
ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨ කාර්මික ව්‍යාපාරිකයාණෝ

**මොරටු පුත්‍රයෙකි.**



ඇම්. රස්කින් ප්‍රනාන්දු මැති තුමා

“ වෙලෝනා ”

- ★ බැනියම් කර්මාන්තය
- ★ කමිස කර්මාන්තය
- ★ සිසිල් බීම කර්මාන්තය
- ★ රස කැවිලි (ස්වීට්) කර්මාන්තය
- ★ සපත්තු නූල් කර්මාන්තය
- ★ මේස් කර්මාන්තය
- ★ බුමුතුරුණු (කාපට්) කර්මාන්තය


**මේ ආදී ව්‍යාපාර රාශියක් ම මෙ තුමා සතුව ඇත. මේ සියලු කර්මාන්තයක්ම මෙ තුමාගේ මනා පාලනයෙන් පැවැත්වේ.**

අද දහස් ගණන් සේවක සේවිකාවෝ වෙලෝනා කර්මාන්ත යන්හි යෙදී සිටිති. අප රටේ පමණක් නොව පිටරටවලද වෙලෝනා නිෂ්පාදන ජනප්‍රිය භාවයට පත්ව ඇත. **කලින් පිටරට** වලින් ගෙන්වූ දේ අද වෙලෝනා ආයතනයන්හි නිපදවා පිටරට වලට යැවීම පුදුමයකි. **පිටරටට බඩු පැටවෙන ඒ සා මහා ව්‍යාපාරයක් සිංහලයකු සතුව තිබීම සකල සිංහල වර්ගයාටම ගෞරවයකි. මේ මහා ව්‍යාපාරිකයා මොරටු පුත්‍රයකු වීම මොරටුවට නම්බුවකි. එ තුමා කෞරව වංශිකයකු වීම සමස්ත ලෝකයේම කෞරව වංශිකයන්ට ආඩම්බරයකි.**

මෙ තුමා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් දැරූ කාලයේදී **තමාට ලැබුණු වැටුප් මුදල මුළුමනින්ම මොරටු පළාතේ පොදු වැඩ සඳහා යෙදවීමෙන්** දැක්වූයේ අනෙක් මන්ත්‍රීවරුන්ටද අගනා ආදර්ශයකි. මෙ තුමා කවදත් ස්වදේශයෙහිද ස්වජාතියෙහිද අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන්නෙකි.



මොරටුවේ ඩී. පී. දෙඩන්ගොඩ සහ සමාගමේ මුද්‍රණාලයයේ මුද්‍රිතයි.

# කෞරව වංශ කථාව

සම්පාදක හා ප්‍රකාශක

පී. ඇස්. ධම්බන්ධු

මුද්‍රණය

ඩී. පී. දෙඩන්ගොඩ සහ සමාගම

මොරටුව

1962

## ඔබේ පරම්පරාව මෙහි ලියන්න.

**පියාගේ නම** ..............................................................

..............................................................

**මවුගේ නම** ..............................................................

..............................................................

**පියාගේ පියාගේ නම** ..............................................................

..............................................................

**පියාගේ මවුගේ නම** ..............................................................

..............................................................

**පුතාගේ නම** ..............................................................

..............................................................

**පුතාගේ භාර්යාවගේ නම** ..............................................................

..............................................................

..............................................................

..............................................................

..............................................................

..............................................................

## ප්‍රස්තාවනා

මේ වූ කල් විසින් සකස් කරනු ලබන වංශ කථාවලියෙහි පළන්න ය. ලක්දිව අනෙක් වංශයන්ගේ ඉතිහාසය හා ශයන් පිළිබඳ දතමනා කරුණුත් යථා කාලයෙහි ප්‍රසිද්ධරවන්නෙමු.

කෞරව (ව) වංශිකයන්ට අවුරුදු හාර දහසකටත් වඩා පැරණි ඉතිහාසයක් ඇත. ඒ සියලු තොරතුරු ම මෙ වැනි පොතකින් විස්තර කළ නොහැක. ඒ නිසා දතමනා කරුණුරින් කොටසක් පමණක් මෙහි සඳහන් කෙළෙමු.

කෞරව, රව්‍ය, කුරු, කරුව යන සකල නාමය කින් ම අදහස්රනුයේ කරුවේ වංශය යි. කුරුකුල යනුවෙන් කියන්නේත් මෙයමැයි. කුරුකුල ජනයෝ විශේෂ කල්පශක්තියකින් යුක්තව විසූහ.

“ දක්ෂිණේනරස්වත්‍යා දෘෂද්වත්‍යුත්තරේණච
යේ වසන්ති කුරුක්ෂෙත්‍රෙ තේ වසන්ති ත්‍රිවිෂ්ටපේ ”

(සරස්වතී නදිකෙරෙන් දකුණෙහි ද, දෘෂද්වතී නදිය කෙරෙන් උතුරු ද, කුරු ක්ෂෙත්‍රයෙහි යම් කෙනෙක් වෙසෙත් නම් ඒ දිව්‍ය ලෝකයෙහි වෙසෙත්.)

මෙයින් අදකරනුයේ එකල කුරු රට ධන-ධාන්‍යාදියෙන් ආඪ්‍යවා සමෘද්ධව තුබුණු බවයි. ‘සතිපට්ඨාන’ නම් සිහිය ඕා ගැනීමයි. කාම-පීම් ආදියෙන් පෙළෙන්නන්ටහියෙන් යුතුව බණ-භාවනාදිය කළ නොහැක. එහෙ යස-ඉසුරෙන් පිරී ගිය මුහුකුරා ගිය නුවණ ඇති කුරු වැසියන්ට සතිපට්ඨාන සූත්‍රය දේශනා

කළ සේකැයි සිතිය හැක. සතිපට්ඨාන සූත්‍රය පමණක් නොව බුදුන් වහන්සේ තවත් සූත්‍ර කීපයක් ම කුරු රට වැසියන්ට දේශනා කළ සේක.

කරාවේ වංශිකයන්ට කුරුකුලසූරිය, කුරුකුලසූරිය පටබැඳිගේ, කුරුකුල ගාර්දිය හේවාවසම් මෙරෙණ්ඤගේ, කුරුකුලත් අරශත් ඉලංගසිංහ ඔඩයාර්ගේ, කුරුකුල ආරච්චිගේ, කුරුනාථගේ, කුරුනේරුගේ, කුරුනායකගේ, කුරුවීරගේ, කුරුසිංහගේ ආදි පෙළපත් නාමයන් ඈත අතීතයෙහි පටන් ම ව්‍යවහාරයෙහි පවතී. අනෙක් කුලවතුන්ට ඒ නම් ව්‍යවහාර නොවේ. කුරුකුලසූරිය ආදී පෙළපත් නාමයන් පමණක් නොව වර්ණකුලසූරිය, මනුකුලසූරිය, වික්‍රමසූරිය, මිහිඳුකුලසූරිය, අර්ෂකුලසූරිය ආදි කෞරව වංශිකයන්ගේ පෙළපත් නම් රැසක් ම කරාවේ වංශිකයන්ගේ පෙළපත් නම් අතර ඇත. එහෙයින් කරාවේ නාමින් ලක්දිව වෙසෙන ජනතාව අන් කිසි මනුෂ්‍ය [illegible] නොව (කුරුකුලයෙහි) කෞරව වංශයෙහි [illegible] බව [illegible] සුදක් සේ පෙනේ.

ඈත අතීතයෙහි සිද්ධීන් අතුරින් බොහොමයක් දේව කථාවන් [illegible] හැඟ උපදවන සුලු ය. රෝමය ගොඩනැඟූ [illegible], රීමස් යන නිවුන් දරු දෙදෙනා කුඩා අවදියෙහිදී [illegible] වලස් දෙනකගෙන් කිරි බී වැඩුණු බැව් රෝම ඉතිහාසයෙහි සඳහන් වේ. විජය රජුගේ මිත්තනිය වූ සුප්පා දේවියගේ ස්වාමි පුරුෂයා සිංහයකු වීයයි මහා වංශයෙහි දැක්වේ. දහසක් දෙනා විසින් උසුලනු ලබන දුන්න රම කුමාරයා විසින් කඩනු ලැබීම, හනුමා කන්දක් ම පිටින් ම ගෙන ඒම ආදි පුවත් රාමායනයෙහි සඳහන් වේ. සංස්කෘතිය හැඩගැසී තිබෙන්නේ මේ අන්දමට ය.

මෙහි දැක්වෙන සත්‍යවතියගේ කථාවත් දේව කථාවක් බඳු ය. එහෙත් එහි ගත යුතු සත්‍ය කරුණු ද ගැබ් වී ඇත.



යම්-යම් කාලවලදී බලයට පත්වුණු රජයට පක්ෂව ලේඛකයෝත් පොත්-පත් ලිවූහ. යටත් විජිත අවදියෙහිදී රාජද්‍රෝහීන් හැටියට සලකන ලද **අන්තෝනි බෙරෙන්තු, කැප්පෙටිපොල, පුරන්අප්පු** ආදි උදවියට අද ගරු කරන්නේ ජාතික වීරයන් හැටියට ය.

"ඉංග්‍රීසි යුගයේ ඉතිහාසඥයන් විසින් ලංකා ඉතිහාසය කණපිට පෙරළා බවට දැක්විය හැකි නිදර්ශන බොහෝ ය. **ශ්‍රී වික්‍රමරාජසිංහ** රජ්ජුරුවන් ජාති ද්‍රෝහියකු ලෙස හංවඩු ගසා තිබීම ඒ බවට එක් නිදර්ශනයකි. රට, ජාතිය, ආගම ආදිය විදේශික රැහැනින් මුදා ගැනීමට සිය දිවි පිදූ **මොනරවිල** හෙවත් **කැප්පෙටිපොල නිලමේ** ආදි වීරයන් රාජද්‍රෝහීන් ලෙස හංවඩු ගසා තිබීම තවත් නිදර්ශනයකි."

(ලංකා ඉතිහාසය පූර්ව භාගයෙහි සංක්‍ෂෙපකය වී. ඩී. ද ලැනරෝල් මහතා)

"දස සත්වන සිය වසෙහි ලංකාවේ තොරතුරු අළලා මහා ග්‍රන්ථයක් ලියූ රොබට් නොක්ස් මුළු රටෙහි ම සැරි සැරුවකු මෙන් ලියූයේ තමා ආරංචියෙන් හා සිතින් මවාගත් දෙයිනි. ලංකාවේ සිරකරුවෙකු ව විසූ ඔහුට ඒ කරුණු දැනගැනීමට තරම් නිදහසක් තිබුණේ නැත. හේ කිසිදක රාජසිංහ රජුවත් නුදුටුවේ ය. එහෙත් හේ පොතක් ලිවී ය."

(අපේ ජපන් ගමන-පණ්ඩිත කඹුරුපිටියේ වනරතන හිමි)

පහත රට ගැන යම්තම්වත් දැනුමක් නොක්ස්ට තිබුණේද? උඩ රට ගමේ-ගොඩේ අය කී දේ ඔහු පොතක ලිවුවේ ය. ඔහුට වුවමනා කෙළේ කෙසේ හෝ රජු සතුටු කොට සිය රට යාමට ය. රොබට් නොක්ස්ගේ ඉතිහාසය සත්‍යයෙන් තොරවූවක් හැටියට උගතුන් විසින් පහත් කොට සලකනු ලබන්නේ එහෙයිනි.

කෞරව වංශයෙහි විශේෂ ස්ථානයක් ගන්නේ කුරු-පාණ්ඩව සංග්‍රාමය යි. කුරු-පාණ්ඩව යුද්ධයෙන් පසුබැස

ගිය කෞරවයන් අතුරින් සමහරෙක් සවකීය සහෝදර යුධිෂ්ඨිර රජු යටතේ විසුවෝ ය. එහෙත් පරාජය නො ඉවසූ දුඃඛ සිත් ඇති ඇතැම් කෞරවයෝ කුරු රට අත්හැර අනෙක් රටවලට ගොස් පදිංචි වූහ. සමහරු ජාවා, සුමාත්‍රා, දකුණු ඉන්දියා හා ලංකා ආදි රටවල් කරා ගියෝ ය. එසේ ගොස් පදිංචිය ගත් කෞරවයෝ ඒ රටවල පරිසරය හා සිරිත්-විරිත් අනුව හැඩ ගැසුණාහ.

**කොරමණ්ඩල්:** ලංකාව ආක්‍රමණය කළ කෞරවයන් අතුරින් වැඩි දෙනෙක් මෙහි ළඟා වූයේ කොරමණ්ඩල් ප්‍රදේශයෙනි. එය පිහිටා තිබෙන්නේ දකුණු ඉන්දියාවේ ය. 'කොරමණ්ඩල්' යන්නේ තේරුම 'කරාවේ මණ්ඩලය' යනුයි.

කෞරව වංශිකයෝ ඈත අතීතයෙහි පටන් ම රණකාමියෝ ය ඔවුහු නිර්භීත ය, අවංක ය, පක්ෂපාත ය, රාජපාක්ෂික ය. එහෙයින් සිංහල නරපතියෝ කීප වාරයක් ම සවකීය සංග්‍රාමයන් සඳහා කෞරව වංශික හේවායන් ගෙන්වා ගත්හ. එයින් වැඩි කොටසක් ගෙන්වා ගනු ලැබුවේ කාංචිපුර, කාවේරි පට්ටනම්, කීලක්කරේ යන තුන් රටිනි.

ඔවුහු රජපාක්ෂිකව, අවංකව, නිර්භීතව සටන් කොට සිංහල නරපතියන්ට ජය අත් කොට දුන්හ. එයින් සතුටට පත් සිංහල නරපතියෝ කෞරව වංශික හේවායන්ට [illegible] ඉඩම් හා [illegible] භෝග ගම්වර ආදිය සන්නස් පිට දුන්හ. කෞරව වංශික සේනාපතියන්ගේ හා සේවා[illegible] සිරිත් නියම අන්දමින් පවත්වාගැනීමට හා [illegible], තොඩි, ජෝසත් ආදිය මේ රටෙහි භාවිතයට ද [illegible] දුන්හ.

කල් යත්-යත්, මේ කෞරව වංශිකයෝ සිංහල රජුන් යටතේ කටයුතු කරමින් රාජපාක්ෂිකව ක්‍රියා කළහ. දක්ෂ



හේවායන් අතුරින් ඇතැමෙකුට සිංහල රජුන් විසින් වෙරළ ආරක්ෂා කිරීමේ රාජකාර්‍යයීය පැවරූ හ. ආයුධ සන්නද්ධ වූ මේ කෞරව වංශික හේවායෝ පවුල්පිටින් මුහුදුබඩ පළාත්වල පදිංචි වූහ. දේශාක්‍රමිකයන්ට (කල්ලතෝනීන්ට) සිරි ලක් බිමට පා තබන්නට ඉඩ නොදී ශ්‍රී ලංකාව ආරක්ෂා කළහ. බස්නාහිර, දකුණු, වයඹ යන පළාත්වල වෙරළ රැකීමෙහි වැඩි වශයෙන් යෙදුණේ කෞරව වංශික හේවායෝ ය.

දඩයම්කිරීම මෙන් ම මසුන් බෑම ද රජකීයයන්ගේ ක්‍රියාවකි. මිහිඳු මහා රහතන් වහන්සේට දේවානම් පියතිස්ස රජ තුමා මුණගැසුනේ මුව දඩයමේ යෙදී සිටියදී ය. බුද්ධ ජයන්ති උත්සව සභාවේ මූලසුන දැරීම සඳහා ලංකාවට පැමිණි නේපාලයේ මහෙන්ද්‍ර රජ තුමා විල්පත්තු අභයභූමියේදී මුවකු වෙඩිතබා මැරුවේ ය. දේවානම් පියතිස්ස රජ තුමා ශ්‍රී මහා බෝධිය සමඟ ලක්දිවට පැමිණි සුමිත්‍ර කුමාරයාට මාළු ඔරුවක් තෑගි කෙළේ ය. දැනුදු අග රැජිණත්, ඇඩින්බරෝ ආදිපාද තුමාත් ඉංග්‍රීසි රජ පවුලේ අනෙක් උතුමෝත් විවේක වේලාවලදී විනෝද වශයෙන් මසුන් බෑම කරති. එසේම ලෝකයේ වෙනත් රජකීයයෝ ද, සිටුවරයෝ ද, මැති, ඇමති ආදි සම්භාවනීය පුද්ගලයෝ ද මසුන් බෑමෙහි යෙදෙති. දඩයමේ ද යති.

අළුත් මාළු මනුෂ්‍ය ශරීරයට හිතකර ය. අපේ ශරීරයට අවශ්‍ය ප්‍රෝටීන් නමැති ජීවධාතු වර්ගය අළුත් මාළු කෑමෙන් ලබාගත හැකියයි උසස් වෛද්‍යවරු පවසති. අළුත් මාළු කෑමෙන් නීරෝගී භාවය, එඩිතර ගතිය, ශරීර ශක්තිය හා මොළයේ දියුණුවත් ඇතිවන බව ය බොහෝ වෛද්‍යවර යන්ගේ මතය. එහෙත් අයිස් දමා සති ගණන් තබා ගන්නා මාළුවලින් අළුත් මාළුවලින් තරම් යහපත් ප්‍රතිඵල නොලැබේ. ඈත අතීතයේ පවා රජවරු හේවායන්ගේ සෞඛ්‍යය ආරක්ෂා වීමටත්, ඔවුන් තුළ එඩිතර භාවය ඇති කිරීමටත් අළුත් මාළු හා මත්පැන් දුන්හ. සුරනිමල

ආදි ඇතැම් යෝධයන්ට මත්පැන්වලින් කරන ලද සංග්‍රහ ගැන පොත පතෙහි සඳහන් වේ.

මේ කොයි කරුණුවලිනුත් කිව හැකි එක් කරුණක් නම් අළුත් මාළු මනුෂ්‍ය ශරීරයට හිතකර බවයි. වියලි හාල්මැස්සන්ගෙන් කැල්සියම් නම් ශරීරයට අවශ්‍ය ද්‍රව්‍යය ලැබේ නම් අළුත් මාළුවලින් ලැබෙන ප්‍රයෝජන ගැන කියනුම කිම?

සිරි ලක් වෙරළ රැක්මෙහි යෙදී සිටි නොයෙක් කුලවලට අයත් භේවායෝ විවේක වේලාවලදී විනෝද ක්‍රීඩාවක් වශයෙන් මසුන් බෑමෙහි ද යෙදුනෝ ය.

කල් යෑමෙන් ලංකාව අරාජක විය. වෙරළ රැක්මේ රාජකාර්‍ය්‍ය අත්හිටියේ ය. මේ භේවායන්ට වෙරළ රැක්මේ රාජකාර්‍ය්‍ය සඳහා රජයෙන් ලැබුණු වැටුප් ආදිය ද නතරවිය. එහෙයින් අඹුදරුවන් සහිත වූ ඔවුහු ජීවනෝපාය සඳහා මං සෙවූහ.

මුහුදු වෙරළ අසල කුඹුරු නැත. ගොවිතැනට සුදුසු ඉඩ-කඩම් නැත. එහෙයින් ඔවුහු ධීවර කර්මාන්තය ස්වකීය ජීවනෝපාය කරගත්හ. මහ මුහුද ඔවුන්ගේ කුඹුර විය. වරාය වැව විය.

මොරටුව, පානදුරය, නල්ලූරුව, කළුතර, බේරුවල, අම්බලම්ගොඩ, දෙඩම්දූව, මීගමුව, හලාවත ආදී මුහුදුබඩ පළාත්වල වෙරළ රැක්මේ යෙදී සිටි කෞරව වංශිකයෝ මාදැල්, ඔරු හා යාත්‍රා ඔරු තබාගෙන ධීවර කර්මාන්තය ආරම්භ කළෝ ය. ඔවුහු ඈත මුහුදේ නිර්භීත ලෙස යාත්‍රා කරමින් ප්‍රචණ්ඩ සමුද්‍රය සමඟ බලවත් සටනක යෙදෙමින් ශාස්ත්‍රානුකූලව ධීවර කර්මාන්තයෙහි යෙදුනාහ. නියම වීර භාවය පලකරමින් සාර්ථක ප්‍රතිඵල ලැබුවෝ ය.

ධීවර කර්මාන්තය පමණක් නොව යාත්‍රාවලින් ඉන්දියාව, බුරුමය ආදි රටවල් තරණය කරමින් වෙළෙඳ ව්‍යාපාර යන්ද ගෙන ගියහ. පුවක්, ගම්මිරිස්, කුරුඳු, පොල් ආදි දේ



යාත්‍රාවලින් වෙනත් රටවලට ගෙනගොස් විකුණුවෝ ය. ඒ රටවලින් ද ලංකාවට වෙළෙඳ බඩු ගෙන ආවෝ ය. ඔවුන්ගේ ව්‍යාපාරය සාර්ථක වීමට හේතු වූයේ ඔවුන්ගේ එඩිතර භාවයත් වීරත්වය හා අවංක භාවයත් ය. දෙඩම්දූව, පානදුරය, මොරටුව ආදී ගම්වල පරන්නෝ දැනුදු මේ යාත්‍රා ගැන වර්ණනා කරති. දෙඩම්දූවේ පමණක් මේ වෙළෙඳ යාත්‍රා තිස්තුනක් තිබුණු බැව් පරන්නෝ කියති.

මුහුදු වෙරළ අසල නිවැසි සෑම කුලවලටම අයත් උදවිය මාදැල්, ඔරු ආදිය තබාගෙන ධීවර කර්මාන්තය කරති. එහෙත් ඈත මුහුදේ ප්‍රචණ්ඩ සමුද්‍රයන් සමඟ පොරබදමින් ඉතා සාර්ථක අන්දමින් ධීවර කර්මාන්තය කරන්නෝ කෞරවයෝ ය. පුරාණ කාලයේ නෝවීජියන් වරු, ප්‍රතිකාල්වරු, ස්පාඤ්ඤවරු හා ඉංග්‍රීසිහු (පිළිවෙළින්) එඩිතරකම් පාමින් මුහුදු ගමන්වල යෙදුනාහ. (දැනුදු කොඩ්ලිවර් තෙල් බහුල වශයෙන් සාදන්නෝ නෝවීජියන් වරුය.) කොරමණ්ඩල්හි සිටි අවදියේ සිට කෞරවයෝ ඈත මුහුදේ යාත්‍රා කිරීමෙහි දක්ෂයෝ ය.

ඈත අතීතයේ පටන් ම කෞරව වංශිකයෝ රණකාමී දාමරික කොටසක් වූවාක් මෙන් ම ශ්‍රද්ධා බුද්ධි සම්පන්න සමයානුකූල දිවි පෙවෙතක් ඇති ශිෂ්ට ජනකායක් ද වූහ. මොවුන් අතර දේව කාර්‍ය්‍යයෙහි නියුක්තයෝ ද වූහ. ජය ශ්‍රී මහා බෝධිරාජයා සිරි ලක්දිවට වැඩමවීමෙහිදී ඒ හා සමඟ කෞරව වංශික පිරිසක් ද පැමිණි බැව් ඉතිහාසයෙන් පෙනේ. ජය ශ්‍රී මහා බෝධියගේ, ජය මහ බෝධියගේ, බෝධියගේ, බෝධියාබදුගේ ආදි කෞරව වංශික පෙළපත් නම් ඇති වූයේ එහෙයිනි.

බුදු සසුනේ දියුණුව සඳහා කෝටි සංඛ්‍යාත ස්වකීය ධනස්කන්ධය වියදම් කළ රට්ඨපාල මහ රහතන් වහන්සේ කෞරව වංශික උතුමෙකි. මුන් වහන්සේ පමණ මහා ධන සම්භාරයක් බුද්ධ ශාසනයට කැප කළ අනෙක් මහ රහතන්

වහන්සේ නමක් ගැන ඉතිහාසයේ සඳහන්ව නැත. ශ්‍රද්ධා වන්තයන් අතුරින් අග්‍ර වූ මුත්වහන්සේ අසූ මහ සව්වන් අතුරින් එක් නමකි.

මෑත භාගයේ පොදු වැඩ සඳහා කෝටි ගණන් වියදම් කළ සී. එච්. ද සොයිසා සිටු තුමා, ද සොයිසා ආයසීංවංශ ශ්‍රී චන්ද්‍රශේඛර මුදලි තුමා, ජේම්ස් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රශේඛර මැති තුමා, ඩබ්ලිව්. ආතර් ද සිල්වා මැති තුමා, ඩී. ඈම්. සමරවීර වංසල මුදලි තුමා, ජෙරමියස් දියෙස් මැතිනිය, එච්. ඩබ්ලිව්. අමරසූරිය මැති තුමා ආදි උතුමෝත් කෞරව වංශිකයෝ ය.

සවකීය ප්‍රඥා මහිමයෙන් සමස්ත ලෝකය විස්මයට පත් කළාවූ ද, දීපබත්ධූ ජාතික වීරවරයෙක් වූද, කුශාග්‍ර බුද්ධිමත් ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැති තුමාත් මුළු ලෝකයෙන් ම එදා වෛද්‍ය විභාගයෙන් ප්‍රමුඛයා ව සමත්වීමෙන් ලෝක වාර්තාවක් තබා සිය රටට අවුත් විස්මය ජනක වෛද්‍ය කර්මයන්ගෙන් උදාර සේවයක් කළා වූ ද ශ්‍රීමත් එච්. ඈම්. ප්‍රනාන්දු වෛද්‍යාචාර්ය තුමාත් රජයේ ශිෂ්‍යත්වය දිනාගෙන එංගලන්තයට ගොස් නීති විභාගයෙන් සම්මාන සහිතව සමර්ථ වී පෙරළා ලක්දිවට අවුත් අසමසම නීතිවේදියෙක්ව රාජකාර්යයෙහි නියුක්ත වූ රාජ නීතිඥ සී. ඈම්. ප්‍රනාන්දු මැති තුමාත් කෞරව වංශිකයෝ ය.

ලංකාවේ පමණක් නොව එංගලන්තයේ ද රාජ නීතිඥ පදවිය ලැබූ එක ම ලාංකිකයා වූ ද, රාජාධිකරණයෙහි විනිශ්චයකාර පදවියක් දරන එකම ලාංකිකයා වූද අග්ගරු ඈල්. ඈම්. ඩී. ද සිල්වා විනිශ්චයකාර තුමාත් කෞරව වංශිකයෙකි.

මේ නයින් බලන කල ප්‍රඥා මහිමයෙන් ද, ත්‍යාගවන්ත භාවයෙන් ද සිංහල ජාතියට උදාර සේවයක් කළවුන් අතුරින් වැඩි දෙන කෞරව වංශිකයන් බැව් පෙනේ. ඔවුහු මහාජන ශුභ සිද්ධිය සැලැස්සුවේ තමන්ගේ මුදලිනි.



තවද විදේශවලට ගොස් ලක්දිවට කීර්තිය අත් කොට දුන් ව්‍යාපාරිකයන් අතුරින් වැඩි දෙන කෞරව වංශිකයෝ ය. බී. පී. ද සිල්වා මුදලි තුමා මොවුන් අතර ප්‍රමුඛත්වයෙහි ලා ගිණිය යුත්තෙකි. සැන්සිබාර්හි වෙළෙඳ මෙහි නියුක්ත ව සිටි විලියම් කුරුණේරු මහතාත්, සිංගප්පූරුවේ වෙළෙඳ ව්‍යාපාරිකයෙක් වූ පී. එච්. හෙන්රි මහතාත් රෝහණ පුත්‍රයෝ ය

ලංකාවේ ව්‍යාපාරිකයන් අතුරින් පිට රට බඩු පැටවීම් හා පිට රටින් බඩු ගෙන්වීමෙහි ද කෞරවයෝ අන් කිසිවකුට නො දෙ වැනි වූහ. ද සොයිසා සමාගම, එච්. ඈල්. ද මැල් සමාගම, රිචඩ් පීරිස් සමාගම, ඩබ්ලිව්. ඩී. ප්‍රනාන්දු සමාගම, වෙලෝනා මේස්බැනියම් ව්‍යාපාරය, ග්ලූකෝරස ව්‍යාපාරය, ලංකා ලයිට් ගිනිකූරු සමාගම ආදිය ඉන් සමහරකි.

මිනිරන් කර්මාන්තය අතින් බලන විට බෝගල, කරඳවල, කිරිල්ලවල, සියඹලාවල යන පතල් මුල් තැන් ගනී. බැස්ටියන් ප්‍රනාන්දු මැති තුමාත් ශ්‍රී චන්ද්‍රශේඛර මුදලි තුමා හා එච්. ඈල්. ද මැල් සමාගමත් මිනිරන් වෙළෙඳාමෙහි ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කළහ. උඩ පාත දෙරටෙහි වෙළෙඳ ව්‍යාපාරිකයන් අතර මැල් මැන්ඩිස් සමාගම, ඈස්. සී. ප්‍රනාන්දු සමාගම, පීරිස් සහෝදර සමාගම හා ඈම්. ඈම්. සල්ගාදු සහ පුත්‍ර සමාගමත් ප්‍රධාන ය.

රබර් වැවීම අතින් බලන විට ද කෞරව වංශිකයන්ට ලැබෙන්නේ අවිතීය ස්ථානයකි. 'රබර් රජා' යන අපර නාමයකින් ප්‍රසිද්ධ වූයේ පානදුරේ සවර්ණගිරියෙහි විසූ ඈම්. ඒ. පෙරේරා මැති තුමා ය. පානදුර සීමාසහිත තේ සහ රබර් සමාගමේ පාලක පක්ෂය කෞරවයෝ ය ද සොයිසා, ද මැල්, දියෙස් ආදි කෞරව වංශික වතු හිමියෝ සිය ගණන් ඇත. මේ වතු නිසා දිවි පෙවෙත කරගන්නෝ දස දහස් ගණනකි.

පොල් කර්මාන්තය අතින් බැලුවත් සිරිලක් බිමේ පොල් අක්කර ලක්ෂ ගණනක් කෞරව වංශිකයන් සතුව ඇත.

ද මැල්, ද සොයිසා, ද පොන්සේකා, පීරිස් පෙරේරා, ප්‍රනාන්දු, සිල්වා, සල්ගාදු, රුද්‍රිගු ආදී කෞරව වංශික ප්‍රභූවරයන්ට අයිති පොල් අක්කර ලක්ෂ ගණනක් ඇත.

තේ ගැන බලන විට එච්. ඩබ්ලිව්. අමරසූරිය මැති තුමා කිසිම සිංහලයකුට දෙවැනි නොවේ. ද මැල්, රුද්‍රිගු, සල්ගාදු, පීරිස්, පෙරේරා, ප්‍රනාන්දු ආදී කෞරව වංශික ධනපතියන්ට අයත් තේ අක්කර දහස් ගණනකි මේ වතුවල සේවයේ නියුක්ත සේවකයෝ දස-දහස් ගණනකි.

පාරා රබර් ගස්වලින් හාපුරා කියා ක්‍රි. ව. 1905 අවුරුද්දේදී කිරි ගැනීම කෙළේ මොරටුවේ කොරළවැල්ලේ විසූ වන්නකුවත්තවඩුගේ රොබට් ප්‍රනාන්දු මහත්මා ය.

ලංකාවේ ප්‍රථම වරට ගිනිකූරු සාදන යන්ත්‍රයක් ස්වකීය ඥාන ශක්තියෙන් සෑදුවේ පානදුරේ වෑකඩ විසූ ජේඛින් පීරිස් මහත්මයා ය. ක්‍රි. ව. 1916 දී මේ ගිනිකූරු කර්මාන්තය සුළු වශයෙන් කරන ලදී. එදා සුදු රජයෙන් ඒ මේ ව්‍යාපාරයට උපකාරයක් නොලැබිණි.

ලංකාවේ ප්‍රවාහන සේවයක් මුලින් ම ඇති වූයේ දැනට අවුරුදු 102 කට පමණ ඉහත දී ය. කෞරව වංශිකයන්වූ පාවුළු ද මැල් හා සවරියල් මැන්දිස් යන යහළුවන් දෙ දෙනා විසින් අරඹන ලද මැල් මැන්දිස් සමාගම මගින් ඒ මේ ප්‍රවාහන සේවය ඇති කරන ලද්දේ.

වඩු කර්මාන්තය අතින් බලන විට මොරටුව මුල් තැන ගනී. එගොඩඋයන, කටුකුරුන්ද, කොරළවැල්ල, මොරටු මුල්ල, ඉඳිබැද්ද ආදී ගම්වල වඩු කර්මාන්තයෙහි යෙදී සිටින දහස් ගණන් කම්කරුවෝ කෞරව වංශිකයෝ ය.

තේ පෙට්ටි කර්මාන්තය අතින් ද කෞරව වංශිකයෝ මුල් තැන ගනී. එගොඩඋයන, කටුකුරුන්ද, කොරළවැල්ල ආදී ගම්වල සිය ගණන් කම්කරුවෝ මේ රැකියාවෙන් මුදල් උපයා ගනිති.



විනාකිරි කර්මාන්තය ද ඈත කාලයේ සිටම කෞරවයන් විසින් කරනු ලබන රැකියාවකි. පානදුරේ, තල්පූරුව, වාද්දුව, කළුතර, මග්ගොන, බේරුවල, අළුත්ගම ආදී ගම්වල සිය ගණන් කම්කරුවෝ මේ රැකියාවෙන් ජීවත් වෙති.

කෞරව වංශිකයන්ගේ රැකියාවකට මරු පහරක් වැදුනේ තැබෑරුම් වැස්සවීමේ ව්‍යාපාරයෙනි. මොරටුව පානදුරේ, වාද්දුව, කළුතර, කටුකුරුන්ද, කලමුල්ල, පයාගල, මග්ගොන, බේරුවල, අළුත්ගම, මාරාවිල, වෙන්නප්පුව, හලාවත ආදී ගම්වල අරක්කු පෙරීමේ කාර්යයෙහි නියුක්තව සිටි කෞරවයන්ගේ ගණන විසි දහසකටත් අධික බැව් පරන්නෝ කියති. කොහු තළන්නී, ලණු අඹරන්නී, අතුරු සාදන්නා, පීප්ප සාදන්නා, අතුරු බඳින්නා, මදින්නා, පීප්ප තල්ලු කරන්නා, රා පුරවන්නා, ගබඩා කරන්නා, අරක්කු පෙරන්නා ඈ විසින් දෙනෝ දාහකට රැකියාව දුන් රා-අරක්කු කර්මාන්තය අමද්‍යප සේවකයන් නිසා නැත්තට නැති විය. මොවුහු රා-අරක්කු කර්මාන්තයෙන් දියුණු වූ පවුලක උද්‍යෝගිමත් පුත්‍රයකු අමද්‍යප වීරයකු කරගැනීමෙහි සමත් වූහ.

**එක හූවට පල්ලි පහයි:**

කළුතර දිස්ත්‍රික්කයේ ඇතැම් ගම්වල එක හූ ශබ්දය දේවස්ථාන පහකට ඇසේ. ඒවා ඉදි වූයේ ඒ ගම්-පළාත්වල රේන්ද මහතුන් උන් අවදියේ ය. එකල ඒ පළාත් කිරියෙන් පැණියෙන් ඉතිරිණි. **පන්සල් අතින් ද** කිය යුත්තේ මෙය මැයි. පානදුරේ වැලිපිටියේ අභයකරුණාරත්න මුදලින්දා, රාමයෙහි තේවා හේවිසිය, රන්කොත් විහාරය; තල්පූරුවේ න්‍යග්‍රෝධාරාමය, බෝධිරාජාරාමය, වෑකඩ බෝධිරුක්ඛාරාමය, බැන්ඩියේ පන්සල ආදී විහාරස්ථාන කීපයකට ඇසේ. ඒවා ඉදි වූයේත් ඉහත කී වකවානුවේ දී ය.

**ඉතිහාසදෝෂයක්:**

ලංකාද්වීප මහාකවි **රුපියෙල් තෙන්නකෝන් මහතාගේ සිංහල වංශයෙහි** මාතලේ කැරැල්ලේ නායකත්‍වයෙන් පුරන්අප්පු වීරයාට තැණදී තිබේ. එහෙත් මේ ජාතික වීරයාට 'පුරන්අප්පුවා' යයි යෙදීම ශිෂ්ට සම්මත නොවේ. එපමණක් ද නොව ඒ පොතේ අත්තෝනි බරෙත්තු මන්ත්‍රීගේ නාමය 'බරෙත්තුවා' යයි යොදා ඇත. මෙසේ ජාතික වීරයන්ට නිගා දෙන පද සිය පොතෙහි රුවා ගැනීම නොහොබනා කමකි.

**ලංකාවේ කැරලි කෝලාහල:**

**කේ. ඩී. පී. වික්‍රමසිංහ** මහතා විසින් ලියන ලද 'ලංකාවේ කැරලි කෝලාහල' නම් පොතේ මාතලේ කැරැල්ලෙහි නායකත්‍වය ගොන්ගාලේගොඩ බණ්ඩාට දී තිබේ. එහෙත් කැරලි නායකයා වූ ද, රජු හැටියට ඔටුනු පලන්දවා පිළිගත්තා වූ ද පුරන්අප්පු වීරයාගේ නාම මාත්‍රයක් වත් මේ පොතෙහි සඳහන් ව නැත. මේ වූ කලී බලවත් අපරාධයකි. (සත්‍ය ප්‍රවෘත්තිය දැන ගැනීමට 'කෞරව වංශ කථාවේ' 128-136 පිටු බලන්න.)

**මධ්‍ය කාලීන සිංහල කුල:**

මේ නමින් නොබෝද නිකුත් වූ ආනන්ද කේ. කුමාරසවාමි නම් යාපනේ ද්‍රවිඩ පණ්ඩිතයාගේ පොතෙහි සිංහල කුල පිළිබඳ විස්තරය අවිචාර බුද්ධියෙන් කළ එකකි. සිංහල කුල ගැන කිසිදු දැනුමක් මේ ද්‍රවිඩයාට නැත. මේ පොතේ පරිවර්තක එච්. ඇම්. සෝමරත්නයන්ගේ යෙදුම් ද අවිචාර ය. එහි ඇතැම් කුලවතුන්ට නිගා කොට ඇත. දෙමළ වෙල්ලාල කුලය හා සිංහල ගොවි කුලයත් එකක් යයි එහි දැක්වේ. මේ කුල දෙක දෙකකි. එකක් නොවේ. ලංකාවේ ඇති කුල සියල්ලක් ම පාහේ ඉන්දියාවෙත් ඇත. එහෙත් 'කොවියා' නමින් දැක්වෙන කුලය ඉන්දියාවේ නැත. එය ලංකාවේ 'ගොවියා' යන්න වර්ණ විපර්‍යාසයෙන් 'කොවියා' යයි සැදුණු වචනයකි. යාපනේ පළාතේ වාසය කරන මේ කොවියා කුලයෙහි උදවිය අඳින්නේ සිංහලයන් අඳින හැටියට යි. ඔවුන්ගේ සිරිත් විරිත් ද බෙහෙවින් සිංහලයනට සමාන ය. ශුද්‍රයන් අතුරින් වෙල්ලාලයන් උසස් යයි දකුණු ඉන්දියාවේ මතයක් ඇත. එහෙත් යාපනේ කොවියා වෙල්ලාලයන්ට වඩා පහත් ය. ආනන්ද කේ.



කුමාරසවාමි වනාහි යාපනේ ද්‍රවිඩයකු නිසා සුදු කතකගේ කුසයෙන් ලොව පහළ වූ තැනැත්තෙකි. සවකීය ජීවිත කාලයෙන් සියයට හැත්තෑපහකටත් වඩා යුරෝපයේ ගත කළ මේ පණ්ඩිතයාට සිංහල කුල ගැන එක-එකා කී දේ ඔහු සිය පොතේ රුවා ගත්තේ ය. ශාස්ත්‍රාචාර්‍ය එඩ්වඩ් මුලර් මහතා විසින් ආණ්ඩුව වෙනුවෙන් සංග්‍රහ කොට ක්‍රි. ව. 1883 දී ලන්ඩන් නුවර දී ප්‍රසිද්ධ කරන ලද 'ලංකාවේ පැරණි ගල් සන්නස්' නම් පොතේ නිශ්ශංකමල්ල රජ තුමාගේ ශිලා ලිපිය මේ පඬුවා දුටුවා නම් මෙ බඳු දේ ඔහුගේ පොතට ඇතුළත් නොවෙනවා ඇත.

පුරාණ කාලයේ සිට ශ්‍රී ලංකාවීපයේත්, සිංහල වගීයාගේත් අභිවෘද්ධිය උදෙසා කරාවේ වංශිකයන්ගෙන් අවිතීය උදාර සේවයක් සිදුවී ඇත. චරිත කථා කීපයක් මේ පොතට ඇතුළත් කරන ලද්දේ කරාවේ වංශිකයන් විසින් රට – ජාතිය – ආගම වෙනුවෙන් කරන ලද උසස් සේවය දැක්වීමටත් පාඨකයා තුළ තමන් උපන් රටට – ජාතියට සේවයක් කිරීම සඳහා උනන්දුවක් ඇතිකරවීමත් සඳහා ය. මේ පොත් පෙළේ අනෙක් පොත්වලින් ද මෙ බඳු දේ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමු. ඔබ ඔබේ රට-ජාතිය වෙනුවෙන් ඔබේ යුතුකම් කොටස ඉටු කළ යුතු බැව් අවසාන වශයෙන් සඳහන් කරමු.

මේ පොත සකස් කිරීමේදී නන් අයුරින් අපට උපකාර කළ හැම දෙනාට ම පසසමු. තවත් කියයුත්තකි, ගෞරවනීය ලක්දැස් ද මැල් බිෂොප් තුමා අග්නිදිග ආසියාවේ නායක බිෂොප් පදවියට පත් වීමත් ජී. පී. ඒ. සිල්වා මැති තුමා ශ්‍රෙෂ්ඨාධිකරණයෙහි විනිශ්චයකාර ධූරයකට පත් වීමත් ඒ චරිත කථාවන්ට ඇතුළත් කළ නොහැකි වූයේ ඒ පදවි ලැබෙන විට පොතේ ඒ කොටස් මුද්‍රණය වී තුබුණු හෙයිනි.

මෙයට-ලෝවැඩ කැමැති
**පී. ඇස්. ධම්මබන්ධු**

14-9-62
"හෙක්ටර් විලා"
එගොඩඋයන-මොරටුව.

# පිළිගැන්වීම

සැරද සිරි, සරසවි - උර මූව වෙතේ රඳනා
රජ, මැති සතත සුහසළ - **විසුදු නඳ හිමි සඳ ගරු**

නැණයෙනි විනායක - සමිඳුනි, අපේ නායක

**ගම, සූනියම්, දෙලසක්, දුඩිමු** **ණ් ඩ**
**සෑම දෙවි ම ඈත ඔබ බස පිළිග** **න් ඩ**

මැති, ඇමති, පබු ගණ - ඔබ දෙරටුවෙහි රැකගෙන

ආ සි රි වඳන් හිමි සඳුගෙන් ලැබ ග න් න
පා පිරි තිය හිඳිති ඔබ මුව දැක ග න් න


මෙ සේ යසස් ඇති කිසිවෙක් නා සමි ඳැ,
දෙ සේ සිහල නැත ඔබ හැර මහ කිවි ඳැ,
වි සේ සයෙකි ඔබ මුව කමල දුටු ස ඳ
දෙ සේ සියලු දුරු වෙයි සමිඳුනි, සැර ඳ

සි රි ග ණ සසුන් විලැ වැජඹෙන රනහංස
ර ජ ව න සමිඳ, මානා කණැ **කුරුවංස**
ස රි ව න රත්මිණට සුලකල අවතංස
ඔබ ගු ණ වණමු අද අපි හැම නොව සංස

අ හ ස ට සසුන් සඟතුරු මැද තුරු රජ
**ක** වි ය ට කවි සෙබේ වැජඹෙන කවි රජ
ල බ න ට වුව සුදුසු පදවිය සඟ රජ
අති සෙට නා සමිඳ, මිහි බට බඹ රජ


**කවි රව ගොත** දිනූ පැවතෙ'න **කෑන් බර** **ත**
කවි බිඟු පිනන පියුමෙකි ඔබ වත දිමූ ත
කවි රැන් ගුණ වණන නා හිමියනි, මෙ වැ ත
**කව රව වස් සුවත** තබමූව ඔබෙ සුර ත

පී. ඈස්. ධම්බන්නු



ලුනාවේ ශ්‍රී විසුඩාරාම මහා විහාරාධිපති
ශ්‍රී සරණපාල වංසාලංකාර ප්‍රවරකිත්ති ශ්‍රී
**ගෞරවාහී**
## ගල්කිස්සේ ශ්‍රී විසුද්ධානන්ද
නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත
**'කෞරව වංශ කථාව' නමැති මේ මහා ග්‍රන්ථය**
පිරිනමන ලදී.

## කෞරව වංශිකයන්ගේ කොඩි



**1. සිංහයා කොඩිය:**

කොඩියේ මැද කෝටුවක් අතින් ගත් සිංහ රූපයක් ද, කොන් හතරේ සිතු හතරක් ද මෙහි සඳහන් ලකුණු ය. (දෙවුන්දර දේවාලයෙහි දේව කාර්‍යයෙහි නියුක්ත කෞරව වංශිකයන්ගේ පරම්පරාවට අයත් කොඩියකි මේ.)

**2. කුකුළා කොඩිය:**

"ගං ගේ මිණි බැබළි කිරණෙව් සත පා ය
ර නේ සටග සැවුළිඳු දද ගල පා ය
අ නේ ලකල කල පුර අප නර පා ය
පෙ නේ දකුණෑ මහසෙත් දෙව් රද පා ය"

(සැලළිහිණි සන්දේශය)

මෙහි සැවුළිඳු දද යනුවෙන් කුකුළු රුව යෙදූ කොඩි ගැන වර්ණනා කරන ලදී. මෙ සේ ලංකාවේ රාජ සම්මානයෙන් පැවැති මේ ධවජය යුද්ධවලදී ජය ගැනීමේ ලකුණක් වශයෙන් රාජකීය ගෞරවය ප්‍රදානය කරන අවස්ථාවලදී කෞරව සේනාපතියන්ට ලැබිණි.

**3. නැව් කොඩිය:**

ඈත අතීතයෙහි පටන්ම කෞරව වංශිකයෝ නැව් තැනීමෙහි ද නෑව් යාත්‍රා ඈදිය පැදවීමෙහි ද සූරයෝ වූහ. එපමණක් ද නොව නාවික යුද්ධවලින් ද ඔවුහු ජය ග්‍රහණය කළෝ ය. මේ ජය ග්‍රහණයන් ගැන ප්‍රසාදයට පත්වුණු රජ දරුවන් විසින් තෑගි කරන ලද්දකි නැව් කොඩිය.

**4. හනුමා කොඩිය:**

හනුමද් ධවජය ක්‍ෂත්‍රිය රජුන්ගේ ජය ධවජයක් වශයෙන් භාවිතයට ගෙන තිබිණි. ලංකාවේ හයවෙනි ශ්‍රී සංඝබෝධි පරාක්‍රමබාහු රජු දවස පුත්තලමට ගොඩ



බැස ඒ ප්‍රදේශය අල්වාගත් සතුරු සේනාව සමග යුද්ධ කිරීම පිණිස කාංචිපුර, කාවේරි පට්ටනම්, කිලක්කරෙ හෙවත් කිර දේශය යන රටවලින් ගෙන්වූ 7740 සේනාවට නායකවූ කෞරව වංශික යුද්ධ සේනාපතීන් හට ඔවුන්ගේ ප්‍රවේණි වශයෙන් අයිතිව පැවත ආ කුලීන ගෞරවය ඇඳන අවස්ථාවෙහි මේ හනුමා කොඩිය ද ලංකාවේ නිදහස් ලෙස පාවිච්චි කිරීමට අවසර දෙන ලදී. එසේ කිරීමට හේතුව නම්, (රාම රජුගේ කාලයේ සිට ඉන්දියාවේ රජ දරුවන් විසින් යුද්ධවලදී භාවිතයට ගෙන තුබුණි) මේ කොඩිය ජාතික කොඩියක් වශයෙන් කෞරව සේනාපතියන් විසින් ගෙනවුත් සිංහල රජුට ජය අත්කොට දීම යි.

"ස්වකීය යුද්ධ රථයෙහි නැංවූ කපි ධවජය (හනුමා කොඩිය) ගගන තලයෙහි ලෙළ දෙද්දී අර්ජුන තෙමේ තම වංශයෙහි අභිජාතවූ භීෂ්ම, ධෘතරාෂ්ට්‍ර, දුර්යෝධන, දුඃශාසන ආදී ලෞකික ඥාති වරයන් දෙසත් තමන් හට ආචාර්‍ය පදප්‍රාප්තවූ ද්‍රෝණ, කෘප ආදී බ්‍රාහ්මණයන් දෙසත් විමංසනාක්‍ෂිය යොමු කෙළේ ය. (හනුමා කොඩිය කෞරවයන් සතු බැව් මෙයින් පෙනේ. භාරත ගීතය– 687 පිටුව.)

**5. නැංගුරම් කොඩිය:**

නැංගුරම් දෙකක් මත නැගුණු හිරවකුගේ රූපය මේ කොඩියේ ලකුණයි 'කපිපණී ධවජ' නමින් සඳහන් වන්නේත් මේ කොඩිය මැ යි.

පෙර දිග මිනිසුන් අතුරින් නොයෙකා ගමනා–ගමනයට පළමුකොට පුරුදු වූවෝ භාරත දේශයෙහි ජනයෝ ය. වජ්ජි රාජ්‍යය, භාරත වර්ෂය යන නම්වලින් දක්වෙන්නේත් මේ ප්‍රදේශය මැ යි. චන්ද්‍ර වංශික රජුන්ට අයිති කුරු රට ද මේ භාරත දේශයෙහි කොටසකි. දුෂ්මන්ත නම් කෞරව රජුගේ රාජ්‍යය

යථෝක්ත වජ්ජි දේශය යි. ඉන්දියාවේ අනෙක් රටවලින් ආවාක් මෙන්ම මේ වජ්ජි දේශයෙහි කෞරව වංශිකයෝ ද ලංකාවට පැමිණියෝ ය. එසේ පැමිණි කෞරව රාජකීයයන් විසින් ගෙන එන ලද්දකි නැංගුරම් කොඩිය.

**6. ශංඛජාල හෙවත් රණ දැල් කොඩිය:**

මේ වූ කලී මධ්‍ය මණ්ඩලයට අයත් කුරු ක්ෂත්‍ර ක්ෂත්‍රියයන්ගේ කොඩියකි. මීට ශංඛජාල යන (අයෝමය යුද්ධ සන්නාහයක) නාමය දී තිබෙන්නේ යුද්ධ හැට්ටයක, යකඩ දැල් හැට්ටයක සලකුණ මෙහි යොදා තිබෙන නිසාය. මෙය ද කෞරව වංශිකයන්ගේ කොඩියකි.

**7. ව්‍යාඝ්‍ර කොඩිය: (කොටියා බැඳි කොඩිය)**

දඹදිව ක්ෂත්‍රිය රජුන් විසින් බොහෝ කලක සිට මේ කොඩිය යුද්ධාදියෙහි භාවිතයට ගෙන තුබුණු බැවින් රාජ වංශිකයන්ගේ ලකුණක් විය. ලක්දිවට පැමිණි රාජ වංශික කුමාරවරුන් විසින් ද සිංහල රජුන්ට පක්ෂව යුද්ධ කරන අවස්ථාවලදී මේ කොඩිය භාවිත කරන ලද්දේය එහෙයින් යුද්ධවලින් ජයගත් චන්ද්‍ර වංශීය කෞරව ජනයන් හට වංශයෙහි ගෞරවය හැඟවීමේ ලකුණක් වශයෙන් මේ ව්‍යාඝ්‍ර කොඩිය පරිත්‍යාග කරන ලදී.

**8. නාග කොඩිය:**

"ම න හර නා මෙනෙවියනිඳ ලවැලි පි ට
ගෙන මිණි වෙණ තත් නියගින් මැඳ රුව ට
ක න හෙවැ ගයන බුදු ගුණ ගී මියුරු කො ට
සැ න හෙව කැලණි ගඟ බඩ මඳ කලක් සි ට


(සැළලිහිණි සන්දේශය)



මෙහි නා මෙනෙවියන් යනුවෙන් දැක්වෙනුයේ නාග ගෝත්‍රික තරුණ කාන්තාවන් ගැනයි. නාග පුර යනු මධ්‍ය දේශයෙහි අගනුවරට ව්‍යවහාර කරන නාමයකි. මධ්‍ය දේශය නම් හිමාලය පර්වතය හා වින්ධ්‍ය පර්වතය ද අතරෙහි වූ භූමි ප්‍රදේශය යි. මේ ආර්යයන්ගේ වාස භූමිය වේ.

මෙකී මධ්‍ය දේශයෙහි වාසය කළා වූ ආර්යයෝ නාග ගෝත්‍රයෙන් පැවතෙන්නෝ වෙත්. එහෙයින් ඔවුන් විසින් නාග ලක්ෂණයෙන් යුක්ත වූ කොඩියක් පිළියෙල කරගන්නා ලද්දේය. ආර්ය වර්ගීය ලෝකයේ නානා රටවලට සංක්‍රමණය වෙත් ම ඔවුන්ගේ සිරිත් විරිත් ද නොයෙක් රටවල පැතිර ගියේය. ඒ අතර ඔවුන්ගේ කොඩිය ද අවශේෂ රජුන් අතරත් භාවිතයට පැමිණියේ ය.

තවද කුරු රට **'හස්තිනා පුර'** නම් අගනුවර නාග පුර යන නාමයෙන් ද ප්‍රසිද්ධ විය. එහෙයින් ආර්යාවර්තයෙහි රජුන් අතර භාවිත වූ මේ ධ්වජය කුරු දේශයෙහි අගනුවරට ව්‍යවහාර කරන නාමය සංලක්ෂණය කොට ගෙන චන්ද්‍ර වංශික රජුන් විසින් භාවිත කරන්ට පටන්ගන්නා ලදී. එකී කෞරව වංශිකයෝ සිංහල රජුන්ගේ පක්ෂය ගෙන යුද්ධවලට සහභාගි වෙද්දී ස්වදේශය හැඟවීමේ ලකුණක් වශයෙන් නාග කොඩිය රැගෙන ආවෝය. ලක්දිව රජුන්ගෙන් ද ඒ කොඩිය පාවිච්චි කිරීමට අවසර ලැබිණි






**9. රාවණ කොඩිය:**

හිස් දහයකින් යුක්තවූ හෙයින් හෝ දස දෙනෙකුගේ සමණ නුවණකින් යුක්තවීම නිසා හෝ 'දසිස්' නමින් ප්‍රසිද්ධ වූ රාවණ රජුගේ රූපය මේ කොඩියෙහි දක්වේ. යුද්ධකාමී නිර්භීත ශ්‍රේෂ්ඨයෙකුගේ රූපය බැවින් එය රජුන් විසින් ද යම්-යම් අවස්ථාවලදී දැරීමට පුරුදු කර ගන්නා ලද්දේ ය.

**10. සිප්පි කොඩිය:**

සිප්පි වූ කලී සක් වෙසෙසකි. රජුන් අතර භාවිත වන ඉෂ්ට වස්තු අතුරින් (සාමාන්‍ය වශයෙන්) මේ සක් වර්ග ශුභ ඵලදායක මංගල වස්තු වශයෙන් සලකනු ලැබේ.

"කැළුවැල් කපුරු දුම තුළ ලෙළෙන දද පෙළ
සුවිසල් මිහිඟු සක් සත් මිණි හඩ පත ළ
කැරලොල් සතත් පවසන තිඹු ගී දෙම ළ
මනකල් ඉසුරු කෝවිලැ ලගිනේ ලක ළ"

(සැළලිහිණි සන්දේශය)

මෙ සේ වර්ණිත වූ සක් විශේෂයෙහි ඇති ලක්‍ෂණ සිප්පි විශේෂයෙහි ද විද්‍යමාන වේ. මේ සේ ඉෂ්ට වස්තුවක් වූ සිප්පිය ද රජුන්ගේ කොඩිවල ලකුණක් වශයෙන් භාවිතයට පැමිණියේ ය.

දඹ දිව රජුන් විසින් සිප්පි කොඩිය රාජකීය ලකුණක් වශයෙන් භාවිත කරත්ම, චන්ද්‍ර වංශයෙහි වූ කුරු-පාණ්ඩු ආදි රජුන් විසින් ද එය භාවිතයට ගත්හ. ලංකාවේ යුද පිණිස ඇමිණි කෞරව වංශිකයන් විසින් ජාතික ලකුණක් වශයෙන් ගෙන එන ලද සිප්පි කොඩිය නිදහස් ලෙස භාවිතය කිරීමට මහ රජුගෙන් අවසර ලැබිණි.

## 11. මත්ස්‍ය කොඩිය:

**බුද්ධ ශ්‍රී පාදයෙහි මංගල ලක්‍ෂණ අතුරින් මත්ස්‍ය ලක්‍ෂණය ද එකකි. රුවන්මැලි මහ සෑයේ පැරණි නිදන් ගැබක තුබුණු මංගල වස්තු අතර මත්ස්‍ය රූපයක් ද විය.**

මෝණරාය, තලගිරිත්තාය, මත්ස්‍යයාය යන මේ සතුන්ගේ ලකුණු යොදන ලද කොඩි රජුන්ට අයිති හෙයින් රජුන්ගේ සම්පත්තිය පිණිස ඒ කොඩි භාවිතයට ගත්හ. මත්ස්‍ය දේශයෙහි විරාට රජු මත්ස්‍ය කොඩිය (ස්වකීය දේශයෙහි ලක්‍ෂණයක් වශයෙන්) මුලින්ම භාවිතයට ගත්තේය. කල් යාමෙන් ක්‍ෂත්‍රිය වංශික නරපතියන් විසින් මත්ස්‍ය කොඩිය ද රාජකීය ලක්‍ෂණයක් කොට ගත්හ.

මහා කවි කාලිදාසයන්ගේ රඝුවංශ මහා කාව්‍යයෙහි මෙසේ දැක්වේ

"මත්ස්‍ය ධ්වජා වායු වශාවිදීර්ණෛ
ර්මුඛෛඃ ප්‍රවෘද්ධ ධ්වජිනී රජාංසි
බභුඃ පිබන්තඃ පරමාර්ථ මත්ස්‍යාඃ
පර්යා ජලානීව නවෝදකාන්"

(රජ මාලිගාව මුදුනෙහි යොදන ලදින් වාත වේගයෙන් කම්පාවන්නාවූ මත්ස්‍ය කොඩිවල මත්ස්‍ය රූප අළුත් ජලයෙහි ක්‍රීඩා කරන ජීවමාන මත්ස්‍යයන් මෙන් බබලන්නාහ.)

"මුවර ඳද දුම් නිදි - කලස කුසුම කල සහත්
වෙළෙප් මළෝ ලඹුදුන් - කලබින් විසිත් සිත්තම්"

(කව් සිළුමිණ)

කෞරව වංශික යුද්ධ සේනාව හමවනි පරාක්‍රමබාහු රජු දවස සිරි ලකට පැමිණි මුක්කරුන් පරාජය කොට යුද්ධයෙන් ජය ගැනීම නිමිති කොට සතුටු පඬුරු දෙන අවස්ථාවේදී මත්ස්‍ය කොඩිය භාවිතයට ද රජ තුමා ගෙන් අවසර ලැබිණි.

## 12. හංස කොඩිය:

**හංස රූපය ද බුද්ධ ශ්‍රී පාදයෙහි ලක්‍ෂණ අතුරින් එකකි**

හංසයෝ තුන් කොටසෙකි. දුඹුරු පැහැති පියාපත් හා තුඩ ඇති එක් කොටසකි. කළු පැහැති පියාපත් හා තුඩ ඇති තවත් කොටසකි. රතු පැහැති පියාපත් හා තුඩ ඇති අනෙක් කොටසකි. රාජ හංස නාමයෙන් දැක්වෙනුයේ මේ රත් පැහැති පියාපත් හා තුඩ ඇති කොටස ය.

පක්‍ෂීන් අතුරින් හංස රාජයා අති ශ්‍රේෂ්ඨ පක්‍ෂියෙකි. රාජ හංසයන් ලංකාවේ නැත. එහෙත් පැරණි කවියෝ ලක්දිව රාජ හංසයන් විසූ බැව් ස්වකීය රචනාවන්හි සඳහන් කොට තිබේ. ("ජලාසය මාත්‍රං රාජ හංසානාම්" "දිය බඳුනක වුවද රාජ හංසයන් ඇතැ"යි කීමේ නිදහසක් කවියනට ඇත.)

"අග පිපි මල් මලිගිය ලිය කැලේයා
වග බැඳ හෙන රජ හස පුල් විලේයා
ලග සිරි තුරු ගිලිහුණු රෝණවුලේයා
මග බැස යව පළ හෙල වැලි තෙලේයා"

(සැලළිහිණි සංදේශය)

රාජ හංසයා කවියන් විසින් මෙන් ම රජ දරුවන් විසින් ද ඉතා උතුම් කොට සලකන ලදී. එහෙයින් ඔවුහු සිය කොඩිවල හංස රූපය යෙදූහ. ඔවුණු පැළඳවීමේ උළෙලට හංස කොඩිය රැගෙන ගියේ එය ඉෂ්ටවස්තුවක්

වශයෙන් සලකාගෙන ආශිර්වාද ලැබීම සඳහාය කුරු දේශයෙහි චන්ද්‍ර වංශික රජුන් විසින් ද හංස කොඩිය භාවිත කරන ලදී. අනෙක් රටවල නරපතියන් විසින් භාවිත කරන ලද හංස කොඩි එක් හස් රුවකින් සැරසූ අතර කෞරව වංශික නරපතියෝ හස් රූ යුවලකින් සිය කොඩි සැරසූහ. ලංකාවට පැමිණි කෞරව වංශික සේනාපතියෝ ද සිංහල රජුන්ගෙන් ලබන ලද අවසර ඇතිව හස් රූ යුවළකින් යුත් කොඩි භාවිතයට ගත්හ.

**13. රාජාලියා කොඩිය:**

පක්ෂි වර්ගයා අතුරින් රාජාලියා බොහෝ බලසම්පන්න ජව වේගයෙන් යුක්ත වූ පක්ෂි රාජයකු බැවින් ආදිකල්පික වූ රජුන්ගේ ධ්වජයන්හි රාජාලියාගේ රූපය සටහන් කිරීම සිරිතක් විය.

"පද්මං කුම්භශ්ච විහගෝ මණිශෙඛ් යථා ක්‍රමාත්
උපර්‍යුපරිතෝ ධෙයෝ නිපතාකෙ මහී භුජාම්"

(පියුම්ය, කලශය, පක්ෂි වර්ගයාය, මැණික්ය යන මේ වර්ගවලින් කමන්ට කැමැති දෙයක් රජුන්ගේ කොඩිවල යොදාගත යුත්තේය.)

යුරෝපා මහා ද්වීපයේ 'ඩ්‍යූතික්' වර්ගයේ රජුන්ගේ කොඩිවල ද රාජාලියාගේ රූ සටහන යොදා තුබුණු බැව් ජර්මන්වරුන්ගේ රාජකීය ධ්වජයෙන් ස්ඵුට වේ.

කුරු ක්ෂේත්‍රයෙහි රජුන් විසින් ද යථෝක්ත රාජාලි කොඩිය රාජකීය ලක්ෂණයක් වශයෙන් භාවිත කරන ලද්දේය. එහෙයින් කුරු වංශිකයන් ලංකාවට පැමිණි පසු රාජාලි කොඩිය වංශ ලක්ෂණයක් වශයෙන් භාවිතයට සිංහල රජුන්ගෙන් අවසර ලැබිණි.

**14 වෘෂභ කොඩිය:**

වෘෂභයා වූ කලී ගව රැළක ප්‍රධාන ගවයායි. අනෙක් ගවයන්ට වඩා විශේෂ ලක්ෂණවලින් හා ශක්තියෙන් ද යුක්ත වූ වෘෂභයා උත්තම සත්වයකු වශයෙන් ඈත



අතීතයෙහි පටන්ම සලකනු ලැබේ. වෘෂභයා මෙතරම් මහාජනතාවගේ සම්මානයට භාජනවූයේ ඊශ්වරයාගේ වාහනයද වෘෂභයකු වීමයි. භාරත දේශ වාසීහු 'නන්දි' නම් වෘෂභයාට අදත් පූද-පූජා පවත්වති. ඊශ්වර දේවාලයට අයත් කොඩිවල වෘෂභයාගේ රූ සටහන යෙදීම සිරිතකි. සමහර කෞරවයෝ ඊශ්වර දේවාලයන්හි ද දෙව කාර්‍යය සඳහා පත්වූහ. වෘෂභ කොඩිය ද භාවිතයට ගත්හ. රාජ කාර්‍යය සඳහා ලංකාවට සම්ප්‍රාප්ත වූ මේ කෞරව වංශවතුන්ට වෘෂභ කොඩිය භාවිතයට ද සිංහල රජුන්ගෙන් අවසර ලැබිණි.

**15. ඇත් කොඩිය:**

ඇතා වූ කලී සිවුපාවුන්ට ප්‍රධානය. යම් කිසි දෙයක මේ සතාගේ රූ සටහන යොදන්නේ එහි උතුම් බව හැඟවීම පිණිස ය. ගැමුණු රජ තුමා ද කණ්ඩුල (කඩොල්) ඇතු අරා යුද පිටියට ගියේ ය. එළාර රජ තුමා ද පර්වත ඇතු අරා රණ බිමට ආවේය. ඇතා මඟුල සම්මත සත්වයකු වශයෙන් කාගේත් සැලකිලි ලබති.

තවත් කිය යුතු කරුණකි කෞරව වංශයෙහි ප්‍රබල නරපතියකු වූ 'හස්තින්' නම් රජු විසින් 'හස්තිනා පුරය' ඉදි කරවන ලද්දේ ය. එය වූ කලී කුරු ක්ෂේත්‍රයෙහි රාජධානිය යි. සංස්කෘත භාෂාවෙන් ඇතාට 'හස්තින්' යන නාමය ව්‍යවහාර කෙරේ.

කුරු රටෙහි අගනුවර වූ හස්තිනා පුරයෙහි චන්ද්‍ර වංශික රජුන් විසින් ඇත් කොඩිය භාවිතයට පටන් ගන්නා ලද්දේ ස්වකීය රාජධානියෙහි නාමය හා හස්තින් රජුගේ නාමය ද සිහිපත් කිරීම සඳහා ය. එහෙයින් මෙ කොඩියට ඇතුන් යුවලකගේ රූ සටහන් යොදන්නේ.


ක්‍රි. ව 461 දී රජ වූ ධාතුසේන රජුගේ පුත්‍ර කාශ්‍යප, මොග්ගල්ලාන යන කුමරුවන් අතරේ ඇතිවූණු යුද්ධයෙන් පරාජය වූ මොග්ගල්ලාන කුමාරයා ඉන්දියාවට ගොස් කලක් (අවුරුදු ගණනක්) එහි වාසය කොට කෞරව වංශිකයන්ගෙන් ද සමන්විතවූ යුද්ධ සේනාවක් රැගෙන ලංකාවට අවුත් කාශ්‍යපයන් පැරදවූයේ ය යුද්ධයෙන් ජය ගත් මොග්ගල්ලාන තෙමේ සෙනෙවියන්ට ගරු සම්මාන දෙද්දී කෞරවයන්ට තමන් සතු ඇතු යුගළ යෙදූ කොඩිය භාවිතයටත් අවසර දුන්නේ ය

## 16. සක් ගෙඩිය බැඳි කොඩිය:

සක් ගෙඩිය ද මංගල සම්මත වස්තුවකි. බුදුන් වහන්සේගේ ශ්‍රී පාදයේ පිහිටි දෙ සිය සොළසක් මඟුල් ලකුණු අතුරින් සක් ගෙඩිය ද එකකි. දේවාලයන්හි තේවා සිරිත් පැවැත්වීමේදී සක් පිඹීම ද කරනු ලැබේ. දක්ෂිණාවෘත්ත සංඛය ද දුර්ලභ වස්තුවක් හැටියට සලකනු ලැබේ.

මෙ සේ මංගල වස්තුවක් වූ සක් ගෙඩිය කුරු රට රජුන් විසින් සිය කොඩිවල යොදන ලදින් එය කෞරවයන්ගේ වංශ ලක්ෂණයක් බවට පත් විය. පසු කලෙක කෞරවයෝ ලංකා තරණය කරද්දී මේ කොඩි ද ගෙනාවෝය. පුත්තලම් කොටුවේ ජය ග්‍රහණයෙන් ඉතා සතුටට පත් වූ ස වැනි පැරකුම්බා මහ රජාණන් විසින් අනෙක් කොඩි සමග සක් ගෙඩිය බැඳි කොඩිය ද ඔවුන්ගේ ගෞරවය සඳහා භාවිතයට අවසර දෙන ලදී.






## 17. මොණර කොඩිය:

මොණරා කොඩිය ද ඈත අතීතයෙහි පටන්ම කෞරව වංශිකයන්ගේ වංශ ලක්ෂණයක් වශයෙන් පාවිච්චි කරනු ලැබේ මොණරා වූ කලී කතරගම දෙවි මහ රජාණන්ගේ වාහනය යි.

"මුහු ණු සයකි අත් දෙළසකි මයුරා පිට වාහනේ
රුහුණු රටේ පිහිටි කන්දෙ කදිර දේව් රාජනේ"


කතරගම් දේවාලයේ දේව කාර්‍යයෙහි නියුක්ත වූවෝ කෞරව වංශිකයෝ ය. ඒ කරුණ ද මොණර කොඩිය කෞරවයන්ගේ වංශ ලක්ෂණයක් වීමට ප්‍රධාන හේතුවකි.



**18 ගුරුළා කොඩිය:**


ගුරුළා කොඩිය ද ඇත. අතීතයෙහි පටන්ම කෞරව වංශිකයන්ගේ වංශ ලක්ෂණයක් වී ඇත. ගුරුළා වනාහි විෂ්ණු දිව්‍ය රාජයන්ගේ වාහනය යි. දෙවි නුවර ශ්‍රී විෂ්ණු දේවාලයෙහි දේව කාර්යයෙහි නියුක්ත වූමෝ කෞරව වංශිකයෝ ය. ගුරුළා කොඩිය කෞරව වංශිකයන්ගේ වංශ ලක්ෂණයක් වීමට එය ද ප්‍රධාන හේතුවකි.





**19. තල් ගහ බැඳි කොඩිය:**

පංච පාණ්ඩව පක්ෂයෙහි ජයසක් නාද ශ්‍රවණයෙන් උත්සන්නවූ සංග්‍රාමෝද්‍යෝගයකට පත්වූ කෞරව සේනාධීශ්වර භීෂ්ම තෙමේ තාල මාක්ෂ ධ්වජය ගගන තලයෙහි ලීලෝපේත කරවමින් සමඟීය යුද්ධ රථය යුද්ධාංගණයට යොමු කෙළේ ය. (තල් ගහ බැඳි කොඩිය කෞරවයන් සතු බවට මෙය නිදසුනකි. 386 පිටුව-භාරත ගීතය.)





**20. ඉර හඳ කොඩිය:** (xvi පිටුව)

මේ කොඩිය සතර වටේ මල් ලිය කමින් සරසා ඇත. හිරු සඳු දෙදෙනාගේ රූ සටහන් හා තරු විසි එකක් ද මේ කොඩියට ඇතුලත්ව තිබේ කරුවේ ප්‍රභේද විසි එකක් ඇති නිසා මෙසේ තරු විසි එකක් යොදනු ලැබුවේ ද? එසේ නොවේ නම් ගෞරවයේ ලක්‍ෂණයක් වශයෙන් තරු විසි එකක් යොදනු ලැබුවේ ද? (දූනුදු රාජකීයයන්ට ගරු බුහුමන් දක්වීමේදී කාලතුවක්කු වෙඩි විසි එකකින් ආචාර වෙඩි මුරය පවත්වනු ලැබේ.) කොඩි 2 වෙනුවට තරු 21 ක් යොදා ඇතැයි ද සලකන්නට ඉඩ තිබේ

**21 මකරයා කොඩිය:** (xvii පිටුව)

ගජේන්ද්‍රං හස්තං කෘත පාද සිංහං
කරාල දන්තං හනුමච් නේත්‍රම්
වරාහ කර්ණං කෘත මත්ස්‍ය දේහං
විචිත්‍ර පත්‍රං මකරස්‍ය රූපං

(රූප වල්ලිය)

(ඇත් හොඬය, සිංහ පාද, කිඹුල් දත්, වානර ඇස්, වලස් හෝ හූරු කන්, මත්ස්‍ය ශරීර යන මේ අවයවයන්ගෙන් යුක්තවූ රූපය මකරයා නමින් හැඳින් වේ.) මෙය කෞරව වංශිකයන්ගේ වංශ ලක්‍ෂණයක් වශයෙන් පෙර සිට භාවිතයට ගෙන ඇත




සුදු ඇතු බැඳි කොඩිය



හලාවත කොඩිය






**කෞරව වංශිකයන්ගේ රාජ ලක්ෂණයෝ**

මේ සිතුවමින් දැක්වෙනුයේ කෞරව වංශිකයන් පමණක් ඔවුන්ගේ උත්සවයන්හිදී භාවිතයට ගෙන ඇති රාජකීය ලක්ෂණයෝ වෙති 1 මුතු කුඩය 2 ඉර ලකුණ දරණ ආලවට්ටම 3. හඳ ලකුණ දරණ ආලවට්ටම 4 ඉර-හඳ කොඩිය 5 මකරයා කොඩිය 6 ත්‍රිසූලය 7 කඩුව 8 හා 9. (ෂේඩ් ලාම්පු) දවල් පන්දම් යුවළත්‍රය. (මේ හැර හෙවිසි, පාවාඩ තල් අතු හා මුර ආයුධත් උත්සවයන්හිදී භාවිතයට ගනිති.)

**කුරු-පාණ්ඩව යුද්ධයට සම්බන්ධ වුණු රජකීයයෝ:-**

කර්ණ, අභිමන්‍යු, අර්ජුන, උත්තර, ජයද්‍රථ, ජරාසන්ධ, සුශර්ම, දුර්යෝධන, දුඃශාසන, ද්‍රැපද, දේවව්‍රත (භීෂ්ම) ශ්‍රී කෘෂ්ණ, බලරාම, භගදත්ත, භීම, යුධිෂ්ඨිර, යුයුත්සු, විදුර, ශ්වේත, සාම්බ, ශකුණි, ශිඛණ්ඩින්, ශිශුපාල, ධෘතරාෂ්ට්‍ර, සල්‍ය, සත්‍යකී, සහදේව, නකුල, විකර්ණ, සුෂේණ, චිත්‍රසේන, සත්‍යසේන, ධෘෂ්ටද්‍යුම්න, සුනාභ, ආදිකේතු, බහ්වාශී, කුණ්ඩධාර, මහෝදර, ඉරවාන්, ඝටෝත්කච, ලක්ෂමණ යන රජකීයයෝ කුරු-පාණ්ඩව යුද්ධයට සහභාගී වූහ.

**කුරු පාණ්ඩව යුද්ධයෙහි සේනාධි නායකයෝ:**

ද්‍රෝණ, කෘප, ශකුනි, ශතවර්මා, අශ්වත්ථාමා, කෘතවර්මා, සුදක්ෂිණ, දුර්යෝධන, භීෂ්ම, දුශ්ශාසන, භූරිශ්‍රව, විකර්ණ, භගදත්ත, භීම, අර්ජුන, අභිමන්‍යු, ධෘෂ්ටද්‍යුම්න, කර්ණ, ශ්‍රී කෘෂ්ණ, යුධිෂ්ඨිර, ශිඛණ්ඩින් යන සේනාධි නායකයෝ මේ මහා සංග්‍රාමයෙහි සේනා මෙහෙයවූහ.

---



**කෞරව වංශයෙහි වූ ද, එයට සම්බන්ධකම් ඇත්තා වූ ද රජ දරුවෝ:**

යයාති, අනු, සභානර, චාක්ෂුෂ, පරමේක්ෂ, කාලානර, සෘඤ්ජය i; පුරඤ්ජය, ජනමේජ i; මහාමණි, මහාමනස්, උසීනර, තිතික්ෂු, ශිවි, නෘග, නර, කෘමි, දර්ව; වෘෂදර්භ, සුවීර, කෛකේය, මද්‍රකය උෂද්‍රථ, හේම; සුතපස්, බලි, අංග i, වංග, කලිංග, සුහ්ම, පුණ්ඩ්‍ර, අංග ii පාර i; දිවිරථ ධර්මරථ, චිත්‍රරථ, සත්‍යව්‍රත, (රෝම පාද) දශරථ, චතුරංග, පෘථුලාක්ෂ, චම්ප, හර්යඞ්ග, භද්‍රරථ, බෘහත්රථ, බෘහත්කර්මන්, බෘහත්-භානු, බෘහත්මනස්, ජයත්රථ, විජය, ධෘති, ධෘතව්‍රත, සත්‍යකර්මන්, කර්ණ, වෘෂසේන, — පූරු, ජනමේජය ii ප්‍රචින්වත්, ප්‍රවීර, මනස්‍යු, අභයද, සුද්‍යුම්න, බහුගව, සංයාති, අහංයාති රෞද්‍රාශ්ව, ඍතෙයුද, කක්ෂෙයුද, ස්ථණ්ඩිලෙයුද, ජලෙයුද, ස්ථලේයුද, සන්නතෙයුද, ධනෙයුද, වනෙයුද, ව්‍රතේයුස රන්තිනාර, අප්‍රතිරථ, ධෘව, කණ්ව i, මේධාතිථි, තංසු, අනිල, දුෂ්‍යන්ත, භරත, භාරමාජ, විතථ, භවන්මන්‍යු, බෘහත්ක්ෂත්‍ර, මහාවීර්‍ය, යනරය, සුහොත්‍ර, සුහොතාර, ගය, ගර්ග, කපිල, කාශක, ගෘත්සමති, සංකෘති, රුචිරධී, රන්තිදේව, ශිනි, උරුක්ෂය, ත්‍රය්‍යාරුණ පුෂ්කරින්, කපිද, හස්තින්, අජමීඪ, ද්විමීඪ i, පුරුමීඪ, කණ්ව ii, බෘහදිෂු, බෘහද්වසු, වෘහත්කර්මන් ජයත්රථ, විශ්වජිත්, සේනාජිත්, රුචිරාශ්ව, කාශ්‍ය, දෘඪදනුශ්, වත්සහනු, පෘථුසේන, පාර ii, නීප, සමර, පාර iii, සම්පාර, සදශ්ව, පෘථු, සුකෘති, විභ්‍රාජ, අනුහ, බ්‍රහ්මදත්ත, විශ්වක්සේන, උදකසේන, භල්ලාට, ද්විමීඪ ii, යවීනර, ධෘතිමත්, සත්‍යධෘති, දෘඪනේමි, සුපාර්ශ්ව, සුමති, සන්නතිමත්, කෘත, උග්‍රායුධ, ක්ෂෙම්‍ය, සුවීර, නෘපඤ්ජය ii, බහුරථ, නීල, ශාන්ති, සුශාන්ති, පුරුජානු, චක්ෂු, හර්යශ්ව, මුද්ගල සෘඤ්ජය ii, බෘහදිෂු, ප්‍රවීර, කාම්පිල්‍ය, බහ්වශ්ව, දිවෝදාස, ශරද්වත්, ශතානන්ද, සත්‍යධෘති, මිත්‍රායු,

ච්‍යවන i, සුදාස, සෞදාස, සහදේව, සෝමක ජන්තු i, පෘෂත, ද්‍රෘපද, ධෘෂ්ටද්‍යුම්න, ධෘෂ්ටකේතු සෘක්ෂ, සංවරණ, කුරු, සුධනුස්, ජහ්නු, පරික්ෂිත් i සුහෝත්‍ර, ච්‍යවන ii, කෘතක, වසු. බෘහද්‍රථ, ප්‍රත්‍යග්‍ර කුශාම්බ, මාවෙල්ල, මත්ස්‍ය, කුශාග්‍ර, ඍෂභ, පුෂ්පවත්, සත්‍යධෘත, සුධන්වන්, ජන්තු ii ජරාසන්ධ, සහදේව, සෝමාපි, ශ්‍රැතශ්‍රව, ජනමේජ iii, ශ්‍රැතසේන, උග්‍රසේන භීමසේන i, සුරථ, විදූරථ, සාර්වභෞම, ජයසේන, ආරාවින්, අයුතායුස්, අක්‍රොධන, දේවාතිථි, සෘක්ෂ, භීමසේන ii, දිලීප,[1] ප්‍රතීප, දෙවාපි, ශාන්තනු බාහ්ලීක, සෝමදත්ත, භූරි, භූරිශ්‍රවස්, ශල, භීෂ්ම චිත්‍රාංගද, විචිත්‍රවීර්‍ය්‍ය, ධෘතරාෂ්ට්‍ර, පාණ්ඩු, විදුර, දුර්යෝධන, දුඃශාසන, යුධිෂ්ඨිර, භීමසේන iii, අර්ජුන, නකුල, සහදේව, ප්‍රතිවින්ධ්‍ය, සුතසෝම, ශ්‍රැතකීර්ති, ශතානීක, ශ්‍රැතකර්මන්, දේවක, ඝටෝත්කච, සර්වත්‍රග, සුහෝත්‍ර, නිරමිත්‍ර, ඉරාවත්, බභ්‍රැවාහන, අභිමන්‍යු හා පරික්ෂිත් ii ය.

1 මහා කවි කාලිදාසයන්ගේ රඝු වංශ මහා කාව්‍යයෙහි කාව්‍ය නායකයා වශයෙන් දැක්වෙන්නේ මේ රජ තුමා විය යුතු ය.

# විදේශීය ගරු නම් හා උත්තම පදවි ලැබූ කෞරව වංශික උතුමන් හා උත්තමාවෝ

## පූජ්‍ය පක්ෂය

### උප සංඝ රාජ මහා නායක පදවිය

අම්බලම්ගොඩ දේවානන්දාභිධාන උප සංඝ රාජ මහා නායක ස්වාමීන්ද්‍රයෝ.

කටුදම්පේ මාලාලංකාරාභිධාන උප සංඝ රාජ මහා නායක ස්වාමීන්ද්‍රයෝ

(බුරුම සංඝ රාජයන් ඇතුළු සංඝ සභාවෙන්)

### අග්ග මහා පණ්ඩිත නාමය

බේරුවල සිරිනිවාසාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයෝ
පොල්වත්තේ බුද්ධදත්ත මහා නායක ස්වාමීන්ද්‍රයෝ

(බුරුම රජයෙන්)

### පණ්ඩිතාචාර්ය නාමය හා ස්වර්ණ මුද්‍රිකාව

වැලිපටන්විල දීපංකර මහා ස්ථවිරයන් වහන්සේ

(කාම්බෝජයේ රජ තුමන්ගෙන්)

### ශ්‍රී බෞද්ධ සිද්ධාන්තාචාර්ය නාමය

සී. ඒ. ශ්‍රී සීලස්කන්ධාභිධාන ප්‍රධාන නායක ස්වාමීන්ද්‍රයෝ

(ශ්‍රී අප්පා ශාස්ත්‍රී විද්‍යාවාචස්පති බ්‍රාහ්මණ පඬි තුමාගෙන්)

### සිරි ලංකා සාසනාලංකාර කවිධජ නාමය

ආභිධම්මික මොරටුවේ මේධානන්ද අධිකරණ නායක ස්වාමීන්ද්‍රයෝ

(බුරුම සංඝ රාජයන් ඇතුළු සංඝ සභාවෙන්)

### රෝමානු කතෝලික සභාවේ බිෂොප් පදවිය

අතිගරු ඇඩ්මන්ඩ් පීරිස්

හලාවත රාජගුරු ප්‍රසාදීන් වහන්සේ

### විකාර් ජනරාල් පදවිය

මොන්සිඤෝර් හියුගෝ ප්‍රනාන්දු පූජා ප්‍රසාදීන් වහන්සේ

ඇස්. ජී. පෙරේරා පූජා ප්‍රසාදීන් වහන්සේ

### 'මොන්සිඤෝර්' යන නිල නාමය

අති ගෞරවනීය පියුස් ප්‍රනාන්දු පූජා ප්‍රසාදීන් වහන්සේ
(මීගමු මහ වීදියෙන් - සේවය කළේ නුවර පදවියේ)

අති ගෞරවනීය වින්සන්ට් ප්‍රනාන්දු පූජා ප්‍රසාදීන් වහන්සේ
(කොළඹින් - සේවය කළේ ගාලු පදවියේ)

අති ගෞරවනීය පී දෙන් පීටර් පූජා ප්‍රසාදීන් වහන්සේ
(බේරුවලින් - සේවය කළේ කොළඹ)

(මේ තුන් නම නිල නාමය ලැබුවේ ශුද්ධොත්තම පාප් වහන්සේලාගෙන්)

මෙහි මතු නම් සඳහන් වන දෙ නම 'විකාර් ජනරාල්' ධුරය දරූ නිසා එතුමන්ට ඉහත කී නිල නාමය අත් වේ.

අති ගෞරවනීය හියුගෝ ප්‍රනාන්දු පූජා ප්‍රසාදීන් වහන්සේ
(බෝලවත්තෙන් - සේවය කළේ හලාවත පදවියේ)

අති ගෞරවනීය බී මයිකල් පෙරේරා පූජා ප්‍රසාදීන් වහන්සේ
(කටුවාපිටියෙන් - සේවය කරන්නේ හලාවත පදවියේ)

### ලංකා සභාවේ බිෂොප් පදවිය

අතිගරු ලක්දාස් ද මැල් කුරුණෑගල බිෂොප් තුමාණෝ



### ආච්ඩිකන් පදවිය

වන්දනීය හැරල්ඩ් ද සොයිසා දේවගැති තුමාණෝ

### කැනන් පදවිය

ගරු ජේකොබ් මැන්ඩිස් දේවගැති තුමාණෝ

ගරු හැරල්ඩ් ද මැල් දේවගැති තුමාණෝ

## ගෘහස්ථ පක්ෂය

### ප්‍රිවිකවුන්සිලර් නාමය

එංගලන්තයේ හා ලංකාවේ රාජ නීතිඥ

අතිගරු ඇල්. ඇම්. ඩී. ද සිල්වා මැති තුමා

(අග රැජිනගෙන්)

### එංගලන්තයේ රාජ නීතිඥ පදවිය

අතිගරු. ඇල්. ඇම්. ඩී. ද සිල්වා මැතිතුමා

**නයිට් පදවිය හා ලේඩි පදවිය** (ඉංග්‍රීසි ආණ්ඩුවෙන්)

කැතරින් ද සොයිසා ආයනීව

සර් මාකස් ප්‍රනාන්දු මැති තුමා
ප්‍රනාන්දු ආයනීව

සර් ජේම්ස් පීරිස් මැති තුමා
පීරිස් ආයනීව

සර් විල්ප්‍රෙඩ් ද සොයිසා මැති තුමා
ද සොයිසා ආයනීව

සර් එච්. ඇල්. ද මැල් මැති තුමා
ද මැල් ආයනීව

සර් සුසන්තා ද පොන්සේකා මැති තුමා
ද පොන්සේකා ආයනීව

සර් බැනට් සොයිසා මැති තුමා
සොයිසා ආයනීව

සර් පිලිප් රුද්‍රිගු මැති තුමා
රුද්‍රිගු ආයකීාව

සර් ලියෝ ප්‍රනාන්දු මැති තුමා
ප්‍රනාන්දු ආයකීාව

සර් අර්නස්ට් ප්‍රනාන්දු මැති තුමා
ප්‍රනාන්දු ආයකීාව

### චැවලියර් නයිට් නාමය

ජුසේ ද සිල්වා චැවලියර් තුමා
එච් බැස්ටියන් ප්‍රනාන්දු මැති තුමා
සී. එච් ඉසැඩ් ප්‍රනාන්දු මැති තුමා
ඇස්. පිලිප් රුද්‍රිගු මැති තුමා
(පාප් වහන්සේගෙන්)

සර්. එච්. ඇල් ද මැල් මැති තුමා
(බැල්ජියම් රජතුමාගෙන්)

### රාජ රුචි නාමය

සෞඛ්‍යාමාත්‍ය: ඩබ්ලිව්. ආතර් ද සිල්වා මැති තුමා
(සියම් රජ තුමාගෙන්)

### කාශ රෝග මර්දන ව්‍යාපාරය පිළිබඳ අධිරාජ්‍ය පදක්කම

ජේ. එච්. ඇෆ්. ජයසූරිය වෛද්‍යාචාර්ය තුමා

### බෙනමෙරෙන්ති පදක්කම

වර්ණකුලසූරිය ජෙරමියස් ප්‍රනාන්දු මුදලි තුමා
වර්ණකුලසූරිය බෙනඩික් තිසේරා මැති තුමා
මහ ලේකම්ගේ කසිතේරු ප්‍රනාන්දු මැති තුමා
ඒ මෝසෙස් සිල්වා මැති තුමා
ජෝන් ජේ ප්‍රනාන්දු මැති තුමා
එලිසබත් සර්ජිනා ද සිල්වා මැතිනිය



### ගර්භනීන් පිළිබඳ මහා වෛද්‍ය ග්‍රන්ථයක් සම්පාදනය කිරීමේ ත්‍යාගය

ජේ. ඩබ්ලිව්. වික්‍රමසූරිය වෛද්‍යාචාර්ය තුමා

### ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විනිශ්චයකාර වරු

ඇම්. ඩබ්ලිව් එච්. ද සිල්වා මැති තුමා
වී ඇම් ප්‍රනාන්දු මැති තුමා
ඒ. ආර් එච්. කනකරත්න මැති තුමා
ඇල් ඇම් ඩී. ද සිල්වා මැති තුමා
සැක්ස්ටස් ගුණසේකර මැති තුමා
වැලන්ටයින් ඇස්. ජයවික්‍රම මැති තුමා
ටී ඇස්. ප්‍රනාන්දු මැති තුමා
එච්. ඇන්. ජී. ප්‍රනාන්දු මැති තුමා
එච්. ඩබ්ලිව් ආර්. වීරසූරිය මැති තුමා
ඇල් බී ද සිල්වා මැති තුමා

### පාබල හමුදා නායක වරු

කර්නල් ටී. ජී. ඇෆ්. මැන්දිස් මැති තුමා
කර්නල් මොරිස් ද මැල් මැති තුමා

### අහස් හමුදා නායක වරු

කැප්ටන් ඩේවිඩ් පීරිස් මැති තුමා

### නාවුක හමුදා නායක වරු

අද්මිරාල් රොයිස් ද මැල් මැති තුමා

### පොලිස්පති වරු

ඔස්මන් ද සිල්වා මැති තුමා

### ජනරල් වරු

පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල් - ඔස්මන් ද සිල්වා මැති තුමා
රෙජිස්ට්‍රාර් ජනරල් - ඇන්. කිවු. ඩයස් මැති තුමා
,, ජී. ආර්. ද සිල්වා මැති තුමා
ඇටෝර්නි ජනරල් - ඇල්. ඇම්. ඩී. ද සිල්වා මැති තුමා
සොලිසිටර් ජනරාල් - ඇල්. ඇම්. ඩී. ද සිල්වා මැති තුමා
,, ටී. ඇස් ප්‍රනාන්දු මැති තුමා
,, ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා මැති තුමා

### කෞරව වංශිකයන් විසින් දැරූවාවූ ද, දැනට දරන්නාවූ ද වෙනත් උසස් නිල

**වී. ඇස්. ඇම්. ද මැල් මැති තුමා** - කොළඹ මහා දිශාපති පදවිය
**බී. ඇෆ්. පෙරේරා මැති තුමා** - නිත්‍ය ලේකම් පදවිය
**ඇස්. සී. ප්‍රනාන්දු මැති තුමා** - ,,
**ඇන්. කිවු ඩයස් මැති තුමා** - ,,
**ඇල්. ඇස්. බී. පෙරේරා මැති තුමා** ,,
**ජී. පී. ඒ. සිල්වා මැති තුමා** ,,
**ඇම්. ඩබ්ලිව්. චන්ද්‍රසෝම මැති තුමා** - කොළඹ වරායේ පාලක ධුරය

### තානාපති හා වෙළෙඳ කොමසාරිස් පදවි ලත් කෞරව වංශිකයෝ

සුසන්තා ද පොන්සේකා මැති තුමා
විල්මට් ඒ. පෙරේරා මැති තුමා
බී. ඇෆ්. පෙරේරා මැති තුමා
ජී. කේ. ඩබ්ලිව්. පෙරේරා මැති තුමා
ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා මැති තුමා

# කෞරව වංශ කථාව

## නමවූ මුනි සරණ

**පෙර මහරූ මහ රජ - යස පිළිබිඹු ගොස් බස**
**කැට තෙලෙහි සිටිනෙපෙණෙ - පිළි ඹවුන නම කල්හිඳු**

(පුරාණ කාලයෙහි විසූ උතුම් වූ මහ රජ දරුවන්ගේ කීර්ති නමැති ප්‍රතිබිම්බය (පින්තූරය) වචන නමැති (පොත් - පත්) කැටපතට පැමිණ ඒ රජ දරුවන් නැති අවදියෙහිදු (ජීවමානාකාරයෙන්) දර්ශනය වේ.

(සිය බස් ලකර)

සිංහල මහා ජනතාව අතර කරාව නමින් ප්‍රසිද්ධ කුලයක් ඇත. ඒ කුලයෙහි වූ දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාවට අවුරුදු හාර දහසකටත් පැරණි ඉතිහාසයක් ඇත. ඒ ඉතිහාසය අපට දැනගන්ට ලැබුණු පමණින් මෙහි සැකෙවින් දක්වමු.

## කුරු රට හා කුරු කුලය

කෞරව (කුරු, කෝරව්‍ය, කරාව) වංශිකයන්ගේ මුල් රට භාරත දේශයෙහි කුරු නම් ප්‍රදේශය යි. ඈත අතීතයේ පටන්ම කුරු රට ශිෂ්ට මනුෂ්‍යයන්ගේ වාස භූමියක්ව තුබුණු බැව් ඉතිහාස නයින් පෙනේ.

අශ්වත්ථ බෝධි මූලයෙහි විදුරසුන්හි වැඩ හිඳ සවාසනා සකල ක්ලේශයන් හා සපිරිවාර මාර පරාජය කොට ලොවුතුරා බුදුව සත් සති යවා බ්‍රහ්මාරාධනයෙන් බරණැස ඉසිපතනන්හි දම්සක් පවත්වා එතැන්පටන් අන්තෝ, මධ්‍ය, මහා මණ්ඩල සංඛ්‍යාත මණ්ඩල ත්‍රයෙහි සැරි සරා දහම් වැසි වස්වා සත්ත්වානුග්‍රහ කර වදාරණ බුදුරජාණන් වහන්සේ එක් කලෙක කුරු දේශයට වැඩ වදාළ සේක.

ඒ කුරු රට වාසීහු නම් මහාමන්ධාතු නම් වූ චක්‍රවර්ති රජ කල ඒ රජ සතර මහාවීප වාසීන්ට අනුශාසනා පිණිස ගිය ගමනෙහි සෙසු තුන් දිවයින්වලින් ම චක්‍ර රත්නානුසාරයෙන් කැමැති තාක් අහසට නැඟී ඒ රජ හා එක්ව ආ සේනාවය නැවත ඒ රජ මෙයට වඩා දෙව් ලොව සැප උතුමැයි අසා, එහි යනු කැමැතිව, එසේම පරිවාර සහිතව චතුර් මහා රාජික දෙව් ලොවට ගොස් එහි සිට දිව සිරි විඳ, එයින් නික්ම ශක්‍ර පුරයට යන කල්හි ඒ රජ එක්ව ගිය සියලු පිරිසම එතැන්හි නැවතී චක්‍ර රත්නය හා එක්ව දඹදිවට බැස චක්‍ර රත්නය දෙවනු ගමන් නැති හෙයින් ඒ රජහුගේ ප්‍රධාන පුත් රුවන වූ පරිනායක රත්නය කරා පැමිණ ''ස්වාමීනි, අපට විසීමට නිසි භූමි ප්‍රදේශයක් දුන මැනවැ''යි කියා ඉල්වාගෙන දඹදිව ම විසුවාහුය.

එයින් පූර්ව විදේහයෙන් ආ මිනිසුන් විසූ රට පළමු සංඥ ලෙසම විදේහ රට නම් විය. අපරගෝයානයෙන් ආ මිනිසුන් විසූ රට අපරන්තක නම් දනව් විය. උතුරු කුරු දිවයිනෙන් ආ මිනිසුන් විසූ රට කුරු රට නම් විය. එසේ ලද නම් ඇති ඒ කුරු දේශය ඍතු ප්‍රත්‍යයාදියෙන් සමෘද්ධව (කල නොවරදවා ඒ ඒ කලට නිසි ලෙස පවත්නා වර්ෂා ශීතෝෂ්ණාදි ඍතු යහපත්ව) පැවතීමෙන් සුලභ වූ ආහාර පාන වර්ග ඇති හෙයින් එහි වසන භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවණක් පාරිසද්‍යයෝම සුඛ විහරණ ඇත්තෝය. ප්‍රත්‍යයාදීන් කලාතන්ත වීමක් නොව සැප විහරණ ඇති බැවින් ඒ හැම නිරන්තරයෙන් නීරෝගව ප්‍රසන්න වූ අකර්කශ මෘදු මනා ශරීර හා සිත් ඇත්තාහුය එසේම ප්‍රත්‍යයෙන් අකලාන්තව කාය – චිත්ත පීඩාවක් නොව ලබන ලද ප්‍රඥා බල ඇති හෙයින් ඒ රට වාසීහු ගම්භීර ධර්ම කථා අසා පිළිගැන්මට සමර්ථයහ.

තවද ඒ දනව් වැසි සිවුවණක් පිරිස්හුම දාන, ශීල, භාවනාදී කුශල ධර්මයන්හි යෙදී අප්‍රමාදව වසන බැවින් ස්වභාවයෙන් ම සතිපට්ඨාන භාවනාවෙහි යෙදී වාසය



කරන්නාහුය. එහෙයින් යටත් පිරිසෙයින් එහි වසන දාසි-දස් කම්කරු පිරිවර ජනයෝද එක්වූ විට සතිපට්ඨාන ප්‍රතිසංයුක්ත කථාවක් ම කරන්නාහු ය. එහෙයින් පැන් තොටට යන තැන් හා නූල් කටින තැන් ආදී වූ ඒ-ඒ තන්හි එක්වූ කල ස්ත්‍රීහු වී නමුත් නිරර්ථක කථා පැවැත්වීමක් නොකරන්නා හ. ඉදින් යම්කිසි ස්ත්‍රියක් අනික් ස්ත්‍රියකට 'මෑණියෙනි, තොපි කවර සතිපට්ඨාන භාවනාවක් සිහිකරන්නහුද, යි විචාල කල කිසි භාවනාවක් නැතැයි කිවහොත් ඇට ගර්හා කොට 'තිගේ ජීවිතයම නින්ද, වේවයි, ජීවත් වී නමුදු මළාක් වැනිය' යි කියා මෙසේ ප්‍රමාද වීමක් නැවත නොකරවයි අවවාද කොට එක්තරා සතිපට්ඨාන භාවනාවක් උගන්වන්නී ය. යම් ස්ත්‍රියක් 'මම අසුවල් සතිපට්ඨාන භාවනාව සිහි කෙරෙමි'යි කියා නම් ඇට ඉතා ප්‍රශංසා කොට සාධුකාර දී 'තොප ලද ජීවිතය ජීවිතය නම් වෙයි, මිනිසත් බවට නීම පැමිණියා නම් වෙයි. තොපට ම වැඩ පිණිස බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූසේකැ' යි යනාදීන් ප්‍රශංසා කරන්නී ය.

මෙසේ එහි වසන්නවුන් භාවනාවෙහි ඇලුම් ඇති හෙයින්දැ යි මේ ආදී නොයෙක් කාරණයෙන් අ
භාග්‍යවතුන්වහන්සේ ඒ කුරු රට වාසීන්ට මේ සතිපට්ඨා
සූත්‍ර දේශනාවෙන් වන මහත් අභිවෘද්ධිය ම දැක වදාරා යම් සේ පුරුෂයෙක් රන් කරඬුවක් හෝ සුවර්ණ මඤ්ජුසාවක් හෝ ලැබ අනේක ප්‍රකාර විසිතුරු මල්, මුතු, මැණික් ආදී වූ මාහැඟි රත්නයන් එහි සුරක්ෂිත කොට තබා රක්ෂා කරන්නේ ද? එපරිද්දෙන් ම ගම්භීර ධර්මයන් පිළිගැන්මෙහි සමර්ථ වූ කුරු රට වාසී පිරිස ලදින් මෙයින් අන්‍ය වූ ද ගම්භීරාර්ථ ඇති දීර්ඝ නිකායෙහි මහා නිධාන සූත්‍රය, (මහා සතිපට්ඨාන සූත්‍රය) මධ්‍යම නිකායෙහි සාරෝපම සූත්‍රය, රුක්ඛූපම සූත්‍රය, මාගන්දිය සූත්‍රය, ආනඤ්ජ සප්පාය සූත්‍රය සහ අන්‍ය වූ ද නොයෙක් සූත්‍ර දේශනාවන් ඒ කුරු රට දීම පැවැත්වූ සේක.

(සන්න සහිත මහා සතිපට්ඨාන සූත්‍රය 2-3-4-5 පිටු)

**මේ නයින් සලකා බලන විට කෞරව (කුරු) වංශිකයන්ගේ මුල් භූමිය වූ කුරු රට ඈත අතීතයේ පටන් ම ඥාන වෘද්ධ වූ ද, තපෝ වෘද්ධ වූ ද මනුෂ්‍යයන්ගේ වාසභූමියක් ව ධන-ධාන්‍යයෙන් සමෘද්ධව තුබුණු බැව් පෙනේ.**

සංස්කෘත භාෂාවේ **කෞරව යන වංශය සිංහලයෙන්** දක්වෙන්නේ 'කරාව' **නමිනි. මේ කෞරව යන** වචනයේ හා කරාව යන වචනයෙහිත් **ප්‍රාණාක්ෂරයන්ගේ** වෙනස මිස (ක්-ර්-ව්) ගාත්‍රාක්ෂරයන්ගේ **කිසිත් වෙනසක්** නොපෙනේ (පාලි භාෂාවෙන් **'කොරව්‍ය'** යයි ව්‍යවහාර කරන්නේත් කරාවේ වංශයටමැ යි.)

"කුරෝර පත්‍යං කෞරවඃ" යි කුරුහුගේ පුත්‍ර කෞරව **නමින් නම් වෙයි,** යන **මේ අර්ථයෙහි කෞරව** යන්න කුරු ගෙන් උපන් බැවින් **දූන්** කුරු යනු කවරෙක්ද යි නැවතත් විස්තර කර බැලිය යුතු. කුරු යනු චන්ද්‍ර වංශයෙහි වූ රජ කෙනෙක් යයි ශබ්දස්තෝම මහානිධියෙහි කියන ලදී.

> කෞරව යනු මහා භාරතයෙහි මෙසේ දක්නා ලැබේ.
> සෘක්ෂාත් සංවරණෙ ජඥෙ කුරුඃ සංවරණාත්තථා
> යඃ ප්‍රයාගාදතික්‍රම්‍ය කුරු ක්ෂෙත්‍රං චකාරහ
> පුණ්‍යඤ්ච රමණීයඤ්ච පුණ්‍ය කෘද්භිර් නිෂෙවිතං
> තස්‍යාන්වවායඃ **සුමහාන්** යස්‍ය **නාමසඨ** කෞරවාඃ

(සෘක්ෂු රජු කෙරෙන් සංවරණ කුමාරයා උපන්නේ ය. එසේ ම සංවරණ කෙරෙන් කුරු කුමාර තෙම උපන්නේය. ප්‍රයාග තීර්ථය ඉක්මවා සුචරිතයෙහි යෙදෙන්නවුන් විසින් ආශ්‍රය කරන ලද්ද, වූ සිත්කලු වූ පුණ්‍ය **භූමියක්** වූ කුරු ක්ෂෙත්‍රය මේ රජ තෙම කෙළේ ය. කෞරව හෙවත් කරාව යන නම් ඇති සමූහයා යමෙකුගේ නාමයෙන් වූවෝ ද? පූජ්‍ය වූ කෞරව යන ගෝත්‍රය තෙම ඒ කුරු රජුගේ වංශය වෙයි. කුරු රජුගෙන් ඉපද පැවත එන්නා වූ දරු මුණුපුරු පරම්පරාවේ සමූහයා කෞරව යන නම් ඇතිවූවෝ ය. යනු යථොක්ත ශ්ලෝකවල අදහස යි).



කෞරව යන ශබ්දය කුරු රාජ පරම්පරාවය යනු සැක නොකරමු. තවද ශබ්දස්තෝම මහානිධියෙහි කෞරව යන්නෙහි අර්ථ දක්වමින් කුරු රාජ වංශයෙහි වෙයි යනු කියන ලදී. ශබ්දාම්බුධියෙහි ද එසේ ම කීයේ ය. කෞරව යන්න ම සමහර තැනෙක එම භාෂාවෙන් කොරව්‍ය කියා ද දක්නා ලැබේ. කෞරව යන ශබ්දය සිංහල භාෂාවට භේද වන කල 'කරාව' කියා පෙරළී තිබෙන්නේ සිංහල භාෂාවෙහි 'කෞ' යන අක්ෂරය නැති බැවිනැ යි සිතමු. එක භාෂාවක ශබ්ද තවත් භාෂාවකින් ව්‍යවහාර කරන කල එබඳු වෙනස්කම් හට ගැනීම සවභාවයක්මැයි.

කෞරව යන ශබ්දය පාලි භාෂාවට පෙරළී පාලි පොත්වල දකින්නට තිබෙන්නේ 'කොරව්‍ය' කියා යි. මෙම ශබ්දය ම සමහර ප්‍රාකෘත භාෂාවලින් 'කවුරව' කියාද, 'කඋරඹ' කියාද, වෙනස්-වෙනස් වූ ශබ්දවලින් ව්‍යවහාර ව තිබෙන බව වරරුචි ආචාර්‍ය තෙම කීයේය. තවද කුරු කුල යන නාමයක් කරාවේ මිනිසුන්ට බොහෝ සේ දක්නා ලැබේ. (අනෙක් කුලවතුන්ට ඒ නම නොයෙදේ.) මොරටුව, කොළඹ, මීගමුව, හලාවත යනාදී පළාත්වල දහස් ගණනක් සමූහයාට ගෝත්‍ර නාමයක් හැටියට මේ කුරුකුල යන නාමය කියති. කුරු කුල යන්න යෙදී තිබෙන ශබ්ද දෙක වෙනස් කළ කල්හි 'කුරු' යනු රජ කෙනෙකුගේ නාමයයි. 'කුල' යනු ඒ රජහුගේ ගෝත්‍රය හෙවත් වංශ යයි. මේ ශබ්ද දෙක එක් ව සෑදෙන 'කුරු කුල' යනු කුරු රාජ වංශය යි.

කෞරව-කරාවේ අය (අමර ශබ්දවලී අකාරාදිය 102 පිටුව)

මී ලඟට කුරුදේශය මධ්‍ය දේශයේ කොයි පළාතක පිහිටි රටක් ද යනු දැක්වීම දූන් ප්‍රයෝජන ව පෙණේ.

(වරාහ සංහිතාවෙහි)

**"'උත්තරතඃ කෛලාසො හිමවාන් වසුමාන් ගිරිර්ධනුෂ්මාංශ්ච කෞඤ්චෝ මේරුඃ කුරුවස්තථොත්තරාඃ ක්ෂුද්‍රමීනාශ්ච"**

කුරු දේශය මධ්‍ය මණ්ඩලයෙහි උතුරු දිග පිහිටි බව මේ ශ්ලෝකයෙහි දක්වන ලදී.

මහා භාරතයෙහි කුරු දේශය දක්වන ශ්ලෝකය මෙසේයි.

"හස්තිනා පුර* මාරභ්‍ය කුරුක්ෂෙත්‍රාච්ච දක්ෂිණේ
පඤ්චාල පූර්ව භාගේතු කුරු දේශඃ ප්‍රකීර්තිතඃ"

(කුරු ක්ෂෙත්‍රය කෙරෙන් දකුණු දිග පඤ්චාල දේශය කෙරෙන් නැගෙනහිර දිශාවෙහි හස්තිනා පුරය පටන් කුරු දේශයයි කියන ලද්දේ ය).

* දැන් නවදිල්ලිය යයි ව්‍යවහාර කරනු ලැබේ.

තවද කුරු දේශයෙහි වට ප්‍රමාණය සෘතැප්ම 1167 ක් යයි හූන්සෑන් විසින් ද, සැතැපුම් 900 ක් පමණ ඇතැයි මේජර් කනින්හැම් උන්නැහේ විසින් ද කියන ලදී.

"දක්ෂිණේන සරස්වත්‍යා දෘෂද්වත්‍යුත්තරේණච
යේ වසන්ති කුරුක්ෂෙත්‍රෙ තේ වසන්ති ත්‍රිවිෂ්ටපේ"

(සරස්වතී නදිය කෙරෙන් දකුණෙහි ද, දෘෂත්වතී නදිය කෙරෙන් උතුරෙහි ද, කුරු ක්ෂෙත්‍රයෙහි යම් කෙනෙක් වෙසෙත් නම් ඔහු දිව්‍ය ලෝකයෙහි වසත්.)

(වැලිගම ශ්‍රී සුමංගල ඉතිහාසය)

## භාරත වංශය

"ආදිත්‍යස්‍යෝදයං තාත – තාම්බූලං භාරතී කථා
ඉෂ්ටා භාර්‍යා සුමිත්‍රංච – අපූර්වානි දිනෙ දිනෙ"

(ඉර උදාව, බුලත, පිරිය බිරිඳ, හොඳ යහළුවා යන මොවුන් වාගේම භාරත කථාවත් දවසින්–දවසම අපූරුය.)

(පංච තන්ත්‍රය.)

සකල ලෝක වාසීන්ගේ ම මී මුත්තණුවන් වූ මහා බ්‍රහ්මයාගේ පුත්‍රයා මරීචි නමින් හැඳින්විණ. ඒ මරීචි ගේ පුත්‍රවූ කාශ්‍යපගෙන් මුළු මහත් මනු වර්ගයාගේ ම පහළ වීම්



ඇතිවිය. භගවත් වූ දක්ෂ සෘෂිවරයා බ්‍රහ්මයාගේ දකුණු මහපටැඟිල්ලෙන් ද, ඔහුගේ ප්‍රියාව බ්‍රහ්මයාගේ වම් මහපටැඟිල්ලෙන් ද පහළ වූ බැව් පුරාණ ග්‍රන්ථයන්හි සඳහන් වේ. මේ අඹු සැමියන්ගේ විවාහයෙන් පණසක් දියණිවරු පහළ වූහ. ඔවුන්ගෙන් තෙලසක් කාශ්‍යපයන් හා විවාහ වීමෙන් දරු කැදැල්ලක් ඇති විය. ඔහුගේ භාර්‍යාවන් අතුරින් අදිති ප්‍රධාන වූවාය. ධාතා, මිත්‍ර, අර්‍යමා, ශක්‍ර, වරුණ, අංශු, භග, විවශ්වාන්, පූෂා, සවිතා, ත්වෂ්ඨා, විෂ්ණු යන පුත්‍රයෝ අදිතියගේ කුසින් උපන්හ. සියල්ලටම වඩා වයසින් බාලවූ විෂ්ණු තෙමේ සෙස්සන්ට වඩා ගුණ නුවණින් යුක්ත වූයේය.

අට වැනි පුත්‍ර වූ විවශ්වාන්ට පුත්‍රයෝ දෙදෙනෙක් වූහ. වෛවශ්වත මනු ඉන් වැඩිමහල් තැනැත්තාය. බාලයා යම නම් විය. මහා ප්‍රඥවන්තයෙක් වූ මනුගෙන් රජ, බමුණු ආදි වූ මනුෂ්‍ය වර්ගයා උපන්නේය. මිනිසා මානව නමින් ප්‍රසිද්ධ වූයේ මනුගේ පරම්පරාවට නෑකම් ඇති වූ හෙයිනි.

"වෛවශ්වතෝ මනුර්නාම – මානනීයෝ මනීෂිනාම්
ආසීත් මහීක්ෂිතා මාද්‍යඃ – ප්‍රණවඃ ඡන්දසාම්ව"

(රඝු වංශය)

(රජුන්ගේ ආදි කර්තෘවරයා වූ පණ්ඩිතයන් විසින් පිදිය යුතු වූ වෛවශ්වත මනු නම් රජ තුමෙක් වේදයෙහි ඕංකාරය මෙන් වූයේය.)

"උණු නොව බරණ සිවු සැට ඔටුණුත් පැළ ද
වෙණු මෙන් පසක් උන් සඳ සීහසුන් මැ ද
ම නු රජ කුලෙන් පැවතෙන පිළිවෙළ නොසි ද
ග නු අවසරය එතිරිඳු සිරි පතුල් වැ ද"

(සැළලිහිණි සන්දේශය)

මනු රජුට දරුවෝ දස දෙනෙකි. වෙණ, ධෘෂ්ට, නරිෂ්‍යන්ත, නාභාග, ඉක්ෂවාකු, කාරූෂ, ශර්යාති, ඉලා, පෘෂධ්‍ා, නාගාරිෂ්ට යන මේ මනු දරුවෝ ක්ෂත්‍රිය ධර්මයෙහි

ඇඳුනාහ. මොවුන් අතුරින් ඉක්ෂ්වාකු, ඉලා යන දෙදෙනා ගෙන් රාජ වංශ දෙකක් පහළ විණි. සූර්ය වංශය හා චන්ද්‍ර වංශය නමින් ප්‍රසිද්ධ වූයේ ඒ වංශ දෙක ය. මේ වංශ වයම විවස්වාන් (සූර්ය දෙවියන්) ගෙන් ඇතිවුණු නමුදු, ඉලාගේ වංශය චන්ද්‍ර වංශය යන නාමයෙන් පතළ විය. චන්ද්‍ර පුත්‍ර බුධ තෙමේ ඉලා විවාහ කොටගත් හෙයිනි ඒ නම ඇති වූයේ. රඝු වංශයේ ප්‍රභවය ඉක්ෂ්වාකු වංශයෙනි. මහා කවි කාලිදාසයන් විසින් රඝු වංශ මහා කාව්‍යය රචනා කරන ලද්දේ ඒ වංශයෙහි වූ කථා-ප්‍රවෘත්තියක් ආශ්‍රය කොට ගෙනය.

රඝු වංශිකයන්ගේ රාජධානිය අයෝධ්‍ය පුරයයි. එහෙත් රඝු වංශයේ ශාඛාවෝ සතර දිශාවෙහි ම ව්‍යාප්ත වූහ. වෛවස්වත මනුගේ දුහිතෘ වූ ඉලාගෙන් ආරම්භ වූ චන්ද්‍ර වංශයෙන් යාදව, පෞරව ආදි රාජ වංශ ඇති වූහ. මන්ධාතා, යුවනාශ්ව, දිලීප, රඝු, දශරථ, රාමචන්ද්‍ර ආදි සූර්ය වංශික රජුන් ගැන රාමායනයෙහි සඳහන් වන්නේ යම් සේ ද? මහා භාරතයෙහි යයාති, පුරු, දුෂ්මන්ත, භරත, කුරු, ශාන්තනු, යුධිෂ්ඨිර, දුර්යෝධන ආදි චන්ද්‍ර වංශික නර පතියන් ගැන සඳහන් වන්නේත් එසේම ය. රාමායන-යෙහි රාමචන්ද්‍ර රජු ප්‍රධානත්වය ගන්නේ යම් සේ ද? මහා භාරතයෙහි භගවත් වාසු දේවයෝ ප්‍රධානත්වය ගන්නෝත් එසේම ය.

රාමායනයෙහි සංග්‍රාමයට වානර, වලස්, රාක්ෂසාදීහු ද සම්බන්ධය. එහෙත් කුරු ක්ෂේත්‍රයෙහි වූ කුරු-පාණ්ඩව සංග්‍රාමයට සම්බන්ධවූවෝ ක්ෂත්‍රියයෝම ය. මේ යුද්ධ දෙකෙහි දීම දේවෝපකාරය පක්ෂ ග්‍රහණයෙන් යුක්තව ලැබිණි. රාවණ රජුට විරුද්ධව සටන මෙහෙයවීම පිණිස විෂ්ණු දෙවියන්ගේ උපකාරය රාම කුමාරයාට ලැබිණි. එමෙන් ම කෞරවයන්ට විරුද්ධව සටන මෙහෙයවීම සඳහා ශ්‍රී කෘෂ්ණගේ උපකාරය පාණ්ඩවයන්ට ලැබිණි.



පාණ්ඩව රාජවංශයෙහි ආදි පුරුෂයා පුරුය. මහා භාරතයෙහි පාණ්ඩවයන් පෞරව යන නාමයෙන් හඳුන්වනු ලබන්නේ එහෙයිනි. පුරු පරපුරෙහි අටළොස් වැන්නෙහි ඉලීන පුත්‍ර වූ දුෂ්මන්ත රජු උපන්නේ ය.

විශ්වාමිත්‍ර ඍෂිහුගේ හා මේනකා නම් දෙවඟනගේ දූ වූ සකුන්තලා නම් අභිරූපිකාව දුෂ්මන්ත රජුට වන-යෙහිදී මුණගැසී ඇ කෙරෙහි පිළිබඳ සිත් උපදවා ඈ ගාන්ධර්ව විවාහයෙන් ආවාහ කොට ගත්තේය. එහෙත් දුර්වාසා ඍෂි වරයාගේ ශාපයෙන් දුෂ්මන්ත රජුට ඈ අමතකවිය. එහෙයින් ඔහු විසින් සකුන්තලාට අවමන්කොට ඈ බැහැර කරනු ලැබුවාය.

මේනකා දිව්‍යාඞ්ගනා තොමෝ ගැබ්ගත් සිය දියණිය දෙව් ලොවට ගෙන ගියාය. දුෂ්මන්ත රජුට දාව ශකුන්තලාවගේ කුසින් භරත කුමාරයා උපන්නේ එහිදී ය.

ශාප මෝචනයෙන් පසු දුෂ්මන්ත රජ තෙමේ සකුන්-තලාව හා තම පුත් භරත කුමරුවා සාදරයෙන් පිළි ගත්තේ ය. යුව රජ තනතුරද භරත කුමාරයාට දුන්නේය. පියාණන්ගේ ඇවෑමෙන් තේජස් වී භරත රජ තෙමේ ජම්බුද්වීපයෙහි අධිරාජයා වූයේ ය. ඔහුගේ මුණුබුරු වූ හස්ති නම් රජු විසින් කුරු රට අගනුවර වූ හස්තිනා පුරය (දැන් දිල්ලිය) ගොඩනැංවූයේය.

හස්ති රජුගේ මුණුබුරු වූ අජමීඪ නරපතිහට කෛකේයී, ගාන්ධාරී, විශාලා, ඍක්ෂා යන බිසෝවරු සතර දෙනෙක් වූහ. ඔවුන්ගෙන් මේ රජුහට පුත්‍රයන් එක්සිය විසි හතර දෙනෙක් ලැබිණි. ඔවුන් අතුරින් එක් පුත්‍රයකු වූ සංවරණ රජ තෙමේ සූර්ය දේවයන් කෙරෙහි ඉමහත් භක්ති ඇත්තේ විය. හෙතෙම සිය තපෝ බලයෙන් හිරු දෙවියන් සතුටු කොට කුලගුරු වශිෂ්ට මුනිහුගේ අනුග්‍රහ යෙන් 'තපතී' නම් සූර්ය කන්‍යාව ලැබුවේ ය. සංවරණ නරපතියාගේ හා තපතී දේවියගේත් පුත්‍ර කුමාරයා කුරු

නමින් ප්‍රසිද්ධ වූයේය. ඉතා දැහැමි දිවි පෙවෙතක් ගත කළ කුරු රජ තෙමේ රට වැසියන්ටද ඉතා කරුණාවෙන් දවසැරියේ ය. එතුමා සුදුසු කාලයෙහි තවුස්දම් ද පුරමින් වාසයකළ තපෝ වනය කුරු ක්ෂේත්‍ර නමින් ප්‍රසිද්ධ වූයේය.

එතුමාගෙන් පැවතෙන්නෝ 'කෞරව' නාමයෙන් ප්‍රසිද්ධවූහ. කුරු රජුගේ පස්වැනි මුනුබුරු වූ ප්‍රතීප නම් රජෙක් විය. මේ රජු හට දේවාපි, ශාන්තනු-බාල්හික යයි පුත්‍රයෝ තිදෙනෙක් වූහ. මොවුන් අතුරින් ශාන්තනු තෙමේ ගඞ්ගා දේවිය ආවාහ කොට ගත්තේ දේවව්‍රත නම් පුත්‍රයෙකු ලැබුවේය. හෙතෙම සිය පියාණන්ට උවටැන් කරමින් දිවිහිමියෙන් ම අවිවාහක ව වාසය කෙළේ ය. පසු කාලයකදී භීෂ්ම යන නාමයෙන් ප්‍රසිද්ධ වූයේ මෙතුමා ය.

ශාන්තනු රජුගේ අනෙක් මෙහෙසියක් වූ සත්‍යවතී බිසොවට චිත්‍රාඞ්ගද, විචිත්‍රවීර්‍ය්‍ය යයි පුත්‍රයන් දෙ දෙනෙක් වූහ.

**සත්‍යවතීගේ කථාව මෙසේය:**

"එක් දිනෙක ශාන්තනු මිහිපල් තෙම දඩ කෙළියෙහි රිසි වූයේ යමුනා ගඟබඩ ආරණ්‍යයට ප්‍රවිෂ්ට විය. එහිදී හදිසියෙන් පැතුරුණු සුමධුර සුගන්ධයෙක් වැද්ද ඔබ-මොබ විමසනුයේ පිවිතුරු වූ සුදු පිළි හැඳගත් දෙවඟනක් වැනි රූසිරිමත් ධීවර කන්‍යාවක් දිටී. ඒ සුන්දරිය වනාහි ධීවරයන්ගේ නායකවූ දාස රාජයන්ගේ දුහිතෘවූ සත්‍යවතී නම් රාජ කන්‍යාවය. අනුපම වූ රූපශ්‍රීයෙන් මනනුවන් පහැරගත් ඒ යුවතිය දුටු කෙණෙහිම පිළිබඳ සිත් ඇතිවූයේ පාණිග්‍රහණයෙහි අභිලාෂී වූ ශාන්තනු නරවර තෙමේ දාස රාජයන් වෙත ගියේය.

දාස රාජයෝ මහත්වූ ගෞරවයෙන් ආචාර කොටැ ශාන්තනු රාජයන් පිළිගත්හ. ආ කතු විමසීමෙන් පසු ශාන්තනු තෙමේ ස්වකීය අභිප්‍රාය දැන්වීය. ඒ ඇසූ ධීවර රාජ තෙමේ "මහ රජාණෙනි, ඔබ මාගේ දියණිය පිළිගන්ට



කැමැත්වීම වනාහී මහත්වූ භාග්‍යයක් කොට සලකමි. පාණි ග්‍රහණයට පෙර මගේ අභිලාෂය සම්පූර්ණ කරන නියාවට ප්‍රතිඥාවක් දෙනු ලැබේවා! එනම් ඔබ වහන්සේගේ ඇවෑමෙන් හස්තිනා පුරයෙහි සිංහාසනය මා දියණියන්ගෙන් ලැබෙන පුත්‍රයාට හිමි කරන සේ ය. මේ ප්‍රතිඥාව ඉටු කරන හැටියට හැකිනම් මා දියණිය දැන්ම පවරා දෙන්නෙමි"යි පැවසීය. "හස්තිනා පුරයෙහි සිංහාසනයට සර්වප්‍රකාරයෙන් ම යොග්‍යවූ මහා තේජස් වී පුත්‍ර රත්නයක් සිටියදී මෙබන්දක් කෙසේ කරම්දැයි?" සිතුවිල්ලෙන් ද දුර්මුඛ වූ ශාන්තනු නරේන්ද්‍ර තෙම ධීවර රාජයන්ගේ අභිලාෂයෙහි සම්මත නොවූයේ පෙරළා හස්තිනා පුරයට ගියේය.

ස්වල්ප දිනකට පසු දේවව්‍රත යුවරාජයන් විසින් පිය රජු හා ධීවර කන්‍යාව පිළිබඳ පුවත කුලූපග වූ වෘද්ධ ඇමතිවරයකු මගින් දන්නා ලද්දේ ය! හෙතෙම පිය රජුගේ කනස්සල්ල සන්හිඳුවනු පිණිස කැත්කුල දෙටුවන් සමග ධීවර රාජයන් වෙත ගොස් පිය රජු උදෙසා ධීවර කන්‍යාව පැතුවේ ය.

ධීවර ජ්‍යෙෂ්ඨ වූ දාස රජ තෙම දේවව්‍රත යුවරාජයන්ගේ පිතෘ භක්තිය ගැන මවිතවැ බොහෝ සත්කාර සම්මාන දක්වා පවසනුයේ "භරත කුල ශ්‍රෙෂ්ඨයාණෙනි, ඔබගේ ප්‍රාර්ථනය සැබවින් ම මට ගෞරව පිණිස වෙයි එසේ ද වුවත් කන්‍යාවගේ පියාණන් වූ මාගේ අභිප්‍රාය විශේෂයෙන්ම ශ්‍රවණය කළ යුතු වෙයි. මේ පරිණය කාර්‍ය්‍යය ඉටු වූ කල්හි රාජ කුලයෙහි මහත් වෛරයක් නැගෙනු නියත යි. හුදෙක් අසුරයන් මතු නොවෙයි. දෙවියන් ද පසු බා කළ හැකි මහා තේජස් වූ ඔබගේ ප්‍රකෝපා'නලයට මාගේ දුහිතෘ ව ඇතුළු වූ සියල්ල ගොදුරුවීම ඉන්ද්‍රයාටවත් වාලක්වාලිය නොහෙන්නේ ය".

ධීවර රජුගේ වචනය ඇසූ දේවව්‍රත කුමරු පිළිතුරු දෙනුයේ "එම්බා සත්‍යවාදී වූ ධීවර රාජයාණෙනි, මාගේ සත්‍ය ව්‍රතය අසන්න. යථාවාදී තථාකාරී වූ මාගේ වචනය

පිළිගන්න. ඔබ දියණියන්ගේ ගර්භයෙහි පිළිසිඳගන්නා නැනැත්තේ ම හස්තිනා පුර වැසියන්ගේ හා මගේද රජු වන්නේය."

මේ ඇසූ දාස රජ තෙම "භරත කුලෝත්තමයාණෙනි, ඔබ විසින් මාගේ දියණියන් උදෙසා මේ ශ්‍රේෂ්ඨතර රජ කුල නායකයන් ඉදිරියෙහි ප්‍රතිඥාවක් පළ කරන ලද්දේය. එය වූ කලී ඔබගේ මහාත්ම ගුණයට ආදර්ශයකි. එහෙත් ඔබගේ පුත් කුමරුවන්ගෙන් වියවුල් ඇතිවීම නොඅනුමානය" යි කීය.

එවිට ධීවර රජයාගේ අභිප්‍රාය තේරුම්ගත් යුව රජ තෙමේ පරිවාර රාජ කුලයන් හා දාස රාජයන් අමතා "ක්‍ෂත්‍රිය කුල ශ්‍රේෂ්ඨයෙනි, මහරු ගුණැති ධීවර රජයාණෙනි, මා විසින් අධිරාජ්‍යය වර්ජනය කරන ලද්දේ මින් පූර්වයෙහිම ය. දැන් යළිත් කරන ප්‍රතිඥාව නම් ජීවිතාන්තය තෙක් බ්‍රහ්මචාරීව සිටීමය" යි කීවේ ය. මේ ඇසූ දාස රජ තෙම මහත් වූ විශ්මයට හා ප්‍රීතියට පැමිණියේ ශාන්තනු රජු උදෙසා රූප ගුණ සම්පන්න වූ සත්‍යවතී දූ කුමරිය දේවව්‍රත යුවරාජයන්ට භාර කෙළේ ය.... .....ශාන්තනු මිහිපල් තෙමේ ශාස්ත්‍රොක්ත විධි නොඉක්මවා සත්‍යවතී ධීවර කන්‍යාව පාණිග්‍රහණය කෙළේ ය.

(මහා භාරතාඛ්‍යානය)

ශාන්තනු හා සත්‍යවතියගේ ආවාහ-විවාහයෙන් පුත් කුමරුන් දෙදෙනකු ලැබිණ. මොවුහු චිත්‍රාංගද හා විචිත්‍ර වීර්‍ය්‍යයයි නම් කරන ලදහ. ශාන්තනු තෙමේ එකුමරුන් ලබා වැඩි කල් යන්නට පෙර ස්වර්ගී පරායන වූයේ ය. මෙ තැන් පටන් සත්‍යවතී මෙන් ම ඇයගේ මේ පුත් කුමරුවන් දෙදෙනා ද ස්වයංවරයෙන් ම බ්‍රහ්මචාරී භාවයට පත්වුණු, භීෂ්මගේ රක්‍ෂාවරණ ගෝපනය යටතේ පරිපුෂ්ටිත වූහ



ශාන්තනු රජුගේ ඇවෑමෙන් පසුව චිත්‍රාංගද කුමරු භීෂ්ම විසින් මහා භාරත වර්‍ෂයෙහි අධිරාජත්වයට පත් කරන ලද්දේය. මොහු වූ කලී භීම වික්‍රමය හා සංග්‍රාමචර ගති ඇති ශෞර්‍ය්‍යවීර්‍ය්‍ය ගුණ සම්පන්න නරේශ්වරයෙකි. ස්වකීය අධිරාජ්‍යයට තවමත් අවනත නොවී අපරාධීන ව රජ සුව විඳිමින් වැළඳීමේ යෙදී සිටි ගන්ධාර දේශයේ මහා නරේශ්වරයාට විරුද්ධව මෙතෙම යුද වැදුණේ ය. අක්‍ෂෞහිණී සංඛ්‍යාත තම සිවුරඟ සෙන් බලයත්, ක්‍ෂත්‍රිය උපාය ශක්තියත් රණ වික්‍රමයත් පරිසමාප්තව ම ක්‍රියාවේ යොදවමින් මෙ රජු තුන් අවුරුදක් මුළුල්ලේ ගන්ධාර දෙශයට විරුද්ධ ව යුද්ධයේ යෙදී සිටි නමුත් අවසානයේ දී එ රජ හා ඇති වූ ද්වන්ද්ව යුද්ධයකින් පරාජිත ව මරුමුවට එළඹුණේ ය. මෙයින් පසුව ගන්ධාර යුද්ධයේ තව දුරටත් යෙදීමට ප්‍රතිරාජ භීෂ්ම නොකැමැති වූ හෙයින් එපමණකින් ම එම යුද්ධය නැවතිණි.

විචිත්‍රවීර්‍ය්‍ය තෙමේ මෙයින් පසුව භාරත මහා සාම්‍රාජ්‍යයෙහි අභිෂේකය ලැබුවේ ය. විචිත්‍රවීර්‍ය්‍ය අධිරාජයා නිසි යොවුන් වයසට පැමිණි පසු භීෂ්ම තෙමේ ඔහුගේ සරණාභිෂේකය සඳහා සුදුසු කුමරියක සෙව්වේ ය. බරණැස අග්‍රරාජධානිය කොට කාසි දේශයේ රජ කරන නරේශ්වරයාගේ භද්‍රයෞවන වයසේ වෙසෙන දූ කුමරියන් තිදෙනකු ස්වයංවරයෙන් සරණ බන්ධනයට ඇතුළත් වන්නට සිටින බැව් ඔහුට මෙහිදී අසන්නට ලැබිණ.

පංචායුධ ධාරීවූ භීෂ්ම තෙමේ ධවල සෛන්ධවයන් සදෙනකු යොදන ලද ස්වකීය යුද්ධරථාරූඪව් කාශි දේශයේ බරණැස් නුවර බලා නික්ම ගියේ ය. අංග, වංග, කාලිංග, කර්ණාට, ගුර්ජර, මගධ, කෝශලාදී රජ්‍යයන්හි සිට විවිධ සන්නාහයෙන් සන්නද්ධව සුසැට බරණින් සැරසී ස්වයංවරයෙන් මෙ කුමරිය දිනා ගැනීම සඳහා එළඹ සිටි දහස් ගණන් රජ කුමරුවන් භීෂ්මට දක්නට ලැබිණ.

ස්වයංවරය ලබන්නට යන කුමරිය උදෙසා තමන් හා සටනට ඉදිරිපත් වේවායි ඔහු හැම ප්‍රතිමල්ලයෙකුට ම අභියෝගයක් කෙළේ ය. සිංහ නාදයක් නගන්නාක් මෙන්

භීෂ්ම විසින් කරන ලද මේ අභියෝගය පිළිගත් රජ කුමරුවෝ ඒකී භූතව ද, සමූහ භූතව ද සටනට වන්නෝ ය. එහෙත් විද්‍යුත් ප්‍රභාවයක් මෙන් සිය අසිපතත් ධාරානිපාත වෂ්‍රාවක් මෙන් සිය දුනු හීත්, සෙන හඬ තළන්නාක් මෙන් සිය ජය සංඛයත් වරින්-වර ක්‍රියාවේ යොදවමින් භීෂ්ම තෙමේ හැම ප්‍රතිමල්ලයෙකුම පරාජයෙන් පරිභාසයට පත් කෙළේ ය...... ............

විචිත්‍රවීය්‍ර්‍ය රජුගේ මෙහෙසුන් බවට පත්වූ අම්බිකා හා අම්බාලිකා දේවීන්ට දරු සම්පතක් ලැබෙන්නට පෙර එ රජු කළුරිය කෙළේ ය.

සවකීය පුත් කුමරුවන් දෙ දෙනම දරු සම්පතක් නොලැබ රාජ්‍යය අස්වාමික කොට පරලෝකප්‍රාප්තවීම නිසා සත්‍යවතී දේවිය කෙරෙහි ඇතිවූණේ බලවත් සංවේගයකි. රජ බවට පත්වුණු සිය දෙපුත් කුමරුවන් හටම දරක සම්පත්තියක් නැතිවීම නිසාත් එතෙකුත් ප්‍රතිරාජ පදවිය දරණ භීෂ්ම බ්‍රහ්මචය්‍ර්‍යාවෙන් බැඳී සිටීම නිසාත් රජය අරාජිකවන බව ඕ තොමෝ දුටුවා ය.

සත්‍යවතී තොමෝ බඹසර රක්නා භීෂ්ම ප්‍රතිරාජයා තමන් හමුවට කැඳෙව්වා ය. "භීෂ්මයෙනි, ම පුත් කුමරුවන් දෙ දෙනා නිසා විධවාභාවයට පත්ව සිටින අම්බිකා හා අම්බාලිකා දේවීන් දෙ දෙන තොපගේ පරිභෝගයට ගනුව! ගෙන භාරත මහා සාම්‍රාජ්‍යය රැකීම සඳහා අවශ්‍ය ආත්ම බලයත්, රාජ බලයත්, කෘත පුණ්‍ය බලයක් ඇති පුත් කුමරුවන් පහළ කරව!" යි සත්‍යවතී දේවී තොමෝ භීෂ්මයන් හට සැල කළා ය.

"අහෝ දේවියනි! තොප ඉල්ලා සිටින්නේ ඉෂ්ට කළ නොහැකි ඉල්ලීමකි. මා වූ කලී නිති බඹ සර රැකීම සඳහා දිවුරුම් දී සිටින බ්‍රහ්මචාරියෙකි. එම දිවුරුම කඩ කොට මේ විධවාවන් කෙසේ නම් මම පරිභෝගයට ගන්නෙම්ද" යි භීෂ්ම තෙමේ අවනත ලීලාවෙන් සත්‍යවතී දේවියහට සැල කෙළේ ය.



සිරියහන් ගබඩාවට වී බොහෝ වේලාවක් නිසොල්-මන් ව නිහඬ ව කල්පනාවේ යෙදී සිටි සත්‍යවතී දේවියහට මෙහිදී සිහිපත්වූයේ තම පුත් කුමරු ය. යමුනා නදියෙහි නදී තීර්ථාසන්නයෙහි දෙඹ ගස් සෙවනක රැඳවුණු යාත්‍රාවේ සිටිමින් පරාශර මහා ඍෂීන් නිසා තමන් ලැබූ පුත්‍ර රත්නය හිමවතට වැදී යෝගාවචර ජීවිතයක් ගත කොට ව්‍යාස ඍෂීන්[1] නමින් දස දෙස පතල කීර්තියක් ඇතිව වැජඹෙන ලීලාවත්, අවශ්‍ය අවසථාවක තමන් සිහි කළ කල්හි තමන්-හට පිළිසරණ වීම සඳහා එළඹෙන බවට ඔහු ප්‍රතිඥ දුන් ලීලාවත් ඕ තොමෝ අනුක්‍රමයෙන් ආවර්ජනය කළා ය. මින් පසු ඕ තොමෝ විෂ්ණු සෙතාත්‍රය ගයා පූජාවක යෙදී-මෙන් පසුව ව්‍යාස ඍෂිවරයා ඇය හමුවේ දකින්නට ලැබිණ. හෙතෙම මාතාවට ආමන්ත්‍රණ කළේ ය

"මාතාවෙනි, කෙබඳු සේවයක් මාගෙන් බලා-පොරොත්තු වන්නීද" යි ඉසිවර තෙමේ සිය මාතාවගෙන් විමසුවේ ය.

සත්‍යවතී ද තම පුත් කුමරුවන් පුත්‍ර සම්පත්තියක් නොමැතිව මිය ගිය සැටිත්, එහෙයින් ම මහා සාම්‍රාජ්‍යය අරාජික වන්නට යන සැටිත්, ප්‍රතිරාජ පදවිය දරන භීෂ්ම නිති බඹසර යෙදී සිටීම නිසා ඔහු කෙරෙන් දරු සම්පතක් ලැබීමේ අපේක්ෂාවක් නොමැති සැටිත් ඔහුහට විස්තර කළා ය. විස්තර කොට අම්බිකා හා අම්බාලිකා ඉසිවර-යාණන් හමුවට කැඳවා ඔවුන් දෙ දෙනට දරු සම්පත් දෙන ලෙස ඔහුගෙන් අයැද සිටියා ය

මහා තාපෝ තේජස් ඇතිවූව ද, වැඩී ගිය දළ රැවුලින් හා හැඩපළු ගෙතී ගිය හිස කෙසින් හා සියලඟ වැසී පවත්නා දළ රෝමයන්ගෙන් හා විවර්ණ වූ දන්ත

1 ව්‍යාස මුනි වූ කලී බ්‍රහ්ම පුරාණය, විෂ්ණු පුරාණය, භගවත් පුරාණය, මත්ස්‍ය පුරාණය, ගරුඩ පුරාණය ආදි ග්‍රන්ථ අට-ළොසක කර්තෘවර මහා ප්‍රාඥයෙකි.

පඬකතියෙන් හා දික්ව වැඩීගිය තියෙන් හා යම්තම් විළිවැසෙන සේ අඳිනා ලද අඳුන් දිවි සමෙන් හා අත්‍යන්තයෙන් ම විරූප භාවයක් ඉසිලූ මේ ඍෂිවරයාණන් දුටු අම්බිකා හා අම්බාලිකා කුමරියෝ බියෙන් තැති ගත් හ. විළියෙන් මූසපත් වූහ.

මොහොතකුදු මේ විරූප දේහය දෙස බලා සිටීමෙහි අපොහොසත් වූ අම්බිකා තොමෝ දෙනුවන් පියාගත්තා ය. අම්බාලිකා තොමෝ කරබා ගත්තා ය. එහෙත් සත්‍යවතියගේ නියෝගයෙහි නොපිහිටීමට අපොහොසත් වූ එකුමරියන් දෙ දෙන ව්‍යාස ඍෂිවරයාණන් සමග සිරියහන් ගබඩාව කරා නික්ම ගියෝ ය.[1]

ව්‍යාස ඍෂින් හා අම්බිකාව අතර ඇතිවුණු සහවාසයෙන් පුත් කුමරෙකු පහළ විණ ඇය දෙ නුවන් පියාගෙන සිටීම නිසා මෙ කුමරු ජාත්‍යන්ධයෙක් වූයේ ය. ධෘතරාෂ්ට්‍ර- යයි ඔහු නම් කරන ලද්දේ ය

අම්බාලිකා ද ව්‍යාස ඍෂින් නිසා කුමරෙකු ලැබුවා ය. ඉසිවරයාණන් කෙරෙහි ඇති වූ බිය හේතු කොට ගෙන පඬුවන් පැහැයෙන් ඇය යුක්ත ව විසීම නිසා එකුමරු ද පඬුවන් පැහැය ලැබුවේ ය. එහෙයින් මෙ කුමරු පාණ්ඩු යයි නම් කරන ලද්දේ ය.

එහෙත් මෙ කුමරුවන් දෙ දෙන පමණක් ලැබීම ස්වකීය රාජ්‍යයෙහි ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් වන්නේ යයි සත්‍යවතී කල්පනා නොකළා ය. තම පුතණුවන් වූ ව්‍යාස ඍෂින් නිසා තවත් පුත් රුවනක් පහළ කර ගැනීමට ඕ තොමෝ කල්පනා කළා ය. එහෙයින් ඕ තොමෝ

1 "දරුවන් නැති වැන්දඹු තරුණ කාන්තාවකට ස්වකීය පුරුෂයාගේ සහෝදරයකු හෝ අන්‍ය ඇවැස්ස නෑයෙකු හෝ සමග වාසය කොට තම පුරුෂයා වෙනුවෙන් දරුවන් උපදවා ගැනීමට ව්‍යවස්ථාවක් ඉන්දියාවේ පැවතුනේ ය. මේ චාරිත්‍රයට 'නියෝග' යයි කියන ලදී. මෙසේ උපන් පුත්‍රයන්හට 'ක්ෂේත්‍රජ' යයි නම් වූහ. (ඍතාදසීය)



වෛශ්‍ය කන්‍යාවක් ව්‍යාස ඍෂින්ගේ යහන් ගැබ කරා යැව්වාය. මැයගෙනුදු පුත්‍ර රත්නයක් ලැබිණ. ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ යන චතුර් වර්ග සම්පත් ගෙන දීමෙහි පොහොසත් පුණ්‍ය බලයෙන් හා ප්‍රඥා බලයෙන් මෙ කුමරු සංයුක්ත වූණේ ය. ඔහු වූ කලී සකල සද් ගුණයෙහිත්, සකල සද්ධර්මයෙහිත් ප්‍රතිමූර්තියකි

එහෙයින් ඔහුට විධුර යයි නම් කරන ලද්දේ ය.

(භාරත ගීතය)

ඔහුගේ මවු වෛශ්‍ය කුල කාන්තාවක් වූ බැවින් නීත්‍යානුකූලව ඔහුට සිහසුන අහිමි විය. (විචිත්‍ර වීර්‍ය්‍ය) රජු තරුණ අවදියෙහිදී ම මිය ගිය හෙයින් බාල වියෙහි උන් පාණ්ඩු කුමාරයා මහ රජ කමට පත්විය. එහෙත් රාජ්‍යානුශාසක පදවිය දැරුවේ භීෂ්ම කුමාරයා ය. ජාත්‍යන්ධයෙක් වුවත් ධෘතරාෂ්ට්‍ර ප්‍රතාපවත් කුමාරයෙක් ව වාසය කෙළේ ය පාණ්ඩු ධනුර්ධයෙක් වූ අතර විදුර මහා විශාරද පණ්ඩිතයෙක් වූයේ ය.

## සත්‍යවතියගේ අතීත කථාව

කුරු රට වනගත ප්‍රදේශයේ දඩ කෙළියේ යෙදී සිටි යම් කිසි රජකුගේ ධාතුරජස පක්ෂියෙකුගේ මාර්ගයෙන් යමුනා ගංගා ජලයෙහි පතිත විය ඒ රජස මත්ස්‍ය ධේනුවක් විසින් ගිල දැමූවෙන් මෙය හේතුකොටගෙන උන්දෑ ගර්භණී වූවා ය. ඕ තොමෝ නිසි කලට යමුනා ගං ඉවුරෙහි බිළිඳියකු වදා දමා පලා ගියා ය යමුනාවෙහි මසුන් මරන්නන් විසින් අවුලාගත් මේ බිළිඳිය ඔවුන්ගේ ධීවර නරේන්ද්‍රයා වූ දාස නම් රාජයා වෙත ගෙන ගොස් බාර දුන්නෙන් හෙතෙම ඒ බිළිඳිව සුත ප්‍රේමයෙන් ඇති දැඩි කර ගත්තේ ය.

කාලාතික්‍රමණයෙන් ධීවරයන්ගේ රජ්ජුරුවෝ තමන් ඇති දැඩි කරගත් දියණියට සත්‍යවතී යන නාමය තබන ලද්දේ ය. ඕ තොමෝ මත්ස්‍යයෙකුගේ කුසින් උපන්

සෙයින් මච්ච කෝනති හෙවත් මච්ච ගන්දි යන අතුරු නාමයක් ද ඈ හට ඇති විය. ඕ රුවින් අගතැන්පත් වූවා ය. එහෙත් මත්ස්‍ය ධේනුවකගේ කුසයෙහි උපන් හෙයින් ඇගෙන් පිළී ගඳක් හමන්නට වන. ඒ බැව් දැනගත් පරාශර මුණිවරයා ඒ දුගඳ පහකොට ඇගේ ශරීරයේ සමන් සුවඳ ඇති කෙළේ ය. පරාශර මහා මුණිවරයා විසින් එක්තරා පොරොන්දුවක් පිට ඈ සරණ පාවා ගන්නා ලද්දේය. එනම් පරාශර මුණිවරයාට දාව සත්‍යවතී කෞරව පුත්‍රයකු වැදූ පසු යළිත් ඈ කන්‍යා භාවයට පත්කිරීමයි. ටික කලකින්ම ඕ තොමෝ පුත්‍රයකු ප්‍රසූත කෙළෙන් පරාශර තෙමේ ස්වකීය අනුභාවයෙන් නැවතත් ඈ කන්‍යා භාවයට පත් කෙළේ ය. යමුනා නදියෙහි වූ ද්වීපතක පුත්‍රයාගේ උත්පත්තිය සිදුවූ බැවින් ඔවුන්ගේ පුත්‍රයා 'ද්වීපායන' නම් විය. කල් යත්, යත්, ද්වීපායන වැඩි වයසට පත් වී ව්‍යාස මුණි නාමයෙන් ප්‍රසිද්ධ ඍෂිවරයෙක් වූයේ ය. පියාණන් වූ පරාශර මුණිවරයා හා යන්නට පිටත්වූ ව්‍යාස තෙම "මෑණියනි, ඔබට මා දැකීමට කැමැති වේලාවක මගේ නම පමණක් මතක් කළ පමණින් මම ඔබ සමීපයෙහි පෙණී සිටිමි"යි කියා සමුගෙන වනගත වූයේ ය.

ධෘතරාෂ්ට්‍ර කුමාරයා ගන්ධාරයේ සුබල් රජුගේ දියණිය වූ ගන්ධාරි කුමාරිය ආවාහ කොට ගත්තේ ය. ඒ දේවී තොමෝ දුර්යෝධන, දුඃශාසන ආදි පුත්‍රයන් සියයක් ද දුඃශලා නම් එක් දූ කුමරියක් ද වැදූවා ය. ධෘතරාෂ්ට්‍ර සහ පාණ්ඩු යන කුමාරයන් දෙදෙනා ම විචිත්‍රවීර්‍ය රජුගේ පුත්‍රයෝ ය. ධෘතරාෂ්ට්‍රගේ මෑණියන් වූ අම්බිකා බිසොව හා පාණ්ඩුගේ මෑණියන් වූ අම්බාලිකා බිසොවත් සහෝදරියෝය. එහෙත් ධෘතරාෂ්ට්‍රයන්ගේ පරම්පරාව (කුරු) කෞරව නාමයෙන් හැඳින්විණි. පාණ්ඩුගේ පරම්පරාව පාණ්ඩව නාමයෙන් හැඳින්විණි. පාණ්ඩු මහ රජ තෙම දකුණේ වින්ධ්‍යා කඳු වැටියේ වුසූ කුන්තිභෝජ රජු සෙවණේ උන් (යාදවයන්ගේ) කුන්ති කුමාරියත් භූතානයේ



ප්‍රාචීන් කඳු වැටි පෙදෙසෙහි මද්‍රි කුමාරියත් යන දෙ කුමරියන් ආවාහ කොට ගත්තේ ය. හැමට බාලවූ විදුර කුමාරයා කෙසේ හෝ වේවයි රජ මැඳුරෙහි විසුමෙහි රිසි නැති වූයේ මහසෙන් පිරිවරා ගොස් විදේහ, කාසි, මිථිලා, මගධ යන රාජ්‍යයන් දිනාගත්තේ ජයග්‍රාහක ලීලාවෙන් හස්තිනාපුරයට සම්ප්‍රාප්ත විය. රට වැසියෝ සතුටින් ඉපිල ගියෝ සැණකෙළි පැවැත් වූහ

කල් යත් යත්, පාණ්ඩු නරපති තෙමේ වන වාසයෙහි ලොල් වූයේ රජයේ කටයුතු ධෘතරාෂ්ට්‍රයන්ට පවරා මෙහෙසියන් හා පිරිවර ජනයාද කැටුව දඩයමේ ගියේ ය. හිමාලය වනයෙහි දකුණු දිග මිටියාවත දඩබිම් කොටගත් ඔහුගේ වනගත ජීවිතය සතුටුදායකව පැවතුනේ මඳ කලකි අවාසනාවන්ත කාලයක් උදාවිය.

දිනක් පාණ්ඩු රජ තෙමේ මුවකු විදිනු වස් ඊ සැරයක් යැව්වේය. එහෙත් ඒ ඊ සැරය වැදුනේ මුවාට නො වේ. අසල වන ලැහැබක භාවනායෙහි යෙදී උන් මුණිවරයෙක් ඒ ඊ පහර කා මරණාසන්නව බිම වැදහොත්තේ තමාට මේ අපරාධය කළ තැනැත්තා කෙරෙහි බද්ධ වෛරයෙන් යුක්ත වූයේ භයානක සාපයක් කරමින් අවසන් හුස්ම හෙළුවේ ය.

තමා අතින් වූ වරද ගැන පාණ්ඩුරජ තෙම බලවත් පසු තැවිල්ලට පත්වූයේ ය. ස්වකීය අපරාධයෙහි සාපය නොවැළැක්විය හැකි පරිදි යෙදෙන බව ඔහුට කල්පනාවිය. "අහෝ! මා අතින් වූ සාපරාධි ක්‍රියාවෙහි දුර්විපාකය කල් නොයවා පල දේ. එහෙයින් මම යළිත් නුවරට නොයමි. මාගේ මේ සාප ලත් ජීවිතය වන තවුසකු ලෙස ගතකරමි." මෙ සේ සිතා පිරිවර ජනයා අමතා තම අදහස සැල කෙළේය. ස්වාමි භක්තියෙන් ඇලලී ගිය සිත් ඇති කුන්ති දේවිය හා මද්‍රි දේවියත් පෙරළා නොගොස් වනයෙහි ම

රැඳුණාහ. ඉන්පසු පාණ්ඩු නරපති තෙමේ තමා වෙනුවෙන් රට පාලනය කරන්නැයි ධෘතරාෂ්ට්‍ර රජු වෙත හසුනක් දී රාජ පුරුෂයන් යැවීය.

මේ සේ අවුරුදු ගණනක් මුළුල්ලේ ඉතා දුක සේ වන ගත ජීවිතයක් ගත කළ පාණ්ඩු රජුගේ සතුටට හා සැනසිල්ලටත් හේතු වූයේ දරු සම්පත යි. කුන්ති දේවියට යුධිෂ්ඨිර, භීම, අර්ජුන යන නම් ඇති ප්‍රියංකර පුත්‍රයන් තිදෙනෙක් ද, මද්‍රි දේවියට නකුල හා සහදේව යන නම් ඇති නිවුන් පුතුන් දෙ දෙනෙක් ද ලැබිණි. [1]එහෙත් පුත්‍ර කුමාරයන් පස් දෙන බාල වියෙහි සිටියදී මුණිවරයාගේ සාපය පරිසන් දී වනයෙහි දී ම පිය රජු මළේය.

ඔහුගේ වියෝගයෙන් බලවත් කනගාටුවට පත්වුණු බිසෝවරු වන තවුසන්ගේ ද උපකාර ඇතිව රජුගේ මළ සිරුර දෙනක බහා කුරු රට හස්තිනා පුරයට රැගෙන ගිය හ. රාජකීයයෝ ද, රට වැසියෝ ද මහත් හරසරින්

---

1 යුධිෂ්ඨිර, භීම, අර්ජුන යන කුන්ති දේවියගේ පුත්‍රයන්ට කෞන්තේය යන නාමයද සහදේව හා නකුලත් ඇතුලු පාණ්ඩව රජුගේ පුතුන් පස්දෙනාටම පාණ්ඩව යන නාමයද ව්‍යවහාර කරති.

**විෂ්ණුශර්මන්ගේ හිතෝපදේශයෙහි:**

"දරිද්‍රාන් භර කෞන්තේය මා ප්‍රයච්ඡේශ්වරේධනම්
ව්‍යාධිතස්‍යෞෂධං පථ්‍යං නිරුජස්‍ය කිමෞෂධෛ:"

1. (කුන්ති දේවියගේ පුත්‍රවූ (යුධිෂ්ඨිර) මහ රජ, අධිපතියා හට ධනය නොදෙව රෝගයක් ඇත්තා හට බෙහෙත හිතවේ, රෝගයක් නැත්තා හට බෙහෙතින් ප්‍රයෝජන කිම?)

**නීති සාරයෙහි:**

"ජයෝස්තු පාණ්ඩු පුත්‍රානං යේෂාං පක්ෂේ ජනාර්දන:
යත: කෘෂ්ණස් තතො ධර්මෝ යතො ධර්මස් තතො ජය:"

(යම් කෙනෙකුගේ පක්ෂයෙහි විෂ්ණුවිද; (යුධිෂ්ඨිරාදි) ඒ පාණ්ඩු පුත්‍රයන්ට ජයවේවා. යම් හෙයකින් කෘෂ්ණ රජතෙම වූයේ ද; ඒ කාරණයෙන් ධර්මය තෙම වූයේය. යම් කාරණයකින් ධර්මය තෙම වූයේද, ඒ කාරණයෙන් ජය වූයේහි.)



පාණ්ඩව නරපතියාගේ අවශාන කෘත්‍යය කළෝය. ස්වාමි වියෝගයෙන් බලවත් සන්තාපයට පැමිණි මද්‍රි දේවි තොමෝ ස්වාමියාගේ දරසෑයේ බුර බුරා නගින ගිනි මැද වැද මළාය. එහෙත් කුන්ති දේවි තොමෝ පුත් කුමරුවන් පස් දෙන රැක බලා ගැනුම් වස් ජීවත් වූවා ය.

වනගත ජීවිතයේදී යම් දවසක කුන්ති දේවිය භීම කුමරු ප්‍රසූත කළා ද; එ දිනම ධෘතරාෂ්ට්‍ර රජුගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර දුර්යෝධන කුමාරයා හස්තිනා පුරයේදී උපන්නේ ය. එදින නොයෙක් තැන්හි ගිනි හටගැනීමෙන් ද, අකුණු සහිත තද කුණාටුව ඇතිවීමෙන් ද, උලමු, බකමූහුණු ආදී සතුන්ගේ මූසල නාද ඇතිවීමෙන් ද හස්තිනා පුරයෙහි දුර්නිමිති පහළ වන්නට වන. "දේවයන් වහන්ස, මේ බිළිඳාගේ දිවි තොර කරනු මැනවි. මෙබඳු දුර්නිමිති පහළ කොට උපන් බිළිඳකුගෙන් රටට සුගතියක් ඇති නොවේ. මොහු නිසා ඔබ වහන්සේගේ පෙළපත ද විනාශ විය හැකිය"යි නිමිත්ත පාඨක බ්‍රාහ්මණයෝ ප්‍රකාශ කළහ. එහෙත් ධෘතරාෂ්ට්‍ර රජ තෙමේ බමුණන්ගේ කීම පිළි නොගත්තේ ය. ඔවුන්ගේ කීමට ගරු කොට තම කුළුඳුල් පුත් දුර්යෝධනගේ දිවි තොර කිරීමට පිය රජු අදහස් නොකෙළේ ය.

කල් යත්, යත්, ධෘතරාෂ්ට්‍ර රජු හට තව පුතුන් බොහෝ ගණනක් ලැබිණි. මේ කුමාරයන් හා හස්තිනා පුරයට සම්ප්‍රාප්ත වූ පාණ්ඩව කුමාරයන් පස් දෙනාගේ ද ආරක්ෂකයා (දේවව්‍රත) භීෂ්මයෝ වූහ. කෞරව-පාණ්ඩව යන දෙ නෑයන්ගේ ම දෙටු නෑයෙක් වූ භීෂ්ම තෙමේ ප්‍රඥාවන්තයෙක් වූවත් මේ පවුල් දෙක අතර පැවැති අමනාපය දුරු කොට සමථයක් කිරීමෙහි සමත් නොවී ය.

පාණ්ඩව රජු ස්වකීය රාජ්‍යය ධෘතරාෂ්ට්‍ර රජුට පැවරීමක් නො කෙළේ නම්, රාජ්‍යයේ හිමිකරුවන් වන්නේ පාණ්ඩව කුමාරයින් බව (ධෘතරාෂ්ට්‍රයන්ගේ පුත්‍රයන් වූ) කෞරවයෝ අමතක නොකළහ. පාණ්ඩවයෝ ධෘතරාෂ්ට්‍රයන්ට මහ රජු වශයෙන් ගෞරව කළ නමුත්

හේ රාජ්‍යාරක්ෂකයා පමණයි. අපගේ පිය පාණ්ඩු රජ නියම රජුය"යි ඔවුහු නොයෙක් විට කීහ. දුර්යෝධන ආදි කෞරවයෝ පාණ්ඩවයන්ගෙන් සව වශීයට විපත් ඇති විය හැකි බැවින් ඔවුන් කෙරෙහි වෛරයෙන් කල් ගත කළහ

දිවුම්, පැනුම්, පිහිනුම් ආදි ක්‍රීඩාවන්හිදී පාණ්ඩව කුමාරයින් පරාජය කිරීමට දුර්යෝධන ආදි සොහොයුරු කුමරුවන් සියයට කිසිසේත් නොහැකිවිය. එහෙයින් පාණ්ඩව පක්ෂයේ යුධිෂ්ඨිර යම් කිසි දිනක කුරු රට හස්තිනා පුරයෙහි සිංහසනාරූඪ විය හැකි බවත් දුර්-යෝධන ආදි සව පාක්ෂිකයනට එය හිමි කර ගත නොහැකි බවත් කෞරවයෝ ඉදුරා දත්හ.

ගඞ්ගානම් ගඟේ ජල ක්‍රීඩාවට යන පාණ්ඩව සහ කෞරව කුමාරවරුන් සඳහා වෙන්වූ ක්‍රීඩා මන්දිරයක් විය. ඔවුහු එහිදී රස කැවිලි, පලතුරු ආදිය අනුභව කොට සතුටු වූහ. දිනක් ක්‍රීඩාවලින් පසු උභය පක්ෂයේම කුමාර වරු එහි රැස්ව රස කැවිලි-පලතුරු ආදිය අනුභව කරන අතර දුර්යෝධනගේ නියමයෙන් විෂ යෙදූ රස කැවිලි වර්ගයක් භීමට කන්නට සැලැස්සුවේය. කුමන්ත්‍රණය ගැන කිසිත් නොදත් භීම ඒවා අනුභව කෙළේ ය. ඇසිල්ලෙකින් සියලු කුමාරවරු ම ගංතෙරට පැමිණියාහ.

"අපි තරගයට පිහිනමු" යි දුර්යෝධන යෝජනා කෙළෙන් භීම ද ඊට එකඟ වූයේ ය. මොහොතකින් දෙ දෙනාම තරගයට පිහිනන්නට වන. ක්‍රම-ක්‍රමයෙන් විෂ වේගය උග්‍ර භාවයට පත්වීමෙන් භීම තොම දියේ ගිලී ගියේ ය. එකෙණෙහි ජයග්‍රාහක දුර්යෝධන අනෙක් කුමාරවරුන් වෙතට ළඟාවී "වෙනදා වාගේ අදත් භීම මා පැරැද්දුවා, එයා නගරය දෙසට ගියා, දැන් ඉතින් අපි මාළිගාවට යමු" යි කියමින් සෙස්සන් සමග රජවාසලට ගියේ ය.



එ බස් ඇසූ කුන්ති දේවී 'කො සේ හෝ වේවා, නපුරක්'යයි බියපත් වූවා භීම සොයනු වස් ඉතිරි පුතුන් පිටත් කොට යැව්වා ය. මේ පරීක්ෂණයේදී ගං ඉවුරේ වැතිර උන් භීම ඔවුනට දක්නට ලැබිණි. රස කැවිලි කෑමෙන් පසු තමා දුර්වල වූ බවත්, එහෙයින් පීනන විට ක්ලාන්තවී තමා දියේ ගිලෙන්නට ගිය බවත් පණ බේරු ගත්තේ මහත් පරිශ්‍රමයකින් බවත්, දුර්යෝධනගේ උපායකින් තමාට විෂ යෙදූ කැවිලි කැවුණු බවත් භීම තෙමේ සිය සොහොයුරන්ට පවසා දුර්යෝධනගෙන් පරෙස්සම් වන ලෙස අවවාද කෙළේ ය. දියේ නොගැලී භීම සුවසේ රජ මාළිගාවට ළඟාවීම දුර්යෝධනගේ සතුට පිණිස නොවී ය.

කුරු-පාණ්ඩව කුමාරවරුන්ට ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ කර වීමේ කාර්ය්‍යය භීෂ්මයන්ට පැවරී තිබිණි. හෙතෙම කෘපාචාර්ය්‍ය බ්‍රාහ්මණ පඬි තුමා ලවා මේ කුමාරවරුන්ට ශිල්පශාස්ත්‍රයද සමස්ත භාරතයෙහි ම, අග්‍ර ධනුර්ධරයාව උන් ද්‍රෝණ ආචාර්ය්‍යවරයා ලවා ධනුශ්ශිල්පයද ප්‍රගුණ කරවූයේය.[1]

---

1 මේ ද්‍රෝණ තෙමේ බාල කාලයෙහි අග්නිවේශ රුසියා සමීපයෙහි ධනුර්වේදය පුහුණු වූයේ ය. පඤ්චාල රජ පුත්‍රයා වූ ද්‍රුපද කුමාරයා ද ඉගෙනගත්තේ එහිය. දිනක් ද්‍රුපද කුමාරයා ද්‍රෝණයන්ට කථා කොට "යහළුව, මා රජකම ලැබූ විට මගේ රටින් අඩක් ඔබට දෙන්නෙමි. මගේ පණ වැනි වූ හිත මිතුරාට දුගී ජීවිතයක් ගත කරන්නට ඉඩ නො දෙන්නෙමි" යි කීවේ ය "සුමිත්‍රය, එසේ වේවා" යි ද්‍රෝණ එ බසට සතුට පළ කෙළේ මහත් බලාපොරොත්තු ඇතිවය. කලක් ඉක්මිණි. දෙ දෙනාම ගුරු පූජා පවත්වා එතැනින් නික්මුණාහ. ද්‍රුපද කුමාරයා පඤ්චාල දේශයෙහි රජ වූයේ ය. ද්‍රෝණ තෙමේ කුරු-පාණ්ඩව කුමරුවන්ගේ ශික්ෂා ගුරුවූ කෘපාචාර්යයන්ගේ නැගණියන් වූ කෘපා සරණ පාවා ගෙන වාසය කෙළේය. විවාහයෙන් පසු මේ යුවලට

අශ්වත්ථාමා නම් පුත්‍රයකු ලැබිණි. දුගී බමුණෙක් වූ ද්‍රෝණ ආචාර්යවරයා තම පුතුට කිරි ටිකක් සපයා දීමෙහි අපොහොසත් විය. අශ්වත්ථාමා පිය නගා සෙල්ලම් කරන අවදියෙහි සෙසු ගම් දරුවන් කිරි බොනු දැක ඔහු තුළ ද කිරි ටිකක් බීමෙහි ආශාවක් ඇතිවිය. එහෙත් දෙමාපියන්ගේ දිළිඳුකම නිසා ඒ අදහස ඉටු නොවීය ද්‍රෝණ ආචාර්ය තෙමේද සිය පුතුට කිරිත්තක් සොයා ගන්නට ඇවිද්දේය. එහෙත් නොහැකි විය. සිය පුතුට කිරි ටිකක් දීගන්නට නොහැකිවීම ගැන දෙමාපියෝ දුක් වූහ. අශ්වත්ථාමා කිරි බීමෙහි ආශාවෙන් සිටින බැව් දුටු ගම් දරුවෝ දිනක් හාල්පාන දිය බොන්නට දී ඔහු රැවටූවෝ ය ගමේ කොල්ලන් විසින් සිය පුතුට කරන ලද සමච්චලය ගැන ලජ්ජාවටත් කණස්සල්ලටත් පත්වූ ද්‍රෝණාචාර්ය තෙමේ කලකිරුණේ කොල්ලන් කෙරෙහි නොව තම දිළිඳුකම කෙරෙහිය.

තමා හා එකට ඉගෙනගත් පඤ්චාල දේශාධිපති දෘපද රජු ගැනත් ඔහු එදා දුන් පොරොන්දුව ගැනත් සිහි වූ ද්‍රෝණ ආචාර්ය තෙමේ ඔහු සොයා ගියේය ඒ මොහොතේ දී දෘපද රජ තෙමේ රත් මිණි ඔටුණු පැළඳ සිවු සැට බරණින් සැරසී සිංහාසනාරූඪව රාජ සභාව ප්‍රබෝධ කරමින් සිටියේ ය ද්‍රෝණ බ්‍රාහ්මණයා රජු ඉදිරියට ගොස් "මිත්‍රය, ඔබගේ සත් මිත්‍ර වූ ද්‍රෝණයෝ මම ය. අග්නිවේශ මහාර්ෂීන් සමීපයෙහි ශිල්ප හදාරණ අවදියෙහි ඔබ මට දුන් පොරොන්දුව සිහිකරන්න. දැන් මා ඉතා දිළිඳු, අසරණ තත්ත්වයකට වැටී සිටින බැවින් ඔබට එය මතක් කරන්නට ආවෙමි. එදා ඔබ පොරොන්දු වූ හැටියට මට රටෙන් පංගුවක් වුවමනා නැත. ජීවිකාව කරගැනීමට තරම් උදව්වක් දෙනු මැනැවැ"යි කීවේ ය.



දෘපද රජුට එක වරම ද්‍රෝණයන් හඳුනාගත නොහැකි විය එහෙත් මොහොතක් සිතීමෙන් පසු හඳුනා ගත්තේ ය. "එම්බල බමුණ, හීන-දීන බමුණකු හා ප්‍රතාපවත් නරේශ්වරයෙකුගේ කුළුපගවූ මිතුරුකමක් නම් කොයින්ද? කුඩා අවදියෙහිදී වුණු පොරොන්දුවක් ගැන මට මතක නැත. කලක් ඇසුරු කළ බැවින් එක් රැයක් මෙහි නැවතී හොඳ කෑම්-පීම් ආදියෙන් සතුටුව යන්නට පිළිවනැ"යි දෘපද රජ තෙමේ ද්‍රෝණ බමුණාට පිළිතුරු දුන්නේ ය.

තමාගේ මහත් බලාපොරොත්තුව කඩකිරීමෙන් ද, තමාට අවමන් කිරීමෙන් ද දෘපද රජු විසින් කරන ලද අසාධාරණ ක්‍රියාව ගැන කෝපයෙන් හා ශෝකයෙන් ආකූල වූ ද්‍රෝණ තෙමේ "කවදාහරි ඔහුගෙන් පළිගනිමි" යන චේතනාවෙන් යුක්තව රාජ සභාවෙන් පිටවී ගියේ හස්තිනා පුරයටය. එහි ළඟාවූ හෙතෙම තමාගේ සුහුරුබඹු වූ කෘපාචාර්යයන්ගේ නිවසෙහි වෙස්වළාගෙන විසුවේ ය.

දිනක් රජකුමරුවන් ලෝ ගුළියකින් සෙල්ලම් කරමින් සිටියදී එය ළිඳකට වැටිණි. කුමාරයෝ එය ගොඩගන්නට බොහෝ උත්සාහ දැරූහ. එහෙත් නොහැකි විය. ඒ දුටු ද්‍රෝණ තෙමේ "දරුවෙනි, නුඹලා රාජ පුත්‍රයන් වුවත් අස්ත්‍ර විද්‍යාව නොදන්නාහුය. තවම බෝලය ගොඩගත නොහැකි විය මට යමක් කන්නට දෙන්න මම බෝලය ගොඩ දමමි"යි කීවේ ය. එබස් ඇසූ කුමාරයෝ "ඔබ බෝලය අරන් දෙන්නෙහි නම් එක් දිනක් නොව සදහටම ආහාර පානාදියෙන් සතුටු කරන්නෙමු"යි පැවසූහ. එකෙණෙහි ද්‍රෝණ තෙමේ දුන්නක් ගෙන ඊයකට පසු පසින් ඊයක් බැගින් අමුනා කුමරුවන් බලා සිටීයදීම බෝලය ළිඳෙන් මැත් කොට දුන්නේ ය. රාජ පුත්‍රයෝ මෙ පවත් භීෂ්ම දේවයන්ට සැළ කළෝ ය. ඒ ඇසූ භීෂ්මයෝ "මෙබඳු

වීර ක්‍රියාවක් කළ හැක්කේ ද්‍රෝණාචාර්යයන්ට පමණකැ"යි කියා ද්‍රෝණාචාර්යවරයා රජ වාසලට ගෙන්වා සත්කාර-සම්මාන කොට අස්ත්‍ර විද්‍යාව ඉගැන්වීම සඳහා කුමරුවන් භාර කළහ.

එකෙණෙහි ද්‍රෝණාචාර්ය තෙමේ කුමරුවන් බණවා "දරුවෙනි, මම තොපට රිසිවූ පරිද්දෙන් අස්ත්‍ර විද්‍යාව උගන්වන්නෙමි. ඉගෙනීම අවසන් වූ කල මා විසින් ඉල්ලනු ලබන එක් ඉල්ලීමක් ඉටු කළ යුතුය"යි කුමරුවන් පොරොන්දු කරවාගෙන ඉගැන්වූහ.

---

# ක්‍රීඩා යුද්ධය

පාණ්ඩව හා කෞරව කුමාරවරු ක්‍රම-ක්‍රමයෙන් වැඩී තරුණ වියට පැමිණෙත්ම ක්‍රීඩා යුද්ධයක් පවත්වා ඔවුන්ගේ සමත්කම් ලොවට පෙන්විය යුතුය යි අදහස් කළ ද්‍රෝණාචාර්ය තෙමේ සිය අදහස ධෘතරාෂ්ට්‍ර මහ රජුට දන්වා එයට අවසර ඉල්ලා සිටියේ ය. එහෙත් මහ රජ තුමා මේ අවසරය දුන්නේ සිතේ බලවත් වේදනාවකිනි. තමා අන්ධයකු වූ හෙයින් මේ ක්‍රීඩා යුද්ධය නැරඹීමට තමාට නොහැකි වීම එයට හේතුව ය.

නියමිත දිනය පැමිණෙත්ම මහ රජ තුමා සපිරිවරින් ක්‍රීඩා උත්සවයට සහභාගි වූයේය. විදුරයෝ පසු පසින් හිඳගෙන ඒ රණ සිප් දැක්ම රජ තුමාට විස්තර කෙළේ ය. කුන්ති හා ගන්ධාරි යන බිසෝවරු ද සපිරිවරින් අවුත් තම-තමන්ට නියමිත අසුන්වල හිඳගත්හ.

ඉක්බිති සුදු පිළියෙන් සැරසුණු ද්‍රෝණාචාර්ය තෙමේ ස්වකීය පුත්‍ර අශ්වත්ථාමන් සමග ක්‍රීඩා භූමියට පැමිණෙත්ම ඔවුන් අනුව යුධිෂ්ඨිර ප්‍රමුඛ රාජ කුමාරවරු ද එහි ළඟාවූහ. ගුරුවරයාට ආචාර කිරීමෙන් පසු ඔවුහු ශිල්ප දක්වන්නට පටන්ගත්හ. පළමු කොට ම කුමාරවරු ඇත්, අස්, රිය යනා



වාහනාරූඪව ඉලක්ක අනුව විදිමින් ස්වකීය දක්ෂතාවය ප්‍රදර්ශනය කළෝ ය. ඉන්පසු තරගයට අසුන්, ඇතුන් විහිදුම්, රිය පැදවුම් ද, කඩු හරඹ ආදිය ද දැක්වූහ. එක් කුමරුවකු දෙන බිහිසුණු කඩු පහර අනෙක් කුමරුවෙක් සිය පලිහ පෑමෙන් වළක්වාලීමෙන් පලිහ ක්‍රියා කරවීම පිළිබඳව තමන් තුළ ඇති දක්ෂතාවය හෙළි කෙළේ ය. ගදා, කුන්ත, තෝමර, අඩයටි ආදියෙන් දෙන පහරවල් වළක්වා ගත්තේත්, එසේම ය.

මෙසේ තරඟ පොර ඇතිවෙත්ම දුර්යෝධන හා භීම අතර ක්‍රීඩා වශයෙන් පැවැත්වුණු ගදා සටන නියම සංග්‍රාමයක ස්වරූපය ගන්නට වන. එකෙණෙහි ඒ බව සැලවූ ධෘතරාෂ්ට්‍ර මහ රජුගේ අණ පරිදි පොරය නතර කළහ.

ඉන්පසු ද්‍රෝණ ආචාර්යවරයාගේ නියෝගයෙන් අර්ජුන කුමාරයා පොර පිටියට පැමිණ කඩුවෙන් ද, චක්‍රායුධයෙන් හා මන්දෙන් ද දස්කම් පෑවේ ය. අනතුරුව ඊ පහරක් පාසා සෙලවෙන යකඩින් කළ ඌරකුගේ මුව තුළට දඬුවක් යැවීමෙන් ද, රිටක එල්ලන ලදුව සුළඟින් ඒ මේ අත පැද්දෙමින් තුබුණු හරක් අඟක් තුළට ඊයක් විදීමෙන් ද සිය දස්කම් පෑවේය. එපමණක් ද නොව අර්ජුන තෙම තම දුන්න ක්‍රියා කොට වජ්‍රා ගිනි, චණ්ඩ මාරුත ආදිය ද ඇතිකිරීමෙන් නොයෙක් හාස්කම් ද පෑවේය. හේ ජයග්‍රාහී ලීලාවෙන් පෙරළා ඊමට සැරසෙත්ම, සන්නාහ සන්නද්ධ වූ ආගන්තුක තරුණයෙක් පොරපිටිය මැදට පැමිණ අර්ජුන පෑ සියලු හපන්කමක්ම කිරීමෙහි හැකියාවක් තමන් තුළ ද ඇති බව පවසමින් රණකෙළි පෑමට අවසර අයැදියේය. ඒ ඇසූ දුර්යෝධන තෙමේ ඒ අභියෝගය මුදුණෙන් පිළිගෙන ඊට අවසර ලබාදුන්නේ ය.

දුර්යෝධන තෙමේ සූරකම් පෑමට අමුත්තාට අවසර ලබාදුන්නේ කෙසේ නමුත් අර්ජුනයන් පරදවාලීමේ දුෂ්ට

චේතනාවෙනි. ඒ බැව් ඉඳුරා දත් අර්ජුන බලවත් කෝපයට පැමිණි නමුත් ආගන්තුක තරුණයාගේ අභියෝගය පිළිගත්තේ ය

"තෝ කවරෙක්ද? කිසිම කැඳවීමක් නොමැතිව මේ රණ පිටියට එන්නට තරම් සාහසික වූයේ ඇයිද?"යි අර්ජුන තෙමේ රණවේග ස්වරයෙන් ප්‍රශ්න කෙළේ ය.

"මගේ නම කර්ණ, මා ආවේ අංග දේශයෙන්, තට මේ රණ පිටියෙහි රැඳී සිටීමට යම් කිසි බලයක් ඇද්ද? එයට නො අඩු බලයක් මට ද ඇත. මා හා සටනට තට අභියෝග කරනවත් හැර, තා මාගෙන් පරාජයට පත්වන බවත් ඉඳුරා දනිමි"යි ආගන්තුක තරුණයා පිළිතුරු දුන්නේ ය.

---

1. කර්ණ කාගේ කවුද? කුන්ති දේවියගේ පුත්‍රයෙක් වූ කර්ණ වූ කලී මහා වීරවර කුමාරයෙකි. කුන්ති දේවිය විවාහවන්නට පෙර දුර්වාස ඍෂිවරයා විසින් තමන් හට පවරා දෙන ලද මන්ත්‍රයෙහි බලයෙන් සූර්ය දිව්‍ය පුත්‍රයා විසින් කරනලද නාභි පරාමර්ශනය හේතුකොට ගෙන කන්‍යාවස්ථාවෙහිම ගැබ්ගෙන තමා ප්‍රසූත කළ කුමාරයා කර්ණය. උපන් සැණෙකින්ම ඔරුවක තංවන ලදුව අශ්ව නදී තීරයෙහි පාකර හරිනු ලැබූ තම පුත් රුවන කුන්ති දේවී තොමෝ හඳුනාගත්තාය. (සිය දෙටු පුත් රුවනෙහි ආරෝහ පරිණාහ දේහයත්, රූප සම්පත්තියත් දුටු ඕ තොමෝ සතුටු කඳුළු හෙළුවා ය. එහෙත් කර්ණ කුමාරයා ස්වකීය ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය බව පළ කිරීමෙහි එඩිතර නොවූ කුන්ති දේවී තොමෝ මුවින් කිසිත් නො බැණ නිහඬ ව රණ පිටිය දෙස බලාගත්වනම උන්නා ය.) අශ්ව නදිය ඔස්සේ යමුනා නදියටත්, යමුනා නදිය ඔස්සේ ගඞ්ගා නදියටත් පාවී ගිය කර්ණ කුමාරයා අංග දේශයෙහි අධිරථ නම් රථාචාර්යයාගේ භාර්යාව වූ රාධා විසින් පුත්‍ර ස්නේහයෙන් ඇති දැඩි කරනු ලැබී ය.



යුධිෂ්ඨිර, භීම හා අර්ජුන මෙන් ම කර්ණත් කුන්ති දේවියගේ කුසයෙන් උපන් කුමාරයෙකි. එහෙත් ඔහු එක් වූයේ කුස ඔත් සොහොයුරන්ට නොවේ. දුර්යෝධන ප්‍රමුඛ කෞරව කුමාරයන්ට ය.)

---

මෙ වදන් ඇසූ දුර්යෝධන ආදී කෞරව කුමාරවරු අත්පොළසන් නගමින් සතුට පළ කළහ. එහෙත් කර්ණ කවරෙකුදැ යි නොදත් අර්ජුන හා භීමයෝ මුවින් නොබැණ බලා උන්හ.

"අර්ජුන කුමාරයිනි, තොපට සටනට අවසරයි. ඔහුගේ වචන අසා නිහඬව සිටිය හැක්කේ කවරකුටදැ?"යි කියමින් ද්‍රෝණාචාර්ය තෙමේ ස්වකීය ශිෂ්‍යයාට අවසර දුන්නේ ය.

අර්ජුන පක්ෂයට යුධිෂ්ඨිර, භීම ආදී සහෝදරයිනුත්, කර්ණ පක්ෂයට දුර්යෝධන හා ඔහුගේ සහෝදර පිරිසක් එක්වූහ. බලවත් ලේ වැගිරීමක පෙර නිමිති පහළ විය.

එ කෙණෙහි භරත වංශයේ ඥාතිවරයෙක් වූ කෘප තෙමේ පොර පිටියට අවුත් "කර්ණයෙනි, තා සටනට කැඳවූයේ පාණ්ඩු රාජවංශික කුමරුවන් ය. තා ඔවුන් හා සටනට සුදුස්සෙක් දැ යි තීරණය කිරීමට තගේ දෙමාපියන්ගේ වත-ගොත කියව"යි නියම කෙළේ ය.

වන්නට යන්නේ කුමක්දැ යි කවුරුත් කර්ණ දෙස බැලුවෝ ය එහෙත් එබසට බිම බලාගත්වනම සිටි කර්ණයා නිහඬ වූයේ ය

"ඔහුගේ ජන්මයෙන් හා දෙමාපියන්ගෙන් ඇති ප්‍රයෝජන කුමක්ද, ඔහු වීරයකු බව ඔප්පු කොට ඇත අර්ජුන හා සටනට රාජ වංශිකයෙකු නොවීම ඔහුගේ නුසුදුසු කමකැ යි ඔබ කියන්නෙහි නම් මාගේ සුමිතුරු වූ කර්ණයන්ට මම දැන් අංග රාජ්‍යය පවරා දෙන්නෙමි"යි කියා ධෘතරාෂ්ට්‍ර පිය මහ රජු ලවා කර්ණයා අද පටන් අංග රාජ්‍යයෙහි රජු හැටියට ප්‍රකාශ කරවූයේ ය

(දුර්යෝධනයන් තුළ පාණ්ඩු කුමාරවරුන් කෙරෙහි පවත්නා බද්ධ වෛරය මේ ක්‍රියා කලාපයෙන් මොනවට පැහැදිලි විය.)

මේ මොහොතේදී කර්ණයාගේ පියාණන් වූ අධිරථ නම් රථාචාර්යයා එහි පැමිණියේ ය. කර්ණ තෙමේ හුනස්නෙන් නැගී සිය අවි පසෙක තබා පියාණන්ට ආචාර කෙළේ ය. ඔහුගේ මේ ක්‍රියාවෙන් පාණ්ඩවයෝ කිපුණාහ තමන් හා තරගයට ආ තැනැත්තා රියැදුරකුගේ පුතකු ය යි කියමින් භීම තෙමේ සාවඥ බැලුම් හෙලන්නටත්,නින්දා කරන්නටත් විය. ඔහුගේ පරිභවයේන් කුපිතවූ කර්ණ තෙමේ කොපු වෙන් අසිපත මෑත් කොට ගෙන සටනට සැරසුණේ ය. යළිත් භයානක සංග්‍රාමයක ලකුණු පහළවෙත්ම මහ රජුගේ නියමයෙන් එය සමථයකට පැමිණියේ ය. එදින හිරු බැස යත්ම මහ පිරිස විසිර ගියාය.

## ගුරු දක්ෂිණාව

පාණ්ඩව හා කෞරව රජ කුමරුවන්ගේ අවි සිප් ඉගෙනීමේ කාලය අවසන් වූ හෙයින් ද්‍රෝණ ආචාර්යවරයාට ගුරු දක්ෂිණාව පිරිනැමීමේ මොහොත එළඹ සිටියේ ය.

එහෙත් කුමාරවරුන්ට ඉගැන්වීම භාරගත් දිනයේ හේ ගුරු දක්ෂිණාව වශයෙන දැන්වූයේ තමාට නින්දා කළ අහංකාර ගති ඇති මිත්‍රද්‍රෝහි ද්‍රැපද රජුගෙන් පළිගැනීමට තමාට සහාය වන ලෙස ය. ද්‍රෝණාචාර්ය තෙමේ යළිත් තම අදහස කුමරුවන්ට පැවසුවේ ය.

සවකීය ආචාර්යවරයාට අවමන් කළ ද්‍රැපද නරපතියාගෙන් පළිගැනීම සඳහා පඤ්චාල දේශය බලා යාමට කුමාරවරු සැරසී ගත්හ දුර්යෝධන තෙමේ කෞරව හමුදාව මෙහෙයවත් ම, අර්ජුන තෙමේ පාණ්ඩව හමුදාව මෙහෙයවූයේ ය. දුර්යෝධනයන්ගේ හමුදාව පඤ්චාල



යුද්ධයෙන් පසුබසිත්ම,අර්ජුන තෙමේ සිය හමුදා මෙහෙයවා ද්‍රැපද රාජයන් සමග සටන් කොට පරාජයට පත් ද්‍රැපදයන් අල්වා පිටිතල හයා බැඳ ද්‍රෝණ ආචාර්යයන් වෙත ගෙනවුත් ගුරු දක්ෂිනා වශයෙන් දුන්නේ ය.

"මම තොපට තොපගේ නිදහස දෙමි. මට ගුරු පඬුරු වශයෙන් ලැබුණු තොපගේ රාජ්‍යයෙන් භාගයක් ද ආපසු තොපට දෙමි. ඉතිරි කොටස මා සතු ය. ඒ ඇයි? මා තොප හා කුඩා අවදියෙහිදී මෙන් දැනුදු යහළු කම පතන හෙයිනි. රජකුගේ යහළුවකු විය යුත්තේ රජකු පමණියි තොප එදා මට කීවා මතකද?"යි ද්‍රෝණාචාර්ය තෙමේ පවසත්ම අභිමානවත් ද්‍රැපද රජ තෙම නිහඬව බලා උන්නේ ය. එහෙත් ඔහු තුළ ද්‍රෝණයා කෙරෙහි පැවැති වෛරය ශත ගුණයෙන් වර්ධන විය. ද්‍රැපද රජ ජයග්‍රාහි ද්‍රෝණ ආචාර්යවරයා කෙරෙහි යම් පමණකට වෛර කෙරේද? එමෙන් ම මේ සටන නිසා කෞරවයෝත් පාණ්ඩවයන් කෙරෙහි වෛර කරන්නට වන.

ද්‍රැපද නරපති තෙමේ ද්‍රෝණ ආචාර්යයන්ගේ අභය දානයෙන් පසු ඉමහත් වූ අපමාණයෙන් පෙළෙමින් සිය රටට පැමිණියේ ය. එහෙත් ද්‍රෝණ ආචාර්යයන් කෙරෙහි ද, පාණ්ඩවයන් කෙරෙහි ද ඔහු තුළ ඇතිවූයේ බද්ධ වෛරයකි සිය සතුරන්ගෙන් ජය ගැනීම පිණිස ධීර, වීර, පරාක්‍රමවත් පුත්‍ර රත්‍නයක් තමාට ලබා ගනුවස් හෙතෙම සිය දෙවියන්ට පුද-පූජා පැවැත්වූයේ ය.

## දුර්යෝධනයගේ කුමන්ත්‍රණයක්

ධෘතරාෂ්ට්‍ර මහ රජ තෙමේ යුධිෂ්ඨිර කුමාරයා යුව රජ තනතුරට පත් කෙළේය. ධාර්මික ශාන්ත ගුණ දරන්නාවූ ද, ධීර, වීර වූ ද යුධිෂ්ඨිරයන් කෙරෙහි රට වැස්සෝ ඉතා පැහැදුණෝ ය. එහෙත් පිය රජුගේ මේ ක්‍රියාව දුර්යෝධනගේ සිත නොගත්තේ ය. ජාතක පුත්‍රයා වූ තමා පසෙක

සිටියදී කුන්ති පුත්‍ර යුධිෂ්ඨිරයන්ට යුව රජකම දීම ඔහුගේ හිතට බලවත් දුකෙකි. ඒ එසේ වුවත් පිය රජු විසින් කරන ලද්දේ සාධාරණ ක්‍රියාවකි.

මේ හේතුවෙන් හස්තිනා පුරය යස ඉසුරින් වැඩෙන්නට වන. අළුත් යුව රජ තෙමේ මහා ජනයාගේ සිත් දිනාගත්තේ ය. මෙ සේ පාණ්ඩව කුමාරවරු යසසින් හා තෙදසින් වැඩෙත් ම දුර්යෝධනගේ සිත සොවගින් හා කුකුසින් පිරෙන්නට වන. කවදා නමුත් හස්තිනා පුරය ඇතුළු සමස්ත කුරු ක්ෂෙත්‍රයෙහිම පාලන බලය පාණ්ඩවයන් අතට පත්විය හැකි යයි හෙතෙම කල්පනා කෙළේ ය. "දැන් ධෘතරාෂ්ට්‍ර රජතුමා වයෝවෘද්ධ ය. ඇරත් එතුමා නීත්‍යානුකූල රාජයා ද නො වේ. ඒ නිසා ධීර-වීර ගුණවන්ත යුධිෂ්ඨිර යුව රජුට රාජ්‍යය පවරා එතුමා අස් විය යුතුය"යි ඇතැමෙක් පැවසූහ.

රට වැසියන් අතර පවත්නා මෙ බඳු කථා චරපුරුෂයන්ගේ මාර්ගයෙන් දුර්යෝධනට දැනගන්ට ලැබිණි. හේ කෝපාකුල විය. 'කෙසේ නමුත් පාණ්ඩව කුමාරවරුන් විනාශ කළ යුතුය'යි තීරණය කොටගත් හෙතෙම පිය රජු හා කුමන්ත්‍රණයක් කෙළේ ය. එහි විපාක වශයෙන් පාණ්ඩව කුමරුවන් හා කුන්ති දේවියත් වාරණාවතී නගරයට පිටත් කොට යවන ලදී.

ඉන්පසු දුර්යෝධන තෙමේ පුරෝචන නම් ඇමතියකු කැඳවා "පුරෝචනය, පාණ්ඩවයන් පිටුවාසල් කළ පමණකින් අපට නිදහසේ විසිය නොහැක. කෙසේ නමුත් ඔවුන් වනසා දැමිය යුතු ය. මම තට මහත් සම්පත් දෙමි"යි පැවසුවේ ය.

ඔහුගේ වචනය මුදුනෙන් පිළිගත් පුරෝචන තෙමේ වාරණාවතියේ පාණ්ඩවයන් නවාතැන් ගන්නා ගෙය ගිනි තැබීමට විධි-විධාන යෙදුවේ ය. එහෙත් මේ අබිරහස කලින් දැන සිටි පාණ්ඩවයෝ ගේ තුළින් මහ වනය දෙසට



උමඟක් සාරා පුරෝචනයා හා දරුවන් පස් දෙනකු සහිත වැදි අඟනක් ද ගෙයි සිටියදී ගෙට ගිනි තබා උමඟින් පලා ගිය හ. වැදි අඟන හා දරුවන් ද පුරෝචනයා ද ගින්නට අසුවූ හ.

වන පලතුරු හා දඩ මස් කමින් කටුක දිවි පෙවෙතක් ගත කරමින් වනචාරීව හැසිරෙන පංච පාණ්ඩවයන් අතුරින් භීමයෝ හිඩිම්බ හා බක නමැති භයානක රාක්ෂසයන් දමනය කළ හ. ඔවුහු ව්‍යාස දේව මහර්ෂින්ගේ උපදෙස් අනුව ඒකචක්‍ර නගරයට පැමිණ යාචකයන් මෙන් වෙස් වළාගෙන වාසය කළ හ.

## ස්වයංවරය

පාංචාල දේශයේ ද්‍රුපද රජුගේ දියණිය වූ ද්‍රෞපදී කුමාරිය සකලකල්‍යාණ ලක්ෂණ සම්පන්න රූප රාජිණියක් වූවා ය. ඒ මේ කුමාරියගේ රූප සම්පත්තිය පිළිබඳ යශෝඝෝෂාව මුළු මහත් දඹදිව අස්සක් මුල්ලක් නැර පැතිරිණි. ඇගේ රූප ලක්ෂණය ගැන ඇසූ හැම රජෙක් ම ඇ සිය මෙහෙසිය කර ගැනීමෙහි ආශා ඇත්තේ විය. ද්‍රෞපදී කුමාරිය විවාහ කොට දීම සඳහා ස්වයංවර මඞ්ගල උත්සවයක් විය. අප්‍රසිද්ධ වේශයෙන් සිටි යුධිෂ්ඨිර, භීම, අර්ජුන ආදී පාණ්ඩව කුමරුවන්ට ද මෙ පවත් සැලවිය. කුමරිය පාවා ගනු ලබන තැනැත්තා අස්ත්‍ර ශිල්පයෙහි කෙළ පැමිණි ශක්තිමත් මහා වීරවරයකු විය යුතු බැව් කාටත් පෙණිනි.

සිය මෑණියන් වූ කුන්තී දේවියගෙන් ලබන ලද අවසර ඇති පංච පාණ්ඩව කුමරුවෝ බමුණු වෙසින් සැරසී ස්වයංවර උත්සව සභාවේ බමුණන් සඳහා වෙන් කොට තුබූ කොටසෙහි අසුන් ගත්හ. රජ දරුවෝ ද, රජවරුද නන් අබරණ කැලුම්න් ස්වයංවර මහා සභාව ඒකාලෝක

කළ හ. නැඟණියන් වූ ද්‍රෞපදී කුමරිය සවයංවර මඟා සභාවට ළඟාවූයේ දෙටු සොහොයුරු ධෘෂ්ටද්‍යුම්න කුමාරයා සමඟය.

ධෘෂ්ටද්‍යුම්න තෙමේ මහ පිරිස අමතා මෙසේ පැවසුවේය. "තමුන්නාන්සේලාට මෙහි තිබෙන දුනු, ඊ පෙනෙනවා ඇත. ඊ මතුයෙහි චක්‍රයක් කැරකෙයි. චක්‍රය මතුයෙහි ඉලක්කය පිහිටුවා ඇත. ඊට පහළින් දිය මැද චක්‍රයේ හා ඉලක්කයේ සේයාව වැටේ. යම්කිසි වීරයෙක් දියෙහි පෙණෙන සේයාවට නෙත් යොමු කොට චක්‍රයේ සිදුර මැදින් ඊ පහරක් විද නිකුත් කෙළේ නම් ඒ හපන්කම කළ වීරයා හට මාගේ නැඟනිය විසින් වර මාලාව පළඳවා පිළිගනු ලබන්නේය."

ධෘෂටද්‍යුම්නගේ ප්‍රකාශයෙන් පසු එක් එක් රජදරුවෝ ඉලක්කය විදීමට සැරසුණා හ. එහෙත් ඒ කිසිවකුටත් ඒ විශාල රන් දුන්නේ ඊය යොදන්නටවත් නො හැකි විය මේ අතර කර්ණ තෙමේ ඉතා පහසුවෙන් දුන්නෙහි ඊය යොදා ඉලක්කය විදින්නට සැරසෙත්ම "මට රථකාරයාගේ පුත්‍රයා පිළිගන්නට බැරිය" යි ද්‍රෞපදී කුමාරිය ප්‍රකාශ කළා ය. ඒ ප්‍රකාශයෙන් දුර්මුඛවුණු කර්ණ තෙමේ කිසිත් නොකියා ලජ්ජාවෙන් කැලඹුණු සිතැත්තේ එ තැනින් ඉවත් වූයේ ය. එයින් නොසන්සුන් වූ දුර්යෝධන කුමාරයා ද මේ වීර ක්‍රියාව සඳහා ඉදිරිපත් වී බලාපොරොත්තු සුන්කොට ගත්තේ ය. ශිශුපාල හා ජරාසන්ධ රජවරු දුන්නෙහි ඊය යොදන්නට ගොස් අතේ මාපටැඟිලි තුවාල කර ගත් හ.

ඊළඟට පැමිණියේ බමුණු වෙසින් උන් අර්ජුන ය. හේ ඉතා පහසුවෙන් දුන්නෙහි ඊය යෙදුවේ ය. ඉලක්කයට විද්දේ ය. ඒ දුටු බමුණු තරුණයෝ ඔල්වරසන් දුන්හ. රජ දරුවෝ අමනාප වූහ. මේ අතර ද්‍රෞපදී කුමාරිය මල් මාලය පළඳවා අර්ජුනයන් සමාදරයෙන් පිළිගත්තා ය



පංච පාණ්ඩවයෝ බමුණන් විසින් පිරිවරන ලදුව ද්‍රෞපදී දේවියත් සමඟ කුන්ති දේවිය උන් නිවෙසට ළඟා වූහ. පළමු කොටම ගෙතුළට ගිය භීම තෙමේ කුන්ති දේවිය අමතා "මෑණියනි, අද අපි අගනා දෙයක් සොයාගෙන ආවෙමු" යි පැවසුවේ ය "යහපති, පුත්‍රය, එය තොපි පස් දෙනම බෙදා ගෙන අනුභව කළ යුතුය" යි එ බසට මෑණියෝ කීවා හ.

මෙ සේ පවසමින්–කුන්ති දේවිය ගෙයින් පිටතට ආ කල නියම රූප රාජිණියක් වූ ද්‍රෞපදී කුමාරිය දැක විස්මය පත්වූවා ය. සවකීය පුත්‍ර භීම විසින් කියන ලද හොඳම භික්ෂාව මේයැයි ඇට අවබෝධ විය මෑණියන්ගේ අවවාදය පරිදි තුමූ පස් දෙනා ම ද්‍රෞපදී කුමාරිය ආවාහ කර ගැනීමට සම්මත කොට ගත් හ.[1]

සිය දියණිය පුරුෂයන් පස් දෙනෙකුගේ භාර්‍යාභාවයට පත්වීම ගැන දෘපද රජු ශෝක වූයේ ය. එහෙත් පසුව ව්‍යාස මහ රුසි රජ මාළිගාවට අවුත් "මහ රජ, පූර්ව ජන්මයෙහි ද්‍රෞපදී තොමෝ සවාමිපුරුෂයකු ලබනු වස් ඊශ්වරයා ඉදිරියෙහි පස් වරක් ම වරම් ලැබුවා ය එහෙයින් මේ ජන්මයෙහි සවාමිපුරුෂයන් පස් දෙනකු ම ඕ හට ලැබිණි මෙය විය යුත්තකි" යි කියා දෘපදයන්ගේ දොම්නස දුරු කෙළේ ය.

---

1. දැනුදු ඇතැම් පළාත්වල සොහොයුරන් කීප දෙනෙකුට එක බිරියක් පාවා ගැනීමේ සිරිතක් පවතී. මේ වූකලී ශිෂ්ට සමාජයෙන් පිටු දැකිය යුතු අශිෂට චාරිත්‍රයකි ජාතක පියා කවරෙක්දැ යි යන්නවත් හරි ආකාර තේරුම්–බේරුම් කරගත නොහැකි මේ සිරිත ඇතැමුන් අතර පවතින්නේ දේපළ රැක ගැනීමේ බලාපොරොත්තුවෙන් යයි කියති. කුමන කරුණක් නිසා කරනු ලබන්නක්වුවත් මේ පිළිකුල් සිරිත, නීතියෙන් තහනම් කටයුතු නිහීන ක්‍රියාවකි.

ද්‍රෞපදී කුමාරිය ආවාහ කොට ගත් පංච පාණ්ඩවයෝත් ඔවුන්ගේ මෑණියන් වූ කුන්ති බිසොවත් පංචාල දේශයෙහි යහතින් වෙසෙන බැව් සැලවූ කෙණෙහිම කෞරවයන්ගේ වෛරය සළිත් මතුවිය. ද්‍රෞපදීය දිනාගත්තේ බ්‍රාහ්මණ තරුණයෙක් නොව වෙස්වළා පැමිණි අර්ජුනයන් බවත්, ගෙය ගිනි ලෑමෙන් පාණ්ඩව කුමරුවන්ට අනතුරක් සිදු නොවූ බවත් දැනගත් දුර්යෝධනයන්ගේ කෝපය නිම්-හිම් නැති විය.

කුමන කුමන්ත්‍රණයකින් හෝ පංච පාණ්ඩවයන් විනාශ කළ යුතුය යි දුර්යෝධනයෝ කල්පනා කළ හ. හේ පිය මහ රජු වෙත ගොස් සතුරන්ගේ බලය දිනෙන්-දින දියුණුවන බවත්, තව දුරටත් බලා සිටියොත් ඔවුන්ගෙන් තමන්ට හානි සිදුවිය හැකි බවත් පැවසුවේ ය. ඔහුගේ අදහස ස්ථිර කරමින් පාණ්ඩවයන්ට විරුඩව සටන් කළ යුතු බව දැක්වූයේ කර්ණය. මොවුන්ගේ කතා-බස් ඇසීමෙන් නොසන්සුන්වූ ධෘතරාෂ්ට්‍ර තෙමේ භීෂ්ම, විදුර, ද්‍රෝණ යන ප්‍රධානීන් ගෙන්වා කුමක් කටයුතුදැයි විමසුවේය "පාණ්ඩවයන් හා සටන් නොකරනු මැනවි. ඔවුන්ට රාජ්‍යයෙන් අර්ධයක් පවරාදී සාමයෙන් විසීම යෙහෙකැ" යි ඒ තිදෙනාම පැවසූහ.

ඉන් පසු විදුර තෙමේ පංචාල දේශයට ගොස් පාණ්ඩව පස් බෑයන් හා මවු බිසොවත්, ද්‍රෞපදී දේවියත් කැඳවා ගෙන ආවේය.

ධෘතරාෂ්ට්‍ර රජ තෙමේ ඔවුන්ට මෙසේ පැවසූවේය. "පුත්‍රයිනි, තොපි ද මාගේ පුත්‍රයන් මෙන් ම මාගේ ආදරයට පාත්‍ර වන්නාහු ය. එහෙත් මෙහි වාසය කිරීම විපත්තිකරය. දුර්යෝධන, දුඃශාසන ආදී මාගේ පුත්‍රයෝ තොප නුරුස්සති එහෙයින් තොපගේ පියාණන්ට හිමි අර්ධ රාජ්‍යය (ඛාණ්ඩව ප්‍රස්ත පුරාණ රාජධානිය) තොපට පවරා දෙමි. එය බාරගෙන ඛාණ්ඩව ප්‍රස්ත නගරයෙහි රාජධානිය පිහිටුවාගෙන සුවසේ වාසය කරව්."



එ බස් මුදුනෙන් පිළිගත් පාණ්ඩව කුමාරවරු මහ රජුගෙන් සමුගෙන ඛාණ්ඩව ප්‍රස්තයට ගොස් එහි ස්වකීය රාජධානිය පිහිටුවා ගත් හ. ලද දෙයින් සතුටුවූ ඔවුහු තමන්ට ලැබුණු රාජධානිය සමෘද්ධිමත් භාවයට පැමිණවූහ මේ රාජධානිය ඉන්ද්‍රයාගේ ඉන්ද්‍ර පුරය මෙන් යස-ඉසුරින් වැඩෙත්ම ඉන්ද්‍ර ප්‍රස්ත නගරය ය යි පතළ විය. කල් යත් යත්, නාරද ඍෂිවරයාගේ අවවාද පරිදි යුධිෂ්ඨිර රජ තෙමේ සහෝදර කුමරුවන්ගේද සහාය ඇතිව නොයෙක් රටවල් නතු කොටගෙන රාජසූය යාගය නම් පූජාවක් පවත්වා රාජාධිරාජ භාවයට පත් වූයේ ය.

යුධිෂ්ඨිරයන්ගේ ඒ මේ ජයග්‍රහණය දුර්යෝධන, දුඃශාසන ආදී කෞරව කුමාරවරුන්ගේ සතුට පිණිස නොවීය දුර්යෝධන තෙමේ සිය මයිලණුවන්වූ ගන්ධාර දේශාධිපති සකුණි සමග කුමන්ත්‍රණයක් කෙළේය එහි විපාක වශයෙන් යුධිෂ්ඨිර, භීම, අර්ජුන ආදී රාජකීයයෝ ද්‍යූත ක්‍රීඩාවක් සඳහා හස්තිනා පුරයට පැමිණියාහ.

## ද්‍යූත ක්‍රීඩාව

දුර්යෝධන වෙනුවෙන් ක්‍රීඩා කෙළේ ඔහුගේ මයිලණුවන්වූ සකුණිය. පාණ්ඩවයන් වෙනුවෙන් ක්‍රීඩා කෙළේ යුධිෂ්ඨිරය ඔහුගේ සිවු බෑයෝ ඔහු පිටු පස හිඳගත්හ. දුර්යෝධන, දුඃශාසනාදි කෞරවයෝ සකුණි පිටුපස හිඳගත් හ.

යුධිෂ්ඨිරයෝ පළමු කොට පරදුවට තැබුවේ සිය ගෙල බැඳ තුබුණු අගනා මුතු හරය. දුර්යෝධනයෝ සිය මිණි මෙවුල් දම පරදුවට තැබූහ. එකෙණෙහි යුධිෂ්ඨිර තෙම පස ඇට ගෙන විසිකෙළේය ඒවා පහටත්, හතරටත් වැටිණි. සකුණි හතරත්, හයත් දැම්මේය.

"මූත් හර තොපටය" යි කෝපයෙන් පැවසූ යුධිෂ්ඨිරයෝ රන් කළස් එක් ලක්‍ෂ අට දහසක් හා භාණ්ඩාගාරයෙහි සියලු ධනය පරදු තැබූහ පස ඇට දැමීමේ වාරය ලැබුණේ සකුණිට ය. හෙතෙම පස ඇට ගෙන දෙකක් හා තුනක් දැම්මේය.

"සත්තකින්ම මේ වර ඔහු පැරදවිය හැකිය" යි කියමින් යුධිෂ්ඨිර තෙමේ හෙප්පුව සොලවා පස ඇට විසි කෙළේය එහෙත් පස ඇට බර වැටී ඒවා එකක් හා තුනක් ම තිබිණි.

මේ සිද්ධියෙන් විමසිලිවත්වූ යුධිෂ්ඨිර තෙම පස ඇට අතට ගෙන යම් කිසි ප්‍රයෝගයක් ඇද්දැ යි ඒවා පරීක්‍ෂා කොට බැලුවේය. එහෙත් එහි කිසියම් දෙසක් දක්නට නොලැබිණි

"ඔබ අප ගැන සැක කරන හෙයින් වෙනත් පස ඇට ගෙනෙන්න කවර පස ඇටයකින් සෙල්ලම් කළත් අපි ඔබ පරදවන්නෙමු."

"සකුණිගේ ආඩම්බර වචනවලින් යුධිෂ්ඨිර ඇවිස්සුනේය මේ වර පරදුවට තැබුවේ යුධිෂ්ඨිරගේ රන්මුවා මංගල රථයයි එහෙත් ඒ වාරයේත් ජය අත් වූයේ සකුණිටය. ඊ ළඟට යුධිෂ්ඨිර තෙමේ රජ මාලිගයේ ගී ගයන සොළ'සැවිරිදි රූප සුන්දරියන් දහසක් ඔවුන් පැළඳි මිණිබරණ සමගින් පරදු වශයෙන් තැබුවේය ඒ වරත් ජය සකුණි සොයා ආවේය.

මෙ පරිද්දෙන් ඇතුන් ද, අසුන් ද, සේනාවන් ද පරදු තබා යුධිෂ්ඨිරයෝ ද්‍යූත ක්‍රීඩා කළහ. ඒ හැම වාරයකදී ම ජය අත් කෙළේ සකුණි ය. අන්තිමේදී සවකීය රාජ්‍යය පරදුවට තබා ක්‍රීඩා කෙළේ ය. ඒ වර ඔහුට වැටුණේ හතර බැගින් දෙකකි. එහෙත් සකුණි ඔහු එකකින් පැරද



වූයේය. ඉක්බිති මිණි බරණ සහිතවූ සොහොයුරන් පරදු වශයෙන් තැබුවේය. එසින් ද ජය අත් වූයේ සකුණිට ය. අවශානයේදී යුධිෂ්ඨිර තෙමේ තමා පරදුවට තබා ක්‍රීඩා කෙළේ ය. මේ වර යුධිෂ්ඨිරයනට දෙකෙක් හා තුනෙක් ද; සකුණිට පසෙක් හා සයෙක් ද වැටිණි යුධිෂ්ඨිර තෙමේ තමාටවත් අයිතිකම් නැතිව අසරණ බවට පත්විණි.

"යුධිෂ්ඨිර අධිරාජයාණෙනි, දැන් ඔබ පැරදුනෙහිය. එහෙත් ඔබ පැරදුණු සකල වස්තුවකට වඩා වටිනා වස්තුවක් ඔබට ඇත. ඔබේ සොහොයුරන් ද, ඔබේ රාජධානිය හා කුදු-මහත් හැම වස්තුවක්ම පෙරළා දිනා ගැනීමට වටනා පරදුවක් නැද්ද? රූපශ්‍රීයෙන් අනුපම ද්‍රෞපදී රාජිනිය ඔබ සතුව නොසිටින්නී ද?"

"මම මාගේ ආදරණීය ද්‍රෞපදී දේවිය පරදු වශයෙන් තබමි" යි යුධිෂ්ඨිරයෝ සකුණිට පිළිතුරු දුන්හ.

මේ වර සකුණි මුලින් තුනත්, පහත් දැම්මේ ය. යුධිෂ්ඨිර තෙමේ සැලෙන අතින් හෙප්පුව ගෙන පස ඇට දැම්මේ ය. හයත්, එකත් පෙරළිණි. අහෝ! ද්‍රෞපදී දේවිය වහලියක් බවට පත් වූවා ය.

ජය පානයෙන් මත් වූ කෞරව නායක දුර්යෝධන කුමාරයා විදුරයන් අමතා "ද්‍රෞපදී වහලිය මෙහි කැඳවා එන්න ඈ මෙවක් පටන් අප මාලිගාවේ බිම අමදිනු ඇතැ" යි පැවසුවේ ය.

එහෙත් එ බසට අවනත නොවී නො ඉවසිලිවත් වූ විදුර තෙමේ ධෘතරාෂ්ට්‍ර රජු දෙසට හැරී "මහ රජ, ද්‍රෞපදිය වහලියක් නොවේ. යුධිෂ්ඨිරයන් ඈ පරදුවට තබද්දී ඔහු තුමූ තම නිදහස නැති කොට ගෙන හමාරය. ඒ නිසා ඈ පරදුවට තැබීමට ඔහුට ඇති බලයක් නැත. මම ඔබගෙන් එක් ඉල්ලීමක් ඉල්ලමි. මේ මහා ජනකාය මධ්‍යයේ

අහිංසක ද්‍රෞපදියට නිග්‍රහ කිරීමට දුර්යෝධනට ඉඩ නුදුන මැනවි. පාණ්ඩවයන්ගෙන් දිනාගත් වස්තුව පෙරළා ඔවුන්ට පවරා දුන මැනවැ" සි පැවසුවේ ය.

එ බස් ඇසීමෙන් කිපුණු දුර්යෝධන තෙමේ "කුරු වංශය නැඟී සිටිනු දක්මට නොකැමැති බියසුල්ලා නිහඬවන්න. ඔබේ අවවාදයෙන් අපට කම් නැතැ" යි විදුර නිහඬ කෙළේ ය.

ඉක්බිති දුර්යෝධනයෝ සිය කණිටු සොහොයුරු දුඃශාසන අමතා "ද්‍රෞපදී දේවිය අල්වා මෙහෙ ගෙනව" යි කීහ. එ බසින් සතුටට පත් දුඃශාසන තෙමේ ද්‍රෞපදී දේවිය උන් තැනට ගොස් "අප විසින් ඔබ සියලු දෙනාම දිනා ගතුම්හ." මා හා කැටුව රජ සභාවට යන්න එන්න" ය යි කීවේය.

දුඃශාසනයන්ගේ වචනවලින් බියෙන් ඇලලී ගිය. ද්‍රෞපදී රාජිනිය ඔහුගෙන් මිදෙනු වස් ගන්ධාරි බිසොව ළඟට දිව්වාය. එහෙත් දුඃශාසන එ තැනට දිව ගොස් ද්‍රෞපදී රාජිනියගේ කේශ කලාපයෙන් අල්වා රාජ සභාවට ඇදගෙන එන්නට වන

"මට යන්නට ඉඩ හරුව, "මහ පිරිස මැද මා තනි වතකින් පමණක් සැරසී සිටින්නේ කෙසේ දැ" යි කියමින් ඕ හැඬුවා ය.

"දැස්ස, නී මා හා ආ යුතු ය: නී නිරුවතින් සිටියත් මට කම් නැතැ" යි කියමින් දුඃශාසන තෙමේ අහිංසක ද්‍රෞපදී දේවිය කෙස් වැටියෙන් ඇදගෙන රාජ සභාවට ආවේය.

ද්‍රෞපදී දේවිය තමාට අවමන් කිරීමට ඉඩ නොදෙන ලෙස ධෘතරාෂ්ට්‍ර ඇතුළු වැඩිහිටියන්ගෙන් අයැද සිටයා ය එහෙත් එයින් වැඩක් නොවීය.



මේ අතර ධෘතරාෂ්ට්‍ර රජුගේ පුත්‍රයෙක්වූ විකර්ණ තෙමේ ද්‍රෞපදියට අපහාස කිරීම අසාධාරණ ක්‍රියාවක් බවත්, තමාත් අන් සතුව සිටියදී ද්‍රෞපදිය පරදූ තැබීමට යුධිෂ්ඨිරට කිසිදු අයිතියක් නැති බවත් පැවසුවේය. ඔහුගේ ප්‍රකාශයට පටහැනිවූ කර්ණ තෙමේ "මෝඩ දරුව, ඔබේ උපදෙස් වුවමනා කාටද" යි කියමින් විකර්ණ නිහඬ කොට "දුඃශාසනයිනි, දැන් මේ පාණ්ඩවයන් කෞරවයන්ගේ දාසයන් බව මේ පිරිසට පෙන්වා ලව් ඔවුන්ගේ රාජ ඇඳුම් උනාදමව්, මේ ගැහැනිය නිරුවත් කරව්" ය යි පැවසුවේය.

එ බසින් ඔද වැඩී ගිය සිත් ඇති දුඃශාසනයෝ ඇ නිරුවත් කරනු වස් ඇඳිවතින් අල්ලා ඇද්දූ හ. විලියෙන් කම්පාවුණු ද්‍රෞපදී තොමෝ ඇගේ මුළු වෙර යොදා තම ඇඳි වත මුදා හරින්නට ඉඩ නොදී ඔහු හා පොර බදමින් තමාට පිහිට වන ලෙස කෘෂ්ණ දේවයාට යාඥා කළා ය.

දුඃශාසනයන්ගේ සාහසික ක්‍රියාව දිවැසින් දුටුවාවූ ද ද්‍රෞපදියගේ කන්නලව්ව දිව කණින් ඇසුවාවූ ද කෘෂ්ණ දිව්‍ය රාජයා ඇසිල්ලකින් ඈ පසෙක අදෘශ්‍යමානව හිඳ ඉවත් කළ-කළ පමණට වස්ත්‍රයෙන් ඇගේ සියුමැලි ගත වැසුවේ ය. ද්‍රෞපදියගේ වස්ත්‍ර හරණයෙන් රැස්වූ වස්ත්‍ර රාශිය කන්දක් මෙන් ගොඩ ගැසිණි. මෙ පරිද්දෙන් කෘෂ්ණ තෙමේ එළඹ සිටි ඉමහත් නින්දාවෙන් ද්‍රෞපදිය මුදා ගත්තේ ය.

"නවතිනු-නවතිනු!" යන හඬ මහ පිරිස කෙරෙන් නික්මෙන්නට වන "ද්‍රෞපදී දේවියට මේ අන්දමින් නිග්‍රහ කිරීමත්, දෙවියන්ට විරුද්දව ක්‍රියා කිරීමත් දක්නට අපි නොකැමැත්තෙමු" යි ඇතැමෙක් කීහ.

නිම්-හිම් නැති සොවින් හා කොවින් ඇලලී ගිය භීම තෙමේ එකෙණෙහි නැඟී සිට "ක්‍ෂත්‍රියෙනි! මාගේ වචනයට සවන් දෙන්න, ද්‍රෞපදියට නැතක් නිගා කළ දුඃශාසන-

යාගෙන් මම පළිගනිමි. යුද්ධයෙහිදී ඔහු මා අතින් මැරුම් කන බවට සකල දේව ගණයා හමුවෙහි මම සපථ කරමි. ඉදින් මම ඔහුගේ ළයේ රුහිරු උරා නොබිව්ව හොත් මම සදහට ම නිරයේ පැසෙම්වා" යි පැවසීය.

පංච පාණ්ඩවයන්ගේ දුර්වල අවස්ථාව දුටු දුර්යෝධනයෝ උපහාස වශයෙන් ඉඟි කොට ද්‍රෞපදියගේ කලවා ප්‍රදේශය දක්වමින් සිනා පෑහ. ඒ අවඥාවත් භීමයන්ගේ කෝපාග්නියට තෙල් ඉසීමක් වැනි විය.

"මගේ දෙටු සොහොයුරු යුධිෂ්ඨිරයන්ගෙන් අවසර ලැබුණොත් මේ සභා මධ්‍යයෙහිදීම දුර්යෝධනගේ කලවා යුග්මය එක් ගදා පහරකින්ම බිඳ දමන්නෙමි. ඒ දුෂ්ටයා මෙලොවින් තුරන් කරන්නෙමි" යි භීමයෝ වේග ස්වරයෙන් ප්‍රකාශ කළහ.

භීමගේ මේ ප්‍රතිඥාවන් ශ්‍රවණය කළ විදුර තෙමේ මෙසේ පැවසුවේය. "ඔබ හැමට භීමගේ ප්‍රතිඥාවන් ඇසෙන්නට ඇත. ඔහු යමක් කියයිද, එය එසේම ඉටු කරනු නිසැකය" යි කියමින් කුරු රාජ වංශයේ අවනතිය ගැන ස්වකීය ශෝකය පළ කෙළේය.

මේ මොහොතෙහිදී මාලිගාවේ හෝම කුටියෙන් කැනහිලකුගේ භයානක ශබ්දයක් නිකුත් විය. එසේම ගදබුවන්ගේත් මස් බුදින පක්ෂීන්ගේත් භයානක නාදයන් ගෙන් අහස් කුස පිරී ගියේය. එහි උන් ජනතාව බියෙන් තැතිගත්හ.

"දෙවියෝ අප රැක දෙත්වා, මේ භරත වංශයේ විනාශය" යි විදුරයෝ හඬ නැඟුහ.

ධෘතරාෂ්ට්‍ර රජ තෙමේ මේ සියල්ලක් අසා සිට ඉවසුම් රහිත වූයේ දුර්යෝධනයන් අමතා "තා අපගේ කෞරව රාජ වංශයේ සාපයයි. තොපට ඇසුනාද? දූත් ඇතිවූණු කුරිරු හඬ, තාගේ නුවණැස අඳුරු වී ද? නො එසේ නම් පාණ්ඩවයන්ගේ ලක්ෂ්මිය වැනිවූ ද්‍රෞපදී දේවියට මෙසේ අවමන් කරන්නෙහිද? මා මගේම සහ ලේ නෑයන්ට අවමන් කිරීමට මෙතෙක් තොපට ඉඩ දෙන්නට සිදුවීම ගැන කනගාටුවෙමි" යි කියමින් ද්‍රෞපදී රාජිනිය දෙසට හැරී "මට කමා කරන මෙන් මම තිගෙන් ඉල්ලමි, තිට කැමැති වරයක් ඉල්ලව" යි කීවේය.



"ඔබ වහන්සේ මට වර ප්‍රදානය කරන සේක් නම් යුධිෂ්ඨිරයන් නිදහස් කරන සේක්වා."

"එය ඉටු කෙළෙමි. තුවත් වරයක් ඉල්ලව"

"එසේ නම් අප කෙරෙහි දයානුකම්පාවෙන් අවිආයුධයන් සහිතවූ භීම, අර්ජුන, නකුල, සහදේව යන පාණ්ඩව කුමාරයනුත් මුදාහරින සේක්වා"

"ඔවුන් හැම දෙනටත් නිදහස දෙමි. තුන් වැනිවත් වරයක් ගනු ව."

"දේවයිනි, වෙන වරයක් නො ඉල්වමි. වෛශ්‍යයනට එක වරයකුත්, ක්ෂත්‍රිය කාන්තාවකට දෙවරයකුත්, ක්ෂත්‍රියයකුට තුන් වරයකුත්, බ්‍රාහ්මණයකුට වර සියයකුත් ගත හැකි බව දනිමි. යුධිෂ්ඨිර ආදි මාගේ ස්වාමිපුරුෂයන්ට නිදහස ලැබුණු බැවින් මට වෙන වරවලින් කම් නැත. ඔවුන්ගේ හා මැණියන්ගේත්, මගේත්, ජීවනෝපාය ඔවුන් විසින් සලස්වා ගන්නවා ඇත." යි ද්‍රෞපදිය පැවසුවාය.

නිදහස ලැබූ යුධිෂ්ඨිර ආදි පිරිස ධෘතරාෂ්ට්‍ර රජු වෙත එළඹ නමස්කාර කොට ගමනට සමුගත්හ. ඉක්බිති භීෂ්ම ආදී වැඩිහිටියෝ ද සමුගෙන ද්‍රෞපදී රාජිනත් සමග ඉන්ද්‍රප්‍රස්ථ නගරය බලා ගමන් ගත්හ.

පාණ්ඩවයන්ගේ නිදහස ලැබීම දුර්යෝධන, කර්ණ, සකුණි ආදි කෞරව පාක්ෂිකයන්ගේ සතුට පිණිස නොවීය. ඔවුහු යළිත් කුමන්ත්‍රණය කළහ. පාණ්ඩවයන් යළිත් සූදුවට කැඳවා පරාජය කොට දොළොස් අවුරුදු වන වාසයකට යැවිය යුතුයයි ඔවුහු තීරණය කොට ගත්හ. එපමණෙක්ද? යළිත් ඔවුන් කැඳවීමට ධෘතරාෂ්ට්‍රයන්ගෙන් අවසරයද ලබාගත්හ

සවකීය පුත්‍ර දුර්යෝධනගේ ක්‍රියා කලාපයෙන් අනාගතයෙහි කෞරව වංශය බලවත් විපතකට පත්වන බව වැටහී ගිය ගන්ධාරි බිසොව නැවතත් පාණ්ඩවයන් සූදුවට කැඳවීම වළක්වන්නට වෑයම් කළ නමුත් පුත්‍රයා මෑණියන්ගේ වචනයට නොනැමුණේය. ඔහු තුළ පාණ්ඩවයන් කෙරෙහි පැවතියේ සීමාව ඉක්ම ගිය වෛරයකි.

ජවාධික අසුන් අරා ගිය රාජ දූතයෝ පාණ්ඩවයන් ඉන්ද්‍රප්‍රස්ථයට ළඟා වන්නට මත්තෙන් ඔවුන් වෙත අවුත් යුධිෂ්ඨිරයන්ට ආචාර කොට "මහ රජාණෙනි, අපේ මහ රජාණන් වහන්සේ යළිත් වරක් ඔබ තුමාට දූ කෙළියට පැමිණෙන ලෙස ආරාධනා කරනු පිණිස අප එවූ සේක" යි පැවසූහ.

රජ අණ ඉක්මවිය නොහැකි හෙයින් යුධිෂ්ඨිර තෙමේ බෑයන් හා ද්‍රෞපදී දේවියත් සමඟ පෙරළා අවුත් ඒ මාරක ක්‍රීඩා මණ්ඩපයට ඇතුළු වූහ.

මේ වර පරදු වශයෙන් තබන ලද්දේ කිසියම් වස්තුවක් නොවේ. පරාජිත පක්ෂය දොළොස් අවුරුදු වන වාසයකට යා යුතුය. දොළොස් අවුරුද්ද ඉක්මුණු පසු ඔවුනට ජන වාසයට ආ හැක. එහෙත් ඔවුහු අප්‍රසිද්ධ වේශයෙන් නාම ගෝත්‍රයෙන් අප්‍රකටව අවුරුද්දක් වාසය කළ යුතු ය. යම් හෙයකින් කවරකු හෝ ඔවුන් හඳුනාගනු



ලැබුවේ වීනම් නවත් අවුරුදු දොළසක් වන වාසයට යා යුතුය. "එම්බා රජ්ජුරුවෙනි, තෙපි මේ පරදුව බාරගන්නහු ද?"

"සකුණිගේ මේ කථාව ශ්‍රවණය කොට නිසොල්මන්ව හිඳීමට අකැමැති වූ යුධිෂ්ඨිර තෙමේ යළිත් දූ කෙළියට පටන් ගත්තේය. මේ වරද ජය අත් වූයේ සකුණිටය. පාණ්ඩවයෝ පරාදය පිළිගත්හ.

ඔවුහු සිය මෑණියන් වූ කුන්ති දේවිය විදුර සමීපයෙහි නවත්වා ද්‍රෞපදිය සමග වන ගත වූ හ.

"යම් දිනක සත්‍යය ජය ගන්නේ ය" යි ධෘතරාෂ්ට්‍ර මහ රජාණන්ට අහසින් දේව වාක්‍යයක් ඇසිණ. පාණ්ඩවයන්ගේ වනගතවීමෙන් පසු දේවර්ෂි නාරද තෙමේ ධෘතරාෂ්ට්‍ර මහ රජුගේ රාජ සභාවෙහි දර්ශනය වී "මහ රජ, ඔබගේ පුතුන්ගේ වරදින් මෙයින් තුදුස් වසකට පසු ඔබගේ කෞරව රාජ වංශය පාණ්ඩව කුමාරයන් අතින් විනාශ මුඛයට පත්වන්නේ ය" යි කියා අතුරුදන් විය.

මේ අනාවැකිය ඇසූ ධෘතරාෂ්ට්‍ර රජ තෙමේ බියෙන් ඇලලී ගියේ ය.

## වන වාසය

පංච පාණ්ඩවයෝ මවගෙන් ලබන ලද ආශීර්වාද ඇත්තෝ තාපස වේශධාරීව ඔවුන්ගේ අවි–ආයුධ ආදියත් රැගෙන වනගත වූ හ. ඔවුන්ගේ ප්‍රියාව වූ ද්‍රෞපදී දේවියත් ඔවුන් සමගම වනගත වූවාය. ඔවුන්ගේ හිතෛෂි ඉන්ද්‍රසේන ආදි අනුගාමිකයෝ ද ඔවුන් සමග වූ හ. එපමණෙක් ද? යුධිෂ්ඨිර රජුගේ පුරෝහිතයාවූ ධෞම්‍ය නම් බ්‍රාහ්මණ පඬිතුමාද සපිරිවරින් ආවේය.

පළමු දින උතුරු දෙසට ගමන් ගත් පාණ්ඩව කුමාරවරුන් ඇතුළු පිරිස එදින රැ ගඟක් අසබඩ වූ නුග

රුකක් මුල ලැගුම් ගත්හ. ගඟින් ලබා ගත් පැන් ටිකක් හැර එ දින රෑ ඔවුන්ට අන්කිසි ආහාරයක් නොලැබිණි. එවේලෙහි යුධිෂ්ඨිරයෝ අති ශෝකයට පැමිණ ධෞම්‍ය පුරෝහිත බ්‍රාහ්මණයා අමතා "පින්වත් බ්‍රාහ්මණය, අපි යම් කිසි කරුණක් නිසා කලට වේලාවට ආහාර නැතිව දුක් විඳිමුව, එහෙත් බ්‍රාහ්මණ සමූහයා අප නිසා නිරාහාරව ඉඳීම් බලවත් පාපයකි. මෙයට උපායක් සිතනු මැනව" යි කීහ

ඒ ඇසූ ධෞම්‍ය තෙමේ සවල්ප වේලාවක් නිහඬව සිට "මහරජාණෙනි, ලෝ වැසියනට අහර ලැබෙන්නේ හිරු ගෙන් නිසා හිරු දෙවියාට පූජාවක් පවත්වනු මැනව" යි කීවේය.

එබසින් උනන්දු වූ යුධිෂ්ඨිර තෙමේ හිරු දෙවියනට ඉමහත් බැතින් පුද දෙන්නට වන.

දිනක් හිරු දෙවියෝ යුධිෂ්ඨිරයන් හමුවෙහි පෙනී සිට "ඔබගේ අභිප්‍රාය සඵල වන්නේය මේ තළිය පිළිගන්න මෙහි බහා ලන සවල්ප ආහාරයක් වුවත් ඔබ හැමටත් පැමිණෙන ආගන්තුකයනටත් සෑහී ද්‍රෞපදී දේවිය අනුභව කරනතුරු නොනිමෙන්නේය. මේ තළිය දොළොස් අවුරුද්දක් ගතවනතුරු ද ඔබට කෑම සපයනු ඇතැ" යි කියා තළිය පෙන්වා අතුරුදන් වූහ.

එවක් පටන් ද්‍රෞපදී තොමෝ ඉතා සුළු වූ ආහාරයක් සූදානම් කොට ඉහත කී තළිය තුළ බහා ලයි එකෙණෙහි එය ආහාර රාශියක් බවට පත්වේ ඒ ආහාරය පංච පාණ්ඩවයන්ද ආගන්තුකයන් හා පරිවාර ජනයා ද කුසපුරා අනුභව කරති සැමට පසු ද්‍රෞපදී දේවිය ආහාර අනුභව කළාය. තමන් වෙත පැමිණෙන දුගී-මගී යාචකයෝ ද ඔවුන්ගේ තළියෙන් ලැබෙන දානයෙන් ප්‍රීති වූහ

කල් යත්-යත්, පාණ්ඩවයන් දෛවත වනයෙහි ගත කරන දුඃඛිත ජීවිතය සියැසින් දැකගැනීමෙහි ආශාවක්



දුර්යෝධනයන් තුළ ඇති විය. එහෙත් පිය රජු එයට අවසර නොදෙන හෙයින් දෛවත වනාසන්නයෙහි වූ සවකීය ගව රැළ ගැණ බැලීමටත්, වසු පැටවුන් ගැණ බැලීමටත් දූත් නිසි කලැයි කියා පියාණන් මුළා කොට එහි ගියේය.

සව ප්‍රියාවන්ද සමග ගිය ඔවුහු කුරු ක්‍ෂෙත්‍රයෙහි ගව රැළ සෝදිසි කොට බලා පාණ්ඩවයන් වසන තැනට තුදුරුව කඳවුරු බැඳ ගැනීමට මඩු-කූඩම් තනවන්නම ගාන්ධර්ව සේවා භටයෝ එහි අවුත් "මේ වනාන්තරය අප රජ තුමා සතුය. එහෙයින් මෙහි වාඩිලා ගැනීමට අවසර නැතැ" යි පැවසූහ.

එයින් කිපියාවූ දුර්යෝධනයෝ "මේ වනය අප සතුය" යි කියමින් සටනට වන්හ. ගාන්ධර්ව දේශාධිපති චිත්‍රසේන රජුගේ හේවායන් හා කෞරවයන් අතර බලවත් සටනක් ඇති විය. මෙයින් පරාජයට පත් දුර්යෝධනයන් හා පිරිස සිර අඩස්සියට ගනු ලැබූහ.

මේ බව සැල වූ ඔවුන්ගේ ඥාති සහෝදර භීම, අර්ජුන ආදි වීරයෝ එහි ගොස් ගාන්ධර්වයන් පරදවා දුර්යෝධන ඇතුළු පිරිස මුදාගෙන යුධිෂ්ඨිරයන් හමුවට පැමිණ වූහ. යුධිෂ්ඨිර රජ තුමා ඔවුන් සාදරයෙන් පිළිගෙන "ඔබට පිහිට වන්නට ලැබීම අපට බලවත් සතුටෙකි. සුවසේ හස්තිනා පුරයට යව" යි දුර්යෝධනයන් ඇතුළු පිරිස පිටත් කොට යැව්වේය. එහෙත් දුර්යෝධන, දුඃශාසන කර්ණ ආදීන්ගේ පාණ්ඩවයන් කෙරෙහි පැවැති වෛරය තව-තවත් වැඩි විය. මෛත්‍රිය වෙනුවට ඔවුන්ගේ සිත් තුළ ඇති වූයේ වෛරය යි.

දුර්යෝධනයන්ගේ සිත සතුටු කිරීම පිණිස කර්ණ තෙමේ ආඩම්බර බස් තෙපලනුයේ තෙළෙස් අවුරුද්ද ගතවුණු පසු යුද්ධ කොට අර්ජුන ඔනසා දැම්මට

පොරොන්දු විය. ඉන් පසු කර්ණ, දුර්යෝධන, දුඃශාසන ආදි පිරිස නොයෙක් රටවල් ආක්‍රමණය කළහ. ඒ රටවලින් ගෙනෙන ලද වස්තුවෙන් කෞරවයන්ගේ භාණ්ඩාගාරය පිරවූහ

වන වාස කාලය කෙළවරවීමෙන් පසු පාණ්ඩව සහෝදරයෝ දෙළොස් මසක් අප්‍රසිද්ධ වේශයෙන් ගත කළහ. වෙස්වලාගෙන උන් ඔවුන් අතුරින් යමකු කිසිවකු විසින් හඳුනාගනු ලැබුවේ වී නම් ඔවුන් තවත් දෙළොස් වසක් වනගතව විසිය යුතු විය. එහෙයින් ඔවුහු මේ දෙළොස් වස ගත කෙළේ ඉතා පරෙස්සමිනි.

ඔවුන්ගේ පිට රට විසීමේ කාලය හමාරවත් ම යළිත් සිය රට බලා යාමේ වකාවානුව එළඹ සිටියේ ය. මේ අතර පාණ්ඩවයෝ වෙස්වළා සිටියදී නතරවී උන් මත්ස්‍ය දේශයේ විරාඩ රජුගේ දියණියගේ හා (අර්ජුන කුමරු නිසා සුභද්‍ර කුමාරියගේ කුසින් උපන්) අභිමන්‍යු කුමාරයාගේ විවාහය මත්ස්‍ය දේශයේහිදී සිදු විය.

දූ කෙළියෙහි උපායෙන් පාණ්ඩවයන් රටින් පිටුවහල් කොට සිය රට අත් කොටගත් කෞරව සහෝදරයන්ගෙන් යළිත් සිය අයිතිවාසිකම් ලබාගතයුත්තේ කෙසේ දැ යි සාකච්ඡා කරගැනීම සඳහා විරාඩ රාජ භවනයෙහිදී රාජකීයයන් අතර සාකච්ඡාවක් ඇතිවිය. සාමදානයෙන් ඉන්ද්‍ර ප්‍රස්ත රාජධානිය පවරා නුදුනහොත් සටන් කොට බල පූර්වකව රාජ්‍යය ලබා ගත යුතු යයි එහිදී සම්මත විය.

එහෙත් ඒ මේ රාජ සභාවට දුර්යෝධන පක්ෂයෙන් සහභාගිවූනියෝජිතයන්ගෙන් පැවසුනේ පංච පාණ්ඩවයෝ තුමූ වෙස්වළා සිටීමට නියමව තුබුණු වකවානුවෙහිදී යම්-යම් අවස්ථාවල පාණ්ඩවයන් ලෙසින් පෙනී සිටි බැවින් තව අවුරුදු දොළසක් වන වාසය කළ යුතු බව ය. එහෙත් ආත්ම ලාභය තකා කරන ලද ඒ ප්‍රකාශය වැඩිදෙනාගේ ඡන්දයෙන් ප්‍රතික්ෂෙප විය.



තව අවුරුදු දොළසක් ඉක්ම ගිය කල වත් පාණ්ඩවයන්ට ඉන්ද්‍ර ප්‍රස්තය පෙරළා දීමට දුර්යෝධන රජු එකග නොවන්නේ ය යි කෞරව නියෝජිතයෝ පැවසූහ. එහෙයින් උභය පක්ෂය සටන් කළ යුතුය යි තීරණය විය.

ඉන්ද්‍ර ප්‍රස්තය පාණ්ඩවයන්ට පවරා දිය යුතුය යි තමා කළ අනුශාසනයට කෞරව පක්ෂය එකග නොවූ බැවින් සුදුසු කල්හි කරන කටයුතු දනිමැ යි සිතමින් ශ්‍රී කෘෂ්ණ තෙමේ වාරක නගරයට පිටත්ව ගියේ ය.

උභය පක්ෂය ම බලගතු රජුන් තම පක්ෂයට බඳවාගනු වස් වෑයම් කළහ.

සියල්ලන්ට පළමුවෙන් ශ්‍රී කෘෂ්ණයන් සව පක්ෂයට බඳවා ගනු වස් දුර්යෝධන තෙමේ ඔහු හමුවීම සඳහා වාරක නගරයට ගියේ ය. ඒ අදහසින් ම අර්ජුන ද ගියේ ය. මේ මොහොතෙහි දී ශ්‍රී කෘෂ්ණ තෙමේ සිරියහන් ගබඩාවේ සැතපී උන්නේ ය. අර්ජුන පැමිණෙන්නට මඳක් කලින් එහි ළඟාවූ දුර්යෝධනයෝ ශ්‍රී කෘෂ්ණ අවදි වන තුරු යහනේ ඉස් දෙර වාඩි වී උන්නේ ය. පමා වී පැමිණි අර්ජුනයෝ යහනේ පා දෙර සිටි අඩියේ උන්හ.

නින්දෙන් අවදි වූ ශ්‍රී කෘෂ්ණයන් පළමුවෙන් දුටුවේ අර්ජුනයන් ය. ඉන් පසු දුර්යෝධනයන් පැමිණ සිටි බැව් දුටුවේ ය. ආගන්තුක සත්කාර කිරීමෙන් පසු ශ්‍රී කෘෂ්ණයෝ ඔවුන් ආ කරුණු පිළිබඳ ව විමසූහ.

"මා මෙහි ආයේ යුද්ධයට ඔබගේ සහායය අපේක්ෂා-වෙනි, මා මෙහි පළමුවෙන් ම පැමිණ ඔබ අවදිවන තුරු පසෙකට වී හිඳගෙන උන්නෙමි. අප දෙ පක්ෂයම ඔබට එක හැටි වුවත්, පළමුවෙන් ම ඔබේ උපකාරය බලාපොරොත්තුව පැමිණියේ මම ය. එහෙයින් ඔබගේ උපකාරය අප පක්ෂයට දුන මැනවැ" යි දුර්යෝධනයෝ ප්‍රකාශ කළහ.

"ඔබ කියන්නේ සැබෑවකි. එහෙත් මට පළමුවෙන් දක්නට ලැබුනේ අර්ජුනයි. එහෙයින් පාණ්ඩව පක්ෂය ගැනීම යුතුකමයි. එහෙත් දෙ පක්ෂයෙන් එක් පක්ෂයක් වෙනුවෙන් වත් මම ආයුධයක් අතට නොගනිමි. මම ආයුධ රහිතව එක් පක්ෂයක් ගනිමි. මාගේ අර්බුදයක්[1] පමණවූ නාරායනී භට සේනාව අනෙක් පක්ෂයට දෙන්නෙමි. මේ උපකාර දෙකින් දෙ පක්ෂය සතුටු එකක් පිළිගත යුතුය යි ශ්‍රී කෘෂ්ණයෝ පැවසුහ.

"මට භට සේනාවෙන් කම් නැත. ශ්‍රී කෘෂ්ණ තුමා පමණක් මගේ පක්ෂයට සිටියොත් මට ඇතැ" යි අර්ජුනයෝ ප්‍රකාශ කළහ. දුර්යෝධනයෝ ශ්‍රී කෘෂ්ණයන්ට ප්‍රශංසා කොට නාරායනී භට සේනාව ද ගෙන ඉමහත් සතුටින් හස්තිනා පුරයට ළඟා වූයේ ය.

උභය පක්ෂය ම බලරාමයන්ගේ ද උපකාරය අපේක්ෂා කළහ "කෞරව-පාණ්ඩව දෙ පක්ෂය ම මට එක හා සමානය. එහෙත් මට ශ්‍රී කෘෂ්ණයන් අත් හැර සිටින්නට නොපිළිවන. කොයි හැටි වුවත් මේ සහෝදර සංග්‍රාමයෙහිදී මම එක පක්ෂයකට වත් බැඳී සටන් නොකරමි" යි බලරාමයෝ පැවසුහ.

මෙසේ උභය පක්ෂයට ම බැඳුණු රාජකීය වීරයෝ බලසම්පන්න අවි-ආයුධ දරමින් සටන් බිමට රැස්වන්නට වන. විසි එක් දහස් අට සිය සැත්තෑවක් රණ සූර හස්තීන්ගෙන් ද, දෙ ලක්ෂ දහ අට දහස් සත් සියයක් රණකාමී අසුන්ගෙන් ද, හය ලක්ෂ පණස් හය දහස් එක් සියයක් යුද්ධ රථවලින් හා දශ ලක්ෂ අනූනුන් දහස් පන් සියයක් සූර-වීර භටයන්ගෙන් ද සමන්විත වුණු

1. විශාල සංඛ්‍යාවකි. අඞක 56 කින් ලිය යුතු ගණනකැයි පාලි-සිංහල අකාරාදියෙහි ද, දශ කෝටියකැ යි ශ්‍රී සුමඞගල ශබ්ද කෝෂයෙහි ද සඳහන් වේ.



සේනාංකයක් දුර්යෝධනයන්ගේ (කෞරව) පක්ෂය වෙනුවෙන් ද, පසළොස් දහස් තුන් සිය නවයක් යුද්ධ හස්තීන්ගෙන් ද, එක් ලක්ෂ පණස් තුන් දහස් අනූවක් රණ සූර අසුන් ගෙන් ද, හාර ලක්ෂ පණස් නව දහස් දෙසිය හැත්තෑවක් යුද්ධ රථවලින් හා සත් ලක්ෂ සැටපන් දහස් සාර සිය පණසක් යුද්ධ භටයන්ගෙන් ද සමන්විත වුණු සේනාංකයක් පාණ්ඩවයන්ගේ පක්ෂය වෙනුවෙන් ද සඞග්‍රාම භූමියට වන්හ.

මේ හැර ශ්‍රී කෘෂ්ණයන්ගෙන් දුර්යෝධනට ලැබුණු නාරායනී සේනාව පමණක් අර්බුදයෙකි පාණ්ඩව පක්ෂයට එක්වූ සාත්‍යකි රජුගේ චතුරඞගිනී සේනාව අක්ෂෞහිණියකි. එසේ ම පාණ්ඩව පක්ෂය ගෙන යුද වැදුණු චේදිය දේශයෙහි ධෘෂ්ටකේතු රජුගේ හා මගධ දේශයෙහි ජගත්සේන රජුගේ ද සේනාව අක්ෂෞහිණියකි.

හිරු-සඳු නුදුටු[1] භීෂණ සඞග්‍රාමයක් පැන නැගීමේ මොහොත එළඹ සිටියේය. මේ මහා සඞග්‍රාමය ආරම්භ කිරීමේ කිසිදු අදහසක් පාණ්ඩවයන් තුළ නොවීය. ඔවුන්ට වුවමනා කෙළේ සාමදානයෙන් තමන් සතු ඉන්ද්‍රප්‍රස්ථ රාජ්‍යය[2] ආපසු ලබාගැනීමට විනා ලක්ෂ සංඛ්‍යාත මනුෂ්‍ය ඝාතනයක් ඇති කිරීමට නොවේ. යුද්ධයක් ඇතිවීමෙන්

1 පරමාණු-ජලකර-බෝම්බ ෂෙල් වෙඩි, රොකට් වෙඩි, කාලතුවක්කු වෙඩි, විෂ ධූම ආදියෙන් දුන් පවත්නා සටන් කරන්නේ සතුරු නොදැකය. එහෙත් මේ මහා සඞග්‍රාමය ඇතිවූයේ මූණට-මූණ ලා සතුරු සියැසින් දැක-දැක ය. සතුරාගේ ගදා පහරට ගදායුධයෙන් ම පිළිතුරු දීමෙනුත්, කඩුවට පළිහ පෑමෙන් හා කඩුවෙනුත්, ඊයට ඊයෙනුත් ඔවුහු සවකීය රණ සූරභාවය ප්‍රදර්ශනය කළහ.

2 ඉඳිපත් නුවර

දෙ පක්ෂයේ ම සහෝදරයන්ට හානි පැමිණෙන බැව් ඉඳුරා දත් පාණ්ඩවයෝ යුද්ධ භූමියට පැමිණියේ කැමැත්තකින් නොවේ. අයිතිවාසිකම් රැකගැනීම සඳහා ය.

ඒ මේ යුද්ධය නතර කරවීම පිණිස ද්‍රෝණ, විදුර, ශ්‍රී කෘෂ්ණ ආදි වීරයෝ නොදුරු තැනක් භීෂ්ම, සඤ්ජය, ශ්‍රී කෘෂ්ණ තෙමේ ම ධෘතරාෂ්ට්‍රයන්ගේ කෞරව නැත. රාජ සභාවට ගොස් පාණ්ඩවයන්ට මුළු ඉන්ද්‍ර ප්‍රස්තය දිය නොහැකි නම් එකි-එකී කුමාරයාට ගම බැගින් දී යුද්ධය නවත්වන ලෙස යෝජනා කෙළේ ය.

එහෙත් දුර්යෝධන ඊට හරස්වෙමින් යුද්ධ නොකොට ඉඳිකටු මුණක පමණ බිමක් වත් නො දෙන බැව් තරයේ කියා සිටියේය.

කෞරව කුමාරයින්ගේ මාතෘ වූ ගන්ධාරි දේවිය ද යුද්ධ නො කරන ලෙස ස්වකීය පුත්‍රයාට අවවාද කළා ය. එහෙත් දුර්යෝධනයේ රණකාමී අදහස වළක්වාලිය නො හැකි විය.

සුන් වූ බලාපොරොත්තු ඇති ව හස්තිනා පුරයෙන් පෙරළා යන ශ්‍රී කෘෂ්ණයන්ට අතර මග දී කර්ණ හමුවී "යහළුව, ඔබ පාණ්ඩව කුමාර වරුන්ගේ දෙටු සොහොයුරාය. කුන්ති දේවියගේ වැඩිමහල් පුත්‍රයා ය. ඔබ මේ මහා සංග්‍රාමයෙහි පක්ෂයක් ගන්නෙහි නම් ගත යුත්තේ පාණ්ඩව පක්ෂය යැ" යි පැවසුවේ ය.

එ බසට කර්ණ තෙමේ මෙසේ කියන්නට වන. "ශ්‍රී කෘෂ්ණ තුමනි, කුන්ති දේවියගේ දෙටු පුතා මා බවත්, පංච පාණ්ඩවයන්ගේ දෙටු සොහොයුරු මා බවත් දනිමි. එහෙත් මගේ මෑණියෝ මා ඇගේ පුතෙකැ යි පිළිගත යුතු තැනදී නිසොල්මන් ව, නිහඬ ව සිටියා ය. මේ රියැදුරකුගේ සූතකු නොව, මාගේ පුත්‍රයාය යි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට මැළි වූවා ය. මා අධිරථ රථාචාර්යයාගේ පුත්‍රයාය යි



ලෝකයා විසින් කරනු ලබන අවමානය සපිර කළා ය. කොයි හැටි වෙතත් මා දැනට යැපෙන්නේ දුර්යෝධනගෙනි. එහෙයින් ඔහු හැර පියා අනෙක් පක්ෂයක් නොගනිමි" කර්ණයන්ගේ ඒ මේ ප්‍රකාශය සාධාරණ බැව් ශ්‍රී කෘෂ්ණයන්ට අවබෝධ විය.

කුන්ති දේවිය ද කුස ඔත් සොහොයුරන් සමග සටනට නො එළඹෙන ලෙස ස්වකීය පුත්‍ර කර්ණට අවවා ද කළා ය. එ බසට කර්ණ තෙමේ මෙසේ පැවසුවා ය.

"අම්මේ, ඔබ කළ වරදින් මා රාජ පුත්‍රයකු ව සිටත් රියකරුවකුගේ පුතකු යයි ලෝ වැස්සාගෙන් නින්දා ලබමි. ශිල්ප දැක්වීමේ අභ්‍යාස යුද්ධයෙහිදී අර්ජුන රජ පුත්‍රයා සමග මා සටන් කිරීමට නුසුදුස්සකුය යි පලවා හරින ලදී. ද්‍රෞපදියගේ ස්වයංවරයෙහිදී ද මා චක්‍රය විද හෙලන්නට සැරසෙද්දී මා රියැදුරකුගේ පුතෙකැයි ද්‍රෞපදියගෙන් නින්දා ලැබුවෙමි. මේ හැම නිග්‍රහයකට ම වරදකාරි ඔබ තුමිය. අර්ජුනත් මා වාගේ ම ශක්තිවන්තයෙකි වීරයෙකි. ඒ නිසා අප දෙ දෙන සටන් කළ යුතු ය. එක්කෝ මගෙන් ඔහු මැරුම් කෑ යුතු ය. නැතහොත් මා ඔහුගෙන් මැරුම් කෑ යුතු ය" යි කර්ණ පැවසුවේ ය.

සිය දෙටු පුත් කර්ණගේ අභිප්‍රාය අවබෝධ කළා වූ කුන්ති දේවිය කිසිවක් කියාගත නොහී දරු සිවු දෙනාට දෙව් පිහිට යදිමින් ආපසු ආවාය.

කෞරව-පාණ්ඩව යුද්ධය ආරම්භ විය කෞරව පක්ෂයෙහි සේනාධිනායක ධුරය දරණ ලද්දේ භීෂ්ම දේවයෝ ය. පාණ්ඩව පක්ෂයෙහි සේනාධිනායක ධුරය අර්ජුනට පැවරිණි. ශ්‍රී කෘෂ්ණ අර්ජුනගේ රථාචාර්යයා පමණක් නොව යුද්ධ උපදේශකයා ද වූයේ ය.

භීෂ්ම දේවයෝ දුර්යෝධනයන් අමතා "මා විසින් දිනපතා පාණ්ඩව සේනාවේ භටයන් දහස් ගණනින් විනාශ

කරනු ලැබේ. එහෙත් පංච පාණ්ඩව කුමාරයන් හා ඔබත් මට එක සමාන ය. එහෙයින් ඔවුන්ගේ ශරීරයන් මගේ ආයුධයකින් ස්පර්ශ නොකරන බව කල්තියාම පවසමි'' යි දැන්වූහ.

මේ අතර කෞරව පක්‍ෂයෙහි සේනාධිනායක පදවිය පිළිබඳ ව භීෂ්ම හා කර්ණ අතර මතභේදයක් ද ඇති විය. අන්තිමේදී භීෂ්ම සටන් කරන තුරු තමා සටනින් ඉවත් වන බව කර්ණ තෙමේ පැවසුවේ ය. තව-තවත් අවුල් හට නොගැනීම සඳහා තීරණයක් ද ඇතිකරගන්නා ලද්දේ ය. ද්‍රෝණ – ධෘෂ්ටද්‍යුම්න සමගත්, භීෂ්ම – අර්ජුන සමගත්, දුර්යෝධන – භීම සමගත්, භගදත්ත – විරාඩ සමගත්, කෘතවර්ම -- සත්‍යකි සමගත්, ශල්‍ය – යුධිෂ්ඨිර සමගත් ආදි වශයෙන් සටනට ඉදිරිපත් වීමේ ක්‍රමයක් ද ඇති කර ගත්හ.

## කෞරව–පාණ්ඩව යුද්ධයෙහිදී ඇතිකරගත් යුද්ධ නීති.

### හේමපාල මුනිදාස මහතුන්ගේ භාරත ගීතයෙහි පූර්විකාංශවෙනි.

දුර්යෝධනයන් ප්‍රමුඛ කෞරව කුමාරයන්ගේ දුෂ්ටාධ්‍යාශයන් දීන ක්‍රියා කලාපයන් අසාධාරණ චේතනාත් පිළිබඳ අනවබෝධයෙන් නොව ඔවුන් කෙරෙහි ළ බැඳුණු අචල පක්‍ෂපාතිත්වය නිසා යුද්ධාවතීර්ණවූ මහාත්ම ගුණ සම්පන්න සෞරවීයයී බලධර භීෂ්මයන්ගේ යුද්ධ සේනාධිශ්වරත්වය ඇති කෞරව සේනාංශය ද, කෞරවයන් හා ඔවුන්ගේ ආචාර්යපද ප්‍රාප්ත ද්‍රෝණයන් කෙරෙහි ළ බැඳුණු වෛරයක් ඇති පංචාලාධීශ්වර ද්‍රුපදාධි රාජ පුත්‍ර ධෘෂ්ටද්‍යුම්නයන්ගේ යුද්ධ සේනාධිශ්වරත්වය ඇති පාණ්ඩව සේනාංශය ද මෙබඳු චතුරංගිනී සේනාවන් සහිත ව යුද්ධාභිමුඛ වීමෙන් පසුව එම සංග්‍රාමය සම්බන්ධයෙන් උභය පක්‍ෂය



අතර ඇතිවූයේ නූතන සමයේ වෙසෙන සංග්‍රාමාවචරයන් පවා විළියෙන් විකෘතියට පත්විය යුතු අන්දමේ රණ සම්මුතියකි. උභය පක්‍ෂය විසින් ම සම්මුතියට පත්කරගනු ලැබූ මේ සංග්‍රාම සම්මුතිය මෙසේ ය.

හැම දිනයෙක්හිම හිරු උදාවී දෙ පැයකට පසුව යුද්ධය ආරම්භ විය යුතු ය. හිරු අස්තංගත වනවාත් සමගම දෛනික සංග්‍රාමය සමාප්තියට පත්විය යුතු ය.

ඒ ඒ දිනයෙහි යුද්ධාවශානයෙන් පසුව උභය පක්‍ෂයේ ම මල්ල ප්‍රතිමල්ලයනට මිත්‍රත්වයෙන් හා සහෝදරත්වයෙන් යුක්තව සහයෝගීවී ඔවුනොවුන්ගේ යුද කඳවුරුවල ස්වාධීන ව නිදහස් ව හැසිරීමේ අවසරය ඇතිවිය යුතු ය.

යුද්ධයෙහිදී තුවාළ ලැබුවනට උභය පක්‍ෂය විසින් ම වෛද්‍යකර්ම ශල්‍යකර්ම ආදි සංග්‍රහ අනුග්‍රහ හා ඇප උපස්ථාන පැවැත්විය යුතු ය.

රණ කෞශල්‍යය පිළිබඳ සාම්‍යයක් ඇති මල්ල ප්‍රති මල්ලයන් අතර පමණක් ද්වන්ද යුද්ධ ඇති විය යුතු ය.

හස්ත්‍යාරූඪ වූ යෝධයෝ හස්ත්‍යාරූඪ වූ යෝධයන් සමග ද, අශ්වාරූඪ වූ යෝධයෝ අශ්වාරූඪ වූ යෝධයන් සමග ද, රථාරූඪ වූ යෝධයෝ රථාරූඪ වූ යෝධයන් සමග ද, පාබල යෝධයෝ පාබල යෝධයන් සමග ද පමණක් සටන් කළ යුත්තාහ.

කඩු, දුනු, තෝමර, කුන්ත, අඩයටි ආදි ආයුධ දරන්නෝ සමාන අවි දරන්නන් සමග පමණක් සටනෙහි යෙදිය යුතු ය.

බියෙනැලළී රණ භූමියෙන් පලායන්නන් ද, සංග්‍රාම ශ්‍රමයෙන් පසුබාන්නන් ද තුවාළ ලබා වැටෙන්නන් ද ව්‍යසනයට පත් නොකට යුතු ය.

ස්වකීය පක්ෂයෙන් බැහැර වී තම සේනාංශයත් සමගම හෝ හුදෙකලාව ප්‍රති පක්ෂයට එක්වන යෝධයනට හිංසා පීඩාවක් නොකට යුතු ය.

ද්වන්ද්ව යුද්ධයකදී හෝ වෙවයි සමූහ යුද්ධයකදී හෝ වෙවයි නිරායුධවන්නන් හට පහර නොදිය යුතු ය.

ස්වකීය ආරම්මණය අන් අතකට යොමු කොට සිටින්නකුට හෝ අන්කිසි මෙහෙවරක යෙදී සිටින්නකුට පහර නොදිය යුතු ය.

සක් පිඹින්නන් හට ද, සටන් බිමෙන් තුවාළ කරුවන් ගෙනයන්නන් හට ද, වෛද්‍යාදි සේවයෙහි යෙදී සිටින්නන් හට ද, මල්ල ප්‍රති මල්ලයනට ආහාර පාන, ඖෂධ හා අවිආයුධ සපයන්නන් හට ද පහර නොදිය යුතු ය.

යුද්ධාග්නියෙන් චිත්ත සන්තානය දැවී ඇලලී ගිය ඇතැම් අවස්ථාවන්හි දී මෙයින් ඇතැම් ප්‍රඥප්ති භංගවූ නමුදු – මෙහි දක්නා සභ්‍යත්වය ප්‍රකෘතියෙන් වැසීගිය නමුදු, මෙයින් ශතවර්ෂ තෙතිසකට හෝ සූතිසකට පෙර – එනම් මානව සදාචාරයේ සමාරම්භ සමයේ ම කුරු ක්ෂෙත්‍රයෙහි ඇතිවුණු මේ සංග්‍රාමයෙහි යෙදුණු මල්ල ප්‍රති මල්ලයෝ කොතරම් උදාර – කොතරම් උත්කෘෂ්ට – කොතරම් දීප්තිමත් ශිෂ්ටත්වයකින් සමන්විතව සිටියාහුදැ යි මේ ප්‍රඥප්ති මාලාවෙන් ඉඳුරාම ස්ඵුට වන්නේ ය.

(සාමදාන විනිශ්චයකාර තැන්පත් පී. ඇම් පී. අභයසිංහ කාව්‍යචින්තාමණී මහතුන්ගේ මහා භාරතාඛ්‍යානයෙහි 140 වැනි පිටුවෙහි ද මේ රණ නීති මාලාව මේ හා සමාන ව දක්වේ.)

දුටු ගැමුණු මහ රජ තුමා එළාර රජ තුමා සමග සටනට සාමාන්‍ය භේවායකු හෝ යෝධයකු නොයොදා තෙමේ ම යුද පිණිස ගිය වග ලංකා ඉතිහාසයෙහි සඳහන් වේ.



එ පමණක් ද නොව තමා අතින් මැරුම් කෑ සතුරු (එළාර) නරපතියාගේ මෘත ශරීරය රාජකීය සම්මාන සහිත ව ආදාහන කරවා සොහොනක් බැඳ, ඒ සොහොන ඉදිරියෙන් පංච තූර්‍ය්‍ය නාද පවත්වාගෙන යාම, ඇතුන්-අසුන් නැගී යාම ආදි ක්‍රියාවන් නොකරන ලෙස ද නියම කෙළේ ය.

යුද්ධ නීති අනුව සාන්තු සේවා නිවාසයන්ට හා ආරෝග්‍ය ශාලාවන්ට බෝම්බ දැමීම් ආදියෙන් හානි නොකිරීම ශිෂ්ටය යි සම්මත වර්තමාන අන්තර් ජාතීන්ගේ චාරිත්‍රයක් ව ඇත. මේ යුද්ධ නීති-රීති ආදිය අවුරුදු තුන් දහසකට ඉහත දී පවා කෞරව වංශිකයන් විසින් ක්‍රියාත්මක කරන ලද බැව් පූර්වෝක්ත යුද්ධ නීති මාලාවෙන් සක් සුදක් සේ පෙනේ.

යටත් වූ සතුරා නොමැරීම මහාත්ම ගතියකි. යුද පෙරමුණෙහි යන වාදකයන් ද දූත් නම් සතුරන්, සේ සලකති. යුද සෙබළුන්ට කෑම ආදිය ගෙන යන්නන්ට ද වත්මන් කල අනුකම්පාවක් නොදක්වති. එහෙත් කෞරව පාණ්ඩව මහා සංග්‍රාමයේ දී වාදකයන්ට හා භේවායන්ට ආහාර-පාන ආදිය ගෙන යන්නන්ටත් අනතුරක් සිදු නොවී ය.

තමන්ගේ ඥාතීන් හා තම දරුවන් අතරත් ඇති වන්නට යන මේ මහා සංග්‍රාමයෙහි විපාකය අති භයානක බවත්, අන්තිමේ දී කෞරව-පාණ්ඩව දෙ පක්ෂය ම හිස ඔසවා ගත නොහැකි තත්ත්වයකට පත්වන බවත් ඉඳුරා දැනගත් ධෘතරාෂ්ට්‍ර රජ තෙමේ ස්වකීය පුත්‍ර දුර්යෝධනයන් අමතා "පුත්‍රය, ඔබත් පාණ්ඩව පුත්‍රයනුත් සහ ලේ නෑයෝ ය. මේ යුද්ධයෙන් කවුරු නැසුනත් අපට හානියකි. අපට අලාභයකි. ඒ නිසා ඔවුන්ගේ ඉන්ද්‍රප්‍රස්ත නගරය ඔවුන්ට දී සාමයෙන් දවසරිවූ"යයි අවසාන අවවාදය ද දුන්නේය.

"පිය මහ රජුනි, ඉදින් මාගේ ජීවිතය හෝ ඔවුන්ගේ ජීවිතය හෝ නැසේවා. මට පාණ්ඩවයන් සමඟ සහතින් විසිය නොහැකැ" යි ඒ අවවාදය නොපිළිගත් දුර්යෝධනයෝ පැවසූහ.

ඔහුගේ මෑණියන් වූ ගාන්ධාරි බිසොව ද පිය රජු මෙන් ම ඔහුට අවවාද කළා ය. එහෙත් එයින් වැඩක් නොවී ය.

යළිත් ධෘතරාෂ්ට්‍ර තෙමේ තමාට සියලු තොරතුරු කියමින් උන් සංජය අමතා "සංජයෙනි, මේ හමුදාවලින් වඩා බලසම්පන්න කවරහුද? කවුරු ජය ගනිද්ද යි අපට කියවයි" පැවසුවේ ය.

"ශ්‍රී කෘෂ්ණයෝ අර්ජුනගේ රථාචාර්‍යයාව හිදී. හෙතෙම මිනිසෙකු මෙන්ම දෙවියෙකි. ඔහුට විරුද්ධව නැගී සිටිය හැක්කේ කවරකුට ද? එහෙයින් ඔවුන් පරදවාලිය නොහැකිය" යි සංජය තෙමේ එ බසට පිළිතුරු දුන්නේ ය.

"ඉදින් ශ්‍රී කෘෂ්ණයන් හා අර්ජුනයන් අතින් සියලු සේනාව විනාශ වී ගියත් මම නම් යට නොවෙමි" යි කියමින් දුර්යෝධනයෝ සවකීය රණකාමිත්වය පළ කළහ

අර්ජුනයෝ මම කා සමග යුද්ධ කරම් ද? භීෂ්මයෝ මාගේ මුත්තණුවෝ ය ද්‍රෝණ මාගේ ආචාර්‍යවරයා ය. කර්ණ කුස ඔත් සොහොයුරා ය. දුර්යෝධන හා දුඃශාසනත් සහෝදරයෝ ය මේ නෑයන් සමඟ කරන යුද්ධය කුමක්දැ'යි උකටලී බවට පත්ව ගාණ්ඩව දුන්න පසෙක ලා මැසිවිලි කියන්නට වූහ. එහෙත් ශ්‍රී කෘෂ්ණයෝ ඔහු දිරි ගැන් වූහ. භගවත් ගීතය කියමින් අර්ජුනයන් යුද්ධයට පෙළඹ වූහ.

මේ අතර ධෘතරාෂ්ට්‍ර රජුගේ පුත්‍රයෙක් වූ යුයුත්සු කුමාරයා කෞරවයන්ට විරුද්ධව පාණ්ඩව පක්ෂයට බැඳුණේ ය.



මෙතෙක් හිරු-සඳු නුදුටු (මුහුණට-මුහුණ ලා කෙරුණු) මහා සංග්‍රාමය ආරම්භ විය.

"භීෂ්මයෝ ඇසිල්ලකින් සවකීය යුද්ධරථාරූඪ වී තම ජයසක පිම්බෙය. කෞරව බල ඇණියට ආමන්ත්‍රණය කෙළේ ය.

දුර්යෝධනයන් ප්‍රමුඛ කෞරව ශත පුත්‍රයන් උදෙසා සංග්‍රාමාවතීර්ණව වෙසෙන අධිරාජයෙනි, මණ්ඩලිකයෙනි, සාමන්තයෙනි, සෙසු සකල ක්ෂත්‍රියයෙනි, සවකීය සිවුරඟ සෙනඟන් සමග පක්ෂ ද්‍රෝහිත්වයේ යෙදී යුයුත්සු කුමාරයන් පංච පාණ්ඩවයන්ගේ පක්ෂය ගත් බැව් තෙපි දුන් සියැසින් දුටුවහුය. එබඳු ම පක්ෂ ද්‍රෝහීත්වයක යෙදී පාණ්ඩවයන්ගේ පක්ෂය ගැනීමෙහි අභිලාෂය ඇති තවත් සෙන්පතියෝ ඇත්තාහු නම්, ඔවුහු ද දැන් වහාම සතුරු පක්ෂයට පිවිසෙත්වා! ආදි මධ්‍යාවසානය වශයෙන් කෞරවයන්ගේ පක්ෂය ගැනීමෙහි හෘදයඞගම චේතනාව නොමැති කවරෙකු හෝ වේවයි දැන් වහාම සතුරු පක්ෂයට එළඹෙත්වා! අපගේ සේනාධි නායකත්වය යටතේ පවත්නා කෞරව යුද්ධ බලාංශයෙනි වැජඹෙමින් ජීවිත පයඝීනාත කොට සංග්‍රාමයෙහි යෙදීමේ ආත්මර්ථියෙන් තොරවූ හැම යෝධයෙක් ම සතුරු පක්ෂය කරා වහා යොමු වේවා!" යි මෙසේ ගර්ජනාවක් බඳු සවරයෙන් පවසා භීෂ්ම තෙමේ කෞරව සේනාංශය කරා සිය ගිජුනෙත් යොමු කෙළේ ය.

එහෙත් මේ සිංහ නාදය ශ්‍රවණය කළ කිසිවෙකුත් යුයුත්සු අනුව නොගියහ.

මෙ පවත් දුටු භීෂ්ම තෙමේ යළිත් ද්වේෂාග්නියෙන් දීප්තිමත් වූ සිය නුවන් කෞරව සේනාංශය කෙරෙහි යොමු කෙළේ ය. ආමන්ත්‍රණය කෙළේ ය.

ස්වකීය පරමාර්ථය හා පරමාධ්‍යාශය ධර්මානුරූප ව හෝ වේවයි, අධර්මානුරූප ව හෝ වේවයි, දුෂ්ට හෝ වේවයි, ශිෂ්ට හෝ වේවයි දුර්යෝධන ප්‍රමුඛ ශත කෞරව පුත්‍රයන් හට සහාය ව සංග්‍රාමාභිමුඛව වෙසෙන සකල ක්ෂත්‍රියයෙනි, තෙපි වූ කලී රාජ මන්දිරයෙහි දී හෝ රාජ සයනයෙහි දී හෝ නොව යුද්ධ භූමියෙහිම ජීවිතක්ෂයට පත් වීමේ ජන්ම වර ප්‍රසාදය ලබා ඇත්තහු ය. ධීර වීර සම්පන්න ක්ෂත්‍රියයා සංග්‍රාමාභිමුඛවම යුද්ධාඞ්ගනයට එළඹි කල්හි රුපු ලියන්ගේ වමැසත්, සුරලියන්ගේ දකුණැසත් ලෙල දෙන්නේය. එය වූ කලී ස්වකීය රණ ප්‍රතාපයෙන් ප්‍රති මල්ලයා සංඝාතනයට පත්වී ඔහුගේ ප්‍රියාම්බිකාව ස්වාමි වියෝගයට පත් වීමත්, ජීවිත පර්යන්ත සංග්‍රාමයක යෙදී ඔහු අභාවයට පත් වීමෙන් පසුව සුරඹුවන් හට ස්වාමි ප්‍රතිලාභයක් ලැබීමත් පිළිබඳ පෙර නිමිත්තකි. අහෝ ක්ෂත්‍රියයෙනි! සංග්‍රාමයෙහි යෙදී ජීවිත ලාභය ලැබූ කල්හි තෙපි නරලොවෙහි සකල ඓශ්වර්යයක් ඇති ව නරදේවත්වයට පත්වන්නාහු ය. ජීවිතක්ෂයට පත්වූ කල්හි සකලවිධ දිව්‍ය සම්පත්තියක් ඇතිව සුර දේවත්වයට පත්වන්නහු ය. එහෙයින් මාගේ සේනාධීශ්වරත්ව යටතේ සංග්‍රාමාභිමුඛව වෙසෙන සකල ක්ෂත්‍රියයෙනි! වහා යුද්ධාභිමුඛ වෙත්වා. සකල ශත්‍රු මථනයෙහි යෙදෙත්වා! සිවු වැදෑරුම් සතුරන්ගේ ගල ලෝහිතයෙන් කුරු ක්ෂෙත්‍රය ධෝවනය කෙරෙත්වා! කෞරවයන් උදෙසා නැඟී එන යුද්ධ ජයෝත්නාදය සර්ව මහී මණ්ඩලය ඉක්මවා අගනිටා බඹ ලොව දක්වා නඟා හරිත්වා! යි භීෂ්මයෝ ගර්ජනය කළහ.

භීෂ්මයන්ගේ රථයට මුහුණ දී සිය රථය නැවැත්වීමේ යෙදුණු පාණ්ඩව සේනාධීශ්වරත්වය දරණ පංචාල



දේශාධීශ්වර පුත්‍ර ධෘෂ්ටද්‍යුම්න තෙමේ මෙහිදී සිය ජය සංඛය නාද කෙළේ ය. සිංහ නාදයක් නඟා කොක් හඬලා සිනා සුනේ ය.

“එම්බා, පංච පාණ්ඩවයෙනි, පංච පාණ්ඩවයන් නිසා සංග්‍රාමාවතීර්ණ ව වෙසෙන සර්ව ක්ෂත්‍රියයෙනි. දුන් තෙපි භීෂ්මයන්ගේ සිංහ නාදය ශ්‍රවණය කළහු ය. යුද්ධෝත්නාදය සවන් කළහු ය. භීෂ්මයෝ පූජාර්හය, ගෞරවාර්හය, කුරු පාණ්ඩව යන උභය පක්ෂයෙහි ම අග්‍රෙස්වරය. එහෙත් ධර්මයට පක්ෂව නොව ප්‍රති පක්ෂව ද, යුක්තියට අනුරූප ව නොව අනනුරූපව ද උදක් පක්ෂ ග්‍රහයේ යෙදී ඔහු විසින් නඟනු ලැබූ සිංහ ගර්ජනයට අවමානයක් හෝ අපහාසයක් නොවේවා! යුක්තියත් ධර්මයත් අනුව සටන් කොට දිවි හිමි කොට යශෛශ්වර්යයට පත් වීමේත්, ජීවිත පර්යන්ත කොට සටනෙහි යෙදී ස්වර්ගාපවර්ග සම්පත්ති ප්‍රතිලාභයේ යෙදීමේත් ජන්මාශීර්වාදය ක්ෂත්‍රියයන් සන්තක බැව් ඔහු විසින් පළ කරන ලද්දේ ය. අහෝ, පාණ්ඩව පක්ෂවාදි ක්ෂත්‍රියයෙනි! මෙය සුභාෂිතයෙකි. එම සුභාෂිතය අනුව යමින් තෙපි ද විජයශ්‍රියෙන් පසුව දිවිහිමි කොට සකල විධ යශෛශ්වර්ය-යක් ලැබීමේත්, ජීවිතක්ෂයෙන් පසු ස්වර්ගාපවර්ග සම්පත්ති ප්‍රතිලාභයෙහි යෙදීමේත් අපේක්ෂා ඇතිව දැන් වහා පෙරමුණ බලා ප්‍රති මල්ල ප්‍රහරණයෙහි යෙදෙත්වා! ප්‍රති පක්ෂ වූ ප්‍රතිවාදීන්ගේ පරාජය ප්‍රත්‍යක්ෂ වශයෙන් දකින තෙක්, සිටි පිය නො සොල්වා ජීවිතාපේක්ෂාවෙන් තොරව විජය ශ්‍රී ප්‍රතිලාභය ම අපේක්ෂා කොට සටන් කෙරෙත්වා!” යි ධෘෂ්ට-ද්‍යුම්න තෙමේ මහෝධ්වනියක් නඟා තෙවරක් සිය ජයශංඛ පිම්බේ ය.

(භාරත ගීතය)

භීෂ්මයෝ තම ගදා පහරින් දහස් ගණන් පාණ්ඩවයන් වනසත් ම අර්ජුනයෝ ගාණ්ඩව දුන්නෙන් විද දහස් ගණන් කෞරවයන් හෙළූහ. පළමු දින යුද්ධයෙහි දී විරාට රජුගේ පුත්‍ර උත්තර කුමාරයා ශල්‍ය රජු අතින් මැරුම් කෑවේ ය.

උත්තරගේ සහෝදරයෙක් වූ ශ්වේත කුමාරයා භීෂ්ම අතින් මැරුම් කෑවේ ය. පළමු දින සටනින් කෞරවයන්ට ජය අත් විය. භීෂ්ම, අර්ජුන දෙ දෙනා අතර පැවැති සටන මෙන් ම ද්‍රෝණ, ධෘෂ්ටද්‍යුම්න දෙ දෙනා අතර පැවැතුණේත් මාරක පොරයකි. ධෘෂ්ටද්‍යුම්නට උපකාර වශයෙන් භීම ආවේ ය. මෙසේ දිනක් පාණ්ඩව පක්ෂයට ද දිනක් කෞරව පක්ෂයට ද යනාදි වශයෙන් දින අටළොසක් මුළුල්ලේ පැවැති මේ මහා සංග්‍රාමයෙන් පාණ්ඩවයන්ට ජය අත් විය. දිනක් එක් ව්‍යූහයක් (සේනා පේළි සංවිධානයක්) ඇති ව සටන් කළ සංග්‍රාමිකයෝ අනෙක් දිනයේ දී අනෙක් ව්‍යූහයක් ක්‍රියාත්මක කළහ. ඔවුහු මෙසේ කෞඤ්ච, ගරුඬ, අර්ධ චන්ද්‍ර, මකර, ශ්‍යෙන, වජ්‍ර, මණ්ඩප, ශෘඞ්ගාටක, සාගර, ශකට ආදි වශයෙන් ව්‍යූහ කීපයකින් සේනා සංවිධානය කළහ.

දුර්යෝධන හා භීම අතර පැවැති ද්වන්ද්ව යුද්ධයේදී භීම නීතිය කඩකරමින් බඳෙන් පහතට යගදා පහර දුන්නේය ඒ පහරින් බිම පතිතවුණු දුර්යෝධනගේ මුහුණට පා පහර දෙමින් අවමන් කෙළේ ය.

"භීම ආත්ම සංයමය ඇතිකරගනුව, වැටුණු මිනිසකුට පහරදීම නින්දිත වැඩකි. ඔබගේ ඤාති සහෝදරයකු වූත්, ක්ෂත්‍රියකුවූත් ඔහුට පා පහර දීම අධම ක්‍රියාවකි"යි ඒ දුටු යුධිෂ්ඨිරයෝ පැවසූහ.

ද්‍රෝණාචාරීන් පරාජය කිරීම උගහට බැව් දුටු පාණ්ඩවයෝ රණ උපායක් යොදා ඔහුගේ පුත්‍ර අශ්වත්ථාම යුද්ධයෙන් මිය ගියේ යයි මුසාවාද පනිවුඩයක් යැවීමෙන් මුළා කොට ඔහුගේ සිතෙහි දිරි බුන් වූ කල්හි මාරක පහර දුන්නේ ය.

එහෙත් තම පියා අයථා ක්‍රමයෙන් මරා දැමීම ගැන නොසතුටු වූ අශ්වත්ථාම කෞරව පක්ෂය ගෙන සටන් කොට ස්වකීය වික්‍රමය ප්‍රදර්ශනය කෙළේ ය.



රණ තන්ත්‍රයෙහි පාරප්‍රාප්ත වූ වරපුරුෂයෝ සිය දහස් ගණනක් මේ මහා සංග්‍රාමයෙහි යෙදී උන්හ.

භීෂ්ම තෙමේ තමා මරණ උපාය පසු මිතුරන්ට දැනුම්දී ශිඛණ්ඩී නම් නපුංසකයා අතින් පරාජයට පත් වූයේය.

පාණ්ඩව පක්ෂයට ජය අත්කර දීම සඳහා ශ්‍රී කෘෂ්ණයෝ නන් අයුරින් උදව් දුන්හ. එ සේ උදව් නුදුන්නා නම් මේ මහා සංග්‍රාමයෙන් කෞරව පක්ෂයට ජය අත්විය හැකි ව තිබිණි.

එහෙත් මේ උභය පක්ෂය ම සහ ලේ නෑයෝ ය. එකම ලෙයින් ජනිත වූ ලේ දරු නෑයෝය. එකම පරම්පරාවකට අයත් කෞරව වංශිකයෝ ය.

මේ මහා සංග්‍රාමයට සහභාගි වූවන්ගෙන් අවසානයේදී ඉතිරි වූයේ කෞරව පක්ෂයෙන් තිදෙනෙකි. පාණ්ඩව පක්ෂයෙන් සත් දෙනෙකි.

## කෞරවයන්ගේ විසිර යාම

කුරු-පාණ්ඩව යුද්ධයේදී පසු බැස ගිය කෞරවයන් අතුරින් සමහර කෙනෙක් ස්වකීය සහෝදර යුධිෂ්ඨිර රජු යටතේ විසුවෝය එහෙත් පරාජය නො ඉවසූ දැඩි සිත් ඇති ඇතැම් කෞරවයෝ කුරු රට අත්හැර අනෙක් රටවලට ගොස් පදිංචි වූහ. කුරු රට යුද්ධයෙන් පරාජයට පත් ඇතැම් කෞරවයෝ ජාවා, සුමාත්‍රා, දකුණු ඉන්දියා හා ලංකා ආදි රටවලට විසිර ගිය බැව් ඉතිහාසයෙන් පෙනේ.

ඇතැමෙක් මධ්‍ය ඉන්දියාව වාස භූමි කොට ගත්හ. කුරු කුල චරිතය පළමු වැනි කොටසේ 29 වැනි පිටේ ඒ බැව් මෙසේ සඳහන් වෙයි.

“ මධ්‍යම ඉන්දියා දේශයේ කෞරවයන් වාසය කරන බව නැවත අපට අසන්ට ලැබී තිබේ.” ( ඩෝල්ටන් )

“ දඹදිව ඊසාන දිගින් ඔවුන්ගේ වංශයට (චන්ද්‍ර) අයත් කුමාරවරුන් විසින් ගොඩනැගූ ජනපද ඇත්තේය. මහා සංග්‍රාමයට ඉහතින් හා පසු කාලවලදී මහබලි පුරය හා මදුරාසියට දකුණු දෙසින් ද, පාණ්ඩිය රජුන්ගේ අගනුවර වූ මධුරය ද හස්තිනා පුර (කුරු රට අගනුවර) ඇපාවරුන් විසින් ආණ්ඩු කරන ලද්දේය.” (වේලර්)

## නොයෙක් පොත්වල කෞරව වංශික රජුන් ගැන සඳහන් වන ශ්ලෝක කීපයකි මේ.

ශතේෂු ෂට්සු සාර්ධේෂු ත්‍ර්‍යධිකේෂුච භූතලේ
කලෙර්ගතේෂු වර්ෂාණමභවන් **කුරු පාණ්ඩවාඃ**

( රාජ තරංගනිය )

ආසන් මඝා සු මුනයඃ ශාසති පෘථ්වීං
**යුධිෂ්ඨිරෙ නෘපතෞ**
ෂඞ්වික පඤ්චියුත ශකකාලස්තස්‍ය රාඥස්‍ය

( වරාහ මිහිර )

දරිද්‍රාන්භර **කෞන්තෙය** මා ප්‍රයච්ඡේශ්වරේ ධනම්
ව්‍යාධිතස්‍යෞෂධං පථ්‍යං නිරුජස්‍ය කිමෞෂධෛඃ

( හිතෝපදේශය )

පෞලස්ත්‍යඃ කථමන්‍ය දාර හරණේ දෝෂං නවිඥාතවාන්
රාමේනාපි කථං නහේම හරිණස්‍යාසම්භවෝ ලක්ෂිතඃ
අක්ෂෛශ්චාපි **යුධිෂ්ඨිරෙණ** රභසා ප්‍රාප්තෝ හ්‍යනර්ථඃ කථං
ප්‍රත්‍යාසන්න විපත්ති මූඪ මනසාං ප්‍රායෝමතිඃ ක්ෂීයතේ;

( පංච තන්ත්‍රය )



බ්‍රහ්මාවර්තං ජනපද මථච්ඡායයා ගාහමානඃ
ක්ෂෙත්‍රං ක්ෂෙත්‍ර ප්‍රධන පිශුනං **කෞරවං** තද්භජේථාඃ
රාජ න්‍යානාං ශිත ශරශතෛර්යත්‍ර ගාණ්ඩීව ධන්වා
ධාරා පාතෛස්ත්වමිව කමලා න්‍යභ්‍ය වර්ෂින් මුඛානි

( මේඝ දූත කාව්‍යය )

යාතඃ ක්ෂමං මබිලාං ප්‍රදාය හරයේ පාතාල මූලං බලිඃ
ශක්තු ප්‍රසථ විසර්ජනාත් සචමූනිඃ ස්වර්ගං සමාරෝ පිතඃ
ආබාල්‍යාදසතීංසතීං සුරපුරිං **කුන්තී** සමාරෝහයත්
හා සීතා පති දේවතාගමද්ධෝ ධර්මස්‍ය ගූක්ෂ්මාගතිඃ

( ධර්ම විවේකය )

ජයෝස්තු **පාණ්ඩු පුත්‍රාණාං** යෙෂාං පක්ෂෙ ජනාර්දනඃ
යතඃ කෘෂ්ණස්තතෝ ධර්මෝ යතෝ ධර්මස්තතෝ ජයඃ

( නීති සාරය )

අනාදෞ දෙවකී දේව ගර්භ ජනනං ගොපී ගෘහේ වර්ධනම්
මායා පූත නජ් විතාපහරණං ගෝවර්ධනිර්ධාරණම්
කංශච්ඡෙදන **කෞරවාදි** හනනං **කුන්ති සුතා** පාලනං
එතත් භාගවතං පුරාණ කථිතං ශ්‍රී කෘෂ්ණ ලීලාවතම්

( කාව්‍ය සංග්‍රහ )

අර්ථස්‍ය පුරුෂෝ දාසෝ දාසස්ත්වර්ථෝ නකස්‍යචිත්
ඉති සත්‍යං මහාරාජ බද්ධෝස්ම්‍යර්ථෛන **කෞරවෛඃ**

( නීති සාරය )

බලවන්තං රිපුං දෘෂ්ට්වා දේශං ත්‍යාගං කරෝතියඃ
**යුධිෂ්ඨිර** ඉවාප්නෝති පුනර්ජීවන් ස මේදිනීං

( පංච තන්ත්‍රය )

**නකාලෙ** ම්‍රියතේ කශ්චිත් විද්ධඃ ශරශතෛරපි
කාල ප්‍රාප්තස්‍ය **කෞන්තේය** වජ්‍රායන්තේ තෘණාන්‍යපි

( පංච තන්ත්‍රය )

උපාධ්‍යාස්තු දේවානාං දේවාපිරභවන් මුනිඃ
ච්‍යවනස්‍ය කෘතඃ පුත්‍ර ඉෂ්ටශ්වාසීත් මහාත්මනඃ
**ශාන්තනුස්ත්ව**භවද්‍රාජා **කෞරවාණාං** ධුරන්ධරඃ
**ශාන්තනෝඃ** සම්ප්‍රවක්‍ෂ්‍යාමි යත්‍ර ජාතෝසි පාර්ථව
ගාංගං **දේවව්‍රතං** නාම පුත්‍රං සෝ ජනයත් ප්‍රභුඃ
සතු **භීෂ්ම** ඉතිඛ්‍යාතඃ **කෞරවාණාං** පිතාමහඃ
කාලී **විචිත්‍රවීර්‍යන්තු** ජනයාමාස භාරත
ශාන්තනෝර්දයිතං පුත්‍රං ධර්මාත්මාන මකල්මෂම්

(හරි වංශය)

## අගස්ත්‍ය මුනි

"අගස්ත්‍ය ඍෂිවරයා පිළිබඳ දේව කථා බොහෝ වෙත්. කළගෙඩියකින් මෙතුමන්ගේ උත්පත්තිය සිද්ධවීයයි කියති."

"කළයෙන් උපන් අගතිසි නම් එකකු පෙ ර
ගත් වර එකැඳිලිනි වියළිනි සත් සයු ර"

(තිසර සන්දේශය)

හේ වනාහි වේද පාඨ හැදෑරීමේ ලෙහෙසිය සඳහා කල්පිත දේව කථාවකි. "මිත්‍රා හා වරුණ" මේ ඍෂිහුගේ මවු පියන් වශයෙන් දක්වා තිබේ. මෙතුමන්ගේ කාලයේ උත්තර ජම්බුද්වීපයේ චන්ද්‍ර-සූර්‍ය වංශිකයන් අතර නොයෙක් යුද්ධ කෝලාහල ඇති විය.

බොහෝ කාලයක් නොකඩවා පැවැති ඒ සටන් සංසිඳවනු රිසිවූ මේ ඍෂිවරයාණෝ චන්ද්‍ර වංශිකයන් සමග දක්‍ෂිණ ජම්බුද්වීපයට ගියහ. එහි පාණ්ඩ්‍ය-චෝලය-කේරළය යි ද්‍රවිඩ රාජ්‍යත්‍රයක්ද පිහිටුවා ගත්හ.

තාම්‍රපර්ණී නදිය සමීපයෙහි පිහිටුවා ගත් පාණ්ඩ්‍ය රාජ්‍යයෙහි ප්‍රධාන නගරයවූ 'කපාට පුරය' කලකදී මුහුදු බත් වූයෙන් 'මදුරා පුරය' පාණ්ඩ්‍ය රජ දරුවන්ගේ රාජධානිය විය. අගස්ත්‍ය ඍෂිවරයාණෝ රජ කුමරුවන් ලවා රාජ්‍යය විචාරවමින් පුරෝහිතයා වශයෙන් එහි ම වාසය කෙළේය.



මේ අගස්ත්‍ය ඍෂි තෙමේ ද්‍රවිඩ භාෂා විෂයෙහි ප්‍රවීණයෙක් විය. 'පෝදිය' නම් පර්වතයෙහි බොහෝ කලක් තපස් රැක සොක්කලිං හෙවත් සරස්වතී දේවිය ගෙන් වර ප්‍රසාදයක් ද ලැබුවේ ය. සංස්කෘත භාෂාවෙහිවූ ඌෂ්මාක්‍ෂර හා ධනිතාක්‍ෂර හැර අක්‍ෂර සමතිසකින් සමන්විත ද්‍රවිඩ ග්‍රන්ථ සෝඩියද නිෂ්පාදනය කෙළේ ය.

(භාරත මණිසි මඤ්ජරි)

මෙහි සඳහන් අගස්ති මුනිවරයා විසින් උතුරු දඹදිවින් රැගෙන පැමිණි චන්ද්‍ර ගෝත්‍රිකයන් වනාහි රණකාමී කෞරවයන් (පාණ්ඩවයන්) විය හැකි බව සිතිය හැක.

මේ චන්ද්‍ර වංශිකයෝ දකුණු ඉන්දියාවේ රාජධානි ඇති කර ගැනීමෙන් පසු ඔවුහු ද්‍රවිඩ භාෂාව පුහුණු වීමෙන් එයම ඔවුන්ගේ ජන්ම භාෂාව කරගත්හ. එපමණක් නොව මොවුන් ද්‍රවිඩ නාමවලින් ම පෙනීසිටීමට ද පුරුදු විය. එහෙත් මොවුහු උතුරු ඉන්දියාතික චන්ද්‍ර වංශිකයෝ ම වන්නාහ.

මහ ඇලෙක්සැන්ඩර් රජුගෙන් පසු ක්‍රි. ව. යට 302 වෙනි වර්ෂයේදී සෙලෙවුකස් නිකේටර් රජු විසින් මෙගෙස්තේනස් නමැත්තෙක් පාටලීපුත්‍ර රජු වෙත තානාපතියෙකු වශයෙන් යවන ලදුව පාණ්ඩ්‍ය නමැති රටක් ක්‍රිෂ්ණගේ එකම දියණිය වන පාණ්ඩ්‍යය කුමරියගේ නමින් තිබෙන බවත් ඉන්දියාවේ දක්‍ෂිණ භාගයේ සමුද්‍රය දක්වා දිඝීව පිහිටි මෙම ප්‍රදේශය ක්‍රිෂ්ණා විසින් තම දියණියට දායාද වශයෙන් දුන් බවත් ග්‍රීක් හා රෝම ඉතිහාසවල සඳහන් වී ඇත්තේය.........

උත්තර ඉන්දියා දේශයේ සිටි චන්ද්‍ර වංශිකයන්ගේ යුද්ධ කෝලාහල මැඩපැවැත්වීම පිණිස අගස්ත්‍ය මුනි චන්ද්‍ර වංශිකයන් සමූහයක් එදෙසින් වෙන් කරවාගෙන දක්ෂිණ ඉන්දියාවේ තාම්‍රපර්ණී නගරය අසල කපාටා පුරයට කැඳවා ආ බවත් එම නගරය පසුව මුහුදුබත් වූ බවත් කියති. දක්ෂිණ ඉන්දියානික භූමි පරීක්ෂකයන් විසින් දැනට තාම්‍රපර්ණී නගරය අසල නටබුන් වූ නගරයක් වශයෙන් සොයාගෙන තිබෙන්නේ කෝර්කෙයි නගරය විය යුතුය යි ද, කලින්-කල නම් වෙනස් වී ඇතත් කපාටා, කෝර්කෙයි යන දෙ නමින් ම හැඳින්වෙන්නේ සිරි වෛකුන්දම් තාලුක් නමැති පෙදෙසෙහි පිහිටි එකම පැරණි නුවරක් බවත් ඉතිහාසඥයෝ ප්‍රකාශ කරති.

කපාටා පුර උත්තර ඉන්දියානික චන්ද්‍ර වංශිකයන්ගේ අගනුවර වශයෙන් කොට ගෙන ඔවුහු පණ්ඩිය, සෝලිය, කෝරල යයි රාජ්‍යත්‍රයක් පිහිටුවා ගත්තාහුය යි 'භාරත මණිෂි මඤ්ජරි' යේ පුවත කියනාතර කෝර්කෙයි නුවර විසූ පඬි, සෝලි, කේරල තුන් බෑයෝ වෙන්-වෙන් ව දැක්වෙන රාජ්‍යත්‍රයක් පිහිටුවා ගත් බව අනාවරණය කරන පුවතක් 'කෝල්ඩ්වැල්ගේ තින්නවැලි' ග්‍රන්ථයෙන් හෙළි වෙයි.

අගස්ත්‍ය මුනි හා පැමිණි චන්ද්‍ර වංශිකයෝ ද්‍රවිඩ භාෂාව ම ජන්ම භාෂාව කොට ගෙන යට කී පාණ්ඩය, කේරලා, සෝලිය ආණ්ඩු කළාහු කල්යාමේ දී ඔවුන් ද්‍රවිඩ නාමයන් ද පාවිච්චි කිරීමට වන.

එහෙත් 'මදුරෙයි-කාංචි' නමැති බොහෝ පුරාණ ද්‍රවිඩ කාව්‍යයෙහි සඳහන් මෙහි පහත පළවන ප්‍රකාශනයෙන් කෝර්කෙයි දේශීහු කවරහු ද යනු දත හැක

"පරවර නොහොත් පර්දවර් මිනිසුන්ගේ ප්‍රධාන නගරය කෝර්කෙයි නුවර වන්නේය මෙම නගරය වූ කලී



මුතු වර්ග සම්බන්ධ ව බොහෝ ප්‍රසිද්ධය. මෙහි ස්වදේශීන් වන පරවරු අන්‍යයන්ට වඩා ඉතා උසස් බලසම්පන්න ජාතිකයෝය" යනුයි.

පරවර මිනිසුන්ගේ ඉතිහාසයේ ප්‍රකාර ඔවුන් වනාහි අයෝධ්‍යය ආණ්ඩු කළ චන්ද්‍ර වංශික භරත රජුගෙන් පැවතෙන පරම්පරාව වන්නේය.

(තින්නවලි ගසට්යාර් 122 පිටුව)

(වරින්-වර උතුරු ඉන්දියාවෙන් දකුණු ඉන්දියාවට සංක්‍රමණය වූ කෞරවයෝ ද්‍රවිඩ නම්වලින් ම ප්‍රසිද්ධ වූහ. ඔවුහු සිංහල රජුන් දවස යුද්ධ කටයුතු සඳහා ලක්දිවට ද පැමිණ මෙහි ම පැල-පදිංචි වූවෝය.)

## විජය රජු දවස

විජය රජු සමග සිරි ලකට පැමිණි සත් සියයක් යෝධයන් අතුරින් සමහර දෙනෙක් මුහුදින් ගොඩ බසින තැනම ගෙවල් කොටගෙන පදිංචි වූහ. ලංකා භාෂාවෙන් ඔවුන්ට 'කරාව' යයි නම කළහ

විජය කුමාරයා සමග ඇමතියන් සත් සියයක් ලක්දිවට ගොඩ බට බැව් ඉතිහාසයෙහි සඳහන් වන නමුත් මෙනම් ඇමතියා මෙනම් කුලයට අයිතිය යනාදි කිසිත් විස්තරයක් නොදැක්විණි.

මහා වංශයෙහි අමාත්‍ය නාමය ව්‍යවහාර කරන ලද අන්‍ය ස්ථානවල ක්ෂත්‍රියන් (රාජ වංශිකයන්) අරභයා අමාත්‍ය නාමය කියා තිබෙන බව මොනවට පැහැදිලි වේ.

විජය කුමාර තෙම රජ දුවක නැති බැවින් සිරි ලක අභිෂේකයට අකැමැති වූයෙන් ඔහුගේ සත් සියයක් ඇමැතියෝ මුතු-මැණික් ආදි බොහෝ පඬුරු ගෙන්වා දකුණු මදුරා පුර පඬි රජුට දායාද පිණිස යවා, එම රජුගේ

'විජයායි' නමැති දියණිය විජය රජුගේ මෙහෙසිය පිණිස ද, එ රට අමාත්‍යවරුන්ගේ දියණිවරු මෙහි සිටි අමාත්‍යයන්ගේ භාර්‍යාවන් පිණිස ද ගෙන්වා පාවා ගත්හ.

පාළි ජනවංශයෙහි සඳහන් මුහුද සමීපයෙහි, එනම් තම්මැන්නා අඩවිය අසල පදිංචි වූ විජය නම් බංගාලි කුමාරහුගේ යොධයින් සත් සිය දෙනා නොහොත් අමාත්‍යයින් සත් සිය දෙනා අතුරින් (මුහුදු සමීපයෙහි පදිංචි වූ) අමාත්‍යයන් සමූහයකට කරාවේ යන නාමය අයිති වූ බවත් මෙකියන ලද කරාව නම් ලත් අමාත්‍යයන් සමූහය ද මදුරා පුර අමාත්‍ය දූවරු පාවා ගෙන සිටිය බවත්, ඔවුහු සමූහය පමණක් කුරු කුලයට අයිති ක්ෂත්‍රියයන් වියයුතු බවත් මහා වංශයේ හා ජන වංශයේ කරුණු අනුව සිතීමට ඉඩ තිබේ.

විජය රජහුගේ අමාත්‍යයන් අතර කුරු කුල ඇමැතියන් සිවු දෙනෙක් හා තවත් අමාත්‍ය පිරිසකගේ ද නාමයන් හා පදිංචි වී උන් ස්ථාන පිළිබඳ විස්තර පහත දැක්වේ.

1. ඔට්ටු අමාත්‍යයා ඔට්ටු කච්චියේ උන්නාය.
2. කලච් කියන අමාත්‍යයා තඹරාවිල උන්නාය.
3. **කුරුවන්නියා කියන අමාත්‍යයා කුරු දූවේ උන්නාය.**
4. රත්නා කියන අමාත්‍යයා රාම පිටියේ උන්නාය.
5. මාරානි කියන අමාත්‍යයා මාරා පිටියේ උන්නාය.
6. **කරානි කියන i අමාත්‍යයා කරදෙන පිටියේ උන්නාය.**
7. වරානි කියන අමාත්‍යයා රාමා පිටියේ උන්නාය.
8 කල්ලරු කියන අමාත්‍යයා කලා පිටියේ උන්නාය.



9. උපතිස්ස කියන අමාත්‍යයා තිස්ස පිටියේ උන්නාය.
10. සේරතිස්ස කියන අමාත්‍යයා සේරත්න පිටියේ උන්නාය.
11. දේවතිස්ස කියන අමාත්‍යයා දෙවගනා පිටියේ උන්නාය.
12. **කුරානි කියන අමාත්‍යයා කුරු පිටියේ උන්නාය.**
13. **කරානි කියන ii අමාත්‍යයා කරා පිටියේ උන්නාය.**
14. යාම දේව කියන අමාත්‍යයා ගල් පිටියේ උන්නාය.
15 දෙවත්ති කියන අමාත්‍යයා දෙළුත් පිටියේ උන්නාය.
16. මෝදරානි කියන අමාත්‍යයා මෝදර පිටියේ උන්නාය.
17. සාවත්ති කියන අමාත්‍යයා වත්නා පිටියේ උන්නාය.
18. වෙනංසති කියන අමාත්‍යයා වෙට්ටුමුන්නේ උන්නාය.
19. පරානි කියන අමාත්‍යයා පිලවල පිටියේ උන්නාය.
20. වරාතිස්ස කියන අමාත්‍යයා වරා පිටියේ උන්නාය.
21. රුත්බල කියන අමාත්‍යයා කිරිඋල උන්නාය.

**මින් කුරුවන්නියා, කරානි, කුරානි, කරානි යන** සිවු දෙන කුරු කුලයෝයි.

(කෑගලු පළාතේ මාත් ගෙදර වලව්වේ තිබුන පුස්කොළ පොතේ අත් පිටපතකින් පිටපත් කරගෙන කුරු කුල චරිතයේ පළමු වැනි කොටසේ 59, 60 වැනි පිටුවල සඳහන් කොට ඇත.)

"දඹදිව කාලිංග චක්‍රවර්ති රජහුගේ මුණුපුරු වූ විජය රාජ කුමාරයන් ලක්දිව එන ගමනේ සත් සියයක් යෝධයන්ට පළමු වෙනි යෝධයාණෝ නම් ............ විජය රාජ කුමාරයින් කරා i ආ හෙයින් කාරවන්ත .......... කාරවන්ත කුමාරයින්ට යුව රාජ තනතුර ද, ගම්වර සොළසක් ද දී, බොහෝ රාජ්‍යාභ්‍යන්තරව නොයෙක් ලෙසින් උපස්ථාන කොට වසන කල්හි ඔවුන් හට කාංචි පුර නුවරින් විවාහ මංගල්‍යයක් ලදින් ................ ඉක්බිති නොබෝ කලක් ගියායින් පසු දරු ස දෙනෙක් ලැබ මෙසේ වසන කල විජය කුමාරයාගේ කථා මාත්‍රයකින් ඒ කාරවන්ත යුව රජ්ජුරුවන් තමන්ගේ මෙහෙසියත් හා සමග වැඩිමහලු කුමාරිකාවුන් දෙදෙනා හා වැඩිමහලු කුමාරයන් දෙ දෙනා හා විජය රජ්ජුරුවන් ළඟ සිටුවා ලා බාල කුමාරවරු දෙ දෙනා හා සමඟ යුව රජ්ජුරුවන් කාංචි රට වැඩ කාංචි පුර නුවර අග්‍ර රාජ්‍යය කොට කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාහ.

එයින් පැවැති ආ අය ii 'මච්ච කොනත කාරවනත' කියාද කරාව කියාද ප්‍රසිද්ධ වූවෝ ය. ඔවුන් බොහෝ කෲරය. අකුසල් කිරීමෙහි භය නැත. යුද්ධයෙහි දක්‍ෂයෝ ය....... ....... ඉතා තීක්‍ෂණ වූ වික්‍රම ක්‍රියා ද, ගෘහ කර්මාන්තයෙහි දක්‍ෂ වූ තියාව ද කාලිංග චක්‍රවර්තිහුගේ මුණුපුරුවූ සිංහබාහු රජහුගේ පුත්‍ර වූ අබය ඇති විජය නරපතිහු ලක්දිව රජ කරන කල තමන්ගේ විජිතයෙහි අගමැතිකමට හා විසිතුරු මාලිගාදිය කරවීමට තිසි සියුම් කමින්ද මන්ත්‍රීකමින්ද යුක්තවූ කාංචි පුර නුවරින් කරාවේ ගෘහපතීන් සූවිසි දෙනෙක් ගෙන්වා ලංකාවීපයෙහි හිඳිනා ලෙස කෙත් වත් ගව මහිෂ වස්ත්‍රාභරණ ආදීන් ඔවුනොවුන්ට දී සම්මත කළාහ." (තමන්කඩුවේ

1. කරා = 1. මුහුද – මූහුදු වෙරළ (ශ්‍රී සුමඞ්ගල ශබ්ද කෝෂය) 2. මච්ච[?] කොන්ත නමින් දැක්වෙනුයේ ශාන්තනු රජුගේ බිසොව වූ සත්‍යවතී දේවියයි.



කොඩිකාරගම පන්සලේ වනවාස ස්වාමීන්ගේ 'ජලතඤ්නය' නමැති පුස්කොළ පොතෙන් පිටපත් කරගෙන කුරු කුල චරිතයේ පළමු වැනි කොටසේ 60, 61 වැනි පිටුවල සඳහන් කොට ඇත.)

## පඬුවස් දෙව් රජු දවස

"මෙකල අනුරාධ පුර රජ කරන පාණ්ඩු රජ (පඬුවස් දෙව්) රට මැද සංචාරය කරන අතර මනත්තිදල් (වැලිගොඩ යන අර්ථයි.) නමැති ග්‍රාමයට ක්‍රමයෙන් පැමිණියේ ය. එවිට එහි පදිංචිකාර දෙමළ ප්‍රධානීන් රුස්ව පිටරටවලට කරවල පටවා යවන සිංහල වාණිජ සමූහයකට විරුද්ධ ව පඬු රජ ඉදිරියෙහි පැමිණිලි කරමින් සිංහල වාණිජයෝ මෙම ගමෙහි කරවල ගබඩා කරන බවත් එහි තිබෙන ශුද්ධ වස්තුවක් වන වතුර ළිඳ අපිරිසිදු කරන බවත් මේ කරදර නිසා ඔවුන්ගේ අති පරිශුද්ධ දේවාලය පවත්වාගෙන යාමට පූජ්‍ය පක්‍ෂයට මහත් අමාරුවක් වී තිබෙන බවත් යනාදි ඔවුන්ගේ දුක්ගැනවිලි වැඩි දුරටත් කියා පෑවෝ ය.

පඬු රජ පැමිණිල්ල විනිශ්චය කර වරදකාර සිංහල වෙළෙඳුන්ට නීති ප්‍රකාර දඬුවම් පමුණුවන්ට යෙදුනේය. ඉක්බිති ධීවර කර්මාන්තයෙහි සිංහල ජනයාගේ අසමර්ථ භාවය පඬුවස් දෙව් රජුට පෙනී ගියෙන් එකී කර්මාන්තයෙහි දක්‍ෂ–පක්‍ෂ මුක්කර නමැති වර්ගයක මිනිසුන් යොදවා සිංහල කරවල වෙළෙන්දන් ඔවුන්ට අධිපති කොට පැවැතීමට ආඥාවක් කැබ්බවිය. තවද මුක්කර ජනයාට දේවාලය තිබෙන ප්‍රදේශයෙන් ද බැහැර යාමට අණ කෙළෙන් මුක්කර ප්‍රධානීන් වන උසුමන සහ සෙන්දන් ඇතුළු විශාල මුක්කර සේනාවක් මඩකලපුව ආසන්නයෙහි පානෙකෙ සහ වලෙයි ඉරාවූ නමැති ගම්වලට ගොස් පදිංචි විය.

මෙසේ පඬු රජ අනුරාධපුරයෙන් බැහැරව සංචාරය කරන අවධියෙහි යට කී කාවේරි පට්ටනමේ කුල කෝට්ටන් රජ ත්‍රිකුණාමලයට පැමිණ සිටින බැව් පඬුවස් දෙව් බිසව ( බද්ද කච්චානා ) ට ආරංචි වී සිංහල හේවා හමුදාවක් යවමින් කුල කෝට්ටන් රජු ව පරාජය කිරීමට අණ කළා ය. සිංහල හමුදාව ත්‍රිකුණාමලයට පැමිණ ඒ රජුගේ සේනාව සමග සටන් කිරීම පහසු නොවන බව තේරුම් ගත්තෝ දෙ පසෙහි සාමදානයකට සතුටුවී, සිංහල හමුදාවෝ එරජුගෙන් නොයෙකුත් තාන්න මාන්න ද ලබාගෙන පෙරළා අනුරාධපුරයට පැමිණියෝ ය. මීට පසුව කුල කෝට්ටන් රජුට විරුද්ධ ව යුද්ධයක් සිදුවී නැත.

මෙම රජු වන්නි ප්‍රදේශ දියුණු කිරීම පිණිස ඉන්දියානු සමුද්‍රාසන්න රටවලින් වන්නි කුමාරවරු හත් දෙනෙක් සහිත පිරිසක් ගෙන්වා මෙහි පදිංචි කරවා දේවාලය හා ඊට අයත් ඉඩ-කඩම් සම්බන්ධව ද කටයුතු කිරීමට ද පැවරුවේ ය. කුල කෝට්ටන් රජ පෙරළා කාවේරි පට්ටනමට ගියේ, නොබෝ කලකින් පරලෝ සැපත් විය.

කල් යාමෙන් තවත් වන්නි පරම්පරාවන් 59 ක් පමණ පඬි රටින් මෙහි පැමිණ පදිංචි වූයෙන් පසු කලකදී වන්නි ප්‍රදේශ ඔවුන්ට මදු විය. ඉක්බිති ඔවුනොවුන් අතර කෝලාහල ඇතිවීමෙන් ජයගත් පසින් කෙනෙකු ප්‍රධානියකු විය. එහෙත් ඔහුගේ ප්‍රධානත්වය ටික කලකට පමණක් සීමා විය.

වන්නියාර් වරු අතරෙන් සංතිය වන්නියාර් නමැත්තා ඉතා දක්ෂයෙක් ව සිටි බැව් දැනගන්ට තිබේ. නමුත් ඔහු ද මරුමුවට පත් කරන ලදින් අන්තිමේ දී වන්නිවරු හත් දෙනෙක් වන්නි ප්‍රදේශ පාලනය කිරීමට යොදා ගත්හ. මෙසේ මොවුන් වන්නි කුමාරවරු වශයෙන් ආණ්ඩු කර ගෙන එන අතර ශක වර්ෂ 515 දී අග්‍ර බෝධි මහා රජයා විසින් ඔවුන් යටත් කර පළාත් පාලන අදිකාරම් වරු වශයෙන් පත් කරන ලද්දේ ය.



මීට ඉහත සිංහල රජවරු වන්නියාර් වරු ගැන කිසි සැලකීමක් කළේ නැත. ඔවුනොවුන්ට රුචි වූ පරිද්දෙන් වන්නි ප්‍රදේශ ආණ්ඩු කර ගෙන තිබේ."

( යාල්පානම් වෛපාව මාලෙයි, බ්‍රිටෝ පරිවර්තනය )

## දෙවනපෑතිස් රජු දවස

මෙසේ කල් යාමක් ගිය කල අප බුදුන් පිරිනිවි දෙසිය හත් වැනි වර්ෂයට පැමිණි සඳ, නැවත සිරි ලක් දිව රජ කරන දෙවැනිපෑතිස්ස නම් නරේන්ද්‍රයන් සමයෙහි දඹදිව ධර්මාශෝක නරපතීන් විසින් විපුල තෙදයෙන් සකල භය හැර අභය ගෙන දෙන ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා සමඟ ශ්‍රී ලංකාද්වීපයට එවන මිහිඳු කුමාරයා හා සංඝමිත්‍රාවන් ද දෙ දෙනා වහන්සේලා සමඟ A ධනු ශිල්පයෙහි නියුක්ත වැදි පේරුවට අයත් වැදි පුතුන් ද, ඛඩ්ග, කොන්ත, තෝමර, පළිස් ආදි යුද්ධයෙහි සපත් අය ද, මුතු කුඩ, සේසත්, චාමර මේ ආදිය අපට නිසිය, අපගෙන් ඇති වූ රජ කුමාරවරු යද්දී අපට හිඳීම යුතු නොවෙයි කියා එකුන් පණසක් පමණ බෝමැඩ කර්මාන්තයන්ට ආවාහුය.

( ජලනන්දන පුස්කොළ පොත )

බෝමැඩ කරු ආ හෙයින් ද රජ කුමාරයන් කරු ආ හෙයින් ද ඔවුන් හට කරුවෝය යි ව්‍යවහාර විය. ඔවුන් හට බොහෝ කෙත්-වත් ගම්වර දී මෙ සිරි ලක්හිම රැඳ වූහ.

දෙවැනිපෑතිස් රජු කල මහා බෝධිය සමඟ ආ B බෝධිගුප්ත, සුමිත්ත, චන්ද්‍ර ගුප්ත, දේව ගුප්ත, සූර්ය ගුප්ත, ගෝතම, ජුතින්ධර යන රාජ කුමාරවරුන්ට බෝධි පාලනය පිණිස උසස් තනතුරු දී ලක්දිව නවතා ගත්තේ ය. ඔවුන්ගෙන් පැවැතෙන්නෝ මේ තාක් උසස් වලව්වල වෙසෙත් මය.

A අශෝක රජු විසින් ලංකාවට එවනු ලැබූවන්ගේ ගෝත්‍රයෝ නම් ක්‍ෂත්‍රිය කුල අටෙක, සිටු කුල අටෙක, බ්‍රාහ්මණ කුල අටෙක, කෙළෙඹි කුල අටෙක, දුනු ශිල්ප දන්නා කුල අටෙක යනාදි වශයෙන් බෝධි වංශයෙහි දැක්වේ.

B ජය ශ්‍රී මහ බෝධියගේ, ජය මහ බෝධියගේ, බෝධියගේ, බෝධිය බදුගේ යනාදි පෙළපත් නාමයන්ගෙන් පෙනී සිටින කුරු කුලයෙහි උදවිය මේ දක්වා ලංකාවේ සිටිති. ඔහු ද මහා බෝධිය කැටුව ආ ක්‍ෂත්‍රියයන්ගෙන් පැවැතෙන්නෝ වෙති.

බදුගේ නාමය (වඩුගන් නොහොත් උතුරේ වැසියා යන අර්ථයි) මොවුහු මධුරේ රජ දරුවන්ගේ අමාත්‍ය වරු ව සිටි පිරිසකි.

එයින් සූයඝී ගුප්ත කුමාරයාගෙන් පැවැතෙන්නන්ට A අර්ණව ශ්‍රෙෂ්ඨ සූයඝී ගුප්ත කුරුකුලසූරිය නාමය කියත්.

---

B. අර්ණව යනුවෙන් අදහස් කරනුයේ සමුද්‍රය යි. ශ්‍රෙෂ්ඨ යනු ප්‍රධානාර්ථයෙහි වැටේ. එහෙයින් ඒ නාමයෙන් ගත යුතු අර්ථය සමුද්‍රයට ප්‍රධාන වූ රජ කුලයක් බවයි.... කරාවේ ගෝත්‍රයේ අයවලුන්ට 'කුරු කුල' හේවා නාම උරුම නාමයන් හැටියට පවත්වාගෙන එන බැව් පෙනේ මෙකී කරාවේ ගෝත්‍ර "කුරු කුල" නාමයන් ගෙන් .......... යුත් වත්ති උන්නැහේලාගෙන් පැවැත එන්නෝ අනුරාධපුර උඩරට මේතාක් වෙසෙත්ම ය.

(මනුරජනිය 70 වැනි පිටුව)

---

A කුරුණෑගල පළාතේ දිද්දෙණියේ සිටි සූරියවත්ති උන්නැහේ ද සූරිය ගුප්ත කුමාරයාගෙන් පැවැත ආ කෙනෙකි. මෙතුමා කුරු වංශිකයෙකි.

B අට කුල ක්‍ෂත්‍රියයන්ගෙන් සමුද්‍ර වංශය ද එකකි.

(ජාති ප්‍රභේද පුස්කොළ පොත. කෞතුකාගාර පුස්තකාල අංක 7 - J 7) (කුරු කුල චරිතය ප්‍රථම කාණ්ඩය.)



# දුටු ගැමුණු රජු දවස

දුටු ගැමුණු රජු දවස ජයසිරි ආදිත්‍ය කුමරු එතුමාගේ හේවා පිරිස වූ 360 දෙනෙක් සමග මොරටු A ප්‍රදේශයෙහි පදිංචි විය. මෙසේ නොබෝ කාලයක් අතික්‍රාන්තවූ පසු මේ පිරිස මොරටුවේ මුල් පදිංචි කාරයන් වශයෙන් ද ඒ ප්‍රදේශය ගම්මානයක් කිරීමෙන් ද එහි මූලිකයෝ වූහ.

කෞරවයෝ වූ කලී සිංහල රජුන් ගෙන් විශ්වාසවන්තභාවය දිනාගෙන සිටි වර්ගයක් බැවින්, මුහුදු මාර්ගයෙන් ගොඩ වදින සතුරන් (කල්ලතෝනීන්) මැඩලීම පිණිස කරාවේ යුද්ධකාරයින් මුහුදු බඩ ප්‍රදේශවල පිහිටි කඳවුරුවල සහ ගම්වල ද නතර කරන ලදී. මෙසේ බෝවූ ඔවුන් අතුරෙන් කාරණා කාරණ දත් වැඩිමහල්ලන් පස් දෙනෙක් හා තවත් උදවියගේ ද උපදෙස් ඇතිව 'පංචයට්' නමැති සභාවක් මගින් ඔවුන් අතරේ සිදුවන නඩු විසඳා ගන්නා ලද්දේ ය.

මේ විනිශ්චය සභාවලදී ඔවුන්ගේ පැරණි නීති-රීති වලට අනුකූලව කටයුතු කරනවත් හැර මේ කෞරවයෝ රාජ පාක්ෂික භාවයෙන් ද, නීතියට අවනත භාවයෙන් ද, ප්‍රධානීන්ට සහ වැඩිමහල්ලන්ට ගෞරව කිරීමෙන්ද ජීවත් වීම ඔවුන්ගේ ජන්ම ගතියක් කොට පැවැත්තේ ය. ඒ වූ කලී ආසියාතිකයන්ගේ උසස් ධර්මතාවකි.

දඹදිව A ගන්ධාර දේශයෙහි ද කෞරවයෝ පදිංචි වූහ. ඔවුහු කොට්ඨාශ නවයකට බෙදී සිටිති. නව කොටසින් තෙකොටසක් රජකම් කිරීමට තෝරා ගන්නා ලදී.

---

A මොරටුව යුද්ධ හටයන්ගේ මුර + අටුව යන්නෙන් බිඳුණ නාමයක් යයි (Guards Piller) කියති.

1946.7.2 දින "ඩේලි නිව්ස්" පත්‍රයෙහි පළවූ ලිපියක් ඇසුරෙනි.

මෙම පේරුවෙන් පැවැත ආවාවූ කණ්දරාය, කාරවන්තය B නමැති දෙ දෙනෙක් ලංකාවට පැමිණ දුටු ගැමුණු මහ රජාණන් බැහැදැක සිටි තැනේදී ඔවුන් දෙ දෙනාට තමන්කඩ දෙකට බෙදා වන්නිකම් පවරා දී ඒ ප්‍රදේශය ආණ්ඩු කිරීමට අවසර දුන්නේ ය. (හලාවත සිටි ආඬි අප්පන් සූරිය වන්නි උන්නැහේට අයිති පුරාණ ලිපි-කුරු කුල චරිතය ප්‍රථම කාණ්ඩයෙනි.)

මෙයින් පැවැත එන කෞරව වන්නි වරු අද දක්වා තමන්කඩ පළාතේ සිටිති. තිම්රා පුල්ලේ වන්නි උන්-නැහේ ද එයින් කෙනෙකි.

---

A ධෘතරාෂ්ට්‍ර කෞරව රජුගේ බිසොව වූ කලී ගන්ධාරයේ රජුගේ දියණිය වූ ගන්ධාරි නම් බිසොව වන්නේය. ඈ එක් සියයක් කුරු කුල කුමරුවන්ගේ මෑණියෝය. මෙතුමියට මහා භාරතයෙහි ඇතැම් තැන 'කෘති කුරුනි' යනුවෙන් ව්‍යවහාරවේ.

එහි අර්ථය කරාවේ සත්‍රිය යනුයි. ඔවුන් ඇඟලන හැට්ටයට 'කබාස්කෘති' කියාද ව්‍යවහාර වෙයි. (සිංහල භාෂාවෙන් 'කබාකුරුත්තු' යයි කියන්නේ මේ ඇඳුමටය. දූනුදු මීගමුව, මොරටුව, පානදුරය, කළුතර, මග්ගොන, බේරුවල, අලුත්ගම, අම්බලන්ගොඩ, හික්කඩුව, ගාල්ල, මාතර ආදි පළාත්වල කරාවේ කාන්තාවන් උඩු කය වැසෙන සේ අඳින්නේ කබා-කුරුත්තුය. අනෙක් කුලවලට අයත් කාන්තාවෝ හැට්ට අඳිති. කබාකුරුත්තු අඳින්නේ කරාවේ කාන්තාවන් පමණකි.

B අට කුල ක්ෂත්‍රියයන්ගෙන් 'කාරවන්ත' කුලය ද එකකි.

(නීති ප්‍රභේද පුස්කොළ පොත-කොළඹ කෞතුකාගාර පුස්තකාල අංක 7 - J 7 කි. පත්‍රිකාව)



**රජ කුල අට නම**, සතාසත කුලය, කාරවන්තු කුලය, සමුද්‍ර වංශ කුලය, අග්නිවංශ කුලය, ශාක්‍යවංශ කුලය, සබසවංශ කුලය, ගංගාවංශ කුලය හා දක්ෂදන්තක කුලයත් ය.

---

තවද (දුටු ගැමුණු) රජු හා යන ලෙසට එක් දහස් පන්සියයක් ප්‍රෝහිත බ්‍රාහ්මණයෝ ය, සාර දහසක් අමාත්‍යයෝ ය, [1] පටබැඳි බිසෝවරුන්ගෙන් එක් දහස් සියයක, රජ කුමාරවරුන් පස් දෙනක.

(රිදී විහාර අස්න - පුස් කොළ පොත හා රිදී විහාර උත්පත්ති කථාව ක්‍රි. ව 1904 මුද්‍රණය 5 වැනි පිටුව)

රළු නර "පරවර" මරවර, තිමිලර, කණ්ණඩි, තෙළිඟු, කෙවර් තිග, සිංදූර යනාදි නා නා දේශවලින් ඇවිත් (දුටු ගැමුණු) රජු පිරිවරා සිටින දෙමළ මහා සේනාවෝ ය.

(රිදී විහාර අස්න පුස් කොළ පොත)

## භාතිය තිස්ස රජු දවස

" .........මල්ලවු මලක්කාවට ගියෝය. එකල කාක මුක්කරුන්ඩ ගොස් උන්ගේ රජහු සිටියෝ ය. ඔවුහු නල මුදලි යායි ප්‍රකට ව නැලව බල කොටුවක් ද කරගත් හ. හෙතෙම කලා ඔයෙනුත් කැළණි ගඟෙනුත්, මොරණිය

---

1 මේ අන්දමට කරාවේ ගෝත්‍රයේ ප්‍රධාන මිනිසුන්ට 'පටබැඳි මිනිස්සු' යන නාමය බොහෝ කාලයක සිට ව්‍යවහාර කරනු ලැබේ.

(ආචාර්ය පෝල් ඊ. පීරිස් මහතාගේ පෘතුගීසි ඉතිහාසය ආශ්‍රයෙනි.)

එමෙන් ම පටබැඳි කුමාරයන්, පටබැඳි මුදියන්සේ, පටබැඳි මුහන්දිරම්, පටබැඳි කෝරාල, පටබැඳි ආරච්චි යනාදි වශයෙන් කරාවේ ප්‍රධානීන්ට ව්‍යවහාර කළ බව පැරණි ඉතිහාස ලේඛනාදියෙහි සඳහන් වේ. අද දක්වා ව්‍යවහාර ව එන බව ද දත යුතුයි.

හෙලෙනුත් යන මේ අතර රට අල්ලා සුළු රජ ව විසී ය. එකල ඔවුහු පෙර පිණැති රජුන් විසින් කරවන ලද වැව්, පොකුණු, කෙත්වත් අත්පත් කර ගත් හ. ආරාම, විහාර, දාගැබ්, පිළිම සිඳ-බිඳ බුදු සසුන නැති කළෝ ය.

මෙ සේ සාවුරුද්දක් නික්ම ගිය කල්හි භාතිය තිස් අභය නම් දෙවූ රජ කුමරු තෙම ලක්දිව රාජාභිෂෙකයට අනුරාධපුරයට පැමිණ තුනුරුවන් කෙරෙහි පහන් සිත් ඇති ව පින් කරණුයේ, තමන් රාජ්‍ය වාසීන් රැස්කරවා අනුරාධපුරය සතර ගව්වක්හි නුසුදුසු වල් හරවා තුමූ උයන් පාලයන් ලවා මල් උයනක් කරවා මාලා කාරයන් ලවා මල් ගෙන්වා රුවන්මැලි දාගැප් තුන් මාල පියව සතරඟුල් සඳුන් ගල්වා ...... ...තවද හස්තිශෛල පුරය හෙවත් කුරුණෑගල නුදුරු මෙහි දඹදෙනිය නම් ගම වසන්නා වූ මුදලි නම් එක් ඇමතියෙක්හු නල මුදලියාට සොරෙන් ගොස් අනුරාධපුර භාතිය තිස්ස දෙව්මහරජාණන් සමීපයට එළඹ එකත් පසෙක සිට ශල කරන සේක් 'දේවයන් වහන්ස, බුද්ධාංකුරවූ ඔබ වහන්සේ හැර සාසන-යෙහි පහන් සිත් ඇත්තෝ නම් කවරේ ද? කිය නො හැක.'

මහ රජාණනි, දැන් වනාහි දෙමළ වර්ගයෙහි නල-මුදලියා යන අධිපොතියෙක් ඔහුගේ හත් දහස් අට සියයක් මුක්කර සේනාවෝ ද හාර දහස් හැත්තෑවක් පමණ සිංහල ජනයෝය යන මොවුන් වසඟ කොට ගෙන කලා ඔයෙනුත්, කැළණි ගඟෙනුත්, මොරණිය හෙලෙනුත්, අතර රට අල්ලා ආරාම, විහාර, පිළිම, දාගැප් සිඳ - බිඳ දමා සඟුන් රටින් නෙරපා හැර සසුන විනාශ කරන්නෝ වේ කිවූය

එ බස් ඇසූ භාතිය තිස්ස රජු දෙම්නසට පැමිණ ඔවුන් රටින් නෙරපනු පිණිස අයෝත්ති පට්ටලමට හසුන් දෙවා දූතයන් යැවී ය. රජහු විසින් යවන ලද හසුන් පත දැක



ඔවුන් මහත් ප්‍රීතියෙන් පිණා, යුද්ධයෙහි දක්ෂ [1]දෙමළු කරාවේ සෙන්පතීන්ගෙන් නව ගෝත්‍ර නව දෙනෙකි. පෝ ඉට්ටන්, කෝ ඉට්ටන්, කාලිංග ඉට්ටන්, නල්ලන්ගවන් පාලවන්, ඉච්චන් මුදවර්, තේවර්, වෙඩි අරශන්, මරවරායර් හා ඔවුන්ගේ හත් දහස් අට සියයක් නව ගෝත්‍ර දෙමළු සේනාවෝ ද යුද්ධ උපකරණ සලස්වාගෙන දිශාකාර නැලි ගොටයා මොවුන් කවා පොවා නැව් නංවා තුමූත් නැව් නැඟී පීනා විත් කරාදූවට ගොඩ බැස්සාහ.

ඒ කරාදූව නම් විය. එයින් නික්ම කුදිරිමලේට පැමිණ ක්‍රමයෙන් අවුත් අනුරාධපුර නුවර භාතිය තිස්ස රජ සමීපයට පැමිණියෝ ය. එ විට රජ්ජුරුවෝ සතුටුව දිශාකාර නැලිගොටයා රජ්ජුරුවන් අභිමුඛයට ගෙන්වා පිළිසඳර කථා කොට ලේකම් බලා යුද්ධයට යුතු භාණ්ඩයන් දෙවා රජ්ජුරුවන්ගේ යුද්ධ සේනාව දෙදහස් හත්සිය අනූවක් ද, දෙමළු සේනාව හත් දහස් අට සියයක් ද කාදෑ බෝද්‍යයෙන් කවා පොවා සන්නාහ සන්නද්ධව යුද්ධයට සැරසී රජ්ජුරුවන් වැඳ සමුගෙන මෙසේ විචාළෝ ය. "දේවයන් වහන්ස, කොතැන්හි කඳවුරුලම්දැ" යි කීහ. මෙ සේ රජ්ජුරුවෝ අවසර දෙවා වදාරණසේක්.

1. මෙහි දෙමළු කරාවේ ය යි සඳහන්ව ඇත්තේ වැරදීමකිනි. දෙමළුන් වූවත් නොවූවත් මුළු ඉන්දියා ජනතාවම මෙරට වැසි බොහෝ දෙන දෙමළු ගණයෙහි ලා සලකති. ද්‍රවිඩයන් නුවූ ජවහර්ලාල් නේරු ආදී උතුමන්ද ඉන්දියන්කාරයන් වූ නිසා දෙමළුන් හැටියට ගණන් ගැනීම අප රටේ සිරිතකි. ඒ අන්දමින් වරදවාගෙන උතුරු ඉන්දියානුවන් වන (අයෝත්ති පට්ටලමෙන්) අයෝධ්‍යපුරයෙන් පැමිණි කෞරවයන්ට දෙමළු කරාවෝ ය යි යෙදී ඇත. (අයෝත්ති පට්ටනමට දැන් ව්‍යවහාර කරන නම ඖඩය.)

"ත්‍රී මේශ්වර තපසරයින්ගේ මැදගම්පල කලල් ගෝරුවේ දූව මැද කඳවුරු ලවා සටන් කරව" යි අවසර දුන්හ. එකල්හි දෙමළෝ එයින් නික්ම නුවර වැව වාඩි හැර එයින් නික්ම කළු වැල්ලාපොතාන වාඩි හැර, නල ගොඩ වාඩි හැර මැදගම්පල තපස්සරයින් විචාරා පතිවිඩ දකිමින් කලල්-ගෝරුව හඳුන්වාලීය

එකල කලල්ගෝරුවේ කඳවුරු ලා යුද්ධයට සැරසී කුඩ, කොඩි, සේසත් නංවා යුද්ධ ඝෝෂා පතුරුවා නල මුදලියාට දන්වන ලදුව, නල මුදලියා ද තම සතු සේනාව කාද්‍ය බෝද්‍යයන් කවා පොවා සන්නාහ සන්නද්ධව හත් දහස් නවසිය හැත්තෑවක් යුද්ධ සේනාව සහිත යුද්ධෝප-කරණ සලස්වා තුමූ ද සැරසී අවුත් යුද්ධයට වනි. ඉක්බිති දෙපසෙහි මහත් සටනක් විය. එකල භාතිය තිස්ස රජුගේ සේනාවට ජය අත්විය. මුක්කර සේනාව පරාජය විය.

1 නල මුදලියා එක් වෙඩි පහරකින් මළේය. භාතිය තිස්ස රජුගේ සේනාවෝ මෙසේ බොහෝ මුක්කරුන් මරා නැලව බලකොටුවට වැදී එය සිඳ-බිඳ දමා තිබූ වස්තූන් රැගෙන විත් අනුරාධපුරයට පැමිණ ජයලත් නියාව සැල කළෝය. රජහු ඔවුන්ට සතුටුව දෙමළෝ කවා පොවා

1. නල මුදලියාගෙන් පැවත එන කාක මුක්කර පරම්-පරාවේ මිනිසුන් ගල්ගමුවේද, නැලව යන ගමේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහ වන්නි බද ප්‍රදේශවලද සිටිති. ඔවුන්ගෙන් සමහරෙක් වන්නිකම් කර තිබේ. ඔවුන් වන්නි පේරුවේ මුදලිවරුය, වැදි පේරුවේ මුදලිවරුය යනුවෙන් බෙදී සිටිති.

ර ණි න් බැඳපු ගල් වෙරලුව ගෙලේ පැලඳලා කදිම ට
සැ ණින් සුරත දරු කඩුව රජත රත්න සැදි මොනව ට
අ ණි න් රුජ ගිරි මල් රට කෙසරිඳු ලෙස රණ පිටිය ට
ල සි න් වැදුනි නල මුදලිඳු රණ කෙළි කෙළ ගල්ගමුව ට

(මුක්කර හටන)



සිංහලෙන් තැලි බැඳ හිර දෙවා, දෙමළෝ ළඟට ගෙන්වා අප මහ සෙනෙවිරත්නයන් හට මෙසේ වදාරණසේක්, මාගේ මේ රාජ්‍යයේ බස්නාහිර ජනවිය කළුරට ද, නැගෙනහිරට මාරගස්හිත්න සහ නැවිගල ද, දකුණට මොරණියේ කන්දෙන් බුළුවල ගල් පඩි පෙළට ද, බස්නාහිරට තුන්පනේ හංගුරු කන්දෙන් කැලණි ගඟට ද යන මේ මායිම් තුළ රට රක්නා පිණිස රට දෙවා කරාවේ දෙමළුන් රැඳවූ හ. මේ නල මුදලියාට තුබූ රටයයි දතයුතුයි. ඉතුරුවූ දෙමළුන්ට දකුණෙන් රට දී පොරොන්තු කරවූහ.

(සිවලා කුලමේ රාමනාත මුදියන්සේලාගේ වන්නි කතා පුස්කොළ පොතේ පිටපතකින් උපුටා ගත් කුරුකුල චරිතයේ ප්‍රථම කාණ්ඩයෙන් ගන්නා ලදී)

භාතිය රජු දවස යුද පිණිස මෙරටට ගෙන්වන ලද, රණකාමී හටයන් දෙමළ ජාතිකයන් නොවේ. සූර්‍ය, චන්ද්‍ර වංශයන්ට සම්බන්ධකම් ඇති නියම කෞරවයෝ ය. ඔවුහු නල මුදලියා පරාජය කොට එවකට ඔහු අත්කර ගෙන සිටි (කලා ඔයෙනුත්, කැලණි ගඟිනුත්, මොරණිය හෙළෙන් හා මාඔයෙනුත් මායිම් වූ) ගම්-නියම් ගම් සියල්ලම භාතිය රජුට අයිති කර දුන් බැව් ඉහත සඳහන් වන්නි කථා පුවතින් හෙළි වෙයි. එසේම ඒ ප්‍රදේශයෙහි මෙකියන ලද භාරත වංශික කුරු කුල සේනාවන්ගෙන් පැවත එන සූරිය කරාවේ චන්ද්‍ර කරාවේ, කෞන්තිය (කොන්ත-කෝන්) කරාවේ යනාදි නාමයන්ගෙන් යුක්තවූ පරම්පරාවල් දූනුදු වාසය කරති.

පුරාණ කාලවල සිරිලක කුරු රට (කුරු කෝරළය) යනුවෙන් ප්‍රදේශයක් ලබාගෙන විසූ පළමු පැමිණි කුරු රට කුරුකුලයන්ගෙන් පැවතෙන්නෝ භාතිශ රජු දවස අයෝත්ති පට්ටනමෙන් පැමිණි සේනාවන්ට "කුරුකැටි නෑයෝ ය." "කුරුනෙහායෝය" කියා ව්‍යවහාර කළ හෙයින් ඒ ප්‍රදේශයට 'කුරුණෑගල' යන නාමය වියයි

රාවණා රජාවලියේ හා කුරුණෑගල විස්තරය යන පුස් කොළ පුරාණ ලේඛනයන්හි සඳහන් වී ඇත. කුරු රට අගනුවර 'හස්තිනා පුරය' හෙයින් ඒ නම හා ගැලපෙන ලෙස 'කුරුණෑගල' යන නාමය වීයයි ද සිතා ගත හැක.

("මේ නගරවරයට කුරුණෑගල යන නාමය සම්මතවී තිබෙන්නේ 'කුරු රටින්' පැමිණි මිනිසුන් එහි විසූ නිසා හෝ "කුරුමිණියාගල" නමැති පර්වතය එහි අවසර්ථිත වූ නිසායයි සිතීමට කරුණු තිබේ" යනුවෙන් රාජනීතිඥ එච් ශ්‍රී නිශ්ශංක පාර්ලිමේන්තු මන්ත්‍රී තුමාගේ ප්‍රකාශයක් 5-10-47 හෙළදිව පුවත්පතේ සඳහන් වේ.)

භාතිය රජු දවස පැමිණි යුද්ධකාර කුරු කුල ජනයාගෙන් පැවතෙන්නෝ දිද්දෙනිය, නෙල්ලිය, කටුපොත, පාලගම, නෙරියාව, දෙමළමානෙ, එඬරගල්ල, සෙනිදිරියාපිටිය, පොතුබෝව, කොටගෙදර, එල්ලාගොන්න, කුරුප්පුවත්ත, නෙත්තානෙ, කහගොල්ල, හිරිවැව, වලස්වැව, ඔතුවෙල, කෝන්ගොල්ල, මැල්ලපිටිය, මොරගොල්ල දෙහෙල්ගමුව, පොරමඩල, අඬරපතේ, උඩපොල, ගොඩිගොමුව, උල්හිටියාව, බුල්නෑව, මානගැටේ, සියඹලාකැලේ, ආරගොඩ ආදී ගම්වල වාසය කරති. ඒ ගම්වල වෙසෙන කෞරව වංශිකයන්ගේ වරිග වාසගම් කීපයකි මේ වරුණසූරිය මුදියන්සේලාගේ, බූදල් ගෙදර රාමනාථ මුදියන්සෙලාගේ, සියඹලා ගෙදර බාලසූරිය මුදියන්සෙලාගේ, වීරසූරිය මුදියන්සෙලාගේ, විජේසූරිය මුදියන්සෙලාගේ, කුරුකුලත් අරශත් ඉලංගසිංහලාගේ හා වර්ණකුලසූරිය ජයසිංහ මුදියන්සෙලාගේත් ය [1] මෙකී ගම්වල කුරුකුලයට අයත් පිරිමින්ට මුහන්දිරම් කියාද සත්‍රීන්ට එතනහාමි හාලමාඑතනා කියා ද ගෞරවාර්ථයෙන් ආමන්ත්‍රණය කරති.

---

1. මේ පෙළපත් නාමයන් සමග උක්කුරාළ, අවුසදහාමි, ඩිංගිරිහාමි, පුංචිරාළ, අප්පුහාමි, පුංචිබණ්ඩා, ටිකිරි බණ්ඩා, රන් බණ්ඩා, කිරි බණ්ඩා ආදි නම් පිරිමින්ටද, මුතු මැණිකේ, බණ්ඩාර මැණිකේ, ගුණරත් මැණිකේ, විජයරත් මැණිකේ, බිසෝ මැණිකේ ආදි නම් කාන්තාවන්ට ද ව්‍යවහාර කරති



මෙසේ කුරුවංශික නාමයන්ගෙන් පෙනී සිටින නොයෙක් පරම්පරාවල් අද දක්වා මේ පළාත්වල උඩරැටියන් මෙන් පෙනී සිටිති. පරණ කුරු කෝරළය වනාහි හතර කෝරළයෙන් එක් කෝරළයකි. මෙම කෝරළයෙහි පදිංචි වූ කුරු කුල මිනිසුන්ට උරුම ඉර හඳ කොඩිය දූන් හතර කෝරළයටම අයිතියයි කියති.

තුවද දෙවුන්දර දේවාලයෙහි දේව කායර්යෙහි නියුක්ත කුරු කුල පුත්‍රයින්ට අයිති ඉර හඳ කොඩිය දෙවුන්දර සිට අළුත්නුවරට ගිය පෙරහැරෙන් පසු ආපසු දෙවුන්දර දේවාලයට නො එවා හතරකෝරළයෙහිම තබාගන්නට යෙදුණු බවත් පරණ කුරු කෝරළයේ සිටි කුරු කුල ජනයා මෙම ඉර හඳ කොඩියට උරුම කියා සිටීම එයට කාරණවූ බවත් දැනගන්නට තිබේ.

**ඉර හඳ කොඩිය හතර කෝරළයට අයත්වීම ගැන පටබැඳුණු කවකි මේ.**

"රුම දෙව් රද දෙවුන්දර සිට අළුත්නුවරට වඩින ගම නේ
සැම සිවුරඟ සෙනඟ සැදෙමින් මඟුල් දිව පෙරහැරින්
සොඳි නේ
සෝම, රිවිරුව පිහිටි කොඩියද පෙරටු කර ආ
සෙයින් එදි නේ
ඒ ම හත් මානයක් සිවුකෝරළේ හට වනි
එ තැන් පට නේ"

(හතරකෝරළේ ලේකම් මිටියෙන් උපුටාගන්නා ලදී.)

**මීට පිළිතුරු වශයෙන් දෙවුන්දර වීරවරුණ රංපටබැඳි නීලවීර නමැති කුරු කුල කවියකු විසින් කියන ලද කවියකි මේ.**

"[1] වේ ද වියාසර මෙකුන් පුත් තේනුවර පෙරුමා හස්ති නා
හා ද වී වින් දෙවුන්දර දේවාලෙ අදිපති වීමෙ නා
පෑ ද සිත තම කොඩිය ඉර හඳ පෙරටු කර ආවා වි නා
ඒ ද මානය එයින් සිවුකෝරළේ හට ඇත්නෑ හි නා"

---

1. ව්‍යාස මහා ඍෂිවරයාට දෙමළ භාෂාවෙන් 'වේද විසායර්' ය යි කියති. කුරු කුල වංශිකයන්ගේ ආදි පිතෘවරයා මෙතුමාය.

# ගජබා රජු දවස

ගජබා රජ නීල මහා යෝධයාගේ ද උපකාර ඇතිව සොලී රටට වැද යුද්ධාරම්භ කෙළේ ය. මේ කාලයේ කුරු රට කරුවේ යුද්ධකාර සේනාවන් සමූහයක් සොලී රජු යටතේ සටන් කරමින් සිටි හෙයින් ඒ සෙනග ද ගජබා රජුට පාවා දෙන්ට යෙදුනෙන් මේ හේවායින් සමූහයද ලංකාවට ගෙනැවිත් අළුත් කුරු රට හෙවත් අළුත් කුරු කෝරළයේ දඹුගමුව ප්‍රදේශයෙහි ගම් බිම් දී පදිංචි කරවන ලද්දේය. ඔවුන්ගෙන් පැවැතෙන්නෝ අදත් එහි වාසය කරති. යුද්ධ සිරකාරයින් වශයෙන් ගෙනෙන ලද නමුත් ඔවුහුද නියම "කුරුකුලත්තාර් වරුය." මින් පෙර ද රජකාරි සඳහා ගෙන්වන ලද කුරු කුල ජනයෝ එහි වූහ. මේ සිද්ධියෙන් පසු කලින් උන් කෞරව වංශිකයන් එහි එක් පසකට යවා ඊට පරණ කුරු කෝරළය යි ද, අළුත ආ කෞරවයන් පදිංචි කරවූ පෙදෙසට අළුත් කුරු කෝරළයයි ද නම් තැබූ බව කියති.

### දෙවුන්දර සිට අළුත්නුවරට ගිය පෙරහැරේ විස්තර

(කුරු කුල චරිතයේ පළමු වැනි කාණ්ඩයේ 84, 85 පිටු)

දඹදෙනි පුර නැමි බඹර කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු මහරජ දේව ප්‍රතිරාජ නම් අමාත්‍යයා දෙවි නුවරට (දෙවුන්දරට) පිටත්කොට දේව රාජ ප්‍රතිකඩය (රාම දෙවි රද) හා මහ රන් ආවුද දෙරට සේනා සමග පෙරහරින් වැඩමවීමට අණ කෙළේය. ඒ පෙරහැරේ මූලිකා වූවෝ නම් පෙර දෙවුන්දර දේව භවනය සාදා දෙවිනුවර සහ දේවාලයේ ප්‍රධාන ධුරවලට පත්ව සිටි දපුළු රජුගේ



පුත්‍රයන් දෙදෙනාගේ පරම්පරාවෙන් නොසිඳ පැවැති ආ නවරත්න බණ්ඩාර සහ සූරිය බණ්ඩාර යන කුමාරයෝ දෙදෙනා ය. ජයවර්ධන කෝට්ටේ රජ කාලයේදී රයිගම් පුරයේ කුමාරයකු සමග සරණවී විසිදෘගමට ගොස් සිටි ඒ කුමරුන්ගේ සහෝදරියකගේ දරුවන්ගෙන් පැවත ආ බුද්ධ ඝෝෂ නම් කුමාරයකුගේ පරපුරයෙන් පැවත ආ නවරත්න බණ්ඩාර දිසානායක කපුරාළ, අළුත් නුවර දේවාලයට දේවරාජ ප්‍රතිකඩය සහ රන් ආවුද වැඩම කිරීමේ මූලිකයෙක් වූයේය.

[1] දෙවි නුවර වැසි ඉහත කී පෙළපතෙන් පැවතූ ආ නවරත්න බණ්ඩාරට ශ්‍රීබුද්ධ වර්ෂ 1779 නිකිණි මස අවදසවක් දින සතුරු පඹුරු වශයෙන් සත් කෝරළේ කටුගම්පල හා ඇලබොඩ යන ගම්වර දෙකක් රජු විසින් ප්‍රදානය කරන ලදී. එපමණක් නොව සතර කෝරළයට අයත් ගම්වර

---

1. ගිරිහෙළ පුරය යනු දෙවි නුවරට කලින් කී නමයි. කිහිරැලි උපුල්වන් දිව්‍ය රාජ තෙමේ දෙවුන්දරට පැමිණියේ දක්ෂිණ ජම්බුද්වීපයේ මලය ප්‍රදේශයෙන්ය යි කියති. දෙවි තෙමේ කිහිරි කොටයක වෙස් ගෙන නදී මාර්ගයෙන් අවුත් මුහුදට පත්වී ගිරි හෙළ පුරයෙහි ගොඩබසිනු කැමැතිව, හික්කඩුව සමීපයෙහි පිහිටි සීනිගම දේවාලයේ කුරු කුලයට අයත් කපු නිලමේට ඒ බැව් සිහිනෙන් දැන්වීය. කපු නිලමේ පසඟතුරු ගොස සහිත මහ පෙරහැරකින් ගොස් දේව රූපය රැගෙන එය තම කරපිට තබාගෙන ගිරිහෙල් පුරයට ගියේය.

සහ මහ දිසාව ද දෙන්ට යෙදුනා ඇත. දෙවුන්දර (දෙවි නුවර) නීලවීර රත්පට බැඳි කිරි එතනා කුමාරිහාමිද මේ පරම්පරාවේ කුමාරියක.

දෙවි නුවර රජ කළ දපුළුසෙන් යුව රජුගේ කාලයේදී දේවරජ ප්‍රතිකඩය සහ සඳුන් රූපයත් අළුත් නුවරට වැඩම කළ බව පැරණි පොතපතින් දැනගන්ට තිබේ.

### සත් වැනි විජයබාහු රජු විසින් වේද වියාසර් තේනුවරප්පෙරුමලා නමැති කුරු කුල නිලමේට දෙවුන්දර දේවාලය සම්බන්ධව දෙවා වදාරණ ලද ශ්‍රී සන්නස.

ස්වස්ති ශ්‍රී වෛවස්වත මනු සංඛ්‍යාත මහා සම්මත පරම්පරානුයාත සූර්‍ය්‍ය වංශෝද්භූත ත්‍රි සිංහලාධීශ්වර නව රත්නාධිපති ශ්‍රීමත් සිරිසඟබෝ ශ්‍රී විජයබාහු චක්‍රවර්ති ස්වාමීන් වහන්සේට දසවන්නෙන් මතු අවුරුදු පොසොන අව සතවකැ නැකැති වේද වියාසරුන්ට පළමු පටන් ප්‍රවේණිව පැවැත ගෙන ආයෙන් දෙළොස් දහස් කෝරළය බද සිත්තටියාට හිමි නැගෙනහිරින් මාවත කොකුන් බස්නා ඇල හා දකුණු දිගින් පරගස මහවෙල මාන්කඩ ඉම හා බස්නාහිරින් ලෙනදූව ගල්තොල්ල ඉම හා උතුරු දිගින් සූදුගල ඉම හා මෙකී සතර මායිමට ඇතුළත්වූ සරියත් මීට වාඩූවට සිටි තුඹාගොඩ ගමට ඇතුළත්වූ මෙහි බඳ ගම් මූදල ගස කොළ වල්විල කුඹුරු ඔවිට ආදිවූ තැන් උත්පලවර්ණ දෙවි මහ රජ්ජුරු සන්තකකොට අවුරුදු එකකට පඬුරට පනම් දසයක් බැගින් පසිඳ ප්‍රයෝජන විඳිනා නියායෙන් නැකැති වේද වියාසරුන් මෙකු පත් තේනුවරප්පෙරමාල ඇතුළු වූවන්ගේ දරු මුණුබුරු



පරම්පරාවට ආ චන්ද්‍රාර්කස්ථායිව ස්වස්ථිරව පවත්නා පනතට සලස්වා පත් ලියා දෙන්නේය යි ජයවර්ධන කෝට්ටේ මාලිගාවේ සිංහාසනයේ වැඩහිඳ මුදලිවරුන් මැද වදාළ මෙහෙවුරින් මේ සන්නස් තාම්‍ර පත්‍රය ලියා දුන් බවට සන්හස් තිරු වරහන් පෙරුමාලුම් වම්හ.

## මහා පරාක්‍රමබාහු රජු දවස

පළමු වැනි පරාක්‍රමබාහු රජු දවස පිටරට යවන ලද යුද්ධ නෞකාවන්හි සේනාපතිවරුන්ද, කපිතන්වරුන්ද, කොඩිකාරයින් යනාදී වශයෙන් කුරුකුල නිලධාරීන් යෙදී සිටි බැව් ආණ්ඩුවේ මහා තෝම්බු කාර්‍ය්‍යාලයන්හි මහා භාරකාර ශාස්ත්‍රාචාර්‍ය්‍ය ජ් රෙමර්ස් මහතා විසින් 'සිලෝන් කෝෂරි ඉලස්ට්රේටඩ්' නම් සංග්‍රහයේ 1933 නත්තල් කලාපයට ලියන ලද 'සිංහල රජුන්ගේ නාවුක හමුදා' යන ලිපියෙහි සඳහන් වේ.

ලංකාවේ පදිංචිව සිටියාවූද, යුද කටයුතු සඳහා ඉන්දියාවෙන් ගෙන්වා ගත්තාවූද කරාවේ නාවුක භටයෝ සිංහල රජුන්ගේ යුද්ධවලට ගොස් ඔවුන් වෙනුවෙන් සටන් කළ හෙයින් ඔවුන්ට බොහෝ වරප්‍රසාද දෙවා වදාරා තිබේ.

ඔවුන්ගේ ආදි නම් හඳුන්වන නාමයන්වූ [1] "මහ මරක්කලගේ" (මහ නැවේ කැප්ටන්) "මාලිමිගේ" (නැවේ නියමුවා) "කොඩිකාරගේ" (කොඩි භාරකරු) හා තවත් නිලවලි නාමයෝ වෙති. තවද "මරක්කල සන්නද්ධගේ, මරක්කල සන්නාදිගේ, මරක්කල හැන්නැදිගේ, පොඩිමරක්කලගේ යන වරිග නාමවලින් යුත්

---

1. පණ්ඩිත වැලිවිටියේ සෝරත නාහිමියන්ගේ ශ්‍රී සුමඞ්ගල ශබ්ද කෝෂයෙහි 700 වැනි පිටුවේ 'මරක්කල' යන්නට 'නාවිකයා' යාත්‍රා කාරයා හෝ යාත්‍රාවක ප්‍රධානයා යයි අර්ථ දී ඇත

කුරුකුල ජනයෝ දකුණු පළාතේ හා බස්නාහිර පළාතේද සිටිති. ඔවුහු යුද්ධ නෞකාපතීන්ගෙන් පැවතෙන්නෝ වෙති

පුරාණ කාලයේ මුන්නේශ්වරමට ගොඩබට මලල බණ්ඩාර කුමාරවරු ගමන්ගත් යාත්‍රාව 'මරක්කාව' නමින් හැඳින්වුණු බැව් 'මලල බණ්ඩාරවලියෙහි' මෙසේ සඳහන් වේ.

"මරක්කාව කොයි අතට ද පදි න් නේ
සිංහල රටට යන්නට අප කිය න් නේ"

නැව්වලට මරක්කාවය යි කියා තිබෙන බවත්, නෞකාධිපතියන් 'මරක්කලගේ' යන නාමයෙන් හැඳින්වුණු බවත් මෙයින් පැහැදිලි වේ.

## සූරිය තමෙල්

මහා පරාක්‍රමබාහු රජතුමන්ගේ රණකාමි නාවුක බලැණියේ 'අද්මිරාල්' කෙනෙකුව සිටි 'වණීකුල ආදිත්‍ය තමෙල්' නමැති නෞකාධිපතියාගේ නාමය මහ වංශයේ සඳහන්වී ඇත්තේ 'ආදිත්‍ය ද්‍රවිඩ අදිගාරි' වශයෙනි.

සූර්‍ය නාමය 'ආදිත්‍ය' වශයෙන් ද, 'තමෙල්' නාමය 'ද්‍රවිඩ' වශයෙන්ද, 'නෞකාධිපති' යන්න 'අධිගාරි' නමින්ද ලියා තිබේ.

පරරාජසේකරන්, සංගිලි යනාදි යාපනේ රජුන් දවස ඔවුන්ගේ යුද්ධ නෞකා බල මණ්ඩලය කරුවේ නිලධාරීන් ගෙන් සකස්වී තුබුණු බව යාපනේ ඉතිහාසයෙන් පෙනේ. එමෙන් ම සිංහල නෞකා සියල්ලෙහිද කරුවේ නිලධාරීන් යොදා සිටි බව පෘතුගීසි, ලන්දේසි සහ දෙමළ ඉතිහාස පොත්වල දක්නට ඇත.

(කුරුකුල චරිතය ii)



තවද මහා පරාක්‍රමබාහු රජු දවස මහ බලගතු නාවික යුද්ධ හමුදාවක් කීර්ති නගරගිරි හා ආදිත්‍ය ද්‍රවිඩ අධිකාරී ([1]සූරිය තමෙල් කුමාරයා) යන "මහමරක්කාල්" නොහොත් "අද්මිරාල් වරු" දෙදෙනාගේ ප්‍රධානත්‍වයෙන් බුරුම රට පේගුවට යවන ලදී. මොවුහු කුසුම් යන ස්ථානයට ගොඩබැස සතුරු පරදවා නගර ගිනි තබා එහි රජුද මරා දැමූහ. (මහා වංශය මෙසේ කියයි)

"මේ යුද්ධ සේනාව සහිත නාවුක සමූහයා, සාගරය මැද යාත්‍රා කරන ද්වීපතක් වැනි විය. සමහර නෞකාවන් කුණාටුවලට අසුවී අන් රටවලට ගොඩබටහ.

ජය ගෙනැ රමණ රට — එහි සිහල බළ බල පෑ

සූරු විරු කිත් නුවර ගල් සෙනෙවියා හ ට
නරවිරු තෙමේ තොසපෑ කළ දස්කම ට

මලබටුව කිත් සෙත් — පපුව යන ගම් පෙදෙසින්

බිජුවට දෙයාළක් ඉර හඳ පමුණුව ට
දිනි ගලැ අකුරු කොටවා කල් තිබෙනුව ට

---

1. සාහිත්‍ය පරාක්‍රමබාහු රජු විසින් කෞරව ආදිත්‍ය කුරු අරශනිලයිට්ට කුමාර තමෙල් නමැති ක්ෂත්‍රියයෙකු යුව රජ තනතුරට පත්කරගත් බැව් 'කරා ගොයි කොන්ටෙස්ට්' නමැති ඉංග්‍රීසි ග්‍රන්ථයේ 58 වැනි පිටුවෙහි දැක්වේ

ක්‍රි. ව. 1715 වැන්නෙන් පසු වර්ණකුල ආදිත්‍ය අරශනිලයිට්ට සීමෙන් තමෙල් ලන්දේසි ආණ්ඩුව යටතේ මහ මුදලි තනතුරට පත් කරන ලද්දේ ය. හෙතෙම යුද්ධ සේනාධිපති ධුරයද දැරුවේ ය. (මොහු හලාවත පළාතේ කම්මල නමැති ගමේ වැසියෙක් බැවින් කම්මල මුදියන්සේ නමින්ද ප්‍රසිද්ධ විය.)

පසිදු දෙවනගල වෙහෙරට තැනූ නුදු රූ
මහ කළුගලෙක එපවත පවසන අකු රූ
අණ ලෙස නරනිඳුගෙ කොටවන ලද අයු රූ
දකිනට අදත් හැකිවෙයි කාටත් එ හු රූ

(සිංහල වංශය — ර. තෙන්නකෝන්)

## දෙ වැනි පරාක්‍රමබාහු රජු දවස

ඒකුරක හෙවත් එකුර සෙනෙවි ප්‍රධාන හත් සියයකින් යුක්තවූ ආයර්‍ය හට හමුදාව ලංකාවට පැමිණියාහුය. එකල දඹදෙණි පුරය ආණ්ඩු කළ රාජද්‍රෝහි මිත්ත සෙනෙවියා එකුරගේ එක් කඩු පහරකින් කපා හෙළීය. ඉන් පසු ආයර්‍ය, සිංහලය යන සියලු සේනාවෝ සමගිව යාපව්වට ගොස් බුවනෙකබාහු කුමරු දඹදෙණියට ගෙන අවුත් අභිෂේක කළෝ ය. එකුරගෙන් පැවතෙන පරම්පරාව 'එකුර අර්ථදේව ආදිත්‍ය' නමින් මේ දක්වා පවතී.

(මොරටුවේ විසූ එකුරාර්ථදේව ආදිත්‍ය ළිඳමුලගේ ජුසේ ද සිල්වා කුරු චන්ද්‍ර සූයර්‍ය තුමා එකුරගෙන් පැවැත ආවෙකි. ශ්‍රීමත් චාර්ල්ස් හෙන්රි ද සොයිසා සිටාණන්ගේ භාර්‍යාවවූ ද සොයිසා ආර්‍යාව ජුසේ ද සිල්වා වැවලියර් තුමාගේ දියණියයි.)

## පළමු වැනි බුවනෙකබාහු රජු දවස

මෙසේ කලින් කලට රාජ්‍යයට පැමිණෙන රජතුමාණන් මෙම වංශානුගතව පැමිණෙන හෙයින් භුවනෙකබාහු නරශ්‍රෙෂ්ඨයන් විසින් පස අනූවක් පමණ කාංචිපුර නුවරින් මෙම ලක්දිවට ගෙන්වාගෙන මුහුදු කරදිය වළල්ල වට පරසතුරන් විසින් වන අනතුරට ගම්වර දී ඔවුන්ට රාජ කරුණා දෙවා එහි පිහිටවූහ. එතැන් පටන් ඔවුන්ට ශම නොයෙක් කටයුතු තබවා පස් මෙහෙකම් කරන්නාවුන්ද සලස්වා රක්‍ෂා කළහ.

(තමන්කඩුවේ 1 කොඩිකාරගම වනවාස හාමුදුරුවන්ගේ ජලකන්‍දය පුස්කොළ පොත.*)



"තමලිංගමුවේ රාජයා (ජාවක රජ) හා සටනට කුරු රට කුරු කුල හේවායින් ද, "පරවර" හේවායින් ද දඹදෙණි පුර කාලිංග පණ්ඩිත පරාක්‍රමබාහු මහ රජු විසින් යවා තිබේ."

(බුද්ධරක්ඛිත හාමුදුරුවන්ගේ දඹදෙණි අස්න පුස්කොළ පොත)

කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන නමින් ප්‍රසිද්ධවූ දඹදෙණි පුර දෙවැනි පරාක්‍රමබාහු රාජ්‍යය කළ කාලය තුළද, ඔහු පුත් හතර වැනි විජයබාහු රජ කාලයේද, පළමු වැනි බුවනෙකබාහු රජ කාලයේද කරාවේ හෙවත් කුරුකුලයින් කීප විටක්ම ගෙන්වා තිබෙන බැව් මෙහි පහත සඳහන් වේ.

"මහින්දය, සුබතෝය, වසෙන්තකුරුය, නන්‍දකුරුය, ගජකුරුය, පුෂ්පකුරුය, උසබ්භකුරුය යන ක්‍ෂත්‍රිය කුමරුවන් සත් දෙනෙකු යටතේ සේනාව මෙ රටට ගොඩ බැස්සාහ"

(කකුසඳ සවාමීන්ගේ දඹදෙණි අස්න පුස්කොළ පොත)

ඉහත සඳහන්වූ ක්‍ෂත්‍රියයෝ වනාහි කෞරව හෙවත් කුරුවංශික රාජ පුත්‍රානා ආර්‍යවරුය. මෙහි පහත සඳහන් කෞරව ආර්‍ය ජනයාද මේ කාලයේදීම දඹදිව සිට දඹදෙණියට පැමිණ තිබේ.

"මිත්‍රද්‍රෝහි මිත්‍ර සෙනෙවියා, ඒකුරක සහ සත් සියයක් ආර්‍ය ක්‍ෂත්‍රිය හේවායෝයි ... මිත්තගේ වැටුප් ප්‍රතික්‍ෂෙප කළ බැවින් මිත්ත සමීපයට කැඳවනු ලැබීය. එවිට බුවනෙකබාහුගේ රහස් ආඥාව පිට ඒ නිර්භීත ඒකුරක තෙමේ වහාම ඉදිරියට පැන මිත්ත සෙනෙවියාගේ හිස එක පහරින් ම කඩුවෙන් කපා හෙළීය."

(ලංකා කථාව - රාජාවලිය සහ මහා වංශය)

* "යන අඹි පාර බලමින් වන සතුන් නේ
දෙන වෙඩි පාර හෙණ හඬමෙන් ඇසෙන් නේ
සිත දැඩි ගෝර අයමයි මෙහි සිටින් නේ
ගම කොඩිකාර පසු කර යව ලසින් නේ"

## පස් වැනි බුවනෙකබාහු රජු දවස

මෙම රජුගේ කාලයේ ද කුරු රට, කාංචිපුර, කාවේරි- පට්ටනම ආදී දඹදිව රටවලින් කරාවේ හෙවත් කුරු කුලයට අයත් ජනයා ලක්දිවට ගොඩ බැස්සාහ. මේ කාලයේ පැමිණි ජනයාගේ ප්‍රධානයා සේනාධිපති ධුරයකට පත් කොට කඩු පැළැන්දූ බව කොළඹ කෞතුකාගාරයෙහි (දැනට) තැන්පත් කොට ඇති කඩුවක සඳහන්ව ඇත. ඒ මෙසේයි "සවස්ති ශ්‍රී ...... ප්‍රවර විරාජමාන ජනදීශ්වර ..... විජයරාජ සෙනෙවි මහ වාසල දීය.

ශ්‍රී බුද්ධ වර්ෂ සහස් නවසිය සතළොස් වැනිවූ කල ශ්‍රී ලංකා .... යුවරාජ ධුරය පත්කරනු ලැබ කෞරව ආදිත්‍ය අරසනිල ඉට්ටු ඉලෙනාග .. නමුදු කගය ලබනට යෙදුනේ මෙ... .....වෙසඟ පුර පසළොස් කුජ දින ජයවර්ධන පුර රජවාසල දීය."

(රාජකීය ආසියාතික සඟරාව 1903-1905, 18 වෙනි කාණ්ඩය)

බුද්ධ වර්‍ෂ 1792 ට පැමිණි සඳ ශ්‍රී ලංකාධිපති සාහිත්‍ය පණ්ඩිත පරාක්‍රමබාහු මහ රජ කෞරව ආදිත්‍ය කුරු අරස නිලසිට්ට කුමාර තමෙල් තෙම, යුව රජ පදවියට පත් කර, නවරත්නයන් සහිත ඛඩ්ගය පළඳවනු ලැබුවේ මෙම වර්ෂයේ පසළොස්වකට පැමිණි අඟහරුවාදා සිරිවර්ධන වාසල දීය

(කාරා ගොයි කොන්ටෙස්ට් 58 වැනි පිටුව.)

මේ වැකි දෙකින්ම කියවෙන කරුණ එකය. එහෙත් කඩු පැළැන්දූ ස්ථාන නාමයෙහි ප්‍රභෙදයක් පෙනේ. එයින් කඩුවෙහි කොටා ඇති ස්ථාන නාමය නිවැරදි බැව් කිව හැක.



## කුරවසිංහ වන්නි බණ්ඩාර

ඊට ඉක්බිති කුරවසිංහ කුමාර තෙම නොබියව සැල කරන සේක් "දේවයන් වහන්ස, මම දාපුත්තලම් ජනපදය රක්නා පිණිස ඔබ වහන්සේගෙන් ලබා සිටින නමුත් නිතර වියවුල් වන බැවින් ඒ සතුරන් පරාජය කළ හැකි යුධයෙහි දක්‍ෂ වූවන්ගෙන් ද ඔවුන්ට යුතු අවි-ආයුධාදීන් ද, මාහැඟි ලැගුම් ඉඩම් ද ඊට සුදුසු පරිවාර අතවැසියන් ද ලැබෙන ලෙසට සැලකෙළේය රජ්ජුරුවෝ ඔබට සතුටු රත්තරන් පටිසථානයක් ද, රත්තරන් කම්බිලියක්ද, රත්මණ්ඩයක් ද, සුරත් වලත් සයක් ද දෙවා වදාරා 'කුරවසිංහ කුමාර වන්නි බණ්ඩාර' යයි කියා රන් පට බැඳ ඔහුට සරඹයෙහි දක්‍ෂයින්ගෙන් නව සිය හැටක්ද, එසේම ධනු ශිල්පීන්ගෙන් සත් සිය හැත්තෑවක් ද, සෙසු පාබළ සේනාවන් දෙ දාස්- හාරසිය පණසක්ද දෙවා මොවුන් යුතු යුද්ධ භාණ්ඩ යන්ගෙන් කාලතුවක්කු වෙඩි, මූලක්කන්, කඩු කස්තාන-තෙප්න - ලන්ස - පටිසථාන - තෙප් - කොන්ත- අඩයටි තෝමර-පලිස් යනාදි වාහික යුද්ධෝපකරණයන්ද දෙවා ඔබට නානා ප්‍රකරන දාසාදීන්ගෙන් හය දාස් හාරසිය තෙ පණසක්ද ගොවිකම්හි නියුක්ත වූවන් ආදිකොට ඇති සෙසු කර්මාන්ත කාරයන්ගෙන් එක් දහස් අට සිය හැටක් පමණ දෙවා වදාරා එකී මෙහෙවර ඒ ඒ කාලයෙහි යටත් පහත්ව කරදෙව්යයි වදාළ පණත දතයුතු.

ඒ ජනපදය තුළෙන් බට නින්දගම් අසා වදාරා මාදම්- පිටිය-බිඳුම්කඩ-සලාවත හෙවත් - කටුපිටිය-නාවක්කඩුව ඉළුක්වත්ත-තඹරාවිල - බූලත්ගම - කස්බෝව - කොහෙල්- අංගම-අස්තුකුලම-කොහොලාන-දෙහිවත්ත - බේරුවලාන වැදිගම - මුන්නේශ්වරම - තලයාය - ඔත්තෑවැව - කොටේ- වත්ත-ඇත්තොට-රඹුක්වැල්ල-සිවලාකුලම්-අන්දරවත්ත- එළුපිටිය-පරපේගමුව - හල්දුම්මුල්ල - කල්ලූන්න - හෙට්ටි මුල්ල-මරින්තිකල්ල - කල්ලතිරිල - කම්බුවටන-තබ්බෝව- බොරුවැව-ගල්ගම - ඉලුක්වැව - කුමරපල - කුරුන්දාකුලම-

බොරැල්ලේගම-වරාහම්මන-බෙලිවත්ත යන මේ ඉඩම් හැර තවත් හය සිය හැත්තෑවක් ඔබට තින්දගම්ය කියා හේරත් බණ්ඩාරගේ අයදුම පිට රට මායිම් කර මහමෝදර නැව් තොටින්-වෙල්පරිප්පුවේ දූගොඩින්-වැදිකෙවුලත්ගේ දුන්න කෙටූ ගලෙන්-පතිරිප්පුවේ හවඩිනුගෙන්-පොරවකෙටූ ගලෙන්-හෙට්ටිපල එද්දේ කැටිය කන්දෙන්-දෙමටගලෙන් වුරද ගොල්ලා හීන්නෙන්-අළුත්වැවේ දිය ගිල්මේ ගල් ටැඹෙන් – කන්දේ විහාරේ ගල්පඩි හෙළෙන් – තිරම්මන හොයේ කළුගල් ගොඩින් – තෝනි ගලෙන් – ඇටඹුරුවා ගලෙන් – කෙවුල්ගම දුන්නකෙටූ ගලෙන් – ඉළුක්හේනේ කොණ්ඩගලෙන්-කළුගල්ලේ කන්දෙන් – දෙදූරු හොයේ මෝදරින් කරදියට මායිම් කර පිහිටුවා ශ්‍රී හස්තයෙන් දෙවා වදාරා—(කුරුකුල චරිතය පළමු වැනි කොටස)

(සිළුමිණ ඓතිහාසික කලාපය 1938 අප්‍රේල් 24 පිටු 24, 23)

## ශ්‍රී පරාක්‍රමබාහු රජු දවස

කෞරවර ආදිත්‍ය කුරුවීර අරශනිලසිට්ට මහානාගට සේනාපති ධුරය සඳහා දුන් කඩුවක.

“ශ්‍රී බුද්ධ වර්‍ෂ..... හස් නවසිය නව පනස් වැනී ශ්‍රී ලංකා දීප්ති ජයවර්‍ධන පුර ශ්‍රී සඟබෝධි ශ්‍රී පරාක්‍රමබාහු මහ රජ විසින් කෞරව ආදිත්‍ය අරශනිලසිට්ට මහානාගට... ... සේනාපති ධුරය සහ කගය සකස් කොට හිමි කර දුන්නේ වෛසඟ පිණි දසවක් ලත් කුජ දින සිරි වඩන වාසල දී ය”

(මෙම කඩුව් සහ මීට ඉහතින් දැක්වුණු කඩුව ද මේ දක්වා කොළඹ කෞතුකාගාරයේ පහත මාලේ අල්මාරියක තැන්පත් කර තිබේ.)



## මුක්කර සටන

ශ්‍රී පරාක්‍රමබාහු රජුගේ කාලයෙහි මුක්කර නම් මනුෂ්‍ය වර්ගයක් හා සිංහල සේනාව අතරත් බලවත් සටනක් ඇති විය සිංහල රජ තෙමේ උපකාර ඉල්ලා කාංචිපුර, කාවෙරු පට්ටනම, කීලක්කාර යන තුන් රටට පණිවුඩ යැව්වේ ය. මේ පණිවුඩය ලැබුණු කාංචිපුර රජු විසින් විශාල සේනාවක් එවන ලදී.

ශ්‍රී ශුද්ධ ශකරාජ වර්ෂයෙන් එක්වා දහස් එක්සිය පණස් වර්‍ෂයට පැමිණි මෙම වර්‍ෂයෙහි මීන රවි පසළොස් භාගවූ පංචමී ලත් රවි දින රෙහෙණ නැකත සිංහ ලග්න-යෙන් ගුරු හෝරාවෙන් පිටත්ව කැළණි පුරේට ගොඩ බැස්සා ය.

රජු හා සමග කථා කරගත් පසු මේ සෙනඟ පුත්තල-මෙහි සිටි මුක්කරුන් සමූල ඝාතනයෙන් පරාජය කළහ. ඒ ගැන සතුටුවූ රජ්ජුරුවෝ තෑගි බෝග දුන් තඹ සන්නසේ විස්තර මෙසේයි.

ස්වස්ති සිද්ධම්-කොට්ටෙ නුවර ශ්‍රී ප්‍රාක්‍රමබාහු මහ වාසල රාජ්ජ ශ්‍රී විඳ වදාරණ ප්‍රස්ථාවට මේ ලක්දිව අල්ලන හැටියට පුත්තලමට නාගපට්ටනමට පුත්නාල දෙසෙ සිටි මූක්කරු ඇවිත් පදිංචි උනු ප්‍රස්ථාව එවගට රදළවරු දක්කවාගන යුද්ධ කරනට කවුරු පොහොසද්ද වදාල තෙනදී මූක්කරු හමුදාව සමග යුද්ධ කරතොත් කාංචිපුර කාවේරි පට්ටනම් කීලක්කරෙ මෙම රට තුනේ හමුදාව ගෙන්නා ගත්තොත් සුදුස්සයයි කියා සැල කළ තැනේදී ඒ හැටි හොඳයි කියා දිවස් ලා වදාල තැනෙදී රදළවරු විසින් දිවස් ලා වදාල හැටියට ඒ රට තුනට ඇරියාය. එකැඩපත්

තුන රට තුනේ නිලමක්කාරයෝ බලාගන එරට තුනේ හමුදාවත් සමග කාංචිපුර දේසෙට එකතු වෙමින් වෙච්චි පණිවුඩ පනතෙ හැටියට කතා කරගණ සනකෙලි කෙලීමින් ලංකාවට ගොඩබසින්ට එන නිලමක්කාරයෝ නම් වචවුනාංවිමු **දෙවරෙද කුරුකුලනාට්මු දෙවරෙද මාණික්ක තලවන්ද අදිඅරස අඩප්ප උන්නැහෙද වර්ණ සූර්යා දෙම්බ්‍රනාද අඩප්ප උන්නැහෙද කුරුකුල සූර්යා මුදියන්සේ ද පරදි කුල සූර්යා මුදියන්සේද අරසකුල සූර්යා මුදියන්සේද**[1] මෙම නිලමක්කාරයෝ නම දෙනා සමග ආරච්චිවරු දහඅට දෙනෙක් ඇතුළුව හේවා හමුදාව ගෙන් සත් දහස් සත්සිය හතලිහකුත් ඇඹැට්ටයා ඇතුළුව තොවිල්කාරයෝ පස් දෙනෙකුත් සමග හඹාන් තුනකට රුවල් ඇද පදිනා වේලාවට එක්වාදහස් එකසිය පණස් නවයට පැමිනි මෙම වර්ෂයෙහි මීන රවි පසළොස් භාගවූ පංචමී ලත් රවි දින රෙහෙනේ නැකතින් සිංහ ලග්නයෙන් ගුරු හෝරාවෙන් පිටත්ව කැළනි මෝදරට ගොඩ බැස්සාහ. ඒ වශහැටී. දීස්වර්ණ වර සිංහාසනාරූඪවී වදාරමින් ඒ ආ නිලමක්කාරයෝ සහ හේවා හමුදාව දක්කවා ගැන වදාරමින් නම් ගොත් සහ ආගිය තොරතුරුද අසා වදාරමින් නැවත කරුණාව සහ තානාන්තරවල් ඇතුළුව පඞි ප්‍රසාධ ලැබෙමින් දේසක්කාර සමූහයා දසාව බලා වදාරමින් රවි මඬලේට නික්මෙන්නාවූ අසුර විලාසයෙන් සොභාව දැක වදාරමින් හේවා පන්නේට සමර්ථයොයයි සිතා වදාරමිං පුත්තලමට ඇවිත් පදිංචිව සිටින මුක්කරුන් සමග යුද්ධයට යන්ඩ පුළුවන්දැයි කියා අසා වදාල තැනෙදී ඉට යහපති කියා යුද්ධ කරණ සැටියට දුනු කඩු කිරිච්චි ජමජාඞි කෙටේරි වලළු හෙල්ල මුගුරු යන මෙකී ආයුද සන්නද්ධව පුත්තලමට ගොස් යුද්ධයට පටන් ගෙන තුන් මාසේකින් කොටුව

1 මේ අයගෙන් පැවත එන්නෝ දැනට ද ඒ නම් භාවිතා කරති. මේ යුද්ධයේදී මාණික්ක තලවන් ජීවිතක්ෂයට පත්වූ බව ඉතිහාසයේ පෙනේ.



ඇරෙව්වාය. ඒ යුද්ධයට මෙ අතින් වැටිච්ච හේවා හමුදාව එක් දහස් පන්සියයක් වැටුනාය. ඊටත් බයපූත් නොවී නාගපට්ටනමට යුද්ධයට ගොහින් හතලිස් දවසක් යුද්ධ කරන වේලාවට මාණික්කතලවන් කියන නිලමක්කාරයා සේවා කමෙං වැටුනාය. ඉන් පසු දෙමස් පසළොස් දවසක් යුද්ධකොට නාගපට්ටනම ඇල්ලුවාය. මේ යුද්ධ දෙකේදී දෙදහස් අටසියයක් සේනාව මෙ අතින් වැටුනාය. කොටු දෙක අල්ලා කොටු දෙකෙ තිබුනු රතු කොඩි දෙකත් කොටු දෙකෙ නිලමක්කාරයෝ දෙන්නාගේ තරම් දෙකත් ගෙනවිත් දක්කවාපු තැනෙදී බොහෝ සේ කරුණා සන්තොසවී වදාරමින් මැදින්නොරුව ආනඹලන්දාව මුන්නෙස්සරමද කම්මල තඹරාවිලද හුනුපිටියෙ වීදියෙද පෙරියාමුල්ලෙ වීදියෙද කම්මල වීදියෙද කොළොම්පිටි මහ වීදියෙද වැල්ලෙ වීදියෙද කුරණ වීදියෙද මීගොමුව සහද ප්‍රවෙනී සැලැස්මට තඹෙන් ශ්‍රී සන් පිහිටුවා ලැබුනාය.

ඒ ඇර රාවණ කොඩියද ඉරහඳ කොඩියද මකරයා කොඩියද මාල දෙරිසන්ද වට්ට පේරස් මුදුද රත්‍රං කස්ථාන රිදී කස්ථාන රංහවඩි රිදී හවඩිද රංබන්දි රිදී බන්දි ද රංබස්තං රිදී බස්තං ද කර්ණ කුංඩලා ද වඩන තල අතුද ඇලි සවරං දේක දෙකද රිදී තැටි රිදී කුසලාංද රිදී අඩු රිදී සුලංද රිදී හැඳිද රිදී කොතලාද රිදී වලන්ද මෙකී තානාන්ත්‍ර ලැබෙමින් දහඅට තොටමුනේට වෙළඳාමට යනවාට එනවාට තීරුව සුඟං මුද්දර මිල නැති සැටියට මහ වාසලින් පනිවුඩ උනායැ නැවත ප්‍රජාංගපවතිනා තෙකට මීගොමුව ප්‍රවෙනී වසමට ලැබී මීගොමුවේ පදිංචි කලාය. නැවත රාජ්ජ ශ්‍රී විඳ වදාරණ ප්‍රස්ථාවට ගෝව ප්‍රතිකාල පරඟිකාර ගොල්ල සිල්වාරමක් නොයෙක් පඬුරු පාක්කුඩම් ගෙනවිත් දක්කවා මූන පාපු තැනේදී ආගිය තොරතුරු අසා වදාරමින් කුමක් පිණිස ආවාදැයි කියා අසා වදාල තැනේදී අපගේ දෙසේ යුද්ධ බෝ නිසාත් වෙළඳාම් නවාම් දුර්ලභ නිසාත් ඔබවහන්සේගේ ශ්‍රී පාද පත්මයට

සටහන් වෙමින් කොළොඹ තොටමුනේ ගෝ සමක් අතුරගන්නා විතරවත් බින්වාසියක් ලබාගණ තලාඞී බැඳගණ පදිංචිව වෙළඳාම් කරගෙන රක්‍ෂාවෙමින් මහ වාසලටත් වැඩ රාජකාරිය ක්‍රමින් හිටින්ඩ ඕනෑ නිසා ආවාය කියා ඔප්පු කල තැනේදී එපමණ බිංවාසිය තරමෙං ශ්‍රී සත් පිහිටුවා දෙවාවදාලාය. එලෙසින්ම ගෝසම තුනී ක්‍රි සීත් ක්‍රි ඉරා වටට ඇද බැඳ මැදිවූ බිමෙ කොටුව බැඳවමින් කළුගල් තාප්පෙ බැඳ මූර සමන්නාගත පදිංචි උනාය. මෙතන වැඩ සිටින්ට නපුරැයි කියා සීතාවක නුවරට වැඩියාය. නැවතත් සීතාවකින් එගොඩ ප්‍රඟිකාර ගොල්ල අන්දැයන් ගනිමින් හිටගත්තාය.

ඒ නිසා මෙතන සිටින්ට සුදුසු නැත කියා සෙංකඩගලට වැඩමවා වදාලාය. එනුවර වැඩවදාරණ ප්‍රස්ථාවට පරඟි ගොල්ල කොරා වහල් කඩින් මෙපිට කඩයින් ලාගත්තාය. මූරතුල් විසිඑකක් තනා ඒවායේ සිට රට කැබෙල්ල රාජකාරිය ගත්තාය. ධෞත සංඛපරික්ෂිප්ත සලිලාකාර අභින්න මනුවංසොත්භූතෙස්වර ශ්‍රී ලංකාදීපතිවූ උතුම් අපගෙ රාජසිංහ දේවස්වාමිදරුවාන්වහන්ෂෙ සිංහාසන මස්ථකයෙහි වැඩවදාරණ ප්‍රස්ථාවට බදුල්ලෙ නුවරට වැඩ වදාරමින් ඒ නුවර වැඩ සිට ඌව මහ බල සේනාව සමග මහ අතපත්තුවේ එක් ලක්‍ෂ පනස් දහසක් පමණ අප්පුහුරු සමග නොයෙක් ආවුද ජියං වෙඩිබේත් සමූර්ධ කොට පිටත්ව උනු වග නම්: චතුරඟිනී සේනාව පිරිවරාගනිමින් අසුර යුද්ධයට නික්මුනු සක්‍ර දේවේන්ද්‍රයන් මෙන් ඒ ඒ තැන පරඟි එක්ක යුද්ධිකරමින් කේසර සිංහරාජ විලාසයෙන් ජයගෙන නැවතත් දලදාගත් වෙලේ හේවාකමට වැඩ වදාරන්ට සිතා වදාරමිං නොයෙක් අමාප්ත මඬලේ රදලවරුං පිරිවරාගනිමින් ශත්‍රැකුඤ්ජර විදාරණ නරකේසරිඳුවූ උතුම් රාජසිංහ දේවස්වාමිදරුවානන් වහන්ෂෙ දලගම් වෙලේ හේවාකමට නික්මෙමින් රණ දෙරණ වැඩ සිටින ප්‍රසථාවට සතුරු සේනාව ලංවී එන



වේලාවට නොයෙක් කොඩි කුඩ ප්‍රසාධ ලැබී උතුම් මහ වාසලට පක්‍ෂවාදිකන් පිණිස සිටි නොයෙක් අමාප්තයො බිංදු පැහැ දිවාය. එවෙලාවට මහ කුඹුරෙ පලියවඩනරාල අපගෙ රාජසිංහ දේවස්වාමිදරුවානන් වහන්සේ වැඩ සිටින කැමුව සිටිය. නැවතත් සතුරු සෙන් ලන්වෙත් වෙත් එම පලියවඩනරාලත් පලිය දමා දුවන වේලාවට නොදුවයි යෙදී දෙතුන් විටක් දිවස්ලා වදාලාය. ඒත් දුවන නිසා අන ඇත්තම් නොදුවයි කියා යෙදුනු පනතට බොහො කාලයක් ආයු ශ්‍රී බොවඩ අන ඇත්තෙ පන ඇති කොටවද කියා දුවන කල මහ කුඹුරෙ බත් තිත්ත ක්‍රමි කියා යෙදුනු විට මහ කුඹුරෙ බත් තිත්ත වෙච්චි නම් පිඟාංඕණයෙ අලකොල මියන කොල තිත්ත වේදැයි කියා දුවපු නිසා ශ්‍රී හස්තෙ තිබුනු යකඩ පලිහ බිමට දමා පලිහ පිට වැඩ සිටිමිං උඩින් ඉගිලෙන මානැවියා දැක වදාරමින් ශ්‍රී හස්තෙ හිටිය වඩන කුරුල්ලා ඇර වදාරමින් රාසිංහ මැඞිල්ල මෙතනයි කියා වැඩ සිටින ප්‍රස්තාවට ශල්දුනු කල්පටි කිරිච්චි කෙවේරි ජමජඞි බල තඞි වානා තඞි වානත් චක්‍රාවලළු හදි තුවක්කු අත්තුවක්කු බීරඟි බොන්දික්කුලා සූසලංස පිටිස්ථාන මෙකී ආවුද ගත්තාවූ පන්සියක් හේවා හමුදාවන් ඉසකෝපිතී කියන පරඟි කප්පිත්තාවූ මහගෞරෙන්ද කියන අපගේ මීගොමුවේ මුදියන්ෂෙත් සැදී පැහැදී හේවාකමට එන වේලාවට ප්‍රවර සූර්යා මඬලයක් මෙං වැඩ සිටිනා බව මීගොමුවේ මුදියන්ෂෙ දකිමින් සුද්ධ සූර්යා වංසොත්භූත වූ දේවස්වාමිදරුවානන් වහන්ෂෙට සතුරු සේනාව යුද්ධ කරපු නම් කොට්ටෙ මහවාසලිං යෙදුනු පනතට කාංචිපුර දෙසේ සිට ආ පක්ෂවාදිකං නැතිවෙයි කියා අතේ තිබූ කිරිච්චියෙන් යටිපල්ල ඉරා සතුරු සේනාවුට ලේ පෙන්නා සිංහලේ ඇත්තො හදිකරපුවයි කියා පරඟිකාර ගොල්ල රවටා ආපසු කරණවාගෙන ගොස් පළමු සිටිය තැන පොරොත්තු උනාය.

අපගෙ රාජසිංහ දේවස්වාමිදරුවානන්වහන්ෂෙ අමාප්ත මඩලෙ රදලවරුන් දක්කවාගෙන පරඟිකාර ගොල්ල ආබව මොකද නැවත ගිය කාරිය මොකද අහ වදාල තැනේදී මාතලේ දිසාව ලැබී තිබෙන වැල්ලකෝ දිසා මහත්මයා විසින් රාජසිංහ දේවස්වාමිදරුවානන්වහන්සේට ඔප්පු කුත සැටී නම් කොළ්වටෙ මහවාසල වේලාවෙදී පුත්තලමේ මුක්කරුන් එක්ක හේවාකමට කුරුකුල දෙසෙ කාංචිපුර දෙසෙ කිලක්කරේ කාවේරි පට්ටලමේ මෙකී දේසවල්වලට කැඩපත් ඇර ගෙන්වා වදාරා හේවාපත්නෙට ඇරපු තැනෙදී මුක්කරුන් හා යුද්ධ කොට ජයගත් නිසා තාන්න මාන්න ලැබී මීගමුව සහජ ප්‍රවේනියට ලැබී ඒ පක්ෂවාදීකමට අදත් අපේ රාජසිංහ මහවාසලට දෙවස්කන නුපුරු සේනාව යුද්ධ කුපු නං නපුරුයි කියා මීගමු වැල්ල වීදියෙ වර්ණකුලසූරිය අරිසිතිලඉව්ට මුදලියා දයාවෙන් පක්ෂවාදිවෙමින් යටිපල්ල ඉරාගෙන පක්ෂවාදිකමට ගිය බව මූත් පැරද ගියා නොවෙයි කියා ඔප්පුකල තැනෙදී ඒ මුදලියාට කරුණාව ලැබී වඩන තල අත්තෙන් තල ඇගිල්ලක් ඉරාගෙන රන් පත්හිදෙන් මෙ පක්ෂවාදිකං ඇති ඔහු මාගෙ සිංහලේට ආවොත් බොහො තාන්න මාන්න ගම්වර ලැබී ආදරවෙමි යෙදී කැඩපතක් ලියා රන්දුනු සාම හැර ගැන වදාරමින් ඊය අග පත්‍රය බැඳ විද වදාලාය. ඒ ලියමන මීගමුවේ මුදලියාගේ තලවාඩි ළඟවූ නිසා පත්‍රය බලා කළු හමුදාව නිලමක්කාරයෝ සතර දෙනත් පරඟිකාරයින්ට කියන වගනම් අපි ආ නැකත-මුවාත් සුද්ද නැත ඊයත් වෙඩිබෙහෙත් නැත සෙවාපත්නත් බල මද කියා කොටුවට ගොස් සියළු කටයුතු සමූර්ධකොට එමැයි කියා කොටුවට ගියාය. ගිය තැනේදී වැල්ල වීදියෙ මුදලියා මහවාසලට පක්ෂවාදිකාංවූ සැටි පරඟිකාර ගොල්ල විමසමින් එම මුදලියා අවහිරකොට කළු සමුදාවත් අනික් නිලමක්කාරයින්ටත් කොල්ලෑවක් පමනවත් ඇත මුහුදෙ යන්ටත් එපාය කියා ගිය කෙනෙක් ඇත්නම් කටට වෙඩි බෙහෙත් දමා ගිනි දෙනවා ඇත කියා අඬ බෙර ලැව්වාය.



නැවත රාජසිංහ දේවස්වාමීන්වහන්ෂෙ ඕලන්දට කැඩපං ඇර වදාලා ඇත. ඒ පනතින් ඕලන්දක්කාරයෝ හේවාපත්නෙට කටයුතු සාදාගෙන ඇවිත් මුහුදෙ සිටි බව අසා පරඟිකාරගොල්ල එන්ට නෙදී රැක්කාය. ඒ වග රාජසිංහ දේවස්වාමිදරුවානන්වහන්ෂෙට ඒත්තු වෙමිං ඕලන්දක්කාරයින්ට අති කඩිනමට ගොඩ බහින සැටියට ලියමං ලියා මීගමුවේ මුදලියාට දෙන්ටෙයි යෙදී පනිවිඩ කාරයින් ඇරියාය. ඔහු ගොස් මීගමුවේ කුරුකුල සූර්යා මුදලියා අතට දුන්නාය. ඒ ලියමන සිංහලේට අතිවිස්වාසවූ මුදලිවරු සතරදෙන බලා අපි නැතිවෙතත් මහවාසලට පක්ෂවාදිකං ඇතිනිසා කැඩපත ලංසි ගොල්ලට දෙන්ට ඕනැයි කියා වැල්ලවීදියෙ මුදලියාගෙ යාළු නෑකං දරණ ඉල්ලේනයිදේට නියොගකර එවලෙහිම ඉලෙනෙදෙ ජීවිකාවෘත්තිය නොසලකා මුහුද පීනාගොස් පසුවදා පාන්වූ තුන් පැය වේලාවට කැඩපත දුන්නාය. ඒ කැඩපත බලා ලංසිගොල්ල මුහුදෙන් ගොඩ ආවාය. නැවත රාජසිංහ දේවස්වාමිදරුවානන්වහන්සේ සවිරණ සනග වල්ලභවූ සේනාවත් වස්තුවත් ඕලන්දකාරයින්ට බාර දෙමිං කපුවරල වාඩියේ වැඩ සිට මීගමුවේ නිලමක්කාරයින්ඩ එන්ට යෙදී මහවීදියේ කුරුකුල සූර්යා මුදලියාද සෙම්ප අරිස් කුරන අරසකුල අබප්පයාද ආරච්චනං අරසකුලසූරිය වීරසිංහ කුරන ආරච්චිලද ජයසූර්යා ආරච්චිලද මහ හුනු පිටියෙ රණසිංහ ආරච්චිලද කට්ටප්පය ආරච්චිලද වැල්ල වීදියේ මුදලියාගේ ඇවැස්ස නෑකං දරපු අයත් අදිඅරස අබප්පයත් ඒ ඇර ආරච්චිනංවලින් තවත් කීප අයටත් තාන්න මාන්න ලැබෙමිං මාලත් කර ලැවාය.

# එදිරිල්ලේ රාළ

කොළඹ දෙන් ජුවන් ධර්මපාල රජුගේ රාජ සභාව පෘතුගීසි යුද්ධ නිලධාරීන්ගෙන් හා රෝමානු ආගම වැළඳ ගත් සිංහල මන්ත්‍රීන්ගෙන් ද යුක්තවූවකි.

ජෙරනිමෝ කොරයා (එදිරිල්ලේ ආරච්චි) ධර්මපාල රජුගේ තෝල්ක නිලධාරියාව සිටියේය. පසු කලෙක එදිරිල්ලේ රාළ නමින් ප්‍රසිද්ධවූ ඩොමිංගු කොරයා මේ ජෙරනිමෝ කොරයාගේ පුතෙකි රජවාසල සමඟ පියාගේ තුබුණු සම්බන්ධය නිසා ඩොමිංගු කොරයාට රාජ සභා ආශ්‍රයෙන් ඇතිදැඩි වීමට ඉඩ ලැබිණ. සිංහල-පෘතුගීසි භාෂා ඇතුළු භාෂා කීපයක්ම හොඳින් දැන සිටි හෙතෙම යුද්ධ ශිල්පයෙහිද දක්ෂ වූයේය. ධර්මපාල රජ ළමා වයස ඉක්මවන්ටත් පෙර ඔහු ආරච්චි නිලයකට පත් කෙළේය. එවක් පටන් නිලතල දරමින් ක්‍රමයෙන් උසස්වූ ඔහුට 'රාළ' පදවියද 'මුදියන්සේ' පදවියද තරුණ වියෙහිදීම ලැබිණ. එහෙත් හැම තැනකදීම ඔහු හඳුන්වනු ලැබුවේ එදිරිල්ලේ රාළ යන නමිනි .. ක්‍රි ව. 1595 ජනවාරි 1 වැනි දින පෘතුගීසි හා සිංහල හමුදාවන්ගේ ප්‍රධානියාවූ අසවේදු සියනෑ කෝරළය බලා පිටත්විය. අසරණ ධර්මපාල රජුද යුද්ධ හමුදාව සමඟ ගෙනයනු ලැබීය.

නවගමු දේවාලයත් ඒ අවට ගම් කීපයකුත් විනාශ කර අසවේදු කැළණි ගඟින් එතරව රක්ගහ වත්තට පැමිණ එය කඳවුරු කරගන සියනෑ කෝරළේ වැසියන් මැඩීමේ ව්‍යාපාරය ආරම්භ කෙළේය ... .. .. මේ කාලය වන විට එදිරිල්ලේ රාළ ධර්මපාල රජුගේ අග්‍ර සේනාධිපතියාව සිටියේය. කෝට්ටේ රාජ්‍යයේ ඉතා උසස් පදවියවූ (ප්‍රධාන අණ දෙන නිලධාරියා යන අර්ථවත්) "වික්‍රමසිංහ" නම් රදළ තනතුරට ද ධර්මපාල රජු විසින් එදිරිල්ලේ රාළ පත්කරන ලදී.



ක්‍රි ව. 1595 නොවැම්බර් මස 17 වැනි දින තුන් කෝරළේ අටුළුගම දී විශේෂයෙන් තෝරාගන්නා ලද නිර්භීත යුද්ධ භටයන් 7000 ක් ඉදිරිපිට එදිරිල්ලේ රාළ කොළඹ ධර්මපාල රජුටත් පෘතුගීසීන්ටත් විරුද්ධව යුද්ධ ප්‍රකාශයක් කෙළේය. මේ ප්‍රකාශය ඇසූ සැම පෘතුගීසියාම භයින් ත්‍රස්තවන්නට වන .................. කඳවුර භාරව සිටි නිලධාරියාවූ ජුවන් ප්‍රදිනාන්දු සවකීය ඥාති සහෝදරයාවූ එදිරිල්ලේ රාළගේ කැරලිකාර භට හමුදාවට එකතුවූ බවත් පෘතුගීසීන්ට දැනගන්නට ලැබුනේය.

ක්‍රි ව. 1596 වන විට සෙංකඩගල නුවර අගනුවර කරගන උඩරට රාජ්‍යය කළ විමලධර්මසූරිය රජතුමා සිංහල වීපයේ නිදහස උදෙසා උද්‍යෝගව සටන් කළ ජාතික පක්ෂයේ නායකයාව සිටියේය... ජාතික නිදහස් ව්‍යාපාරය සාර්ථක ලෙස ගෙන යන ක්‍රම සාකච්ඡා කිරීම පිණිස එදිරිල්ලේ රාළ නුවරට එන බව ඇසූ විමලධර්මසූරිය රජ තුමා මේ සිංහල වීරයා ගෞරවයෙන් පිළිගැනීමට සූදානම් විය. ඔවුණු පැළැන්දූ රජකුට හිමි සත්කාර-සම්මාන සහිත පිළිගැනීමක් එදිරිල්ලේ රාළට සෙංකඩගල නුවරදී ලැබුණේ ය.

මේ කාලයෙහි සිංහල රජ වංශයේ එදිරිමනසූරිය පවුලේ කුමාරයෙකුවූ වීදියබණ්ඩාර, විමලධර්මසූරිය රජ තුමාගේ ප්‍රතිරජයන් හැටියට සත් කෝරළය ආණ්ඩු කෙළේය. විමලධර්මසූරිය රජ තුමාගේ අග්‍ර මහිෂිකාව වන මහ බිසෝබණ්ඩාර හෙවත් දෝන කතරිනා බිසොවගේ කිට්ටුවර ඥාතියකුවූ මේ සත් කෝරළේ වීදියබණ්ඩාර කුමාරයාට රූප ලාවණ්‍යයෙන් අංග සම්පූර්ණ තරුණ දියණි කෙනෙක් වූවාය. මේ රජ කුමාරිය දෝන කතරිනා බිසොව බාරේ රජ මාලිගයේ නැවතී සිටියාය.

එදිරිල්ලේ රාළ රාජ වංශයට ඇතුළත් කර ගැනීම පිණිසත් පහත රට අළුත් රජ පවුල සමඟ නෑ සබඳකම් ඇතිකර ගැනීම පිණිසත් මේ දහ අට හැවිරිදි රූමත් කුමාරිකාව එදිරිල්ලේ රාළට සරණ පාවා දෙන්ට විමල ධර්මසූරිය රජ තුමා කැමැත්ත ප්‍රකාශ කෙළේය.

මේ කුමාරිකාවගේ වංශ නාමයවූ එදිරිමාන්න සූරිය යන නම පට බැඳි නාමය හැටියට එදිරිල්ලේ රාළට ප්‍රදානය කොට විමලධර්මසූරිය රජ තුමා මේ දෙදෙනාගේ විවාහ මඞගලය උත්සවශ්‍රීයෙන් සිදු කිරීමට අණ දුන්නේ ය.

එතැන් සිට එදිරිල්ලේ රාළ එදිරිමනසූරිය බණ්ඩාර නම් විය.

(ත්‍රි සිංහල සංග්‍රාමය පිටු 40, 46, 52)

මෙයින් පසු එදිරිමනසූරිය එදිරිල්ලේ රාළ උඩුවර කඳවුරු බැඳගෙන සිටින විට සමරකෝන් රාළ මොහු අල්වා හිර කෙළේ ය. ධර්මපාල රජු මොහු මරා දමා ගැණුන් සහ මොහුගේ මලයා වන සයිමන් කොරයා පව්ටන් කච්චි හෙවත් සීමන් කුරේ රාළ ගෝව රටට හිර බාරයේ යැව්වේ ය.[1]

---

1 එදිරිල්ලේ රාළගේ මරණින් පසු ඔහු විසින් ගෙනයනලද කැරැල්ල නොනවත්වා කර ගන යන ලෙස විමලධර්මසූරිය රජු විසින් සයිමන් කොරයා පොළඹවනු ලැබිණ. ඔහු 'නවරත්න බණ්ඩාර' යන නාමය ආරූඪ කරගෙන තෙමේම 'සීතාවක රජු' බව ප්‍රකාශ කර සිටියේ ය. එදිරිල්ලේ රාළ කොළඹට සිරභාරයේ ගෙනවුත් සතර කඩකට කපා සතර වාසල්කඩ එල්වූ බවත් හිස අටුලුගම කඩමණ්ඩියේ උලක ඇන ප්‍රදර්ශනය කරවූ බවත් 1961 ජූලි මස 16 වැනි දින ලංකාදීප පත්‍රයේ 6 වැනි පිටුවේ සඳහන්වේ.



## විමලධර්මසූරිය වර්ණකුල එදිරිසූරිය මුදියන්සේ

ක්‍රි. ව. 1597 දී විමලධර්මසූරිය මහ රජු විසින් එදිරිමාන සූරිය ආදිත්‍ය උත්තැන මුදලි ස්ථානාන්තරයකට පත් කොට "විමලධර්මසූරිය වර්ණකුල ආදිත්‍ය එදිරිසූරිය මුදියන්සේ" යයි නම් පටබැඳි සිරි ලක දකුණු පළාතේ මුදලි වශයෙන් ශ්‍රී සත්නස් දෙවා වදාරා පත් කරන ලදී.

දකුණු සිරි ලක ජයගත් විමලධර්මසූරිය රජු ඒ පෙදෙසට මුහුදෙන් ගොඩවදින්නට මාන බලන පරංගි සේනාවන්ට පහර දෙවීම පිණිස මේ ආදිත්‍ය මුදලි හා ඔහුගේ සේනාවන් යොදවාගත්තා ලදී.

(කුරු කුල චරිතය II)

## මීගමුවේ කුරුකුල අමරාපති මුදියන්සේ

පෘතුගීසීන් යටතේ සේවය කළ නමුත් මීගමුවේ අමරපති මුදියන්සේ නිතරම සිංහල රජුන්ට පක්ෂව සිටියෙකි. දෙ වැනි රාජසිංහ රජු විසින් පරංගින්ට හොරා මීගමුවෙන් සීතාවකට රහස් ඔත්තුකාරයින් මගින් ගෙන්වන ලද වෙළෙඳ මන්ත්‍රීන් අතුරෙන් මේ අමරාපති මුදියන්සේ ද කෙනෙකි.

මේ මුදලිඳු ඇතුළුව අනිකුත් මුදලිවරුන් ද පෘතුගීසීන්ට විරුද්ධව සටන් කර මීගමු යුද කඳවුර රාජසිංහ රජුට අල්ලා පාවා දීමට සීතාවකදී (අවිස්සාවේල්ල) පැවැත්වූ රහස් මන්ත්‍රණයේදී පොරොන්දු වී තිබේ

පොරොන්දු ප්‍රකාර මේ මුදලිවරු ලංදේසීන්ගේ ද උපකාර ඇතුව මීගමු යුදකොටුව පරංගින්ගෙන් උදුරා රාජසිංහ රජුට පාවා දුන්හ.

මීගමුවේ වැල්ලේ වීදියේ හෝ මහ වීදියේ ඒ අමරාපති මුදියන්සේගේ පුත්‍රෙක් ද මේ සටනට සහභාගිවී සිංහල රජුට සහ ලංදේශීන්ට ද අදාල බොහෝ වැදගත් රාජකාරිවල නියුක්තව සිටියේ ය. මෙ තෙම පරංගින්ගෙන් කතෝලික ආගම වැළඳගෙන කුරුකුලසූරිය දොන් ජාන්ද කෝස්තා අමරාපති නමින් පෙනී සිටියේ ය.

රජුගේ පුද්ගලික මුර හේවායෙක් වූ මොහු කෙරේ රාජසිංහ රජු බොහෝ විශ්වාසව සිටියේ ය. වාසල අප්පුහාමි ධුරයට ද පසුව සැතපෙන ගෙයි අප්පුහාමි ධුරයට ද පත්කරගෙන වාසල විසූ රදළ තරුණියක් ද ආවාහ කර ගැනීමට අවසරය දෙමින් ඔවුන්ගේ ජීවිකාව උදෙසා අඹන්වෙල නින්දගම් වරයද දෙවා වදාළේය. මෙයින් පසු මෙ තෙම අඹන්වෙල රාළ නමින් ප්‍රසිද්ධ විය.

මෙසේ කෞරව වංශිකයෝ දොන් ජුවන් ධර්මපාල රජු දවසද, පළමු වැනි විමලධර්මසූරිය රජු දවස ද, ඈ විසින් කීප වාරයක්ම සිංහල රජුන්ගේ පක්ෂය ගෙන සවකීය ජන්ම දායාද කොට ගත් රණ සූර භාවය හා අභීත වීර වික්‍රමයන් පළකරමින් සතුරන් අභිභවනය කොට රාජකීයයන්ගේ ප්‍රසාදයට ලක්වූහ.



## කුරුවිට රාළ හෙවත් ඌවේ රජතුමා



විමලධර්මසූර්ය රජ තුමා සෙංකඩගල පුරය රාජධානිය කොට ගෙන රාජ්‍යය කරන අවදියෙහි පහත රට, සත් කෝරළය, සතර කෝරළය, සබරගමුව, මාතර දිශාව යන කොටස් පෘතුගීසීන්ගේ පාලන යෙහි පැවතිණි.

මේ වනතුරු විදේශියනට පරාජය නොවූ උඩරැටියෝ පෘතුගීසීන් හා යුද්ධ කරන්නට වන්හ. දොන් ප්‍රනාන්දු සමරකෝන් රාළ පෘතුගීසීන් යටතේ සිංහල සේනාධිනායක ධුරය දැරුවේය. පෘතුගීසි පක්ෂය ගත් සිංහලයෝද පෘතුගීසීන් සමග සෙමින් උඩ රට රජුට විරුද්ධව සටන් කළහ. එහෙත් විදේශීන් නුරුස්සන පහත රටියෝ පෘතුගීසීන්ට විරුද්ධව ඒ ඒ තැන කැරලි ගැසූහ.

මේ කාලයේ අන්තෝනි බරෙත්තු (ඇන්ටෝනියෝ බැරටෝ) යන ක්‍රිස්තියානි නාමය දැරූ කෞරව වංශික ලස්කිරිඤ්ඤ හේවායෙක් (පෘතුගීසීන් සතු) දොන් ප්‍රනාන්දු සමරකෝන් රාළගේ හමුදාවේ සිටියේ ය. කිසියම් හෙයකින් පෘතුගීසීන් හා අමනාප වූ මොහු සවකීය නායකත්වයෙන්

මහ කැරැල්ලක් උපදවා කැතිත් තැන තුබූ පෘතුගීසි බල කොටු සිය අත් අඩංගුවට ගනිමින් ඉදිරියටම ගමන් කෙළේය වැඩි කලක් ගත නොවිය. පෘතුගීසීන්ගේ වැදගත් බලකොටු දෙකක් වූ මාතර හා සබරගමුව ඔහු අතට පත් විය. හෙතෙම ඒ දෙපෙදෙසට ද අසහාය ස්වාමි වූයේ කුරුවිට මූලික ස්ථානය සේ ගෙන සව කාර්‍යාරම්භ කෙළේය. එහෙයිනි හේ කුරුවිට රාළ නමින් ප්‍රසිද්ධ වූයේ. ක්‍රි. ව. 1604 දී විමලධර්මසූර්‍ය රජ අභාවප්‍රාප්ත වූයෙන් එතුමාගේ සොහොයුරු සෙනරත් කුමරු දෝන කතිරිනා නම් ස්වාමි විප්‍රයෝගික රාජිණිය සරණ කොට ගෙන ශ්‍රී ලංකා වීපයේ අධිරාජයා හැටියට වොටුණු පැළැන්දේ ය

## ඌවේ කුමාර පදවිය

ප්‍රඥා සම්පන්න මේ රජ තුමා විසින් එවකට සිටි තේජාන්විත රණ සූරයාවූ අන්තෝනි බරෙත්තු (කුරුවිට රාළ) උඩ රට යුද්ධ හමුදාවේ වික්‍රමසිංහ නාමාන්විත මහා සේනාධිපති ධුරයට පත් කරන ලදී තවද ටික කලකට පසු රාජකීය කුමාරයකුට මිස අන් කිසිවකුට කිසි කලෙක නුදුන්—නොදෙන ඌවේ කුමාර පදවියට ද මොහු පත් කැරිණ. මේ අන්දමින් අන්තෝනි බරෙත්තු දක්ෂිණ ලංකාවේ විශාල ප්‍රදේශයක ස්වාමියා විය.

## රාජ්‍යානුශාසක ධුරය

ක්‍රිස්තු වර්ෂ 1612 දී ලන්දේසීන් විසින් සෙනරත් රජු හා ගිවිසුමක් ඇතිකරගැනුම පිණිස මාර්ෂල් ද බොස්කොවර් නමැත්තා තානාපතියකු සේ මහනුවරට එවන ලදී. මෙහිදී ඔහු කොපමණ ආනුභාව සම්පන්නයෙක් වූයේ දැයි කිව හොත් මීගමුවේ කුමාරයා හැටියටත් මහනුවර රාජ සභාවේ ශ්‍රේෂ්ඨ ස්ථානාන්තරයකට හිමිකාරයකු හැටියටත් පත් කරන ලදී. තදාසන්න කාලයෙහිදීම රජ තුමා විසින්



ශ්‍රේෂ්ඨාධිකරණයක් පිහිටුවා මහ රජු ප්‍රමුඛ ඇමති මණ්ඩලය විසින් මේ වනතුරු විසඳන ලද කරුණු මීගමුවේ කුමාරයාගේ ප්‍රධානත්වයෙන් ඌවේ කුමාරයා හා තවත් කුමාරයන් දෙදෙනකු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චය කාරයන් ලෙස පත් කළ සභාවෙන් විනිශ්චය කළ යුතු යයි තීරණය කරනලදී. තව දුරටත් මේ සභාවේ තීරණය අවසාන තීරණය හෙයින් ඉන් ඔබ්බෙහි අන්‍ය විනිශ්චයක් නොමේ ය යි ද සැළ කැරිණි. රජ තුමාගේ ප්‍රිවිකවුන්සලය ද, ඌවේ කුමරු මීගමුවේ කුමරු හා තවත් කුමරුන් තිදෙනකුගෙන් යුක්ත වූවාය.

## නෞකා හා නාවිකයෝ

ක්‍රිස්තු වර්ෂ 1612 දී උඩරට නැව් හමුදාව ලොකු කුඩා නැව් වලින් සමන්විත කුරුවිට රාළගේ ඥාති පුත්‍ර වූ (අනුමාන ලෙස පේද්‍රුරු බරෙත්තෝ යයි සිතන) අද්මිරාල් තැන හා වත්දිගේ නයිහාමි යන උප අද්මිරාල් තැනගේත් මෙහෙයීමෙන් ත්‍රිකුණාමලයේ කොට්ටියාර් වරායෙන් යුද පිණිස පිටත්වූවාය. කාගේත් සිත් සතුටු කරන ප්‍රධාන නැව් හය සහ ඒවායේ කප්පිත්තන්ගේ නම් මෙසේ ය. පළමු වැනිවූ 'මහනුවර' නමැති නැවේ කපිතන් තැන සංදරප්පුය. දෙවැනිවූ 'ඕලන්ද' නමැති නැවේ කපිතන් තැන කිස්තෙනාය. තෙවැනිවූ 'මීගමුව' නමැති නැවේ කපිතන් තැන ඕංගප්පේය. සතර වැනිවූ 'සම්පත' නමැති නැවේ කපිතන් තැන ඕර්දියා ය. පස් වැනිවූ 'වාසනාව' නමැති නැවේ කපිතන් තැන මාරසිංහය. ස වැනිවූ 'විශ්වාසය' නමැති නැවේ කපිතන් තැන සංදප්පුය. මේ නැව් හමුදාව මීගමුවට උතුරින් හලාවත සමීපයේදී ද, මන්නාරමේදී ද පෘතුගීසීන්ගේ ලොකු කුඩා නැව් කීපයක් අල්ලාගෙන 'ලිවර්ස්' හය ලක්ෂයක කොල්ලය ඇතිව ආපසු ත්‍රිකුණාමලය කරා ආවාය. අතර මගදී තවත් පෘතුගීසි නැව් කීපයක් ද, ඔමර්ස්හි සිට එන්නාවූ ධනයෙන් පිරි මුස්ලිම් නැවක් ද අල්ලා ගත්හ. ආඥාවේ ප්‍රකාරයට ඒ නැව්වල සිටි

පෘතුගීසීන් මුහුදට විසිකර ඔවුන්ගේ සත්‍රීන් ද, කාපේරීන් ද නොමරා ගෙනාහ. රජ විසින් අණ කරූ එව් පරිදි ලබා ගන්නා ලද කොල්ලය නැව්වල මූලාදෑනීන් හා සේවකයන් අතරේ බෙදා ගත්හ.

## බිසොව දරුවන් භාර දීම

ක්‍රිස්තු වර්ෂ 1613 හි ජූලි මාසයේදී දෝන කතරිනා බිසොව උණ රෝගයක් වැලඳ මරණාසන්න තත්වයකට පත්වූවාය. මේ අවස්ථාවේදී එතුමිය විසින් ඌවේ කුමාරයා හා මීගමුවේ කුමාරයා කැඳවා මහ රජ තුමාගේ අනුමතිය ද ඇතිව දරුවන්ගේ පාලනය ඔවුන් දෙදෙනාට භාර කරන ලදී. මෙතුමියගේ අවසාන කාල පරිච්ඡේදය තුළ වැඩි වශයෙන් ආශ්‍රය කෙළේ ඌවේ කුමරුය. අන්‍යයන් හා කථාවක් වත් කළේ නම් එද කලාතුරකිනි. ක්‍රිස්තියානි ධර්මානුකූලව පුහුණුවක් ලැබ සිටි මෙහෙසිය අවසාන කාලයේ ආගම අත් හැරීම පිළිබඳ පශ්චාත්තාපය ප්‍රකාශ කරන ලද්දේත් පෘතුගීසීන් විසින් ආගම අත්හරින ලද්දෙක් හැටියට ප්‍රකාශ කර තිබෙන මේ ඌවේ කුමාරයා සමගය. දෝන කතරිනා බිසවු තොමෝ "සවාමිවරුනි, සියලු පොරොන්දු හරිහැටි ඉෂ්ට කළ මැනවැ"යි සවකීය අවසාන වචනය ඌවේ කුමාරයාට හා මීගමුවේ කුමාරයාට භාර කොට අන්තිම ශුභාසංසනය කළාය.

## සම්මත රාජ ධාරකයෝ

දෝන කතරිනා බිසොවගේ මරණින් ටික කලකට පසු රජ තුමාද ජීවිතය බලාපොරොත්තු නැතිවන තරමේ අසාධ්‍ය රෝගයකින් පෙළෙන්නට විය. විමලධර්මසූර්‍ය රජ තුමාගේ මරණින් පසු ඔටුන්න පිළිබඳ සිදු වූ අරගලයන් මෙනෙහි කර අනාගතයේ එබන්දක් නොසිදුවන සේ කටයුතු කිරීම පිණිස සියලු රාජ කුමාරයන්ගේ ද මණ්ඩලික-යන්ගේ ද දිශාපතීන්ගේ ද රාජකීය සභාරැස්වීමක් පවත්වන ලදී. එහිදී රජ තුමෝ සභාව අමතා:-



"කුමාර සිංහස්ථාන නමැති ඔටුන්න හිමි කුමාරයා ළදරු වියේ සිටින හෙයින් රාජ්‍යය පිළිබඳ සියලු කාර්‍යයන්හි භාරකාර ධූරය ඉසිලීමටත් කුමාරයා රාජ්‍ය කටයුතු සඳහා පුහුණුකරවීමටත් ආරක්ෂා කරගැනීමටත් සුදුසු මේ වාගේ ශ්‍රේෂ්ඨ කාර්‍යයක් ඉෂ්ට කිරීමට හැකිවන විශ්වාස කටයුතු අය තෝරා ගැනීම නුඹලාට භාරකරමි" යි වදාළ සේක.

එක්-එක්කෙනා තම-තමාගේ කැමැත්ත ලියවිලිවලින් ප්‍රකාශ කළහ. මීගමුවේ කුමාරයාත්, ඌවේ කුමාරයාත් ඉතා සුදුස්සන් හැටියට ඒකච්ඡන්දයෙන් නිශ්චය විය. නමුත් කුමාරවරු දෙදෙනා "මේ භාරදූර කර්තව්‍යය පිණිස අපට වඩා සුදුසු අය තෝරාගත යුතුය" යි රජ තුමාට සැලකර සිටියෝය. ඉන්පසු රජ තුමා ඔටුන්න හිමි ළදරු කුමාරයා ළඟට කැඳවා "මේ සම්බන්ධයෙන් ඔබ කැමැති අය තෝරාගත යුතුය" යි කී හෙයින් කුමාරයා ද පෙරකී කුමාරයන් දෙදෙනා රජුට දක්වමින් ඔවුන්ගේ ආරක්ෂාව යටතේ සිටීමට සතුටු බව ප්‍රකාශ කෙළේ ය. රජ තුමාගේ අදහසත් මෙයම වූ බැවින් එතුමා ඊට බොහෝ සේ කැමැති විය.

පසු දින රජ කුමාරයාගෙන් හා මණ්ඩලිකයන්ගෙන් ද, දිශාපති ආදීන්ගෙන් ද යුක්තව රාජකීය මහා සභාව ඉදිරියේ රාජ්‍යය ආණ්ඩු කිරීමේ බලය කුමාරයන් දෙදෙනාට පැවරූ ශ්‍රී සන්නස කියවන ලදී. එහි සංක්ෂිප්ත සටහන මෙසේ ය.

## රාජකීය ශ්‍රී සන්නස

අසනීපකම නිසාත් ජීවිතයේ බලාපොරොත්තු නැතිකම නිසාත් අපගේ ඇවැමෙන් කටයුතු කිරීම පිණිස කුමාරයන් දෙදෙනකු පත් කරන ලද්දේ රාජ්‍යය සම්බන්ධ

කටයුතු පිණිස පමණක් ම නොව ඔටුන්න හිමි කුමාරයාගේ ළදරු කාලයේදී සම්පූර්ණ බලය ඇතිව රාජ්‍ය කටයුතු පාලනය කරන පිණිසයි. අපගේ රාජ්‍යයත්, පළාත්, ප්‍රදේශ යන මේවා අප පුත්‍රයන්ගේ බාල අවස්ථාව තුළ පාලනය කිරීමේ බලය මොවුන්ට පැවරේ. අපගේ අවසානයෙන් පසු, එක්-එක්කෙනා තම-තමන් සතු සියලු ආදායම් ගණන් සහිත ව මේ බලකාරයන් දෙදෙනාට දැක්විය යුතුවත් හැර, එසේ නොකරන යමෙක් ඇත්ද? ඔහු මරණීය දණ්ඩනයට යටත් වන බව දැනගත යුතු ඕනෑවූ විටක එක් අයෙකුදු අයානැර සියලුම බලවත්තයන්ට හා වංශවතුන්ට වාසලේ පෙනී සිටීමටත්, සියලු දෙයෙහිදී ඔවුන්ට යටත්වීමටත් ඔටුන්න හිමි කුමාරයා හා රාජ්‍යය පිළිබඳ බලකාරයන් දෙදෙනා ඉදිරියේ සාමාන්‍ය දිවුරුම ප්‍රකාශ කිරීමටත් බල කරනු ලැබේ.

සවර්ණමය අක්ෂරයෙන් ලියවුණු අපගේ මේ ශ්‍රී සන්නස මීගමුවේ කුමාරයාටත්, ඌවේ කුමාරයාටත් ප්‍රදානය කරනු ලැබේ. ක්‍රිමිනල්, සිවිල් නඩු විසඳීම් සම්බන්ධයෙන් ද මොවුන්ට බලය දුන් බව තව දුරටත් ප්‍රකාශ කරමු ඒ නිසා අපගේ ආඥාවත්, බලකිරීමත්, සියලු රජවරුන් ද, කුමාරයන් ද, ආදිපාදයන් ද, මණ්ඩලිකයන් ද, ආගමානු-කූල ප්‍රධානීන් ද, වංශාධිපතීන් ද, ආණ්ඩුකාරයන් ද, පළාත් පාලකයන් ද, නගරාධිපතීන් ද, කප්පිත්තන් ද, සභා නායකයන් ද, අනුශාසකයන් ද, නෞකාධිපතීන් ද, විනිශ්චයාධිපතින් හා අපගේ කාර්යයෙහි ව්‍යාප්ත අනුකාර්යාධිකාරීන් ද, ගොවීන් ද, ස්වදේශීන් ද, සේවායන්ද, නාගරිකයන් ද, අනෙකුත් සියලු දෙනා ද, පොදු වශයෙන් හා පෞද්ගලික වශයෙන් ඔටුන්න හිමි කුමාරයා නිසි වයසට පැමිණෙනතුරු පළමු කියන ලද බලකාර කුමාරයන් දෙදෙනා රාජ්‍ය පාලකයන් හැටියට එක හෙළා පිළිගෙන පක්ෂපාතිත්වය ප්‍රකාශ කරන සේ දිවුරා අපට ගෞරවය කරන්නාක් මෙන් ඔවුන්ටත් ගෞරව කරන ලෙස තරයේ ප්‍රකාශ කර සිටීමය යි වදාරන්නමෝහ.



ක්‍රිස්තු වර්ෂ 1613 නෙහි අගෝස්තු මස
19 වැනි දින දියතිලක මහ වාසලේදී ය.

කිරීටයට අයිතිවාසිකම් කියා සිටි වීදියබණ්ඩාර, මායාදුන්නේ යන දෙදෙනාට තමා ඉදිරියේ පෙනී සිටින ලෙස කතරිනා බිසොව නියම කළා ය. ඔවුන් මාළිගයට පැමිණි විට කිසිවකු විසින් වීදියබණ්ඩාර මරණ ලදී. මායාදුන්නේ පලා ගියේය. සෙනරත් කතරිනා බිසොව පාවාගෙන රජ විය. අන්තෝනියෝ බරෙත්තු ඌවේ රජ විය.

(මහා වංශය 682 පිට)

රාජකීය සන්නසේ හැටියට වැඩ භාරගත් කුමාරයන් දෙදෙනා රජ පවුලේ කුමාරයන්ගේ ආරක්ෂාව සලසනු පිණිස භේවායන් සහිතවූ ඔවුන් කුකුළු කෝරළයට පිටත් කළෝය. රට නැවතත් කලකෝලාහල ඇතිවී වියවුල් වීමට පටන්ගත්තේ ය. ක්‍රිස්තු වර්ෂ 1615 දී බොස්කොවර් නමැති මීගමුවේ කුමාරයා යුරෝපයට ගියේ ආපසු එන අතර මිය ගියේය. සෙනරත් රජුගේ අසනීපය ද සුව විය.

ක්‍රිස්තු වර්ෂ 1617 තේ සෙනරත් රජ තුමා පෘතුගීසීන්ගේ යටත් රජකු ලෙස ගිවිසුමක් ඇතිකරගත් හෙයින් පෘතුගීසීන්ට යටත් නැති පෙදෙස්වල සිංහලයෝ මේ වහල් ගිවිසුම ගැන රජු කෙරෙහි කලකිරී බලවත් කැරැල්ලක් ඇරඹූහ කැරලිකාරයෝ රජ මාලිගාව වනසා අළුත් කුරු කෝරළේ කාන්ගර ආරච්චි ද, රාජ්‍යයට අයිතිවාසිකම් කියමින් සිටි නිකපිටියේ නමැත්තා ද, වන්නි ප්‍රධානීන් ද එක්කොට පෘතුගීසීන්ට විරුද්ධ ව එක්සත් ව නැගිට එවකට ඉන්දියාවේ සිටි මායාදුන්නේ නමැති කුමාරයාට උඩරට රාජ්‍යයත්, ලංකාවේ අධිරාජ තනතුරත් දෙන බව සඳහන් ගිවිසුම් පත් යවා ලංකාවට ගෙන්වා ගත්තේ ය. මේ සියලුම භේවායෝ නැගෙනහිර පළාත තමන් යටතට ගෙන මහත්වූ සේනාවක් ඇතිව දෙනවකාට පැමිණ මායාදුන්නේ කුමරු

අභිෂේක කිරීමට සූදානම් වූවෝය. මේ අතර කොන්ස්-තන්තීනු ද සා නමැති පෘතුගීසි ප්‍රධානියාට සබරගමුවේ කටයුතු කිරීමට ඉඩකඩ ලැබෙන බව දුටු අන්තෝනියෝ බරෙත්තු ඌවේ කුමාරයා ප්‍රමුඛ මුළු සේනාව දෙනවක හැර වහ-වහා පෘතුගීසීන් අවහිර කිරීමට යාමෙන් දෙ සෙනඟ අතර මහත් සටනක් ඇති විය.

එවකට රෝමානු කතෝලික ආගම වැලඳගෙන ක්‍රිස්තු භක්තිකයෙක් ව පෘතුගීසීන්ගේ පන්දම් කවියෙක් ව සිටියාවූ අලගියවන්න මුකවැටි තුමා අන්තෝනි බරෙත්තු හෙලා දක්වමින් කුස්තන්තීනු හටනෙහි මෙසේ ලියයි

කපටත් අසත් ගුණ සත් යුතු වූ නොම දේ
ඇසුවොත් බරෙත්තු පැවසු තෙපුල් හැම ස දේ
සෙනරත් නිරිඳු හට වූ සඳිය නිවර දේ
ඔබටත් නොබෝ කලකින් හිමි සඳිනි යෙ දේ

මහත් ඉසුරු දුන් සෙනරත් නරනිඳු ට
පැවැත් තරඟ දූන-දූන ඒ සිහි නොකො ට
බරෙත් තු නම් ගුණ මඳ දූදනා බස ට
ඇවිත් මෙ දුක විය හිමි සඳිනි, මෙ නුඹ ට

## සතුරන්ගේ ජය

පෘතුගීසි පාක්ෂිකයෝ අන්තෝනි බරෙත්තුගේ සේනාව විනාශ කළහ. කුරුවිට රාළගේ හා මායාදුන්නේ රජුගේ මාලිගා ඇතුළු විශාල ප්‍රාසාදයනුත් විනාශ කළ අයුරු කුස්තන්තීනු හටනෙහි මෙසේ දැක්වේ.

"සදා යහන් තුළ නිස ගේ
නිදා පියන රජු සිත ගේ
උදා රවූ සැතපෙන ගේ
දදා වැටිණි ලෙස ගිනි ගේ



වි සි ත් වියන් වටතිර ඇ ද
දි මූ ත් එ සුර විමනක් ලෙ ද
බ රෙ ත් තු මැතිඳුගෙ විමන ද
පොරෙත් තුවම ගිනිලූ සෙ ද"

මායාදුන්නේ රජු හා අන්තෝනි බරෙත්තු සතුරන්ට අසු නොවී පලා ගියහ. පෘතුගීසීහු අන්තෝනි බරෙත්තුගේ හිස ගෙනවුත් දුන්නෙකුට දහස් ගණනක් තෑගි දෙන බැව් පළ කළහ

පෘතුගීසීහු එක් ගමක් විනාශ කළහ. අන්තෝනි බරෙත්තු ඒ ගමේ රෝගාතුරව වෙසෙන බැව් නොදත් පෘතුගීසි භේවායෝ ගම විනාශ කරද්දී ලෙඩ ඇඳේ උන් බරෙත්තු මැති හමු විය. තමා බලවත් ලෙස ගිලන්ව උන් බැවින් සතුරන්ට මූණ දීමට එතුමා අපොහොසත් විය. සතුරෝ එතුමා ද පවුලේ අනෙක් උදවිය ද මරුමුවට පත් කළහ.

ඝාතනයෙන් පසු බරෙත්තු තුමාගේ මෘත ශරීරය ඔවුන්ට දක්නට ලැබිණි. "මාතෘ භූමිය ගලවා ගැනීමට උපන් වීර මනුෂ්‍යයා අප අතින් නැසුණේ ය" කියා කළ හැකි පිළියමක් නොදත් ඔවුහු මේ වීරයාගේ හිස ගෙන ගොස් දී ත්‍යාගය ලබා ගත යුතුයයි අදහස් කළහ පෘතුගීසි භේවායෝ එතුමාගේ හිස ද සා පෘතුගීසි ආණ්ඩුකාරයාට දක්වා "රජු වෙනුවෙන් බොහෝ භයානක සටන් කොට මෙය ගෙන ආවෙමු" යි ප්‍රකාශ කළහ

කුස්තන්තීනු ද සා ආණ්ඩුකාර තැන මේ මරණයෙන් ඔවුන්ට සැලසුණු වාසනාව ගැන සතුටු වූ නමුත් මරණය සිදුකර තිබෙන පිළිවෙළ උසස් ක්‍රියාවක් හැටියට ගණන් නොගත්තේ ය එහෙත් ඔහු අමරණීය වීරයකු හැටියට කල්පනා කළ බරෙත්තු මැතිගේ මරණය මහත් ජයක් හැටියට කල්පනා කෙළේ ය. එකල ලාංකිකයෝ මේ

වීරයාගේ බලයට කොතරම් වශීකෘතව සිටියෝද යි කියතොත් උඩ පාත දෙරට අය ජනරල් තුමා විසින් නුවරට යවන ලද ඔහුගේ හිස දකිනතුරු ඔහු මළ බව විශ්වාස නොකළහ. දුටු පසුවත් එය මහත් පුදුමයක් හැටියට සැලකූහ.

මාතෘ භූමියේ නිදහස උදෙසා මෙතරම් නිර්භීතව යුද්ධ කළ (අන්තෝනි බරෙත්තු වැනි) වීරවරයන් දීර්ඝවූ ලංකා ඉතිහාසයේ ඇත්තේ ඉතා ටික දෙනෙකි. 'මේ වීරවරයා මායාදුන්නේගේ අභිවෘද්ධිය නොසලකා (පෘතුගීසීන්ටත් ඔවුන්ට පක්ෂපාත සිංහලයන්ටත්) කෲර ආඥාදායකයකු සේ ක්‍රියා නොකොට සිටියේ නම් සිංහලයන්ගේ අභිමතය පරිදි ස්වදේශික කුමාරයෙක් ඔවුන්ට ලබාගන්නට තිබිණැ' යි ක්විරෝස් පියතුමා කියයි.

විදේශිකයන්ගෙන් ස්වදේශය ගලවා ගැනීම සඳහා අවුරුදු 17 ක් භයානක යුද්ධයන්හි යෙදී සිටි මේ බලසම්පන්න සේනාධිනායකයාගේ ජීවිතය ක්‍රි. ව. 1620 දී අවසාන විය. ඉතිහාස විශාරද එස්. ජී. පෙරේරා පියතුමෝ 'මොහු මීගමුවේ කෙනෙකැ' යි කියති.

(කුරුවිට රාළ හෙවත් ඌවේ රජ තුමා නමැති පොතෙන් උපුටා ගන්නා ලදී.)

"මෙහිදී (අට්ටාපිටියේදී) අන්තෝනි බරෙත්තු කෙරෙහි පෘතුගීසීන් අතර භයක් ඇතිවිය. ..... "ප්‍රධාන වශයෙන් ධෛර්‍ය සහ නිර්භීත භාවයෙන් ද අගපත්වූ මෙතෙම පේදුරු බරෙත්තුගේ සහ සමරකෝන් රාළගේ සමහර හේවායින්ගේ ද සහාය ඇතුව රජුගේ යුද්ධ බල ඇණියේ ගමන වළක්වන ලද්දේය." ........

"කෝට්ටේ ධර්මපාල රජුගේ යුද්ධ හමුදාවේ මහා සේනාධිපති සමරකෝන් රාළ යටතේ සුළු යුද්ධ නිලධාරියකුව සිටි අන්තෝනි බරෙත්තු පසුව සිංහල රජුගේ පක්ෂය ගෙන පුදුම අන්දමේ රණසූරයෙක් විය."



"යුද්ධ කිරීමේ දක්ෂ පක්ෂ භාවය කරණ කොට ගෙන හෙතෙම ඌවේ කුමාරයා වශයෙන් පත්වීමට ද හේතු සම්පන්නවූ... ...මොහු වනාහි කරාවේ පුත්‍රයෙකි." ........

"එවකට ඔත්පලව සිටි සෙනරත් රජුගේ ප්‍රධානත්වයෙන් සිංහල නිලම වරුන්ගෙන් යුත් මහා සභාවක් මගින් ඌවේ[1] කුමාරයා දියතිලක නුවරට කැඳවා හෙතෙම සහ මීගමුවේ රාළත් (බොස්කාවර්) ලා බාල කුමාරසිංහ කුමරුගේ භාරකාරයින් වශයෙන් ද, සෙනරත් රජු අපවත් වෙන්ට යෙදුනහොත් ඔවුහු උඩ රට රාජධානිය ආණ්ඩු කිරීමටත් (ක්‍රි. ව. 1613) අගෝස්තු මස 18 වැනි දින පත් කර ගන්නා ලදී." .... (සිංහලයෝ වූ කලී සූර්‍ය වංශයට අයත් කෙනෙකු විනා අන්‍යයකු රජුබවට නොපතන්නෝ ය)

(ආචාර්‍ය පෝල් ඊ පීරිස් තුමාගේ පෘතුගීසි ඉතිහාසය.)

"රාජ ද්‍රෝහි නම් සිතිනුත් නොසිතිය යුත්තේ ය. අරාජක ද නො විසිය යුත්තේ යැ. එහෙයින් මහා රාජ තැන්පත්ව සිටියවුන් හෝ උනුදු නැතහොත් රාජ කුමාරවරුන් හෝ උනුදු නැතහොත් බිසෝ වරු හෝ රාජ්‍යයට තැබිය යුත්තේ යැ."

(කීර්ති නිශ්ශංකමල්ල - පොළොන්නරු ශිලා ලිපිය.)

ඉහත සඳහන් ශිලා ලිපියේ අන්දමට ලක්දිව, රජ, යුව රජ තනතුරුවලට රාජ වංශිකයන්ම පත් විය යුතු බව ද, එය නොබිඳී පැවත ආ ආඥාවක් බව ද එහෙයින් ඉහත සඳහන් පුවතේ පැහැදිලි වන අන්තෝනි බරෙත්තු (ඌවේ කුමාරයා) රාජ වංශිකයකු වශයෙන් සෙනරත් රජු සහ සිංහල නිලම වරු ද, මහජනයා ද මහ රජුගේ අභාවයෙන් රජයට සුදුස්සා කොට තැබී ය.

---

1. අලුතැ වත් කුස්තන්-තීනු ද සා නොරොඤ්ඤෙ
   සෙන්පතී තෙමේ මඩනට පෙරළියත් වහා
   බරෙත්තුවා විටැ-විටැ දුන් පහර සහා
   බැසැ තැළෙන එතෙරට-පෙරැදින පැලැ ගොස් සිටී
   (සිංහල වංශය-රා-තෙන්නකෝන්)

දොන කතිරිනා බිසොවගේ මරණය හේතු කොට ගෙන බරපතල ලෙස ගිලන්ව සිටි සෙනරත් රජු ඌවේ කුමාරයා හා මීගමුවේ රාළත් තම ලා බාල පුත්‍රයින්ගේ සහ අපවත් වූ රජුගේ (විමලධර්මසූරිය) දූ කුමරියගේ ද භාරකාරයන් වශයෙන් පත්කරගන්නා ලද්දේ ය.

(පර්සිවෙල්ගේ ලංකා ඉතිහාසය)

"දේශක්කාර කාරවංත කුල උත්තුංග ඌවේ යුව රජ උඩුමාලේ අසථානය විජයපාල අසථානය මාලිගාතැන්නේ පහළ වලව්වේ වැඩ සිටියාහ"

මීගමුවේ මුදියානා මල්වත්තේ අළුත් වලව්වේ පොරොත්තු වෙන්ඩ යෙදී කළු හමුදාවට කටුගහලන්දේ මඩු කුඩම් තනවා කාවල් තබන්ඩ වරම් ලැබුනා ය රටේ මිනිස්සු වාදයෙන් වෛර බැඳලා ලංකාධි හේරත් රාළට පස්සවෙමින් කරපු ගේවාකමට කරුමෙ අත්පිට පල දුන්නා ය හේරත් රාළ ඌල තියලා මරවන්ඩ යෙදිච්ච කාරණාවට රට සමූත්තු උනා ය. බිබිලේ ගම පෘතුකානෝ අටු කොටු තනව තනවා රට ගම කොල්ලෙට යටත්වෙලා තිබෙන අවසථාවට මහ අමාරුවෙන් සතුරු සෙනග වැනසුණාහ

(ඇස්. පී. බී. මුතුබණ්ඩාර මහතාගේ ලිපිය-දිනමිණ 18-2-37)

## වන්නි ආණ්ඩුකාරයෝ

"හලාවත දිසත්‍රික්කේ කඩුපිටි මාදම්පේ කුරු කුලත්

1. අරශන් සූරිය වන්නි උන්නැහේ
2. මුත්තම් වන්නි උන්නැහේ
3. අයියන් පුල්ලේ වන්නි උන්නැහේ
4. පාලන් වන්නි උන්නැහේ
5. කුමාරප්පෙරුමාල් වන්නි උන්නැහේ

මොවුහු මුන්නේශ්වරම් දේවාලයෙන් පළමුවෙනි කම් පවත්වා ගෙන මීගමු තෝප්පුවේ පටන් කුදිරමලේ කන්ද දක්වා කලින්--කල වන්නිකම් කර තිබේ. මොවුන්ගෙන් පැවැත් එන බොහෝ දෙන කඩුපිටි මාදම්පේ වන්නි වරු යන නාමයෙන් නුවර කලාවියේ, මහ පොතාන කෝරළේ, රඹ පොතාන, කෝන් වැව ආදී පළාත්වල වෙසෙති. ඔවුන් මීගමු මහ වීදියේ කෞරව වංශිකයෝ ය.

(වන්‍නිකුල මාලාව 4. 5. පිටු)

## කුරු කුල ප්‍රභූ කුමාරයා

"දෙවෙනි රාජසිංහ රජු ලන්දේසීන්ට විරුඩව ඇරඹූ සටන්වලදී 'කොකිල්' පළාතේ පව්ටන් කව්ටි තැන ද, (පට බැන්ද නොහොත් කරාවේ ආණ්ඩුකාරයා) රජු වෙනුවෙන් ඉදිරියට ගොස් යුද්ධ කටයුතු සංවිධාන කෙළේ ය (මෙම කුල වනානයෝ ඔවුන් පදිංචි ප්‍රදේශය ඔවුන් ම ආණ්ඩු කර-ගනු ලැබුවෝ ය.)

"ඔවුන් හට ඔවුන්ගේ ම, ගොතිරේ අදිකාරම් වරු සහ මුදලිවරුනුත් ඇතිව සිටියෝ ය.

(ආචාර්‍ය පෝල් ඊ. පීරිස් මැතිඳුගේ පෘතුගීසි ඉතිහාසය.)

(කුරු කුල චරිතය පළමු වැනි කොටස 189 පිට)

## යාපනේ කුරු කුලය

උත්තර ඉන්දියා කුරු රටින් දකුණු ඉන්දියා ප්‍රදේශ-යන්ට සංක්‍රමණය වූ කුරු වංශිකයෝ එහි නානා ප්‍රදේශයන් සවකීය වාස භූමි කරගත්හ. මෙසේ දක්ෂිණ ඉන්දියාව වාස භූමි කොට ගත් කුරු වංශිකයෝ (කෞරව ක්‍ෂත්‍රියයෝ) ක්‍රම ක්‍රමයෙන් ඔවුන්ගේ මවු බස අත්හැර ද්‍රවිඩ භාෂාව භාවිත-යටත්, ද්‍රවිඩ නාමයන්ගෙන් පෙනී සිටීමටත් පටන්ගත්හ.

කල් යාමෙන් ඔවුහු ලංකාවටත් සංක්‍රමණය වූහ. එසේ පැමිණ ලක්දිව පැල-පදිංචි වූ මේ කෞරවයෝ සිංහල නම් පාවිච්චි කිරීමටත් සිංහල භාෂාව කථා කරන්නටත් පටන් ගත්හ. එහෙත් මීගමුව, හලාවත, මාරාවිල ආදී පළාත්වල පදිංචි වූවෝ දෙමළ භාෂාව ම කථා කරති.

මන්නාරම, යාපනය ආදී පළාත්වල පදිංචිවූ කෞරව වංශිකයෝ ද්‍රවිඩ භාෂාව හා ද්‍රවිඩ නම් ගොත්ම පුරුදු පරිදිම පාවිච්චි කරති. තමන්කඩුව පළාතේ කෞරවයන් පිළිබඳව ද කිව හැක්කේ මෙයම ය.

## සපුමල් කුමරු

ජයවර්ධන පුර සවැනි පරාක්‍රමබාහු රජු දවස යාපනය යටත් කර ගැනීම පිණිස (සපුමල් කුමාරයාගේ) සෙම්බග පෙරුමාල්ගේ මෙහෙයීම පිට යුද්ධ හමුදුවත් රාශියක් යාපනයට යවා එරට සිංහල රජුන් විසින් යටත් කොට ගෙන (සපුමල් කුමාර තෙම) සෙම්බග පෙරුමාල් එහි යුව රජ පදවියට පත් කෙළේ ය

මේ කාලයේ කුරු කුල යුද්ධ හමුදාවෝ යාපනේ රජුගේ පක්ෂයට ද, සෙම්බග පෙරුමාල් (සපුමල් කුමරුගේ) පක්ෂයට ද එක්වී සටන් කළහ[1].

ඈත අතීතයේ පටන් ම යාපනේ රජ වරු කුරු කුලාතර්වරු, වරුණ කුලාතර් නමැති ප්‍රධානීන් යටතේ ඔවුන්ගේ යුද්ධ හමුදාව තැබ්බවූ බව යාපනේ ඉතිහාසවල සඳහන් වේ.

සවැනි පැරකුම්බා රජු දවස කෞරව යුද්ධකාර සේනාව යාපනයට (නාග පට්ටනමට) ඇතුල් ව යාපනය ජයගත් බැව් මෙහි විස්තර කොට ඇත්තේ ය.

"නැවත නාග පට්ටනමට (යාපන) යුද්ධයට ගිය හ ඉන් හතළිස් දහසක් හේවාකම් කරන වේලාවට මාණික්ක තලවෙත් කියන නිලමක්කාර උන්නැහේ හේවාකමින් වැටුනා ය."

1 තිළ තුරඟුට නැඟෙමින් රිවි දෙවි සිරි ත<br>
දුළ කර සේසත් මිණි බරණ කිරණී ත<br>
බළ පිරිසෙන් සහ යාපා පටුන් ගෙ ත<br>
බළ සේනානායක සපු කුමරු එ ත<br>
(සැළලිහිණි සංදේශය)



"එයින් දෙමස් දෙපෝයක් හේවාකම් කරමින් නාග පට්ටනම ඇල්ලුවා ය. මෙයින් දෙදස් අට සියයක් (කරාවේ යුද්ධකාර) සේනාව වැටුනා ය. නැවතත් මේ කොටු දෙකේ තිබුණු රතු කොඩි දෙකත් මේ කොටු දෙකේ නිලමක්කාරයින් දෙදෙනාගේ තරම් (හිස්) දෙකත් දක්වාපු තැනේදී (සවැනි පැරකුම් රජු) බොහෝ සේ සතුටු-සන්තෝස වී, වදාරමින් ගම්වර ලැබීමට උතුම් මහ වාසලින් දෙවා වදාළ පණතයි.

(වෛද්‍යාචාර්ය ඇන්ඩ්‍රීයස් නෑල් මහතා විසින් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් පිටපත් කළ ලිපිය සිළුමිණ 1. 11. 36)

මාණික්‍ය තලයි වේන්දර් (මැණික් ඔටුණු කුමාරයා) හෙවත් මාණික්ක තලවෙන්ද නමැති මෙම කුරු කුල (කරාවේ) කුමාරයා ද ඔහුගේ යුද්ධ හමුදාව ද යාපනේ රජු හා යුද්ධයට ගොස් යාපනය ජයගත් බැව් මෙයින් මනා සේ අවබෝධ වේ. එහෙත් යාපනය දිනා උතුරු පළාතම සවැනි පැරකුම්බා රජුට යටත් කර දීමේ ගෞරවය සිංහල ඉතිහාස කරුවන් විසින් තනිකරම කෞරව සේනාධිනායක සෙම්බග පෙරුමාල් ට (සපුමල් කුමාරයාට) පිරිනමා ඇත. ඊට හේතුව මාණික්ක තලවෙන්ද නමැති කෞරව සේනාපති තැන යුද්ධයෙන් ජයග්‍රහණය කළ නමුත් සටන නිම වන්නට මත්තෙන් මිය යාමයයි ඉතිහාසඥයෝ ප්‍රකාශ කරති.

## රණ සූර මාණික්ක තලවෙත්

"වැදි අරශත් සේනාපති තැන හා ඔහුගේ මුක්කර සේනාවත් මෙහි ශස්ත්‍රදුවී වැඩි කලක් යන්ට ප්‍රථම මෙම ප්‍රදේශයේ දක්ෂිණ භාගයේ විසූ ගම් ප්‍රධානියෙක් වන මාණික්ක තලෙවෙත් නමැති කරාවේ නායකයකු හා සටන් කිරීමට සිදු විය."

"කෞරව නමැති මිනිසුන් වර්ගයක් අපට විරුද්ධ ව සටනට පැමිණියේ යයි මුක්කරුන් විසින් කියන ලද්දේ ය."

"මුක්කර යුද්ධ හමුදාව පරාජය කොට පුත්තලම පරාක්‍රමබාහු රජහට අල්ලා දුන්නේය. එහෙත් ක්‍රි: ව: 1545 පමණේදී සිංහල රජුගේ අවසරය ඇතිව මුක්කර වර්ගයා ඒ අසල ප්‍රදේශයෙහි පදිංචි විය.

(කාශි චෙට්ටි ගැසටයාර් 281 වෙනි පිටුව)

සංග්‍රාමයන්ගෙන් ජය ගෙන දුන් කෞරව ප්‍රධානීන්ට මීගමු වීදි සියල්ලම නින්දගම් වශයෙන් පවරා දෙන ලද්දේ ය. රාවණා කොඩිය, ඉරහඳ කොඩිය හා මකර කොඩියත් ඔවුන්ට නම්බු පිණිස ප්‍රදානය කරන ලදී.

(ඇf්. ඊ. ගුණරත්න තෝම්බුවේ මුදලිතුමන් විසින් ඉන්ඩිපැන්ඩන්ට් පත්‍රයෙහි පළ කළ ලිපියක කොටසකි.)

## හත් වැනි විජයබාහු රජ දවස

ඒ විජයබාහු රජුගේ ප්‍රියංකර වූ පුණ්‍ය ලක්ෂණයෙන් ලක්ෂිත වූ රයිගම්බණ්ඩාරය, පරරාජසිංහය, බුවනෙකබාහුය, මායාදුන්නේය යන නම් ඇති පුත්‍ර කුමාරයෝ සතර දෙනෙක් වූහ. ඔවුන් අතුරෙන් ඒ වැඩි මහලු කුමාර තෙමේ කුඩා කාලයෙහි ම මැරුණේ ය. අනෙක් කුමාරවරු තිදෙනා නිතර යසසින යුක්තව වැඩුනාහු ය. ඒ කුමාරවරුන්ගේ මවු බිසොව මළ කල්හි විජයබාහු රජ තෙමේ අනෙක් බිසොවක් පාවා ගත්තේ ය. ඕ තොමෝ රජ කුමරුවන් මැරවීම පිණිස කුමන්ත්‍රණය කළා ය. ඒ රාජ කුමාරවරු එය දැන භික්ෂූන් සමඟ ද මන්ත්‍රණය කොට සවකීය ජීවිතාරක්ෂාව සඳහා ඒ ඒ තන්හි සැඟවූනාහ

(මහා වංශය)

සත් වැනි විජයබාහු රජ තෙම තම දෙ වැනි බිසොවගේ කුමන්ත්‍රණවලට රැවටී කාලයාත්‍රා කළ බිසොවගේ පුත්‍රයින් තිදෙන මැරවීමට චරපුරුෂයන් යෙදවී ය. කෝට්ටේ වැඩ විසූ සිල්වත් භික්ෂූන් සමූහයක් මෙ කුමරුන් තිදෙන බොහෝ කාලයක් මුළුල්ලේ ආරක්ෂා කළ නමුත් බලගතු ඔත්තුකාරයින් කරණ කොට ශෙන කුමාරයින්ගේ ජීවිත අවදානම් තත්ත්වයකට මූණ පෑවේ ය.



තම පුත් දේව රාජ කුමාරයාට සවාමි රාජයාගේ ඇවැමෙන් ලක් රජය උරුම කිරීමේ දුෂ්ට චේතනාවෙන් යුක්ත වූ දෙ වැනි බිසොව කඳුරේ බණ්ඩාර හා ඒකනායක මුදියන්සේත් යන නිලම් වරුන් දෙ දෙන කුමරුවන් මැරවීමේ කුමන්ත්‍රණයට සහභාගි කර ගත්තා ය. එහෙයින් කුමරුවන් තිදෙන කෝට්ටේ නතර කිරීම නුවණට හුරු නැති බැව් වැටහී ගිය භික්ෂූන් වහන්සේ යාපනයට ගොස් එහි රජුගේ රැකවරණයෙහි සිටින ලෙස අවවාද කළහ.

ඉතා රහසිගතව යාපනයට පැමිණුණු මේ කුමාරයින් තිදෙනාට යාපනයේ රජ තුමා හමුවන තුරු රැකවරණය ලැබුනේ මීගමුවේ සිට යාත්‍රා කළ මහ සුළුප්පුවේ ප්‍රධාන බොරලැස්සේ මාලිම පටබැන්දාගෙනි.

කුමරුවන් සාදරයෙන් පිළිගත් යාපනේ රජ ඔවුන් තම මාලිගාවේ මාස ගණනක් ප්‍රවේසම් සහිතව තබා ගත උන්නේ ය. එහෙත් කෝට්ටේ සිට චරපුරුෂයන් එහි ළඟා වී ඇති බැව් රජුහට දැනගන්නට ලැබිණි. එහෙයින් එවකට බොහෝ බල පරාක්‍රමයෙන් විසූ යාපනේ "මහ පටබැඳි නිලමේ" තුමාට සිංහල කුමාරයන් තිදෙන භාර දුන්නේ ය. එතුමා බොහෝ ප්‍රවේසමෙන් කුමරුවන් රැකබලා ගත්තේ ය. යාපනේ පටබැන්දාගේ වලව්වේ සවකීය ප්‍රාණාරක්ෂාවේ යෙදී උන් කුමරුවෝ කලකට පසු යාත්‍රාවකින් මීගමුවට පැමිණ කෝට්ටේ සිටි පිය රජු මරා වැඩි මහල් කුමරු රජ වූයේ ය.

(රාජාවලිය ආශ්‍රයෙනි)

## දෙන් මැනුවෙල් දියෙස් අන්දරාදි මහ අදිකාරම

වරුණ කුල ආදිත්‍ය අරශ කුල ඉට්ටන් දෙන් මැනුවෙල් දියෙස් මුදලිඳු වනාහි කෞරව (කරාවේ) වංශිකයෙකි. මෙතුමා පළමුවෙන් කෝට්ටේ දෙන් ජුවන් ධර්මපාල රජුගේ සහ පරංගි යුද හමුදාවලත් දක්ෂ-පක්ෂ නිර්භීත සේනාපතියකු වී සිට ධර්මපාල රජුගෙන් පහත රට මුදලි තනතුරක් ද ලබාගත් ප්‍රභූවරයෙකි.

කල් යත්, යත් මෙ තුමා පෘතුගීසීන්ට සේවය කිරීම බලවත් අකටයුත්තකැයි සිතා මහනුවරට ගොස් දොන් ජෝන් විමලධර්මසූර්‍ය්‍ය රජුට හා දොන කතරිනා මහ බිසවට ද ළැදිව සිංහල යුද්ධ හමුදාවට බැඳී අතීතව සටන් කෙළේ ය. මෙයින් පැහැදුණු රජ තුමා උඩ රට රාජධානියේ මහ අදිකාරම් ධුරයකට ද මැනුවෙල් දියෙස් පත් කොට ගත්තේ ය.

එක් වරක් පෘතුගීසීන් විසින් මෙහෙයවන ලද චර පුරුෂයන්ගෙන් රජ තුමා ගලවාගත්තේ මෙතුමා ය. තවද උඩරට රාජධානියට විරුද්ධ ව පෘතුගීසි පක්ෂයෙන් ගොතන ලද රහස් උගුල් කීපයක් කල් තබා රජ තුමාට අනාවරණය කිරීමෙන් රටත් රජුත් බේරාගත්තේ ය.

මෙ තුමා පෘතුගීසි කාරයෙකැයි ආචාර්‍ය්‍ය පෝල් ඊ. පීරිස් මැතිඳුගේ 'පුර්තුගීස් ඊරා' නමැති පොතේ ද, යගිරල ප්‍රඥානන්ද නාහිමියන්ගේ මහා වංශය තුන් වැනි කොටසෙහි හා ගෞරවණීය එස්. ජී. පෙරේරා පියතුමන්ගේ ලංකා ඉතිහාසයෙහි ද දැක්වේ. එහෙත් ලක්මිණිපහන් කතු ඇම්. ධර්මරත්න පඬිතුමාගේ 'ගහපති විභාගය' වැලිගම ශ්‍රී සුමංගල 'ඉතිහාස වර්ණනාව' ගාල්ලේ ඇෆ්. ඊ. ගුණරත්න තෝම්බුවේ මුදලිතුමාගේ 'ලන්දේසි කාලය' (ඩච් ටයිම්ස්) නමැති පොත, පෝලත්ත දේශ නානාපති මහතාගේ 'ලක්දිව ප්‍රභූවරු' යන ඉතිහාස පොත, දඹුගම ජෝර්ජ් පෙරේරා වර්ණකුලසූරිය සෙනෙවිරත්න නොතාරිස් රාළහාමිගේ 'ක්ෂත්‍රිය වංශය' යනාදි ඉතිහාස හා චරිත කථා පොත්පත්වල යථොක්ත මහ අධිකාරම වනාහි කෞරව (කරාවේ) වංසයට අයත් සිංහලයෙකු වශයෙන් දැක්වේ. දිනමිණ පත්‍රයේ කර්තෘ ධුරය දැරූ සත් දත් ඇලෙක්සැන්ඩර් වැලිවිට මහතා 1939. 2. 10 දිනමිණ පත්‍රය මගින් පළ කළ ලිපියෙහි ද මැනුවෙල් දියෙස් මහ අදිකාරම් තුමා සිංහලයෙකැයි ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කොට තිබේ. මෙ තුමාගේ වාසගමෙහි වූ 'වරුණකුල ආදිත්‍ය අරශනිල ඉට්ටන්' ආදී වචන මාලාව පෘතුගීසි කාරයෙකුට කෙසේ නම් යෙදේ ද? මෙ තුමා සිංහලයකු බවත්, කරාවේ උතුමකු බවත් මේ වාසගමින් සක්සුදක් සේ පෙනේ.



# පට්ටන්කට්ටි යන ගරු නම

කරාව, (කුරු කුලය, පෞරව) යනාදි වංශිකයන් විසින් ගරු උප නාම පදයක් වශයෙන් භාවිතා කරනු ලබන 'පට්ටන්කට්ටි' හෙවත් 'පටබැන්ද' යන නාමය ලැබුවන් අතුරින් සයිමන් කොරයා පට්ටන්කට්ටි හෙවත් නයිදෙ අප්පු මුදියන්සේ එක් අයෙකි.

"දොන් ජුවන් ධර්මපාල රජුගේ අන්තිම කැමැති පත්‍රය පිළිබඳ ව කරාව කුලය වෙනුවෙන් පෙණීසිටියේ පට්ටන් කට්ටි තෝමෙ රුද්රිගුස් නමැත්තෙකි.

(පුර්තුගීස් ඊරා, ආචාර්‍ය්‍ය පෝල් ඊ. පීරිස් 1 කාණ්ඩය)

# පුරන්අප්පු රජ්ජුරුවෝ



කරාවේ වංශයට අයත් මොරවූ පුත්‍රයෙක් වූ කුරුඋතුම්පාල වීරහැන්නැදිගේ ප්‍රන්සිස්කු ප්‍රනාන්දු (පුරන් අප්පු) ජාතික වීරයා දහතුන් හැවිරිදි වියෙහිදී ලක්‍ෂපතියේ ගම්මූලාදෑනියාට ගල් - මුල් වලින් ගසා උඩ රටට පැන ගියේ ය. මෙසේ පැන ගොස් ජීවනෝපාය වශයෙන් නොයෙක් - නොයෙක් රැකියාවන්හි යෙදෙමින් උන් පුරන් අප්පු තිස්පස් වැනි වියෙහිදී හාරිස් පත්තුවේ බණ්ඩාර මැණිකේ නමැති කාන්තාවක් සරණපාවා ගත්තේ ය.

ඉංග්‍රීසි පලකයන්ට විරුද්ධ ව විශාල කැරැල්ලක් උඩ රට ඇති විය. මේ මහ කැරැල්ලේ නායකයා පුරන්අප්පු විය. ඉංග්‍රීසි පාලක පක්‍ෂය පසුබැස යත්ම මාතලේ නගරය කැරලිකරුවන් අතට පත් විණි. කුඩාපොල සවාමින් වහන්සේ ද ගොංගාලේගොඩ බණ්ඩා නොහොත් පැලියගොඩ ඩේවිඩ් ද දිනෙස් හා ඩිංගි රාළ ද පුරන්අප්පු අනුගමනය කරමින් කැරැල්ලට සහභාගි වූහ.

මාතලේ කැරැල්ල සුළුපටු එකක් නොවීය. ක්‍රි: ව: 1848 ජූලි 26 වෙනි දින පුරන්අප්පුගේ නායකත්වය යටතේ දඹුල්ලෙන් පිටත්වූ සිංහල මහා සේනාවන් ටොරිංටන් ආණ්ඩුකාරයාගේ ලියකියවිලි අනුව ලක්‍ෂයක් පමණ වූ බව පෙනේ.



පුරන්අප්පු මේ කැරැල්ල මෙහෙයවන ලද්දේ බදුබරින් පීඩිත ව ඉංග්‍රීසින්ගේ තාඩන-පීඩනවලින් මිරිකෙමින් සිටි සිංහලයින්ගේ විමුක්තිය සඳහා ය

ක්‍රි. ව. 1848 ජූලි මස 28 වැනි දිනට යෙදුණු සුබ මොහොතකින් දඹුලු විහාරස්ථානයේදී මහාජනයා විසින් පුරන්අප්පු උඩ රට රජු බව ප්‍රකාශ කරමින් මේ ජාතික වීරයාට ඔටුණු පළඳ වනලදී.

ගොංගාලේගොඩ බණ්ඩා හා දිනෙස් ද, ඩිංගි රාළ ද උප රජ්වරු හැටියට පත්කර ගත්හ. පුරන්අප්පුගේ සේනාව ලෙනදෙර, කවුඩුපැලැල්ල, නාලන්ද, පලාපත්වෙල, අලුවිහාරය ආදි ස්ථාන පසු කොට දෙ දිනකින් මාතලයට පැමිණ දූනට 'සැක්ස්ටන් පාක්' නමින් ප්‍රකට 'මැක්ඩෝවල් කොටුව' බිඳ දමා නගරය දිනාගත් කල්හි උඩ රට ප්‍රභූන් විසින් නැවතත් පැරණි සිරිත් අනුව පුරන්අප්පු මහනුවර රජ බවට ප්‍රකාශ කොට රට වැසියන්ට රජුගේ අණපණත් පිළිපදින්ට නියම කරන ලදී. තවද දුල්ලෑවේ මහ නිලමේ, ගොඩහැල්ලේ නිලමේ, රත්වත්තේ බණ්ඩා ආදී උඩ රට ප්‍රභූවරයෝ ද පුරන්අප්පුගේ ජාතික විමුක්ති හමුදාවට එක් වූහ. ඩිංගි රාළගේ සේනාවෙහි අදිකාරම් වශයෙන් උකුවෙල හිටපු රටේ මහත්මයා ද, ගොංගාලේ ගොඩ බණ්ඩාගේ සේනාවේ කෝන්ගොඩ සාමි නම් අයෙක් ද, පුරන්අප්පුගේ සේනාවෙහි රත්වත්තේ බණ්ඩා ද අදිකාරම් වරුන් මෙන් ක්‍රියා කළහ.

(කුරුකුල චරිතය I 266 පිටුව)

ක්‍රි. ව: 1961 අප්‍රියෙල් 2 දින සිළුමිණ පත්‍රයේ ඩබ්ලිව්. කේ. පී. ගුණවර්ධන මහතුන් විසින් ලියන ලද ලිපියෙහි පුරන්අප්පු සේනාධිනායක හැටියට දක්වමින් මෙසේ සඳහන් කරයි.

" සිංහලේ සටනට පක්ෂ බවක් පෙන්වා පුහු අනුරාගයකින් සටන් බිමට එන සිංහලේ ද්‍රෝහීන් ගැන විමසිලිමත් වීමටත්, ඔවුන්ට විරුද්ධ ව කටයුතු කිරීමටත් පුරන්අප්පුට සිදුවිය. පිටු පසින් සිටින ගෙදර සතුරා මැඩීමේත් ඉදිරියෙන් එන පොදු සතුරා පන්නා හැරීමේත් ද්විධ කාර්යයකට මුහුණ දුන් සේනාධිනායක පුරන්අප්පු අගෝස්තු 6 වැනිදා රාත්‍රිය වාරියපොළ කඳවුරේ නැවතී පසුවදා කටයුතු ගැන කල්පනාකාරිව සිටියේ ය

සටන් පටන් ගත් දා සිට ම පුරන්අප්පුට සහායව කටයුතු කළ හේවාහකුරුගේ සහ යක්බැද්දගේ අල්ලිස් යන දෙ දෙනා එදා සවස කවුඩුපැලැල්ලේ සිට එහි පැමිණියෝ ය. කවුඩුපැලැල්ලේ දී ඉංග්‍රීසි හමුදා මෙහෙය වූ කැප්ටන් වොට්සන් ට පහර දී පලා ආ මේ දෙ දෙනාගේ කණ්ඩායමට පුංචිඅප්පු, ඇල්ලේපොල, හොදිගේ, වීරනෙත්ති, අප්පු කුට්ටි, ආරුමුගම් සහ කාරියවසම් යන හත් දෙනාත් ඇතුළත් වූහ

වාරියපොළ කඳවුරට පැමිණි මේ අමුත්තන් නව දෙනා ගැන කිසිම සැකයක් ඉපදවීමට හේතුවක් ඇති බවක් පුරන්අප්පුට නොපෙනිණ. හෝරුවෙන්-හෝරුවට වෙනස් වෙමින් පවත්නා සටන් තත්‍වය ගැන සිය සගයන් සමඟ කථා බස් කළ සේනාධිනායක තෙමේ රාත්‍රි ආහාරයෙන් පසුව වාරියපොළ කඳවුරේ ප්‍රධාන මුරපළ වූ ගල් ගෙයක් තුළට වී විඩා නිවමින් සිටියේ ය හේවාහකුරුගේත්, අල්ලිසුත් ඒ අසලට වී සිටියාහ.

අල්ලිස් හා හේවාහකුරුගේ සමඟ රෑ බෝ වන තුරුම කථා බස් කරමින් සේනාධිනායක පුරන්අප්පු එම ගල් ගෙය තුළ ම නින්දට ගියේ ය. මධ්‍යම රාත්‍රිය ඉකුත් වී ටික වේලාවකට පසු ව ගල්ගේ තුළට කඩා වැදුණු අල්ලිස් හා හේවාහකුරුගේ එතෙක් වේලා උරෙනුර ගැටී පොදු සතුරාට විරුද්ධ ව සිංහලේ සටන මෙහෙයවීමේ



විරෝදාරත්‍වය ලැබ සිටි සිංහලේ සේනාධිනායකයාගේ දෑතත්, දෙපාත් බැඳ දැමූහ. කලින් යොදා ගත් වැඩ පිළිවෙළක් අනුව, එහි පැමිණි සිංහලේ ද්‍රෝහීන්ගේත් ආධාරය ඇතිව සිංහලේ සේනාධිනායක පුරන්අප්පු එහිදී සිරකරුවකු බවට පත්කර වූයේය අගෝස්තු 7 වැනි දා වටින්-ගොඩින් එළිය වැටෙද්දී දෑතත්-දෙපයත් බැඳ දමනු ලැබූ සේනාධිනායකයා සිරකරුවකු වශයෙන් මාතලේ ඉංග්‍රීසි කඳවුරට ගෙනෙනු ලැබුවේ ය

පුරන්අප්පු මෙසේ හදිසියේ ම සිංහලයන් අතින් ම බැඳී සිරකරුවකු වශයෙන් ඉදිරිපත් කිරීම පිළිබඳව ඉංග්‍රීසින් තුළ මහත් කැලඹීමක් ඇතිවිය. මාතලේ දී යුද්ධාධිකරණයක් ඉදිරියේ පුරන්අප්පුට විරුද්ධ ව චෝදනා ඉදිරිපත් කොට දඬුවම් ලබාදීමට තැත් කිරීම ඉතා අවදානම් කටයුත්තක් බැව් කැප්ටන් වොට්සන් තීරණය කෙළේ ය. ඒ තීරණය අනුව විශේෂ යුද්ධ සේනාංකයක රැකවරණ සහිත ව එවේලේ ම පුරන්අප්පු මහනුවරට පිටත් කිරීමේ කටයුතු සංවිධානය කරන ලදී.

සිරකරුවා රැගෙන මහනුවරට යන සේනාංකයට රහස් නියෝගයක් කැප්ටන් වොට්සන් විසින් නිකුත් කරන ලදී. අතරමගදී සුළු කලබලයක් හෝ සිදුවුව හොත් සිරකරුවාත් ඔහු අල්ලාදීමට ඉදිරිපත් වූ නව දෙනාත් මොහොතකින් සමූලඝාතනය කර දැමිය යුතු බැව් කැප්ටන් වොට්සන්ගේ එම රහස් නියෝගයෙන් කියවුනේ ය.

ඉංග්‍රීසින්ගේ රහස් පොරොන්දුවක් අනුව සිංහලේ සේනාධිනායක පුරන්අප්පු සිරකරුවකු වශයෙන් අල්ලා ගෙනවුත් ඉංග්‍රීසින් හට භාර කළ සිංහලේ ද්‍රෝහීන් නව දෙනාත් සිරකරුවන් වශයෙන් මහනුවරට පිටත් කර එවීම මෙහිදී කාගේත් විමතියට ලක්වන්නකි. සිය දේශයේ නිදහස තකා සටන් කළ ජාතික වීරයකු ප්‍රසිද්ධියේ ම

විදේශිකයන්ට පාවා දීමට තරම් වූ ද්‍රෝහි කමක් කළ පිරිසකගෙන් කිසිදු පක්‍ෂපාත භාවයක් බලාපොරොත්තු වීමට ඉඩක් තමන්ට නොවූ බැව් කැප්ටන් වොට්සන් පසුව කරන ලද ප්‍රකාශයකින් කියවිණ.

අගෝස්තු 7 වැනි ද සවස් වන විට සිංහලේ සේනාධිනායක පුරන්අප්පුත්, ඔහු සිරභාරයට ගෙන ඉංග්‍රීසීන්ට පාවා දීමට ඉදිරිපත් වූ සිංහලේ ද්‍රෝහීන් නව දෙනාත් මහනුවර ඉංග්‍රීසි සිරකඳවුරට ගෙනෙනු ලැබූහ. සිංහලේ සටන් මූලිකයා ලෙස කටයුතු කළ පුරන්අප්පු මෙසේ සිංහලයන් අතින් ම බැඳී තමන් වෙත සිරකරුවකු වශයෙන් ඉදිරිපත්වීම මහනුවර ඉංග්‍රීසි සේනාධිනායක ටී. ඒ ඩිරුප්ච්ගේ විමතියට හේතුවක් විය මහනුවර ඉංග්‍රීසීහු ඒ නිමිත්තෙන් අගෝස්තු 7 වැනි ද සවස මහත් ප්‍රීතියෙන් කල් ගත කළහ.

එතෙක් පැවැති කරදරකාරී ගතිය ක්‍රම-ක්‍රමයෙන් ඉවත්ව යනු දුටු ඉංග්‍රීසි සේනාධිනායක ටී. ඒ ඩිරුප්ච් විශේෂ පනිවුඩයක් කොළඹට පිටත් කරමින් පසුව ද උදෑසන (අගෝස්තු 8 වැනි ද) සිංහලේ සටන ගැන වග කිය යුතු පුරන්අප්පු ඇතුළු සිරකරුවන් දස දෙනාම යුද්ධාධිකරණයක් ඉදිරියට කැඳවන බැව් දන්වා සිටියේ ය.

ක්‍රි. ව. 1848 අගෝස්තු මස 8 වැනි ද උදේ 10 ට මහනුවරදී යුද්ධාධිකරණය රැස්වූවාය. යුද්ධාධිකරණයෙහි සභාපති හැටියට මේජර් ඇෆ්ප් ලුෂින්ටන් මහතා කටයුතු කෙළේ ය කැප්ටන් ටී එච්. වින්ග්ෆීල්ඩ්, කැප්ටන් එච්. ග්‍රීර්සන්, කැප්ටන් එච් සී බර්ඩ් සහ ලෙෆ්ටිනන්ට් ජේ. ස්මිත් යන හතර දෙනා යුද්ධාධිකරණ සාමාජිකයන් හැටියට කටයුතු කළහ.

දෑතේත් දෙපයේත් විලංගු සහිත ව යුද්ධාධිකරණය ඉදිරියට පමුණුවනු ලැබූ සේනාධිනායක පුරන්අප්පු රැක



බලාගැනීමේ කාර්‍යය එහි කැඳවනු ලැබූ යුද්ධ හමුදාංකයට භාරව තිබිණි. සේනාධිනායක පුරන්අප්පු වාරියපොළ දී අල්ලා බැඳ ගෙනවුත් මාතලේට භාර කළ නව දෙනාත් සිර විලංගුවේ ම එහි කැඳවනු ලැබ සිටියාහ.

පළමුකොට ම චෝදනා ඉදිරිපත් කරනු ලැබුයේ යක්බැද්දගේ අල්ලිස් හා හේවාහකුරුගේ යන සිරකරුවන් දෙදෙනාට විරුද්ධවය. ඉංග්‍රීසි අග රැජිණගේ පාලනයෙන් සිංහලේ රාජ්‍යය බැහැර කරවීමට ආධාර දෙමින් රාජ ද්‍රෝහීන්ට පක්‍ෂව කටයුතු කෙළේ යයි මේ දෙ දෙනාට විරුද්ධව චෝදනා නගා තිබිණි. චෝදනා විභාගය අවසානයේදී හේවාහකුරුගේ හා යක්බැද්දගේ අල්ලිස් යන සිරකරුවන් දෙ දෙනා ම අවුරුදු දහහතරක් රටින් පිටුවහල් කර තැබීමටත්, ඒ එක්-එක් සිරකරුවාට කස පහර පණහ බැගින් ප්‍රසිද්ධියේ ම ලබා දීමටත් යුද්ධාධිකරණය මගින් තීරණය කරන ලදී. (කස පහර දීමේ තීරණය පසුව වෙනස්විය. එහෙත් දෙ දෙනා ම රටින් පිටුවහල් කරනු ලැබූහ.)

ඉතිරි හත් දෙනාට ම කස පහර දහඅට බැගින් දී බරපතල වැඩ සහිත ව අවුරුද්ද බැගින් සිර දඬුවමක් ලබා දීමට ද යුද්ධාධිකරණය මගින් තීරණය කළා ය.

සේනාධිනායක පුරන්අප්පුට විරුඬ ව චෝදනා විභාගය ඊළඟට ආරම්භ විය.

චෝදනා අංක: 1. ඉංග්‍රීසි අග රැජිණගේ සාධාරණ ආණ්ඩුවේ පාලනයට අයත් ව තිබෙන උඩ රට රාජ්‍යය එම සාධාරණ පාලනයෙන් ඉවත් කරවා ද්‍රෝහී සතුරු රජකුට පාවා දීම පිණිස කුමන්ත්‍රණ කොට අග රැජිණගේ හමුදාවන්ට විරුද්ධව කැරළි සේනා මෙහෙයවීම,

චෝදනා අංක: 2. එසේ ම 1848 අගෝස්තු මස 2 වැනි දා මාතලේ කවුඩුපැලැල්ලේ දී ඉංග්‍රීසි අගරැජිණගේ රාජ්‍යයේ යටත් වැසියකුවූ දෙන් කොර්නේලිස්ට වෙඩි තබා මරා දැමීම සහ යටත් වැසියන් බිය වද්දන අදහසින් තුවක්කු හා නොයෙකුත් අවි ආයුධ ගත් කැරලිකාරයන් සමඟ ඉංග්‍රීසි රාජ්‍යයට වැදී මංකොල්ල කෑම් සහ ගිනි තැබීම් ආදියට කැරළිකාරයන් පෙළඹවීම

මේ චෝදනා පිළිබඳ ව මාතලේ යුද්ධ හමුදා නායක කැප්ටන් වොට්සන් විසින් ඉදිරිපත් කර තිබුණු සාක්ෂි සටහන් ද යුද්ධාධිකරණය ඉදිරියේ කියවන ලදී. පැ එකහමාරක් තිස්සේ පැවැති විභාගයකින් පසුව යුද්ධාධිකරණය සිය තීන්දුව ප්‍රකාශයට පත් කළා ය සිරකරුවා චෝදනා සියල්ලට ම වැරදිකරු බවත්, අනිකුත් යටත් වැසියන්ට පාඩමකට ගතහැකි පරිද්දෙන් සවස 2-30 කනිසමට සිරකරු වෙඩි තබා මැරිය යුතු බවත් යුද්ධාධිකරණ තීන්දුවෙන් කියැවිණ. ඒ තීන්දුව මහනුවර සේනාධිනායක ඞී. ඒ. ඩිරුප්ට් විසින් අනුමත කරන ලදී.

ක්‍රි. ව. 1848 අගෝස්තු මස 8 වැනි දා සවස 2-30 ට මහනුවර ඉංග්‍රීසි හමුදාවේ ඝාතක සේනාංකය ඉදිරියට සිංහලේ සේනාධිනායකව සිටි පුරන්අප්පු දෑතේත් දෙපයේත් විලංගු සහිතව ම ඉදිරිපත් කරනු ලැබුයේ ය.

**පොදු ජනතාව වෙනුවෙන් ජාතික සටනක් මෙහෙයවීමේ භාග්‍යය ලැබූ සිංහලේ සේනාධිනායක (කරාවේ වංශික වීරහැන්නැදිගේ ෆ්‍රන්සිස්කු ප්‍රනාන්දු) පුරන්අප්පු ඉංග්‍රීසින්ගෙ ඝාතක හමුදාවෙන් ආ වෙඩි උණ්ඩ ලම නියම රණ සූරයෙක් ලෙස අභීතව ළය පෑවේය.**

**ඔහු ද්‍රෝහීන්ගේ මර උගුලක බැඳී ඉංග්‍රීසින් වෙත පැමිණ ජාතියේත්, දේශයේත් අනාගත විමුක්තිය සලකා සිය මවු බිම වැළඳගෙන අවසන් හුස්ම හෙළුවේ ය.**



**"මගේ අම්මා මා වැනි පුතුන් දස දෙනකු ලැබුවා නම් සුද්දාගෙන් ශ්‍රී ලංකාව ගලවා ගැනීම එතරම් කාරියක් නොවේය" යි මේ වීරයා කී අවසන් වචන බැව් පරන්නෝ කියති.**

සේනාධිනායක පුරන්අප්පු වෙඩි තබා මරා දැමීමෙන් පසුව ඔහු පිළිබඳ වන ගොන සඳහන් විස්තරයක් මහනුවර ඉංග්‍රීසි හමුදාවේ නායක ඞී ඒ. ඩිරුප්ට් මහතා විසින් ටොරිංටන් සාම්වරයා වෙත එවන ලදී. එම විස්තරය අනුව මාතලේ දී සිංහලේ හමුදා මෙහෙයවීමේ කාර්යය භාරගෙන සිංහලේ රජු අතින් සේනාධිනායක පදවි ලැබූ පුරන්අප්පු මුහුදු බඩ පළාතේ නගරයක් වූ මොරටුවේ උපන්නෙකි වීරහැන්නැදිගේ ෆ්‍රන්සිස්කු ප්‍රනාන්දු නම් වූ මොහු තරුණ වියට පා තැබීමෙන් පසුව, උඩ රට ප්‍රදේශයට පැමිණ කරෝඅප්පු හා දිනිස් නම් වූවන් දෙ දෙනෙකු හා සමඟ එක්වී නොයෙකුත් ආණ්ඩු විරෝධී කටයුතු කළ බැව් ද ඩිරුප්ට් කියයි. උඩ රට දී පුරන්අප්පු නමින් පතළුව සිටි ඔහු රාජ ද්‍රෝහියකු බැව් කියැවෙන රාජ්‍ය නිවේදනයක් 1848 ජූලි මාසයේ ගැසට් නිවේදනයකින් ප්‍රසිද්ධියට පත් කරන ලද බව ද එම ලිපියෙහි සඳහන් වෙයි.

කිතු වසිනෙක් දහස් — අට සිය අට සාලිසේ

ඒරොප්පුයේ නෙක් රට වැසියන් ලෙස ට
ලක් වැසියෝ ද නැගැ සිටියෝ පෙරළිය ට

මාතලේ පෙදෙසේ — සැහැසිවැ නැගැ සිටි ද නෝ

පුරන්අප්පුවා ගොස් සිටි පාන ර ටි න්
පිළිගෙනැ නයුවා සෙ තම යුද කරන අ ටි න්

නැංවූ ඔහු නිරිඳු ලෙසැ නුවරෙහි ක ත් දේ
දෙන්නට ඔහුට නතු කොට'වට රට නි ත් දේ
ගොවුනරු ටොරිංටනයා වැද හෙවැ නි ත් දේ
නැගි කොටියකු සෙ වී නර දම් නය සි ත් දේ

( සිංහල වංශය—ර. තෙන්නකෝන් )

මේ මහා කැරැල්ලට අනුබල දුන් කුඩාපොල ස්වාමින් වහන්සේත් කැරැල්ලේ දෙ වැනියාවූ ගොංගාලේගොඩ බණ්ඩා ඇතුළු අනෙක් සිංහල වීරයෝත් සුද්දන්ගේ වෙඩි පහරට ලක්වූහ. "මේ නඩු විභාගයේ දී සාක්ෂි දුන් ගොංගාලේගොඩ බණ්ඩා උඩ රට නායකයන් විසින් රජ බවට තෝරාගත් නියම රජු තමා නොවන බව ප්‍රකාශ කෙළේය."

(ආණ්ඩුවේ වාර්තාව 1848 12. 5)

(උඩ රට කාන්තාවක් ආවාහ කොට ගෙන විසූ පුරන් අප්පුට 'සිරිබර මැණිකේ' නම් එක ම දියණියක් වූවාය. ඇ පිළිබඳ තොරතුරු කිසිවක් මෙතුවක් සොයාගත නොහැකි විය.)

---



# කෞරව වංශික උතුමන් හා මහා ජන සේවය

"ස්‍යාමොපාලි නිකායෙහි කලක් පැවිදි ව සිටියාවූ කතලූවේ (කුරුකුල) ගුණරතන නම් යති තෙමේ උප සම්පත්තිය ලැබීම පිණිස විදේශයකට යාමෙහි කරන ලද ආසා ඇත්තේ, හිතවතුන්ට ඒ අදහස දන්වා



කතලූවේ ශ්‍රී ශ්‍රී ශ්‍රී ගුණරතන මහා නායක ස්වාමීන්ද්‍රයෝ

විධිවූ පරිදි ඔවුන්ගෙන් බොහෝ උපකාර ලැබ ශික්ෂා-කාමිවූ සාමණේර සත් නමක් සමග

දෙදහස් තුන් සිය එක් පණස් වන බුද්ධ වර්ෂයෙහි නැව් නැග මුහුදු තරණය කොට නුවණින් යුතුව

රාමඤ්ඤ රට හංසවතී නම් පුරයට පැමිණ රාජ සම්මාන ලැබ තුටුපහටු වූයේ

එකල්හි සවකීයයන් සමඟ සාකච්ඡා කොට රිසි සේ කල්‍යාණී සීමාවෙහි මනාව උපසම්පත්තිය ලැබ

පෙරළා ලක්දිවට පැමිණ සගමොක් ලැබීමේ ආසා ඇත්තවුන්ට පැවිද්ද හා උප සම්පත්තියත් දෙමින් හා දෙවමින් ද

සාධු සම්මතවූ යම් භික්ෂු නිකායක් පිහිටුවීද? ඒ මේ කල්‍යාණ වංශ නිකාය නම් අදත් විරාජමාන වේ

(මහා වංශය 102 වෙනි පරිච්ඡේදය තුන්වෙනි කොටස)



**දෙඩන්දූවේ පියරතන තිස්ස මහා නායක ස්වාමීන්ද්‍රයෝ**

මූන්වහන්සේ ශ්‍රී බු. ව 2426 සිට 2450 දක්වා කල්‍යාණී වංශ මහා නිකායේ මහා නායක ධුරය දැරූහ ඉද්දමල්-ගොඩ දිශාපති තුමන්ගේ අයැදුම ලෙස පැල්මඩුල්ලේ



ධර්ම ශාලාවේදී පැවැත්වුණු ධර්ම විනය පුස්තක සංශෝධනය සඳහා මූන්වහන්සේ ද කැඳවන ලදහ. ඒ අවසථාවෙහි ශ්‍රී ලංකේශ්වර තුමන් ද ඇතිව පැවැත්වූ ගිහි-පැවිදි මහා සභාවේ දී මහා සංඝයා වහන්සේ වෙනුවෙන් කථා කිරීමට තෝරා ගන්නා ලද්දේ මෙතුමා ය. ලංකාවේ ප්‍රථම බෞද්ධ පාඨශාලාව පිහිටුවන ලද්දේ මූන්වහන්සේ විසිනි. බෞද්ධ පාඨශාලවන්හි භාවිතයට පොතක් නැතිව තුබුණු පාඩුව පිරිමැසීමට මූන්වහන්සේ පොතක් සකස් කළහ. බෞද්ධ ධර්මය ඉගෙනීමට පොතක් නොතිබුණු හෙයින් 'ජින ධර්ම විකාශිනී' හා 'ශ්‍රෙයාර්ථ දීපනී' නම් පොත් දෙකක් ද සකස් කොට දුන්හ.

කර්නල් ඕල්කොට් තුමා ලක්දිවට පැමිණෙන්නට පෙර සිටම මෙතුමාගේ හිත මිත්‍රයෙක් ව විසුවේ ය. එතුමා ලක්දිවට පැමිණ මෙතුමන්ගෙන් තිසරණ පන්සිල් ගෙන බෞද්ධයෙක් වූයේ ය ඕල්කොට් තුමාගේ සකල සත් ක්‍රියාවකට ම මූන්වහන්සේගෙන් අගනා උපදෙස් හා උප-කාරයත් ලැබිණි.

**තවත් නායක පදවියක්**

මෙසේ කල්‍යාණ වංශය පාලනය කරමින් වසන මූන්වහන්සේට ක්‍රි. ව. 1894 දී අමරපුර මහා නිකායේ මහා නායක පදවියක් ද පවරන ලදී. සුසිල්වත් සංඝ පිතෘවර යෙක්වූ මූන්වහන්සේගෙන් ලෝක-ශාසන වයට ඉමහත් සේවයක් සිදුවූයේ ය.



### වැලිගම ශ්‍රී සුමංගල මහා නායක ස්වාමීන්ද්‍රයෝ

ක්‍රි. ව. 1894 දී අමරපුර මහා නිකායේ මහා නායක පදවි දෙකෙන් එකක් දොඩම්දූවේ අරියවංසාලංකාර සාසන ධජ විනයාචරිය පියරතන තිස්ස නායක මහා ස්ථවිරයන් වහන්සේට ලැබිණි. අනෙක් මහා නායක පදවිය සාසන වංසාලංකාර කවිධජ විනයාචරිය වැලිගම ශ්‍රී සුමංගල නායක මහා ස්ථවිරයන් වහන්සේට ලැබිණි.

පැල්මඩුල්ලේ පැවැත්වුණු ධර්ම සඞ්ගායනාවට කැඳවනු ලැබූ මූන්වහන්සේ එහි ප්‍රමුඛස්ථානය ගෙන ක්‍රියා කළහ. මූන්වහන්සේ තුළ පැවැති ධර්ම විනය පිළිබඳ විශාරද ඥානය සූර්‍ය්‍යාලෝකය මෙන් ලක්දිව මුළුල්ලේ පැතිර ගියේ මේ ධර්ම සංගායනාවේදී ය. "ශික්ෂා ගරුකවූ මහා ප්‍රාඥවූ, ආචාර්‍ය්‍ය ශ්‍රී සුමංගල ස්ථවිරයන් වහන්සේ බැසගත් ධර්ම විනය ඇත්තෙක, මහා ව්‍යක්තයෙක, ගැඹුරුවූ නුවණැත්තෙක, විසිතුරු කථා ඇත්තෙකැ" යි එහි උන් කවුරුත් කීහ.



ලඞකාණ්ඩුවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලා පොත් ශුද්ධ කිරීමට ද මූන්වහන්සේ පත්කරගන්නා ලද්දේය. ලඞකාණ්ඩුව විසින් ද ශ්‍රෙෂ්ඨ පණ්ඩිත රත්නයක් ලෙස පිළිගත් මූන්වහන්සේ විද්‍යෝදය පිරිවෙනේ අධ්‍යයන පරීක්ෂාව සඳහා කීප වාරයක් ම රජය මගින් පත්කර ගන්නා ලදී.

**සර් ඇඩ්වින් ආනෝල්ඩ් තුමා:**

පූර්ව දිග භාෂා ශාස්ත්‍ර සම්බන්ධයෙන් හසල බුද්ධිමතෙක් වූද (ලයිට් ඔෆ් ඒසියා නම්) බුද්ධ චරිත කථාවෙහි කර්තෘ වූද සර් ඇඩ්වින් ආනෝල්ඩ් තුමා මූන්වහන්සේගේ උසස් මිත්‍රයෙක් වූයේය. මේ යුරෝපාකාර පඬි තුමා වරක් ලංකාවට පැමිණ මූන්වහන්සේ සමග පිළිසඳර කථා කොට බොහෝ වේලාවක් ශාස්ත්‍රීය වූද, සාමයික වූද කරුණු විචාරා දැන ඉමහත් සතුටට පැමිණ පෙරළා ගියේය.

**ග්‍රන්ථකරණය:**

හිතෝපදෙශ සංස්කරණය, ඉතිහාසය හා මුග්ධබෝධ නම් සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථයට සිද්ධාන්ත ශේඛර නම් ව්‍යාඛ්‍යානයක් ද මෙතුමන් අතින් ලියවිණි.

**පානදුරේ සෞගත විද්‍යාලය:**

ග්‍රන්ථ සම්පාදනයෙන් පමණක් නොනැවතුණු වැලිගම් ශ්‍රී සුමංගල මහා නායක ස්ථවිරයන් වහන්සේ පානදුරේ සෞගත විද්‍යාලය නමින් පිරිවෙනක් පිහිටුවා ඒ මගින් සිය ගණන් ගිහි-පැවිදි සිසුනට ධර්ම ශාස්ත්‍රය ද ඉගැන්වූ සේක.

**පානදුරා වාදය:**

මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමින් වහන්සේ හා දාවිත් ද සිල්වා පාදිලි උන්නාන්සේ අතරත් පැවැතුණු පානදුරා වාදයේ දී බෞද්ධ පක්ෂයෙහි කාර්‍ය්‍ය සංවිධානය මෙ තුමාගේ අනුශාසනා පරිදි පී. ජෙරමියස් දියෙස්,


කොර්නේලිස් ප්‍රේරා ආදී දායක භවතුන් අතින් සිදු විය. මේ මහා වාදයේ දී බෞද්ධ පක්‍ෂයට වුවමනා සකල උපකාරයක් ම මුන්වහන්සේ කොපිරිහෙලා ඉටු කළහ.

ස ම ර  නැණැති සඟනට වන්  ස ඟ රු ජ
ස ම ර  සිඳුරු සිඳු එකසර  සි හ රු ජ
ස ම ර  පබඳ කුරු රජ කුල  තුරු රු ජ
ස ම ර  කරමූ සිරි සුමඟුල්  යති රු ජ

( ශ්‍රී විජය කවිරාජ පණ්ඩිත )

---





සී. ඒ. ශ්‍රී ශීලස්කන්ධාභිධාන ප්‍රධාන නායක ස්ථවිරයන් වහන්සේ

දෙඩන්දූවේ ශෛලබිම්බාරාම සරස්වතී මණ්ඩප පිරි-වෙන පිහිටුවා සිය ගණන් ගිහි-පැවිදි සිසුන්ට ධර්ම ශාස්ත්‍රය ඉගැන්වූ අලුත්ගම සී. ඒ. ශ්‍රී ශීලස්කන්ධ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වූ කලී දේශ දේශාන්තරයන්හි පතල කීර්තියෙන් යුක්තවූ මහා පණ්ඩිත රත්නයකි කවිකත්ව-

යෙන් ද ග්‍රන්ථ කරණයෙන් ද, දුර්බෝධ ප්‍රශ්න නිරාකරණය කිරීමෙන් ද පෙර - අවර දෙදිග මහ පඬුවන් අතර විශ්‍ව කීර්තියක් ඇතිව උන් මුන්වහන්සේගේ ප්‍රඥා මහිමය විස්මය ජනකය. බෞද්ධ පොත් කීපයක් සංස්කෘත භාෂාවෙන් ලිවීමෙන් භාරත දේශවාසීන් තුළ බුදු සමය පිළිබඳ හැඟීමක් ඇති කළ මුන්වහන්සේ අතින් පොත් රැසක් ලියවිණ. පොත් කීපයක් නාගර අක්‍ෂරයෙන් මුද්‍රණය කොට සංස්කෘත භාෂාව හදාරණවුන්ගේ ප්‍රයෝජනය සලකා ප්‍රසිද්ධ කරන ලදී.

මුන්වහන්සේගෙන් ලොක ශාසන ඔයට සිදුවන ඉමහත් සේවයට ගරු කිරීමක් වශයෙන් චූලාලංකරණ සියම් රජ තුමා විසින් පූජා වශයෙන් ශ්‍රමණ පරිෂ්කාර රාශියක් හා මහාර්ඝ ප්‍රතිමා වහන්සේ තුන් නමක් ද මෙතුමන් වෙත එවන ලදී. ජම්බුද්වීප වාසී ප්‍රතාපසිංහ මහ රජතුමා විසින් මුන් වහන්සේගෙන් ගැඹුරු ප්‍රශ්න කීපයක් විචාරා ඊට යවන ලද පිළිතුරු ලැබ සතුටු ව විශේෂයෙන් රචිත 'උදධි බද්ධ' නම් සංස්කෘත ප්‍රබන්ධයක් හා අගනා පොත් එකොළසක් ද මෙ තුමන් වෙත එවන ලදී.

අමෙරිකාවේ ආචාර්ය පෝල් කේරස් පඬි තුමා විසින් සර්වඥ ධාතු, බුද්ධ පූජා, බුද්ධ වන්දනා, නිර්වාණ යන කරුණු සම්බන්ධයෙන් අසන ලද ගැඹුරු ප්‍රශ්න කීපයකට සැක පසිඳලීම් වශයෙන් නියම පිළිතුරු දීම නිසා සතුටු වූ එ තුමා එකී පිළිතුරු මුද්‍රණය කොට පත්‍රිකා හැටදහක් විසුරුවා හරින ලදී.

දඹදිව රාස විහාරි මුඛෝපාධ්‍යාය පඬි තුමා ආදී මහා විශාරදයෝ මෙ තුමාගේ ප්‍රශ්න විසර්ජනයෙන් ඉමහත් සතුටට පත්වූහ. කල්කටාවේ රජයේ සංස්කෘත මහා විද්‍යාලයේ ප්‍රධානාචාර්ය සතිශ්චන්ද්‍ර විද්‍යාභූෂණ පඬි තුමෝ මුන්වහන්සේ හමුවීම පිණිස දෙඹන්දූවේ ශෛලබිම්බා-රාමයට පැමිණි අවස්ථාවේ ගෘහස්ථ ප්‍රව්‍රජිත මහා සභාවක්



ඉදිරියේ ව්‍යක්ත කථාවක් පවත්වමින් "ශ්‍රී ශීලස්කන්ධ ස්වාමිපාදයන් වහන්සේ ලංකාවෙහි වූ මාගේ මිත්‍ර උතුමන් අතරින් ශ්‍රෙෂ්ඨතරයෙකි. මුන්වහන්සේගේ නාමය ඉන්දියා දේශ වාසීන්ගේ තුඩ-තුඩ පවතී. මුන්වහන්සේගේ නාමය නිසාම ලක්දිව දෙඹන්දූව නමින් නගරයක් ඇති බැව් භාරත වාසීහු දැන සිටිත්" යයි උදන් ඇනූහ

මෙ තුමෝ බුද්ධ වංශය, අත්තනගලු වංශය, සුගත විදත්‍ථි විධානය, විදග්ධ මුඛමණ්ඩනය, රාජ ප්‍රශස්තිය, දශරූපාවතාරය, හංස දූත කාව්‍යය, ප්‍රශ්න සාරය යන ග්‍රන්ථවලට ව්‍යාඛ්‍යානයන් කළහ. බාලාවබෝධන සන්නය හා රසු වංශ සන්නයන් සකස් කළහ. විශුද්ධි මාර්ගය, ධම්මපදය, දෛවඥකාම ධේනුව, විශ්ව ප්‍රකාශය, වෘත්ත රත්නාකර පංචිකාව යන ග්‍රන්ථ සංස්කරණය කරන ලදින් නාගරාක්‍ෂරයෙන් මුද්‍රිතව ප්‍රසිද්ධ කර තිබේ. භක්ති ශතකය, අනුරුද්ධ ශතකය, වෘත්ත මාලාඛ්‍යාව, ත්‍රි කාණ්ඩ ශේෂය යන ග්‍රන්ථවලට සංස්කෘත ටීකා ලියන ලදින් ඒ පොත් නාගරාක්‍ෂරයෙන් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරවන ලදහ.

ඉන්දියා දේශ වාසීන් තුළ බෞද්ධ සමය සම්බන්ධ ව විශේෂ ගරුත්වයක් ඇතිකරලීම පරමාර්ථ කොට ගෙන සද්ධර්ම මකරන්දය නම් විශාල ග්‍රන්ථයක් හා රාජ රාජේශ්වර ප්‍රශස්තිය, ශ්‍රී මඞ්ගලාෂ්ටකය, වරමඞ්ගලාෂ්ටකය යන ග්‍රන්ථයෝ සංස්කෘත භාෂාවෙන් ම රචනා කරන ලදහ. උපදේශ වාක්‍ය මංජරිය හා කාය ගතා සතිය යන ග්‍රන්ථ චයය ද මෙ තුමන්ගේ කෘතීහු ය.

මුන්වහන්සේ තරම් භාරතීය පණ්ඩිතයන්ගේ ප්‍රසාදයට ලක්වූ වෙනත් සිංහල පණ්ඩිතයෙක් එකල නොවී ය. මුන්වහන්සේගේ ග්‍රන්ථකරණාදිය සලකා ශ්‍රී අප්පා ශාස්ත්‍රී විද්‍යා වාචස්පති බ්‍රාහ්මණ පඬිතුමා විසින් "ශ්‍රී බෞද්ධ සිද්ධාන්තාචාර්ය" යන ගරු නාමයකින් මුන්වහන්සේට ගෞරව කරන ලදී.

# පානදුරේ රන් කොත් විහාරස්ථානය
## (ගල්වලේ පන්සල)

" පානදුරේ රන් කොත් විහාරස්ථානය වනාහි බුද්ධ වර්ෂ 2354 ( ක්‍රි. ව. 1810 ) දී පුණ්‍යකර්මාවලෝකනයක් සඳහා පානදුර පුරප්‍රවරයට වැඩමවූ කතළුවේ ගුණරතන තිස්ස, බටපොළේ කල්‍යාණ තිස්ස, වල්පිට සුමන තිස්ස මහා ස්ථවිර තිදෙනා වහන්සේගේ ශීලසංවරාදි ශ්‍රාමණ්‍ය ගුණ මහිමය කෙරෙහි අති ප්‍රසන්නවූ වරුසහැන්නැදිගේ ප්‍රන්සිස්කු සොයිසා පටබැඳි මහත්මයා, පොත්තහැන්නැදිගේ ලවරෙන්ති දියෙස් ගුරුන්නාන්සේ මහත්මයා, මහවඩුගේ බස්තියන් ප්‍රේරා රේන්ද මහත්මයා, වරුසහැන්නැදිගේ පේදුරු සොයිසා විදානෙ මහත්මයා, වරුසහැන්නැදිගේ ජුවන් සොයිසා මහත්මයා, තෙල්ගේ ජොරෝනිස් පීරිස් රේන්ද මහත්මයා යන මේ භවතුන් විසින් ග්‍රාමික තවත් සැදැහැවතුන්ගෙන් ලබන ලද ආධාරෝපකාරද ඇතිව මෙම ශුද්ධවූ ස්ථානය පිහිටුවීමට නියමකර ගෙන කටයුතු පටන්ගන්නා ලදහ එයින් පළමු කොට ඔවුන් විසින් දෙළොස් රියන් බුද්ධ රූපයකින් ප්‍රතිමණ්ඩිත විහාර ගෙය කරවන ලදහ "

" වරුසහැන්නැදිගේ ප්‍රන්සික්කු සොයිසා පටබැඳි මහත්මයා ආදී සත් දෙනෙකුන් විසින් පන්සලක් සාදවා ගැනීම පිණිස බිම් පෙදෙසක් ක්‍රි. ව. 1824 ක් වූ මැයි මස 3 වැනි දින සීමන් ද සිල්වා මහ රාළ නොතාරිස් තැන ලවා ලියවන ලද පින් පත්‍රයකින් බටපොළේ කල්‍යාණ තිස්ස මහා ස්ථවිර පාදයන් වහන්සේට පින් පිණිස පිළිගන්වන ලදී "

එසේ ම තවත් බිම් කොටසක් ක්‍රි. ව 1825 ක් වූ පෙබරවාරි මස 21 වෙනි දින බැමිණහැන්නැදිගේ ජුහානිස් පීරිස් නොතාරිස් තැන ලවා ලියවන ලද පොරෙන්දු ඔප්පුවකින් යථෝක්ත ස්ථවිර පාදයන් වහන්සේට පිළිගන්වන ලදී.

( කල්‍යාණී ශාසන වංශය )



ඉන් පසු කලින්-කල මේ විහාරස්ථානය දියුණු කිරීමට පානදුරු පළාතේ බෞද්ධයෝ නොමසුරු ව ධන පරිත්‍යාග කළහ පොත්තහැන්නැදිගේ ජෙරමියස් දියෙස්, කුරුකුල සූරිය කොර්නේලිස් ප්‍රේරා ආදී බෞද්ධ ප්‍රභූවරයෝ සංඝාවාසයත්, විහාරස්ථානයත්, පොත්ගුල හා දාගැබ ආදී අනෙක් පූජනීය ස්ථානත් සැදවීමෙන් හා ප්‍රතිසංස්කරණය කරවීමෙන් ද සසුන් වැඩූහ. මෙහි ඉදි කොට ඇති දර්ශණීය දාගැබෙහි (පළමු) රන් කොත පළඳවන ලද්දේ කොරළවැල්ලේ ජේ. ප්‍රන්සික්කු ප්‍රනාන්දු බාස් මහත්මයා අතිනි.

බටපොළේ කල්‍යාණ තිස්ස මහා ස්ථවිරයාණන්ගේ ඇවෑමෙන් පානදුරේ රන් කොත් විහාරාධිපති ධුරය වල්පිට සුමන තිස්ස මහා ස්ථවිරයාණන් වහන්සේට පැවරිණි.



**වල්පිට භදන්ත ශ්‍රී ගුණරතන**
**මහා නායක ස්වාමීන්ද්‍රයෝ**

මුන්වහන්සේ වූ කලී වල්පිට සුමන තිස්ස මහා ස්ථවිර පාදයන් වහන්සේගේ දෙ වැනි ශිෂ්‍ය රත්නයයි. ශික්ෂා ගරුක ශීලවන්තයෙක් වූ මුන්වහන්සේ ස්වකීය 'ගුණරතන' නාමය අන්වර්ථ කෙරෙමින් ලෝ සසුන් වැඩූ සේක. මුන්වහන්සේ පින් පිඩෙකි වාසනාවේ මූර්තියෙකි. කථාව ශාන්තය, නිතරම ප්‍රීතිමත් ස්වභාවයකින් කල් ගත කළ සේක. ස්වකීය ගුරු හිමියන්ගේ ඇවෑමෙන් පානදුරේ රන් කොත් විහාරාධිපති ධුරය මුන්වහන්සේට ලැබිණි. ශත වර්ෂ භාගයක් පමණ වූ දීර්ඝ කාලයක් මුළුල්ලේ මේ පදවිය දැරූ මුන්වහන්සේගේ පුණ්‍ය මහිමය නිසා රන් කොත් විහාරය මෙ කල පවත්නා සමෘද්ධිමද් භාවයට පැමිණියේ ය.



මුන්වහන්සේගේ ශිෂ්‍යයන් අතුරෙන් පානදුරේ පඤ්ඤානන්ද, පානදුරේ ඤාණවිමල යන මහා ස්ථවිරයන් වහන්සේලා පාණ්ඩිත්‍යයෙන් ඉතා ප්‍රකට වූහ. ක්‍රි. ව. 1873 අගෝස්තු මස 26 වෙනි 28 වෙනි දෙ දිනයන්හි පානදුරේ රන් කොත් විහාරයට බටහිරින් පිහිටි භූමිභාගයෙහිදී පැවැත්වුණු, බෞද්ධ-ක්‍රිස්තියානි ආගම් වාදයේදී මේ ගුණරතන මාහිමියන් වහන්සේ බෞද්ධ පක්ෂයෙහි ප්‍රමුඛ ආධාර කාරයෙක් ව ක්‍රියා කළ සේක.



**අම්බලම්ගොඩ දේවානන්ද උප සංඝරාජ මහා නායක**
**ස්වාමීන්ද්‍රයන් වහන්සේ.**

මුන්වහන්සේ වූ කලී පාලි භාෂාවෙහි දක්ෂ සංඝ පිතෘවරයෙකි. පාලි ග්‍රන්ථ කීපයක් සංශෝධනය කළ මුන්වහන්සේ කලක් බුරුම රට වැඩ විසූ සේක. ආගමික

කරුණු පිළිබඳ වාද තිපයකම එක් පක්ෂයක ප්‍රධානියා වූයේ මුන්වහන්සේය. ශාස්ත්‍රඥානයෙන් ද, ගුණමත්කමින් හා සිල්වත්කමින් ද අනූන වූ මුන්වහන්සේ අමරපුර නිකායේ මහා නායක පදවියට පත් වූ සේක. මෙසේ ලෝක ශාසනවයේ අභිවෘද්ධිය සලස්වමින් වැඩ වෙසෙන මුන්වහන්සේ කෙරෙහි ප්‍රසන්නවූ බුරුම මහා සංඝ සභාව මගින් මුන්වහන්සේට උප සංඝරාජ පදවිය පිරිනමන ලද්දේ ය. මේ ගරු පදවිය ඉන් පෙර කිසිම සිංහල නාහිමි නමකට නොලැබිණ. බුද්ධ ශාසනයෙහි දියුණුවට ඉමහත් සේවයක් කළ අම්බලම්ගොඩ දේවානන්ද උප සංඝරාජ මහා නායක ස්වාමීන්ද්‍රයන්ගෙන් අනෙක් නිකායික මහ තෙරුන් වහන්සේලා ද ආගමික ප්‍රශ්නයන්හිදී අවවාද අනුශාසනා ලැබුවෝ ය.

---





**පානදුරේ ශ්‍රී ඥානවිමල තිස්ස නායක ස්වාමීන්ද්‍රයෝ**

වැලිගම ශ්‍රී සුමඞ්ගල මහා නායක ස්ථවිරයන් වහන්සේගේ ඇවෑමෙන් පානදුරේ සෞගත විද්‍යාලයෙහි අධිපති පදවියට පත් වූ පානදුරේ ශ්‍රී ඥානවිමල තිස්ස නා හිමියන් වහන්සේ සංස්කෘත භාෂාවෙහි අති දක්ෂයෙකි. "කඳ කුමර වරය" ලත් තොටගමුවේ ශ්‍රී රාහුල සංඝ රාජයන් වහන්සේ මෙන් ම යම් කිසි ගාථාවක් හෝ ශ්ලෝකයක් වරක් ඇසූ පමණින් ධාරණය කොට ගැනීමේ අරුම පුදුම ශක්තියක් මෙ තුමන් තුළ තිබිණි.

ඉගෙණීම කරනා අවදියෙහිදී ඥානවිමල සාමණේරයන් වහන්සේ අනෙක් සිසුන් පරදවා ගුරු සිත් දිනීමෙහි සමත් වූහ.

'පෙරුදුරුවර නුදුටු-ගැඹරු නැත් දුටු සතරෙහි' යන වැණුම මුන්වහන්සේ ගැන ම කියන ලද්දකැයි පළකරන් නාක් මෙන් සවකීය තීක්ෂණ ප්‍රඥාමහිමයෙන් මෙ තුමෝ ලෝ වැසියා විස්මය පත් කළහ.

**ග්‍රන්ථකරණය**

පාණිනී ව්‍යාකරණයෙහි විශාරදයෙක් වූ මුන්වහන්සේ ලඝු සිද්ධාන්ත කෞමුදී, මහා සිද්ධාන්ත කෞමුදී ආදී මහා ග්‍රන්ථයන් ශුද්ධ කොට මුද්‍රණ වාරයෙන් ප්‍රසිද්ධ කරවූහ. එවකට උන් සංස්කෘත මහා පණ්ඩිත මාණික්‍ය දාමයෙහි දීප්තිමත් මාණික්‍ය රත්නය මුන්වහන්සේ බැව් කවුරුත් අවිවාදයෙන් පිළිගත්හ.

**සෞගතෝදය විද්‍යාලය:**

මෙ තුමාගේ ශිෂ්‍යයන් අතුරින් ප්‍රධාන පැවිදි ශිෂ්‍යයෙක් වූ කහඳමෝදර පඤ්ඤාසාර මහා ස්ථවිරයන් වහන්සේ මෙ තුමන් වෙතින් ධර්ම ශාස්ත්‍රය හදාරා ආපසු වැඩම කොට කෝට්ටෙගොඩ සෞගතොදය විද්‍යාලය ආරම්භ කළහ එ තුමන්ගේ ඇවෑමෙන් අමරපුර නිකායේ ලේඛකාධිකාරි රාජකීය පණ්ඩිත ශාස්ත්‍රාචාර්ය කහඳමෝදර පියරතන මාහිමියන් වහන්සේ එහි අධිපති ධුරය දරණ සේක

**ශ්‍රී විජය සෞගත විද්‍යාලය:**

ශ්‍රී ඥානවිමල තිස්ස නා හිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍ය රත්නයක් වූ චිත්‍රභාණක සිරි සද්ධම්මාචරිය වලානේ ධම්මානන්ද නාහිමියන් වහන්සේ ධර්ම දේශනයෙන් හා ග්‍රන්ථ කරණයෙන් ද ලෝ සසුන් වැඩූ සේක. බුදුගුණ අලංකාර සන්නය, සඳ කිඳුරු දා සන්නය ආදිය මෙ තුමන්ගේ කෘතිහුය මෙ තුමන්ගේ ශිෂ්‍ය රත්නයක් වූ පණ්ඩිතාචාර්ය වලානේ ශ්‍රී විජයානන්ද නායක ස්ථවිරයන් වහන්සේ පානදුරේ



වලානේ ශ්‍රී විජය සෞගත විද්‍යාලය ආරම්භ කළහ. එ තුමන්ගේ ඇවෑමෙන් පූජ්‍ය පණ්ඩිත මාදුපිටියේ මේධානන්ද මහා ස්ථවිරයන් වහන්සේ එහි ප්‍රධානත්වය දරණ සේක. මුන්වහන්සේ විචිත්‍ර ධර්ම කථිකයෙකි.

**ප්‍රාචීන භාෂෝපකාර සමිතිය:**

ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ කාරක සභිකයෙක් ව සිටි ඥානවිමල නාහිමියන් වහන්සේ විභාග ප්‍රශ්න පත්‍ර සාදදීමෙන් ප්‍රාචීන භාෂා ශාස්ත්‍රොද්දීප්තියට විශේෂෝප-කාරයක් කළහ එ පමණෙක් ද? රාජකීය ආසියාතික සමිතියෙහි සත් ව්‍යාපාරයන්ට ද මෙ තුමන්ගෙන් ලැබුණු උපකාර බොහෝ ය.

**පානදුරේ ශ්‍රී ඥානවිමල තිස්ස නායක ස්වාමීන්ද්‍රයන්ගේ නිධන ප්‍රාප්තිය සම්බන්ධයෙන් විබැව් ජාතික මහින්ද ස්වාමීන් විසින් ප්‍රබන්ධ කරන ලද කවි දෙකක්.**

"හැ ම මී රසේ මී කැටි කැටි කොට ඇ ද ය
දි වි මී මඩල පිළිබඳ මහ වන මැ ද ය
කි වි මී මැහි පොදිය තැනූ මහ මී ව ද ය
ම හි මී තුමා බව මට හැඟුණේ අ ද ය

සකු මී අඹේ මී පැණි රස උරා බි බී
එකු හූ හඩ දෙමින් ලක් උයනෙහි පැළ ඹී
ලොකු මත කොවුල් තෙම අද නැති බැවින් එ බී
කු කු – කු ක් කියති කුකුළන්ටත් ජයක් ලැ බී"

"මි නි ර න් රන් රුවන් ආකර වුවත් මො වේ
මි නි යෙ න් පවා පළිගත්නා පුදුම ර වේ
මි ණී ව න් මහතුමන් ගන්නට විත් මෙ වි වේ
මි නි හෝ මරුවෝ, පස් වැටෙනව ඔහෙගෙ ක වේ"

(පී ඇස්. ධම්මබන්ධු).



**වැලිපටන්විල දීපංකර මාහිමියන් වහන්සේ**

එළු, පාළි, සංස්කෘත ආදි පෙර දිග භාෂාවන්හි හසල බුද්ධිමතෙක් වූ පණ්ඩිතාචාර්ය වැලිපටන්විල දීපංකර මහා ස්ථවිරයන් වහන්සේ ධර්ම දේශනයෙහි ද ව්‍යක්තයෙක් විය. දෙඹන්දූවේ සරස්වතී මණ්ඩප විද්‍යාපීඨයේ උපාචාර්ය ධුරය දැරූ මුන්වහන්සේ කොළඹ කොටහේනේ 'බ්ලූමැන්ඩල්' වීදියේ ආරාමයක තුන් වසක් ද, තිරණාගම සුනන්දාරාමයෙහි සිවු වසක් ද වැඩ වෙසෙමින් ඒ පළාත් වාසීනට ධර්ම ශාස්ත්‍ර දානයෙන් උදාර සේවයක් කළහ. ඉක්බිති දෙවුන්දර ගලතුරුමූල පිරුවන්හි අධිපති වූ මේ හිමිපාණෝ එමගින් ද, තංගල්ලේ ගෞතම විද්‍යාලය පිහිටුවා එහි අධිපතිව, එමගින් ද ලෝක සාසන වයට අමරණීය සේවයක් කළහ.

මෙ තුමන්ගෙන් සිදුවූ උදාර සේවයට ගරු කිරීමක් වශයෙන් කල්‍යාණි වංශ නිකායේ මහා සංඝ සභාව විසින් 'ශ්‍රී සිද්ධාර්ථ ධර්මකීර්ති' යන ගරු නාමය හා උපාධ්‍යාය පදවිය ද පිරිනමන ලදී. කාම්බෝජයේ "ප්‍රාබට් සම්දච් ප්‍රාසි සොවත් වොම් චක්‍රපොන්ස් රෙඩීවූ" මහ රජ තුමෝ මුන්වහන්සේට 'පණ්ඩිතාචාර්ය' ගෞරවෝපාධිය හා ස්වර්ණ මුද්‍රිකාවක් ද පිරිනැමීමෙන් ගෞරව කළහ.



ජිනාලංකාර වර්ණනා පාළි (ටීකාව) පරිවාර පාළි ධම්මපදට්ඨ කථා i. පිරුවානා පොත, සතිපට්ඨානය, මයුර සන්දේශ ව්‍යාඛ්‍යා, සිද්ධාන්ත ව්‍යාඛ්‍යා සහිත හිතෝපදේශය, වෘත්තෝදය වර්ණනා, සඳැස් ලකුණු වර්ණනා, නෛෂධ චරිත ව්‍යාඛ්‍යා, සුශ්‍රැත සංහිතා, ශාන්ති ශතක වර්ණනා, බුද්ධ චරිත මකරන්ද ආදි ග්‍රන්ථ රාශියක් සම්පාදනය කළ මුන්වහන්සේගෙන් ධර්ම ශාස්ත්‍රාදිය උගත් ශිෂ්‍ය සංඛ්‍යාව ඉමහත් ය.



**ආශිධම්මික**
**මොරටුවේ මේධානන්ද නායක ස්ථවිරයන් වහන්සේ**

සිංහල රජ කාලයෙන් පසු ලක්දිව පහළ වූ ගාථා බන්ධනයෙහි දක්ෂයා යයි කිව හැකි මොරටුවේ මේධානන්ද නාහිමියන් වහන්සේ සාමණේර කාලයෙහි පටන් ම ඉගෙනීමේ සමතෙක් විය රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙනේ ඉගෙනීමෙන් පසු මේ සාමණේරයන් වහන්සේ අභිධර්මය ඉගෙනීම පිණිස බුරුම රටට වැඩම කළහ. අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලැබුවේත් එහිදීය. බුරුම රට රාජගුරු මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේලා වෙතින් ධර්ම ශාස්ත්‍රාදිය හදාරා ලක්දිවට පෙරළා වැඩම කළ මුන්වහන්සේ විචිත්‍ර ධර්ම කථිකයකු වී තුන් දහසකටත් වඩා දම් දෙසුම් පැවැත්වූ හ.



**දෙවැනි වර බුරුම රට ගමන:**

ස්වකීය ආචාර්යයන් වහන්සේ වැඳ පුදා ගැනීම පිණිස ක්‍රි. ව 1920 දී බුරුම රටට වැඩම කළ මුන්වහන්සේ තමන් වහන්සේ විසින් රචනා කරන ලද 'ජිනවංශදීප මහා කාව්‍යය' සුධර්ම සංඝ සභාවේ මහ තෙරවරුන් ඇතුළු ශ්‍රී සංඝරාජ මාහිමියන් වහන්සේට පුදන ලදින් සතුටට පැමිණි සුධර්ම සංඝ සභාව සහිත සංඝරාජ හිමියාණෝ "සිරිලංකා සාසනාලංකාර කවිධජ" යන නාමය ප්‍රදානය කිරීමෙන් ගෞරව කළහ.

**තෙවන වර බුරුම රට ගමන:**

තව ද මුන්වහන්සේ ස්වකීය ධර්මාචාර්යයන් වහන්සේගේ ආදාහන කෘත්‍යය සඳහා තජ්ජීවන චරිත ගර්භක 'අච්ඡරියාපදාන චම්පු' නම් ශබ්දාර්ථ ගම්භීර ගද්‍ය පද්‍යාත්මක කාව්‍යය සම්පාදනය කොට බුරුම දේශයට වැඩමවා එය බුරුම අකුරින් ද ප්‍රසිද්ධ කරවූහ.

**ජිනවංශදීපෝත්සවය:**

ජිනවංශදීප පාළි මහා කාව්‍යය පිළිගැනීම පිණිස පානදුරේ මහා පූජෝත්සවයක් පැවැත්විණි. අලි-ඇතුන් සහිත විශාල පෙරහැරකින් ජිනවංශදීප මහා කාව්‍යය වඩම්වාගෙන පානදුරේ අභයකරුණාරත්න මුදලින්දුරාමයට ගිය මහ පෙරහැරේ ඇතකු අරා සිටි ඩී ඇම්. ඇස්. ඇස්. කවිරාජ පඬිතුමා මේ මහා කාව්‍ය ග්‍රන්ථය ගරු බුහුමන් සහිත ව සිය හිස මත දරා සිටියේ ය.

එ දින පස්වරු සමයෙහි පැවැත්වුණු මහා සංඝ සභාවෙහිදී අරුග්ගොඩ සීලානන්ද නාහිමියෝ "මේ සම්භාවනීය ග්‍රන්ථය සම්පාදනය කිරීම ගැන සිංහල රජ කාලයේ නම් මේධානන්ද ස්ථවිරයන්ට ගම්වර සියයක් ලැබෙනවා නො අනුමානය" යි පැවසූහ. මෙ දින සංඝ සභාවෙන් පිරිනැමුණු ගරු නාමය මේධානන්ද හිමියෝ ප්‍රතික්ෂේප කළහ.

**ග්‍රන්ථකරණය :**

සිංහල රජ කාලයෙන් පසු මෙ තරම් මහා කවියෙක් අප රට නොවීය. ගාථා දෙදහසකින් බුද්ධ චරිතය වර්ණනා කොට මෙ තුමන් විසින් ලියන ලද ජිනවංශදීප මහා කාව්‍යය පාළි සාහිත්‍ය රත්න දාමයට එක් වූ දීප්තිමත් පද්ම රාගයක් වැන්න. ධම්ගාරව දීපනී නම් පාළි පද්‍ය ග්‍රන්ථය, ආහාර තණ්හාවතාර, පරමාර්ථ ධම් මකරන්දය, කාලිදාස මහා කවි ප්‍රණීත නලෝදය කාව්‍යයෙහි එලෝදය ව්‍යාඛ්‍යාව, අච්ඡරියා පදාන චම්පූ, කුමාර සම්භව මහා කාව්‍යයෙහි කල්පලතා ව්‍යාඛ්‍යාව, සම්මෝහ විනෝදනී නම් අටුවාවට ලියන ලද අභිධම් ප්‍රදීපිකා ව්‍යාඛ්‍යා ආදි ග්‍රන්ථ රාශියක් මෙ තුමන් අතින් ලියවිණ.


මෙ තුමාගේ අභාවයෙන් සාතිශය ශෝකයට පැමිණි විබැට් ජාතික ඇස්. මහින්ද හිමියන් අතින් ලියැවුණු කවකි මේ.

කිම එම් බා මරුව අප හිමි පුදන් ට ද?
මෙ තරම් යුහුව ගෙන ගියෙ කුම් කරන් ට ද?
මෙහි සම් බුදු සසුන වනසා දමන් ට ද?
නැති නම් සුර ලොවේ සස්නක් මවන් ට ද?

**මේධානන්ද ප්‍රතිමාව :**

මඳ කලකට පසු මොරටුවේ මේධානන්ද නා හිමියන්ගේ ප්‍රතිමාව විවෘත කිරීම පිළිබඳ මහා උළෙලක් පානදුරේ අභය කරුණාරත්න මුදලින්දාරාමයෙහිදී පැවැත්විණි. එහිදී මේ නා හිමියන්ගේ ගුණ වර්ණනා මුඛයෙන් ජර්මන් ජාතික මහා විශාරදයෙක් වූ මහාචාර්ය ගයිගර් පඬිතුමා විසින් පාළි භාෂාවෙන් කරන ලද ව්‍යක්ත කථාව මහාචාර්ය මලලසේකර මහතුන් විසින් සිංහලයට පරිවර්තනය කරන ලදී.





**කටුදම්පෙ ශ්‍රී මංගලාලංකාරාභිධාන උප සංඝරාජ මහා නායක ස්වාමීන්ද්‍රයෝ**

මුන්වහන්සේ වූ කලී සිංහල, පාළි, සංස්කෘතාදි භාෂා වන්හි මනා පටුත්වයක් ඇතිව ලෝ-සසුන් වැඩූ මහ තෙර නමකි. **අම්බලන්ගොඩ දේවානන්දාභිධාන උප සංඝරාජ** **යන් වහන්සේගේ** සුවච ශිෂ්‍ය රත්නයක් වූ මුන්වහන්සේට ගුරු හිමියන්ගේ ඇවෑමෙන් **උප සංඝරාජ මහා නායක** යන

ගරු නාමය බුරුම රට සඟරජ තුමන්ගෙන් ලැබිණ. ගුරු සඟරජ හිමියන්ගෙන් පමණක් නොව **වැලිතර ශ්‍රී. ඒ. ඥාණතිලක නා හිමියන්ගෙන් ද** ධර්ම විනය සහිත ශාසනාන්තරයන් උගත් මුන්වහන්සේට ඥාණතිලක නායක ස්වාමීන්ද්‍රයන් විසින් ද අනුනායක ධුරයක් පවරන ලදී. කුඩා අවදියෙහි පටන්ම ඉගෙණීමේ දක්‍ෂයෙක් වූ මුන්වහන්සේ හිටුවනම කවි, ගාථා ආදිය කීමෙන් මහා ජනයාගේ ගෞරවය දිනාගත්හ.

"මජ්ඣණ්හ සමයේ සූරියො පජ්ජලන්තොව ගච්ඡති
දුබ්බලො අඞ්ඝ ඉන්දුව තස්සූරං අනුගච්ඡති."

මේ වූ කලී මුන්වහන්සේ සාමණේර අවදියෙහිදී හිටුවනම කී ගාථාවකි.

වාදයෙහි දක්‍ෂයෙක් වූ මුන්වහන්සේ වාද කීපයකදීම පක්‍ෂ නායකයා ව කථා කළහ. කතළුවේ රාමඤ්ඤ වාදය, නමස්කාර වාදය, සතර වාදය, දෙනේපිටියේ විෂ්ණු වාදය ආදිය ඉන් සමහරකි. චතුර කථිකයෙක් වූ මුන්වහන්සේ කුඩා අවදියෙහිදීම **"වාදකාරයා"** යන දෙවන නමකින් ද ප්‍රසිද්ධ විය.

විචිත්‍ර ධර්ම කථිකයෙක් වූ මුන්වහන්සේ ලක්දිව නොයෙක් පළාත්වල ප්‍රසිද්ධ ධර්ම දේශනා දහස් ගණනක් පැවැත්වීමෙන් බුදු සසුනට උදාර සේවයක් කළහ. බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීමේ පරම පවිත්‍ර චේතනාවෙන් යුක්තව බෞද්ධ පාඨශාලා කීපයක් ඇති කළහ.

---





ශාසන වංශාලඞ්කාර කවිධජ විනයාචරිය
කළුතර සිරි සුමන තිස්ස
මහා නායක මාහිමියාණන් වහන්සේ.

පසුගිය ශත වර්ෂයේ ලඞ්කාවේ වාසය කළ දීප්තිමත් පඬිරුවනක් වූ මුන්වහන්සේ අටහැවිරිදි වියෙහිදී කළුතර අශෝකාරාම මහා විහාරාධිශ්වර වූ අසරණසරණ පිණ්ඩපාතික අළුත්ගම ශ්‍රී සඞ්ඝරතන මාහිමියාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් ප්‍රව්‍රජ්‍යා භූමියට පත්වූහ. ඉගෙණීමෙහි අති දක්‍ෂයෙක් වූ මුන්වහන්සේ මූලික අධ්‍යාපන කටයුතු යශෝකත මාහිමියාණන් වහන්සේ වෙතින් අවසන් කර එවකට ලඞ්කාවේ මහා පඬිවරයෙක් වූ බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්‍ෂිත මහතාණන් වෙතින් සංස්කෘත තර්ක, න්‍යායාදී නොයෙක් දේ ඉගෙණ මහා පණ්ඩිත සංඛ්‍යාවට පත්වූහ. මුන්වහන්සේ සමග එක පංතියේ ඉගෙනීම ලැබූ තවත් පඬිවරයෙක් නම් කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය විද්‍යාලයෙහි අධ්‍යක්‍ෂක පදවියට පත් වූ හෙයියන්තුඩුවේ ශ්‍රී දේවමිත්‍ත මාහිමියාණන් වහන්සේ ය. සිරිසුමන තිස්ස නායක මාහිමියාණන් වහන්සේ ඉගෙණීමේ කටයුතු අවසන් කර සවකීය නිජ ග්‍රාමය වූ කළුතර

අශෝකාරාමයට වැඩමවා එහි බොහෝ ගිහි පැවිදි ශිෂ්‍ය සමූහයාට ශාස්ත්‍රාධ්‍යාපනය කරවීමෙහි නියුතු වූහ. මුන්වහන්සේ තරුණ වයසේදීම ස්වකීය ආචාර්ය පාදයාණන් වහන්සේ ස්වර්ගස්ථ වදාළ හෙයින් විශාල පන්සල් දසයක පමණ ආධිපත්‍යය සහිත සහෝදර පිරිසකගේ ද ආධිපත්‍යය දරන්ට සිදු විය. ස්ථාන පාලනය ගැන මුන්වහන්සේට කියන්ට තිබෙන්නේ ඒවායේ භේදයක් නොමැතිව නියම පරිපාලන ශක්තියකින් පැවැත්වූ බවය. ධර්ම දේශනා කිරීම හා පොත් පත් ලිවීම් වාද විවාදයන්හිදී ප්‍රමුඛව ක්‍රියා කිරීම් ආදි විවිධ ශාසනික සේවයන් නිසා මුන්වහන්සේගේ කීර්ති ඝෝෂාව දසත නැංගේය. වර්ෂ 1908 දී මාතර සිරි සද්ධම්මයුත්තික නිකායේ මහා නායක පදවිය නීත්‍යානුකූලව මුන්වහන්සේ වෙත පත් කරන ලදී.

---

වැලිගම ශ්‍රී සුමංගල මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය රත්නයවූ මුන්වහන්සේ සුපේශල ශික්ෂාකාමී මහා සංඝ පිතෘවරයෙකි. කථාව ශාන්තය ගති ගුණ සුවිනීතය, පාලනයෙහි දක්ෂ මහා නායක තුමෙකි. කළුතර පුලිනතලාරාම මහා විහාරයෙහි ද, මොරටුවේ ද සොයිසා ආරාමයෙහි ද පැරැලියේ පදුම ගබ්භාරාමයෙහි හා බේරුවල අභිනවාරාමයෙහි ද ආධිපත්‍යය දරණ මුන්වහන්සේ බුරුම රට ජරාජ මහා සංඝාය-නාවෙහි මුලසුන හොබවමින් වැදගත් ශාසනික සේවයක් කළ සේක. බුරුම රට රජය මගින් "අග්ගමහා පණ්ඩිත" යන ගෞරව නාමය ද මෙ තුමන් වෙත පිරිනැමිණි




අග්ග මහා පණ්ඩිත බේරුවල ශ්‍රී සුමංගල ශ්‍රී නිවාසාභිධාන අමරපුර මහා නිකායේ මහා නායක ස්වාමීන්ද්‍රයෝ



පණ්ඩිත ඩබ්ලිව්. ඒ. ප්. ගුණවර්ධන වාසල මුදලි තුමා ස්වකීය ග්‍රන්ථ සම්පාදනයෙහි දී මෙතුමන්ගේ නොමසුරු උපකාරය ලබාගත්තේ ය. මෙ තුමන් විසින් සකස් කරන ලද චරියා පිටක සිංහල පරිවර්තනය තව ටික දවසකින් නිකුත්වේ.

---



සද්ධර්ම වාචස්පති සාහිත්‍යාචාර්ය තෙල්වත්තේ මෙධා ශ්‍රී ආර්යවංශාභිධාන ශ්‍රී කල්‍යාණ වංශ මහා නිකායේ මහා නායක ස්වාමීන්ද්‍රයෝ

තෙල්වත්තේ සාරාලංකාර මහා ස්ථවිර පාදයන් වහන්සේගේ ඥාති ශිෂ්‍යවරයෙක් වූ මුන්වහන්සේ බාල්‍යයෙහි පටන්ම ඉගෙනීමෙහි සමතෙක් වූ සේක. ස්වකීය ආචාර්යයන් වහන්සේගෙන් මූලිකාධ්‍යාපනය ලැබූ මුන්වහන්සේ දෙඹම්-දූවේ ශ්‍රී පියරතන මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් වැඩි දුරටත් ඉගෙනීම කොට පානදුරේ ශෛලගත විද්‍යාලයෙහි ආචාර්ය පදවියක් දැරූ සේක. ඉක්බිති බේරුවල මංගල පරිවෙණාධිපතිව ඒ මගින් සිය ගණන් ගිහි-පැවිදි සිසුනට ධර්මශාස්ත්‍ර දානය කළ සේක. සංස්කෘත භාෂාවේ විශාරදයෙක් වූ මුන්වහන්සේ අශීති පූර්ති මංගලම්, පාරාජිකා පාළි, පාචිත්තිය පාළි, ජාතකමාලා, පද්‍යචූඩාමණි ආදි ග්‍රන්ථ රාශියක් සම්පාදනය කළ සේක. පාණිනීය ව්‍යාකරණයෙහි විශාරදයෙක් වූ මුන්වහන්සේ සංස්කෘත භාෂාව විෂයෙහි විශේෂ නෛපුණ්‍යයක් දක්වන්නාහු, ශ්ලෝක බන්ධනයෙහි මෙන්ම

සංස්කෘත කථාවෙහි ද මනා ශූරත්වයක් දැරූ ශ්‍රීමත් ජේම්ස් පීරිස් මැතිඳුගේ මෑණියන් විසින් සාදවන ලද කොළඹ-වැලිකඩ ගෝතමී ආරාමයෙහි ආධිපත්‍යය දරමින් වැඩ විසූ මුන්වහන්සේ සුසිල්වත් මහ තෙර නමකි. ක්‍රි ව 1939 දී කල්‍යාණ වංශ මහා නිකායේ මහා නායක ධුරයට පත් කරන ලදුව නිකායාභිවෘද්ධියට මහඟු සේවයක් කළ සේක. මුන්වහන්සේගේ ශ්‍රී ශරීරය පිළිබඳ ආදාහන මහෝත්සවය පවත්වන ලද්දේ නිදහස් චතුරශ්‍රයේදීය. විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයයෙහි, උපකුලපති කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නාහිමියෝ මෙතුමාගේ ගුණ වර්ණනා මුඛයෙන් සිළුමිණ පත් මගින් ලිපියක් පළ කළහ.

---

සංස්කෘත ව්‍යාකරණ විෂයෙහි නූතන පාණිනීයයි කවුරුත් ගුණ වණන මුන්වහන්සේ වූ කලී සිය සිල් සුවඳින් බුදු සසුන පොබ කළ මහ සඟනමකි. තෙල්වත්තේ සාරාලංකාර මහා ස්ථවිර පාදයන් වහන්සේගේ ඥාති ශිෂ්‍ය වරයෙක් වූ මුන්වහන්සේ ශ්‍රී ආයසීවංශ මහා නායක ස්වාමීන්ද්‍රයන්ගේ ද ඥාතිවරයෙකි. කහවේ රතනසාර නාහිමියන් වහන්සේ හා මුන්වහන් සේත් ගිහි අවදියෙහිදී සිටම කල්‍යාණ මිත්‍රයෝ ය. කුඩා කාලයේදී මේ



පණ්ඩිතාචාර්ය තෙල්වත්තේ
ශ්‍රී අමරවංශ ස්වාමීන්ද්‍රයෝ

ළමා යහළුවෝ දෙදෙන තෙල්වත්තේ පාසලේ එකම පංතියේ ඉගෙනීම කළහ. එ කල ද මෙ තුමා විචක්ෂණ බුද්ධියකින්



යුක්ත කුමාරයකු වීයයි කහවේ නාහිමියෝ නොයෙක් විට පැවසූහ. සිංහල, පාළි, සංස්කෘත යන ත්‍රි භාෂාවෙහිම විශාරදයෙක් වූ මුන්වහන්සේ කලක් බේරුවල මංගල පිරිවෙනෙහි ඉගැන්වීම කළ සේක. ඉන් පසු කොළඹ-වැලිකඩ ගෝතමී ආරාමයෙහි අධිපති පදවිය දරමින් ගිහි පැවිදි සිසුනට ධර්ම-ශාස්ත්‍ර දානය කළහ. මාලිගාකන්දේ විද්‍යෝදය විද්‍යාපීඨයෙහි විභාග පරීක්ෂණය කීප වරක්ම මුන්වහන්සේ අතින් සිදුවිණි. ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ කාරක සභාවට ආණ්ඩුවෙන් පත් කළ කාරක සභිකයෙක් වූ මුන්වහන්සේ පණ්ඩිත විභාගයෙහි ප්‍රශ්න පත්‍ර ද සම්පාදනය කළ සේක.

කල්‍යාණ වංශ නිකාය නමැති ශරදාකාශයෙහි බෘහස්පතී තාරකාව මෙන් බැබළුණු මුන්වහන්සේ වංග භාෂාවෙහි ද දක්ෂයෙකි. අශෝක චක්‍රවර්ති, අශීති පූර්ති මංගලම්, ජාතකමාලා කාව්‍යය, පද්‍යචූඩාමණි මහා කාව්‍යය ආදී ග්‍රන්ථ රාශියක් නිෂ්පාදනය කළ ශ්‍රී අමරවංශ ස්වාමීන්ද්‍රයන් ගැන දඹදිව බ්‍රාහ්මණ මහා පණ්ඩිතයෙක් ප්‍රකාශ කෙළේ සංස්කෘත භාෂාවෙහි මෙතරම් විශාරදයෙක් භාරත දේශයෙහි ද නොමැති බවයි. විදුරුපොල පියතිස්ස උඩරට අමරපුර නිකායේ මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ උන්වහන්සේට අසූ අවුරුදු පිරීම පිළිබඳ මහ උළෙලේ මුලසුන හෙබවීමට මුන්වහන්සේ තෝරාගැනීමට අදහස් කෙළේ මුන්වහන්සේගේ ධර්ම-ශාස්ත්‍රඥතායට හා ශීලවන්ත භාවයටත් ගරු කිරීමක් වශයෙනි. කලකට පෙර කල්කටා විශ්වවිද්‍යාලයේ පාළි මහාචාර්ය පදවිය දරණ බනී මාධව බරුවා පඬි තුමා ලක්දිවට පැමිණ පේරාදෙනියේ විශ්ව විද්‍යාලයට ද ගියේ ය. එහිදී විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සමූහයක් "ඉන්දියා දර්ශනයත්, බෞද්ධ දර්ශනයත් යන දෙකම දැනගත හැක්කේ ඉන්දියාවේ කිනම් තැනකින්ද" යි එතුමාගෙන් ප්‍රශ්න කළහ. ඒ ප්‍රශ්නයට බරුවා තුමා කීයේ "ඒ දර්ශන දෙක දැනගැනීමට ඉන්දියාවේ තැනක් නැත. ඉන්දියා දර්ශනය පමණක් එහිදී දැනගත හැක. බෞද්ධ

දර්ශනයක් එහි නැත. ඒ දර්ශන දෙකම හරි හැටි දැන ගැනීමට වුවමනා තැනැත්තෙක් ඇත්නම් යා යුත්තේ කොළඹ-වැලිකඩ ගෝතමී ආරාමයේ වෙසෙන තෙල්වත්තේ අමරවංශ මාහිමියන් වෙතටය" යනු යි.

**මුන්වහන්සේගේ නිධන ප්‍රාජ්ඥීය සම්බන්ධයෙන් ශ්‍රී චන්ද්‍රරත්න මානව සිංහ මහත්මා (සඳරුවන්) 1949 දෙසැම්බර 29 වැනි දින ලංකාදීප පත්‍රයෙහි පළ කළ වැකියේ කොටසක් මේ.**

බටහිර ගගන තලය ශෝභාමත් කෙරෙමින් දිලිසුණු සිකුරු තරුව ගිලගත් ගිය ඉරිඳු අඳුරු සහිත මැදියම් රැය ගෙවී අළුයම් කාලයට පිවිසෙත්ම ලංකා ප්‍රාචීන භාෂා-සාහිත්‍යාම්බරය ඒකාලෝක කෙරෙමින් විරාජමාන වූ ශ්‍රී අමරවංශ සිකුරු තරුව ද ආයුක්ෂිතිජයෙහි ගිලී යාමෙන් මතුවූ අඳුරෙන් විද්වද්ලෝකය අඳුරු විය. රත්මලානේ සිරි දම්රම් සුරගුරු තරුව අස්තංගත වූයේ මීට සමතිස් වර්ෂයකට පමණ පෙර ය.

වීදාගම, තොටගමු යුගයෙන් මෙපිට සතවර්ෂ ගණනකට පසු ලංකා ප්‍රාචීන භාෂා නමැති අහස් තලයේ උදා වූ විද්වද් තාරකාවන් මධ්‍යයෙහි ගුරු සිකුරු තරු හැටියට අවිවාද-යෙන් පිළිගැනෙනුයේ ශ්‍රී ධර්මාරාම හා ශ්‍රී අමරවංශ යන පැවිදි මහ පඬිවරු දෙපොළය. පූජ්‍ය මහා පණ්ඩිත රත්මලානේ ශ්‍රී ධර්මාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් පසුව සංස්කෘත භාෂා චක්‍රවර්ති පදවිය හිමි වූවෝ පණ්ඩිතාචාර්ය තෙල්වත්තේ ශ්‍රී අමරවංශ ස්වාමීන්ද්‍රයෝ ය.

**දෙසැට දිමුම විමසා නුවණින් සැල කී**
**දසම පෞරාණ මොගු වරදැසී හල දෙය කී**

යන පැරණි වර්ණනය සිහිපත් කරවන අමරවංශ හිමියන්ගේ දර්ශනාන්තර විචක්ෂණ භාවය මැනගත හැක්කේ උන්වහන්සේ විසින් වරින් වර දර්ශන ශාස්ත්‍රය



හකුලා ලියන ලද ලිපි කියැවූවත්ට පමණකි. එය එතරම් හරබරය ව්‍යක්තය විචාර සූක්ෂ්මය. අර්ථවත්ය, ගාම්භීර-තරය, දර්ශනාන්තරයෙහි පැතිර සිටි බුද්ධි මහිමය නිසාම උන්වහන්සේ වෙත මහා පඬිවරයෝ දාර්ශනික මත හා ධර්මාන්තරගත ප්‍රශ්න විසර්ජනය සඳහා නිබඳවම පැමිණුනාහ.

මෑත භාගයෙහි පළ වූ බොහෝ සාහිත්‍යමය ග්‍රන්ථ හා ගැඹුරු ධර්ම ග්‍රන්ථවලට උන්වහන්සේගේ විශාරද බුද්ධියේ ප්‍රභාව ලබා ගැනීම සඳහා පඬිවරුන්ගේ ආයාසය යොමු වූයේ එබැවිනි. සංඥාපනයෙහි නම රුවා ගැනීම පිළිකුල් කිරීමේ පිළිවෙත නිසා උන්වහන්සේගේ නම කළු අකුරුවලින් දැකිය නොහැකි වුවද එම පොත්වල එන මතභෙදවලට තුඩුදෙන කරුණු විසඳා තිබෙන අයුරින් උන්වහන්සේගේ බුද්ධියේ ඡායාමාත්‍රයත් සොයා ගැනීම විද්වතුන්ට දුෂ්කර නොවේ.

ප්‍රාකෘතය වර්තමාන තත්ත්වයට පත්වීම ගැන විගකිව යුත්තන්ගෙන් ප්‍රමුඛත්වය අමරවංශ හිමියන්ට අයත් වන්නේ උන්වහන්සේ ඊට අතපොවන විට එය ඉතාම දුබල තත්ත්වයක පැවැති නිසාය. එහි නීති රීති හා වාග් ප්‍රභෙදයන් මතුකර දක්වීමෙහි රුසියකු හැටියට උන්වහන්සේට නවීනයන් තුළ පමණක් නොව ප්‍රවීනයන් තුළ ද ඇත්තේ මහත් ගරුසරුවකි.

සප්ත මහා සාගරය අගස්තීන් කුඩා දෙහොතට ගැනීම අද්භූත සිද්ධියක් වුවද අමරවංශ හිමියන්ගේ දෙහොතෙහි සංස්කෘත භාෂාගාරය හැරුණු විට තවත් ඉඩ තිබුණේ යයි කීම අතිශයොක්තියක් හෝ අද්භූත වාදයක් හෝ නොවන්නේ ය.

## හුදුම අනා වැකියක්:

**අතිගරු පණ්ඩිතාචාර්ය රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයෝ, තෙල්වත්තේ ආරියවංශ, අමරවංශ යන මා හිමිවරුන් තරුණ අවදියෙහිදී කී අනාවැකියකි මේ.**

**"දූනට හොඳින් හැඳිනෙන යන, දූන උගත් භික්ෂුවරු දෙදෙනෙක් වෙති. තෙල්වත්තේ ශ්‍රී ආර්‍ය වංශ හා තෙල්වත්තේ ශ්‍රී අමරවංශ යන දෙනම ඔහු ය."**

---

### වලානේ ධම්මානන්ද අධිකරණ නායක ස්වාමීන්ද්‍රයෝ:

වැලිගම සංඝානන්ද මා හිමියන්ගේ ශිෂ්‍යවරයෙකි. එළු, පාලි, සංස්කෘත ආදි භාෂාවන්හි ද, කාව්‍ය රචනයෙහි ද මහා පටුභවයක් ඇතිව වලානේ සරණපාලාරාමාධිපතිව වැඩ විසූ මුන්වහන්සේ විචිත්‍ර ධර්මකථිකයෙකි. මුන්වහන්සේ කෙරෙහි පැහැදුණු පානදුරේ සිරිමැදුරේ විසූ ධනවත් පී. දුමිංගු දියෙස් මැති තුමා හා එම මැතිනිය විශාල ආවාස ගෙයක් ඉදිකරවා සඟ සතු කොට පිදූවෝ ය. චිත්‍ර භාණක සිරි සද්ධම්මාචරිය යන ගරු නාමය මුන්වහන්සේට සංඝ සභාවෙන් පිරිනමන ලද්දේ මුන්වහන්සේගෙන් බුද්ධ ශාසනයට සිදුවුණු උදාර සේවයට ගරු කිරීමක් වශයෙනි. පානදුර පලාතේ මෙතරම් වැදගත් සිසු පරපුරක් තැනූ අනෙක් මහ සඟනමක් නැත. වලානේ ආනන්ද, කෙසෙල්වත්තේ පියනන්ද, එගොඩඋයනේ සුනන්ද, එගොඩඋයනේ උපනන්ද නායක, පණ්ඩිතාචාර්‍ය වලානේ විජයනන්ද, කෙසෙල්වත්තේ ජිනානන්ද හා ගල්කිස්සේ ශ්‍රී විසුද්ධානන්ද නායක යන මහා ස්ථවිරයන් වහන්සේලා මුන්වහන්සේගේ ශිෂ්‍යයෝ ය. වලානේ ධම්මානන්ද නාහිමියන්ගේ ශාස්ත්‍රීය කෘතීන් අතර බුදුගුණාලංකාර (වලානේ) සන්නය, සඳකිඳුරු ද කව (වලානේ) සන්නය ආදි පොත් කීපයක් ඇත.



### කරගම්පිටියේ ජෝතිරතන අධිකරණ නායක ස්වාමීන්ද්‍රයෝ

වල්පිට හදන්ත ශ්‍රී ගුණරතන මහා නායක මාහිමියන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයක් වූ මුන්වහන්සේ එළු, පාලි, සංස්කෘතාදි භාෂාවන්හි මහා පටුභවයක් ඇතිව පානදුරේ රත්කොතු විහාරාධිපති පදවිය දරමින් ලෝ සසුන් වැඩූ සේක. පණ්ඩිත මොරටුවේ සාසනරතන මහා ස්ථවිරයන් වහන්සේ මුන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය රත්නයයි. මුන්වහන්සේ සුසිල්වත් මහ තෙර නමකි.

### කෙසෙල්වත්තේ සාසනවංශ නායක ස්වාමීන්ද්‍රයෝ

මොරටුවේ ආභිධම්මික මේධානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ඇවැමෙන් පානදුරේ වැලිපිටියේ අභය කරුණාරත්න මුදලින්දාරාමයෙහි අධිපති පදවියට පත්වූ මුන්වහන්සේ පානදුරා පලාතේ බෞද්ධ කටයුතු ගැන බලවත් උනන්දුවක් දක්වමින් ක්‍රියා කළ සුසිල්වත් සංඝ පීතෘවරයෙකි.

### අඟුලානේ සුමනනන්ද මහා ස්ථවිරයන් වහන්සේ

බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමෙහි පුරෝගාමී වූ මුන්වහන්සේ ලක්ෂපතියේ ශික්ෂාදාන පාඨශාලාව හා අඟුලානේ සුමනනන්ද පාඨශාලාවත් දියුණු කළ සේක. පලාතේ බොදු-පොදු වැඩ සඳහා බලවත් උනන්දුවක් දැක්වූහ.

---



ධර්මාචාර්ය මොරටුවේ ශ්‍රී පේමරතන නා හිමියන් වහන්සේ

මෙ තුමා වූ කලී නියම නායකයෙකුගේ විලාශය මෙ බඳු යයි ලොවට පෑමට පහළ වූ උතුමෙකි. තේජස්වී ස්වභාවයකින් හා ආරෝහ පරිනාහ දේහයකින්ද උපලක්ෂිත වූ මෙ තුමා ශීලවන්තය. පැවතුම ඉතා චාම්ය නිහතමානිය. ගති ගුණ උපශාන්තය. වචනය ප්‍රියංකරය.

මොරටුමුල්ලේ තපසරාරාමාධිපති ව වැඩ විසූ ගොරකපල සීලරතන මාහිමියෝ මුන්වහන්සේගේ ගුරු නාමුදුරුවෝ ය. ගුරුහිමියන්ගේ ඇවෑමෙන් තපසරාරාමයෙහි ආධිපත්‍යය ධර්මාචාර්ය මොරටුවේ පේමරතන නාහිමියන්ට ලැබිණ. බෞද්ධ අධ්‍යාපනයෙහි දියුණුවට අනල්ප සේවයක් මෙ තුමාගෙන් සිදුවිය. එළු, පාළි ආදි භාෂාවන්හි මනා ප්‍රවුත්ඩයක් ඇති මේ තුමාගෙන් ධර්මශාස්ත්‍රාදිය හදාරන්නා වූ ගිහි පැවිදි ශිෂ්‍යයෝ බෝහෝ ය. විචිත්‍ර ධර්මකථිකයෙක් වූ මුන්වහන්සේ ලක්දිව නොයෙක් පළාත්වල ධර්මදේශනා පැවැත්වීමෙන් ද සමිති - සමාගම් කීපයක අනුශාසක ධුරය දැරීමෙන් ද බුදු සසුනට ඉමහත් සේවයක් කෙරේ. වෘත්ත චන්ද්‍රිකා ආදි කාව්‍ය ග්‍රන්ථ කීපයක් ද මෙ තුමා අතින් ලියවිණි. මොරටු පළාත්වාසි බෞද්ධ ක්‍රිස්තියානි සියලු දෙනා තුළම මුන්වහන්සේ කෙරෙහි බලවත් ප්‍රසාදයක් පවත්නේ ය.




## එගොඩඋයනේ ශ්‍රී සුනන්ද මහා ස්ථවිරයන් වහන්සේ

වලානේ සරණපාලාරාමාධිපතිව වැඩ විසූ ධම්මානන්ද නා හිමියන් වහන්සේගේ තුන් වැනි ශිෂ්‍ය රත්නය වූ මුන්වහන්සේ බාල්‍යයෙහි පටන්ම මනා පැවතුම් ඇත්තෙක් විය. පැවිදි වූ පසු සුපිරිසිදුව සිල් රකිමින් දවසැරි මුන්වහන්සේ එගොඩඋයනේ සුනන්දොපනන්ද පාඨශාලාව සෑදවීම පිණිස ඉතා උනන්දුවෙන් ක්‍රියා කෙළේය. කලක් වලානේ ශ්‍රී විජය සෞගත විද්‍යාලයෙහි ආචාර්ය පදවියක් ද දැරූ මුන්වහන්සේ බෞද්ධ පාඨශාලාවන්හි භාවිතය සඳහා දහම් පොත් පෙළක් ද පිළියෙළ කළ සේක.

## එගොඩඋයනේ ප්‍රවර කීර්ති ශ්‍රී උපනන්ද නායක ස්වාමීන්ද්‍රයෝ

මුන්වහන්සේ වූ කලී වලානේ සරණපාලාරාමාධිපතිව වැඩ විසූ ධම්මානන්ද නා හිමියන්ගේ සතර වැනි ශිෂ්‍ය රත්නය යි. කුඩා අවදියෙහි පටන් ම ඉගෙනීමේ දක්ෂතාවයක් දැක්වූ මුන්වහන්සේ සුසිල්වතෙකි. කලක් වලානේ ශ්‍රී විජය සෞගත විද්‍යාලයෙහි ආචාර්ය ධුරයක් ද දැරූ මුන්වහන්සේ එගොඩඋයනේ සුනන්දොපනන්ද පාඨශාලාව ඇති කිරීම පිණිස උට්ඨාන වීර්යයෙන් ක්‍රියා කළ සේක. මුන්වහන්සේගෙන් බුදු සසුනට සිදුවූ සේවයට ගරු කිරීමක් වශයෙන් අතිගරු බේරුවල ශ්‍රී නිවාසාභිධාන මහා නායක ස්වාමීන්ද්‍රයන් ප්‍රමුඛ මහා සංඝ සභාව විසින් "ශාස්ත්‍ර විශාරද ප්‍රවර කීර්ති ශ්‍රී" යන උපාධිය සහිතව සම්මාන නායක පදවියකින් ගරු කරන ලදී. ගී සිදත් සඟරාව, උම්මග්ග ජාතක සංශෝධනය හා (පාසැල්වල භාවිතය සඳහා) දහම් පොත් පෙළක් ද මුන්වහන්සේගේ ශාස්ත්‍රීය කෘතීන් අතර වේ.



**පණ්ඩිතාචාර්ය වලානේ ශ්‍රී විජයානන්ද නායක ස්වාමීන්ද්‍රයෝ**

වලානේ සරණපාලාරාමාධිපතිව වැඩ විසූ ධම්මානන්ද නා හිමියන්ගේ පස් වැනි ශිෂ්‍ය රත්නය වූ මුන්වහන්සේ, කුඩා අවදියෙහි පටන්ම මනා ගුණ-නුවණින් යුතුව පානදුරේ සෞගත විද්‍යාලයෙහි ඉගෙනීම කළ සේක. කල් යාමෙන් එහි ම ආචාර්ය පදවියකට පත්වූ මුන්වහන්සේ සවකීය ඥාතිවරයෙක් වූ ඇම්. සී. ප්‍රනාන්දු මැති තුමන් ලවා වලානේ ශ්‍රී විජය සෞගත විද්‍යා මන්දිරය සාදවා ගෙන එහි ම ඉගැන්වීම ඇරඹූ සේක. සිය ගණන් පැවිදි-ගිහි ශිෂ්‍යයෝ එහි ඉගෙනීම ලැබූහ. මුන්වහන්සේගෙන් සිදු-වුණු ශාසනික සේවයට ගරු කිරීමක් වශයෙන් අමරපුර නිකායේ නායක පදවියක් ද පිරිනමන ලදී. පණ්ඩිත මාදුම්පිටියේ මේධානන්ද මාහිමියන් වහන්සේ මෙ කල මේ විද්‍යා පීඨයෙහි ප්‍රධානාචාර්ය ධුරය දරන සේක.



**පණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල මාහිමියන් වහන්සේ**

කුඩා අවදියෙහි පටන්ම ඉගෙනීමෙහි සමතෙක් වූ මුන්වහන්සේ පැවිදි වූ පසු පානදුරේ සෞගත විද්‍යාලයෙහි අධිපති පදවිය දැරූ පණ්ඩිතාචාර්ය ශ්‍රී ඥානවිමල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගෙන් එළු, පාළි, සංස්කෘතාදි භාෂාවන් මොනවට හදාරා පණ්ඩිත විභාගයෙන් ද සමර්ථ වූ සේක. ඉන් පසු අම්බලම්ගොඩ ශාස්ත්‍රෝදය පිරිවෙන ඇරඹූ මුන්වහන්සේ ඒ මගින් සිය ගණන් පැවිදි - ගිහි සිසුනට ශාස්ත්‍ර දානය කරන සේක. සිංහල අකුරු, ධාතුරූප රත්නාවලිය, මහාවග්ග පාළි, සද්ධර්ම සාගරය ආදි ග්‍රන්ථ රාශියක් මුන්වහන්සේ විසින් සම්පාදනය කරන ලදී. සුසිල්වත් මහ තෙර නමකි.

**රාජකීය පණ්ඩිත කහඳමෝදර පියරතන අමරපුර මහා නිකායේ ලේඛකාධිකාරි ස්වාමීන්ද්‍රයෝ**

බාල්‍යයෙහි පටන්ම ඉගෙනීමෙහි අති දක්‍ෂයෙක් වූ මුන්වහන්සේ පානදුරේ ශ්‍රී විජය සෞගත විද්‍යාලයෙහි ඉගෙනීම කරමින් ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම යන විභාග දෙකින් සම්මාන සහිතව සමර්ථ වූහ. අවසාන විභාගය සඳහා කොළඹ ප්‍රධාන පිරිවෙණකින් ද ශිෂ්‍යයන් රාශියක් ඉදිරිපත් වූහ. ඒ වර උභයසේකර ස්වර්ණ මුද්‍රිකාව කොළඹ ප්‍රසිද්ධ පිරිවෙණෙහි ශිෂ්‍යයකුට හිමිවේ යයි කවුරුත් සිතූහ.

එහෙත් සිදු වූයේ කුමක් ද? ඒ පිරිවෙණෙන් ඉදිරිපත් වූ ශිෂ්‍යයන් සැම දෙනාම පරදවා පානදුරේ වලානේ ශ්‍රී විජය සෞගත විද්‍යාලයෙන් ඉදිරිපත් වූ කහඳමෝදර පියරතන ස්ථවිරයන් වහන්සේ උභයසේකර ස්වර්ණ මුද්‍රිකාව දිනා ගැනීමයි. ස්වර්ණ මුද්‍රිකාව දිනා ගැනීමෙන් රාජකීය පූජ්‍ය පණ්ඩිතයෙක් වුවද, මුන්වහන්සේගේ චාම් පැවතුම හා සමානාත්මතා ගුණයන් පෙර සේ ම පැවතිණි.

ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමෙහි යෙදුණු මුන්වහන්සේ වැඩි කල් නොයාදීම (බී. ඒ.) ශාස්ත්‍රාචාර්ය විභාගයෙන් සමත් වූහ. ධර්ම ප්‍රචාරයෙහි නියැලී මුන්වහන්සේ වූ කලී දක්ෂ කථිකයෙකි.

ශාස්ත්‍ර විශාරදත්වයෙන් ද, පණ්ඩිත භාවයෙන් ද යුක්ත වූ මුන්වහන්සේට සවතිකායෙහි ලේඛකාධිකාරී පදවිය ද ලැබිණ.

පාලි පාඨ මඤ්ජරී (ප්‍රාකෘත) සේතු බන්ධ ව්‍යාඛ්‍යා ආදි පොත් රැසක් මේතුමා විසින් සම්පාදනය කරන ලදී.

## ශ්‍රී සරණපාල වංශාලංකාර ප්‍රවරකීර්ති ශ්‍රී ගල්කිස්සේ ශ්‍රී විසුද්ධානන්ද (ඇම්. අයි. පී. ඇස්.) නායක ස්වාමීන්ද්‍රයෝ

මුන්වහන්සේ වූ කලී චිත්‍රභාණක සිරි සද්ධම්මාචරිය වලානේ ධම්මානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍යයෙකි. මහා කවියෙකි. සිංහල, පාලි, සංස්කෘතාදි පෙරදිග භාෂාවන්හි මෙන්ම ඉංග්‍රීසි භාෂාවෙහි ද හසල බුද්ධිමතෙක් වූ මෙ තුමා උට්ඨාන වීර්‍යයෙන් යුක්ත වූ ගුණවන්තයෙකි.

මෙ තුමා තුළ පවත්නා අප්‍රතිහත ධෛර්‍යය නිසාම පාලුවට තිබුණු ලුණාවේ විහාරස්ථානය අද මෙසා දියුණු-වකට පත්වී ඇත. ලුණාවේ විසුද්ධාරාමය අද අංග සම්පූර්ණ පූජනීය ස්ථානයකි. ප්‍රිය දර්ශනීය දාගැබකින් ද, විශාල විහාර මන්දිරයකින් ද, නෙළුම් පොකුණකින් ද, ආරාමයකින් ද, බෝමළුවකින් හා සාංචි හැඩහුරුකමින් යුත් තොරණකින් ද අලංකාර වූ මෙහි ශාන්ත පරිසරය කාගේත් සිත් ගන්නා-සුලුය. දිනපතා පාසැලක් හා ඉරිදින පාසැලක් ද මෙහි පිහිටුවා ඇත.

මෙ විහාර භූමියෙහි ම පසෙක ශ්‍රී විෂ්ණු, කතරගම, සුනියන්, දැඩිමුණ්ඩ, පත්තිනි යන දෙවිවරුන්ට පුද-පූජා



පැවැත්වීම සඳහා ඉදි කරවන ලද දේවාල පසක් දක්නට ලැබේ. මේ දේවාලයන්ට දිනපතා පැමිණ දේවාශීර්වාද ලබා ගන්නා බැතිමතුන් සිය ගණනකි.

විහාරාධිපති ශ්‍රී විසුද්ධානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඉතා කරුණාවන්තයෙකි. මුන්වහන්සේ සිනාමුසු පියකරු මුහුණින් යුතුව කාගේත් දුකට පිහිටවන සේක. මුන්වහන්සේගෙන් ආශීර්වාදාත්මක වචනයක් හිතවත් අවවාදයක් ලබාගන්නා පිණිසෙන් බුලත් හුරුලු ගත් අත් ඇතිව තමන්ගේ වාරය පැමිණෙන තෙක් පන්සලට වී දොරකඩ රැක සිටිනා දෙනෝ දහකි. මැති, ඇමතිවරු, රජයේ උසස් නිලධාරී, වෛද්‍යවරු, නීතිඥවරු, ගුරුවරු ආදි උසස් පහත් හැම තරාතිරමකම අයත් උදවියම මෙ පිරිසට ඇතුළත් ය.

කරුණාබර හිනා මුහුණින් යුතු මේ නායක ස්ථවිරයන් වහන්සේ කාගේත් දුක් ගැනවිලි අසා කාටත් පිහිටවන සේක. ගිහියන් පමණක් නොව පැවිද්දෝත් මෙ තුමන්ගේ පිහිට පතා එති. ඇතැමෙක් දේවාශීර්වාද ලබා ගනු වස් මුන්වහන්සේ ලවා සෙත් කවි සාදවා ගනිති. සෙත් පිරිත් කියවා ගනිති.

මුන්වහන්සේ ලුණාවේ ශ්‍රී විසුද්ධාරාමය දියුණු කරන අතරම කොළඹ මාලිගාවත්තේ ශ්‍රී විසුද්ධ ධර්මධ්වජාරාමය සහ දූවේ ශ්‍රී විසුද්ධාශ්‍රමයත් ඇති කළ සේක. මේ විහාර ත්‍රයෙහි ම අධිපති මුන්වහන්සේ ය.

මේ තරම් මහා ජනතාවගේ සිත් දිනාගනිමින් ජනප්‍රිය භාවයකත්, පූජාර්හ භාවයකත් පත්වූ එක ද භික්ෂුවක් එත් අද සිරිලක නැත. එහෙයින් අගමැති, ඇමැති, මැති, රාජ්‍ය නිලධාරී, වෛද්‍ය, නීතිඥ ආදි හැම තරාතිරමකම උදවිය දිනපතා මුන්වහන්සේ වෙත බැතිමත්ව ලඟාවනුයේ,

කරුණාභරිත පියකරු වදනින් යුක් මුන්වහන්සේ ඒ හැම දෙනකුම සනසමින් අවවාද අනුශාසනා දෙන ඒක දෙවියන්ට කියා දේවාශීර්වාද ලබා දෙන සේක. මුන්වහන්සේට නායක පදවිය පිළිබඳ අක්ත පත්‍රය පිළිගැන්වුණු උත්සවයේදී අග්‍රාණ්ඩුකාර සර් ඔලිවර් ගුණතිලක මැති තුමා විසින් කරන ලද සාරගර්භ කථාවේ කොටසකි මේ.

මූලාසනයේ ගරු කටයුතු මහා නායක හිමිතුමනි, ගරු ස්වාමිවරුනි, ගරු කටයුතු පූජක වරුනි, සෙනෙට් සභාවේ සභාපතිතුමනි, ගරු ඇමති වරුනි, මන්ත්‍රී වරුනි, සම්භාවනීය නෝනාවරුනි, මහත්වරුනි.

අද දින මෙ තරම් අලංකාර උත්සවයකට පැමිණි පරම පූජනීය ගල්කිස්සේ ශ්‍රී විසුද්ධානන්ද නායක ස්වාමිපාදයන් වහන්සේට ලැබුණු මේ නායක පදවිය පිළිබඳ සන්නස් පත්‍රය මට පිළිගන්වන්ට ලැබීම මගේ ජීවිත කාලය තුළ කරන්ට ලැබුණු ඉතාම උතුම් කටයුත්ත ලෙස මම සලකමි. මේ උතුම් මොහොතේ දී ඔබ හැම දෙනම විශාල ප්‍රීතියකින් සහ සතුටකින් සිටින බව මට පෙනෙනවා. ඊටත් වඩා ප්‍රීතියකින් සහ සන්තෝෂයකින් සිටින්නේ මේ අභිනව නායක ධුරය ලැබූ පූජනීය ගල්කිස්සේ ශ්‍රී විසුද්ධානන්ද නායක ස්වාමීන් වහන්සේ යි. උන්වහන්සේ ළඟට ලොකුම සතුටක් තිබෙන්නේ මා තුළ බව කියන්නේ බලවත් ප්‍රීතියෙනි.


පිදිය යුත්තෙකුට පිදීම උතුම් ක්‍රියාවක් [illegible] ඔබ හැමදෙනා වගේම මාත් පිළිගන්නවා මේ විසුද්ධානන්ද නායක ස්වාමීන් වහන්සේ පිදීමට සුදුසු උතුමෙක්, මෙසේ කියන්නේ උන්වහන්සේ තුළ තිබෙන වැදගත් ගුණාංග ගැන කල්පනා කිරීමෙනුයි උන්වහන්සේ හැමදෙනාටම ලොකු කරුණාවක් දක්වන කෙනෙක්. උන්වහන්සේගේ



මහා කරුණාව නිසා මහජනයා නිතරම වාගේ කරදර වලින් නිදහස් වී ලෙඩ දුක්වලින් ගැලවී දිනෙන් දින ම උසස් එසේම වාසනාවන්ත ජීවිත ගත කිරීමට මග සලස්වා ගන්නා බව අප කාටත් හොඳට පෙනෙන ප්‍රසිද්ධ කාරණයක්. මේ නිසාම නොයෙක් පළාත්වල නොයෙක් තරාතිරමේ අයවලුන් මේ විහාරස්ථානයට ඉතා ඕනෑකමින් හා බැති සිතින් පැමිණෙන බව රහසිගත කාරණයක් නොවේ. රහසිගතවත් සමහර උදවිය මේ විහාරස්ථානයට පැමිණ දේවාශීර්වාද ලබාගන්නා බව මා අසා තිබෙන ප්‍රසිද්ධ රහසක් බව එළිපිට ම කියන්ට කැමතියි.

නිතරම සිනහවෙන් මුහුණ පුරවා ගෙන කථා බස් කිරීම නිසා මේ නායක ස්වාමීන් වහන්සේ ගැන හැම දෙනාම පැහැදී සිටින බවත් ගරු කරන බවත් මා දන්නා තවත් හොඳ කාරණයකි. උන්වහන්සේ තුළ හොඳ පාලන ශක්තියකුත් කාරණාවට ගැලපෙන පරිදි කටයුතු කිරීමේ ශූර බුද්ධියකුත් උත්පත්තියෙන් ම පිහිටා තිබෙන බව මේ විසුද්ධාරාමයේ නව දියුණුව ගැන සිතන විට කාටත් අවබෝධ වෙනවා ඇත. ආගම් භේදයක් හෝ පන්ති භේදයක් හෝ පක්ෂ භේදයක් නොසලකා කාටත් එක සමානව උපකාර කරන නිසා කොයි ආගම් අදහන උදවියත් හැම පක්ෂවල ම අයත් උන්වහන්සේට එකහා සමානව සලකන බව මා හොඳින් දන්නවා. උන්වහන්සේගේ නුවණට උන්වහන්සේගේ කරුණාවට සමාන වූ හොඳ සිල්වත් කමකුත් තිබෙන නිසා උන්වහන්සේගේ වටිනාකම දිනෙන් දින ම පිරෙන හඳ මෙන් වැඩි වෙන බව කියන්නේ බලවත් ගෞරවයෙනි.

මෙ වැනි හොඳ ගුණාංග රාශියක් තිබෙන නිසා ගල්කිස්සේ විසුද්ධානන්ද නායක ස්වාමීන් වහන්සේ ගෞරව කිරීමටත් ගෞරව ලැබීමටත් සුදුසු උත්තමයෙක් බව කියන්ට ලැබීම මට බලවත් සන්තෝෂයකි,



දෙහිවල සුමනජෝති මහා නායක මාහිමියාණන් වහන්සේ

පිණ්ඩපාතික අසරණ සරණ අළුත්ගම ශ්‍රී සඞ්ඝරතන මහාස්වාමීන්ද්‍රයාණන් වහන්සේගේ කණිෂ්ඨ ශිෂ්‍යරත්නය වූ මූන්වහන්සේ කළුතර ශ්‍රී සුමන තිස්ස මහා නායක මාහිමියාණන් වහන්සේගෙන් ශාස්ත්‍රාද්ග්‍රහණය කොට ගල්කිස්සේ ධර්මේන්ද්‍රාරාමයේ වැඩ වාසය කරමින් බොහෝ ලෝක ශාසනොපකාරී කර්තව්‍යයන්හි නියුක්තව ගිහි පැවිදි ශිෂ්‍යයනට ශාස්ත්‍ර දානය කරමින් සිටි කාලයෙහි සිරිසද්ධම්ම යුත්තිකා නිකායේ මහා නායක පදවිය ද ලැබ-කුසාග්‍ර බුද්ධිමත් කරගම්පිටියේ ශ්‍රී ජිනරතන ස්වාමීන්වහන්සේ ආදි වැදගත් ශිෂ්‍ය පිරිසක් ඇති කර වර්ෂ 1930 ගේ දී ගල්කිස්සේ ධර්මේන්ද්‍රාරාමයේදී ස්වර්ගස්ථ වදාළේය.

---

ශ්‍රී බුද්ධ වර්ෂ 2425 ගේ ඇසළ මස පුර 11 වක් ලත් කිවි දින වැකඩදී උත්පත්තිය ලැබූ මූන්වහන්සේ ක්‍රිස්තු වර්ෂ 1895 ගේ මැයි මස 8 වන දින වැකඩ බෝධිරුක්ඛාරාමයේදී කළුතර අශෝකාරාමාධිපති සිරි සද්ධම්ම වංශාලඞ්කාර කවිධ්වජ විනයාචාර්ය සිරිසුමන තිස්සාභිධාන මහා නායක මාහිමියාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් හා වැකඩ සඞ්ඝානන්ද මාහිමියාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් විය. මූන්වහන්සේ මූලිකා



අධ්‍යාපනය ලැබුවේ සුපෙසල ශික්ෂාකාමී මහවිල ඇවරීවත්තේ උදිතොදිතාරාමාධිපති මාලමුල්ලේ ශ්‍රී ධම්මානන්ද මාහිමියාණන් වහන්සේගෙන් ය. පසුව ගල්ගොඩ ශ්‍රී මහා විහාරස්ථ විද්‍යානන්ද පරිවේණාධීශ්වර ආඳවල ශ්‍රී සාරානන්ද මාහිමියාණන් වහන්සේ වෙතින් ද ඉගෙනීම ලබා පසුව කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදයාග්‍ර විද්‍යාලයෙහි උපරිම වර්ගය තෙක් ඉගෙණ පණ්ඩිත ශිරෝමණි හිප්කඩුවේ නායක මාහිමියාණන් වහන්සේගේ විශේෂාශ්‍රයෙන් සීලාදී උසස් ගුණ ධර්ම වර්ධනය කර ගෙන පණ්ඩිත ඇම්. ධර්මරත්න ලක්මිණි සඟරාකර්තෘ මහතාණන්ගෙන් අභිධර්මය ද හදාරා අනතුරුව ජ්‍යොතිශ්ශාස්ත්‍රය ද තම්බිඅප්පු ගුරුතුමාගේ ආශ්‍රයෙන් ලබා ගෙන වැකඩ බෝධිරුක්ඛාරාමයට වැඩමවා ලොකශාසන දෙක්හි අභිවෘද්ධිය සඳහා ව්‍යාවෘත විය. මූන්වහන්සේගේ අවවාද අනුශාසනා පරිදි කළුදූවල ධර්මාරාමය, පුටුපාගල ශ්‍රී මහාබෝධි විහාරය යන විහාරද්වය ද ඇති වූයේ ය. විනය ධර්මයෙහි පටුතර බුද්ධියක් ඇතුව වැඩ සිටි මූන්වහන්සේ අතින් "සික්ඛා පද වලංජනී" නම් විනය ග්‍රන්ථය ද ප්‍රකාශයට පැමිණියේය. මූන්වහන්සේගෙන් ශාස්ත්‍රය ලැබූ බොහෝ වැදගත් පිරිසක් කළුතර පාණදුරය ආදී පළාත්වල සිටී. මූන්වහන්සේගේ හා වැකඩ සඞ්ඝානන්ද මාහිමියාණන් වහන්සේගේත් ශිෂ්‍යයන්



වැකඩ ශ්‍රී පඤ්ඤානන්ද අධිකරණ නායක මාහිමියාණන් වහන්සේ

හැටියට වත්තල්පොල සුමේධානන්ද, කෙසෙල්වත්තේ සුගතපාල, කෙසෙල්වත්තේ සීලානන්ද යන ස්වාමීන්වහන්සේලා වැඩ සිටි මුන්වහන්සේගේ අනුශාශකත්වයෙන් වැඩකෑ ඇති කළ ධර්මප්‍රශාදස්ථානයේදී වර්ෂ හැට දෙකක් ආයු විඳ අධිකරණ නායක ආදි වැදගත් තනතුරු රාශියක් දරා වර්ෂ 1942 කේ දී සවර්ගීස්ථවී වදාළේ ය

---


කළුතර ගංගාරාමාධිපතී වූ ද, මහා කවියෙක් වූ ද මුන්වහන්සේ වූකලී පැරකුම්බා සමයේ උතුරු ඉන්දියාවෙන් ලංකාවට ගෙන්වූ වර්ණකුලසූරිය අර්ශනිලසීම්ට දේවරීර් සෙන්පතියාගේ පරම්පරාවෙන් පැවතෙන් නෙකි. මුන්වහන්සේගේ පියාණන් වූ දොන් ආබ්‍රහම් වර්ණකුලසූරිය මැතිතුමා ද උපන් කවියෙකි. සෝමාරාම මාහිමියන් වහන්සේ උපන්නේ ක්‍රි. ව 1900 යේ දීය. මෙ තුමා ක්‍රි ව. 1915 දී වනරතන මාහිමි යාණන් වහන්සේගේ ආචාර්‍යත්වය යටතේ රූකව රජමහා විහාරාධිපතිවූ ද, පළුතුඩුවේ ජයසුමනාරාමාධිපතිවූ ද මහෝපාධ්‍යාය රූකව විමලසාර මාහිමියන් විසින් පැවිදි කරන ලදී. රසවත් කව් ලිවීමෙන් මහාජන ප්‍රසාදය දිනාගත් මුන්වහන්සේ රටේ බොදු–පොදු වැඩ ගැන බලවත් උනන්දුවක් දක්වන සේක. මාගම් පත්තුවේ හා බටහිර ගිරුවා පත්තුවේ කවියන්ගෙන් වැඩිදෙන මුන්වහන්සේගේ ශිෂ්‍යයෝ ය.



**වල්ගම්මුළියේ සෝමාරාම මහා ස්ථවිරයන් වහන්සෙ**

හොරේතුඩුවේ ගඩගාරාමාධිපති ධර්මකීර්ති ශ්‍රී

# හොරේතුඩුවේ ධම්මධජ අධිකරණ නායක මාහිමි




කෙසෙල්වත්තේ පූර්වාරාමාධිපතිව විසූ

## කෙසෙල්වත්තේ පඤ්ඤාසෙන අධිකරණ නායක

**මාහිමි තුමන්ගේ**

ප්‍රධාන ශිෂ්‍යරත්නයයි.

# වැලිගම සුමනරංසි හිමි



මුන්වහන්සේ තුදුස් විය ඉක්මවීමටත් පෙර වැලිගම රාජකුල වඩන රජමහා විහාරස්ථානයෙහිදී පැවිදි ද ලැබූහ. පැවිදි වීමේ දී උපාධ්‍යාය ධුරයට පත් වූයේ පානදුරේ අභයකරුණාරත්න මුදලිඳුරාමාධිපති පණ්ඩිත ශිරෝමණි අභිධම්මිකාචාර්ය මොරටුවේ මේධානන්ද මාහිමි තුමා ය. ආචාර්ය ධුරය උසුලන ලද්දේ අභිධම්මිකාචාර්ය වැලිගම ඤාණානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි. කුඩා අවදියේ පටන් ම ඉගෙණීමේ හුරුබුහුටි බවක් දැක්වූ සුමනරංසි හිමි අභිධම්මිකාචාර්ය මොරටුවේ මේධානන්ද නායක මාහිමි තුමන් ඇසුරු කරමින් අවුරුදු කීපයක් බණ දහම් හදාරා පසුව මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණට බැඳුනේ ය. එහිදී වර්ග පිළිවෙළින් තෑගි සහිතව විශිෂ්ට සාමර්ථ්‍යයන් ලැබූ මේ හිමියන් විසින් 1936 දී අවසාන වර්ගයෙන් ගෞරව සහිතව සමත්වී "රාජගුරු අභිධර්මත්‍යාගය" ආදී විශේෂ තෑගි කීපයක් ම දිනාගෙන තිබේ. එම වර්ෂයේ ම ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ ප්‍රාරම්භ පරීක්ෂණයේ භාෂාත්‍රයයෙන් ප්‍රමුඛස්ථාව සමත් වී අමරසූරිය ත්‍යාගය හා ශ්‍රී ප්‍රියරතන සංස්කෘත ත්‍යාගය ද දිනාගන්නා ලදී. එහි ම මධ්‍ය පරීක්ෂණයෙන් ද උසස් සාමර්ථ්‍යයක් ලබා තිබේ. ඉංග්‍රීසි ඉගෙණීමේ ලැදියාවක් දැක්වූ මේ හිමියන් ලංකා විශ්වවිද්‍යාලයට ද ඇතුළත් ව බී. ඒ. ගෞරව උපාධිය ද ලබා තිබේ. එතැන් පටන් අධ්‍යාපන සේවය ප්‍රිය කළ සුමනරංසි හිමි "ලංකා බෞද්ධ අධ්‍යාපන සංගමයේ" ආරම්භයේ පටන් ම ගරු ප්‍රධාන ලේඛක ධුරය උසුලමින් ලක්දිව පුරා සිය ගණනක් පාසල් පිහිටුවාලීමට උපස්ථම්භකව මහඟු සේවයක් කෙළේ ය. කොරතොටුවේ ගඩභාරාමස්ථ විද්‍යාශේඛර විද්‍යාලයේ ප්‍රධානාචාර්ය ධුරය ද ඉසිලූ මේ හිමි තුමා රත්මලානේ පිරිවෙන් අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්ය ධුරයක් ද උසුලයි.



## විලේගොඩ ධම්මානන්ද අධිකරණ නායක ස්වාමීන්ද්‍රයෝ

අම්බලම්ගොඩ සුනන්දාරාමාධිපති වූ මුන්වහන්සේ පළාතේ ධර්ම ශාස්ත්‍රාභිවෘද්ධියට නිතර කටයුතු කරන උතුමෙකි. මෙ තුමෝ රිවිදින ධර්ම පාඨශාලාවන්හි භාවිතය සඳහා දහම් පොත් පෙළක් සකස් කළ සේක. 'පාචචනෝපායනී' නම් පාලි ඝගරාව පස් වසරක් මුළුල්ලේ පවත්වාගෙන යන ලද්දේ මෙ තුමා විසිනි. අංගුත්තර නිකායේ ගාථා සන්නය ද මුන්වහන්සේගේ කෘතියකි.

---

## අමරපුර ධම්මාරාම සද්ධම්ම යුත්තික නිකායේ මහා නායක දෙවිනුවර සිරි මහින්ද ස්වාමීන්ද්‍රයෝ

මුන්වහන්සේ වූකලී කොළඹ-වැලිකඩ ගෝතමී ආරාමාධිපති ව වැඩ විසූ තෙල්වත්තේ අමරවංස මාහිමියන්ගේ ශිෂ්‍ය රත්නයකි. රාජකීය පූජ්‍ය පඬිවරයෙක් වූ මුන්වහන්සේ, දකුණු ලක ධර්ම ශාස්ත්‍රාභිවෘද්ධිය කරමින් ම බෞද්ධ-පොදු කටයුතුවලට ද උපකාර කරන සේක. දැනට අහංගම මහා විහාරයෙහි හා ගාල්ලේ ගංගාරාමයෙහිත් අධිපති පදවිය දරන්නේ මුන්වහන්සේ ය.

---

## මොරටුවේ ඤාණාලෝක මහා ස්ථවිරයන් වහන්සේ

මොරටුවේ ක්‍රිස්තියානි පවුලක උපන් මුන්වහන්සේ කුඩා අවදියෙහිදීම බුදු දහමෙහි පැහැද එගොඩඋයනේ විදර්ශනාරාමයෙහි වැඩ විසූ අරියබුද්ධි ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍යයකු වශයෙන් පැවිදි වූහ. එළු-පාලි භාෂා පිළිබඳ මනා දැනුමක් ඇති කර ගත් මුන්වහන්සේ එවකට වල් බිහිව තුබූ එගොඩඋයනේ පුරාණ බෝධිය අසල බෝධිරාජාරාමය පිහිටුවා ගෙන එය පූජනීය ස්ථානයක් බවට පැමිණ වූහ.



කොසෙල්වත්තේ සීලානන්ද
ශ්‍රී දේවාදිත්‍ය ස්වාමීන් වහන්සේ

මුන්වහන්සේ වනාහි වර්ෂ 1898 වේ දෙසැම්බර් මාසයේ කොසෙල් වත්තේදී උත්පත්තිය ලැබූසේ ය. උපතින් වර්ෂ 10 ය පැමිණි විට වැකඩ බෝධිරුක්ඛාරාමයේදී වැකඩ බෝධිරුක්ඛාරාමාධිපති ශ්‍රී සද්ධානන්ද මාහිමියාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් කළුතර අශෝකාරාම මහා විහාරාධිපති ශාසනවංශාලඞ්කාර කල්‍යාණ වංශික කළුතර ශ්‍රී සුමනතිස්ස මහා නායක මාහිමියාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් ශ්‍රමණ භූමියට ඇතුලත් විය. මුන්වහන්සේ වැකඩ බෝධිරුක්ඛාරාමයේ පැවිදි වීමට හේතුව එකල කොළඹ පළාතේ විශාල ශාසනික ව්‍යාපාරයක යෙදී සිටි පිණ්ඩපාතික අසරණ සරණ අළුත්ගම ශ්‍රී සද්ධාරතන මාහිමියාණන් වහන්සේගේ ඥාතීත්වයයි - මුන්වහන්සේ පැවිදි වීමේදී අටපිරිකර පූජා කරන ලද්දේ සුප්‍රසිද්ධ ත්‍යාගශීලී පී. ජේරමියස් දියස් විශාඛා මහෝපාසිකා මැතිනියයි. මුන්වහන්සේට ඥාති සම්බන්ධයක් තිබුන මෙම දියස් මහෝපාසිකාව මුන්වහන්සේගේ සියලු වියදම් දැරීමට තද අශාවකින් සිටියාය. නමුත් මුන්වහන්සේ වයස 17 වන විට කොළඹට ගොස් අප්‍රසිද්ධ ජනනායක ත්‍යාගශීලී රජයේ නීතිඥ විජුබර් රණසිංහ මහතාණන්ගේ අදහස් දායකත්වයෙන් කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය මහා විද්‍යාලයට ඇතුලත්ව ඉගෙණීම ආරම්භ කෙළේ ය.




යථෝක්ත රණසිංහ නීතිඥ තුමා මුන් වහන්සේ කෙරෙහි තිබූ භක්තිය කෙතරම් විශාලද කීවොත් මුන්වහන්සේ කොළඹ වර්ෂ 12 ක් සියලු වියහියදම් දැරීය. කෙළවර මුන්වහන්සේම ලෝකයේ ඉතාම විශ්ව විද්‍යාලයක ඉගෙනීම ලබනට විශාල මුදලක් කැප කෙළේය. වර්ෂ 1925 හේ වර්ෂයේදී මුන්වහන්සේ තාගෝර් විශ්ව විද්‍යාලයට යන්ට සූදානම් විය. නමුත් අසනීප කම් හේතුකොටගෙන එය නවත්වන ලදී. 1925 මුල භාගයේදී අධිනීතිඥ ඒ. රත්නායක මහතා විසින් මුන්වහන්සේට ඉංග්‍රීසි ඉගැන්වීමට සලස්වන ලදී. නැසීගිය ඇල්ප්. ආර්. සේනානායක, ආතර් වී. දියෙස් යන මහතුන් මුන්වහන්සේගේ අභිවෘද්ධිය ඉතාසිතින් සැලූහ. වර්ෂ 1925 හේ දී මුන්වහන්සේ සර් රාමනාථන් මහතාගේ වුවමනාවෙන් යාපනයට වැඩ ඉංග්‍රීසි ඉගෙණීමට සූදානම් විය. නමුත් අසනීපකම හේතුකොටගෙන එයද නවත්වන ලදී. පසුව මුන්වහන්සේ උඩරට ජන සේවකයෙක්ව විසූ පී. බී. රත්නායක මහතාගේ ඉල්ලීම පිට මහනුවරට වැඩමවා අභාවප්‍රාප්ත ඩී. ඇම්. සී. ඇස්. අභයනායක මහතාණන් දුන් ශිෂ්‍යත්වයක් පිට කටුගස්තොට රාහුල විද්‍යාලයේ ඉගෙණීම ආරම්භ කොට සීනියර් පංතිය දක්වා ඉගෙණීම කෙළේ ය. මුන්වහන්සේ අවශාන ගුරු විභාග යෙන්ද මෙහිදී සාමාර්ථ්‍යය ලැබීය.

මුන්වහන්සේගේ සේවය ගැන කල්පනාකර බලනවිට සැම විටම පොදු සේවයක් බව පිළිගත යුතුය. ධනයට කුලයට බලයට වහල්වීමක් කවදාවත් නොවීය. හෘදය සාක්ෂියට එකඟව කටයුතු කෙරීම ප්‍රධාන අදහස විය. කලක් දිනමිණ පත්‍රයේ "සමරවාදී" නමින් සතිපතා පළ කළ වැදගත් ලිපිය හේතුකොට ගෙන නොඑක් දේ හෙළිවිය. එසේම ඒ හේතුකොටගෙන වර්ෂ 1918 පටන් දිනමිණ පත්‍රයේ කර්තෘ ධුරය දැරූ පී. නිශ්ශංක මහතා විශේෂ සැලකිල්ලක් මුන්වහන්සේට දක්වයි. එසේම "කේසර සිංහ" යන නාමයෙන් සතිපතා පත්‍රයක ලියූ අවංක වූත් නිර්භීත වූත් ලිපිය අදත් සෑ අතරත්

රැව් පිළිරැව් දෙයි සිංහල ජාතිය පත්‍රයෙහි සතිපතා පළ කළ ඉතා වැදගත් ලිපිය ගැන සිංහල ජාතිය පත්‍රයෙහි පිටක් වෙන්කර තිබුනේය පියදාස සිරිසේන මහතා මේ ලිපිය හේතුකොටගෙන කෙතරම් පැහැදීමකට පත්වූයේ ද කියතොත් පත්‍රයේ එතුමාට අනවකාශ අවස්ථාවයෙහි ප්‍රධාන වාක්‍යය මුන්වහන්සේ ලවා ලියවූයේය මුන්වහන්සේගේ උපසම්පත්ති මහෝත්සවයේ කථා කළ මහනුවර මන්ත්‍රීවරයා වූ ජෝර්ජ් ඊ ද සිල්වා සෞඛ්‍ය ඇමති තුමා කීවේ මුන්වහන්සේ අවුරුදු 20 ක් තදින් ආශ්‍රය කළ බවත් තමා බෞඩයෙක් වීමටත් සෞඛ්‍ය ඇමතිවරයා වීමටත් මූලික හේතුව මුන්වහන්සේගේ ආශ්‍රය බවත් තමාට පෞද්ගලිකව යමක් මුන්වහන්සේ නමින් කළ නොහැකිවීම ගැන දුක්වන බවත් ය මුන්වහන්සේගේ කාලය පොදු සේවය වශයෙන් ගතවූයේ පාණදුරේ කීර්තිමත් ආතර් වී දියෙස් මහතා අනගාරික ධර්මපාල මහතා හා ඇෆ් ආර්. සේනානායක යනාදී මහතුන් සමග ය.

---



මාතර වීරබා පරිවෙනාධිපති
විද්‍යා විශාරද – පණ්ඩිත
'කල්‍යාණිවංශධවජ කීර්ති ශ්‍රී'
යන ගෞරවෝපාධි ධාරී
**මාතර ශ්‍රී මේධානන්ද**
කල්‍යාණිවංශ නිකායේ
මහා නායක ස්වාමීන්ද්‍රයෝ.

මාතර නූපේ ජයමහාරාමාධිපතිවැ වැඩ සිටි, පණ්ඩිතාචාර්ය මාතර ශ්‍රී අග්‍රසාර මහාස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍යවූ මේ මහා නායක හිමියෝ, ප්‍රාචීන භාෂා විශාරද යාණ කෙනෙකි. කොළඹ ගෝතමී විහාරාධිපතිවැ වැඩ සිටි, පණ්ඩිතාග්‍රගණ්‍ය කොල්වත්තේ ශ්‍රී අමරවංශ නායක



ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙතින් ද, ධර්මශාස්ත්‍රීය අධ්‍යයනයක් ලත් මුන්වහන්සේ ප්‍රාචීන පණ්ඩිත විභාගයෙන් හා විශ්ව විද්‍යාලයීය විද්‍යා විශාරද පරීක්ෂණයෙන් ද උත්තීර්ණ වූහ 1949 දී මාතර වීරබා පිරිවෙන අරඹා එහි අධිපතිව සිටිමින්, ශ්‍රේෂ්ඨ විද්‍යා දානයක් කරන මේ මහා නාහිමියෝ මාතර නූපේ ශ්‍රී මේධානන්ද බෞද්ධ මිශ්‍ර පාඨශාලාවද පිහිටුවා එහි දියුණුවට ක්‍රියා කරත් මුන්වහන්සේ විසින් සම්පාදිත ධර්මශාස්ත්‍රීය ග්‍රන්ථයන් අතර, සිංහල භාෂාවේ ප්‍රාග් ඉතිහාසය ගැන හා දැනට අතිශයින් දුර්ලභවැ පවත්නා නිරුක්ති ශාස්ත්‍රය ගැනද ලියැවුණු ග්‍රන්ථ දෙක ඉතා වැදගත්ය.

---

**හොරේතුඩුවේ ධම්මධජ අධිකරණ නායක ස්වාමීන්ද්‍රයෝ**


මුන්වහන්සේ වූ කලී කෙසෙල්වත්තේ පූර්වාරාමාධිපතිව වැඩ විසූ දූල්තර පඤ්ඤාසේන මාහිමියන්ගේ ශිෂ්‍යයෙකි. මොරටුවේ ප්‍රභූ පවුලකට අයත් උතුමෙකි. එළු-පාළි ආදී භාෂාවන්හි මනා පටුත්වයක් ඇති මෙ තුමා හොරේතුඩුවේ ගංගාරාමයෙහි අධිපති ධුරය දරණ සේක. ශාස්ත්‍රාචාර්ය වැලිගම සුමනරංසි ස්වාමීන්වහන්සේ මෙ තුමාගේ ශිෂ්‍ය රත්නයකි පරලෝසැපත් ත්‍යාගශීලී ඇම් ටී. ප්‍රනාන්දු මහත්මා හා ඩෝසන් ඊ ප්‍රනාන්දු මහත්මාත් මෙ තුමාගේ සහෝදරයෝය

---

**මිරිස්සේ ගුණසිරි ස්වාමිපාදයන් වහන්සේ**

එළු-පාළි, සංස්කෘතාදි භාෂාවන්හි පමණක් නොව ඉංග්‍රීසි භාෂාවෙහිද හසල බුද්ධිමතෙක් වූ මුන්වහන්සේ ප්‍රගතිශීලී ක්‍රියා මාර්ගයක් අනුගමනය කරමින් ධර්මශාස්ත්‍රාලෝකය කරන සේක ව්‍යක්ත කථිකයෙක් වූ ද පූජ්‍ය පණ්ඩිතයෙක් වූ ද මුන්වහන්සේ කොළඹ විපස්සනා භාවනා මධ්‍යස්ථානයෙහි වැඩ වෙසෙමින් බලවත් ශාසන සංග්‍රහයක් කරන සේක

පාණදුරේ වලානේ ශ්‍රී විජය සෞගත විද්‍යාලයෙන් ධර්ම ශාස්ත්‍රය උගෙන එහි උප ප්‍රධානාචාර්ය පදවියට පත්වූ මුන්වහන්සේ ස්වකීය ආචාර්ය වූ වලානේ ශ්‍රී විජයානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ඇවෑමෙන් ශ්‍රී සෞගත විද්‍යාලයෙහිම අධිපතිධුරයෙහි පත්වූ සේක. අමරපුර මහා නිකායේ කාරක සභිකයෙක් වූ මුන්වහන්සේ ශ්‍රී විජය සෞගත විද්‍යාලයාධිපති පදවිය දරමින්ම බණ්ඩාරගම - වෑවිට මහා විද්‍යාලයෙහි උප ප්‍රධානාචාර්ය ධුරය ද දරන සේක. ලංකාවේ ධර්ම කථිකයන් අතර කිසිවකුම නොදෙවැනි ස්ථානයක් දරන මුන්වහන්සේ ධර්ම භාණ්ඩාගාරයක් වැන්න. ලක්ෂපාන ඇල්ලෙන් දිය ඇදහැලෙන්නාක් මෙන් ගලා එන මුන්වහන්සේගේ විචිත්‍ර වාක් මාලාව සාරගර්භය, කර්ණ රසායනය. එහෙයින් අවුරුදු පතා සිය ගණන් ධර්ම දේශනාවන් පැවැත්වීමට නානා පළාත්වලින් ආරාධනා ලැබෙනුයේ. වලානේ ධර්මානුවර්තික බෞද්ධ සමිතියේ අනුශාසක පදවිය ද දරන මුන්වහන්සේ ගම වලානේ බොදු-ළොදු මැඩ සඳහා බිලිවික් උනන්දුමක් දක්වන සේක. ආපත්ති උට්ඨානය නම් ග්‍රන්ථය මුන්වහන්සේගේ කෘතියකි.



පණ්ඩිත මාදුපිටියේ මේධානන්ද මහා ස්ථවිරයන් වහන්සේ



පාණදුරේ රන්කොත් විහාරාධිපතිව වැඩ විසූ කරගම්පිටියේ ජෝතිරතන අධිකරණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යයා මෙ තුමා ය. මුන්වහන්සේ ප්‍රාචීන භාෂෝපකාර සමිතිය මගින් පවත්වනු ලබන පණ්ඩිත විභාගයෙන් සමර්ථවන තුරුම ධර්ම ශාස්ත්‍රාදිය ඉගෙනීම කෙළේ සිය ගුරු හිමියන් ගෙනි. මෙ තුමෝ පණ්ඩිත උපාධිය සමඟක් නොව විද්‍යා විශාරද උපාධිය හා ග්‍රන්ථ විශාරද උපාධිය ද ස්වකීය දක්ෂතාවය පළ කරමින් ලබාගත්හ. අභිධර්ම කෝෂ සිංහල පරිවර්තනය විනය කෝෂය ප්‍රාතිමෝක්ෂ සූත්‍රය ආචාර්ය නාගාර්ජුනයන්ගේ මාධ්‍යමික කාරිකාව ආදි ග්‍රන්ථ රාශියක කර්තෘවරයා මෙ තුමෝ යි. පාණදුරේ ඥානවිමලතිස්ස නාහිමියන්ගේ අභාවයෙන්, අභාවයට පත්වී තුබුණු සෞගත විද්‍යාලය යළිත් පිහිටුවා ගත් මුන්වහන්සේ ඒ මගින් භික්ෂූන්ට ධර්ම-ශාස්ත්‍රාදිය ප්‍රගුණ කරවති. පාණදුරේ රන්කොත් විහාරාධිපති පදවිය දරන මුන්වහන්සේ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයෙහි දර්ශනාංශයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරය ද දරන සේක.



පණ්ඩිත මොරටුවේ ශාසන රතන මාහිමියන් වහන්සේ



අත්‍යුත්තම එඩ්මන්ඩ් පීරිස්
හලාවත රාජගුරු ප්‍රසාදීන් වහන්සේ

ලක්දිව පළමු වැනි වරට රාජගුරු අභිෂේකයෙන් පුදනු ලැබූ සිංහල ජාතිකයා අත්‍යුත්තම එඩ්මන්ඩ් පීරිස් හලාවත රාජගුරු ප්‍රසාදීන් වහන්සේය. කතෝලික සසුන අප රටෙහි ඇතිවී ශත වර්ෂ හතරක් පමණ ඉකුත්වී තුබුණු නමුත් සිංහල ජාතිකයකුට මේ උසස් පදවිය නොලැබිණි. එසේ තිබියදී අළුතින්ම හලාවත පදවියක් ඇතිවීමත්, එහි පාලනය හලාවත පුත්‍රයාණ කෙනෙකුට පැවරීමත් විශිෂ්ට සිද්ධියකි.



කිසියම් මාණික්‍යයක් කපා ඔප් නැගීමට පෙරදී ම කාන්තිය විහිදුවන්නාක් මෙන් මෙ තුමා බාල කාලයෙහි සිටියදීම මෙ තුමාගේ අනාගතය වාසනාවන්ත බවට පත් වන ලකුණු පහළ විය. සුවච පැවතුමෙන් හා තියුණු නුවණින් යුක්තවූ මෙ තුමා අසල්වැසියන්ගේ සිත් දිනාගත් සුරු-බුහුටි ළදරුවෙක් විය.

අත්‍යුත්තම පීරිස් තුමාගේ පියා වනාහි කෞරව වංශික මිහිඳුකුලසූරිය මනුවෙල් දියෝගු පීරිස් මහත්මාය. මෑණියෝ මිහිඳුකුලසූරිය වීරසිංහ ක්ලාරා පීරිස් මැතිනියෝය. මේ යුවලට ලැබුණු එකම දරුවා අත්‍යුත්තම පීරිස් තුමාය. මෙ තුමෝ ක්‍රි. ව. 1897 දෙසැම්බර් මස 27 වැනි දින හලාවත නගරයේ දී උපන්හ.

මෙ තුමා බාල වියෙහිදී හලාවත සාන්ත මරියා පාඨශාලාවෙන් මූලික අධ්‍යාපනය ලැබුවේය. එදා සිංහල භාෂාවට දැන් මෙන් තැනක් නොවීය. එදා බොහෝ දෙන සිංහලයට තැන නුදුන්හ. එ දා සිංහලය කුස්සි භාෂාවක් වී තිබිණ. එහෙත් මෙ තුමා ඉතා උනන්දුවෙන් හා ආදරයෙන් සිංහල භාෂාව ඉගෙන ගත්තේය. ඒ අතර ඉංග්‍රීසි භාෂාව ද මැනවින් උගත්තේය.

මෙසේ සාවුරුද්දක් පමණ එහි ඉගෙණීමෙහි යෙදී සිටි මෙ තුමා තුළ පැවිදි වීමේ ආසාවක් ඇති විය. සිය එකම දරුවා මෙසේ පැවිදි ජීවිතයක් ගත කරන්නට අදහස් කිරීම එතුමාගේ පියාණන්ට දරිය නොහෙන සිත් තැවුලක් විය. එහෙත් නියම දේව භක්තිකයෙක් වූ එතුමෝ දේව අභිප්‍රායට එකඟවූහ.

ඉන්පසු පීරිස් තුමාණෝ 1912 දී සාන්ත ඇලෝසියස් දේව ශාස්ත්‍ර ශාලාවට ඇතුල් වූයේය. එහෙත් බාහිර ශාස්ත්‍ර ඉගෙණීම කොළඹ සාන්ත ජෝශප් විද්‍යාලයෙහි කල් යත්-යත් එතුමෝ ජූනියර් කේම්බ්‍රිජ් විභාගයෙන් හා

සීනියර් කේම්බ්‍රිජ් විභාගයෙන් ද සමත් වූ හ. ශාන්ත ජෝශප් අග්‍ර පාඨශාලාවෙන් අස්වූ මෙ තුමෝ ශාන්ත බෙර්නාඩ් දේව ශාස්ත්‍ර ශාලාවට බැඳී උසස් දේව ශාස්ත්‍රය ඇතුළු තර්ක ශාස්ත්‍රය සහ දර්ශනවාද ශාස්ත්‍රය ඉගෙනීමට පටන්ගත්හ. උගතුමනා සියලු දේ මේ දේව ශාස්ත්‍ර ශාලාවේදී දැන ඉගෙන ගත් පසු මෙ තුමාට ක්‍රි. 1924 පෙබරවාරි මස 25 වැනි දින අත්‍යුත්තම ධර්මාධ්‍යක්ෂ අන්තෝනි කුදේර් අග්‍ර රජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් බොරැල්ලේ පිහිටි එතුමන්ගේ කථා දේවස්ථානයේදී පූජාවරය නමැති මහඟු ප්‍රසාද නිධානය දානය කරනු ලැබූහ.

ඉන්පසු පිටකොටුව, හංවැල්ල, කලමුල්ල, මෝදර, මොරටුව ආදී පළාත්වල දේවස්ථානයන්හි කටයුතු කළ මෙ තුමා විවේක කාලයන්හි දී සිංහල භාෂාව තවදුරටත් ඉගෙන ගත්තේය. ලංකා ඉතිහාසය, පුරාවිද්‍යාව ආදී කරුණු සම්බන්ධයෙන් පරීක්ෂණයක ද යෙදුනේය.

මෙ තුමෝ ක්‍රි. ව. 1927 දී බොරැල්ලේ ශාන්ත බෙර්නාඩ් දේව ශාස්ත්‍ර ශාලාවේ හේතු ධර්ම ශාස්ත්‍රාචාර්ය පදවියට පත් වූහ. ඉක්බිති මග්ගොන ශුද්ධ වින්සන්ට් ගෘහයේ උප කළමනාකාර පදවිය ලැබූ මෙ තුමෝ "භක්ති ප්‍රබෝධන" සඟරාවේ කතෘ ධුරයට ද පත්වූහ. මෙසේ නොයෙක්-නොයෙක් උසස් පදවි දරමින් සිටි මුන්වහන්සේ 1933 දී එංගලන්තයට වැඩම කොට ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් බී. ඒ. උපාධිය ලබාගත්හ. එංගලන්තයේ සිටියදී බ්‍රිතාන්‍ය කෞතුකාගාරයට ගොස් ශාස්ත්‍රීය සහ ඓතිහාසික පර්යේෂණයන්ට අවශ්‍ය පොත් පත් පිටපත් කර ගත්හ. "ශ්‍රෙල් මැගසින්" "කැතලික් ගැසට්යර්" නම් සඟරාවලට ද ලංකාවේ "ලිටරරි රිජිස්ටර්" නම් සඟරාවට ද සාරගර්භ ලිපි සැපයූහ. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් පිටපත් කොටගත් ඉපැරණි සිංහල කාව්‍යයක්වූ "මඟ සළකුණ" නම් ග්‍රන්ථය මෙ තුමා විසින් විශේෂ ශුද්ධියක් සහිතව පළකරන ලදී.




සිය අදහස් මැනවින් ඉටු කර ගැනීමෙන් පසු පෙරළා ලක්දිවට සැපත්වූ මෙ තුමෝ "සමාජ සාමය" නම් පත්‍රයේ කතෘ ධුරය ද දරමින් උදාර සේවයක් කළහ. "දේව වේද සංක්ෂෙපය" නම් ග්‍රන්ථය මෙ තුමෝ විශේෂ ශුද්ධියකින් යුක්තව ප්‍රසිද්ධ කළහ.

සිංහල භාෂාවට මෙන් ම සව ජාතික සිරිත්-විරිත්වලට ද ගරු කරන මෙ තුමෝ ස්වකීය විරුදු සංඥාව වශයෙන් කුරුසයක් අතින් ගත් සිංහයකු යොදා ගත්හ. ජාතිකවූ ද, ආගමිකවූ ද සකල ව්‍යාපාරයකදීම අත්‍යුත්තම එඩ්මන්ඩ් පීරිස් රජගුරු ප්‍රසාදීන් වහන්සේ පුරෝගාමී ව ක්‍රියා කරති.

### ඇස්. ජී. පෙරේරා ජේසු නිකායේ පිය තුමා

ක්‍රි ව 1882 ජූනි මස 5 වන දින කළුතර දී උපන් මෙ තුමාගේ පියා වූයේ එ කල 'ඔබ්සවර්' පත්‍රයේ වාර්තාකරුවකුවූ ද, කෞරව වංශිකයකුවූ ද කාබෙරි පෙරේරා ය. කළුතර ශ්‍රී කුරුස විදුහලේ, මූලික අධ්‍යාපනය ලත් මෙ තුමා පසුව වෙස්ලි හා ශාන්ත ජෝශප් යන විදුහල්වල අධ්‍යාපනය ලැබීය. තම පාසල් ජීවිත කාලයේදී ම ඔහු ආගමට ලැදි, ඉගෙනීමේ දක්ෂ ශිෂ්‍යයෙක් විය. වයස 18 දී රජයේ ලිපිකරු සේවා විභාගයෙන් සමත් වූ හෙතෙම, රත්නපුරේ ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ සේවය කෙළේ ය. 1905 ජේසු නිකායේ දෙව්සත් හලකට ඇතුල්වීම සඳහා ලංකාව හැර ගිය හෙතෙම 1917 නොවැම්බර 21 වන ද පූජාවරය ලැබීය. මෙසේ මෙ තුමා ප්‍රථම සිංහල ජේසු නිකායික පිය තුමා විය. දක්ෂ පෘතුගීසි උගතකු වූ මෙ තුමා රෝමයේ ග්‍රෙගරියන් විශ්ව විද්‍යාලයේ ධර්ම ශාස්ත්‍රය පිළිබඳ මහාචාර්ය තුමා විය. ඉන් පසු ලංකාවට පැමිණි අප පිය තුමා ගාල්ලේ ශාන්ත ඇලෝසියස් විදුහලේ විනයධර ලෙසද, මාතර ශාන්ත ඊර්වේසියස් හි විද්‍යාලයාධිපති ලෙස ද කටයුතු කොට 1939 ගාල්ල ගුරු පදවියේ විකාරිජෙනරල් ධුරයට පත් විය.

ආගමික සේවය හැරුණු විට අප පිය නම ඉතිහාසයටත් සිංහල භාෂාවටත් කළ සේවය අප්‍රමාණ ය. ඉතිහාසය පිළිබඳ ගවේෂණ කටයුතු බොහෝමයක යෙදී සිටි අතරම, ඉතිහාසය පිළිබඳ මේ තුමා ලියූ පොත් පාඨශාලාවල හා විශ්ව විද්‍යාලවල අද ද භාවිතයට ගෙන ඇත. මේ තුමාගේ කෘතීන් අතර ප්‍රධානතම වන්නේ කුවේරොස් පිය තුමගේ,



'The Temporal and Spiritual Conquest of Ceylon' යන පොතේ ඉංග්‍රීසි පරිවර්තනය යි. කාණ්ඩ තුනක් වූ මෙහි පිටු 2174 කි. ලංකා ඉතිහාස ග්‍රන්ථයක් වශයෙන් මෙය දෙවෙනි



වනුයේ මහාවංශයට පමණි. බොහෝ අවස්ථාවල දී, පෘතුගීසි පොත් පත් ඉංග්‍රීසියට නැගීමට ලංකාණ්ඩුව මගින් මේ පිය තුමාට භාර දෙන ලදී. "කොන්ස්ටන්ටයින් ද සා ද නොරොන්‍යාගේ 1630 ඌව ආක්‍රමණය", "දෙකෝරළේ තෝම්බුව", "පාසැලා ලංකා ඉතිහාසය, 1505 – 1911" "ලංකා ඉතිහාසය – බ්‍රිතාන්‍ය සමය 1795 – 1911", "අලගියවන්නගේ කුස්තන්තීනු හටන" "ගොන්සාල්වේස් පිය තුමගේ ජීවන චරිතය", "ලංකාවේ ජේසු නිකායිකයෝ" යන ග්‍රන්ථ මේ තුමාගේ කෘතීන් අතර ප්‍රධානය.

මේ හැර පුවත් පත් හා සඟරාවලට මෙ තුමා ලියූ ලිපි ගණන බොහෝ ය. සමාජ කටයුතු සම්බන්ධයෙන් ද මෙ තුමා දැක්වූයේ මහත් සැලකිල්ලකි.

---

## අතිගරු ලක්දස් ද මැල් කුරුණෑගල බිෂොප් තුමා



මෙ තුමා වූ කලී සර් එච්. ඇල් ද මැල් මැති තුමාගේ හා ද මැල් ආයසීංවගේත් පුත්‍ර රත්නයකි. කුඩා අවදියෙහි පටන්ම සුවිනීත භක්තිගුණ වලින් දෙගුරුන්ගේ හා මැති හිටියන්ගේ සිත් දිනාගත් මෙ තුමා සිංහල භාෂාවට හා සිරිත් විරිත්වලට ද ඉතා ඇලුම් කෙළේ ය. එහෙයින් ඉංග්‍රීසි භාෂාව මෙන්ම සිංහල භාෂාවද මැනවින් ඉගෙන ගත්තේ ය. කොළඹ තුරුළු වත්තේ ශු. පාවුල් වල උදවිය සිංහල භාෂාව පිළිකුල් කළ අවදියක මෙ තුමා සිංහල භාෂා ප්‍රේමියකු වූයේ භාෂා ශාස්ත්‍ර හැදෑරීමෙන් පසු

ආගමික ජීවිතයක් ගත කිරීමට ආසාවක් දැක්වූ මේ තුමා දේවගැතිවරයකු වීමට වුවමනා ඉගෙනීමෙහි යෙදී සිය මනදෙල මුදුන් පමුණුවා ගත්තේ ය. ආගමික කටයුතු කරන අතර ම පොදු වැඩට ද රුකුල් දෙන මේ තුමා ක්‍රිස්තියානි සභාව විසින් කුරුණෑගල බිෂොප් පදවියට පත්කර ගන්නා ලදී. හැම විටම සිංහල භාෂාවේ දියුණුව පතන මේ තුමාගේ ජීවිතය ආදර්ශවත් ය. ශාන්තය, චාම්ය, කොළඹ නගරාධිපති පදවිය දැරූ ආර්. ඇස්. ඇ[illegible]ජ ද මැල් මැති තුමා මේ තුමාගේ සොහොයුරෙකි.

---

## හැරල් ද සොයිසා ආච්ඩිකන් තුමා


ද සොයිසා ආච්ඩිකන් තුමා වනාහි සර් විල්ෆ්‍රෙඩ් ද සොයිසා මැතිතුමාගේ හා ඉවුලින් ද සොයිසා ආයඝීාමයේත් පුත්‍ර රත්නයකි. භාෂා ශාස්ත්‍ර ඉගෙනීමේ කටයුතු හමාර කිරීමෙන් පසු ආගමික ජීවිතයක් ගත කළ යුතු ය යි අදහස් කළ මේ තුමා දේවගැති වරයෙකු වීමට වුවමනා ඉගෙනීමෙහි යෙදුනේ ය. දේවගැතිවරයකු වීමෙන් පසු ක්‍රිස්තියානි ආගමේ දියුණුව සලස්වමින් සිය යුතුකම් මැනවින් ඉටු කළ මේ තුමා ආච්ඩිකන් නමැති උසස් තනතුරට පත් කර ගන්නා ලදී. මේ තුමා ද සොයිසා පවුලේ ගෞරවය ද ආරක්ෂා කර ගනිමින් මහාජන සේවයට ද උපකාර කරයි.

---

## ගෞරවාර්හ ජී. ඒ. එෆ්. සේනාරත්න දේව ගැතිඳුණෝ

දේශීය සංස්කෘතිය මෙතෝදිස්ත සභාවට ඇතුළු කරවන්නට මහත් ආයාසයක් ගත් පරලෝ සැපත් ජෝජ් ඒ. එෆ් සේනාරත්න දේව ගැතිඳුණෝ මෙතෝදිස්ත සභාවේ දේව ගැතිඳුන් අතරෙහි වෙසෙස් තැනෙක වැජඹුණු කෙනෙකි. පාසල් සිසු වියෙහි දී එ තුමන් සිප් සතර





ඉගැනුමට මෙන් ම පන්දු කෙළියෙහි ලා දැක්වූයේ විශිෂ්ට දක්ෂතාවෙකි. එ තුමාණෝ ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයයෙහි ධර්ම ශිෂ්‍යයකු සේ ඉගැනුම ලබමින් සිටි අවදියෙහි දී ලංකා මෙතෝදිස්ත සභාවෙහි ඉතිහාසය අළලා මහ ගතක් ඉංගිරිසියෙන් ලියා, ස්වකීය ලේඛන ශක්තියෙන් කීර්තිමත් අනාගතයේත් ඡායාවක් පිළිබිඹු කළහ. ලංකා මෙතෝදිස්ත සභාවේ නායක දේව් ගැති පදවියට පත් වූ පළමු වැනි ලාංකික දේව් ගැති වරයාණෝ ගෞරවාර්හ සේනාරත්න තුමාණෝ ය.

---

## ගෞරවාර්හ එස්. ජෝජ් මැන්දිස් දේව ගැතිඳුණෝ

මෙතෝදිස්ත සභාවේ දේව් ගැතිවරයන් අතුරින් බෙහෙවින් ම ජන ප්‍රිය කෙනෙකි ගෞ. එස්. ජෝජ් මැන්දිස් දේව් ගැතිඳුණෝ මේ තුමාණෝ රජයේ සේවාවට බැඳුණාහු නම්, එහි ඉතා උසස් තනතුරකට පත් වීමට ඇමැසි සියලු සුදුසුකම් මේ තුමාණන් සතු ව තිබිණ. මෙතෝදිස්ත සභාවේ නායක දේව් ගැති පදවියට පත් වූ දෙ වැනි ලාංකික දේව් ගැතිවරයාණන් වීමේ ගෞරවය හිමි වනුයේ ගෞරවාර්හ එස්. ජෝජ් මැන්දිස් දේව් ගැතිඳුන් හට ය



සී. එච්. ද සොයිසා සාමදුන විනිශ්චයකාර තුමා

“ සිතුමිණි බඳුරු ක ළු
කුලඹ තිලිනෙත් පසු ක ළු
පුරණ දන මන දෙ ළු
තමා සුරතම සුරතුරක් ක ළු ”

යනුවෙන් පැරණි කවියකු විසින් වර්ණනා කරන ලද උතුම-
මෙ තුමා යයි අභීතව ප්‍රකාශ කළ හැකි උතුමෙක් විසි වැනි
ශත වර්ෂයේ ලක්දිව වීනම් ඒ අන් කිසිවෙක් නොව චාර්ල්ස්
හැන්රි ද සොයිසා සිටුවරයා ය

මෙ තුමාගේ මුත්තණුවන් වූ ජෝශප් ද සොයිසා
මැති තුමා හා පියාණන් වූ ජෙරොනිස් ද සොයිසා වාසල මුදලි
තුමාත් පොදු වැඩ සඳහා දසදහස් ගණන් වියදම් කළහ



**ලෝක ප්‍රසිද්ධ නිධානය:**

ද සොයිසා මැතිඳුගේ පියාණන්වූ ජෙරොනිස් ද සොයිසා, වාසල මුදලි තුමාට හඟුරන්කෙත වත්තෙන් නිධානයක් ලැබුනේය යන කථාවක් ලොව පතළ වී ඇති නමුදු එබන්දක් නොලැබිණ නිධානය නම් (මේ වත්ත මෙ තුමා මිළයට ගන්නට කලින්) වවා වල්බිහිව තුබුණු සිංහලේ රජුගේ කෝපි නිධාන යයි මේ කෝපි වත්තෙන් ලැබුණු මුදල් හා වෙනත් ඉඩ-කඩම් ගොඩනැගිලි ආදියෙන් ලැබුණු ආදායම ද ක්‍රමානුකූලව දියුණු කර ගත් බැවින් සී එච් ද සොයිසා මැති තුමා එවකට ලංකාවේ සිටි ප්‍රධාන පොහොසතා විය

**කාරුණික හදවත:**

දුප්පතාගේ දුක ගැන අනුකම්පා කරන්නෝ විරලය, ධනපතියාට දුප්පතාගේ දුක ගැන අවබෝධයක් නැත, එයටත් වඩා පුදුමය නම් මුලින් දිළිඳුත්ව සිට උත්සාහයෙන් දියුණුවූ ඇතැම් ධනපතියන් තුළත් දුප්පතාගේ දුක ගැන කිසිත් අවබෝධයක් නොමැති වීමයි. දන්නම් මහාජන වැඩට උදව් දෙන්නෝ නොයෙක් විට කරන්නේ රජයෙන් උපකාර ලබා දීමයි, තමන්ගේ සාක්කුවෙන් සතයක් වියදම් නොකොට රජයෙන් උදව් ලබාදී මහාජනයාගේ සිත් දිනා ගන්නා දේශ පාලකයෝ හැම පළාතකම වෙසෙති එහෙත් එදා මහාජන වැඩට බැස්සෝ වියදම් කළ තරමක් වියදම් කලේ තමාගේ සාක්කුවෙනි ද සොයිසා මැති තුමා තරම් මහාජන ශුභ සිද්ධිය සඳහා පොදු වැඩට වියදම් කළ ජාති හිතෛෂියෙක් සිරි ලක නොවීය ආගම්, කුල, ජාති, පක්ෂ ආදි කිසිත් වෙනසක් නොසලකා එ තුමා රුපියල් ලක්ෂ ගණනක් මහාජන යහපත සඳහා යෙදෙව්වේ ය.

ලක් වැසි ජනතාවට සුවසේ ගමන් කිරීමට හා නිරුපද්‍රිතව රථ වාහනාදිය ගෙන යාමට මංමාවත් හා පාලම්

තනවා දීමෙන් ද, ගිලනුන්ට ගිලන් හල් සාදවා දීමෙන් ද, සිසුනට සික් හල් ඉදි කරවා දීමෙන් ද, ප්‍රසූතිකාවන්ට සූතිකාගාර තනවා දීමෙන් ද, භික්ෂූන් වහන්සේලාට ආවාස කරවා දීමෙන් ද, පාසැල් නඩත්තුවට ඉඩ-කඩම් වෙන් කිරීමෙන් ද, දුගී-මගී, යාචකාදීන්ට අම්බලම් තනවා දීමෙන් ද, නිවෙස් නැත්තවුනට නිවෙස් සාදවා දීමෙන් ද, චන්දනා-මාතාදිය පිණිස බුද්ධ ස්ථාන සඳහා භූමිභාග ප්‍රදානයෙන් ද, ක්‍රිස්තියානීන්ට දෙව් මැදුරු ඉදි කරවා දීමෙන් ද, විද්‍යාර්ථීන් සඳහා පොත් පත් පළ කරන්නවුනට මුදලින් උපකාර කිරීමෙන් ද, කුසගින්නෙන් පෙළෙන්නන් ස්ඳහා කෙත්වතු දන්දීමෙන් ද රෝගීන් සඳහා වෙදුන් නියුක්ත කිරීමෙන් ද, දියණිවරුන්ගෙන් නිදහස ලබාගැනීම සඳහා මවුපියන්ට දායාද මුදල් දීමෙන් ද, යාචකයන් සඳහා දන් සැල් තැබීමෙන් ද, සුචරිතය ඇති කිරීම සඳහා අපරාධ මර්දන සමිති ඇති කිරීමෙන් ද, මළවුන් සඳහා සොහොන් බිම් වෙන් කිරීමෙන් ද අසරණයන් සඳහා පින් වැටුප් පිහිටුවීමෙන් ද, දිළිඳුන්ට මුදලින් උපකාර කිරීමෙන් ද යනාදි වශයෙන් ආගම් භේද පක්ෂ භේද ආදියෙන් තොරව මෙ තුමා අනේපිඬු සිටු මෙන් නිර්ලෝභීව වියදම් කෙළේය.

**ඇඩින්බරෝ ඇපාණන්ගේ ලංකා ගමන:**

වික්ටෝරියා මහා රැජිණියගේ ද්විතීය පුත්‍ර ඇඩින්බරෝහි ඇපාණෝ ක්‍රි. ව 1870 මාර්තු මස 30 වැනි දින සිරිලකට ළඟා වූහ. මේ රාජකීය උත්තමයාට භෝජන සංග්‍රහයක් පැවැත්විය යුතුයයි අදහස් කළ චාර්ලිස් හැන්රි ද සොයිසා මැති තුමා ඒ සඳහා ස්වර්ණමය භාජන කීපයක් සකස් කර වූයේ ය. බගතලේ වලව්වේදී පැවැත්වුණු මේ විශේෂ සංග්‍රහය ගැන මෙ තුමන් විසින් වෙන් කරන ලද මුදල රුපියල් ලක්ෂයකි. අතිශයින් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වුණු මේ රාජකීය භෝජන සංග්‍රහයට ස්වදේශිකවූ ද, විදේශිකවූ ද සම්භාවනීය උත්තමයන් රැශියක් එහි ළඟා වූහ.



**මේ සිද්ධිය මහාවංශය තෘතීය භාගයෙහි දැක්වෙන්නේ මෙසේ ය:**

දේශ සංචාරණයෙහි යෙදුනාවූ වික්ටෝරියා මහා රැජිණියගේ දෙවන පුත්‍ර තෙමේ මේ කාලයෙහි මෙහි පැමිණියේ ය. චාර්ල්ස් හැන්රි ද සොයිසා නම් සිංහල ප්‍රභූ තෙමේ ඒ රජ කුමරු සිය නිවෙසට පමුණුවා, බොහෝ ධනය වියදම් කොට ශ්‍රේෂ්ඨ සංග්‍රහයක් කෙළේ ය. එද ඒ සංග්‍රහය තෙමේ ස්ව ජාතික ගෞරවයට හේතු විය.

ඇඩින්බරෝහි ආදිපාදයාණෝ ද, ද සොයිසා මැති තුමා හා එම මැතිණිය ඇතුළු ද සොයිසා පවුලේ උදවිය භෝජන සංග්‍රහයක් සඳහා රජ මැදුරට කැඳවූ හ. මේ භෝජන සංග්‍රහයෙන් පසු ද සොයිසා මැති තුමෝ කළුවර අල්මාරියක් හා ලංකා මැණික්වලින් පිරවූ ඇත්දත් පෙට්ටියක් ද ඇපාණන්ට පිරිනැමූහ ඇපාණෝ ද ද සොයිසා මැති තුමාට රන් පින්කටුවක් තෑගි කළහ

**හිතෝපදේශය හා ජානකීහරණය:**

වැලිගම ශ්‍රී සුමඞගල නාහිමියන්ගේ හිතෝපදේශ සන්නය හා රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමියන්ගේ ජානකී හරණ මහා කාව්‍යයත් ප්‍රසිද්ධියට පැමිණවීම සඳහා වියදම් දරන ලද්දේ ද සොයිසා මැති තුමා විසිනි.

**එංගලන්ත ගමන:**

ක්‍රි ව 1886 ජූලි 31 වැනි දින මෙ තුමෝ එංගලන්තයට සම්ප්‍රාප්ත වූහ. එහිදී එංගලන්තයේ පුණ්‍යාරෝග්‍ය ශාලා, අනාථ නිවාස, ශාස්ත්‍ර ශාලා ආදිය සඳහා මෙ තුමෝ නිර්ලෝභීව වියදම් කළෝ ය.

**ද සොයිසා මහතුන්ගේ දීමනා අතුරින් සමහරක්:**

මොරටුවේ වේල්ස්කුමාර ශාස්ත්‍ර ශාලාවට හා එම කුමාරිකා පාඨශාලාවට රුපියල් 300000 ක් ද, එම්මානුවෙල් දේවස්ථානය ද, කටුබැද්දේ මහ පාර ද, ලුනාවේ පාර හා

පාලම ද, අගුලානේ අම්බලම ද, වලපනේ පලාත් වාසීන්ට කුඹුරු හා ගෙවල් ද, අනාථයන්ට පිං වැටුප් ද, අගනුවර ද සොයිසා සූතිකාගාරය ද ශාන්ත තෝමස් පාඨශාලාවට රුපියල් 30000 ක් ද ක්‍රි. ව 1868 සාගතයෙන් අනාථ වූවන්ට රුපියල් 5000 ක් ද, අයර්ලන්තයේ සාගතයට රුපියල් 1000 ක් ද, යාපනේ මහා ශාස්ත්‍ර ශාලාවට රුපියල් 2000 ක් ද, පානදුරේ ආරෝග්‍ය ශාලාව ද, නයනාරෝග්‍ය ශාලාව ද, පානදුරේ ශාන්ත ජෝන්ගේ පාඨශාලාව හා දේවස්ථානය ද, ලුනාවේ ආරෝග්‍ය ශාලාව ද, මාරවිල ආරෝග්‍ය ශාලාව ද, හගුරන්කෙත දේවස්ථානය ද, එම පාඨශාලාව ද, එහිම විහාර භූමිය ද, ද සොයිසා ආරාමය, පාඨශාලාව හා භූමිභාගය ද, ආදර්ශ ගොවිපළක් පිහිටුවීමට රුපියල් 50000 ක් ද යනාදී වශයෙන් කෝටි භාගයකටත් වඩා පොදු කටයුතු සඳහා මෙ තුමෝ පරිත්‍යාග කළහ. අද ඒ දීමනාවල වටිනාකම තුන් කෝටිය ද ඉක්මවා සිටී. ශ්‍රීමත් චාර්ල්ස් හැන්රි ද සොයිසා මැති තුමාගේ එවකට පොහොසත්කම රන් පවුන්ඩ් 4000000 කි. (රුපියල් හතළිස් කෝටියකි.)

## කැතරින් ද සොයිසා ආර්යාව

**කල්පලතාවක්:**

ස්වකීය ස්වාමියා අනුගමනය කරමින් ද සොයිසා මැතිණිය මිහිබට කප් ලියක් සේ දිළිඳුන් කෙරෙහි කරුණාවෙන් පොදු වැඩ සැලැස්සුවා ය. එතුමියගේ වැඩිමහල් පුත් ජේ. ඩබ්ලිව් සී ද සොයිසා මැති තුමා ද මෑණියන්ගේ සත් ව්‍යාපාරයනට අනුමතිය හා අනුබලයත් දුන්නෝ ය.

**ක්ෂුද්‍ර ප්‍රාණී පරීක්ෂණාගාරය:**

චාර්ල්ස් හැන්රි ද සොයිසා සාමදාන විනිශ්චයකාර තුමා උමතු බලු විෂ කාරනකොට ගෙන මිය ගිය හෙයින් ද, එවකට උමතු බලු විෂට පිළියම් කරන ආණ්ඩුවේ ආරෝග්‍ය



ශාලාවක් නොතිබුණු හෙයින් ද ඒ පාඩුව පිරිමසාලනු වස් ක්ෂුද්‍ර ජීව පරීක්ෂණාගාරය පිහිටුවීම සඳහා මෙ තුමිය මුදල් දුන්නා ය.

**නයනාරෝග්‍ය ශාලාව:**



නේත්‍ර රෝගයන්ගෙන් පෙළෙන ලක්ෂ ගණන් ජනයන්ගේ ප්‍රයෝජනය සඳහා ද සොයිසා මහතුන්ගේ ධනව්‍යයෙන් පිහිටුවනු ලද වික්ටෝරියා නයනාරෝග්‍ය ශාලාව කොළඹ මහා රෝගය ශාලාවේ විශේෂ අංගයකි. මේ ආයතනයෙන් දෙනෝ දහක් දිනපතා ප්‍රයෝජන ලබති.

**ලුනාවේ ආරෝග්‍ය ශාලාව**

විශේෂයෙන් මොරටු නගරවාසීන්ගේත් සාමාන්‍යයෙන් අවට ගම්වැසියන්ගේත් ප්‍රයෝජනය සඳහා පිහිටුවූ මොරටුවේ ආරෝග්‍ය ශාලාව සිය ගණන් රෝගීන්ගෙන් පිරී පවතී. මේ ආරෝග්‍ය ශාලාව නොමැති නම් මොරටු පළාතේ දිළින්දන්ට සිදුවන්නේ බලවත් කරදරයකි.

**සම්භාවනීය ගෞරව නාමයක්:**

චාර්ල්ස් හැන්රි ද සොයිසා මැති තුමාගේ භාර්යාව වූ කැතරින් ද සොයිසා මැතිණිය ස්වාමියාගේ අඩි පාරේ යමින් මහාජනානුකම්පාවෙන් පොදු වැඩ සලස්වත්ම ඒ මේ රජ පාක්ෂික කාන්තාව කෙරෙහි සැලකිලිමත් වූ වික්ටෝරියා මහේෂිකාවෝ (ලේඩි) 'ආයනී' යන සම්භාවනීය ගෞරව

නාමයෙන් මේ තුමියට බුහුමන් කරනු ලැබූහ. ලංකාවේ මුලින්ම 'නයිට්' නාමයක් ලැබුවේ මෙ තුමියගේ පියාණන් වූ මොරටුවේ විසූ එකුරාර්ථ දේව ආදිත්‍ය ලිඳමුලගේ ජුසේ ද සිල්වා කුරු චන්ද්‍ර සූර්‍ය්‍ය තුමා ය. එහෙත් ඒ 'නයිට්' නාමය ඉංග්‍රීසි ආණ්ඩුව සම්බන්ධ නම්බු නාමයක් නොවේ. ඉතාලි රාජ්‍යයේ රෝම නුවර වතිකානු මාලිගාවේ ශුද්ධ වූ දහතුන් වැනි ලියෝ පාප් වහන්සේ විසින් දෙවා වදාරණ ලද්දකි. එහෙයින් ප්‍රථම වරට ඉංග්‍රීසි ආණ්ඩුවෙන් නයිට් කෙනෙකුගේ භාර්‍ය්‍යාවකට ලැබිය යුතු ගෞරවය (ලේඩි) ආර්‍ය්‍යා නාමය ලැබූ උත්තමාව ද සොයිසා ආර්‍ය්‍යාවයි.

---

## මුතුතන්ත්‍රිගේ සිමන් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රශේඛර මුදලි තුමා



සෝත්සාහයෙන් දියුණු වූ සිංහල ව්‍යාපාරිකයන් අතර චන්ද්‍රශේකර මුදලි තුමාට ලැබෙන්නේ නොදෙවැනි තැනකි. ලී මෝල් හිමියෙක් වශයෙන් ද, මිනිරන් පතල් හිමියෙක් වශයෙන් ද, ප්‍රසිද්ධ වැවිලි කරුවෙක් වශයෙන් ද විශාල කීර්තියට පත් වූ මෙ තුමා පොදු වැඩ හා බොදු වැඩ සඳහා නොමසුරුව වියදම් කෙළේ ය. මෙ තුමාගේ චරිතය ආදර්ශවත් කථාවන්ගෙන් හා රසික ප්‍රවෘත්තීන්ගෙන් ද සිත් ගන්නා එකකි.



### හොරේතුඩුවේ ගංගාරාමය:

මේ විහාරස්ථානයේ දියුණුවට මෙ තුමා මහා ධනස්කන්ධයක් වියදම් කෙළේ ය. විහාරස්ථානයේ හා දාගැබේද කටයුතු සඳහා විශේෂ උනන්දුවකින් ක්‍රියා කළ මෙ තුමා මේ සිද්ධස්ථානයෙහි දාගැබ අමුතුම ක්‍රමයකට කොරලවැල්ලේ ජේ. ප්‍රන්සිස්කු ප්‍රනාන්දු (පිංහාමි බාස්) මහත්මයාගේ සැලැස්මක් අනුව සෑදවූයේ ය. චෛත්‍යයේ සිවු දිශාවෙහි විහාර සතරක් ඇති වන සේ නිම කරන ලද මේ දාගැබ ප්‍රිය දර්ශනීය පූජ්‍ය වස්තුවකි

### බෞද්ධ විවාහ ලේකම්වරු:

දැන් මෙන් නොව ඉහත කාලයේදී බෞද්ධයෝ ද විවාහ ලියා පදිංචි කිරීම පිණිස ක්‍රිස්තියානි දේවස්ථාන කරා යා යුතුව තිබිණි. මෙය බෞද්ධාගමේ ගෞරවයට කැළලක් බවත් දියුණුවට බාධාවක් බවත් වැටහීගිය වැලිගම ශ්‍රී සුමංගල නා හිමි, මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි, මුතුතන්ත්‍රිගේ ලූවිස් ප්‍රනාන්දු මහතා, බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ෂිත පඬි තුමා ආදි උතුමන් විසින් බෞද්ධ විවාහ ලේකම් ක්‍රමයක් ඇතිකර ගැනීම සඳහා දරන ලද ශ්‍රේෂ්ඨ ප්‍රයත්නයට මුතුතන්ත්‍රිගේ සීමන් ප්‍රනාන්දු (සිඤ්ඤප්පු බාස්) මහත්මයාගේ නොමසුරු උපකාරය ලැබිණි. (ලූවිස් ප්‍රනාන්දු මහතා සිමන් ප්‍රනාන්දු මහතාගේ දෙටු සොහොයුරු ය)

### මුදලි නාමය:

මෙසේ ලෝ සසුන් වඩමින් දැහැමින් සෙමෙන් දිවිපෙවෙත යවන ඈම්. සිමන් ප්‍රනාන්දු මහතා මහජනයාගේ මෙන් ම රජයේ ද ගෞරවයට පාත්‍ර විය. ඉංග්‍රීසි ආණ්ඩුව මුදලි නාමයක් පිරිනැමීමෙන් මෙ තුමාට ගෞරව කෙළේ ය. එ කල මෙ තුමා (ශ්‍රී චන්ද්‍රශේඛර මුතුතන්ත්‍රිගේ යන) පෙළපත් නාමයට ද ගරු කිරීමක් වශයෙන්

ශ්‍රී චන්ද්‍රශේඛර යන්න සවකීය නාමයෙහි අගට එකතු කොට ඇම්. සීමන් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රශේඛර යයි ව්‍යවහාරයට පටන්ගත්තේ ය.

**දිගරොල්ලේ පාලම:**

පුරාණයේදී පැවැති ප්‍රසිද්ධ ගාලු පාර මොරටු නගරයේ සිට කොරළවැල්ල, කටුකුරුන්ද, එගොඩඋයන යන ගම් මැදින් වැටී තිබිණ. එගොඩඋයනේ දකුණු කොණේ තොටුපොළෙන් පානදුරයට එගොඩ විය යුතු ය. මෙසේ තිබියදී මේ තොටුපොළ හරහා පාලමක් දැමීමට රජය අදහස් කෙළේ ය. මේ අතර චන්ද්‍රශේඛර මුදලි තුමා මොරටුවේ සිට හොරේතුඩුවට පාලමක් දැමීම සඳහා යන මුළු වියදම දරන්නට සතුටු විය. මේ නිසා රජයේ පළමු අදහස වෙනස් විණි. මොරටු-හොරේතුඩු පාලම ඉදිවිණි. ප්‍රසිද්ධ ගාලු පාර හොරේතුඩුව මැදින් වැටීම නිසා හොරේතුඩුව, ගොරකාන, සරික්කාලිමුල්ල, පල්ලිමුල්ල, වලාන ආදී ගම් දියුණු විය.

**කදිම පිළිතුරක්:**

උසස් පංතියේ ධනපතියෙක් ව සිටි සර් ඇස් සී. උබේසේකර මහතාගෙන් දිනක් (සිඤ්ඤප්පු බාස්) ඇම්. සීමන් ප්‍රනාන්දු මහත්මයාට පනිවුඩයක් ලැබිණි "සිඤ්ඤප්පු බාස්, උඹට මිනිරන් වුවමනා කෙරේ නම් ඕනෑ තරම් මිනිරන් මට දිය හැක. වහාම දන්වා එවන්න." මේ පනිවුඩය ලත් සිඤ්ඤප්පු බාස් මහතා මෙහි මතු දැක්වෙන පිළිතුර උබේසේකර මහත්මයා වෙත යැවී ය. "සර් ඇස් සී. උබේසේකර, මට උඹෙන් වුවමනා කරන මිනිරමක් නැත. උඹට මුදල් වුවමනා කෙරේ නම් ඕනෑ තරම් මුදල් මට දිය හැක. වහාම දන්වා එවන්න" මේ ලිපිය ලත් උබේසේකර මහතා අන්දුන්-කුන්දුන් වූයේ ය. සිතින් මවාගත තුඹුණු රදළ පවටම පුස්සක් බව තේරුම් ගත්තේ ය.



**දනපති සිවුවරයෙක්:**

තමන් දුකසේ සපයාගත් ධන සම්භාරයෙන් තමන්ටත්, රටවැසියන්ටත්, ජාතියටත්, ආගමටත් සේවයක් කටයුතු යයි අදහස් කළ චන්ද්‍රශේඛර මුදලි තුමා බුදු සසුනේ දියුණුවටත්, රටේ දියුණුවටත් ලක්ෂ ගණන් ධනය පිදුවේය. පොදු ප්‍රශ්නවලදී යුක්තිය ඉටු කරවා ගැනීම පිණිස නොපැකිලිව සටන් කෙළේ ය. වෙනත් අය ආගමික කටයුත්තක් ගැන රුපියල් හත් අට දහක් වුවමනා වූ විට රට පුරා සම්මාදම් කරමින් සම්මාදම් ලෝකයක් ඇති කිරීමට තැත් කළහ. එබඳු අවස්ථාවලදී මෙ තුමා ඒ වුවමනා මුදල තම පසුම්බියෙන් දී සිංහල ගෞරවය ආරක්ෂා කෙළේ ය.

**වැදගත් පරම්පරාවක ආදී කර්තෘවරයා:**

පුත්‍රයන් දෙදෙනකුගේ හා දියණිවරුන් සදෙනෙකුගේ ද පියාණන් වූ චන්ද්‍රශේඛර මුදලි තුමාගේ දරු-මුණුබුරු පරපුරෙන් ලෝ-සසුන් දෙකට ඉමහත් සේවයක් ඇතිවිය. ඇම් තේමිස් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රශේඛර මැති තුමා හා (ශ්‍රී චන්ද්‍රශේඛර ආරාමය පිහිටු වූ) ඇම් ජේම්ස් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රශේඛර මැති තුමාත් මෙ තුමාගේ පුත්‍රයෝ ය. ඇම් සී. පෙරේරා මැතිණිය, වෛද්‍යාචාර්ය සී පී ද පොන්සේකා මැතිණිය, ගාල්ලේ බෙලිකන්දේ ඩැනිස්ටර් පෙරේරා මැතිණිය හා ඩබ්ලිව් ආතර් ද සිල්වා මැතිණියත් දියණිවරුන් අතුරින් ප්‍රසිද්ධියට පැමිණියෝ ය. හෙක්ටර් ද පොන්සේකා මැති තුමා, ඩොඩ්වෙල් ද පොන්සේකා මැති තුමා, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ උප සභාපතිව සිට පසුව බුරුම, ජපාන් ආදී රටවල ලංකා තානාපති පදවිවලට පත් වූ දිපාල් සුසාන්ත ද පොන්සේකා මැති තුමා, ෆ්‍රෙඩ් ද පොන්සේකා වෛද්‍යාචාර්ය තුමා, ඇල්බට් ද පොන්සේකා වෛද්‍යාචාර්ය තුමා, සිවිල් නිලධාරී ඇල් ඇස් බී. පෙරේරා මැති තුමා හා ඩැනිස්ටර් කුරේ වෛද්‍යාචාර්ය තුමාත් මුණුබුරෝ ය. සැනෙට් මන්ත්‍රීවරියක් වූ සිසී කුරේ මැතිණිය, (සිවිල් නිලධාරි බී ආර් පෙරේරා මැතිණිය, එච්. ඩබ්ලිව්. අමරසූරිය මැතිණිය හා රිචඩ් සල්ගාදු මැතිණියත් මෙ තුමාගේ මිණිබිරියෝ ය

## ඇම් අන්දිරිස් පෙරේරා අභයකරුණාරත්න දිශානායක මුදලි තුමා

පාණදුරේ නයිදෙහාමි මුදියන්සේ යන අපර නාමයකින් ප්‍රකට ව විසූ මෙ තුමා මහා ධන කුවේරයෙකි. පළාතේ බෞද්ධ-පොදු වැඩ සඳහා ලක්ෂ ගණනක් වියදම් කළ මෙ තුමා සාමාන්‍යයෙන් සිංහල බෞද්ධයන්ගේත්, විශේෂයෙන් කුරුකුල බෞද්ධයන්ගේත් ගෞරවයට හේතුවන මහා පුණ්‍යකර්මයක් කෙළේ ය

මඩ වගුරක් ව තුබුණු වැලිපිටියේ මෝදරවිලේ කොටසක් මුදු වැලි, කළුගල් ආදියෙන් පුරවා අලි-ඇතුන් යොදවා පාගවා සම කොට එහි විශාල චෛත්‍යයක් ගොඩ නැංවූයේ ය. සිංහල රජ කාලයෙන් පසු තනි පුද්ගලයකු විසින් බන්දවන ලද විශාල වූ ද, ශ්‍රෙෂ්ඨ වූ ද චෛත්‍ය රාජයා මෙය බැව් කාටත් පෙණේ. අභයකරුණාරත්න මුදලින්දාරාමය දියුණු කෙළේත් මෙ තුමා ය

ඇම්. කොර්නේලිස් පෙරේරා (ආරෙන්) මහත්මයා, ඇම්. ඒ පෙරේරා (ඒබ්‍රහම් මහත්මයා - රබර් රජ්ජුරුවෝ) කවීන්ද්‍ර ආතර් දිශානායක මහත්මයා ආදි රටට, දැයට, සමයට උදාර සේවයක් කළ මුණුබුරන් කීප දෙනෙක්ම මෙ තුමාට වූහ චීනයේ ලංකා තානාපති පදවිය දැරූ විල්මට් ඒ පෙරේරා මහතාත්, සිවිල් නිලධාරී ඇල්. ඇස්. බී පෙරේරා මහතාත් මෙ තුමාගේ මී මුණුබුරෝ ය. වෛද්‍යාචාර්ය ෆ්‍රෙඩ් පොන්සේකා මැතිණිය, වෝල්ටර් සල්ගාදු මැතිණිය හා එච්. ඩබ්ලිව්. අමරසූරිය මැතිණියත් මෙ තුමාගේ මී මිණිබිරියෝ ය.



## සුසෙවු ද සොයිසා ධර්ම ගුණවර්ධන විපුල ජයසූරිය කරුණාරත්න දිශානායක වාසල මුදලි තුමා

මෙ තුමා වූ කලී ජෝසප් ද සොයිසා මැති තුමාගේ බාල පුත්‍රයා ය. සී. එච්. ද සොයිසා මැති තුමාගේ සුළු පියා ය. මෙ තුමා සාමෙල් මුදියන්සේ යන අපර නාමයකින් ද ප්‍රසිද්ධ විය කුඩා කාලයේ පටන් නිර්භීත ගති-ගුණ ඇතිව සිටි මෙ තුමාගේ අනාගතය හොඳ වන බව කවුරුත් කීහ

දිළිඳුන්ගේ අගහිඟකම්, ඔනෑ එපා කම්, නැති බැරිකම් ගැන මනා අවබෝධයක් ඇතිව සිටි මෙ තුමා සියලු වේලේම දුප්පතාගේ පැත්ත ගෙන කටයුතු කෙළේ ය.

පානදුරේ ශුද්ධවූ යොහන්ගේ දේවස්ථානය, සාන්ත ජෝන්ගේ පාඨශාලාව හා ආරෝග්‍ය ශාලාවත් කරවන ලද්දේ මෙ තුමන් විසිනි. මාරවිල ආරෝග්‍ය ශාලාව හා දේවස්ථානයක් සාදවන ලද්දේත් මෙ තුමන් විසිනි. මෙ තුමාගේ ලමාඑතනී ද සවාමියා අනුගමනය කරමින් පොදු වැඩවල යෙදුනා ය.

> "සුසෙවු ද සොයිසා නම් රජ වාසල් දිසානා
> මුදලි තුම කෙරෙව් ඒ ඉස්පිරිස් තාලයක් වේ"
>
> (සුගත් කව් මිණ)

> "සු ර ර ද  වැනි දෙරණ බට ඉසුරෙන් නොම  ද
> කුරු ර ද  මහ ගොතින් පැවතෙන ලොව පබ  ද
> සුසෙවු ද  සොයිස වාසල මහ මුදලි ස  ද
> කළසොඳ  රාජකීය ඔසු හල බල සබ  ද"
>
> (කුමර සන්දේශය)

## ජුසේ ද සිල්වා චැවලියර් තුමා

චැවලියර් යන නාමය පාප් වහන්සේ විසින් භක්තිමත් රෝමානු කතෝලික ප්‍රභූවරයන් වෙත ප්‍රදානය කරනු ලබන නයිට් පදවියකි. මෙතුවක් මේ ගෞරව නාමය ලැබූ සිංහලයින්ගේ ගණන තුන් හතර දෙනකුට වැඩි නොවේ. මුලින්ම මේ ගෞරවයට හිමිකාරයා වූයේ ජුසේ ද සිල්වා චැවලියර් තුමා ය. මේ තුමා කොටහේනේ සාන්ත ලුසියා ආසන දෙව් මැදුරේ ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් දසදහසකටත් වඩා පරිත්‍යාග කෙළේ ය. සිය සමයේ හැම වැඩකටම නොමසුරුව මුදල් දුන්නේ ය. ආගමේ දියුණුවට කටයුතු කරන ගමන් රටේ පොදු වැඩ සඳහා ද නන් අයුරින් උදව් දුන්නේ ය, කැතරින් ද සොයිසා ආයම්මා මේ චැවලියර් තුමාගේ දියණියයි.

---

## හැන්රි අමරසූරිය මුදලි තුමා (ජේ. පී.)

සාමදාන විනිශ්චයකාර හැන්රි අමරසූරිය මුදලි තුමා වූ කලී බොදු වැඩට හා පොදු වැඩට නොමසුරුව ධනය පරිත්‍යාග කළ රෝහණ පුත්‍රයෙකි. දක්ෂිණ ලංකාවේ විසූ සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක්වූ මේ තුමා විශේෂයෙන් බෞද්ධ අධ්‍යාපනය සඳහා රුපියල් ලක්ෂ ගණනක් පරිත්‍යාග කෙළේ ය.

### මහින්ද විද්‍යාලය:

ගාලු පුරවර මහින්ද විද්‍යාල මන්දිරය වූ කලී මේ තුමාගේ නොමසුරු ධන පරිත්‍යාගයෙන් මහාජනයාට ලැබුණු ආශීර්වාදයෙකි. **'පාසැලක් ඉදිකරන්නා සිරගෙයක් වසා ලන්නේ ය'** යන කියමනට ගරු කළ මේ තුමා තමන් දහඩිය මහන්සියෙන් දියුණු කරගත් ලක්ෂ සංඛ්‍යාත කාසි ගස් සෙලවීමෙහි යහපත් විපාක වශයෙන් දහස් ගණන් ශිෂ්‍ය-ශිෂ්‍යාවනට ධර්ම ශාස්ත්‍රය හැදෑරීම සඳහා පාසැල්



ගණනාවක් ලැබිණි. මෙසේ කාසි ගස් සෙලවීමෙන් යහ මගේ ගමන් කරන හොඳ පරපුරක් ඇති වන්නාක් මෙන්ම කූට කෛරාටික කෙල-තොලු නිවට නායකයන් ද ඇතැම් විට ඇති වේ. එබන්දෝ නුගත් මහාජනයා මුළා කරමින් මහාජන මුදලින්ම රැකෙමින් යහවැඩ සඳහා සොලවන කාසි ගස්වලින් තම බඩ පුරවා ගනිති. නුගත් මහාජනයා ද රත්රන් පසෙක ලා රන් මෙන් දිලිසෙන පිත්තල රත්රන් යයි බදාගෙන අමාරුවේ වැටෙති. එදා කාසි ගස් නොසෙල්ලුනා නම් බෞද්ධ අධ්‍යාපනය සඳහා සිය ගණන් පාසැල් ඇති නොවේ. අද මෙන් රජයෙන්ම යහවැඩ සලස්වා ගන්නට එදා සුදු පාලකයන්ගේ ආණ්ඩු ක්‍රමයෙන් ඉඩ නොතිබිණි.


### පුණ්‍යායතන:

පාසැල් පමණක් නොව වෙහෙර, දාගැබ්, මංමාවත්, අම්බලම්, අනාථ නිවාස, ආරෝග්‍ය ශාලා, පිරිවෙන් ආදී බොදු-පොදු වැඩ සඳහා ද මේ තුමා කාසි ගස් සෙලවූයේ ය. දහ අතෙහිම සෙලවූයේ ය. රටේ, ජාතියේ, ආගමේ දියුණුව සැලැස්සුවේ ය. කටින් බතල කොළ සිටුවන වාචාල නායකයන් දහ අතින්ම පිරුණු රටක ස්වකීය ධනය පොදු වැඩට කැප කරන පින්වතුන්ගේ පහළවීම ජනතාවට ආශිර්වාදයෙකි. මේ මුදලි තුමන්ගේ පුත්‍රයන් වූ හැන්රි වුඩ්වඩ් අමරසූරිය මැති තුමා හා තෝමස් අමරසූරිය මැති තුමා ද පියා මෙන්ම පොදු වැඩ කරති.

---

## වෛද්‍යාචාර්ය සලමන් ප්‍රනාන්දු මැති තුමා

ඉගෙනීමෙහි අති දක්ෂයෙක් වූ සලමොන් ප්‍රනාන්දු නමැති තරුණයා වැඩිදුර ඉගෙනීම පිණිස එංගලන්තයට ගියේ එහිදී ඇම්. බී. සී. ඇම්, ඇල්. ආර් සී. පී, ඇම්. ආර්. සී. ඇස්. යන වෛද්‍ය උපාධි රැශියක් ලැබ පෙරළා සිය රට පැමිණියේ වෛද්‍ය කර්මයෙහි යෙදුනේ ය. මේ තරුණ



වෛද්‍යවරයාගේ සුවර්ණමය අනාගතය දුටු සී. එච්. ද සොයිසා මැති තුමා සිය දෙටු දියණියන්වූ පැනී ජෝර්ජියානා කැතරින් ද සොයිසා තරුණ මහත්මිය සලමොන් ප්‍රනාන්දු වෛද්‍යචාර්‍ය්‍ය තුමාට සරණ පාවා දුන්නේ ය. මෙසේ රාජකාරියේ යෙදෙමින් ටික කලක් ගත වන විට ප්‍රනාන්දු වෛද්‍යචාර්‍ය්‍ය තුමා මහාජන වැඩට ද බැස්සේ ය.


ක්‍රි. ව 1915 සිද්ධියෙන් සිංහලයාට සිදුවුණු විනාශය ගැන කුමක් කටයුතු දැයි සාකච්ඡා කරගැනීම සඳහා "පබ්ලික් හෝල්" ශාලාවේදී ජේම්ස් පීරිස් මැති තුමාගේ ප්‍රධානත්වයෙන් මහා සභාවක් පැවැත්විණි. මේ මහා සභාවේ




ඉතා වේගයෙන් කථාවක් පවත්වද්දී සවදේශාලයෙන් මත්වුණු දේශබන්ධු සලමොන් ප්‍රනාන්දු වෛද්‍යවරයාගේ ජාත්‍යානුරාගයෙන් රත්වූ රුධිරය ගමන් කිරීමට ලේ නහර ප්‍රමාණවත් නොවීමෙන්දෝ ලේ නහරයක් පිපිරීමෙන් ලක්ෂ ගණන් සිංහලයන් සෝ සුසුරේ ගිල්වමින් වේදිකාව මත මැරී වැටිණි. මෙසේ මේ ජාති හිතෛෂී කෞරව පුත්‍රයා රට වෙනුවෙන් සිය දිවි දුන්නේ ය. සිංහල වර්ගයා උදෙසා ස්වකීය අගනා ජීවිතය පරිත්‍යාග කෙළේ ය.

---

**සර් මාකස් ප්‍රනාන්දු වෛද්‍යචාර්‍ය්‍ය තුමා**



රජයේ ශිෂ්‍යත්වය දිනා ගනිමින් එංගලන්තයේ සරසවියකට ඇතුලුවූ මාකස් ප්‍රනාන්දු තරුණයා එහි සිටි යුරෝපීයයන් පවා පරදවා පළමු වැනි තැන ගනිමින්



වෛද්‍යවරයාගේ සවර්ණමය අනාගතය දුටු සී. එච්. ද සොයිසා මැති තුමා සිය දෙවූ දියණියන්වූ ෆ්‍රැනී ජෝර්ජියානා කැතරින් ද සොයිසා තරුණ මහත්මිය සලමොන් ප්‍රනාන්දු වෛද්‍යාචාර්ය තුමාට සරණ පාවා දුන්නේ ය. මෙසේ රාජකාරියේ යෙදෙමින් ටික කලක් ගත වන විට ප්‍රනාන්දු වෛද්‍යාචාර්ය තුමා මහාජන වැඩට ද බැස්සේ ය.


ක්‍රි. ව 1915 සිද්ධියෙන් සිංහලයාට සිදුවුණු විනාශය ගැන කුමක් කටයුතු දැයි සාකච්ඡා කරගැනීම සඳහා "පබ්ලික් හෝල්" ශාලාවේදී ජේම්ස් පීරිස් මැති තුමාගේ ප්‍රධානත්වයෙන් මහා සභාවක් පැවැත්විණි. මේ මහා සභාවේ



ඉතා වේගයෙන් කථාවක් පවත්වද්දී ස්වදේශාලයෙන් මත්වුණු දේශබන්ධු සලමොන් ප්‍රනාන්දු වෛද්‍යවරයාගේ ජාත්‍යානුරාගයෙන් රත්වූ රුධිරය ගමන් කිරීමට ලේ නහර ප්‍රමාණවත් නොවීමෙන්දෝ ලේ නහරයක් පිපිරීමෙන් ලක්ෂ ගණන් සිංහලයන් සෝ සයුරේ ගිල්වමින් වේදිකාව මත මැරී වැටිණි. මෙසේ මේ ජාති හිතෛෂී කෞරව පුත්‍රයා රට වෙනුවෙන් සිය දිවි දුන්නේ ය. සිංහල වර්ගයා උදෙසා ස්වකීය අගනා ජීවිතය පරිත්‍යාග කෙළේ ය.

---

## සර් මාකස් ප්‍රනාන්දු වෛද්‍යාචාර්ය තුමා



රජයේ ශිෂ්‍යත්වය දිනා ගනිමින් එංගලන්තයේ සරසවියකට ඇතුළුවූ මාකස් ප්‍රනාන්දු තරුණයා එහි සිටි යුරෝපීයයන් පවා පරදවා පළමු වැනි තැන ගනිමින්

සිය දස්කම් පෙන්වූයේ ය. ඇම්. ඩී. බී. ඇස්. සී. (ලන්ඩන්) ඇම්. සී. බී ආර්. ඒ. ඇස් යන වෛද්‍ය උපාධීන් ද ලැබ ගෙන පෙරළා සිය රට පැමිණියේ ය. විභාගයේදී මේ සිංහල තරුණයා විසින් ලියන ලද පිළිතුරු ලන්ඩන් කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනය වන්නට වන. පසු කලෙක බ්‍රිතාන්‍ය රජ පවුලේ රාජකීය වෛද්‍යයා වූ ඩෝසන් සාමි මේ විභාගයෙන් සමර්ථ වූයේ දෙවැනියා ලෙස ය.

කෞරව වංශික මාකස් ප්‍රනාන්දු තරුණ වෛද්‍යයා ඉතා දක්ෂ අත්දැමින් රෝගීන් දහස් ගණන් සුව කරමින් වෛද්‍යකර්මය කරන්ම තෝරු-බේරු ගත නොහැකි රෝගයන්ගෙන් පෙළෙන රෝගීන් පරීක්ෂා කරවා ගැනීම සඳහා ලංකාවේ සැම වෛද්‍යයෙක්ම මෙ තුමාගේ උපකාරය බලාපොරොත්තු වූයේ ය.

මෙසේ නුවණින් හා ධනයෙන් ද, එහෙයින්ම ලබන ලද යසසින් ද යුත් මේ තරුණ වෛද්‍යවරයා සී. එච් ද සොයිසා සිටුවරයාගේ තෙ වැනි දියණියන් වූ මාගරට් ප්‍රැන්සිස් මේරි ද සොයිසා තරුණ මහත්මිය හා සරණ බන්ධන ප්‍රාප්ත වූයේ ය.

කල් යත් යත්, ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ උගතුන්ගේ ආසනය සඳහා තරගයක් ඇතිවිය. මාකස් ප්‍රනාන්දු දොස්තර මහතා මේ තරගය සඳහා ඉදිරිපත් වූ සිංහලයා ය. යාපනේ ද්‍රවිඩයෙක් වූ රාමනාදන් මහතා ද ඔහු හා තරගයට ඉදිරිපත් විය. උගත්කමින් වැඩිවූ ද, නියම සිංහයෙක්වූ ද මේ තරුණ වෛද්‍ය රාජයා සිය කුලයට අයත් නොවීම බලවත් අඩු පාඩුවක් ලෙස ජාතිභ්‍රස්ම කුල මාමක පුද්ගලයන්ට පෙනිණි. කුල භේදයෙන් උමතු වූ මේ පිරිස මෙ තුමාට විරුද්ධව බලවත් ව්‍යාපාරයක් ඇති කෙළේ ය. උගත් ඡන්ද දායකයන්ට වඩා නූගත් ඡන්ද දායකයන් වැඩි කර ගැනීමෙහි ඔවුහු සමත් වූහ. එහෙයින් උගත් සිංහලයා පරදවා එතරම් උගත්කමක් නැති ද්‍රවිඩයා



උගතුන්ගේ අසුන දිනාගත්තේ ය. මහාජන පක්ෂය නමැති මහ මාවතේ ගමන් ගන්නට ආ උද්‍යෝගවත් තරුණයකු කුල භේදය නමැති ගල් මෝල නිසා ආණ්ඩු පක්ෂය නමැති අගලට තල්ලු වූයේ ය. එහෙත් එතුමා ඇතැම් මහාජන ප්‍රශ්නයන්හිදී සර් ජේම්ස් පීරිස් ආදී මහාජන මන්ත්‍රීන් සමඟ සහයෝගයෙන් උරෙනුර ගැටී වැඩ කෙළේ ය.

සිංහල වර්ගයාගෙන් තමාට ලැබුණු උපකාරය නිසා රාමනාදන් මහතා සිංහලයන් වෙනුවෙන් පැය ගණන් මන්ත්‍රණ සභාවේදී කථා කෙළේ ය. එහෙත් ඔහුට සිංහලයාගෙන් ලැබුණු අනුබලය ගැන සිතන විට ඒ එතරම් කාරියක් නොවේ.

ව්‍යවස්ථාදායක මන්ත්‍රී මණ්ඩලයේ ගරු සමාජිකයෙක් වූ මෙ තුමාට ආණ්ඩුවෙන් නයිට් නාමය ද පිරිනැමිණි. වුඩ්රන්ටන්-ප්‍රනාන්දු පනි කොමිසම සකස් කරන ලද්දේ මෙ තුමා හා එවකට නායක විනිශ්චයකාර ධූරය දැරූ වුඩ්‍රැන්ටන් තුමා විසිනි.

---

### රාජ නීතිඥ සී. ඇම්. ප්‍රනාන්දු මැති තුමා



"අයියේ, අයියා මේ පාර යන්න, මම අනිත් අවුරුද්දේ එන්නම්" යයි රාජකීය ශිෂ්‍යත්වය දිනාගෙන එංගලන්තය බලා යන වැඩිමහල් සොහොයුරාට ඔහුගේ මලණුවන් විසින් කොළඹ වරායේ ජැටියේදී, සුබ පතන ලද්දේ ය ඊ ලඟ අවුරුද්දේදී මේ මලණුවෝ රාජකීය ශිෂ්‍යත්වය දිනා ගෙන සිය අනාවැකියේ ප්‍රකාර නීතිය හැදෑරීම පිණිස

එංගලන්තයට ගියහ. අයියා වෛද්‍ය අංශයෙන් ප්‍රමුඛයා වී සමත් වූ අතර මල්ලී නීති අංශයෙන් ශ්‍රෙෂ්ඨත්වය ලබා සමර්ථ වූයේ ඇම්.ඒ, ඇල්.ඇල්.බී. යන පටබැඳි නාමයන් ද සමගය.

මේ කථාවේ අයියා සර් මාකස් ප්‍රනාන්දු වෛද්‍යාචාර්ය තුමා ය. මල්ලී රාජ නීතිඥ සී. ඇම්. ප්‍රනාන්දු මැති තුමා ය.

ඉගෙනීමෙන් පසු පෙරළා ලක්දිවට සැපත්වූ සී. ඇම්. ප්‍රනාන්දු මැති තුමා රජයේ සේවයට බැඳී කටයුතු කෙළේ ටික කලකින් රාජ නීතිඥ පදවියට ද පත්විය. කොතලාවල ආටිගල මිනීමැරුම් නඩුවේදී ආණ්ඩුවේ පක්ෂයට පෙණී සිටි මෙ තුමා ඉන්දියාවේ සිංහයා යයි ප්‍රකටව සිටි නීති විශාරද නෝටන් තුමාගේ කථාවට පිළිතුරු වශයෙන් කළ කථාව කරණ කොට ගෙන මහත් කීර්තියක් ලැබුවේ ය. මහාජන මන්ත්‍රීවරයෙක්ව සිටි සී. එච්. ඉසඩ් ප්‍රනාන්දු මැති තුමා මෙ තුමාගේ පුත්‍රයා ය. අතිගරු රාජ නීතිඥ ඇල්. ඇම්. ඩී. ද සිල්වා මැති තුමා මෙ තුමාගේ බෑණනුවෝ ය.

---

## සර් ජේම්ස් පීරිස් මැති තුමා

### අතට පත් පුන් සඳ

පීරිස් පවුල මොරටුවේ වැදගත් පරපුරකට අයත් වූවකි. දිනක් රෑ **අපලෝනියා පීරිස් මැතිණිය** සිහිනෙන් කෑගසන හඬක් ඇසී ඇගේ ස්වාමියා වහා අවදිවී බිරිඳ අවදි කරවා ඔබ කෑගැසුවේ ඇයිදැයි? විමසුවේ ය.





කොළඹ-වැලිකඩ
ගෝතමී ආරාමය කරවූ
**අපලෝනියා පීරිස් මැතිණිය**
(සර් ජේම්ස් පීරිස් මැතිඳුගේ
මෑණියෝ)


"අනේ, මා නරක හීනයක් දැක බියපත් වී කෑගැසුවා" යයි පීරිස් මැතිණිය පිළිතුරු දුන්නා ය.

"මොකක්ද? ඔබ බියපත් වූ ණු සිහිනය. බලන්න කියන්න" යයි ස්වාමියා විසින් විමසන ලදින් ඕ තොමෝ මෙසේ සිහිනය විස්තර කළා ය.

පාණදුරේ පන්සලේ බණ පිරිත් පින්කමක් පටන්ගෙන තිබුනා. ඒ පින්කමට මොරටු පළාතෙන් ගිනි පෙරහැරක් එනවා යයි ආරංචි වුනා. මාත් පෙරහැර බලන්නට මිදුලට බැස්සා. පසළොස්වක දවස නිසා හොඳට හඳ එළිය තිබුනා.

"අද හඳේ ලස්සණ" කියා කවුදෝ කියනවා ඇසී මා හඳ දෙස බලනවාත් සමගම හඳ මා දිහාවට වේගයෙන් ආවා. මේ මොන පුදුමයක්දැයි මා බියපත්වී කෑ ගසන විට පුන් සඳ මා අතට ආවා. මා අත ගසා දැම්මා. ඒත් හඳ බිම වැටුනේ නෑ. මා කෑගැසුවේ මේ නරක හීනය දැක බියපත් වූ නිසාය" යි පීරිස් මැතිණිය විසින් කියන ලද කථාව ඇසූ පීරිස් මහතා ද බියපත්වී පසු දින පහන්වූ සැටියේම එවකට පාණදුරේ වලානේ පන්සලේ වැඩලුන් දෙඩන්දුවේ සරණපාල මාහිමියන් වෙත ගොස් ඉකුත්වූ රෑ සිය බිරිඳ විසින් දක්නා ලද සිහිනය ගැන තොරතුරු විමසුවේ ය

එබස් ඇසූ දෙඩන්දූවේ හාමුදුරුවෝ "මේ සිහිනය ගැන බිය වෙන්නට කරුණක් නෑ. පීරිස් මැතිණියට පින්වත් දරුවෙක් ලැබේවි. ලංකාවේ රජ කරන තරම් පින්වත් දරුවෙක් ලැබේවි. හිතට දුකක් නොගෙන සතුටින් ඉන්න"යයි පීරිස් මහත්මාගේ දෞර්මනස දුරුකොට සෝම්නස උදා කළහ.



ස්වප්නයෙහි ඉෂ්ට විපාකයත් දෙඩන්දූවේ ස්වාමින්ගේ ප්‍රකාශයෙහි සත්‍යතාවයත් වැඩි කල් නොගොස්ම හෙළිවිය.



"දෙ වැනි රාජසිංහ රජ තුමාගෙන් පසු ලක්දිව පහළවූ ශ්‍රේෂ්ඨ සිංහලයා මේ තුමාය"යි එදා දියවඩන නිලමේ පදවිය දැරූ සී. බී. නුගවෙල දිසා මැති තුමා යම් කිසි සිංහලයකු ගැන වර්ණනා මුඛයෙන් කථා කෙළේ ද ඒ සිංහලයා අන් කෙනෙක් නොව සර් ජේම්ස් පීරිස් මැති තුමා ය.

මේ තුමා ළාබාල අවදියෙහිදී සිටම ඉගෙනීමේ දක්ෂයෙක් වූයේ ය. යම් කිසිවක් වරක් කියවූ පමණින් හෝ ඇසූ පමණින් ධාරණය කොට ගැනීමේ ඥාන ශක්තියක් මෙ තුමන් තුළ තිබිණි. මේ ළදරුවා කවදාහරි ඉතා උසස් පදවියක් ලබනවා ඇතැයි ඇතැමෙක් ළපටි ජේම්ස් ගැන අනාවැකි පළ කෙළේ එහෙයිනි.

ස්වභාෂාව තරමක් දුර ඉගෙනීමෙන් පසු ඉංග්‍රීසි පාඨශාලාවකට යවනු ලැබූ ජේම්ස් පීරිස් තෙමේ වැඩි කල් නොගොස්ම ස්වකීය දක්ෂ භාවය දැක්වූයේ ෂේක්ස්පියර් ත්‍යාගය, ටර්නර් ත්‍යාගය හා සමස්ත ශාස්ත්‍ර ශාලා ත්‍යාගය යන තෑගි තුනක්ම දිනාගත්තේ ය.

සමස්ත ශාස්ත්‍ර ශාලා ශිෂ්‍යත්වය දිනාගෙන එංගලන්තයට ගිය තරුණ ජේම්ස් පීරිස් ඉංග්‍රීසි වාක්‍ය රචනාව පිළිබඳ ත්‍යාගය හා තවත් තෑගි රැසක් දිනා ගැනීමෙන් ස්වකීය සමර්ථතාවය පළ කෙළේ ය. සුරගුරු වැනි නුවණින් හා චතුර කථාවෙන් ද යුක්තවූ තරුණ පීරිස් මහත්මා නීතිය හා අර්ථ ශාස්ත්‍රයෙහි විචක්ෂණයෙක් විය. ගෞරව පංතියේ ඇම්. ඒ., ඇල්. ඇල්. ඇම්. උපාධි ලබාගත් හෙතෙම (මැකෝල් සාමිගෙන් පසු හිස්ව තුබූ) කේම්බ්‍රිජ් ශාස්ත්‍ර ශාලාවේ ශාස්ත්‍රීය සංගමයේ සභාපති පදවියට පත් වීමෙන් ලංකාවට පමණක් නොව මුළු ආසියාවටම ගෞරවයක් අත්කොට දුන්නේ ය. නීති විශාරද යෙක්වූ පීරිස් මැති තුමා අනෙක් සියලුම අපේක්ෂකයන් අභිභවනය කොට 'මැක්මෝහන්' නීති ශිෂ්‍යත්වය ද දිනා ගත්තේ ය.

සිය රටට ලඟාවීමෙන් පසු නීතිඥ වෘත්තියෙහි යෙදී මඳ කලක් සිටි ජේම්ස් පීරිස් මැති තුමා ගාල්ලේ දිසාත්‍රික් නඩුකාර පදවියට පත් විය. නීති ගරුකව යුක්තිය පසිඳලීමෙහි සමත්වූ දිස්ත්‍රික් විනිශ්චයකාර තරුණ පීරිස් මහතා රජයේ මෙන්ම මහාජනයාගේත් සිත් දිනා ගැනීමෙහි පොහොසත් විය.

**සරණ බන්ධනය :**

බාල කාලයෙහි සිටියදී තම ඉගෙනීමට උපකාර කළ මයිලඬුවන්වූ ජේකබ් ද මැල් මහතාගේ නාමයට මේ තුමා ගරු කෙළේ ය. මෙ තුමා එවකට ප්‍රධාන පන්තියේ ව්‍යාපාරිකයෙක්වූ ජේකබ් ද මැල් මහතාගේ දෙවූ දියණියන් ආවාහ කොට ගත්තේ ය. මේ සරණ බන්ධනයෙන් ඔවුනට දූ පුතුන් සිවු දෙනෙකු ලැබිණි. ලෝක ප්‍රසිද්ධ සංගීත විශාරදයෙක්වූ ද, උපාධිධර අධිනීතිඥයෙක්වූ ද දේවාර්-සූර්යසේන (හර්බට් පීරිස්) මහතා හා ලෙනාඩ් පීරිස් මහතාත් පුත්‍රයෝ ය. ඒ ඇම්. ක්ලැමන්ට් දියෙස් මැතිණිය හා ජේ. ඇල්. කුරේ මැතිණියත් දියණිවරු ය.

සරණ බන්ධනයෙන් පසු විශාල ධන සම්භාරයක හිමිකාරයාවූ පීරිස් මැති තුමා රාජකාරියෙන් අස්ව තම සතු දේපල බලාකරගනිමින් මහාජන වැඩට ද සහභාගි වූයේ ය.

**අමද්‍යප වීරයන් මරණයෙන් මුදා ගැනීම :**

ක්‍රි: ව: 1915 අන්ධකාර කාලයේ එක් දවසක උදය කාලයේ චාමර්ස් ආණ්ඩුකාරයාගෙන් නියෝගයක් ලැබී සර් ජේම්ස් පීරිස් තුමා රජ වාසලට ගියේ ය. (ඒ මොහොතේ සර් ඩී. බී. ජයතිලක, ඇෆ්. ආර්. සේනානායක, ඩබ්ලිව්. ආතර් සිල්වා, ආතර් වී. දියෙස්, ඩී. ඇස්. සේනානායක, හැරී දියෙස්, පියදාස සිරිසේන ආදී අමද්‍යප වීරයෝ සිංහල මුස්ලිම් කෝලාහලය සම්බන්ධයෙන් සිරබාරයට ගන්නා ලදුව මරණ භයින් බියපත්ව උන්හ.)



චාමර්ස් ආණ්ඩුකාරයා සර් ජේම්ස් පීරිස් මැතිඳුන් පිළිගෙන "මේ කෝලාහලය ඉංග්‍රීසි ආණ්ඩුව පෙරළා දැමීම පිණිස අමද්‍යප සභාවේ බෞද්ධයන් විසින් ඇතිකරන ලද්දක් නොවේද? යි ප්‍රශ්න කෙළේ ය.

"උතුමාණන් වහන්ස, මේ වූ කලී ජාතීන් දෙකක් අතර ඇතිවූ අරගලයකි. මාගේ මිත්‍ර අමද්‍යප සභාවේ බෞද්ධයෝ එයට කිසිසේත් සම්බන්ධ නැත. ඔබ තුමා මාගේ වචනය පිළිගන්න යම් හෙයකින් ඔබ මේ කලහය රජයට විරුද්ධව මාගේ ඒ බෞද්ධ මිත්‍රයන් විසින් ඇතිකරන ලද්දකැයි සිතා ඔවුන්ට දඬුවම් දෙනවා නම් ඔවුන්ගේ මිත්‍ර අමද්‍යප සේවකයකු වශයෙන් ක්‍රිස්තියානිකාර මාත් සිරභාරයට ගන්න" යනුවෙන් අභීත උත්තරයක් දුන්නේ ය.

මේ ප්‍රකාශයෙන් චාමර්ස් ආණ්ඩුකාරයාගේ සැකය දුරුවී ගියේ ය. අමද්‍යප වීරවරයන්ගේ ආරක්ෂාව සැලසුනේ ය.

**ලංකා ජාතික සංගමය:**

ලංකා මාතාව වහල් බැම්මෙන් නිදහස් කොට ගැනීමේ ප්‍රබල සටනෙහි ජේම්ස් පීරිස් මැති තුමා පුරෝගාමීව ක්‍රියා කෙළේ ය සර් පී. අරුණාචලම්, ඇෆ්. ආර්. සේනානායක, ඊ. ටී. ද සිල්වා ආදී ජන නායකයන් සමග පීරිස් මැති තුමා ද මේ සටනෙහි පතාක යෝධයෙක්ව කටයුතු කෙළේ ය.

කලකට පසු කොම්පඤ්ඤ වීථිය කොට්ඨාශයේ නාගරික මන්ත්‍රී ධුරයට ද, පහත රට වැවිලිකරු සමිතියේ සභාපති පදවියට ද, මහාජන සේවක සමිතියේ සභාපති පදවියට ද පත්වූ මෙ තුමා අමද්‍යප ව්‍යාපාරයේදී ආතර් වී. දියෙස්, ඇෆ්. ආර්. සේනානායක ආදී අමද්‍යප වීරයන් සමග සහයෝගයෙන් ක්‍රියා කෙළේ ය.

## නිල නොලත් මන්ත්‍රීන්ගේ ප්‍රමුඛයා:

ව්‍යවස්ථා දායක මන්ත්‍රණ සභාවේ නිල නොලත් මන්ත්‍රීන්ගේ ප්‍රමුඛයා වශයෙන් ජේම්ස් පීරිස් මැති තුමා පත්විය. ඉන් පසු මෙ තුමා සකල දේශපාලන ප්‍රශ්නයකදීම ඩී. බී. ජයතිලක, ඈ.ජ. ආර්. සේනානායක, ආතර් ද සිල්වා ඒ. ඩබ්ලිව්. පෙරේරා, ඩී. ඇස්. සේනානායක ආදී ජන නායකයන් සමග උරෙනුර ගැටී කටයුතු කෙළේ ය.

ප්‍රතිසංස්කෘත මන්ත්‍රණ සභාවේ ප්‍රධාන සභාපති උතුමාණන් වහන්සේ ය. එහෙත් එ තුමා මූලාසනය භාර ගත්තේ අවුරුද්දකට වරක් හෝ දෙවරෙකි. විශේෂ සිද්ධියක් නොවී නම් එ තුමාගේ මුලසුන ගැනීම එක් වරකට සීමාවිය. උප සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මන්ත්‍රණ සභාව පැවැත්වේ. මේ මන්ත්‍රණ සභාවේ මුලින්ම උප සභාපති පදවියට පත්වූයේ ජේම්ස් පීරිස් මැති තුමා ය. ලාංකික ජනතාවට අමරණීය සේවයක් කළ දේශබන්ධු ජේම්ස් පීරිස් මැතිඳු කෙරෙහි ප්‍රසන්නවූ අග රජ තුමා විසින් 'නයිට්' නාමයෙන් මේ තුමාට බුහුමන් කරන ලදී.

---

## ජෝර්ජ් ඒ. ධර්මරත්න අධිනීතිඥ තුමා

තමන් උපන් වංශයට තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් කොටස ඉටුකරමින් රටටත් ජාතියටත් සේවයක් කළ උතුමන් අතුරින් ධර්මරත්න අධිනීතිඥ තුමාට ලැබෙන්නේ නො දෙ වැනි තැනකි. මෙ තුමා ඉංග්‍රීසි භාෂාවෙහි මෙන්ම සිංහල භාෂාවෙහි ද දක්ෂයෙකි. ස්වකීය වංශයෙහි ගෞරවය ආරක්ෂා කරගනිමින් සත්‍යවූ ඉතිහාසයක් ලොව හමුවෙහි තැබීම පිණිස මෙ තුමන් විසින් 'කරා-ගොවි කොන්ටෙස්ට්' නම් ග්‍රන්ථය සම්පාදනය කරන ලද්දේ ය. මොරටුවේ 'ධර්මරත්න මාවත' ඇති කරන ලද්දේ මෙ තුමාගේ නාමයට ගරු කිරීමක් වශයෙනි.




## ජී. ඇම්. ද සිල්වා නීතිඥ තුමා

මොරටුවේ ගෞරවය ආරක්ෂා කරගනිමින් පොදු වැඩෙහි යෙදුනු නීති විශාරදයෙකි. නීතිඥ වෘත්තිය සාර්ථක අන්දමින් ගෙනගිය ටික දෙනා අතුරින් මෙ තුමා ද එක් කෙනෙකි. මොරටු සංගමය නමින් එදා පැවැති බල මණ්ඩලයේ ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කළ මෙ තුමා නිතරම සිංහල ජාතියේත් ලංකාවේත් දියුණුව ප්‍රාර්ථනා කෙළේ ය. ශ්‍රේෂ්ඨ මොරටු පුත්‍රයෙකි. නියම මහත්මයෙකි.

---

## ඩබ්ලිව්. ආතර් ද සිල්වා සෞඛ්‍යාමාත්‍ය තුමා



මහාජන වැඩවලින් ඇතැම් නායකයන් ධන පතියන් වන රටක මහා ජන වැඩවලින් නිර්ධන භාවයට පත්වූ උතුමකු ගැන අසන්නට ලැබීම පුදුමයකි. එහෙත් සාධු චරිතයෙන් ශාන්තුවර යෙක් වූ ද, වීර වික්‍රම-යෙන් ගාමණී අවතාර යක් වූ ද, ඥාන මහිමයෙන් අගස්තිමුනි වැනි වූ ද, 'ශ්‍රාවස්තියේ සෘෂිවරයා' යන අපර නාමයකින් සකල ලාංකිකයන් විසින් ගරු කරනු ලබන ඩබ්ලිව්. ආතර් ද සිල්වා මහත්මා වූ කලී මහාජන වැඩ වලින් ම නිර්ධන භාවයට පත්වූ උතුමෙකැයි කවුරුත් අවිවාදයෙන් පිළිගනිති.

පශු වෛද්‍යවරයෙකු වශයෙන් ජීවිතය ආරම්භ කළ මෙ තුමා මොරටුවේ හොරේතුඩුවේ ඇම්. සීමන් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රශේඛර මුදලි තුමාගේ තෙ වැනි දියණිය ආවාහ කොට ගෙන මහා ධන කුවේරයකු වූයේ ය ශ්‍රී නිවාස චතුශ්‍යාය, ශ්‍රාවස්ති වෙල්යාය ආදි වතු කීපයක අයිතිකාරයා වූයේ ය.

**ශ්‍රාවස්ති මන්දිරය:**

කොල්ලුපිටියේ ඇඹින්බරෝ ක්‍රෑසන්ට්හි පිහිටි මෙ තුමන්ට අයත්වූ සුවිශාල මන්දිරය ලංකාවේ තනි පුද්ගලයකුට අයිතිව තුබුණු අගනාකමින් වැඩිවූ ද, ලස්සණින් අශතැන් ගත්නාවූ ද මහා ප්‍රාසාදයකි. ප්‍රංශයේ සැලැස්මක් අනුව රුපියල් අට ලක්ෂයක් පමණ වියදම් කොට තැනවූ මේ මහා මන්දිරයෙහි ලැගුම් ගෙන, ද සිල්වා යුවළ ගෙන් ආගන්තුක සත්කාර ලත් සම්භාවනීය අමුත්තන් අතර මහත්මා ගාන්ධි, රවීන්ද්‍රනාත් තාගෝර්, ශ්‍රී නිවාස ශාස්ත්‍රී ආදි උතුමෝ ද වෙති.

**මෝනිං ලීඩර් පත්‍රය හා ලක්මිණ:**

වරක් ලංකාවේ ප්‍රධාන පත්‍රයක්ව තුබුණු මෝනිං ලීඩර් දිනපතා ප්‍රවෘත්ති පත්‍රයේ සහ ලක්මිණ නම් දිනපතා ප්‍රවෘත්ති පත්‍රයේ ද කලක් අයිතිකරුව සිටි ද සිල්වා මැති තුමා මේ පුවත්පත් දෙක මහාජන මතය තහවුරු කිරීම සඳහා යෙදුවේ ය. අයුක්තියට පහර දී යුතුකම ඉටු කරවා ගැනීම පිණිස යෙදුවේ ය. රුපියල් අට ලක්ෂයක් පමණ අලාභ විඳිමින් ද ගෙන ගියේ ය.

**ශ්‍රාවස්ති වෙල්යාය:**

ක්‍රි. ව. 1918 අවුරුද්දේ සහල් දුෂ්කරත්වයෙන් ලක් වැසියෝ අපමණ පීඩා වින්දෝ ය. සා දුකින් පෙළී එයින්ම රෝගාතුරවී ඇතැමෙක් මළෝ ය. මතු කාලයෙහි ලක් වැසියන් මෙබඳු බියකරු ඉරණමකට ලක් නොවන ලෙස



නිසරු බිම් සරු කළ යුතුය. මින්නේරිය අස්වැද්දිය යුතුය. ගිනුරජවෙල අස්වැද්දිය යුතුය. රජ රට වගා කළ යුතුය යි මහාජන රාවයක් ලක පුරා ඇති විය.

ඇතැම් ප්‍රභූවරයෝ කීප දෙනා බැගින් එකතුවී අක්කර දෙතුන් සියයේ කුඹුරු අස්වැද්දූහ. සුදු මහතුන්ගේ සමාගමක් මගින් ද අක්කර දහසක් ගොවිතැන සඳහා සකස් කරන ලදී. පරාක්‍රමකාමී ආතර් ද සිල්වා මැති තුමන්ට තමාගේත් සව ප්‍රියාවගේත් සහල් මනාව සපයා ගැනීම අසීරු කරුණක් නොවී ය. එහෙත් අනාගතයෙහිදී ඇතිවන සාගතයකදී තමන් පමණක් සුවසේ කා බී ඉඳීමෙන් ලොවට වැඩක් සිදු නොවන බැව් සැලකූ මෙ තුමා සවකීය මහා ප්‍රාසාදයේ නාමයෙන් ම අක්කර දෙදහසක කුඹුරු යායක් අස්වැද්දුවේ ය. 1918 ජූලි මස 18 වැනි දිනට යෙදුණු සුබ මොහොතෙහි ලකිසුරු තුමා හා මෙතුමා රිදී නගුල්වලින් හෑම කළ හ. ගොවිතැනට බට සෙස්සෝ 'මේ වැඩේ හරියට ගඟට ඉණි කැපීමක් වැනි පාඩු ජාවාරමක්ය" යි කියමින් අතර මගදී නතර වූහ. එහෙත් අප්‍රතිහත ධෛර්යයෙන් යුක්ත වූ ආතර් ද සිල්වා මැති තුමා සවකීය ව්‍යාපාරය නොකඩවා ගෙන ගියේ ය. රුපියල් අට ලක්ෂයක් පමණ පාඩු විඳිමින් ගෙන ගියේ ය. අදත් ගොවි පවුල් දෙසියයක් පමණ මේ ශ්‍රාවස්ති වෙල් යායෙන් රැකෙති.

**පොත් පත් හා ශාස්ත්‍රීය සංග්‍රහ:**

ඉංග්‍රීසි භාෂාවෙහි මෙන් ම ප්‍රාචීන භාෂාවන්හිද විශාරදයෙක් වූ මෙ තුමා ගොවිකම් සඟරාව ආරම්භ කොට එහි කර්තෘ ධුරය ද දැරුවේ ය. කපු වැවීම පිළිබඳව පැවැත්වුණු ලිපි තරගයේදී "ජෝර්ජ් වෝල්" ත්‍යාගය මේ තුමාට ලැබිණි. 'සිලෝන් නැෂනල් නම් ඉංග්‍රීසි සඟරාව, කුවේණි කාව්‍යය, ලෝවැඩ සඟරාව, මහාවංශය, දීඝනිකාය,

ජන සම්මත කාව්‍යය' යන පොත් මෙ තුමාගේ සම්පාදකත්වයෙන් පළ විණි. ඩෙන්මාක්හි පූජීදිග ශාස්ත්‍රීය සම්මේලනයෙහි ද, ඔක්ස්පර්ඩ්හි ධර්ම ශාස්ත්‍රීය සම්මේලනයෙහි හා නිව්යෝක්හි සම්මේලනයෙහි ද චතුර කථාවන් පැවැත්වීමෙන් මෙ තුමා විසින් කරන ලද සේවය ඉතා අගනේ ය.

**අධ්‍යාපනයට කළ උදාර සේවය:**

ද සිල්වා මැති තුමා සාමාන්‍යයෙන් සමස්ත ලාංකිකයන්ගේ අධ්‍යාපනය සඳහා ද විශේෂයෙන් සිංහල බෞද්ධයන්ගේ අධ්‍යාපනය සඳහා ද උදාර සේවයක් කෙළේ ය. පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ පාඨශාලා සාමාන්‍යාධිකාරි ධුරය අටළොස් වසක් ද එහි සභාපති පදවිය කිප වතාවක් ද දැරූ මෙ තුමා වරින්වර ගුරු වැටුප් ගෙවීම, ගොඩනැගිලි තැනවීම ආදි කටයුතු සඳහා රුපියල් ලක්ෂ ගණනක් වියදම් දැරුවේ ය. මෙ තුමා කෙරෙහි ප්‍රසන්න වූ සියම් රජ තුමෝ 'රාජ රුචි' යන ගෞරව නාමයෙන් මෙ තුමා පිදූහ.

**බෞද්ධ මන්දිරය නිදහස් කෙළේ ය:**

කොළඹ බෞද්ධ මන්දිරය පරම විඥානාර්ථ බෞද්ධ සංගමය විසින් තෙමහල් පායක් හා දාගැබක් ද සහිතව ගොඩනගන ලද්දේ වී නමුත් උගසකට බැඳී තිබිණි. එවකට ණය ගැනිව උන් ආතර් ද සිල්වා මැති තුමා ශ්‍රාවස්ති මන්දිරය තුන් වැනි උගසකට බැඳ රුපියල් 27000 ක් ගෙන ඒ මුදලින් බෞද්ධ මන්දිරය නිදහස් කොට තැබුවේ ය. සවකීය ශ්‍රාවස්ති මන්දිරය ණයට විකිණී ගියේ ය.



**ඩබ්ලිව්. ආතර් ද සිල්වා මැතිණිය**

**සඳුන් රුක වැලඳගත් සමන් වැල:**



පරාර්ථකාමි මහා ජන සේවකයෙක්වූ ද, පරිත්‍යාගශීලී බෞද්ධ උපාසකයෙක් වූ ද ආතර් ද සිල්වා මැතිඳුගේ හා චන්ද්‍රසේකර මුදලිඳුගේ දියණියක් වූ, ද සිල්වා මැතිණියගේත් සම්බන්ධය සඳුන් රුකේ හා සමන් වැලේ සම්බන්ධය වැනි විය. මේ උතුමා හා උතුමිත් සිය ගුණ සුවඳින් සිරිලක හොබවමින් පොදු වැඩට රුකුල් දුන්හ.

**මහාජන සේවය:**

ලාංකික කාන්තා පක්ෂය මැදී ඉන්නා ප්‍රපාතයෙන් ඔවුන් නගාලනු වස් මෙ තුමී මහිලා සමිතිය ආරම්භ කොට ඒ මගින් අනල්ප සේවයක් කළා ය. මහිලා සමිතියේ සභාපතිණිය වූ ඕ තොමෝ කාන්තාවන්ගේ අත්කම්, ගෙත්තම්, පන්නම්, ඉවුම්, පිහුම් ආදිය දියුණු කරවමින් ගම්-නියම්ගම්හි සැරිසරමින් ගමක්-ගමක් පාසා මහිලා සමිති පිහිටෙව්වා ය. කාන්තා පක්ෂය මගින් කළ හැකි මහාජන සේවය පෙන්නා දුන්නා ය. අද සැනෙට් මන්ත්‍රිණී සිසී කුරේ මැතිණිය මේ ව්‍යාපාරයෙහි නායිකාව වී සුළු ඔබගේ අඩිපාරේ ගමන් කරමින් උදාර සේවයක් කරයි.

## වැල්ලවත්තේ ශ්‍රී ලඞ්කාධාර සමාගමේ පාඨශාලාව:

මේ මහා ශාස්ත්‍ර ශාලාව හා එහි භූමි භාගයත් මෙ තුමීගේ විශාල පරිත්‍යාගයෙකි. රුපියල් ලක්‍ෂ ගණනක් වටිනා මේ දීමනාව නිසා අද සිය ගණනක් ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ ධර්ම ශාස්ත්‍ර හදරති. (කලක් මේ ශ්‍රී ලඞ්කාධාර සමාගමේ පාඨශාලාව අභ්‍යාස විද්‍යාලයක් ව ද තිබිණි.)

---

## ජේම්ස් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රසේකර මැති තුමා



මොරටුවේ හොරේතුඩුවේ ඇම් සිමන් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රසේකර මුදලි තුමාගේ හා එම ලමා එතනීගේත් දෙවැනි පුත් අමා ජේම්ස් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රසේකර මැති තුමා බාල කාලයෙහි පටන් ම ත්‍යාගවන්තයෙක් විය. මේ තුමන්ගෙන් උපකාරයක් බලාපොරොත්තු වෙන් පැමිණි කිසිවෙක් හිස් අතින් පෙරළා නොගියේ ය. තමන් යටතේ සේවය කළ අයට හොඳින් සංග්‍රහ කිරීමත්, විපතේදී පිහිට වීමත් මෙ තුමාගේ සිරිත විය. බෞද්ධාගම කෙරෙහි ඉමහත් ලැදියාවක් ඇතිව උන්



මෙ තුමා සීය පියාණන් ප්‍රමුඛ දායකත්වය ගෙන උන් හොරේතුඩුවේ ගංගාරාමයෙහි දියුණුව නිතරම ප්‍රාර්ථනා කෙළේ ය.

මෙසේ ආගම කෙරෙහි ශ්‍රද්ධා භක්තියෙන් යුතුව කටයුතු කරමින් උන් ජේම්ස් ප්‍රනාන්දු චන්ද්‍රසේකර මැති තුමා හතළිස් හැවිරිදි වියෙහිදී බලවත් ලෙස රෝගාතුර විය. තමාට සුවයක් නොලැබෙන බව ඉදුරා දත් මෙ තුමා සිය මුළු දේපලම කැප කොට අරමුදලක් පිහිටෙව්වේ ය. චන්ද්‍රසේකර අරමුදල නමින් හැඳින්වෙන්නේ රුපියල් ලක්‍ෂ ගණනකින් යුක්ත වූ මේ මහා පරිත්‍යාගය යි.

එවකට මේ අරමුදලෙහි අගය රුපියල් දහහත් ලක්‍ෂය යැයි කියනු ලැබේ. එකල ඉඩ-කඩම් ආදියෙහි වටිනාකම ඉතා අඩු ය. දැන් එමෙන් කීප ගුණයක් වටී. එහෙයින් දැන් මේ අරමුදලේ වටිනාකම රුපියල් ලක්‍ෂ ගණන ද ඉක්මවා ඇතැයි කිව හැක. මේ අරමුදලේ ආදායමෙන් අවුරුදු පතා මහාජනයාට උපකාර සලස්වන්නේ රජයේ ද අනුමතිය පරිදි ය. සිය අවුරුද්දේ මේ අරමුදලින් මහාජන ශුභ සිද්ධිය සඳහා ද ආගමික කටයුතු සඳහා ද රුපියල් හතළිස් පන්දහස් අටසිය පණහක් පරිත්‍යාග කළ බැව් 1961. 5. 10 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් පෙනේ. මෙසේ අවුරුද්දක් පාසාම චන්ද්‍රසේකර අරමුදලින් මහා ජනතාව ප්‍රයෝජන ලබති. මේ අරමුදල පිහිටුවා දැනට අවුරුදු පණහකි. එහෙයින් රුපියල් විසි ලක්‍ෂයක් පමණ මේ අරමුදලින් දැනට පොදු වැඩ සඳහා යොදවා ඇතැයි කිව හැක. මෙබඳු අරමුදලක් පිහිටෙව්වේ මේ කෞරව වංශික ශ්‍රී චන්ද්‍රසේකර මැති තුමා හැර වෙන කවුරු ද?

## සර් එච්. ඇල්. ද මැල් මැති තුමා

යම්කිසි පුද්ගලයකුගෙන් රැකෙන පිරිස අනුව ඔහුගේ කීර්තිය මැනගත හැක. යමෙක් බොහෝ දෙනකුට රැකියාව දේ නම් හේ ශ්‍රේෂ්ඨයෙකි. ලක්දිව තනි පුද්ගලයෙකු වශයෙන් බොහෝ දෙනකුට රැකියාව දීම ගැන අන් හැම ධනපතියකුට ම වඩා උසස් තැන ගත්තේ සර් එච්. ඇල්. ද මැල් මැති තුමා ය.

ධනපතියකු වශයෙන් ඉපිද ස්වකීය ධනය නානා ව්‍යාපාරයන්හි යොදවා තව-තවත් වැඩි දියුණු කොටගත් ලක්ෂපතියන් ටික දෙනා අතුරින් ප්‍රමුඛයා මෙ තුමා ය යි කීම අතිශයෝක්තියක් නොවේ. නීතිඥ විභාගයෙන් සමත් වූවත් එය අත්හැර සිය පියාණන් වූ ජේකොබ් ද මැල් මැති තුමාගේ අඩිපාරේ යමින් මිතිරත් වෙළඳාමට පටන් ගත් එච්. ඇල් ද මැල් මැති තුමා ප්‍රධාන පංතියේ ව්‍යාපාරිකයෙක් විය. මෙ තුමා පහත රට වැවිලිකරු සංගමය අරඹා එහි සභාපති ධුරය හා එම සංගමය වෙනුවෙන් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ මන්ත්‍රී ධුරයක් ද උසුලමින් ගොවිතැන හා සිවුපිමට විශාල උනන්දුවක් ගත්තේ ය. ප්‍රදර්ශන පැවැත්වීමෙන් ගොවි කර්මාන්තය සඳහා මහාජනයා උනන්දු කරවූයේ ය. වේල්ස්හි කුමාරයන්ගේ ලංකා තරණය නිමිති කොට ගෙන පැවැත් වූ මහා ප්‍රදර්ශනයේ කාර්‍ය්‍යාධිකාරී මණ්ඩලයේ ප්‍රමුඛ සාමාජිකයන් දෙතුන් දෙනාගෙන් මෙ තුමා ද එක් කෙනෙකි.

### නගර සභාවේ උපදේශක ධුරය:

මෙ තුමා පුරා එකුන් තිසි වසක් ම කොළඹ නාගරික සභාවේ කොම්පඤ්ඤ වීදිය කොට්ඨාශයේ උපදේශක ධුරය දැරුවේ ය. ද මැල් සෙල්ලම් පිට්ටනිය ඇති කෙළේත් මෙ තුමා ය.



### මැල් සිරි පුරය:

හිරියාල හත්පත්තුවේ ජනයා සිය දෙගුරුන්ට දක්වන සැලකිල්ල ගැන කළ ගුණ සැලකිල්ලක් වශයෙන් ද, ඒ පළාතට තමන් තුළ ඇති ආදරය පෙන්වීමක් වශයෙන් ද මෙ තුමා හිරියාලේ සිට දඹුල්ලට යන පාරේ දහසයේ සැතපුම් කණුව අසල මැල් සිරි පුර නම් සකලාංග සම්පූර්ණ මහා නගරවරයක් ඉදිකර වූයේ ය.

### සී. බී. ඊ. නාමය ආදි නම්බු නාම:

මහාජන සේවය ද නොකඩවා කරමින් රාජපාක්ෂික ව කටයුතු කළ මෙ තුමාට ඉංග්‍රීසි ආණ්ඩුව මගින් 'සී. බී. ඊ.' යන ගෞරව නාමය ප්‍රදානය කරන ලදී. චිලී රට වෙනුවෙන් ලංකා තානාපති පදවිය දැරුවේත් මෙ තුමා ය. බෙල්ජියම් මහ රජ තුමා විසින් 'ෂැවලියර්' නමැති සිවු තනතුර පිළිබඳ ගරු නාම සම්මුතිය ද, ඉංග්‍රීසි ආණ්ඩුව මගින් 'නයිට්' නාමය ද මෙ තුමන් වෙත ප්‍රදානය කරන ලදී.

පුත්තලම් කොට්ඨාශය වෙනුවෙන් මහාජන ඡන්දයෙන් ශ්‍රේරී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අසුනක් හෙබවූ මෙ තුමා සකල ජාතික ප්‍රශ්නයකදීම ඩී. බී. ජයතිලක, ඩබ්ලිව්. ආතර් ද සිල්වා, සී. ඒ. හේවාවිතාරණ, ඇෆ්. ආර්. සේනානායක ආදි ජන නායකයන් සමඟ උරෙනුර ගැටී සහයෝගයෙන් ක්‍රියා කෙළේ ය

### වීර ක්‍රියාවක්:

මෙ තුමාගේ වත්තක උන් මුලාදැනියකුට (මෙ තුමාගේම) ඥාතියකු විසින් වෙඩි තබන ලදී. මෙයින් පසු වියරු වැටුණු සාහසිකයා තවත් සේවකයනට වෙඩි තැබීමේ අදහසින් තුවක්කුව ද රැගෙන දිව යද්දී මෙ තුමා අභීතව ලුහුබැඳ ගියේ ය. අවාසනාවකි. අනුන් මුදා ගැනීමේ වීර ක්‍රියාවේ යෙදුණු මෙ තුමා සාහසිකයාගේ වෙඩි පහරට ලක් වී වීරයකු වශයෙන් අවසන් හුස්ම හෙළුවේ ය.

**පරම්පරාව:**

ක්‍රි. ව. 1198 දී ශ්‍රී නිශ්ශඞ්ක මල්ල රජු දවස පොළොන්නරුවේ විසූ කඳවුරු දෙශිලක් විජයසිංකින් සෙනෙවියන් පුත් කිත් පොළොන්නරු ලක්විජය සිං සෙනෙවි සහ කිවියන්ගේ පරම්පරාවෙන් පැවැත විත් පරංගි යුගයේදී රෝමානු කතෝලික ආගම වැළඳගෙන ද මැල්ලෝ (ද මැල්) යන නාමයෙන් පැවැතෙන පරම්පරාවට අයත් උතුමෙකි. [1] අග්නිදිග ආසියාවේ නායක පූජක ලක්දාස් ද මැල් කුරුණෑගල බිෂොප් තුමා හා කොළඹ නගරාධිපති ආර්. ඇස්. ඇෆ් ද මැල් මැති තුමාත් මෙ තුමාගේ පුත්‍රයෝ ය.

---

## ජ්. පී ද සිල්වා අභිනීතිඥ තුමා

සම්භාවනීය නීතිඥ පරම්පරාවකට අයත් ජ්. ටී ද සිල්වා තරුණ අභිනීතිඥ වරයා සාමාන්‍යයෙන් ලාංකික වර්ගයාගේත් විශේෂයෙන් සිංහල ජාතියේත් අභිවෘද්ධිය උදෙසා අප්‍රතිහත ධෛර්‍යයෙන් ක්‍රියා කළ ආදර්ශ වත් ජන නායකයෙකි. ලාංකික වර්ගයාගේ විමුක්තිය සඳහා එළ ජන නායකයන් විසින් පිහිටුවා ගන්නා ලද ලංකා ජාතික

1. සුප්‍රසිද්ධ ග්‍රන්ථ කර්තෘවරයෙක් වූ පියදාස සිරිසේන මහතා විසින් ලියන ලද 'ශ්‍රී ලංකා මාතා' නමැති ප්‍රබන්ධ කථාවෙහි ද මැල් පරම්පරාවේ තුන් වැනි මුත්තණුවන් වනාහි උඩරට ගොවි කුලයේ කෙනෙකු වශයෙන් හැඟවීමට බෙහෙවින් වෙහෙස දරා මැල් සහ ජයසේකර නමින් දෙබසක් ලියා තිබේ.

එහෙත් ද මැල් පරපුරේ මුත්තණුවන් අන්‍ය කුලයක අයෙක් නොව කිත් පොළොන්නරු ලක්විජය සිං සෙනෙවි නමැති කුරු රාජ වංශික උතුමෙකි.



සංගමයේ ගරු ලේකම් පදවිය දැරුවේ මේ තරුණ අභිනීතිඥ වරයා යි. තරුණ වියෙහිදීම මරු වසඟයට පත් නොවූවා නම් මේ ශ්‍රෙෂ්ඨ ලංකා පුත්‍රයාගෙන් ලංකා මාතාවට උදාර සේවයක් සිදුවනු නිසැකයි.

---

## ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා මැති තුමා

"චාලි හාමු" නමින් බාල කාලයෙහි හැඳින්වුනු මෙ තුමා කුඩා කල පටන්ම නිහතමානි ගුණයෙන් යුක්ත ව දිළින්දන් ඇසුරු කෙළේ ය දිළිඳුන්ගේ ඕනෑ එපා කම් ඉටු කෙළේ ය. දකුණතින් දුන් දේ වමතට නොදන්වා දහස් ගණන් දුන්නේ ය. පොදු ජනතාව සුඛිත මුදිත කිරීමට දුන්නේ ය. කුඩා අවදියෙහිදී චාලි හාමු නමින් හැඳින්වුණු මෙ තුමා මනා රූ සිරියෙන් කාගේත් සිත් දිනා ගත්තේ ඉගෙනීමෙහි ද සමතෙක් විය. එංගලන්තයට ගොස් ඉගෙනීම ලැබූ මෙ තුමා තරුණ වියෙහිදී ඇම්. ඒ. යන උපාධිය ලබා ගෙන සිය රටට පැමිණියේ ය. මහාජන වැඩෙහි නිරත වූයේ ය. මෙසේ යහ වැඩ කරමින් වෙසෙන මෙ තුමාට තම පියා, සීයා, මුත්තා ආදී ද සොයිසා පවුලේ වැඩිහිටියන්ට මෙන් ම වාසල මුදලි ධුරය ද, සාමදාන විනිශ්චයකාර පදවිය ද ලැබිණ.

මෙ තුමෝ ක්ෂුද්‍රජීව පරීක්ෂණාගාරය සඳහා රුපියල් දස දහසක් ද, ක්‍රි. ව. 1897 පැමිණි ඉන්දියාවේ දුර්භික්ෂයට රුපියල් පසළොස් දහසක් ද වෙනත් පොදු කටයුතු සඳහා දස දහස් ගණන් ද පරිත්‍යාග කරමින් පොදු ජන යහපත සැලැස් වූහ. ලයනල් ද සොයිසා මැති තුමා මෙ තුමාගේ පුත්‍රයෙකි.

"ප ච රා සොයිස මැති කරනා ලෙස තුටුව
මෙ ව රා ඉඳී පෙහෙකම් හල නොව පටුව
කු ම රා පාසැලෙහි පිය මිතුරෙ මොරටුව
නොහැරා කරම් කටයුතු සිදුවුව ඉටුව"
(වී. ඇස්. ධම්මඤ්ඤ)

## වංශාධිපති ඒ. ජේ. ආර්. ද සොයිසා මැති තුමා

'රිචෙඩ් හාමු' යන අපර නාමයකින් පතළ ව සිටි ද සොයිසා පවුලේ දෙ වැනි පුත් ඒ. ජේ. ආර් ද සොයිසා මැති තුමා මවු පිය පරපුරෙන් තමාට ලැබුණු දේපල දියුණු කරන අතර ම පොදු ජන යහපත උදෙසා ද ක්‍රියා කෙළේ ය. වංග දේශයෙහි සාගතයට රුපියල් දහස් ගණනක් දුන්නේ ය. ලංකාවේ ගංවතුරෙන් අනාථ වූවන්ට රුපියල් දහස් ගණනක් ද ක්‍ෂය රෝගීන්ගේ ආරෝග්‍ය ශාලාවක් සෑදීමට රුපියල් විසි පන්දහසක් ද දුන්නේ ය. විශේෂයෙන් මොරටු පළාතේ ද, සාමාන්‍යයෙන් සමස්ත ලංකා වාසීන් ගේ ද ප්‍රශනයන්හි දී මහාජන පක්‍ෂය ගෙන ක්‍රියා කරමින් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ මන්ත්‍රී ආසනයේ ගෞරවය රැක ගත්තේ ය. මෙ තුමාට අයත් පොල් උයනක් සුප්‍රසිද්ධ සිංහල කවීන්ද්‍රයකු වූ පියදාස සිරිසේන මහතාට පෙනුණු හැටි මෙසේ ය.

"සි රි සර පා න සක් සුරිඳුගෙ නඳුන් ව න
හැම තද මා න වතු හිමියන් දවල ව න
කිරි මැටි යා න මහ පොල් උයන දකිම් න
දි රි සහ මා න ඇතිවිය සිතට අපම න

අ ක් ක ර අට සියක් වන විපුල මෙ උය න
ඉ ස් ති ර සිහල සිටු තුමෙකුට අයිති ව න
වි ස් ත ර මෙහි තියන කව් නැණ ඉක්ම ව න
ඈ ස් ඈ ර බලව් උඩගුව සිහලුනි, බැති න

ද හ ස ක් සියක් තුරු පෙළ කප්තුරන් බ දේ
අ හ සක් වසා සිටි වලු බර වෙමින් සො දේ
සහ ස ක් සියොත් දෙන නද නදන එහි ඉ දේ
ශ ස ස ක් කියන වැනි සොයිසා මැතිඳු ස දේ



තොස පත් තිති කරන සිය සිහල දන ළැ දී
ද න ව ත් රිචෙඩ් සොයිසා මැතිඳු සඳ සු දී
සැ ප ව ත් ලෙස විසුම් ගැනුමට එහි සුසැ දී
මි හි ප ත් සුර විමානෙකි මැඳුර සිරි සැ දී

ලෝතෙක් පෙර පතල සිහළුන් තෙද මා න්
නැ ද ක් මට මිසක් ජරපත් තෙද මා න
මා රු ක් උයන දුටු කල කිරි මැටි යා න
බෝ වි ක් මය චඩසි හද තුළ සිහලා න"

(සිංහල ජාතිය පත්‍රය)

---

## සර් විල්ෆ්‍රෙඩ් ද සොයිසා මැති තුමා

ඉංග්‍රීසි භාෂාවේ මනා පටුත්වයකින් යුක්ත වූ විල්ෆ්‍රෙඩ් ද සොයිසා මැති තුමා වූ කලී මින් අවුරුදු පණහකට උඩ දී පවා සිංහල භාෂාවට ඉමහත් ලැදියාවකින් ක්‍රියා කළ උතුමෙකි. පාර්ලිමේන්තු ආසන දිනා ගැනීම සඳහා ද, පාර්ලිමේන්තු ආසන රැක ගැනීම සඳහා ද අද ධනවත්තු හෙළ බසට හිතවත්කම පෙන්වන්නෝ ය. එහෙත් එබඳු වෙස් මුහුණකින් නොව හද පත්ලෙන් නැගුණු ඇල්මකින් ම මෙ තුමා සිංහල භාෂාවේ දියුණුව ප්‍රාර්ථනා කෙළේ ය. සිංහල භාෂාවේ දියුණුවට ක්‍රියා කෙළේ ය. සිංහල භාෂාව ඉගෙණගත්තේ ය. සවකීය සිංහල ආචාර්යවරයා වූ පානදුරේ ඩී. ඇම්. ඇස්. ඇස්. කවිරාජ පඬි තුමාට මැනවින් සංග්‍රහ කෙළේ ය. වරක් මෙ තුමා එංගලන්තයට ගියේ සවකීය ආචාර්ය කවිරාජ පඬි තුමා ද සමග ය. (ද සොයිසා මැති තුමාට සිංහල ඉගැන්වීම පිණිස එ තුමා කැටුව එංගලන්තයට ගිය කවිරාජ පඬි තුමා බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ පොත් පත් පරීක්‍ෂණයක ද යෙදුනේ ය.) සමස්ත ලංකා සිංහල ශාස්ත්‍රීය සම්මේලනයේ මූලාසනය දැරූ මෙ තුමා වරක් තමාට අයත් ඕලබොඩුව වත්තේ මහ

මන්දිරයට රැස්වූ සිය ගණනක් සාහිත්‍ය රසිකයින්ට කැම්-පිම් ආදියෙන් දින ගණනක් සංග්‍රහ කෙළේ ය.

ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක් වූ මෙ තුමා ද සොයිසා බූදල-යෙන් මවු පිය සන්තකයෙන් තමාට ලැබුණු දේපල දියුණු කර ගැනීමෙන් ද, වෙළෙඳ ව්‍යාපාර කීපයක් ආරම්භ කිරීමෙන් ද තමන්ගේ දියුණුව සලස්වා ගන්නා අතර ම සිය ගණන් සේවකයන්ට ජීවනෝපාය ද සලස්වා දුන්නේ ය. රටේ ජාතියේ පොදු වැඩ ගැන උනන්දුවෙන් ක්‍රියා කරන මෙ තුමාට ඉංග්‍රීසි ආණ්ඩුව මගින් 'නයිට්' නාමයක් පිරිනමන ලද්දේ ය. මෙ තුමා කලක් ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ ගරු සාමාජික ධුරයක් ද දැරුවේ ය.

මෙ තුමාගේ ප්‍රිය භාර්යාව වූ ඉවුලින් ද සොයිසා ආර්යාව වූ කලී සැනෙට් මන්ත්‍රීවරියකි. කාන්තා පක්ෂයේ අභිවෘද්ධිය සඳහා අමරණීය සේවයක් කරන උත්තමාවකි. මෙ තුමී ස්වාමියා අනුගමනය කරමින් පොදු වැඩවලට නිතර උදව් දෙන්නී ය.

"සිරිලකට සැපත් වූ කප්තුරේව් නිත් දයාවෙන්
සෙත සැලසූ දුගින් වෙනු පින් සිරින් වත් සුදුල් වූ
මැති සඳ සොයිසා විල්ෆ්‍රෙඩ් බිදන් වාසනාවත්
සැරද සිරිමතී හා සක්රජා මෙන් උදම් වී"

(කාව් හදන හැටි-ඩී ඇස්. ධම්බන්නු)

---

## වෝල්ටර් ද සොයිසා මැති තුමා

සී. එච්. ද සොයිසා මැති තුමාගේ හා ද සොයිසා ආර්යාවගේ පුත්‍ර රත්නයක් වූ ද 'වොලී හාමු' නමින් ප්‍රසිද්ධ ම විසුවා වූ ද වෝල්ටර් ද සොයිසා මැති තුමා වනාහි ස්වකීය පිතෘවරයාගේ අභිප්‍රාය ශමින් ත්‍යාගශීලී ව කටයුතු කළ උතුමෙකි. මෙ තුමා විසින් මහනුවර හා ශාල්ලේ ආරෝග්‍ය



ශාලාවන්ට සම්බන්ධ කොට අක්ෂි රෝගීන්ට හිත-මැඩ පිණිස ඇස්වාට්ටු තනවා රජයට භාර දෙන ලදී. කොළඹ මහාරෝග්‍ය ශාලාවට 'පැරිලැබරටරි' නමින් පරීක්ෂණා-ගාරයක් ද නයනාරෝග්‍ය ශාලාවට 'ද සොයිසා ආර්යා-වන්ගේ වාට්ටුව' නමින් වාට්ටුවක් ද තනවා දෙන ලද්දේ ය. වේල්ස් කුමාර හා කුමාරි ශාස්ත්‍ර ශාලාවන්ගේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කළ මෙ තුමා අක්කර හැටක සාරවත් පොල් උයනක් ද පරිත්‍යාග කෙළේ ය. මේ හැර ආගමික වූ ද ජාතික වූ ද හැම වැඩකට ම මෙ තුමාගේ උපකාරය නොමසුරු ව ලැබිණි.

---

## ජ්. ඇල්. ඇෆ්. ද සොයිසා මැති තුමා

කුඩා අවදියෙහිදී 'ඇඩී හාමු' නමින් ප්‍රසිද්ධ ව සිටි මෙ තුමා වේල්ස් කුමාර ශාස්ත්‍ර ශාලාවේ දියුණුවට කටයුතු කෙළේ ය. එහි කළමනාකාර පදවිය ද දැරුවේ ය. කෙළි-කවට කම්වලට ප්‍රිය මනාප ගතියක් ඇතිව උන් මෙ තුමා උපන් කවටයෙක් ද විය. තමා ඇසුරු කළ කොයි-කවුරුන් සමගත් සුළු කවට කමක්-දෙකක් කිරීම එතුමාට ප්‍රීතියක් විය.

රේස් අසුන් ගැන මනා දැනුමක් ඇතිව සිටි මේ විනෝද රාජයාගේ රේස් අශ්වයෝ සෑම රේස් පොරයකට ම සහභාගිවූහ. තෑගි, කුසලාන් ආදිය දිනා ගත්හ. 'ඇබීස්ටෝන්, මෝඩැනිස්, ඔරේන්ජ් විලියම්' ආදි ප්‍රසිද්ධ රේස් අසුන්ගේ අයිතිකරු වී උන් මෙ තුමා "ගවනර්ස් කප්" නම් කුසලාන් සොළොසක් දිනාගත්තේ ය. මෙසින් කුසලාන් දෙකකට වඩා දිනාගත් සිංහලයකු ගැන නැසීමු.

## පණ්ඩිත ඩබ්ලිව්. ඇෆ්. ගුණවර්ධන වාසල මුදලි තුමා



උසස් ග්‍රන්ථ කර්තෘවරයෙක්ව ද, ව්‍යක්ත කවිකයෙක්ව ද, විශාරද භාෂා පරිවර්තකයෙක්ව ද, ශ්‍රද්ධා සම්පන්න බෞද්ධ නායකයෙක්ව ද ගල්කිස්සේ 'රෝස වලව්වේ' විසූ පණ්ඩිත ඩබ්ලිව්. ඇෆ්. ගුණවර්ධන වාසල මුදලි තුමාට වඩා ව්‍යක්ත භාෂා පරිවර්තකයෙක් එ කල නොවී ය.

### ෂඩ් භාෂා පරමේශ්වර:

තොටගමුවේ ශ්‍රී රාහුල සංඝ රාජයන්ගෙන් පසු ෂඩ් භාෂාවක පරමේශ්වරත්වය ඇතිව උන් එක ම උතුමා ඩබ්ලිව්. ඇෆ්. ගුණවර්ධන වාසල මුදලි තුමා ය. එළු, පාළි, සංස්කෘත, ඉංග්‍රීසි, දෙමළ, තෙළිඟු යන ෂඩ් භාෂාවක ප්‍රවීනත්වයක් මෙ තුමා තුළ තිබිණි.

### කුමාරතුංග විශාරදයන්ගේ ආචාර්යවරයා:

තොටගමුවේ ශ්‍රී රාහුල සංඝ රාජයන් වහන්සේගේ ගුණ ගයනු වස් ශාස්ත්‍රීය සම්මේලනය මගින් මහෝත්සවයක් පැවැත්විණි. ඒ මහා සභාවේ ප්‍රසිද්ධ කථාවක් පවත්වද්දී "මුනිදාස කුමාරතුංග මහතා මගේ ගෝලයකු වීම ගැන මම ආඩම්බර වෙමි" යි ගුණවර්ධන මුදලි තුමෝ පැවසූහ.



එහෙත් එය එසේ නොවන බැව් මුනිදාස කුමාරතුංග විශාරදයෝ ප්‍රකාශ කළහ. සෝමාක්සාගයෙන් ඉගෙණගත් මුනිදාස කුමාරතුංග මහතා ප්‍රාචීන විභාගයට පෙනී සිටියේ ගුණවර්ධන වාසල මුදලිඳුගේ ශිෂ්‍යයකු වශයෙනැ යි ඇතැමෙක් කියති.

කරුණු කොයි හැටි වුවත් මුනිදාස කුමාරතුංග මහත්මා තුළ ගුරුදේව ගුණවර්ධන වාසල මුදලිඳු කෙරෙහි ගරු කිරීමක් තුබුණු බැව් කුමාරතුංග විශාරදයන්ගේ ප්‍රබන්ධ සංග්‍රහයෙන් ප්‍රත්‍යක්ෂ වේ. එ තුමෝ චරිත කථා වස්තු දශයක් එහි දක්වති. 1. පණ්ඩුකාභය 2. කුමාරදාස 3. මහ පැරකුම්බා 4. ශ්‍රී රාහුල 5. මහා මෛත්‍රෙය 6. වැලිවිට සරණංකර 7. වාසල මුදලි ගුණවර්ධන 8. විජය 9. කුවේණිය 10. විභීෂණ යනුවෙනි.

කුමාරතුංග පඬි තුමාගේ ගුරුවරයා කවරෙක්දැයි අපි නොකියමු. එහෙත් එක් කරුණක් මෙහිදී හෙළි වේ. පුරාණ කාලයට අයත් වුවත් නව දෙනකුගේ චරිත කථා තම පොතට ඇතුළත් කළ කුමාරතුංග පඬි තුමා මෑත අතීතයෙන් ගුණවර්ධන වාසල මුදලිඳුගේ චරිත කථාව පමණක් තෝරා ගැනීම සැලකිය යුතු කරුණකි. වැලිවිට සරණංකර සංඝ රාජයන්ගෙන් පසු (අවුරුදු දෙසියයක් පමණ ඒ සා දිගු කලක් මුළුල්ලේ) ලක්දිව පහළ වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල, පානදුරේ ශ්‍රී ඥානවිමල තිස්ස බටුවන්තුඩාවේ දේවරක්ෂිත, රත්මලානේ ධම්මාරාම, ඇම්. ධර්මරත්න, තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන, මොරටුවේ මේධානන්ද, මහගොඩ ඥාණිස්සර, කහවේ රතනසාර ආදී මහා විශාරදයන්ගේ ශාස්ත්‍රඥානය කුමාරතුංග පඬි තුමා විසින් සුළු කොට තකනු ලැබුවේ ද? නො එසේ නම් ගුරුදේව ගුණවර්ධන වාසල මුදලි තුමා වෙත කුමාරතුංග පඬි තුමා විසින් ආචාර්ය භක්තියෙන් ගරු කරනු ලැබුමේ දැ යි විමතියක් ඇති නොවේ ද?

**ග්‍රන්ථකරණය:**

ගුත්තිල කාව්‍ය වර්ණනාව, උපමාලංකාරය, සුභාෂිත වර්ණනාව, සිද්ධාන්ත පරීක්ෂණය, කෝකිල සන්දේශ වර්ණනාව හා මයුර සන්දේශ වර්ණනාවත් මෙ තුමාගේ කෘතීහු ය. රජය මඟින් පිළියෙළ කරගෙන යන සිංහල ශබ්ද කෝෂයේ කර්තෘ මණ්ඩලයෙහි ද කටයුතු කළ මෙ තුමා ප්‍රාචීන භාෂෝපකාර සමිතියේ ගරු ලේකම් පදවිය ද, රහස් පොලීසියේ ප්‍රධාන භාෂා පරිවර්තක ධුරය ද, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන භාෂා පරිවර්තක ධුරය හා දෙහිවල-ගල්කිස්ස පළාත් ආණ්ඩු සභාවේ උපදේශක ධුරය ද දැරුවේ ය. මෙ තුමාගේ නිර්වාණප්‍රාප්තිය පිළිබඳ ව අමරපුර මහා නිකායේ ලේඛකාධිකාරී රාජකීය පණ්ඩිත කහඳමෝදර පියරතන නාහිමියන්ගේ ශෝක ප්‍රකාශය මෙ මේ.

හස්ත්‍යශ්වවර්ණී නෙත්‍රබෝය බෞද්ධබ්දෙ පෞෂමාසගෙ
කෘෂ්ණපක්ෂෙ චිතීයස්‍යං ත්‍රෛෂ චත්‍රස්‍ය වාසරෙ
කවිචූඩාමණිශ්‍රීාග්වී කුරාරාජ කුලධ්වජාං
මන්ත්‍රීන්ද්‍රිස් ත්‍රිදිවංයාතො ඩබ්ලිව්. ඈf ජ්. ගුණවර්ධනඃ

---

### ආර්. ජී. ඇස්. ද සොයිසා මැති තුමා

කුඩා අවදියෙහිදී 'බෙබී හාමු' යන නමින් හැඳින්වුණු මෙ තුමා මහා ව්‍යාපාරිකයෙකු වී සිය ගණන් අයට රක්ෂාව දුන්නේ ය. ප්‍රසිද්ධ රේන්ද මහතකු ලෙස කටයුතු කළ මෙ තුමා කීප වරක් ම මුළු පළාතක ම තැබෑරුම් ගත්තේ ය. දුප්පතුන්ට උපකාර කෙළේ ය. පසු කලෙකදී බුද්ධාගම වැළඳ ගත් මෙ තුමා උතුරු මොරටු සීමාවේ පිහිටි රුපියල් ලක්ෂ ගණනක් වටිනා ඉඩමක් ඒ සඳහා වෙන් කොට ද සොයිසාරාමය කරවූයේ ය. එහිම බෞද්ධ පාඨශාලාවක් ද ආරම්භ කෙළේ ය. මේ පාසැලින් අද සිය ගණනක් ශිෂ්‍යයෝ ශාස්ත්‍රය හදාරති. එ තුමා ජීවත් ව සිටියදී මොරටු පළාතේ පැවැත්වුණු බෞද්ධ පෙරහැර ගැන කද උනන්දුවක් දක්වූයේ ය.



### ඩී. ඇම්. සමරවීර වාසල මුදලි තුමා

වැලිගම 'සිරිමැදුර' වලව්වේ ඩේවිඩ් සමරවීර වාසල මුදලි තුමා වනාහි උත්පත්තියෙන් දනිසුරු පවුලකට අයත් වූවෙක් නොවේ. සුළු රැකියාවක් කොට ඉපයූ මුදලින් හෙතෙම දිනපතා කොටසක් ඉතුරු කෙළේ ය. මෙසේ දැහැමි ලෙස අරපරෙස්සමින් ඉපයූ මුදල වෙළෙඳ ව්‍යාපාරයන්හි යෙදවූයේ ය. ඉඩම් වගා කෙළේය. මෙසේ ක්‍රම-ක්‍රමයෙන් ධන කුවේරයෙක් බවට පත් වූයේය.

බොහෝ ධනපතියෝ දුප්පතුන්ගෙන් වැඩගෙන, ඔවුන්ට නිසි හැටි ගාස්තුව නොගෙවා, ඔවුන්ගේ ඥාන ශක්තියෙන් හා, ශ්‍රම ශක්තියෙන් ධනවත් භාවයට පත් වෙති. ඉන් පසු දරුවනට, මුණුබුරු, මිණිබිරියනට සවකීය වස්තුව උරුම කොට තබා හිස් අතින් පරලොව යති. ඇතැම් කෙනෙක් තම වතු-පිටි ගේ දොර ආදිය මිය යන විට ගෙන යාමට නොහැකි හෙයින්දෝ සදාකාලයෙන්-සදාකාලයට පරම්පරානුගත ව තබාගැනීමේ ලෝභ චේතනාවෙන් මුණුබුරනට 'ෆිද කොමිස්' කොට ලියති. එහෙත් එහි සදාකාලික භාවයක් නොමැති බව ඔවුන් නොදක්නේ අනෙකක් නිසා නොව මුණුබුරන් ඒවා නැති-නාස්ති කරන විට ඔවුහු පරලොව පොල් වගා කරන බැවිනි.

**පරිත්‍යාග:-**

මහා ධන කුවේරයෙක් වූ මෙ තුමා ලක්ෂ සංඛ්‍යාත ධනය සවකීය ප්‍රදේශයේ පමණක් නොව සමස්ත ලංකාවේ ම ජාතික, ආගමික පොදු වැඩ සඳහා යෙදවූයේ ය. දනට-පිනට දුන්නේ ය. පාසැල් කර වූයේ ය. වෙහෙර-දාගැබ් සැදවූයේ ය. ශාස්ත්‍රාචාර්ය පී. ද ඇස් කුලරත්න, මහාචාර්ය ජී. පී. මලලසේකර ආදි උතුමන්ගේ බෞද්ධ අධ්‍යාපන ව්‍යාපාරයනට නොමසුරු ව ආධාර කෙළේ ය. දරු මුණුබුරන්ට ද ප්‍රමාණවත් ධනයක් තබා සුරලොව සැපපතා යන විට මෙ තුමා අතින් පොදු වැඩ සඳහා රුපියල් දශලක්ෂයක් පමණ කැපවී තිබිණි

## උදේනි ද සිල්වා මැති තුමා



ජාතික වීරයන්ගේ පහළ වීමත් සමගම පහළ වූ තරුණ ලේඛකයන් අතර උදේනි ද සිල්වා මැති තුමාට ලැබෙන්නේ අවිතීය ස්ථානයකි. එ තුමා උපන්නේ ක්‍රි. ව 1887 දී මහනුවරට නුදුරු යටවර නම් ග්‍රාමයෙහි ය. උගත් ස්ථවිරයන් වහන්සේ නමකගෙන් සිංහල භාෂාව මැනවින් උගත් උදේනි ඉන්පසු මහනුවර ධර්මරාජ පාඨශාලාවට බැඳී ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගත්තේ ය. ඉක්බිති සිය සොහොයුරකු කැටිව අමෙරිකාවට ගිය හෙතෙම තව දුරටත් ඉංග්‍රීසි භාෂාව ප්‍රගුණ කෙළේ ය.

ලක්දිවට පෙරළා ආ උදේනි ද සිල්වා මහත්මා මහනුවර ගොවිකම් සමිතියෙහි ලේකම් පදවියට පත්වූයේ ය. ඉන්පසු එයින් අස්වූ එ තුමා ලංකාවේ පහත්ය යි සම්මත ජනකායක් වූ රොඩී ජනයන්ගේ යහපත පිණිස බෞද්ධ කොමිසමක් අරඹා ඉතා උනන්දුවෙන් කටයුතු කරගෙන ගියේ ය.

ක්‍රි. ව. 1913 දී ලංකාවේ තැපැල් මාර්ගයෙන් ඉංග්‍රීසි උගන්වන විද්‍යාලයක් පළමුවෙන් ආරම්භ කළේ මෙ තුමා ය. එ පමණක් ද නොව ළමයින්ගේ සඟරාව ද ඇරඹුවේ උදේනි ද සිල්වා මහත්මා ය. "ශ්‍රී ලංකා ශ්‍රී" නම් මාසික සඟරාව



මගින් මෙ තුමාගෙන් සිදුවූ සේවය ඉමහත් ය. එවකට සිරිලක තුබුණු ප්‍රබල සඟරාව ශ්‍රී ලංකා ශ්‍රී ය. තරුණ සමාජයට ආදර්ශයක් වූ මෙ තුමා 1914 මාර්තු මස 20 වැනි දින පරලෝ සැපත් විය. මිය යන විට මෙ තුමාගේ වයස අවුරුදු විසිහතකි.

---

## පී. එම්. ඒබ්‍රහම් ද සිල්වා මැති තුමා

පහත රටින් උඩරට වෙළෙඳාම පිණිස ගිය සමහරු උඩරටියන්ගේ ධනය සූරාගත් අවදියක දී උඩරට වැසියන්ගේ දියුණුවට වැඩ කළ වෙළෙඳ මහතෙක් ද විය. දෙඩම්දූවෙන් රඹුක්කනට ගිය පී. එච්. ඒබ්‍රහම් ද සිල්වා මහත්මයා ස්වකීය වෙළෙඳ ව්‍යාපාරය දියුණු කරන අතර ම උඩරටියන්ගේ දියුණුව සඳහා උදාර සේවයක් කෙළේ ය. හතරලියැද්දේ හිතමිතුරු වෙළෙඳ සමාගම, හතරලියැද්දේ සමූපකාර ණය දෙන සමිතිය, රඹුක්කන ග්‍රාම සංවර්ධන සමිතිය, ශාසනාභිවර්ධන සමාගම ආදි සමිති-සමාගම්හි ආදි කර්තෘවරයා ඒබ්‍රහම් ද සිල්වා මහත්මා ය. ගල්බඩ-කිතිගොඩ දෙකෝරළයේ බෞද්ධ පාසැල් කීපයක් ඇරඹූ මෙ තුමා අමද්‍යප වීරයෙක් ද විය. අමද්‍යප සේවය හා මහජන සේවය නිසා 1915 ජාතිවාදී කලහයේදී මෙ තුමා සිරබාරයට ගත්තේ ය. අවුරුදු ගණනක් ම තිරිකුණාමලයට පිටුවහල් කොට තැබූ සිල්වා මහත්මා ගැන එංගලන්තයේ පාර්ලිමේන්තුවේ ද සාකච්ඡාවක් ඇති විය. ඉන් පසු එයින් නිදහස ලැබූ සිල්වා මහත්මා පෙර සේ ම මහාජන සේවයෙහි යෙදෙයි. දිවා රෑ දෙක්හි සම්බුද්ධ සාසනයේ දියුණුව සඳහා ක්‍රියා කරන්නෙකි ඒබ්‍රහම් ද සිල්වා මහත්මා.

## පී. ජෙරමියස් දියෙස් මැති තුමා

පානදුරු පළාතේ 'රෙබෝ සිඤෙඤ රේන්ද රළු' යන අපර නාමයකින් ප්‍රසිද්ධ ව සිටි ජෙරෙමියස් දියෙස් මැති තුමා පළාතේ පමණක් නොව මුළු ලංකාවෙහි ම බොදු පොදු වැඩ සඳහා නොමසුරු ව සවකීය ධනය යෙදවූයේ ය.

පානදුරු වාදයෙහි දී වැලිගම ශ්‍රී සුමඞගල මහා නායක සවාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසනා පරිදි බෞද්ධ පක්‍ෂයෙහි කාර්‍ය්‍ය සංවිධානය කෙළේ මෙ තුමාගේ ප්‍රමුඛත්‍ව-යෙනි. පානදුරේ රන්කොත් විහාරස්ථානයෙහි චෛත්‍යය ඉදි කිරීමේ දී මූලික ව කටයුතු කෙළේ මෙ තුමා ය. මේ තුමා ඇතුළු දායක සභාවේ තීරණය පරිදි රන් කොත් දාගැබේ කොත කොරළවැල්ලේ ජේ. ප්‍රන්සිස්කු ප්‍රනාන්දු (පිංහාමි බාස්) මහතා ලවා පැළඳවිණි.

රුපියල් ලක්‍ෂ ගණනක් බොදු-පොදු වැඩ සඳහා යෙදවූ මෙ තුමාගේ අභාවයෙන් පසු ජෙරමියස් දියෙස් මැතිණියන් සවාමියා අනුගමනය කළා ය. හැරී දියෙස්, ආතර් වී. දියෙස් සී. ඇම්. දියෙස්, වින්සන්ට් දියෙස් යන පුත්‍රයන් සිවු දෙනකු හා ඇම්. ඒ. පෙරේරා මැතිණිය, තෝමස් ද සිල්වා මැතිණිය, ඕවන් රුද්‍රිගු මැතිණිය හා අමරසූරිය මැතිණිය යන දියණි වරුන් සිවු දෙනකු ද මේ යුවළට ලැබිණි.

පාර්ලිමේන්තු මන්ත්‍රී හා චීන ලංකා තානාපති විල්මට් ඒ. පෙරේරා මැති තුමා, ඩන්ස්ටන් ද සිල්වා මැති තුමා, පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල් ඔස්මන් ද සිල්වා මැති තුමා, උපාලි දියෙස් මැති තුමා, වෛද්‍යාචාර්‍ය්‍ය ඇස්. පී. දියෙස් මැති තුමා, සිසිල් දියෙස් මැති තුමා, ලාල් රුද්‍රිගු මැති තුමා හා ලෑස්ලි පෙරේරා මැති තුමාත් මේ උතුමන්ගේ මුණුබුරන් අතුරින් සමහරෙකි. ෆ්‍රෙඩ් ද පොන්සේකා මැතිණියත්, වෝල්ටර් සල්ගාදු මැතිණියත්, වී. සී. ජයසූරිය මැතිණියත්, ජේ. කුරේ මැතිණියත්, ජී. ඇම්. පොන්සේකා මැතිණිය හා ආර්. අමරසූරිය මැතිණියත් මිණිබිරියන් අතුරින් සමහරෙකි.



## පී. ජෙරමියස් දියෙස් මැතිණිය (ඇම්. බී. ඊ.)



පානදුරා පළාතේ ප්‍රසිද්ධ ධනවතෙක් ව විසූ ඩබ්ලිව්. පී. ඇස්. රුද්‍රිගු (සල්මන් රේන්ද) මහත්මයා මෙ තුමියගේ පියාණෝ ය. සොහොයුරන් දෙ දෙනකුගෙන් හා සොහොයුරියන් සත් දෙනකුගෙන් ද සැදුම් ලත් රුද්‍රිගු පවුලේ සිවු වැනි දියණිය සෙලෙස්තිනා රුද්‍රිගු (ජෙරෙමියස් දියෙස්) මැතිණිය යි.

**විශාඛා විද්‍යාලය:-**

බෞද්ධ කන්‍යා විද්‍යාලය නමින් අගනුවර ඇරඹූ ඉංග්‍රීසි කාන්තා විද්‍යාලය දුෂ්කර තත්වයකට මුහුණ පා සිටිය දී ඩබ්ලිව්. ආතර් ද සිල්වා, ඩී. බී. ජයතිලක, ඩී. ඇස්. සේනා-නායක ආදි බෞද්ධ නායකයන්ගේ ඉල්ලීම පරිදි මෙ තුමී මේ කාන්තා විද්‍යාලයට උදව් දීමට සතුටු වූවා ය. පළමුවෙන් රුපියල් ලක්‍ෂයක් පරිත්‍යාග කළ ඕ තොමෝ නැවත-නැවතත් සැළකිය යුතු උදව් දුන්නා ය. ඉන් පසු රුපියල් එක් ලක්‍ෂ පණස් දහසක් පමණ වියදම් කොට ගොඩනැගිල්-ලක් කරවා එයිනුදු නොනැවතී (පසු ව නම් වෙනස් වී විශාඛා විද්‍යාලය නමින් ප්‍රසිද්ධියට පැමිණි) ඒ මේ බෞද්ධ කන්‍යා විද්‍යාලය සඳහා තවත් ලක්‍ෂ ගණනක් පරිත්‍යාග කළා ය. මෙසේ වරින්-වර මේ මැතිණිය විසින් විශාඛා විද්‍යාලයට කරන ලද පරිත්‍යාගය රුපියල් හාර ලක්‍ෂ පණස් දහසකි.

## ආනන්ද මහා විද්‍යාලයෙහි වින්සන්ට් දියෙස් අනුස්මරණ ශාලාව

පරලෝ සැපත් සිය පුත් වින්සන්ට් දියෙස් මහතාට පින් පැමිණවීම සඳහා මෙ තුමී විසින් ආනන්ද මහා විද්‍යාලයෙහි විශාල ශාලාවක් ඉදිකරවන ලදී. මේ හැර ආනන්ද, නාලන්ද විද්‍යාලයන්ට රුපියල් දහස් ගණනක් වියදම් කළා ය.

**විහාරාරාම:-**

පානදුරා පළාතේ සෑම පොදු වැඩක් සඳහාම නොමසුරුව ධන පරිත්‍යාග කළ මෙ තුමී ස්වකීය ධනය යොදවා ගම්පහ පළාතේ හා මොරටු පළාතේත් විහාර දෙකක් සෑදවූවා ය. රුවන්මැලි මහා සෑයේ වැඩට ද විශාල පරිත්‍යාගයක් කළා ය.

**ධර්මදූත මෙහෙය හා වෙනත් පොදු වැඩ:-**

ගරු කටයුතු හීනටියන ධම්මාලෝක ස්වාමීන් වහන්සේ ප්‍රධාන කොට ඇති උගත් ස්වාමීන් වහන්සේලා ලවා ලක්දිව ගම්-නියම්ගම් හි ධර්ම දේශනා පැවැත්වීමෙන් ද, ධර්ම පත්‍රිකා ලක්ෂ ගණන් සන්තර්පනා බෙදා හැරීමෙන් ද දියෙස් මැතිණියගේ ධනව්‍යයෙන් කොළඹ ධර්මදූත සභාව මගින් ධර්මදූත මෙහෙයක් අවුරුදු ගණනක් ම පවත්වන ලදී.

**ඇම්. බී. ජ්. නාමය හා විශාඛා නාමය:-**

ලෝ සසුන් වඩමින් දැහැමි දිවි පෙවෙතක් ගත කළ මෙ තුමියට ඉංග්‍රීසි ආණ්ඩුව මගින් ඇම්. බී. ජ්. යන ගරු නාමයෙන් ගෞරව කරන ලදී. එහෙත් එයින් උද්දාම නොවූ මේ පින්වත් කුලඟන ඉහත දී මෙන් ම රෙද්දෙන් හා හැට්ටෙන් සැරසී පොදු වැඩවල යෙදුනා ය. රජය මගින් ඇම්. බී. ජ්. නාමය පිරිනමත් ම විශාඛා මහෝපාසිකාව යළිත් ලොව පහළ වූවාක් මෙන් පොදු වැඩ සඳහා රුපියල් ලක්ෂ ගණන් වියදම් කරන මේ මහා උපාසිකාවට 'විශාඛා' යන ගරු නාමය ජන සම්මුතියෙන් ව්‍යවහාර වන්නට වන. ඕ තොමෝ ඇම්. බී. ජ්. නාමයට වඩා 'විශාඛා' නාමයට ප්‍රිය කළා ය.



**රජ කාලයෙන් පසු:-**

විහාරාරාම, පාසැල්, අනාථ නිවාස, ශිෂ්‍යත්ව, අම්බලම්, ආරෝග්‍යශාලා, ළිං-පොකුණු, සොහොන් බිම්, දන්වැට, දින්පතා දෙන දීමනා ආදී පොදු කටයුතු සඳහා වරින්-වර මෙ තුමිය විසින් පරිත්‍යාග කරන ලද මුදල රුපියල් විසි ලක්ෂය ද ඉක්මවා සිටී.

**සිංහල රජ කාලයෙන් පසු එක ද සිංහල කුල කාන්තාවක් විසිනුදු මෙතරම් විශාල පරිත්‍යාගයක් කරන ලද බැව ඉතිහාසයෙහි නොපෙණේ.**

---

## ඇම්. මත්තෙස් සල්ගාදු මැති තුමා

වෙළෙඳ ව්‍යාපාරයන්ගෙන් දියුණු වූ සිංහලයන් අතර පානදුරේ ඇම්. මත්තෙස් සල්ගාදු මැති තුමන්ට ලැබෙන්නේ විශේෂ ස්ථානයකි. තමුනුත් දියුණු වී ස්වකීය සේවකයන්ට ද දියුණුව ළඟා කරදීමේ පවිත්‍ර චේතනාවෙන් යුක්තව ක්‍රියා කළ මෙ තුමා මුලින් ම මහනුවර පාන් ගෙයක් ආරම්භ කෙළේ ය. එය ක්‍රම-ක්‍රමයෙන් දියුණුවත් ම බදුල්ලේ ද පාන් ගෙයක් ඇරඹුවේ ය. මෙසේ දියුණුවත්, වාසනාවත් තමන් කරා පැමිණෙත් ම ඇම්. ඇම්. සල්ගාදු සහ පුත්‍ර සමාගම පටන්ගත්තේ ය. දැන් මේ මහා ව්‍යාපාරයට අයත් ආපන ශාලා හා පාන් ගෙවල්, කොළඹ, මරදාන, මහනුවර, බදුල්ල, අනුරාධපුරය, මාතලේ, මොරටුව, බේරුවල, රාවතාවත්ත ආදී පළාත් කීපයක ම ඇත. මේ මහා ව්‍යාපාරයෙහි සේවකයන්ට මාසික වැටුප් පමණක් නොව අවුරුදු පතා පාරිතෝෂික දීමනාවන් ද පිරිනමනු ලැබේ. එහෙයින් මේ ව්‍යාපාරයෙහි නියුක්ත සේවකයෝ ඉතා උනන්දුවෙන් සිය යුතුකම් නොපිරිහෙලා ඉටු කරති.

## බෙලිකන්දේ සොහොයුරෝ

ගාල්ලේ සමුද්‍රාසන්නයෙහි අඩිමීපයක් බඳු උස් ගොඩැල්ලකි. මෙහි ඉපැරණි වලව්වක් ඇත. මේ වලව්වේ කෞරව වංශික ක්ෂත්‍රියකුගෙන් පැවතෙන ධනපති අධිපතීන් දෙදෙනෙක් වූහ. ඒ දෙදෙන සොහොයුරෝ ය. ඉන් වැඩිමහල් සහෝදරයා වූ ඩැනිස්ටර් පෙරේරා මහත්මා අභීත පුද්ගලයෙකි. සුද්දන්ට කිසිදු ගරු සරු කමක් නොදක් වූ මේ වීර කෞරවයාගේ පා පහරට ලක් වූ සුද්දන් කීප දෙනෙකි. මෙ තුමා මොරටුවේ විසූ මහා ධනපති චන්ද්‍රශේඛර මුදලිඳුගේ දියණියක් ආවාහ කොට ගත්තේ ය.

අනෙක් සොහොයුරා වූ ෆ්‍රැන්සිස් පෙරේරා මහත්මා සී. එච්. ද සොයිසා සිටුවරයාගේ හා ද සොයිසා ආයිමාව ගේත් දියණියක් ආවාහ කොට ගත්තේ ය. මෙ තුමන්ගේ සොහොයුරිය වූ රෙජිනා පෙරේරා හාමු ද සොයිසා පවුලේ ආතර් ද සොයිසා මැති තුමා හා විවාහ වූවා ය.

---

## පානදුරේ ශ්‍රී විජය කවිරාජ පඬි තුමා

කවිරාජයෝ බොහො ය. ඉන්දියාවේ රස වෛද්‍යයන්ට ද කවිරාජ නාමය ව්‍යවහාර කරති. අප රටේ දූන් සිවුපදයක් යම්තමකට ගැටගසා ගත හැකි මිනිසාත්, හන්දිවල තෙල් බේත් විකුණන මිනිසාත්, (කලින් කටපාඩම් කොට ගත්) කවියක්-දෙකක් කුවි මඩුවක දී කියන්නාත්, ව්‍යාකරණයක් බැරිනිසා නිසඳැස් කවියයි වාසගම් ලියන්නාත් මහා කවියන්-කවිරාජයන් වන්නට දඟලති. පානදුරේ විසූ මාඳුවගුරුගේ දොන් මර්තේලිස් සිල්වා ශ්‍රී විජය කවිරාජ පඬි තුමා එනාහි එබඳු පුහු මිනිසෙක් නොවේ. නියම කවි රාජයෙකි මහා සංඝ සභාවක් මගින් 'ශ්‍රී විජය කවිරාජ පණ්ඩිත' යන නාමයෙන් ගෞරව කරන ලද්දෙකි.





මෙ තුමාගේ පිය තුමා නක්ෂත්‍රාචාර්යවරයෙකි. පස් හැවිරිදි වියට පත් පුත්‍රයාට පියාණන් විසින් ම හෝඩිය උගන්වන ලදී. ඉන්පසු ඉගෙණීම කෙළේ පානදුරේ මෙතෝදිස්ත පාඨශාලාවෙහි ය. දොළොස් අවුරුද්දේ දී පානදුරේ රන්කොත් විහාරයෙහි වැඩ විසූ කෙසෙල්වත්තේ පඤ්ඤානන්ද ස්වාමීන්ද්‍රයන්ගෙන් එළු, පාළි, සංස්කෘතාදි භාෂා ශාස්ත්‍රයන් ඉගෙණීමට පටන්ගත් මෙ තුමා ඉංග්‍රීසි භාෂා වෙහි ද තරමක දැනීමක් ඇති කොට ගත්තේ ය. ඉක්බිති වැලිගම ශ්‍රී සුමංගල නාහිමියන් වහන්සේගෙන් වැඩිදුරටත් ඉගෙණීම කෙළේ ය. භාරත පණ්ඩිතයෙක් වූ 'ලලිතා ප්‍රසාද' නම් විශාරදයාගෙන් තර්ක-න්‍යායාදි ශාස්ත්‍රයන් ද දැනගත්තේ ය.

තරුණ වියට පැමිණි කවිරාජ පඬි තුමා ඉසබෙලා සොයිසා තරුණ මහත්මිය ආවාහ කොට ගත්තේ ය. පානදුරේ සජීජන විද්‍යාලයාධිපති ඩබ්ලිව්. ඇස්. ප්‍රනාන්දු මැතිණිය මේ යුවළගේ දියණියකි.

සර් විල්ෆ්‍රෙඩ් ද සොයිසා මැති තුමාගේ සිංහල ආචාර්‍ය්‍යවරයා වූ මෙ තුමා එතුමන් එංගලන්තයට යද්දී ඒ සමග ගොස් කලක් එංගලන්තයේ වැස බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ පොත්-පත් පරීක්ෂණයෙහි යෙදුනේ ය.

ශාස්ත්‍රීය වාදකරුවකු වූ මෙ තුමා වරශන වාදය, මනු වාදය, බංකු වාදය, හේසිරිමා වාදය යන වාද සතරක ම පක්ෂ නායකයෙක් ව සටන් කෙළේ ය. මෙ තුමන් අතින් ලියුවුණු කුදු මහත් ග්‍රන්ථ සංඛ්‍යාව සියයක් පමණ ඇත. කවි කල්ප තරුව, කාව්‍යාවතංසය, යමක කව්මිණ, සත් සිළුමිණ, සොයිසාලංකාර වර්ණනාව, නරකුමර සන්දේශය ආදිය ඉන් සමහරකි.


---

## සී. එච්. ඉසැඩ් ප්‍රනාන්දු මැති තුමා

මෙ තුමා වූ කලී සී. එච්. ද සොයිසා සිටු තුමාගේ හා එම සිටු දේවියගේත් මුණුබුරෙකි. සී. ඇම්. ප්‍රනාන්දු (ඇම්. ඒ. ඇල්. ඇල්. ඇම්.) රාජ නීතිඥ තුමාගේ අසහාය පුත්‍ර රත්නය මෙ තුමා ය. මෙ තුමා නීති ශිෂ්‍යයෙකු වශයෙන් එංගලන්තයේ ඉගෙණීමෙහි යෙදුණු අවදියෙහි පවා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවට මන්ත්‍රීන් තෝරා යැවීමේ බලය මහාජනයාට තිබිය යුතු බැව් පැවසුවේ ය. නිතරම මහාජන මතයට ගරු කළ මෙ තුමා සිය රටට පෙරළා පැමිණියේ පොදු වැඩ ගැන තද උනන්දුවක් දක්වූයේ ය. වරක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ද පත් වූ මෙ තුමා රෝමානු කතෝලික ආගමේ දියුණුවට නොමසුරුව ධනය පරිත්‍යාග කෙළේ ය. හලාවත රාජගුරු ප්‍රසාදින් වහන්සේගේ මාලිගාව හා ඒ අවට භූමි ප්‍රදේශයක් ප්‍රදානය කරන ලද්දේ මෙ තුමන් විසිනි.



## පාර්ලිමේන්තු මන්ත්‍රී පී. ද ඇස්. කුලරත්න මැති තුමා



අම්බලන්ගොඩ නම් සිත්කලු ගම්වරය උපන් ගම් කොට ඇති පැට්රික් ද සිල්වා කුලරත්න මැති තුමා වනාහී සරසවි වරම ලත් ප්‍රඥාවන්තයෙකි. කුඩා අවදියෙහි පටන් ම ඉගෙණීමෙහි අති දක්ෂයෙක් වූ මෙ තුමා රජයේ ශිෂ්‍යත්වය දිනාගෙන වැඩි දුර ඉගෙණීම පිණිස එංගලන්තයට ගියේ ය. එහිදී සහජයෙන් ලත් ස්වකීය දක්ෂභාවය ප්‍රදර්ශනය කරවමින් මෙ තුමා බී. ඒ., බී. ඇස්. සී., ඇල්. ඇල්. බී. යන උපාධි ලැබගෙණ සිය රටට පැමිණියේ ය.

අධිනීතිඥ වරයකු වශයෙන් කටයුතු කිරීමට හෝ රජයේ අනෙක් රැකියාවක යෙදීමට හෝ එතුමාට පිළිවන්කම තිබිණ. එහෙත් ආනන්ද විද්‍යාලය පාලනය කළ බෞද්ධ ජන නායකයන්ගේ ආයාචනයට සවන් දුන් මෙ තුමා ආනන්ද විද්‍යාලයෙහි ප්‍රධානාචාර්‍ය්‍ය පදවිය බාර ගත්තේ ය. ආනන්ද විද්‍යාලය අධ්‍යාපනය අතින් ද, ක්‍රීඩා අතින් ද, සුදු හරඹ අතින් ද අන්තයටම පිරිහී තුබුණු අවදියක ය මෙ තුමා

එහි ප්‍රධානත්වය පිළිගත්තේ. එහෙත් වැඩිකල් ගත නොවී ය. ආනන්දය කාගේත් ආනන්දයට හේතු විය. මෙ තුමා ආනන්දය මහා විද්‍යාලයක් බවට පරිවර්තනය කෙළේ ය. විභාග ප්‍රතිඵල අතින් ආනන්දය මුල් තැන ගත්තේ ය. ක්‍රීඩා අතින් අනභිභවනීය විය. එ පමණක් ද? සුද හරඹ අතින් ද මුල් තැනක් ගත්තේ ය. ආනන්දීයයෝ ඉලක්කයට වෙඩි තැබීමෙහි ප්‍රමුඛ ස්ථානය ගත්හ. ආනන්දයට ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීමට ලංකාවේ දෙගුරුන් පමණක් නොව ඉන්දියා, බුරුම, සියම්, මලයා ආදී රටවල දෙගුරුනුත් ඉදිරිපත් වන්නට වන.

කුලරත්න සූරීන්ගේ සූරභාවය පරම විඥනාර්ථ බෞද්ධ සමාගමට පෙනී ගියේ ය. අනෙක් පාසැල්වල කටයුතු ගැනත් මෙ තුමාගේ සහයෝගය පැතූ සමාගමේ නිදිබර ගතිය ද තුරන් විය. කොඩි දිනයන් හා සැණකෙළි ආදිය ඇති කිරීමෙන් ආනන්ද මහා විද්‍යාලයේ භූමි භාගය විශාල කිරීමටත්, අළුත් ගොඩනැගිලි ඉදි කිරීමටත් කුලරත්න මැති තුමා අදහස් කෙළේ ය. මේ සත්ව්‍යාපාරයන්ට ආතර් වී. දියෙස්, ජී. පී. මලලසේකර, ටී. ඒ. ධම්බන්ධු, ඇම්. ඊ ප්‍රනාන්දු, කේ ඩී. ද ලැනරෝල් ආදී මහතුන්ගේ සහයෝගය ද නොමඳ ව ලැබිණ. මේ අරමුදල්වලින් මැක්වුඩ් වත්ත රුපියල් හැටදහසකට මිලයට ගත් පරම- විඥනාර්ථ බෞද්ධ සමාගම රුපියල් ලක්ෂ ගණනක ගොඩනැගිලි ඉදි කෙළේ ය. කුලරත්න මහතාගේ අදහස ඉටු විය. සවකීය විද්‍යාලයෙන් ඉගෙණීම පතා දින- පතා එන ශිෂ්‍ය සංඛ්‍යාවට ඉඩ කඩ ප්‍රමාණ නොවී ය. කුලරත්න මැති තුමා බෞද්ධ ජන නායකයන් අමදි කොට කොඩි දින ආදිය පවත්වා අරමුදල් තර කෙළේ ය. එහි විපාක වශයෙන් නාලන්ද විද්‍යාලය ඇති විය. අද එයක් ආනන්දය මෙන් ම ශිෂ්‍යයන්ගේ හිතසුව සලසමින් පුරාණ නාලන්දව සිහියට නගවයි. මේ හැම කරුණකම මූලිකයා කුලරත්න මැති තුමා හැර අන් කවරෙක් ද?



වෙනත් පුද්ගලයන් හා බෞද්ධ සමාගම් මගින් පාලනය කරන ලද පාසැල්වලට ද කුලරත්න මැතිඳුන්ගේ උපකාරය බලාපොරොත්තුවන්නට වන. පානදුරේ ශ්‍රී සුමංගල විද්‍යාලයේ හා මොරටු විද්‍යාලයේත් පාලනය කුලරත්න මැති තුමාට පැවරිණ. වරක් ධර්මරාජ විද්‍යාලයේ ද ප්‍රධානත්වය දැරුවේ ය. බෞද්ධ පාඨශාලා සාමාන්‍යාධිකාරි ධුරයත් කීප වරක් ම මෙ තුමාට පැවරිණ. ඇතැම් විට එහි නිලධාරීන් තේරීමේදී පැවැති අයථා ක්‍රම නිසා මෙ තුමාට සාමාන්‍යාධිකාරි ධුරයෙන් ඉවත් වන්නට සිදුවුණි. එහෙත් මෙ තුමා ඉවත් ව සිටි ටික කාලයේදී පාසැල් පාලනය අවුල් ජාලයක් ව තිබිණ. රජකුගෙන් ඉටුවිය යුතු කාර්යයක් අදිකාරම් කෙනෙකුගෙන් කෙසේ බලාපොරොත්තු විය හැකි ද?

බෞද්ධ අධ්‍යාපනය පමණක් නොව අමද්‍යප ව්‍යාපාරය, අපරාධ මර්දනය ආදී පොදුජන ප්‍රශ්නයන්හිදී ද, දේශපාලනයෙහි ද උසස් තැනක් ගත් කුලරත්න මැති තුමා අනෙක් ජන නායකයන් සමග උරෙනුර ගැටී සහයෝග- යෙන් ක්‍රියා කෙළේ ය. වරක් රාජ්‍ය මන්ත්‍රීවරයෙක් ව සිටි මෙ තුමා දැන් අම්බලන්ගොඩ කොට්ඨාශය වෙනුවෙන් පාර්ලිමේන්තුවෙහි පෙනී සිටී. බෞද්ධ කොමිෂන් සභාවේ ද සභාපති ධුරය දැරූ මෙ තුමා බෞද්ධ අධ්‍යාපනය අතින් ගන්නේ මුල් තැනකි. කිසිවකුට නොදෙවැනි තැනකි.

---

## ඇල්. එච්. මෙත්තානන්ද මැති තුමා

ශාස්ත්‍රාචාර්ය මෙත්තානන්ද මහතාගේ නාම ය නොදන්නා සිංහලයෙක් ලක්දිව නැත. ආනන්ද මහා විද්‍යාලයෙහි හා ධර්මරාජ විද්‍යාලයෙහිත් ප්‍රධානත්වය දරමින් බෞද්ධ අධ්‍යාපනයට අමරණීය සේවයක් කළ මෙ තුමා වඩාත් ප්‍රසිද්ධියට පැමිණියේ සිංහල රට, සිංහල භාෂාව,




බෞද්ධයාගේ අයිතිවාසිකම් ආදි කරුණු ගැන මහ සටනක යෙදීමෙන් පසු ය. **මේ රට සිංහලයාගේ ය. සිංහලයාට තමාගේය යි කිව හැකි අන් රටක් මෙය හැර නැත. රටේ වැඩි දෙනා සිංහලයෝ ය. සියයට හැත්තෑපහකටත් වඩා සිංහලයෝ ය. එහෙයින් ප්‍රජාතන්ත්‍රවාදය අනුව මේ රටේ රාජ්‍ය භාෂාව සිංහලය විය යුතු ය. රටේ වැඩි පිරිස බෞද්ධයන් නිසා නිලතල අතින් බෞද්ධයන්ට දැන් තිබෙනවාට වඩා වැඩි බලයක් තිබිය යුතුය.** යනාදි තර්ක ගෙන හැර පාමින් මෙ තුමා දිවා රෑ දෙක්හි ප්‍රබල සටනක යෙදී සිටී.

බණ්ඩාරනායක රජය පිහිටුවීමට අන් හැම කෙනෙකුන්ට ම වඩා වෙහෙස වූ කෙනෙකි මෙත්තානන්ද මහත්මා. ප්‍රසිද්ධ කථා මාර්ගයෙන් ද වේගවත් ලිපිවලින් ද කලින් පැවති පාලන බලයට විරුද්ධව ප්‍රබල සටනක් ගෙන ගියේ මෙ තුමා ය. එහෙත් නව රජයේ නිලතල කිසිවක් මෙ තුමා පිළි නොගත්තේ ය. සිය අදහස් හරි හෝ වේවා, වැරදි හෝ වේවා, ඒවා ක්‍රියාත්මක කිරීමට අප්‍රතිහත ධෛර්‍යයෙන් යුක්තව මෙ තුමා ඉදිරිපත් වෙයි. ඉකුත් හතළිස් වස තුළ ලංකාවේ ජාතික වූ ද, ආගමික වූ ද සකල සත් ව්‍යාපාරයකට ම සහයෝගය දුන් මෙත්තානන්ද මහත්මා ඊයේ මෙන් අදත්, අද මෙන් හෙටත් සිය සටන ගෙන යයි බහු ජනතාව උදෙසා සිංහල ජාතික සටන මෙහෙයවයි.



## ආතර් වී. දියෙස් මැති තුමා



තමන්ට ලැබුණු නයිට් පදවිය ප්‍රතික්ෂෙප කරමින් ද, නිදහස් දිනයේ (පෙබරවාරි 4 වැනි දා) සිය ගෙයි දොරකඩ සිංහ කොඩියක් ද කළු හා සුදු කොඩි දෙකක් එල්ලමින් ද මහාජනයාට වූවමනා වැදගත් කරුණු, අතින් මුදල් ගෙවා ප්‍රසිද්ධ පත්‍රමාර්ගයෙන් පළ කරවමින් ද ලෝකයාගේ ප්‍රශංසාවටත්, උපහාසයට හා පරිහාසයටත් ලක් වූ අරුම පුදුම පුද්ගලයෙක් නොබෝදා අප අතුරින් තුරන් විය. ඒ අන් කිසිවකු නොව ජාත්‍යානුරාගයෙන් ඔද වැඩී ගිය සිත් ඇති, පුහු මාන්නය පුස්සක් කොට සැලකූ, ලක්දිව අමද්‍යප වීරයා ලෙස කවුරුත් පිළිගත්තා, දියෙස් මාමා, කොස් මාමා යන අපර නාමයන්ගෙන් ද හැදින්වෙන පානදුරේ ආතර් වී. දියෙස් මහත්මා ය.

මෙ තුමා පානදුරේ ඇම් මත්තෙස් සල්ගාදු මැති තුමාගේ දෙවැනි දියණියන් වූ ග්‍රේස් සල්ගාදු තරුණ මහත්මිය ආවාහ කොට ගත්තේ ය. උපාලි දියෙස් මැති තුමා, වෛද්‍යාචාර්‍ය ඇස් පී දියෙස් මැති තුමා, වී. සී. ජයසූරිය මැතිණිය ආදි දරු පිරිසක් ද ඇත. 1915 මරක්කල කෝලාහලය ගැන ජාතික වීරයන් සමඟ බන්ධනාගාර ගත වූයේ ය. රුපියල් ලක්ෂයක දඩයක් ගෙවා එයින් නිදහස ලැබුවේ ය. (දඩ මුදල ආපසු ලැබිණ. ධූම පානයෙන් වැළකී සාධු චරිතයක් ගත කෙළේ ය.


මත් පැන් බීමෙන් වැළකී උන්, මෙ තුමා සෙස්සන් ද එයින් වළක්වා ගැනීම පිණිස අමද්‍යප ව්‍යාපාරය ගෙන ගියේ ය. තැබෑරුම් වැහීම සඳහා රුපියල් ලක්‍ෂ ගණනක් වියදම් කෙළේ ය. බෞද්ධ අධ්‍යාපනය ගැන විශේෂ සැලකිල්ලක් දක් වූයේ ය. ආනන්ද-නාලන්ද පාඨශාලා සඳහා භූමි භාග ලබා ගැනීමටත්, ගොඩනැගිලි සෑදවීමටත් මුදල් සපයා ගැනීම පිණිස පැවැත්වුණු කොඩි දිනයන්හි ක්‍රියා සංවිධානයේ ප්‍රමුඛත්වය ආතර් වී. දියෙස් මහත්මා භාරගත්තේ ය. පී. ද ඇස්. කුලරත්න, ජී. පී. මලලසේකර, පී. ඒ. ධම්බන්ධු, රණවීර, කේ. ඩී. ද ලැනරෝල්, ඇම්.-ජ්. ප්‍රනාන්දු ආදි මහතුන්ගේ ද සහාය ලැබ අරමුදල් තර කොට ගත්තේ ය.

දක්‍ෂ කථිකයෙක් වූ මෙ තුමා රිවි දින දහම් පාසැල් ගැන ද විශේෂ උනන්දුවක් දැක්වූයේ ය. හීනටියන ධම්මාලෝක මාහිමියන්ගේ ආශ්‍රයෙන් චාම් ජීවිතයකට පුරුදු වූයේ ය. ඇස් ඩබ්ලිව්. ආර්. ඩයස් බණ්ඩාරනායක මැති තුමා මඟුල් දිනයේදී ජාතික ඇඳුමින් සැරසී සිටි පින්තූරය දැක කලිසම් ඇඳීම අත්හැර සුදුරෙද්දකින් හා (කෝට් එකකින්) බැනියමකින් සැරසුනේ ය. ධර්මපාල තුමා අනුගමනය කරමින් මහාජනයාට පත්‍ර මාර්ගයෙන් හා කථා මාර්ගයෙන් කරුණු කියාදී කොස්, දෙල්, පැපොල් ආදිය වැවීමේ ව්‍යාපාරයක් ගෙන ගියේ ය. බීජ ගබඩාවක් තබා මහාජනයා අතුර කොස් ඇට-පැල ආදිය පතුරුවා හැරියේ ය. මෙ තුමා කොස් මාමා වූ අතර මේ ව්‍යාපාරය නිසා ලක් බිමේ කොස් ගස් ලක්‍ෂ ගණනක් අමුතුවෙන් ඇති විය.

පොදු වැඩ ගැන සිය මැණියන්දෑ ද උනන්දු කරවූ මෙ තුමා රටට දැයට සමයට අමරණීය සේවයක් කරමින් හරි දැකීම් ඇතිව වාසය කෙළේ ය. මහත්මයා යන්නට වඩා පින්වතා යන්නට ගරු කෙළේ ය. තමා අදහස් කළ දේ හොඳ සිතින් යුතුව ක්‍රියාත්මක කෙළේ ය. සාධු චරිතයක් ගත කරමින් තම ජීවිතය ආදර්ශවත් එකක් කෙළේ ය.



## වෛද්‍යාචාර්ය වෝල්ටර් ඇස්. ජේ. පීරිස් මැති තුමා




ඉංග්‍රීසි උපාධිධර සුප්‍රසිද්ධ වෛද්‍යවරයෙක් වූ මෙ තුමා කාස රෝග මර්දන ව්‍යාපාරයෙහි පෙරමුණ ගෙන ක්‍රියා කෙළේ ය. බාල දරුවන්ගේ ශුභ සිද්ධිය උදෙසා ද බලවත් ව්‍යාපාරයක් ගෙන ගියේ ය. පළාතේ ජාතිකවූ ද, ආගමිකවූ ද, දේශපාලනාත්මකවූ ද සකල සත් ව්‍යාපාරයක ම මූලිකත්වය ගෙන ක්‍රියා කෙළේ ය. මොරටු පළාත් ආණ්ඩු සභාව නාගරික සභාවක් කළ යුතුය යි රජය මගින් ඇති කොට ගත් අදහසට විරුද්ධ ව පැවැත්වුණු මහාජන රැස්වීමේ මූලසුන ගෙන උනන්දුවෙන් ක්‍රියා කෙළේ මෙ තුමා ය.

---

## සිරිල් ප්‍රනාන්දු වෛද්‍යාචාර්ය තුමා

ඉගෙනීමෙහි අති දක්‍ෂයෙක්වූ ද සියුම් බුද්ධි මහිමයකින් යුක්තවූ ද මෙ තුමා වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ ඇම්. ඩී. උපාධිධරයෙකි. ඉංග්‍රීසි වෛද්‍යවරයන් අතර ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කළ මෙ තුමාගෙන් බොහෝ ඉංග්‍රීසි වෛද්‍යවරයෝ



පාරම්පරික ව පැවත එන ත්‍යාගශීලී භාවයේ මුදුන් පෙත්තට ම පැමිණියේ මෙ තුමා ය.

ගාල්ලේ මහින්ද විද්‍යාලය ඇතුලු පාසැල් ගණනාවක කළමනාකාර ධුරය මෙ තුමන්ට පැවරිණි. මෙ තුමා ඇතැම් පාසැල් අමුතුවෙන් ම ඇති කෙළේය. ස්වකීය ත්‍යාගශීලි භාවය නමැති මහ රුක සෙලෙව්වේ ය. පාඨශාලා භූමිභාගය ඇති විය. ඉන් පසු තවත් වරක් ත්‍යාගශීලි භාවය නමැති මහ රුක සෙලෙව්වේය. පාසැල් ගොඩනැගිලි ඇති විය. මේ අන්දමින් මෙ තුමා කාසි ගස සොලවමින් මහාජන වැඩ කරනු දුටු ඇතැම් ඊර්ෂ්‍යාකාර නරුධමයෝ රට මුළා කරමින් ද මිනිසුන් නොමග යවමින් ද තම බඩ පුරවා ගත්හ.

ළාබාල වියෙහි පටන් ම මහාජන සේවයට ලබැඳුණු එච්. ඩබ්ලිව්. අමරසූරිය මැති තුමා පමණ පොදු වැඩ ගැන ස්වකීය ධනය යෙදවූ අන් කිසි ත්‍යාගවන්තයෙක් අද ජීවතුන් අතර නැත. ද සොයිසා සිටු තුමා, ශ්‍රී චන්ද්‍රශේඛර සිටු තුමා, ආතර් ද සිල්වා ඇමති තුමා, ජෙරමියස් දියෙස් මැතිණිය ආදි කෞරව වංශික උත්තම-උත්තමාවන් මෙන් ම මෙ තුමාත් නොමසුරු ව රට, ජාතිය, ආගම වෙනුවෙන් ධනය ප්‍රදානය කරයි. මෙතුවක් මෙ තුමන් විසින් රුපියල් පසළොස් ලක්ෂයක් පමණ පොදු වැඩ සඳහා යොදවා ඇත.



දේශපාලනඥයකු වශයෙන් ද, ත්‍යාගවන්තයකු වශයෙන් ද, අමද්‍යප සේවකයකු වශයෙන් ද, කාරුණික සත් පුරුෂ මහාත්මයකු වශයෙන් ද ලංකාවට උදාර සේවයක් කරන මෙ තුමා ඩී. බී. ජයතිලක, ඩබ්ලිව්. ආතර් ද සිල්වා, ඩී. ඇස්. සේනානායක ආදි ජන නායකයන් සමග උරෙනුර ගැටී මහාජන වැඩ කෙළේ ය. දැනුදු මහාජන වැඩෙහි නියැලී ව වෙසෙයි. මහාජන මන්ත්‍රීවරයකු වශයෙන් පාර්ලිමේන්තුවට ඇතුල් වූ මෙ තුමා වෙළෙඳ ඇමති ධුරය ද දැරුවේ ය.

"ස බ ද බැහැර වෙනසක් නැතිව මෙත් අ මා
නි බ ද පතුරු වන රුහුනෙහි රුපුන් ද මා
ස ර ද පුන් සඳසෙ සිරි දිමුත මනර මා
සැ ර ද අමරසූරිය පිනැති මැති තු මා"

(කව් හඳන හැටි - පී. ඇස්. ධම්බන්ධු)

පානදුරේ මහා ධන කුවේරයෙක් ව සිටි ඇම්. කොර්නේලිස් පෙරේරා (ආරොන්) මහත්මයාගේ ප්‍රිය දියණිය සමග එච්. ඩබ්ලිව්. අමරසූරිය මැති තුමා සරණ බන්ධන ප්‍රාප්ත වූයේ ය. මේ මැතිණිය ද ස්වාමියා මෙන් ම නොමසුරු ව දන් පින් කරන්නී ය.

---

## සැනෙට් මන්ත්‍රීවර තෝමස් අමරසූරිය මැති තුමා

මෙ තුමා සිය දෙටු සොහොයුරාගේ අඩි පාරේ ගමන් කරමින් ජාතික වූ ද, ආගමික වූ ද සියලු යහ වැඩට ම සහභාගි වෙයි. ශ්‍රී ලංකා බෞද්ධ සමිතියේ සභාපති ධුරය හා පරම විඥනාර්ථ බෞද්ධ සමිතියේ සභාපති පදවියක් ද දරමින් බෞද්ධ දරුවන්ගේ අධ්‍යාපනය ගැන විශේෂ උනන්දුවකින් ක්‍රියා කරයි. මොරටුවේ ඇම්. ජේ. සී. ප්‍රනාන්දු මැතිඳුගේ හා එම මැතිණියගේ දෙ වැනි දියණිය වූ ප්‍රනාන්දු තරුණ මහත්මිය ආවාහ කොට ගත්තේ ය.


බණ්ඩාර නොහොත් මල්ල කුමාරවරුන්වූ බොධි මල්ල නරේන්ද්‍රයාගේ පුත්‍රරත්නයන් වූ රජ කුමරුවන් සිහිපත් කරවන ග්‍රාමයක්වූ මලලගම නම් ග්‍රාමයට අයත්වූ කොටසකි. මෙය දර්ශනීය "කොන්ගල ඔය" අසබඩ පිහිටි ගමකි. මේ ගමෙහි ධර්මිෂ්ඨ බෞද්ධොපාසකව සිටි දෙතියාගේ වෙළෙඳ ව්‍යාපාරිකයෙකු ව කටයුතු කළ බස්තියන් අප්පු උපාසක මහත්මා මෙ තුමාගේ පියාණෝ ය.

දැනට කුරුණෑගල "කාරවත්ත" නිවසෙහි වෙසෙන මෙ තුමා කුරුණෑගල ප්‍රසිද්ධ එළවලු වෙළඳ පළෙහි වෙළඳ ව්‍යාපාරිකයෙකි. රට, දැය, සමය දියුණුව පතා නොයෙක් වෙහෙස දරමින් කටයුතු කරන ත්‍යාගශීලී නැණවත් උතුමෙකි. තිස් වසරකට අධික කාලයක සිට කෞරව වංශය (කරාව කුලය) ගැන ඉතා උනන්දුවෙන් බොහෝ වියදම් දරා තම හිත මිත්‍රයෙක්වූ කුරුකුල වේන්දර් වීරසූරිය මහතා සමඟ කුරුරාජ වංශික කෞරව කුලය ගැන මෙතෙක් යටපත් ව තිබූ වටිනා ඉතිහාස ගත තොරතුරු රැස්කොට කාණ්ඩ දෙකකින් යුක්ත ව පළ කළ පිටු 700 කින් පමණ විශාලවූ කුරුකුල චරිතය නම් කරාව ඉතිහාස ග්‍රන්ථයේ ප්‍රකාශක මෙ තුමා ය. කුරුකුල චරිතයේ දෙ වෙනි කාණ්ඩයේ 258 වෙනි පිටුවේ මෙ තුමා ගැන ලියවී ඇති කවි කීපයකින් එක් කවියක් මෙසේයි:-

පෙම් පා දැයට රුපු එඬිබිඳ කෙසරු යු රු
සෙන්පති පදවි ලත් පෙර වෙතින නරව රු
සෙන්පති පරපුරක "පැලවා" කුලෙහි කු රු
සත් මිතු ජයරත්න දිනූ සැපතින් සපි රු



## ශාස්ත්‍රසූරි මාර්ටින් වික්‍රමසිංහ පඬි තුමා



පත්‍ර කලා වේදියෙක් වූ ද, සුප්‍රසිද්ධ ලේඛකයෙක් වූ ද, මාර්ටින් වික්‍රමසිංහ මහත්මා වනාහි සෙවොත්සාහයෙන් දියුණු වූ කෞරව වංශිකයෙකි. ඔහුගේ පොත් සරල හා සුගම ය. එහෙයින් ම ඒවා ජන ප්‍රිය භාවයට පත් විය. පත්‍ර සඟරා ආදියට ලිපි ලිවීමෙන් ලේඛන කලාවට බැස ගත් මාර්ටින් වික්‍රමසිංහ මහත්මා කලියුගය, විරාගය, අයිරාංගිනී, ශීතා, සෝමා, රෝහිණී, මිරිඟුව, මඩොල්දූව, අපේ ගම, ගම්පෙරළිය, අපූරු මුහුණ, යුගාන්තය, උපාසකම්මා ආදි නවකථා රාශියක් රචනා කෙළේ ය. නව පද්‍ය සිංහලය, විචාර ලිපි, කාව්‍ය විචාරය, ගුත්තිල ගීතය, සාහිත්‍ය කලාව, සිංහල ලකුණ, බුදු සමය හා සමාජ දර්ශනය, ඇත්ත යුත්ත, බණ කථා සාහිත්‍යය, සිංහල සාහිත්‍යයේ නැගීම, සාහිත්‍යොදය කථා, පුරාණ සිංහල ස්ත්‍රීන්ගේ ඇඳුම, සත්ව සන්තතිය, ග්‍රාමීය විද්‍යා ප්‍රවේශනය, සාහිත්‍ය ශික්ෂා, විද්‍යාවිනෝද කථා, තේරිගී, ප්‍රජා පාලන ශික්ෂා ආදි ග්‍රන්ථ රාශියක් ද මෙ තුමන් අතින් ලියවිණ. එමතු ද නොව ඉංග්‍රීසි පොත් සතරක් ද සම්පාදනය කිරීමෙන් වික්‍රමසිංහයෝ ස්වකීය වික්‍රමය පළ කළහ. ස්වකීය ජීවන චරිත කථාව ද 'උපන්දා සිට' නමින් පළ කිරීමෙන් මෙ තුමා පාඨක ලෝකයෙහි විශේෂ ස්ථානයක් ගත්තේ ය.

වික්‍රමසිංහ විශාරදයන්ගේ වියත් කම ගැන පැහැදුණු ලක් රජය මගින් 'ඇම්.බී.ඊ.' යන ගරු නාමය එතුමන්

වෙත පිරිනමන ලද්දේය. 'බමුණු කුලය බිඳ වැටීම' යන හිසින් මාර්ටින් වික්‍රමසිංහයන් විසින් ලියන ලද ලිපියකට රුපියල් පන්දහසක තෑග්ගක් ලැබිණ. ප්‍රසිද්ධ පත්‍ර කලාවේදියෙක් වූ වික්‍රමසිංහ පඬි තුමා ලක්මිණ, දිනමිණ, ලක්වැසියා, සිළුමිණ ආදී ප්‍රවෘත්ති පත්‍ර කීපයක ම කර්තෘ ධුරය දැරුවේ ය. 'ශාසත්‍රසූරි' යන ගෞරව නාමය ලංකා විශ්ව විද්‍යාලය මගින් මෙ තුමා වෙත පිරිනමන ලදී. තිහඬ ව මහාජන සේවය කරන ටික දෙනා අතුරින් මාර්ටින් වික්‍රම-සිංහ මහත්මා ද එක් කෙනෙකි.

---

## පොලිස්පති ඔස්මන් ද සිල්වා මැති තුමා

අම්බලම්ගොඩ තෝමස් ද සිල්වා මුදලිඳුගේ හා එම මැතිණියගේත් පුත්‍රයෙකි. මෙ තුමා උප පොලිස් සුපිරින් ටැන්ඩන්ට් වරයකු වශයෙන් රාජකාරිය ආරම්භ කොට ස්වකීය ක්‍රියා සූරත්වය නිසා පොලිස් පති පදවිය දක්වා ඉහළ නැංගේ ය. ස්වකීය සෘජු දේහයට ම අනුරූප වූ තේජස්වී විලාසයක් මෙ තුමා තුළ ඇතත් බිළිඳකු මෙන් ශාන්තය. පොලිස්පති වරයෙක් ව සිටි රිවඬ් අළුවිහාරේ මැති තුමන්ගේ දියණියක් ආවාහ කොට ගත් මෙ තුමා ආඥා බලයෙන් ම රට වැසියන් හික්ම වීමට වඩා මහාජනයා සමග සහයෝගයෙන් ක්‍රියා කිරීමෙන් ඔවුන් හික්ම විය යුතු බැව් පොලීසියේ සේවකයන්ට පෙන්වා දුන්නේ ය. පොලීසිය ජාතිකෝත්සව ක්‍රීඩා ආදියට ඇදී ආයේ මෙ තුමාගේ පාලන යුගයේ දීය.

---

## ඩබ්ලිව් දැනියෙල් ප්‍රනාන්දු වෛද්‍යශේඛර වෙද මුදලි තුමා

ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙහි හසළ බුද්ධිමතෙක් වූ මෙ තුමා ටික කලක් වෙද මූහන්දිරම් නාමය දරමින් දස-දහස් ගණන් රෝගීන්ට ප්‍රතිකාර කෙළේ ය. මෙ තුමාගේ





ඖෂධ වර්ගවලින් මහා ජනයාට සැලසුන සුව-සෙත ඉමහත් ය. මෙ තුමාගේ ක්‍රියා සූරත්වය ගැන බලවත් සතුටට පැමිණි රජය මගින් වෙද මුදලි නාමය ද පිරිනැමිණි. සාමාන්‍යයෙන් සමස්ත ලංකා-වේ ද, විශේෂයෙන් පානදුරු පළාතේ ද බොදු-පොදු වැඩ ගැන උනන්දුවක් දැක්වූ මෙ තුමා ප්‍රාචීන පණ්ඩිත විභාගයෙන් විශේෂ ස්ථානයක් ගෙන සමර්ථ වන ශිෂ්‍යයන් සඳහා 'වෛද්‍යශේඛර ත්‍යාගය' නමින් තෑග්ගක් ද පිහිටෙව්වේ ය. සත්‍යාර්ථ සංග්‍රහව නම් මාසික සඟරාව අවුරුදු ගණනක් පළ කරවූයේ ය. කෞරව වංශිකයින්ගේ දියුණුව නිතර ප්‍රාර්ථනා කෙළේ ය සෑම පිරිවෙන්වලට ම උපකාර කෙළේ ය. ගොවිතැන දියුණු කිරීම සඳහා තෑගි ඇති කෙළේ ය.

---

## පානදුරේ සල්ගාදු සහෝදරයෝ

ක්‍රි: ව: 1915 මුස්ලිම් කලහයේදී සිංහල ජාතිහිතෛෂි ජන නායකයින් සියලු දෙනාම සිරභාරයට ගත්හ. ඒ අතර පානදුරේ ධනපති පවුලකට අයත් සුකුමාල සහෝදර තරුණයන් දෙ දෙනෙක් ද වූහ. ඇම්. මත්තෙස් සල්ගාදු මහතාණන්ගේ පුත්‍රයන් වූ ඇම්. වෝල්ටර් සල්ගාදු මහත්මා හා ඇම්. රිචඩ් සල්ගාදු මහත්මාත් ඒ සොහොයුරෝ දෙ දෙනාහ. ජාත්‍යාලයෙන් ඔද වැඩී ගිය, ආගමාලයෙන් ළය පිරී ගිය ඒ තරුණයන් දෙ දෙනා රට, ජාතිය වෙනුවෙන් දහ දුක් වින්දෝ ය. සිරබත් කෑවෝ ය.

සිර ගෙයින් ආ පසු මේ සොහොයුරෝ ජාතික වූ ද, ආගමික වූ ද සකල සත් ව්‍යාපාරයකටම රුකුල් දෙමින් ස්වකීය ව්‍යාපාරය ගෙන යති. මේ ව්‍යාපාරයන්හි නියුක්ත සේවකයන් සිය ගණනකි. ඔවුන්ගේ යහපත මේ ස්වාමිවරුන්ගෙන් හොඳ හැටි ලැබේ. ආතර් වී. දියෙස් මැති තුමා සල්ගාදු සොහොයුරන්ගේ මස්සිනා ය.

---

## විල්මට් ඒ. පෙරේරා මැති තුමා

ඇතැම් ධනපතියෙක් දේශාටනයෙහි ගොස් පෙරළා අවුත් සිය රටේ චිත්‍ර පටි ප්‍රදර්ශනාගාරයක් අරඹද්දී, තවත් ධනපතියෙක් රේස් අසුන් තොගයක් රැගෙන සිය රට එද්දී විල්මට් ඒ පෙරේරා මහත්මයා කෙළේ කුමක් ද? ඉන්දියාවේ රවීන්ද්‍රනාත් තාගෝර් තුමා හමු වී එතුමන්ගේ මඟ පෙන්වීම යටතේ ලංකාවේ ආදර්ශ ශාස්ත්‍ර ශාලාවක් ආරම්භ කිරීමයි. ශ්‍රීපාලිය ඇති වූයේ රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ හා පානදුරේ විල්මට් ඒ. පෙරේරා මැති තුමාගේ සාකච්ඡාවක විපාක වශයෙනි.

හොරණ ශ්‍රීපාලි විද්‍යාලය ලංකාවට ආදර්ශවත් පාඨශාලාවකි. භාරතයේ ශාන්තිනිකේතනයේ ක්‍රමයට හැඩ ගැසුණු මේ විද්‍යාලයෙන් සිය ගණනක් ශිෂ්‍යයන් නාට්‍ය කලා, චිත්‍ර කර්ම ආදිය උගෙණ ප්‍රීතියෙන් දවසරිති.

මේ ආයතනය පවත්වා ගෙන යාමෙන් විල්මට් ඒ. පෙරේරා මහතා රුපියල් ලක්ෂ ගණනක් අලාභ වින්දේ ය. එහෙත් යහපත් විපාක දැකීමෙන් ඒ මහතා ප්‍රීති වනවා ඇත. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් ව සිටි විල්මට් ඒ. පෙරේරා මැති තුමා ඉන් පසු චීනයේ ලංකා තානාපති පදවිය දැරුවේ ය. එහෙත් ටික කලකින් තානාපති පදවියට ආයුබෝවන් කියා සිය රට පැමිණි විල්මට් ඒ. පෙරේරා මැති තුමා වැටුප්



කොමිෂන් සභාවේ සභාපති පදවිය දැරුවේ ය. කවදත් මෙ තුමා බහු ජනතාවගේ හිත සුව පතන්නෙකි. මේ තුමා 'රබර් රජ්ජුරුවෝ' යන අපර නාමයකින් ප්‍රසිද්ධ ව සිටි පානදුරේ "සුවර්ණගිරි" යෙහි ඇම්. ඒ. පෙරේරා මැතිඳුගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා ය.

---

## සර් සුසාන්ත ද පොන්සේකා මැති තුමා

ඇම්. ඒ. ඇල්. ඇල්. ඇම්. උපාධිධාරි අධිනීතිඥයෙක් වූ පානදුරේ සුසාන්ත ද පොන්සේකා මැති තුමා රූප රාජයෙකි. කරුණාවේ මූර්තියෙකි. විශාරද දේශපාලනඥයෙකි. ක්‍රියා සූර වීරවරයෙකි. තත් වැසි නුවණින් යුත් නියම මහත්මයෙකි. එ තුමා අවංකය. සාධාරණය.

පානදුරේ සුප්‍රසිද්ධ වෛද්‍යාචාර්ය වරයෙක්ව විසූ සී පී. ද පොන්සේකා මැති තුමා මෙ තුමාගේ පියාණෝ ය. මෑණියෝ මහා ධනපති ශ්‍රී චන්ද්‍රශේඛර මුදලිඳුගේ දියණියකි. බාල කාලයෙහි පටන් ම දුප්පතාගේ දුක ගැන දන්නා නියම ප්‍රජාතන්ත්‍රවාදියෙක්වූ සුසාන්ත නමට ම ගැළපෙන ශාන්ත ජීවිතයක් ඇත්තෙක් විය. පානදුර නගරයේ වළාන කොට්ඨාශයේ උපදේශකයා වශයෙන් පානදුරේ නගරසභාවට ඇතුලත් වූ මෙ තුමා වැඩි කල් නොගොස්ම නගරාධිපති පදවියට පත්විය. නගර සභාවේ කලින් පැවැති දූෂණ ක්‍රියා නමැති වැහි අඳුරු සුසාන්ත හිරුගේ උදා වීමෙන් දුරුවී යන්නට වන. පලාතේ කවුරුත් සතුටට පත් වූහ. පානදුරේ සෞඛ්‍ය නිවාසය ආදි මහ ජනතාවට ප්‍රයෝජනවත් දේ ඇති වූයේ මෙ තුමාගේ පාලන කාලයේ දීය.

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පානදුරු ආසනය වෙනුවෙන් දෙවරක් ම තෝරා ගත් සුසාන්ත ද පොන්සේකා මැති තුමා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ උප සභාපති පදවියට ද පත් විය. මෙ තුමාගේ අවංක ක්‍රියා කලාපය ගම් පලාතේ දේශපාලන කපටින්ට හිස රදයක් විය. එහෙයින් මෙ තුමා පරාජය

කොට පානදුරු ආසනයෙන් ඉවත් කළ යුතුය යි ඔවුහු කල්පනා කළහ. බේගල්වලින් මහාජනයා මුළා කළහ. ඔවුන්ගේ අදහස ඉටු විය.

පානදුරේ පාර්ලිමේන්තු ආසනයෙන් ඉවත් ව ගිය සුසාන්ත ද පොන්සේකා මැති තුමා බුරුමයේ ලංකා තානාපති කමට පත් ව දෙ රට අතර හොඳ හිත දියුණු කෙළේ ය. බුරුම මහාජනයා ද මෙ තුමාට ඉතා හිතවත් කම පළ කළහ. ඉන් පසු ජපන් රටේ ලංකා තානාපති පදවියට පත් විය. ඒ රටේ ජනයාගේ ද ප්‍රසාදයට ලක් වූ ද පොන්සේකා මැති තුමා නන්අයුරින් දෙ රට හොඳ හිත දියුණු කෙළේ ය. මෙ තුමාගේ අසහාය දුහිතෘව වූ මානෙල් ද පොන්සේකා තරුණ මැතිණිය ශාස්ත්‍රාචාර්‍ය්‍ය ඇන්. කේ. ඒ. ද සිල්වා තරුණ මැති තුමා සමග විවාහ වූවා ය.

ද පොන්සේකා ආර්‍ය්‍යාව වූ කලී ධනවත් ව්‍යාපාරිකයෙක් ව පානදුරේ "සල්ගාදු විලා" හි විසූ ඇම්. මත්තෙස් සල්ගාදු මැති තුමාගේ කණිටු දියණිය යි. ඇම්. වෝල්ටර් සල්ගාදු මැති තුමා හා රිචඩ් සල්ගාදු මැති තුමාත් මෙතුමියගේ සොහොයුරෝ ය. මෙ තුමිය ද ස්වාමියා අනුගමනය කරමින් පොදු වැඩ කරයි. දන් පින් කිරීමෙහි නියැලි උපශාන්ත උත්තමාවකි සුසාන්ත ද පොන්සේකා ආර්‍ය්‍යාව.

## සර් පිලිප් රුද්‍රිගු මුදලි තුමා

නයිට් පදවියක් ලැබීමෙන් අහංකාර භාවයකට පත් නොවූ, රුද්‍රිගු මැති තුමා වෙනදා මෙන් ම පොදු ජන යහපත ගැන ක්‍රියා කරයි. මෙ තුමා සාමාන්‍යයෙන් සකල සිංහල වර්‍ගයාගේ ද, විශේෂයෙන් රෝමානු කතෝලිකයන්ගේ ද දියුණුව සලකා බලවත් උනන්දුවකින් ක්‍රියා කරයි. අනෙක් ජන නායකයන් හා උරෙනුර ගැටී මහාජන ශුභ සිද්ධිය සඳහා කටයුතු කරයි. මෙ තුමාට චැවලියර් (නයිට්) නාමය ද පාප් වහන්සේගෙන් ලැබී ඇත.



## සර් බැනට් සොයිසා මහනුවර නගරාධිපති තුමා

පානදුරේ නල්ලූරුවේ බැනට් නිවෙසේ බස්තියන් සොයිසා මැති තුමාගේ හා එම මැතිණියගේත් පුත්‍රයෙක් වූ මෙ තුමා විශාල ව්‍යාපාරිකයෙකි. මහා ධන කුවේරයෙකි මහාජන සේවයට ම කැපවුණු ජීවිතයක් ඇති මෙ තුමා ප්‍රජාතන්ත්‍රවාදයට එකඟ ව දේශපාලන කටයුතුවල ද යෙදේ. මහනුවර නගරාධිපති වූ ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ව සිටියා වූ ද, සැනෙට් මන්ත්‍රීවර සර් බැනට් සොයිසා මහතා බෞද්ධ අධ්‍යාපනය ගැන විශෙෂ උනන්දුවක් දක්වූයේ ය. මහනුවර මහාමායා විද්‍යාලයේ දියුණුවට උනන්දුව වැඩ කෙළේ ය. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්‍ෂා කරන අනෙක් ජන නායකයන් සමග එක්සත් ව වැඩ කරයි. මහියංගන චෛත්‍ය වර්‍ධන සමිතියේ ගරු භාණ්ඩාගාරික ධූරය දරණ මෙ තුමා ස්වකීය ධනය රුපියල් ලක්‍ෂ භාගයක් පමණ වියදම් කොට අභිනව මහියංගන චෛත්‍ය රාජයාගේ රන් කොත සෑදවූයේ ය. ගතවූ ශත වර්‍ෂ භාගය තුළ සර් බැනට් ද සොයිසා මැති තුමාගේ සහයෝගයෙන් තොර ව සිදු වූ පොදු වැඩක් නැතැයි කිව හැක. ද සොයිසා ආර්‍ය්‍යාව ද ස්වාමියා අනුගමනය කරමින් පොදු වැඩෙහි නියැලිව විසුවා ය.

## සර් අර්නස්ට් ප්‍රනාන්දු මැති තුමා

සිය දෙටු සොහොයුරු ජේම්ස් ඇල්ෆ්‍රෙඩ් ප්‍රනාන්දු මහතා සමග සහයෝගයෙන් බෝගල පතල දියුණු කොට එය ලඞ්කාවේ ප්‍රධාන මිනිරන් ආකරය බවට පත් කළ මෙ තුමා ආගමික කටයුතුවලදී සිය දෙටු සොහොයුරු අනුගමනය කෙළේ ය. දහස් ගණනක් සේවකයනට රැකියාව ලබා දුන් මෙ තුමා මොරටුවේ ඕර්ලෝසු කණුව, සෞඛ්‍ය නිවාසය ආදී පොදු වැඩ සඳහා ලක්‍ෂ ගණනක් ප්‍රදානය කෙළේ ය. බෞද්ධ භික්‍ෂූන් සඳහා විහාරාරාම

කර වූයේ ය. මෙ තුමාගේ බෞද්ධ-පොදු වැඩ ගැන සැලකිලිවත් වූ ආණ්ඩුව මගින් 'නයිට්' නාමයකින් මෙ තුමාට ගරු කරන ලදී. මෙ තුමා කෝටිපතියකු වශයෙන් මෙ ලොවින් තුරන් විය.

---

## සර් ලියෝ ප්‍රනාන්දු මැති තුමා

සේවාත්සාහයෙන් දියුණුව නමැති ඉණිමගේ අන්තිම පෙත්ත දක්වා නැගුණු සර් ඩබ්ලිව්. ලියෝ ප්‍රනාන්දු මැති තුමා වූ කලී ශ්‍රේෂ්ඨ ව්‍යාපාරිකයෙකි. පානදුර මෝටර් ට්‍රාන්සිට් කොම්පැනියේ ප්‍රධානියා ව ක්‍රියා කළ මෙ තුමා දෙසිය ගණනක් බස් රථ ඇතිව ස්වකීය ව්‍යාපාරය ගෙන ගියේ ය. මෙ තරම් දිගු බස් රථ මාර්ගයක් කිසිම බස් ව්‍යාපාරයකට නොලැබිණි. එහෙත් සැතපුම් දෙසිය ගණනක් දිගු වූ මේ බස් රථ මාර්ගයෙහි මගීන්ට සුව-පහසු ඇති වන පරිදි මෙ තුමා ක්‍රියා සංවිධානය කෙළේ ය. සේවකයන්ට හොඳ හැටි සැලකුවේ ය. බුත්තල ආසනය දිනාගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වූයේ ය.

ධනපතියකු වූ පසු පින් දහම් කිරීමට පටන්ගත් මෙ තුමා වෙහෙර-විහාර කර වූයේ ය. වෙසක් තොරන් ආදිය බන්දවා බෞද්ධයන් තුළ ආගමික හැඟීම් දියුණු කෙළේ ය. පොදු වැඩ සඳහා රුපියල් හාර ලක්‍ෂයක් ප්‍රදානය කෙළේ ය. පානදුර මෝටර් ට්‍රාන්සිට් සමාගමේ හා මැද්දෙගෙදර, ගිකියනකන්ද ආදි විශාල වතු යාය කීපයක අයිතිකාරයා වී කෝටිපතියකු වශයෙන් මෙ ලොවින් තුරන් විය.

---

## අධිකරණ අමාත්‍ය ධුරය දැරූ ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා මැති තුමා

රජ නීතිඥ පදිවියෙන් සොලිසිටර් ජනරාල් පදවියට ද එයින් ඇටෝර්නි ජනරාල් පදවියට ද, එයින් ධර්මාධිකරණ විනිශ්චයකාර පදවියට ද පත්වූ මෙ තුමා සර් ඩී.බී. ජයතිලක



මැතිඳුගෙන් පසු ඉන්දියාවේ වෙළෙඳ කොමසාරිස් පදවියට පත්වූයේ ය. රාජකාරිවලින් විශ්‍රාම ලැබ සිටි ද සිල්වා මහතා මහාජන එක්සත් පෙරමුණු රජයේ අධිකරණ ඇමති පදවියට පත්වූයේ ය. අවංකව හිතට එකඟව ක්‍රියා කළ මෙ තුමා ටික කලකට පසු අධිකරණ ඇමති පදවියට ද ආයුබෝවන් කියා නිදහස් දිවි පෙවෙතක් ගත කෙළේ ය.

---

(අධිකරණ අමාත්‍ය ධුරය දැරූ)

## වැලන්ටයින් ඇස්. ජයවික්‍රම මැති තුමා

සුප්‍රකට නීතිවේදියෙක් වූ මෙ තුමා ඇම්.ඩබ්ලිව්. එච්. ද සිල්වා ඇමති තුමන්ගේ අස්වීමෙන් පසු මහාජන එක්සත් පෙරමුණු රජය මගින් අධිකරණ ඇමති පදවියට පත් කර ගන්නා ලදී. ශ්‍රෙෂ්ඨාධිකරණයෙහි විනිශ්චයකාර ධුරයක් ද දැරූ මෙ තුමා නිදහස් අදහස් දරන මහාජන සේවකයෙකි.


---

(අධිකරණ අමාත්‍ය ධුරය දැරූ)

## එඩ්මන්ඩ් ජේ. කුරේ මැති තුමා

අභීතිය නීති විශාරදයෙක් වූ ද, සිවිල් නිලධාරියෙක් වූ ද, උත්තර මන්ත්‍රී එඩ්මන්ඩ් ජේ. කුරේ මැති තුමා නියම මහාජන සේවකයෙකි. චතුර කථිකයෙකි, විශේෂයෙන් වාද්දුව පළාතේ ද, සාමාන්‍යයෙන් සමස්ත ලංකාවේ ද පොදු වැඩවලදී මෙ තුමා සිය කොටස නොපිරිහෙලා ඉටු කරයි. එක්සත් ජාතික පක්‍ෂය මෙ තුමා අධිකරණ අමාත්‍ය ධුරයට පත් කොට ගත්තේ මෙ තුමා තුළ පවත්නා නීති විශාරද භාවය නිසා ය. මෙ තුමා වූ කලී අවංක ජන සේවකයෙකි. ආදර්ශවත් උත්තර මන්ත්‍රීවරයෙකි.

## සෑම් පී. සී. ප්‍රනාන්දු අධිකරණ ඇමති තුමා



ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයෙහි අධිකරණ ඇමති ධුරයට පත්වුණු සෑම් පී. සී. ප්‍රනාන්දු මැති තුමා වූ කලී මොරටුවේ වැදගත් පෙළපතකට අයත් කෞරව වංශික යෙකි. අධිනීතිඥ වරයෙක් වූ මෙ තුමා මහා නීතිවේදියෙකි. අවිතීය කථිකයෙකි සාමාන්‍යයෙන් සමස්ත ලංකාවේ ද, විශෙෂයෙන් මොරටු පළාතේ ද පොදු වැඩ ගැන උනන්දුවක් දක්වන්නෙකි. සිංහලය රාජ්‍ය භාෂාව කිරීම සඳහා බලවත් පරිශ්‍රමයක් දරන උතුමෙකි.

රටේ සාමය ඇති කිරීම සඳහාත්, අපරාධ මර්දනය කිරීම සඳහාත් රට පුරා ගෙන යන සාම මණ්ඩල ඇති කිරීමේ ව්‍යාපාරයෙහි මෙ තුමා පුරෝගාමීව ක්‍රියා කරයි.




## බී. හැරිසන් ජ් පීරිස් මැති තුමා



පානදුරේ බී. හැරිසන් ජ්. පීරිස් මැති තුමා දිවිපෙවෙත ඇරඹුවේ කම්කරුවෙකු වශයෙනි. ක්‍රම-ක්‍රමයෙන් උනන්දු වෙන් කටයුතු කළ මෙ තුමා බස් බොඩි සෑදීමට පටන් ගත්තේ ය. අද පානදුරේ 'හැරිසන්ස්' මහා කර්මාන්ත ශාලාව බවට පරිවර්තනය වූයේ මේ ව්‍යාපාරය යි. අද එහි සිය ගණනක් කම්කරුවෝ වැඩ කරති. මෙ තුමා කම්කරුවන් ගැන හොඳින් සලකයි. ඔවුන්ගේ දුක් ගැනවිලි ගැන සොයා බලා සුදුසු පිළිවෙත් යොදයි.

සාමාන්‍යයෙන් සමස්ත ලංකාවේ ද, විශෙෂයෙන් මොරටු-පානදුර දෙ පළාතේ ද බෞද්ධ-පොදු වැඩ සඳහා නොමසුරුව ධනය වියදම් කරන මෙ තුමා සැදැහැවත් බෞද්ධයෙකි. සදාචාර සම්පන්න ආදර්ශවත් ස්වාමියෙකි.

## ඇල්. පීටර් ප්‍රනාන්දු මැති තුමා



මෙ තුමා වූ කලී එගොඩඋයනේ දිළිඳු පවුලක උපන් උද්‍යෝගවත් පුරුෂයෙකි. සොවාත්සාහයෙන් දියුණුවූ මෙ තුමා පානදුරේ 'වීරගිරි' වෙළෙඳ ව්‍යාපාරයෙහි ආදි කර්තෘවරයා ය. තමනුත් දියුණුවී සිය නෑ හිතවතුන්ට ද දියුණුවීමේ මඟ උදා කළ මෙ තුමා ස්වකීය ධනයෙන් වැඩි කොටසක් එගොඩඋයනේ ශ්‍රී බෝධිරාජාරාමයෙහි වැඩ කටයුතු සඳහා යෙදෙව්වේ ය. ජාතික වූ ද ආගමික වූ ද සකල සත් ව්‍යාපාරයකට ම උපකාර කරමින් දැහැමි දිවි පෙවෙතක් ගත කෙළේ ය. මෙ තුමාගේ ඥාති පුත්‍ර ටී. ඇස්. පීරිස් මැති තුමා සිය සුළු පියාණන් මෙන් ම මහාජන සේවයෙහි නියුක්ත වීම සතුටට කරුණකි.



(කොළඹ නගරාධිපති පදවිය දැරූ)

## ආර්. ඒ. ද මැල් මැති තුමා

කලකට පෙර කොළඹ නගරාධිපති පදවිය හා පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයක් ද දැරූ රෙජිනෝල්ඩ් ඒ. ද මැල් මහතා වූ කලී මොරටු පුත්‍රයෙකි. ලක්‍ෂපතියෙක්වූ මෙ තුමා කොළඹ වරායේ නැව්වලින් බඩු බාන-බඩු පටවන ව්‍යාපාරයක අයිතිකාරයා වී විශාල ආදායමක් ලැබුවේ ය. සිය ගණනක් කම්කරුවන්ට රක්‍ෂාව දුන්නේය. සේවකයන්ට හොඳින් සංග්‍රහ කෙළේ ය. දනට-පිනට දුන්නේ ය. එක්තරා නඩුවක දී මෙ තුමා ඒ අවුරුද්දේ කොතෙක් ආදායම් බදු ගෙවා තිබේ දැයි නායක විනිශ්චයකාර තුමකු විසින් අසන ලද ප්‍රශ්නයකට 'රුපියල් හය ලක්‍ෂයකැ' යි පිළිතුරු ලැබිණි. ඒ ඇසූ විනිශ්චයකාර තුමා "ඔබ කුමාරයකු වාගේ කටයුතු කරනවාය" යි කියමින් තීන්දුව දුන්නේ ය.

---

(කොළඹ නගරාධිපති පදවිය දැරූ)

## ආර්. ඇස්. ඇෆ්. ද මැල් මැති තුමා

'නගරාධිපති සාමි' යනුවෙන් කොළඹ නගරාධිපති කෙනෙකු හඳුන්වනු ලැබුවා නම් ඒ ගෞරවය කීප විටක් ම ලැබීමෙහි වාසනාව මෙ තුමන් සතුව තිබිණි. ශ්‍රීමත් එච්. ඇල්. ද මැල් මැති තුමන්ගේ පුත්‍රයෙක් වූ මෙ තුමා ජාතික වූ ද, පොදු ජනයාගේ යහපතට අදාලවන්නා වූ ද සෑම ප්‍රශ්නයකදී ම මහාජන පක්‍ෂය ගෙන කටයුතු කෙළේ ය. වුවමනා අවස්ථාවන්හිදී නොමසුරුව ධනය කැප කෙළේ ය. පියාණන්ගේ අඩි පාරේ යමින් පොදු ජන සේවය කරයි. අග්නිදිග ආසියාවේ නායක බිෂොප් පදවිය දරන ගෞරවණීය ලක්දාස් ද මැල් උතුමා මෙ තුමාගේ සහෝදරයෙකි.

### ජී. සී. ද පොන්සේකා සේනාපති තුමා

මිහිරන් පතල් හිමියෙක් ව සිටි ජී. සී. ද පොන්සේකා (ජ්‍යෙෂ්ඨ) මැති තුමාගේ පුත්‍රයෙකි. ලංකාණ්ඩුකාර තුමාගේ ආරක්ෂක ඇමති ධුරයක් දැරූ මෙ තුමා මොරටුවේ විසූ සුප්‍රසිද්ධ දෙස්තර කෙනෙක් වූ කේ. ජේ. ද සිල්වා සාමදාන විනිශ්චයකාර තුමාගේ හා එම මැතිණියගේත් දියණියක් ආවාහ කොට ගත්තේ ය.

---

### ඇස්. (සාගෝ) ජයවික්‍රම මැති තුමා

සී. ඇෆ්. ඇස්. ජයවික්‍රම මුදලි තුමාගේ හා එම ළමා එතනියගේත් පුත්‍රයෙකි. ක්‍රිකට් ක්‍රීඩාවට උපන් හපනෙකි. තමා උගත් පාසැල්වලට ගෞරවය අත් කොට දෙමින් ක්‍රීඩා කළ (සාගෝ) ජයවික්‍රමගේ දක්ෂ තාවය දිනපතා රට මුළුල්ලේ පැතිරෙන්නට වන. ක්‍රීඩා ලෝලයෝ ඉරිදා පුවත් පත් රැගෙන ජයවික්‍රම විසින් පිහිටුවන ලද වාර්තා බලමින් පසසන්නට වන. මේ අතර සමස්ත ලංකා සිංහල ක්‍රීඩා සංගමයේ නායක ධුරයට ද ජයවික්‍රම තරුණයා තෝරා පත් කොට ගත්හ. සිංහල වර්ගයාගේත්, රටේත් ගෞරවය ආරක්ෂා කරමින් සවකීය ක්‍රීඩකයන් මෙහෙය වූ තරුණ ජයවික්‍රමගේ කීර්තිය දේශ-දේශාන්තරයන්හි පැතිර ගියේ ය.

---

පාබල සේනාධිපති

### කර්නල් මොරිස් ද මැල් මැති තුමා

චැවලියර් තෝමස් ඒ. ද මැල් මුදලි තුමාගේ පුත්‍රයෙකි. කෞරව වංශිකයෙකි. භක්තිමත් කතෝලිකයෙකි. එදිරිල්ලේරාළ, අන්තෝනිබරෙත්තු ආදී සව වංශික සේනාපතියන් මෙන් ක්‍රියා සූරත්වයෙන් උසස්වූ උසස් නිලධාරියෙකි. නාවුක සේනාධිපති රොයිස් ද මැල් මැති තුමා මෙ තුමාගේ සොහොයුරෙකි.



(අහස් හමුදා නායක)

### කැප්ටන් ඩේවිඩ් පීරිස් මැති තුමා

සී. එච්. ද සොයිසා සිටු තුමාගේ හා ද සොයිසා ආයතීවගේ මුණුබුරෙකි. මහනුවර විසූ ඇල්. එච්. ඇස්. පීරිස් මැති තුමාගේ හා එම මැතිණියගේත් පුත්‍රයෙකි. අහස් යාත්‍රා පැදවීමේ අති දක්ෂයෙක් වූ මෙ තුමා සව වංශිකයන්ගේ පරම්පරානුයාත ගෞරවය ආරක්ෂා කරමින් ක්‍රියා කරන උතුමෙකි.

---

### මොන්ටේගු ජයවික්‍රම සේනාපති තුමා

කීප වරක් ම වැලිගම මන්ත්‍රී වශයෙන් මහාජන ඡන්දයෙන් වැලිගම ආසනයට තෝරා පත් කර ගත්තා වූ ද, කම්කාන්ත ඇමතිවරයා ව සිටියා වූ ද සේනාපති මොන්ටේගු ජයවික්‍රම මැති තුමා වූ කලී තනතුරු ලාභයෙන් හිස උදුම්මා නොගන්නා නියම ප්‍රජාතන්ත්‍රවාදී වීර පුරුෂයෙකි. පිය-මුතු පරපුරින් එන විශාල වස්තුවකට හිමිකාරයාවූ මෙ තුමා දක්ෂිණ ලංකාවේ මහා දනපතියෙක් ව සිටි හැන්රි අමරසූරිය මැති තුමාගේ හා එම මැතිණියගේත් ප්‍රිය දුහිතෘවක් ආවාහ කොට ගත්තේ ය.

ජාතික වූ ද, ආගමික වූ ද සකල සත්ව්‍යාපාරයකදීම මෙ තුමා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂාකරගනිමින් එක්සත් ජාතික පක්ෂයේ පතාක යෝධයකු වී සටන් කරයි. ධීවර කාර්මිකයන්ගේ මෙන් ම ගොවි-කම්කරු ජනතාවගේත් උන්නතිය සඳහා ක්‍රියා කරයි. අවංක මහාජන සේවකයෙකි. නිහතමානී උත්තමයෙකි.

---

නාවුක සේනාධිපති

### රොයිස් ද මැල් මැති තුමා

කෞරව වංශිකයන් නාවුක සේනාපතිකම් දැරුවේ අද ඊයේ නොවේ. මහා පරාක්‍රමබාහු මහා රජයන්ගේ

කාලයේදී ද කෞරව වංශිකයන් නාවුක සේනාපති (අද්මිරල්-ජලාධිකාරි) පදවි දැරූ බව ඉතිහාසයෙන් මොනවට පැහැදිලි වේ. කෞරව ආදිත්‍ය කුරු අරශ නිලයිච්ච කුමාර තමෙල් නම් කෞරව වංශික නාවුක සේනාපතියෙක් බුරුම රට පේගු නුවරට යැවූ බැව් ඉතිහාසයෙන් පෙනේ.

නිදහස ලැබූ පසු ලංකාවට ද නාවුක හමුදාවක් අවශ්‍ය විය. එහි ප්‍රථම නාවුක සේනාධිපති ධුරයට (අද්මිරාල් පදවියට) පත් වූයේ ආරෝහ පරිණාහ දේහයකින් හා කෘතහස්ත සමත්‍ථතාවයෙන් ද යුක්ත වූ තේජස්වී පුද්ගලයෙකි. මේ පුද්ගලයා අන් කිසිවෙක් නොව ලංකා නාවුක හමුදාවේ රොයිස් ද මැල් රෙයාර් අද්මිරාල් තුමා ය.

---

## පී. එච්. විලියම් ද සිල්වා කර්මාන්ත හා ධීවර ඇමති තුමා

ධනවත් පවුලකට අයත් මෙ තුමා එංගලන්තයේ ඉගෙන ගන්නා අවදියෙහිදී ම ජෙමෝ කිතියාටා ආදි විප්ලවවාදීන් සමඟ කටයුතු කෙළේ ය. ලක්දිවට පැමිණි පසු දිළින්දන් සුවපත් කිරීමත්, කම්කරුවන් නඟාසිටුවීමත් පරමාර්ථ කොට ගෙන දේශපාලනයට බැස්සේ ය. මහාජන එක්සත් පෙරමුණට බැඳී එය නඟා සිටුවීමට ක්‍රියා කෙළේ ය. මිනි පෙර සිටි එකද ඇමතිවරයකුගෙන් වත් ධීවර කාර්මිකයනට කියයුතු සේවයක් නොසිදුවූ නමුත් මෙ තුමා යාන්ත්‍රිකබෝට්ටු ක්‍රමයක් හා නිවාස ක්‍රමයක් ඇතිකරවීමෙන් ද උදාර සේවයක් කෙළේ ය. "ඇම්. ඊ. පී. ආණ්ඩුවේ ඇමතිවරයෙක්ව ධීවර කාර්මිකයන්ගේ උන්නතිය සඳහා අදාල මෙබඳු වැඩ ආරම්භ කිරීම ඇතැම් අයගේ විමතියට හේතුවකි"යයි ජනතා සහ සිළුමිණ කතෘ මහතාගේ "1956 සහ ඉන්පසුව" යන ඉංග්‍රීසි පොතේ සඳහන් වේ. නියම මහාජන සේවකයෙකි. කාරුණික මහාත්මයෙකි. ධීවර කාර්මිකයෝ අදත් ඒ මහතාගේ නාමට ගරු කරත්.



## ඒ. එච්. පී. ද සොයිසා මැති තුමා

මහා ධනපතියෙක් වූ මෙ තුමා සවකීය ධනයෙන් කොටසක් පුණ්‍ය කටයුතු සඳහා යෙදවූයේ ය. සව වර්ගයාගේ අභිවෘද්ධිය නිතර ප්‍රාර්ථනා කෙළේ ය. මොරටු පළාතේ හා මහනුවර පළාතේ පොදු වැඩ ගැන විශේෂ සැලකිල්ලක් දැක්වූයේ ය. මහා දානපතියෙක් ව දවසැරියේ ය. 'පෙළපත සහිත කෞරව රාජ වංශය' නම් පොත පිළිගන්නා ලද්දේ මෙ තුමන් විසිනි.

---

## වී. සී. ජයසූරිය මැති තුමා

උපාධිධරයෙකි. කියා සුර රාජ සේවකයෙකි. අමරපුර නිකායේ මහා නායක ධුරය දැරූ වැලිගම ශ්‍රී සුමංගල මහා නායක හිමියන්ගේ මුණුපුරෙකි. ජයසූරිය පෙළපත නමැති මැණික් මාලයේ දිලිසෙන මැණිකක් බඳු මෙ තුමා අද පළාත් පාලන හා නිවාස අමාත්‍යාංශයේ නිත්‍ය ලේකම් පදවිය දරයි. පානදුරේ විසූ අමදෲප වීරවර ආතර් වී. දියෙස් මැති තුමන්ගේ දියණියක් ආවාහ කොට ගත් මෙ තුමා විශේෂයෙන් පානදුරා පළාතේ ද, සාමාන්‍යයෙන් සමස්ත ලංකාවේ ද පොදු දැඩට නිතර ම සහාය වෙයි. පළාත් පාලන සභාවල විශේෂ ශ්‍රේණිගයක් ඇති කෙළේ ය.

---

## දේවාර් සූර්යසේන මැති තුමා

සර් ජේම්ස් පීරිස් මැති තුමාගේ හා පීරිස් ආයනීවගේත් ප්‍රිය පුත්‍රයෙකි. බී. ඒ. ඇල්. ඇල්. බී. උපාධිධාරී අධිනීතිඥයෙක් වූ මෙ තුමා නීති වෘත්තියට වඩා සංගීතයට ප්‍රිය කෙළේ ය. සිංහල වන්නම් පිළිබඳ මනා අවබෝධයක් ඇති මෙ තුමා ඒවා රාග-තාල අනුව ගායනය කරමින් සවදේශිකයන්ගේ හා විදේශිකයන්ගේ සිත් දිනා ගත්තේ ය. මෙ තුමාගේ ප්‍රියාව වූ නෙළුම්දේවියත් සිංහල ගීත ගායනයෙහි දක්ෂ උත්තමාවකි. මේ යුවළ යුරෝපා අමෙරිකා ආදි රටවල සිංහල වන්නම් ගයා-වයා සමස්ත ලංකාවට ම ගෞරවයක් අත් කොට දුන්හ. නීතිවේදියකු වශයෙන් ද, දේශපාලනඥයකු වශයෙන් ද, දේශ ප්‍රේමියකු වශයෙන් ද, ශාස්ත්‍ර විශාරදයකු වශයෙන් ද මෙ තුමාගේ පියාණන්ට

ලෝකයාගේ ගෞරවාදරය ලැබෙන අතර ජනප්‍රිය නළුවකු වශයෙන් ද ගායකයකු වශයෙන් ද දේවාර් සූර්යසේනට මහාජන ගෞරවය ලැබේ.

---

## ඩබ්ලිව්. ඇම්. ප්‍රනාන්දු මැති තුමා



පානදුරේ මොරවින්නේ විසූ වඩිහැන්නැදිගේ ජුවානිස් ප්‍රනාන්දු (අප්පුසිඤ්ඤො මුදලාලි) මෙ තුමාගේ පියාණෝ ය. එම පෙළපතෙහිම වූ කර්ලිනා ප්‍රනාන්දු මැතිණිය මෑණියෝ ය. පවුලේ අසහාය පුත්‍රයා වූ මෙ තුමා ළාබාල අවදියෙහි පටන් ම ඉගෙණීමෙහි දක්‍ෂයෙක් විය. මෙ තුමා තරුණ



වියට පැමිණෙත් ම සිංහල, පාළි, සංස්කෘත ආදි පෙරදිග භාෂාවන්හි පමණක් නොව ඉංග්‍රීසි භාෂාවෙහි ද ප්‍රවීණයෙක් විය. පානදුරේ නල්ලූරුවේ 'අමෘතගිරි' යෙහි පී. ජෝර්ලිස් දියෙස් වෛද්‍යාචාර්‍ය්‍ය තුමන් විසින් පවත්වන ලද 'අමෘතෝදය වර්ණනා' පද්‍ය තරගයෙන් මෙ තුමා දෙවැනි තෑග්ග දිනා ගත්තේ ය.

වියත් ලේඛකයෙක් වූ මෙ තුමා 'සිහල සමය' පත්‍රයෙහි කතෘ මණ්ඩලයෙහි සේවය කෙළේ ය. ඉන් පසු 'ලක්මිණ' පත්‍රයෙහි ප්‍රධාන කතෘ ධුරය ද දැරුවේ ය. කලකට පසු මෙ තුමා අධ්‍යාපන මණ්ඩලයෙහි ග්‍රන්ථ පරිවර්තක ධුරයට පත් කරන ලද්දේ ය. පත්‍ර-සඟරා ආදියට ශාස්ත්‍රීය ලිපි හා රසවත් කවි සිය ගණනක් මෙ තුමන් අතින් ලියවිණි. සිරිමලී නම් කවි පොත මෙ තුමාගේ ප්‍රබන්ධයකි.

---

## ඇම්. ජේ. සී. ප්‍රනාන්දු මැති තුමා

මෙ තුමා මොරටුවේ හොරේතුඩුවේ උපන්නේ ය. මොරටු බෞද්ධ ජනතාව වැටී උන් ප්‍රපාතයෙන් නඟාලනු වස් උට්ඨාන වීර්යයෙන් කටයුතු කෙළේ ය. මොරටුවේ පමණක් නොව මුළු ලංකාවේ ම ජාතික, ආගමික වැඩ ගැන උනන්දුවක් දැක්වූයේ ය. මොරටුවේ බෞද්ධ දරුවන්ට ඉංග්‍රීසි ඉගෙණීම සඳහා බෞද්ධ පාඨශාලාවක් නැතිව පැවැති අඩු පාඩුව පිරිමසා ලනු වස් අළුත්වත්ත නම් භූමිභාගය මිලයට ගෙන බෞද්ධ මන්දිරය හා පාඨශාලා ගොඩනැගිලිත් ඉදිකිරීමෙහි ප්‍රමුඛ ව ක්‍රියා කෙළේ ය. ශ්‍රී ලංකා බෞද්ධ සමිතිය පිහිටුවා ඒ මගින් ලෝසසුන් බැබළවූයේ ය. මෙ තුමාගේ මේ සත්ව්‍යාපාරයට බී. දෙන් තෝමස්, ඇම්. ටී. ප්‍රනාන්දු, සී. පී. දෙඩන්ගොඩ, ටී. ඒ. ධම්බන්ධු, එවුජින් ප්‍රනාන්දු, අයිසෙක් ද මැල් ආදි මහතුන්ගේත් සහයෝගය ලැබිණි. මොරටු පළාත් ආණ්ඩු සභාවේ උපදේශක ධුරයක් ද දැරුවේ ය.

## ඇම් සිම්යොන් ප්‍රනාන්දු මැති තුමා



එගොඩඋයන උපන් ගම් කොට ඇති මෙ තුමා වූ කලී සොත්සාහයෙන් දියුණු වූ කෞරව වංශිකයෙකි. ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවෙක් වූ මෙ තුමා ද සොයිසා පවුලේ පරම්පර තුනක ම ගොඩනැගිලි ඉදිකිරීමෙන් විශේෂ වාර්තාවක් පිහිටුවූයේ ය. දැනුදු ද සොයිසා පවුලේ වැඩ හා වෙනත් ධනපතියන්ගේ වැඩ ත් මෙ තුමා විසින් කරවනු ලැබේ. අවංක භාවයත්, සුරවීර භාවයත් මෙ තුමාගේ දියුණුවට හේතු විය. කටුබැද්දේ ද සොයිසා උද්‍යානය ඉදිරිපිට සුවිසල් මැඳුරක් සාදවා ගත් මෙ තුමා ඒ අවට ගෙවල් රැසක ම අයිතිකාරයා ය. තමන් දුක සේ උපයා ගත් වස්තුවෙන් දන්-පින් කිරීමෙහි නියැලී වූ මෙ තුමා එගොඩඋයනේ සුනන්දෝපනන්දාරාමයට අඩුපාඩුවක් ව තුබුණු විහාර මන්දිරය රුපියල් තිස් දහසක් පමණ වියදම් කොට කර වූයේ ය. කටුබැද්දේ සුවර්ණ ශෛලබිම්බාරාමයෙහි හා ගම් පළාතේ අනෙක් වෙහෙර විහාරවල ද පින්කම්වලට නොමසුරුව උපකාර කරන මෙ තුමා මාදම්පේ ජේතානායක ආරාමයෙහි කේශ ධාතු චෛත්‍යය ඇතුළු සුවිසල් ගොඩනැගිලි සෑදවීමේදී උපදෙස් දුන්නේ ය.

## ජේ. වී. පීරිස් මැති තුමා

ඉංග්‍රීසි-සිංහල භාෂාවන්හි මනා පටුත්වයක් ඇතිව පොත්-පත් සම්පාදනය කළ මෙ තුමා උසස් පෙළේ ග්‍රන්ථ කර්තෘවරයෙකි. දූත් මෙන් පාසැල් පොත් සුලභ නොවූ





අවදියෙකය මෙ තුමා පාසැල් පොත් ලිවුවේ. භූගෝල ශාස්ත්‍රය හා ගණිතය ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා එදා මෙ තුමා ලිවූ පොත් දෙ පෙළ ඉතා අගේ කොට කවුරුත් පිළිගත්හ. මොරටු නගර සභාවේ උපදේශක ධුරයක් ද දැරූ මෙ තුමා ගම් පළාතේ පොදු වැඩවලදී මූලිකත්වය ගෙන ඉතා උනන්දුවෙන් ක්‍රියා කෙළේ ය.

## මහා කවි හික්කඩුවේ බී. එච්. අමරසේන මැති තුමා




කවිකාරයෝ බොහෝ ය. කොටසක් තෙල්-බෙත් වෙළෙඳුන් මෙන් වන පොත් කොට ගත් කවි පෙළක් වේදිකාවක් පාසා කියමින් රට මුළා කරන හිටුවන කවියෝ ය. කොටසක් බෙත් සීට්ටු වැනි කවි පත්ති ලියන නිසඳැස් කවියෝ ය. කොටසක් අඩි පිට කවියෝ ය. මෙබඳු කුකවියන් ගෙන් පිරි ලොවක නියම කවියෙකැයි කටපුරා කිවහැකි හික්කඩුවේ අමරසේන වූ කලී උපන් කවියෙකි. මහා කවියෙකි. අසෝකමාලා, සකුන්තලා, අම්මා, බිම්බා දේවි, පබාවතී, කතරගම් කාව්‍යය ආදි කවි පොත් රැසක් ලිවූ මෙ මහා කවියා අඩු වයසින් මියගියේ ය. එහෙත් ඔහුගේ කවිවලින් අදත් මහාජනයා පල ලබති.

## ඇස්. ඒ. පීරිස් ගුරු තුමා

පේරාදෙණියේ ක්‍රිස්තියානි අභ්‍යාස විද්‍යාලයෙහි ගුරුවරුන් පුහුණු කරවමින් සිටි මොරටුවේ ඇස්. ඒ. පීරිස් මහත්මා වූ කලී ආදර්ශවත් ගුරුවරයෙකි. සමස්ත ලංකා කවික තරගයෙන් ප්‍රමුඛයා ව රන් පදක්කම් ලැබුවෙකි. පාසැල් පොත් කීපයක් සම්පාදනය කළ ග්‍රන්ථ කර්තෘවරයෙකි. ප්‍රසිද්ධ සමාජ සේවකයෙකි.

---

## ගන්දර පී. ඩී. ඇස්. වීරසූරිය ගුරු තුමා




ගුරුවරු බොහෝ ය. එහෙත් සිය යුතුකම් නොපිරිහෙළා ඉටු කරමින් ගුරු ගෞරවය රැක ගත්තෝ දහසකින් එක් කෙනෙකි. ගන්දර පී. ඩාර්ලිස් ඇස්. වීරසූරිය මහත්මා නියම ගුරුවරයෙකි. ගුරු පදවියේ ගරුත්වය ආරක්ෂා කරන්නෙකි. හොඳ ගෝල පරපුරක් හැදූ වීරසූරිය ගුරු තුමා සාරගර්භ ග්‍රන්ථ රාශියක් ද සම්පාදනය කෙළේ ය. ළමා කවි, සිංහල කවීන්ද්‍රයෝ, සරල කථා, පාඨශාලීය බුද්ධ ධර්මය, සරසවි මණ්ඩපය, අමෘත බිංදු, සිංහල වීරවරයන්ගේ මත, මාතර සාහිත්‍ය වංශය, වර්ණනා සහිත නීලකොබෝ සන්දේශය, දෙවුන්දර



ඉතිහාසය, ඔවා කළඹ ආදි පොත් මෙ තුමාගේ කෘතීන් අතර ඇත. 'සිංහල ළමයා' සඟරාව ද මෙ තුමාගේ කර්තෘත්වයෙන් සම්පාදනය කරන ලද්දකි. ස්වකීය සේවය ගුරු වෘත්තියට ම සීමා නොකළ මේ ගුරු තුමා ජාතික වූ ද ආගමික වූ ද සියලු යහ වැඩට ම රුකුල් දෙන්නෙකි.

---

## බස්තියන් කැන්මර (වර්ණකුල) මැති තුමා



කළුතර-කලමුල්ල උපන්ගම් කොට ඇති මෙ තුමා ස්වභාෂා ගුරුවරයකු වශයෙන් ක්‍රියාරම්භ කෙළේ ය. පස්දුන් කෝරළයේ යටිගම්පිටියේ රජයේ මිශ්‍ර පාඨශාලාවේ ස්වභාෂා උප ගුරුවරයකු වශයෙන් රාජකාරියට බැඳුණු මෙ තුමා තුළ ස්වභාෂාව පිළිබඳ ලෙන්ගතු කමක් තිබිණි. 1943 රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී පළමු වරට ස්වභාෂා ප්‍රශ්නය පිළිබඳ නව අදහසක් පළ කළ මන්ත්‍රීවරයකුගේ කථාවක් මෙ තුමාගේ හදවත තුළ වේගයෙන් රැව් පිළිරැව් දෙන්නට විය. ස්වභාෂාවන් රාජ්‍ය භාෂාවන් වශයෙන් පිළිගත යුතු යයි රාජ්‍ය මන්ත්‍රීවරයා මහ හඬින් කියා සිටි නමුදු ඉංග්‍රීසියෙන් සිංහලයට පරිවර්තනය වීමේදී පැන නඟින සම්බාධකයන් පිළිබඳ ව කල්පනා කෙළේ මේ ගුරු තුමා ය.

ඉංග්‍රීසි භාෂාව අවුරුදු සිය ගණනක් මුළුල්ලේ එක ම රාජ්‍ය භාෂාව වශයෙන් පිළිගැනී තිබුණු යටත් විජිතයක

සවභාෂා ප්‍රශ්නය පැන නැගීම අතිශය වැදගත් කාරණයක් ලෙසින් සඳහන් කළ යුතු ය. එහෙත් සිංහල භාෂාව එම රාජ්‍ය තත්ත්වයට පත්වීමට තරම් සකලාංග සම්පූර්ණ ද යන්න රාජ්‍ය පාලකයන්ගේ මනැසට යොමු වූයේ ද යි සිතීම සැක සහිතය.

සිංහල ලඝු ලේඛන ක්‍රමයක් ඒතාක් සිංහල භාෂාවට අංග සම්පූර්ණ අන්දමින් සකස් වී තිබුණේ නොවේ. සවභාෂා ප්‍රේමී මහතුන් කීප දෙනෙකු විසින් ම සිංහල ලඝු ලේඛන ක්‍රම කීපයක් සකස් කරන ලද නමුත් ඒවා අංග සම්පූර්ණ නොවීම නිසා දෝ එතරම් ප්‍රචාරයකට පත් නොවී ය.

මේ අතර ඔස්ටින් කැන්ටර් (වර්ණකුල) ගුරු තුමා විසින් ඉංග්‍රීසි 'ග්‍රෙග්' නම් ක්‍රමය අනුගමනයෙන් සකස් කරන ලද 'කැන්ටර්' ලඝු ලේඛන ක්‍රමය රටේ කවුරුත් පිළිගත්හ. මෙ තුමාගේ ක්‍රමය අනුගමනය කරන ශිෂ්‍යයෝ සිය ගණනක් ඇත. රජයේ කාර්මික විද්‍යාලයයේ හා පොලිටැක්නික් වාණිජ විශ්ව විද්‍යාලයයේත් ලඝු ලේඛනය පිළිබඳ ආචාර්ය වරයා ඔස්ටින් කැන්ටර් මැති තුමා ය.

මෙ තුමා අතින් මෙතුවක් ලියවුණු පොත් අතුරින් සමහරකි මේ. 'කැන්ටර්' ලඝු ලේඛනය, 'කැන්ටර්' යතුරු ලියන ඇබෑසිය, 'කැන්ටර්' වේග පදහන මාලාව, හෙළ පදහන පුහුණුව, බස් පෙරළිය, හෙළ යතුරු කුරු පුහුණුව, වෙළෙඳ බස, මල් මාසය, හෙළ බස් රැකුල, හෙළ පදහන රැළිය, කාසිය හා ළදරු හඬත් ය.

## ශාස්ත්‍රාචාර්ය ඒ. ඇම්. ද සිල්වා මැති තුමා

පානදුරේ ශ්‍රී සුමංගල විද්‍යාලයයේ හා මොරටු විද්‍යාලයයෙහිත් ප්‍රධානාචාර්ය ධුරය දැරූ ඒ. ඇම් ද සිල්වා මැති තුමා වූ කලී ආදර්ශමත් ආචාර්යවරයෙකි. එසේ ම සමත්



නළුවෙකි. තමා පෙනී සිටින කොටස මැනවින් ඉටු කිරීමේ හැකියාවක් ද සිල්වා මහත්මා තුළ සහජයෙන්ම පිහිටා ඇත. බෞද්ධ අධ්‍යාපනයෙහි දියුණුව උදෙසා පුරෝගාමීව ක්‍රියා කළ ටික දෙනාගෙන් මෙ තුමා ද එක් උතුමෙකි. ගති-ගුණ අවංකය. නියම මහත්මයෙකි.

## ලැස්ටර් ජේම්ස් පීරිස් මැති තුමා

උසස් චිත්‍රපටි කීපයක් නිපදවූයේ ය. චිත්‍රපටියේ තාත්වික සවරූපය චිත්‍රපටි ලෝලයනට ගෙනහැර පෑමේ අදහසින් මෙ තුමා විසින් සම්පාදනය කරන ලද ඇතැම් චිත්‍රපටි විදේශයන්හි චිත්‍රපටි තරගයන්ට ද ඉදිරිපත් කරනු ලැබීය. එසේ ඉදිරිපත් කරනු ලැබූ රේඛාව ආදී චිත්‍රපටි විදේශිකයන්ගේ ගෞරවාදරයට ද හිමි විය. මෙ තුමා දැන් මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ 'ගම්පෙරළිය' චිත්‍රපටි ගත කිරීමේ යෙදී සිටී.

## සුනිල් ශාන්ත මැති තුමා

ගීත ගායනයෙහි මෙන් ම රචනයෙහි ද එක සේ සමතෙකි. ඔහුගේ ගායනය පියකරු ය. ඉමිහිරි ය. රචනය සරලය. සුගමය. සිත් ගන්නා සුලුය. සුනිල් හඬ, පිදිවලාව, ගුවන් තොටිල්ල, මල් මිහිර, මිහිරියාව, සුනිල් ගීය, දේශීය සංගීතය ආදී ගීත පොත් රැශියක් සුනිල්ගේ රචනාවලියට ඇතුළත් ය. ඔහුගේ ගුවන් විදුලි ගීතයන්ට සවන් දීමට දෙනෝ දහක් පුල-පුලා ඉඳිති.

## ඩබ්ලිව්. ඩී. අමරදේව මැති තුමා

කෞරව වංශිකයෙක් වූ ද, මොරටු පුත්‍රයෙක් වූ ද, අමරදේව බාල කාලයෙහි පටන් ම සංගීත ශාස්ත්‍රය පිළිබඳ හැඟීමකින් යුතු ව වාසය කෙළේ ය. දස හැවිරිදි වියෙහි දී ම

වයලීනය හොඳ හැටි වාදනයෙහි හැකියාවක් තුබුණු අමරදේව මහාජනයාගේ ගෞරවාදරයට පාත්‍ර වූයේ තෑගි-බෝග ද ලැබුවේ ය. ලාංකික සංගීතය ගැන පරීක්ෂා කිරීමෙහි යෙදුණු මහාචාර්‍ය රතංජනර් තුමා අමරදේවයන් ගැන ප්‍රසාද මුඛයෙන් කථා කෙළේ ය. අමරදේවයන්ගෙන් ලංකාවට කීර්තියක් අත්වන බැව් ඉදුරා දත් ලංකාදීප පත්‍රය ඔහුගේ අනාගතය සාර්ථක කරලීම සඳහා අරමුදලක් පිහිටුවාලී ය. ඒ මේ අරමුදලින් වැඩිදුරටත් සංගීතය ඉගෙනීම සඳහා අමරදේවයන් ඉන්දියා වට යැවී ය. ඉන්දියාවේ දී විශේෂ දක්ෂකම් පාමින් තෑගී දිනාගනිමින් ඉගෙනීමෙහි යෙදුණු අමරදේවයෝ විද්‍යාලයේ ප්‍රමුඛ ශිෂ්‍යයා වශයෙන් සමර්ථ වූහ. පෙරළා ලක්දිවට පැමිණි අමරදේවයෝ ගුවන් විදුලියෙහි ද විශේෂ තැනක් ගනිමින් සංගීත ශාස්ත්‍රය දියුණු කිරීමෙහි යෙදෙති.

---

## තිලකසිරි ප්‍රනාන්දු මැති තුමා

සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක් වූ ඇම්. සී. ප්‍රනාන්දු මහත් මාගේ පුත්‍රයා ය. ගීත ගායකයෙකි. වේදිකා නළුවෙකි. ප්‍රබන්ධ රචකයෙකි. කාලගෝල කථාව ආදි නාට්‍යයන්හි පොතේ ගුරු මෙන් රඟ පෑමෙන් ලබන ලද කීර්තිය ඇත්තෙකි.

---

## ලැඩී රණසිංහ මැති තුමා

මෙ තුමා වූ කලී ජා-ඇල තුඩැල්ලේ කෞරව වංශික වැදගත් පෙළපතකින් පැවතෙන්නෙකි. ආරෝහ පරිණාහ දේහයකින් යුක්ත වූ මෙ තුමා තුළ තමා පෙනී සිටින ඕනෑම චිත්‍රපටියක සිය කොටස මැනවින් ඉටු කිරීමෙහි හැකියාවක් ඇත. චිත්‍රපටි කීපයක ම ප්‍රධාන නළුවා වීමේ ගෞරවය මෙ තුමාට හිමි විය. අවුරුදු හයක් නොකඩවා හොඳ ම නළුවා වශයෙනුත් ඊට පසු කඩින් කඩ අවුරුදු තුනක් හොඳ ම නළුවා වශයෙනුත් උසස් චිත්‍රපටිවල රඟ පෑ මෙ තුමාට වර්ෂ 1960 දී පොදු වශයෙන් ලංකාවේ හොඳ ම නළුවාට ප්‍රදානය කරන 'සුවර්ණ ධාරා' ශීඛාවද අත් විය. පුරා තිස් අවුරුද්දක් මුළුල්ලේ නෘත්‍ය ලෝකයෙහි රඟ පෑ මෙ තුමාට වේදිකා නාට්‍යවල දී රන් පදක්කම් රාශියක් ලැබිණි.



## ඩික් ඩයස් මැති තුමා

නෘත්‍ය කීපයක් සම්පාදනය කිරීමෙන් මෙ තුමා කාගේත් ප්‍රශංසාවට ලක් විය. රතු මකරා, ජානකීහරණය, කාලි දුව, මහහේනේ රීරියකා, ලීලා, සිරිසඟබෝ ආදි වේදිකා නාට්‍ය ඉන් සමහරකි. මෙසේ මෙ තුමා බලවත් මහන්සියක් ගෙන මේ නාට්‍යයන් සම්පාදනය කරන ලද්දේ පුද්ගලික ප්‍රයෝජනයක් සලකා ගෙන නොව ඉන් ලැබෙන ආදායම පොදු වැඩ සඳහා යෙදවීමේ පිරිසුදු සිතිනි. අමුතු ම මඟක් ගත් මේ වේදිකා නාට්‍යයන් නැරඹීමට බොහෝ දෙන රුචි කෙරෙති.

---

## කාන්ති ගුණතුංග මැතිණිය

පඤ්ච කල්‍යාණී තරගයෙන් මුල් තැන ගත් කාන්ති ගුණතුංග මැතිණිය වූ කලී ආරෝහ-පරිණාහ මනස්කාන්ත දේහයකින් යුක්තවූ කාන්තාවකි. නියම රූප රාජිනියකි. චිත්‍රපටියෙහි තමා ගන්නා කොටස මැනවින් ඉටු කිරීමෙහි සමත්කම් ඇති මේ රුචිරාණනිය සිංහල චිත්‍රපටි කීපයකම ප්‍රධාන නිළිය වීමේ ගෞරවය ලැබුවා ය. ඇගේ නාට්‍ය විලාශය තාත්වික ය. කථාව ප්‍රාණවත් ය. කාන්ති ගුණතුංග වූ කලී දුටුවන් මනනුවන් ඇද ගෙන රඟ පෑමෙහි සමත්කම් ඇති සුරූපී කාන්තිමත් කාන්තාවකි.

---

## පී. ජ්. ධර්මබන්ධු මැති තුමා

ව්‍යක්ත කවිකයෙක් වූ ද, ප්‍රසිද්ධ ලේඛකයෙක් වූ ද මෙ තුමා අතින් පොත් කීපයක් ලියවිණි. ලෝවැඩ සඟරාවට මෙ තුමන් අතින් ලියැවුණු විස්තර වර්ණනාව වූ කලී වැදගත් ධර්ම ග්‍රන්ථයකි. ධර්ම භාණ්ඩාගාරයකි. මේ හැර විමලාවතී, විශාඛා චරිත දෘශ්‍ය කාව්‍යය, ශ්‍රී සද්ධර්ම සාර ග්‍රන්ථ මාලා, කාව්‍ය සාරය ආදි ග්‍රන්ථ රාශියක් මෙ තුමා

විසින් සම්පාදනය කරන ලදී. සාමාන්‍යයෙන් සමස්ත ලංකාවේ ද, විශේෂයෙන් මොරටු පළාතේ ද බොදු-පොදු වැඩවලදී උනන්දුවෙන් ක්‍රියා කළ මෙ තුමා මොරටු නගර සභාවේ එගොඩඋයන කොට්ඨාශයේ උපදේශක ධුරයට පත්වූයේ නිතරගයෙනි. නොබෝ ද, පනස් අවුරුදු ස්වර්ණ ජයන්ති උත්සවය පැවැත්වුණු එගොඩඋයනේ ශ්‍රී සද්ධර්මෝදය තරුණ සමිතියේ හා රිවිදින පාඨශාලාවේත් ආදි කර්තෘවරයා මෙ තුමා ය. මේ සමිතිය හා ඉරු දින දහම් පාසැලත් වත්මන් දියුණුවට ගෙන ඒම සඳහා බී. ජේ. එච්. පීරිස්, එච්. ඇස්. ද මැල්, ටී. ආර්ලිස් පීරිස්, ආර්. එච්. පීරිස්, ඇස්. ඇම්. ඇෆ්. ජිනදාස ආදි මහතුන්ගේ අනල්පාධාරය ද මෙ තුමාට ලැබිණි. ආනන්ද මහා විද්‍යාලයට අරමුදල් එකතු කිරීමේදී ද අමද්‍යප ව්‍යාපාරයෙහිදී ද, මෙ තුමා පී. ද ඇස්. කුලරත්න, ඇල්. එච්. මෙත්තානන්ද, ආතර් වී. දියෙස් ආදි මහතුන් සමග උරෙ’නුර ගැටී වැඩ කෙළේ ය. “මෙ තුමාගේ ශ්‍රී නාමයට ගෞරව කිරීමක් වශයෙන් එගොඩඋයනේ මාවතක් “ධර්මබන්ධු මාවත” නමින් නම් කළ යුතුය යි මොරටු පළාත් ආණ්ඩු සභාව ඒකච්ඡන්දයෙන් තීරණය කළා ය.

---

### ඩබ්ලිව. එවුජින් ප්‍රනාන්දු මැති තුමා

සාමාන්‍යයෙන් සමස්ත ලංකාවේ ද විශේෂයෙන් මොරටු පළාතේ ද බොදු-පොදු වැඩවල දී පුරෝගාමී ව කටයුතු කළ උද්‍යෝගිමත් පුද්ගලයෙකි. බෞද්ධ සමිති-සමාගම් කීපයක සභාපතිත්වය දරමින් කටයුතු කළ ප්‍රනාන්දු මැති තුමා වෙළෙඳ ව්‍යාපාරිකයෙක් විය. කෞරව වංශිකයන්ගේ අභිවෘද්ධිය නිතර ප්‍රාර්ථනා කළ මෙ තුමා ආදර්ශවත් චරිතයක් ගත කෙළේය. පුරන්අප්පු වීරානුස්මරණ සභාවේ සභාපති පදවිය ද දැරුවේ ය.




### සී. ඇම්. ප්‍රනාන්දු ගුරු තුමා

ව්‍යක්ත කවිකයෙක් වූ ද, ජනප්‍රිය ලේඛකයෙක් වූ ද මෙ තුමා වරක් මොරටු නගර සභාවේ උපදේශක ධුරයක් ද දැරුවේ ය. ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමයේ සභාපති පදවිය දරන්නේත් මෙ තුමා ය. කෞරව වංශිකයන්ගේ අතීත ඉතිහාසය පිළිබඳ විස්තර සෙවීමෙහි යෙදී සිටින කීපදෙනා අතුරින් මෙ තුමා ද එක් අයෙකි. ආදර්ශවත් ආචාර්යවරයෙකි.

---

### ජේ. ප්‍රැන්සිස් ප්‍රනාන්දු ගුරු තුමා



ශාස්ත්‍ර විශාරද මේ ආචාර්යවරයා අතින් පාසැල් පොත් විශාල සංඛ්‍යාවක් ලියවී ඇත. මොරටු පළාතේ පොදු වැඩ ගැන උනන්දුවක් දක්වන මෙ තුමා විශේෂයෙන් කතෝලික සභාවේ දියුණුව පිණිස කටයුතු කරයි. ආදර්ශමත් ආචාර්යවරයෙක් වූ මෙ තුමාගේ පොත්-පත් ශිෂ්‍යයන්ගේ ගුණ-නුවණ වඩමින් පවතී.

---

### බී. දොන් තෝමස් මැති තුමා

මොරටු පළාතේ රිවි දින ධර්ම පාඨශාලා ව්‍යාපාරයෙහි දී උද්‍යෝගයෙන් ක්‍රියා කළ මෙ තුමා මොරටු විද්‍යාලය ඇති

කිරීමෙහි පුරෝගාමීව ක්‍රියා කෙළේ ය. සාමාන්‍යයෙන් සමස්ත ලංකාවේ ද, විශේෂයෙන් මොරටු පළාතේ ද බොදු-පොදු වැඩවල දී අප්‍රතිහත ධෛර්‍යයෙන් ක්‍රියා කළ මෙ තුමා වූ කලී ව්‍යක්ත කථිකයෙකි. ගිහිගෙයි කලකිරුණු සැදැහැවත් මෙ තුමා දැන් මොරටුවේ සුමන ස්වාමීන් වහන්සේ යන නමින් පැවිදි බිමට පැමිණ සිටී.

---

### ජේ. ඈස්. ඒ. ප්‍රනාන්දු මැති තුමා

කෞරව වංශිකයන්ගේ ඉපැරණි තොරතුරු සොයා පළකරවමින් ස්වකීය වංශයට ඉමහත් සේවයක් කළ උතුමෙකි මෙ තුමා. ලංකාවේ නානා පළාත්වල ඇවිද සොයා ගත නොහැකිව තුබුණු කුරුකුල ඉතිහාසය පිළිබඳ කරුණු රැසක් මෙ තුමා හෙළි කෙළේ ය. (මංගලෝත්සවයන්හි දී භාවිතා කරන) **කෞරව වංශිකයන්ගේ කුඩ-කොඩි, කඩු ආදිය පිළිබඳ ඓතිහාසික ලුහුඬු විස්තර** නමැති පොත මෙ තුමාගේ කෘතියකි.

---

### ගස්පේවිස් ජයවර්ධන මැති තුමා

මොරටුවේ රාවතාවත්තේ ජයවර්ධන වලව්වේ නිවැසි මේ තුමා කුරුකුල ඉතිහාසය පිළිබඳ මනා දැනීමක් ඇත්තෙකි. කෞරව වංශිකයන්ගේ පෙළපත් සම්බන්ධයෙන් ජයවර්ධන මැති තුමා තුළ ඇත්තේ පුදුම දැනීමකි. ප්‍රජාතන්ත්‍ර වාදයට ගරු කරන මෙ තුමා මොරටු පළාතේ දේශපාලන කටයුතු සම්බන්ධයෙන් ද උනන්දුවක් දක්වයි. නිහතමානී කාරුණික මහත්මයෙකි.

---

### ප්‍රවෘත්ති පාලක ඩබ්ලිව්. ලයනල් ප්‍රනාන්දු මැති තුමා

පානදුරේ නල්ලූරුවේ උපන් මෙ තුමා ගාල්ලේ 'ටයිම්ස්' පත්‍රයේ වාර්තාකරු වශයෙන් දිවි පෙවෙත ඇරඹුවේ ය. කලකට පසු 'ටයිම්ස්' පත්‍රයේ ප්‍රධාන වාර්තාකරු



පදවියට පත් වූ මෙ තුමා ඉහත කී පත්‍ර සමාගම යටතේ එංගලන්තයේ කාර්‍යාලයෙහි ද කටයුතු කෙළේ ය. විල්මට් ඒ. පෙරේරා මැති තුමා චීනයේ ලංකා තානාපති පදවිය දරද්දී එතුමාගේ පුද්ගලික ලේකම් පදවිය දැරුවේ ප්‍රනාන්දු මැති තුමා ය. කල් යාමෙන් රජයේ ප්‍රවෘත්ති පාලක පදවියට පත් වූ මෙ තුමා කාගේත් සිත් දිනා ගෙන කටයුතු කරයි. නිහතමානී නිලධාරියෙකි. රාජ්‍ය පාලන විද්‍යාව පිළිබඳ මනා දැනීමක් ඇත්තෙකි. බොදු-පොදු වැඩ ගැන විශේෂ උනන්දුවක් දක්වන්නෙකි.

---

### ශාස්ත්‍රාචාර්ය ඈම්. සී. සී. ප්‍රනාන්දු මැති තුමා

මෙ තුමා උපාධිධාරි මහාජන සේවකයෙකි. ප්‍රතිපත්ති ගරුක බෞද්ධයෙකි. නිහතමානී මහාත්මයෙකි. මෙ තුමා ඉගෙන ගන්නා අවදියෙහි දී ම පේරාදෙනියේ විශ්ව විද්‍යාලයයෙහි ශිෂ්‍ය සංගමයෙහි සභාපති පදවිය දරමින් විචක්ෂණ ලෙස ක්‍රියා කෙළේ ය. කලක් ලංකා බැංකුවේ උසස් නිලයක් දැරූ මෙ තුමා ඉන් පසු රජයේ සේවයට පත් විය. දැනට පළාත් පාලන අංශයේ උප කොමසාරිස් පදවිය දරන මෙ තුමා ගම්පළාතේ වූ ද, අනෙක් පළාත්වල වූ ද බොදු-පොදු වැඩ පිළිබඳ ව උනන්දුවක් දක්වයි.

---

### ඈජ්. බී. ද මැල් මැතිණිය

සී. එච්. ද සොයිසා සිටු තුමාගේ හා කැතරින් ද සොයිසා ආර්‍යාවගේත් පස් වැනි දියණිය වූ රීටා ද සොයිසා මැතිණිය ගාල්ලේ බෙලි කන්දේ වලව්වේ ෆ්‍රැන්සිස් පෙරේරා අබේවර්ධන මැති තුමා සමඟ විවාහ වූවා ය. මේ යුවළගේ ප්‍රිය දියණිය මාර්ජරි පෙරේරා අබේවර්ධන තරුණ මැතිණිය කොළඹ සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක් ව විසූ ජේකොබ් ද මැල් මැති තුමාගේ හා ඇන හෙලේනා ද මැල් මැතිණියගේත්

පුත්‍රයෙක් වූ ෆ්‍රැන්සිස් බෙන්ජමින් ද මැල් තරුණ මැති තුමා සමග 1919 දී විවාහ වූවා ය. මේ විවාහයෙන් ඔවුන්ට පුතකු හා දූවරු දෙ දෙනකු ලැබිණි.



උසස් පෙළේ සමාජ සේවිකාවක් වූ ද මැල් මැතිණිය මහා ජන ශුභ සිද්ධිය උදෙසා ක්‍රියා කරන්නට පටන් ගත්තේ තරුණ වියෙහිදී ය. ඇ ඉගෙන ගත්තේ ගාල්ලේ සවුත්ලන්ඩ් විද්‍යාලයෙහි ය. එහි ඉගෙනගන්නා කාලයෙහිදී ම පොදු වැඩ කිරීම තම ජීවිතයෙන් ලැබිය හැකි උසස් ම ලාභය බැව් ඇ දැන සිටියා ය.

ද මැල් මැතිණිය 1923 දී 'ඩෝටර්ස් ඔෆ් ලංකා' නමැති සමාගමේ සභාපතිනිය වූවා ය. මේ සමාගම ආරම්භ කිරීමේ දී පුරෝගාමීව ක්‍රියා කළා වූ ද, මහා ජන ශුභ සිද්ධිය සඳහා ඉදිරිපත් වූ මූලික මහාජන සේවිකාවක් වූ ද, ද මැල් මැතිණියගේ දෙටු සොහොයුරියක් වූ ද සීනා මැතිණිය 1925 දී මිය ගියා ය. සමිතිය ද වැඩි කල් නොයාදී ම අභාවයට ගියා ය. 1924 දී ද මැල් මැතිණිය ජාත්‍යන්තර කාන්තා සංගමයේ හා මහාජන සේවක සංගමයේ ද උද්‍යොගිමත් සාමාජිකාවක් වූවා ය. 1930 දී ලාහෝර්හි දී පැවැත්වුණු සමස්ත ආසියා කාන්තා සම්මේලනයට බණ්ඩාරනායක ආයම්මාව ඇතුළු නියෝජිතවරියන් දස දෙනකු සමග ද මැල් මැතිණිය ද සහභාගි වූවා ය.



1930 දී ලංකා මහිලා සමිතියේ ආරම්භක සාමාජිකාවක් වූ ඕතොමෝ එහි ගරු භාණ්ඩාගාරිකා පදවියට ද පත් වූවා ය. 1938-40 දී කාන්තා දේශපාලන සංගමයේ සභාපති පදවියට පත් වූවා ය.

1945-47 ඉන්දියා, ලංකා හා බුරුම ක්‍රිස්තියානි තරුණ කාන්තා සම්මේලනයෙහි නියෝජිතවරියක් වශයෙන් ලක්නව් නගරයට ගියා ය. 1947-48 ඇම්ස්ටර්ඩෑම් නගරයෙහි පැවැත්වුණු ගැමි කාන්තාවන්ගේ සම්මේලනයට ලංකා නියෝජිතවරියක් වශයෙන් සහභාගිවුණු ද මැල් මැතිණිය එංගලන්තය, ස්කොට්ලන්තය, අයර්ලන්තය ආදී රටවල දී කථා කීපයක් ද පැවැත්වූවා ය. 1948-51 (එදා ඉන්දියාව මූලික ස්ථානය ව පැවැති) ලංකා ක්‍රිස්තියානි කාන්තා සංගමයේ සභාපතිනිය වූවා ය. 1949 දී එක්සත් ජාතීන්ගේ ළමා ශුභ සාධක සම්මේලනයෙහි ගරු ලේඛිකා පදවියට පත් වූවා ය. 1951-57 ක්‍රිස්තියානි කාන්තා සංගමයේ ප්‍රථම සභාපති පදවියට පත් වූවා ය.

1953-56 ලංකා මහිලා සමිතියේ සභාපති ධුරයට පත් වූවා ය. 1953 දී ටොරොන්ටෝ, කැනඩා යන රටවල පැවැත්වුණු ජාත්‍යන්තර ගම්බද කාන්තා සම්මේලන සාකච්ඡාවට ලංකාව වෙනුවෙන් සහභාගිවූ නියෝජිතවරියන්ගේ නායකත්වය දැරුවා ය.

1951 වර්ෂයේ ලෙබනන්හිදී ද, 1955 වර්ෂයේ දී ලන්ඩන්හිදී ද පැවැත්වුණු සමස්ත ලෝක තරුණ ක්‍රිස්තියානි කාන්තා සම්මේලනයන්හි නියෝජිතවරියක් වූවා ය. 1951 දී (යෙරුසලම්) ශුද්ධ භූමියට ද ගියා ය. 1955 දී සැන්ට් පෝල් දේවස්ථානයෙහිදී පැවැත්වුණු ක්‍රිස්තියානි තරුණ කාන්තා සම්මේලනයෙහි සිය වස් පිරීමේ උළෙලට සහභාගිවූ ද මැල් මැතිණිය ඔවුන් වෙනුවෙන් සැන්ට් ජේම්ස් මාලිගාවෙහි පැවැත්වුණු ප්‍රිය සම්භාෂණෝත්සවයට ද ගියා ය.

1955 දී රෝමයෙහි පැවැත්වුණු ආහාර හා කෘෂිකර්ම සංවර්ධන සම්මේලනයෙහි නිරීක්ෂක කාන්තාවක් වශයෙන් ගියා ය. 1957 දී ලංකාවෙහි පැවැත්වුණු සමස්ත ලෝක ජාත්‍යන්තර ගම්බද කාන්තාවන්ගේ සම්මේලනයෙහි උප සභාපති පදවියට ද මැල් මැතිණිය පත්කර ගන්නා ලදී. 1957 දී බැංකොක් නුවර දී එක්සත් ජාතීන්ගේ ශුභ සිද්ධිය සඳහා පැවැත්වුණු සාකච්ඡා සභාවට ගියා ය. 1957 දී ලංකා තරුණ ක්‍රිස්තියානි කාන්තාවන්ගේ සංගමයෙහි සභාපතිනිය වශයෙන් චීනයෙහි පැවැත්වුණු සංස්කෘතික දූත මණ්ඩලයට ගියා ය. 1957 දී බැංකොක් නගරයෙහි කාන්තාවන්ගේ පොදු ජීවිතය සම්බන්ධයෙන් පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ සාකච්ඡා සභාවට ද මැල් මැතිණිය ද නිරීක්ෂක කාන්තාවක් වශයෙන් ගියා ය. 1958 දී සමස්ත ලෝක ගම්බද කාන්තා සම්මේලනයෙහි උප සභාපතිනිය වශයෙන් සිංගප්පූරුව, මලයාව, සියම, ලාඕස්, කාම්බෝජය, පිලිපයින්, ජපන්, බෙංගාලය, නැගෙනහිර හා බටහිර පකිස්තානය යන රටවල ගම්බද කාන්තාවන්ගේ ශුභ සිද්ධිය සඳහා කල්කටාවෙහි දී පැවැත්වුණු සාකච්ඡා සභාවට සහභාගිවී උපදෙස් දුන්නා ය.

1958 දී කොළඹදී පැවැත්වුණු ආසියා-අප්‍රිකා සාකච්ඡා සභාවෙහි ලංකා නියෝජිතවරියන්ගේ නායකත්වය දැරුවා ය. ද මැල් මැතිණිය ඒ අවුරුද්දේ ම ජපානයෙහි පැවැත්වුණු 'පෑන් පැසිපික්' සම්මේලනයෙහි නියෝජිතවරියක් වූවා ය. 1951-59 සමස්ත ලංකා කාන්තා සම්මේලනයෙහි උප සභාපතිත්වය දැරුවා ය 1959 දී එඩින්බරෝහිදී පැවැත්වුණු සම්මේලනයට සහභාගිවූ ද මැල් මැතිණිය සමස්ත ලෝක ගම්බද කාන්තා සම්මේලනයෙහි උප සභාපතිනිය වශයෙන් තෝරාගන්නා ලදී. 1961 දී රෝමයෙහි පැවැත්වුණු මහා ජන සේවිකා සාකච්ඡා සභාවට ගිය ලංකා නියෝජිත වරියන්ගේ නායකත්වය දැරුවා ය. 1962 දී ලංකාවේ මහාජන සේවක සංගමයෙහි මධ්‍ය කාරක සභාවෙහි සභාපති



පදවියට පත් වූවා ය. 1962 ඔක්තෝබර් මාසයේ දී ඕස්ට්‍රේලියාවේ මැල්බෝන් නගරයෙහි දී පැවැත්වෙන සම්මේලනයට සමස්ත ලෝක ගම්බද කාන්තා සම්මේලන යෙහි උප සභාපතිනිය වශයෙන් යාමට ද මැල් මැතිණිය බලාපොරොත්තු වන්නීය. මේ නයින් බලන විට ඇෆ්. බී. ද මැල් මැතිණියගෙන් සිදුවන මහාජන සේවය ඉතා අගනේ ය.

---

## සැනෙට් මන්ත්‍රිනී සිසී කුරේ මැතිණිය

මෙ තුමිය වූ කලී මහා දනපති ශ්‍රී චන්ද්‍රශේඛර මැති තුමාගේ ලේලියකි. චන්ද්‍රශේඛර මුදලි තුමාගේ මිණිබිරියකි. සිය සුළු මව වූ ආතර් ද සිල්වා මැතිණිය අනුගමනය කරමින් කාන්තා පක්ෂයේ දියුණුව සඳහා උද්යෝගයෙන් කටයුතු කළ මෙ තුමී කීප වරක් ම සමස්ත ලංකා මහිලා සමිති-සම්මේලනයේ සභාපති වශයෙන් තෝරාගන්නා ලදී. සැනෙට් සභාවේ වාද විවාදවල දී නුවණින් යුතුව ප්‍රජා තන්ත්‍ර වාදය අනුව කටයුතු කරන මෙ තුමිය පුද්ගලික ගරු නම්බු නොසොයා කාන්තා පක්ෂයේ අභිවෘද්ධිය අපේක්ෂා වෙන් ම ක්‍රියා කරන අවංක දේශපාලන නායිකාවකි. ආදර්ශමත් සදාචාර සම්පන්න කාන්තා රත්නයකි.

---

## නීනා විජේසූරිය මැතිණිය

ජී. කේ. ඩබ්ලිව්. පෙරේරා අධිනීතිඥ තුමාගේ දියණියකි. උපාධිධර ආචාර්යවරියකි. මොරටු විද්‍යාලයේ කාන්තා අංශයේ ප්‍රධානාචාර්ය ධුරය දරන්නී ය. උසස් පෙළේ සමාජ සේවිකාවකි. කථාවෙහි චතුරය. ආදර්ශමත් ආචාර්යවරියකි. පියාණන් මෙන් ම සෘජු ගතිගුණ ඇත. අවංකය. සදාචාර සම්පන්නය. ප්‍රතිපත්ති ගරුකය.

## සෝමා ද සිල්වා මැතිණිය



පානදුරේ නල්ලූරුවේ සිරිවෙද වලව්වේ විසූ ඩබ්ලිව්. දනියෙල් ප්‍රනාන්දු වෛද්‍යශේඛර වෙද මුදලිඳුගේ හා එම ලමාඑතනීගේත් කණිටු දියණියයි. ගති ගුණ අතින් පියාණන් මෙන් ම එඩිතරය. අවංකය. සදාචාර සම්පන්න ය. ගම් පළාතේ ජාතික වූ ද, ආගමිකවූ ද සකල සත් ව්‍යාපාරයකට ම නොමසුරු ව උපකාර කරයි. දිළිඳුන්ගේ දුකට නිතර පිහිට වෙයි. නිරහංකාර ය. පැවැතුම චාම් ය. ස්වකීය ආදරණීය පියාණන් විසින් ආරම්භ කරන ලද මාහැඟි ගුණ සම්පන්න ඖෂධ වර්ග සම්පාදනය සිය දෙටු සොහොයුරිය වූ නැණසි ද සිල්වා මැතිණියගේ ද සහාය ඇතිව නොකඩවා ගෙන යයි. ශත වර්ෂ භාගයකටත් වැඩි කාලයක් මුළුල්ලේ මහාජන විශ්වාසය දිනා ගත් මේ ඖෂධ වර්ග මෙසේ ජනතාව අතට පත් කිරීම මහාජන ශාන්තියකි.

---

## සී. ඊ. ද සිල්වා මැතිණිය

ආදි කාලයේ පටන් ම කෞරව වංශිකයෝ යුද්ධ කාර්යයෙහි මෙන් ම දේවකාර්යයෙහි ද යෙදුනෝ ය. කතරගම් දේවාලයෙහිත්, දෙවිනුවර උපුල්වන් දේවාලයෙහි හා මුන්නේශ්වරම් දේවාලයෙහිත් දේවකාර්යයෙහි නියුක්ත





වූවෝ කෞරව වංශිකයෝ ය. ලුනාවේ විශුද්ධාරාමයෙහි දේව වර ප්‍රසාදය ලැබගෙන දේවකාර්යය කරන සිල්වා මැතිණිය වූ කලී කෞරව වංශික කාන්තාවකි. ප්‍රතිපත්ති ගරුක සිල්වා මැතිණියට දේවාකර්ෂණය ඇත. නානා රෝගයන්ගෙන් පෙළෙන දෙනෝ දහක් ලුනාවේ දේවාලයට පැමිණ සිල්වා මැතිණියගේ දේවාකර්ෂණ බලයෙන් ශාන්තිය ලබා ගනිති. ශ්‍රද්ධා භක්තියෙන් හා ස්ථිර අධිෂ්ඨානයෙන් ද යුක්ත වූ සී. ඊ. ද සිල්වා මැතිණිය විචක්ෂණ බුද්ධියකින් යුක්ත වූ ක්‍රියා සූර කාන්තාවකි.

---

## දයාවතී කුරුනේරු මැතිණිය

ගාල්ලේ මාගාල්ලේ පඩව්තොට විසූ පී. එච්. මැතිව් ද සිල්වා මැති තුමා හා ඇලිස් නෝනා කුරුනේරු මැතිණියත් මෙ තුමියගේ දෙමාපියෝ ය. බාල කාලයෙහිදී ම සිංහල-ඉංග්‍රීසි භාෂාවන්හි මනා දැනුමක් ඇති කොට ගත් දයාවතී ද සිල්වා තරුණ මැතිණිය මඩකලපුවේ ඉඩම් හිමියෙකු වූ ද, මඩකලපුවේ කුරුනේරු වෙළෙඳ ආයතනයේ හා කුරුනේරු ගරාජයේත් අයිතිකරු වූ ද වෝල්ටර් කුරුනේරු තරුණ මැති තුමා සමඟ විවාහ වූවා ය. එවක් පටන් දයාවතී




කුරුතේරු නමින් හැඳින්වෙන මේ මැතිණිය ආදර්ශමත් චරිතයක් ගත කරමින් මඩකලපු පළාතේ මහාජන සේවාවන්හි නිරත වූවා ය. මෙසේ සමාජ සේවයට පා නැගූ මෙ තුමිය මඩකලපුවේ සංඝමිත්තා කුලඟන සමිතියේ හා මහිලා සමිතියේත් උප සභාපතිනිය හැටියට කටයුතු කළා ය.

1956 සිට මේ වන තුරු ම මඩකලපුවේ බුද්ධ ජයන්ති කාන්තා සමිතියේ ප්‍රධාන සභාපති පදවිය දරන්නේ දයාවතී කුරුතේරු මැතිණිය යි. මඩකලපුවේ බෞද්ධ මධ්‍යස්ථානය නමින් අමුතුවෙන් ම විහාරස්ථානයක් ඇති කොට ඒ මගින් මුළු නැගෙනහිර පළාතට ම උදාර සේවයක් කරගන යයි. වෂී කිපයක පටන් මාන්තිව්හි ලාදුරු ආරෝග්‍ය ශාලාවේ නිල නොලත් පරීක්ෂකවරිය හැටියට කටයුතු කරන්නේ මෙ තුමිය යි ජාතික වූ ද, ආගමික වූ ද සකල සත් ව්‍යාපාරයකට ම සවකීය ධනයත්, අප්‍රතිහත ධෛයසීය හා කාලයත් යොදවන මෙ තුමිය ගේ විශේෂ උනන්දුවේ ප්‍රතිඵලයක් වශයෙනි මඩකලපුවේ 'ජයන්ති පුරය' නම් සිංහල ගම්මානය ඇති වූයේ.



## ඇන්. එච්. කුමාරසිංහ මැති තුමා



රෝහණ පුත්‍රයෙක් වූ මෙ තුමා කටුගස්තොට ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකි. මෙ තුමාගේ සාධු චරිතය වතීමාන ලංකාවේ තරුණ පරපුරට ආදර්ශවත් වූවකි. කොළඹ, ගාල්ල ආදී ප්‍රසිද්ධ නගරවල ලක්ෂ ගණනක් වටිනා ඉඩ-කඩම් හිමි මෙ තුමා නො පසුබට උත්සාහයත් අවංක සේවයත් නිසා මේ සා දියුණුවක් ලැබුවේ ය. තමා විසින් උපදවා ගත් ලක්ෂ සංඛ්‍යාත ධනය රටේ, ජාතියේ හා ආගමේ දියුණුවට නොමසුරුව වියදම් කරන මෙ තුමා කටුගස්තොට ත්‍රිසිංහලාරාමයෙහි ලැගුම් ගෙය සවකීය ධනය වියදම් කොට සෑදවූයේ ය පොදු වැඩෙහි නියැලී මෙ තුමා ගෙන් සිදුවන සේවය ඉතා උසස් ය.

## ඩබ්ලිව්. ජී. ඇම්. විලියම් සිල්වා මැති තුමා

මෙ තුමා වූ කලී සෞත්සාහයෙන් දියුණු වූ රෝහණ පුත්‍රයෙකි. ස්වකීය ව්‍යාපාරයන් පවත්නේ හලාවත නගර යෙහි බැවින් එහි 'ලක්ෂ්මී මාල්' නම් සුවිසල් මැඳුරක් තනවා ගෙන වාසයට පටන් ගත්තේ ය. සාමාන්‍යයෙන් සමස්ත ලංකාවේ ද විශේෂයෙන් හලාවත හා මිරිස්ස පළාතේ ද බොදු-පොදු වැඩ සඳහා නොමසුරු ව වියදම් කරන මෙ තුමා කාරුණික මහත්මයෙකි. ආදර්ශමත් සත් පුරුෂයෙකි. මෙ තුමාගේ බෑනණුවෝ ජාතික කෞතුකා ගාරයෙහි උසස් නිලයක් දරති.

## ඇල්. ඇස්. ප්‍රනාන්දු මැති තුමා

සිංහල-ඉංග්‍රීසි ආදි භාෂාවන්හි මනා පටුත්වයක් ඇති පානදුරේ මොරවින්නේ ඇල්. ඇස්. ප්‍රනාන්දු මැති තුමා වූ කලී ගම් පළාතේ දියුණුවට ඉත සිතින් ක්‍රියා කරන උතුමෙකි. කීප වරක් ම මොරවින්න පළාතේ ගම් සභා උපදේශක ධුරය දැරූ මෙ තුමා ව්‍යක්ත කවිකයෙකි. බොදු-පොදු වැඩට නිතර උදවු දෙන්නෙකි. නියම ජන සේවකයෙකි.

## එච්. වී. පීරිස් මැති තුමා

මොරටු කටුකුරුන්දේ උපන් මෙ තුමා වූ කලී සිංහල-ඉංග්‍රීසි භාෂා වයෙහි ම දක්ෂයෙකි. මොරටුවේ ශාන්ත සෙබස්තියන් විදුහලේ ආචාර්ය මණ්ඩලයෙහි සේවය කරන මෙ තුමා උපශාන්ත මහත්මයෙකි ආදර්ශවත් ආචාර්ය වරයෙකි දකුණු මොරටුවේ පොදු වැඩ ගැන විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන්නෙකි. භක්තිමත් කතෝලික යෙකි. ග්‍රන්ථ කර්තෘවරයෙකි.

## ඇම්. ජී. පෙරේරා මැති තුමා

මොරටුවේ කොරළවැල්ල පළාතේ බොදු-පොදු වැඩට නොමසුරුව උදව් දෙන මෙ තුමා තිලක විද්‍යාලය පිහිටුවීම සඳහා රුපියල් විසි දහසකටත් වඩා වියදම් කෙළේ ය. සෞත්සාහයෙන් දියුණු වූ මෙ තුමා උද්‍යෝගවත් ව්‍යාපාරිකයෙකි. මහාජන සේවකයෙකි.



## ජී. මෝසෙස් සිල්වා මැති තුමා



මෙ තුමා වූ කලී සෞත්සාහයෙන් දියුණු වූ කෞරවවංශික මොරටු පුත්‍රයෙකි. මොරටු-කටුකුරුන්දේ මෝසෙස් මාවතෙහි "සීනයි" නිවෙසෙහි විසූ මෙ තුමා ජාතික වූ ද ආගමික වූ ද සකල සත් ව්‍යාපාරයකටම නොමසුරුව වියදම් කෙළේ ය. ලක්ෂ ගණන් වියදම් කෙළේ ය. ආගම් භේදයෙන් තොරව වියදම් කෙළේ ය. ගම් පළාතේ දුප්පතුන්ට උපකාර කෙළේ ය. දම්පේ කතෝලික දේවස්ථානයත්, අරුක්ගොඩ කතෝලික දේවස්ථානය හා මොරටු-කටුකුරුන්දේ කතෝලික පාසැලේ අළුත් ගොඩනැගිල්ලත් සාදවන ලද්දේ මෙ තුමා විසිනි. මෙ තුමාගෙන් සිදු වුණු ආගමික සේවයට සැලකීමක් වශයෙන් ශුද්ධෝත්තම පාප් වහන්සේගෙන මෙ තුමාට බෙනෙමෙරෙන්තෙ ගෞරව පදක්කම ද ලැබිණ.

## මැරිල් ජී. ඇෆ්. සිරිවර්ධන අධිනීතිඥ තුමා

මොරටුවේ කොරළවැල්ලේ විසූ මෙ තුමා උපාධිධර අධිනීතිඥ වරයෙකි. නීතිඥයෝ නීති ශාස්ත්‍රයෙහි කුශාග්‍ර බුද්ධිමත් මෙ තුමාගෙන් උපදෙස් ලබා ගැනීම සඳහා

දිනපතා පැමිණියෝ ය. ගම්පල පොලිස් මහෙස්ත්‍රාත් ධුරය කලක් දැරූ මෙ තුමා එයට ආයුබෝවන් කියා යළිත් නීතිඥ වෘත්තිය ම ජීවිකා වෘත්තිය කොට ගත්තේ ය. උපශාන්ත පුරුෂයෙකි. පොදු වැඩෙහි නියැලී උපශාන්ත පුරුෂයෙක් වූ මෙ තුමාගේ අකාල අභාවය මොරටුවේ කෞරව වංශිකයන්ට වූ බලවත් පාඩුවකි.

---

**කෞරව වංශික නළු නිළියන් අතුරින් සමහරෙක්**
**(මෙහි දැක්වෙන මැති–මැතිනිවරු දක්ෂ නළු–නිළියෝ ය.)**

| | |
|---|---|
| ලැඩී රණසිංහ | විජිත මල්ලිකා ප්‍රනාන්දු |
| ඩොම් ජයවර්ධන | ඔරිල් වර්ණකුලසූරිය |
| කාන්ති ගුණතුංග | තෙරේසා වීරසිංහ |
| වින්සන්ට් වාස් | ඇනස්ටා වයලට් ප්‍රනාන්දු |
| ස්ටැන්ලි පෙරේරා | ජෝර්ජ් ලියනගේ |
| ගර්ලි ගුණවර්ධන | ගාමිණී ෆොන්සේකා |
| බොනිෆස් ප්‍රනාන්දු | ජීවරාණි කුරුකුලසූරිය |
| ක්‍රිස්ටි ද මැල් | මාෂල් පෙරේරා |
| මාලනී ප්‍රැක්සිඩ් ප්‍රනාන්දු | නැන්සි ඩයස් |
| බර්ට්‍රම් ප්‍රනාන්දු | රූබි ද මැල් |
| ඒ. සී. පෙරේරා | වෝල්ටර් ප්‍රනාන්දු |
| මතායස් ප්‍රනාන්දු | සෝමපාල ධම්ප්‍රිය |
| බෙන්ජමින් ප්‍රනාන්දු | තිලකසිරි ප්‍රනාන්දු |

ලතා ප්‍රනාන්දු

---

## පොදු වැඩ සඳහා ලක්ෂ ගණන් පිදූ
**කෞරව වංශික දානපතියෝ**

සී. එච්. ද සොයිසා සාමදාන විනිශ්චයකාර තුමා
කැතරින් ද සොයිසා ආයිමාව
ඇම්. අන්දිරිස් පෙරේරා අභයකරුණාරත්න
දිසානායක මුදලි තුමා



සුසෙව් ද සොයිසා වාසල මුදලි තුමා
ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා මැති තුමා
ජුසේ ද සිල්වා චැවලියර් තුමා
ඇම්. සීමන් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රශේඛර මුදලි තුමා
ජේම්ස් ප්‍රනාන්දු ශ්‍රී චන්ද්‍රශේඛර මැති තුමා
ඩී. ඇම්. සමරවීර මුදලි තුමා
ඩබ්ලිව්. ආතර් ද සිල්වා සෞඛ්‍යාමාත්‍ය තුමා
ඩබ්ලිව්. ආතර් ද සිල්වා මැතිණිය
ජෙරමියස් දියෙස් මැතිණිය
ඒ. ජේ. ආර්. ද සොයිසා මැති තුමා
සර්. විල්ෆ්‍රඩ් ද සොයිසා මැති තුමා
ආර්. ඒ. ඇස්. ද සොයිසා මැති තුමා
ඒ. එච්. ටී. ද සොයිසා මැති තුමා
ආතර් වී. දියෙස් මැති තුමා
සර්. එම්. ඇල්. ද මැල් මැති තුමා
සී. එච්. ඉසැඩ් ප්‍රනාන්දු මැති තුමා
සර් ඒ. පී. ඒ. ප්‍රනාන්දු මැති තුමා
හැන්රි අමරසූරිය සාමදාන විනිශ්චයකාර තුමා
එච්. ඩබ්ලිව්. අමරසූරිය වෙළෙඳ ඇමති තුමා
සර් ලියෝ ප්‍රනාන්දු මැති තුමා
ඇම්. ටී. ප්‍රනාන්දු මැති තුමා
පී. දුමිංගු දියෙස් මැතිණිය
ඩබ්ලිව්. ඒ. පීරිස් මැතිණිය
ඩබ්ලිව්. ඒරන් ප්‍රනාන්දු මැති තුමා
හඳුවතී ප්‍රනාන්දු මැතිණිය
තෝමස් ද සිල්වා මුදලි තුමා
ඒ. මෝසෙස් සිල්වා මැති තුමා
ඩබ්ලිව්. ජොහැන්නස් ද මැල් මැති තුමා
ඇම්. ජේ. සී. ප්‍රනාන්දු මැති තුමා
සර් ඒ. බී. සොයිසා මැති තුමා
සී. ඒ. ඒ. දියෙස් මැති තුමා
හැරී දියෙස් මැති තුමා

# කෞරව වංශිකයන්ගේ පෙළපත් (වාසගම) නම් අතුරින් සමහරක්.

(අකාරාදි පිළිවෙලිනි)

**ආරච්චිගේ කාණ්ඩය.**

අරසකුලසූරිය ආරච්චිගේ, කස්තූරි ආරච්චිගේ, කඳන් ආරච්චිගේ, කළු ආරච්චිගේ, කුමාරසිංහ ආරච්චිගේ, කට්ටුකාරුම්සආරච්චිගේ, කුරුකුල ආරච්චිගේ, ගලප්පත්ති ආරච්චිගේ, ගුණසේකර ආරච්චිගේ, ගුණරත්න ආරච්චිගේ, ජුවන් ආරච්චිගේ, ජයවීර ආරච්චිගේ, පසික්කු ආරච්චිගේ, බලපිටිය ලියනආරච්චිගේ, මදප්පුලි ආරච්චිගේ, මදන කොන්ඩ ආරච්චිගේ, මූදන්ගොඩ ආරච්චිගේ, මීවල ආරච්චිගේ, මහමඩ ආරච්චිගේ, මහමූදලි ආරච්චිගේ, රණසිංහ ආරච්චිගේ, ලියනආරච්චිගේ, වැඩෙනකොන්ඩ ආරච්චිගේ, වික්‍රමආරච්චිගේ, වීරකොන්ඩ ආරච්චිගේ, වෙඩික්කාරආරච්චිගේ, සිමන් ආරච්චිගේ, සූරියආරච්චිගේ සෙම්බුකුට්ටි ආරච්චිගේ, හෙට්ටිආරච්චිගේ, සේන ආරච්චිගේ, දෙන් දුම්ංගු ආරච්චිගේ, ආරච්චිරාළලාගේ, තුසේපෙරේරා ලියනආරච්චිරාළලාගේ වණීකුලආරච්චිරාළලාගේ, ජයවර්ධන සෙම්බුකුට්ටි ආරච්චිගේ.

**කංකානමගේ කාණ්ඩය.**

අරුමකංකානමගේ, කොඩිතුවක්කුකංකානන්ගේ, කෝට්ටෙගොඩකංකානන්ගේ, කිරිකංකානන්ගේ, කොරුවංකංකානන්ගේ, කොට්ටාසකංකානන්ගේ, ගලප්පත්ති කංකානන්ගේ, මූදන්ගොඩකංකානන්ගේ, රුහුණුකංකානමගේ, ලොකුකංකානමගේ, සෙම්බුකුට්ටිකංකානන්ගේ, වජ්ජක්කාර කංකානන්ගේ.

**ගුරුනාන්සේලාගේ කාණ්ඩය.**

අම්බලන්ගොඩ ගුරුන්නාන්සේලාගේ, කස්තූරි මොහොට්ටි ගුරුන්නාන්සේලාගේ, දෙමළපල්ලිය



ගුරුන්නාන්සේලාගේ, මග්ගොන ගුරුන්නාන්සේලාගේ, බතුගෙදර ගුරුන්නාන්සේලාගේ, නානායක්කාරවසම් මග්ගොන මොහොට්ටි ගුරුන්නාන්සේලාගේ.

**ගුරුගේ කාණ්ඩය**

අල්දුරලියගුරුගේ, කහවගුරුගේ, මාදුවගුරුගේ, මාදුව ගුරුසිංහගේ, ගුරුගේ.

**තන්ත්‍රිගේ කාණ්ඩය.**

තන්ත්‍රිගේ, කළුතන්ත්‍රිගේ, කාශීවසත් තන්ත්‍රිගේ, හේවාතන්ත්‍රිගේ, මුතුතන්ත්‍රිගේ, කංකානිතන්ත්‍රිගේ, තෙවරු තන්ත්‍රිගේ, චට්ටෝරු තන්ත්‍රිගේ, වඩුතන්ත්‍රිගේ.

**තෙල්ගේ කාණ්ඩය.**

තෙල්ගේ, මහ තෙල්ගේ, කුඩා තෙල්ගේ.

**තුප්පහිගේ කාණ්ඩය.**

තුප්පහිගේ, මානික්ක තුප්පහිගේ, මානික්කු තුප්පහිගේ, මයියප්පා තුප්පහිගේ, තුප්පහිරාළලාගේ, සල්පඳෙරු තුප්පහිගේ.

**පටබැඳිගේ කාණ්ඩය.**

අබයදීර ගුණරත්න පටබැඳිගේ, අබයසූරිය පටබැඳිගේ, අබයවරණ පටබැඳිගේ, අබයදීර වීරවර්ණ පටබැඳිගේ, අළුත් පටබැඳිගේ, අන්ද්‍රවාස් පටබැඳිගේ, අන්ද්‍රාබඳු ජයසේකර පටබැඳිගේ, අබේදීර ගුණරත්න පටබැඳිගේ, අබේවර්ණ පටබැඳිගේ, අබේදීර ලියන ජයවික්‍රම පටබැඳිගේ, ආරුක්කට්ටි පටබැඳිගේ, ආරච්චි පටබැඳිගේ, ඉත්ගිරි පටබැඳිගේ, එදිරිවීර පටබැඳිගේ, එදිරිවීර ආරුකට්ටි පටබැඳිගේ, අසුරමාන පටබැඳිගේ, එදිරිවික්‍රමසූරිය පටබැඳිගේ, එදිරිවීර ජයසූරිය පටබැඳිගේ, එදිරිවීර ජයසූරිය ලියනපටබැඳිගේ, එදිරිවීර ජයසේකර කුරුඳු පටබැඳිගේ, කත්‍රිසැඳවාස් ජයසේකර පටබැඳිගේ,

කර්ලිසැසැවාස් ජයසූරිය පටබැඳිගේ, කළුතර පටබැඳිගේ, කළුතන්ත්‍රි පටබැඳිගේ, කහකච්චි පටබැඳිගේ, කාංචිපුර පටබැඳිගේ, කාරියකරවන මහපටබැඳිගේ, කාරියවසම් පටබැඳිගේ, කාලිංගපුර පටබැඳිගේ, කෝෂ්මපටබැඳිගේ, කොඩිප්පිලි පටබැඳිගේ, කුමාර පටබැඳිගේ, කුරුකුලසූරිය පටබැඳිගේ, කළුතන්ත්‍රි පටබැඳිගේ, කොළඹ පටබැඳිගේ, කොළඹ මහ පටබැඳිගේ, කෝට්ටෙ පටබැඳිගේ, කොට්ටෙගොඩ විජයවීර පටබැඳිගේ, ගිංතොට සරුක්කාලි පටබැඳිගේ, ගුණවර්ධන පටබැඳිගේ, ගුණසේකර ආරච්චි පටබැඳිගේ, ජයසේකර පටබැඳිගේ, ජයවික්‍රම පටබැඳිගේ, ජසෙත්තු පටබැඳිගේ, ජයවර්ණ පටබැඳිගේ, ජයවර්ධන සෙම්බුකුට්ටි පටබැඳිගේ, ජයවීර පටබැඳිගේ, ජයවීර ලියන පටබැඳිගේ, දළුවත්ත පටබැඳිගේ, දොන් සිමොන් පටබැඳිගේ, නාගසූරිය කරුණා පටබැඳිගේ, නාගසූරිය කුමාර පටබැඳිගේ, නීලවීර පටබැඳිගේ, නීලවීර රන් පටබැඳිගේ, නිරවණ නීලවීර රන් පටබැඳිගේ, පංචශිල පටබැඳිගේ, පරණ පටබැඳිගේ, පෙන්කුට්ටි පටබැඳිගේ, පොඩිමරක්කල පටබැඳිගේ, බාල පටබැඳිගේ, මතුගවීර පටබැඳිගේ, මනම්පේරි මහ පටබැඳිරාලගේ මහනාප පටබැඳිගේ, මහ පටබැඳිගේ, මහමරක්කල පටබැඳිගේ, මාලිම් පටබැඳිගේ මුතුතන්ත්‍රි පටබැඳිගේ, මෝදර පටබැඳිගේ මොරමු පටබැඳිගේ, යාපනේ පටබැඳිගේ, රන් පටබැඳිගේ, රේන්ද පටබැඳිගේ, රත්නවීර පටබැඳිගේ, ලමාබඳු වණීකුලසූරිය පටබැඳිගේ, ලොකු පටබැඳිගේ, ලොකුබඳු ජයසූරිය පටබැඳිගේ, වර්ණකුලසූරිය පටබැඳිගේ, වණීකුලසූරිය පටබැඳි මහකාරිය කරවනගේ, වර්ණකුලසූරිය මෝදර පටබැඳිගේ, වර්ණසූරිය පටබැඳිගේ, විජේසේකර පටබැඳිගේ වික්‍රමසූරිය පටබැඳිගේ, වික්‍රම කොඩිප්පිලි පටබැඳිගේ, විජයනායක පටබැඳිගේ, විජයපුර පටබැඳිගේ, විජේතුංග පටබැඳිගේ, විජේවීර පටබැඳිගේ, විජේසූරිය පටබැඳිගේ, විජේසූරිය පටබැඳි මුහන්දිරම්ගේ, වීරරත්න පටබැඳිගේ, වීරරත්න ජයසූරිය පටබැඳිගේ, විතාරණ පටබැඳිගේ, විතාරණ ලොකු පටබැඳිගේ, වීරකෝණ්ඩ පටබැඳිගේ,



වීරරත්න ගුණසේකර පටබැඳිගේ, වීරරත්න විජේනායක පටබැඳිගේ, වීරවර්ණ පටබැඳිගේ, වීරසූරිය පටබැඳිගේ, සූරිය පටබැඳිගේ, සමරකෝන් පටබැඳිගේ, සරුක්කාලි පටබැඳිගේ, සිංහපුර පටබැඳිගේ, ශ්‍රී කියන පටබැඳිගේ, හාතාගල පටබැඳිගේ, වීරබලවීරසක්කන්ධ ජයසූරිය කුරු උතුම්පාල අධිදෙව පටබැඳිගේ.

**බඳුගේ කාණ්ඩය**

අහංගම බඳුගේ, අප්පු බඳුගේ, අළුත් බඳුගේ, අමාතෘ බඳුගේ, අරුමා බඳුගේ, අන්ද්‍රා බඳුගේ, අන්තෝනි බඳුගේ, කන්ද බඳුගේ, ක්‍රිස්තෝගු බඳුගේ, ක්‍රිස්තෝම්බු බඳුගේ, කුලතුංග සිංහ බඳුගේ, කොරින් බඳුගේ, ජයසූරිය කුඩා බඳුගේ, තෝනා බඳුගේ, දඩයක්කාර බඳුගේ, නයිනා බඳුගේ, නානායක්කාර වීරවර්ණසූරිය බූසා බඳුගේ, පලියගල බඳුගේ, පනියාගල බඳුගේ, පෙරුමා බඳුගේ, පොන්සිත් බඳුගේ, සිංහ බඳුගේ, බූසා බඳුගේ, බෝදියා බඳුගේ, මහ බඳුගේ, මදනකාම බඳුගේ, මනමාල බඳුගේ, මානික්ක බඳුගේ, මල්මාල බඳුගේ, ලමාබඳුගේ, ලමාබඳු ජයසූරියගේ, ලද්දසිංහ බඳුගේ, ලොකු බඳුගේ, ලොකුබඳු ජයසූරියගේ, වනිග බඳුගේ, වර්ණකුලසූරිය බූසා බඳුගේ, වර්ණගේ බඳුගේ, වීරකෝන්ඩ බඳුගේ, පොල්වත්ත රතු බඳුගේ.

**මරක්කලගේ කාණ්ඩය.**

අන්තෝනි මරක්කලගේ, අරස මරක්කලගේ, කොග්ගල මරක්කලගේ, කොඩිමරක්කලගේ, කොළඹපටබැඳි මහ මාන්න මරක්කලගේ, පොඩිමරක්කලගේ, මහමරක්කලගේ, මහමරක්කල මාමගේ, මාන්න මරක්කලගේ, ලොකු මරක්කලගේ, මහමරක්කල පටබැඳිගේ, සන්ද්‍රා මරක්කලගේ, සන්ද මරක්කලගේ, සමුන්දර මරක්කලගේ, අත්තිසැසු මරක්කලගේ.

**මේස්ත්‍රීගේ කාණ්ඩය**

ජයලත් වඩුමේස්ත්‍රීගේ, වඩුමේස්ත්‍රීගේ, වරුණකුලසූරිය වඩුමේස්ත්‍රීගේ, වරුණකුලසූරිය පටබැඳි මහවඩු මහ මේස්ත්‍රීගේ

**මන්ඩඩිගේ කාණ්ඩය**

පාලමන්ඩඩිගේ පිලිප්පුමන්ඩඩිගේ, මහමන්ඩඩිගේ, මිගෙල්මන්ඩඩිගේ උන්ගාමන්ඩඩිගේ, වීරමන්ඩඩිගේ.

**ලියනගේ කාණ්ඩය**

අම්බලන්ගොඩ ලියනගේ, ඇලබොඩ ලියනගේ, ජයවීර ලියනගේ, ජයසූරිය ලියනගේ, ජසෙත්තු ලියනගේ, දෙන් පේදුරු ලියනගේ, දෙන් වත්ත ලියනගේ, මහ ලියනගේ, බද්දේ ලියනගේ, බලපිටිය ලියන ආරච්චිගේ, මහ ලියනගේ, ලියන ආරච්චිගේ, ලොකු ලියනගේ, ලේකම් වසම් හික්කඩුව ලියනගේ, තුසේ පෙරේරා ලියන ආරච්චි රාළලාගේ, බලපිටිය ලියනගේ.

**වඩුගේ කාණ්ඩය.**

අම්බලන්ගොඩ වඩුගේ, අරනවත්ත වඩුගේ, අලගිය වඩුගේ, අරුම වඩුගේ, උදිරිඅප්පු වඩුගේ, කලමුල්ල වඩුගේ, කුලප්පුවා වඩුගේ, ගම්පල වඩුගේ, ගුස්තිසැඳ වඩුගේ, දෙඩම්දූව වඩුගේ, පීතිය වඩුගේ, පේදුරු වඩුගේ, බලාපු වඩුගේ, මහ වඩුගේ, මාතා වඩුගේ, මානික්ක වඩුගේ, මිටි වඩුගේ මල්ලුව වඩුගේ මල්ලියා වඩුගේ, යාත්‍රා වඩුගේ. යන්ත්‍රා වඩුගේ, රත්න වඩුගේ. ලසඳ වඩුගේ, ලූක්කු වඩුගේ, ලොකු වඩුගේ. වත්නකුවත්ත වඩුගේ, වත්නකුවත්ත මිටි වඩුගේ, වත්නකුවත්ත වඩුගේ දෙන්, විජේසූරිය මහ වඩුගේ, සම්පතා වඩුගේ.

**විදානගේ කාණ්ඩය සහ විතානගේ කාණ්ඩය**

කාරියවසම් කෙල්ලට විදානගේ, කෝට්ටෙගොඩ මහ විදානගේ, ගිංතොට සරුක්කාලි විතානගේ, ගෝනපීනුවල



විදානගේ, ජයමරක්කල විදානෙලාගේ. දෙනගම විතාරණගේ, දෙනගම විදානගේ, පරන විතානගේ, බෙන්තොට විදානගේ, මහ විදානගේ, ලක්ෂපති මහ විදානෙලාගේ, විජේවීර ගුණරත්න මහ විදානගේ, විජේවීර ගුණරත්න මහ විදාන මුහන්දිරම්ගේ, විදානෙගේ, විදානෙලාගේ, විදානෙ රාළලාගේ, වීරසේකර මහ විදානගේ, සෙම්බුකුට්ටි විදානෙලාගේ, විජේරත්න මහ විදානගේ, වතිග විතාරණගේ, හෙන්ද විතානගේ, දෙනගම විතාරණගේ, ගිංතොට විදානගේ, වරුස විතානගේ.

**වර්ණගේ කාණ්ඩය.**

එදිරිවර්ණගේ, නාමවර්ණ ගබඩාගේ, වර්ණගේ, වීර වරුණගේ, මිහිඳුකුලසූරිය වරපේලිගේ, වීරවණීකුල වගච්චිගේ, මිහිඳුකුලවර්ණ පේලිගේ, වරුණකුලසූරියගේ. වරුණකුලසූරිය කුමාරසිංහ මුදියන්සෙලාගේ, වරුණකුලසූරිය මුදියන්සෙලාගේ.

**වත්තගේ කාණ්ඩය.**

කුමරගෙ වත්තගේ, කොරටුව වත්තගේ, පැල වත්තගේ, පාංගල උඩවත්තගේ, දඩයක්කාර උඩවත්තගේ, දළුවත්තගේ, දෙඩම්ගොඩ උඩවත්තගේ, මෝරුවත්තගේ, හල්පෙවත්තගේ.

**සච්චම්බිගේ කාණ්ඩය**

අබරන් සච්චම්බිගේ, බන්ඩි සච්චම්බිගේ, සච්චම්බි රාළලාගේ.

**හැන්නැදිගේ කාණ්ඩය.**

අරුමා හැන්නැදිගේ, අප්පුහැන්නැදිගේ, අන්ද්‍රාහැන් නැදිගේ, කලලු හැන්නැදිගේ, කළු හැන්නැදිගේ, කාමරංග හැන්නැදිගේ, කුති හැන්නැදිගේ, කුත්නැවෙසු වෙඩි අරමකුල හැන්නැදිගේ, කොක්කු හැන්නැදිගේ, ගොඩ

හැන්නැදිගේ, ජුවන් හැන්නැදිගේ, ටිකිරි හැන්නැදිගේ, තුන්යා හැන්නැදිගේ, නෙත් නුවර හැන්නැදිගේ, නේනා හැන්නැදිගේ, දියෝගු හැන්නැදිගේ, පත්තිනි හැන්නැදිගේ, පොන්න හැන්නැදිගේ, පසික්කු හැන්නැදිගේ, පතිරාජ හැන්නැදිගේ, බැමිණ හැන්නැදිගේ, බෝද හැන්නැදිගේ, බෝදියා හැන්නැදිගේ මහ හැන්නැදිගේ, මුතු හැන්නැදිගේ, මුමරන් හැන්නැදිගේ, ලුවිස් හැන්නැදිගේ, ලොකු හැන්නැදිගේ, වච්චි හැන්නැදිගේ, වර්ණදීප්ත්‍ය කුරුකුලසූරිය පත්තිනි හැන්නැදිගේ, වර්ණ දීප්ති කුරුකුලසූරිය පසික්කු හැන්නැදිගේ, වර්ෂ හැන්නැදිගේ, වරුණ හැන්නැදිගේ, වීර හැන්නැදිගේ, සමුන්දර හැන්නැදිගේ, සුදිරික්කු හැන්නැදිගේ, සෙල්ලා හැන්නැදිගේ, හපු හැන්නැදිගේ, හෙවන හැන්නැදිගේ, හර්ෂමුනි ජයසූරිය පතිරාජ හැන්නැදිගේ, ජයසූරිය හැන්නැදිගේ.

**හේවා ගේ කාණ්ඩය.**

උලුවිස් හේවාගේ, කන්දඋඩ හේවාගේ, කළුගල හේවාගේ, කළුතොට ගාර්දියේ පුංචිහේවාගේ, කනක හේවාගේ, කුලසේකර බිංදුහේවාගේ, ගම්මැද්ද හේවාගේ, ගම හේවාගේ, ගල්බොක්ක හේවාගේ ගාර්දිය පුංචි හේවාගේ, ගාර්දියවසම් පුංචි හේවාගේ, ගොඩ හේවාගේ, ගොංලු හේවාගේ, ජුවන් හේවාගේ, කොට හේවාගේ, නල්ල හේවාගේ, පට්ටිය ගාර්දි හේවාගේ, පතිරණ හේවාගේ, පරණ හේවාගේ, පාවුළු හේවාගේ, පුංචි හේවාගේ, පේදුරු හේවාගේ, බලපිටි ගාර්දිය හේවාගේ, බාල හේවාගේ, බාල පට බැඳි හේවාගේ, බාලසාමු හේවාගේ, බිංදු හේවාගේ, බෙන්තොට හේවාගේ, මිලිකොට හේවාගේ, මොරටු හේවාගේ, ලමා හේවාගේ ලොකුගම් හේවාගේ, ලොකුසාමු හේවාගේ, ලොරන්සු හේවාගේ, වික්‍රම කුලතොට හේවාගේ, විජය හේවාගේ, වෙලබඩ හේවාගේ, සරංගු හේවාගේ, සිමන් හේවාගේ, සෙල්ල හේවාගේ, සෙන්නායිදෙ හේවාගේ, විලබඩ හේවාගේ, හෙට්ටි හේවාගේ, හෙන්ද හේවාගේ, කෝට්ටෙ හේවාගේ.



**කපුගේ කාණ්ඩය.**

මහ කපුගේ, කුඩා කපුරාළලාගේ, (කපුසික්කුගේ)

**දේවගේ කාණ්ඩය.**

මුදලි දේවගේ, තෙවරුසිගේ, (දෙවරුසිගේ)

**මෙරෙන්නගේ කාණ්ඩය.**

මෙරෙන්නගේ, අහංගම මෙරෙන්නගේ, දෙමුන්දර මෙරෙන්නගේ.

**ගලප්පත්තිගේ.**

ගලප්පත්තිගේ, ලොකු ගලප්පත්තිගේ, ගලප්පත්ති කංකානමගේ, ගලප්පත්ති ආරච්චිගේ, ආඹගම් ගලප්පත්තිගේ, පොල්වත්ත ගලප්පත්තිගේ.

| | |
|---|---|
| අකුරලීය ගමගේ | ඉලංගසූරියගේ |
| අත්තෝතිගේ | උඟුව අදිකාරම්ගේ |
| අබිත් තන්ඩල්ගේ | එදිරිවීරගේ |
| අබේදීර ගුණරත්නගේ | කන්කානි තන්ත්‍රිගේ |
| අබේවීරගේ | කන්දඋඩගේ |
| අබේසූරියගේ | කන්දඋඩ රාජධානිගේ |
| අබේසේකර ගුණවර්ධනගේ | කපුගේ |
| අමරසූරිය මුදියන්සේලාගේ | කපුසික්කුගේ |
| අමරසූරියගේ | කර්ණසූරියගේ |
| අඹනීල පතිරණගේ | කරුණාකලගේ |
| අප්දරාදිගේ | කළුගලගේ |
| අරන්දරගේ | කළුතර වෙදගේ |
| අරසකුලසූරියගේ | කළුපහනගේ |
| අරසකුලසූරිය වීරසිංහගේ | කාගිවසක් තන්ත්‍රිගේ |
| අලෙන්තුගේ | කාරිය කරවනගේ |
| ආරච්චිරාළලාගේ | කාරිය කරවන පටබැඳි මහවිදානෙලාගේ |
| ඉරිප්පුගේ | කාරියවසම් ගොඩැල්ලගේ |
| ඉලේකුට්ටිගේ | |

කාරියවසම් මර්තිනාගමගේ
කරිතිගනගේ
කැකුල් කොටුවගේ
කුරුකුලසූරියගේ
කුරුකුලසූරිය මෙරෙඤ්ඤගේ
කුරුකැටියගේ
කුරුකුලසූරිය සුංගම්මන්ඩඩිගේ
කුරුකුලත් අරශන් ඉලංගසිංහ ඔඩයාර්ගේ
කුරු නයිදේගේ
කුරු නායකගේ
කුරු නාථගේ
කුරුනේරුගේ
කුමාරසිංහ මුදියාන්සෙලාගේ
කුරුවීරගේ
කුරුසිංහගේ
කුලතුංගගේ
කුලතුංග මුදලිගේ
කුලතුංග විපුලසූරියගේ
කොරුවාගේ
කොළඹගේ
කොළඹ ලියනගේ
කෝට්ටගොඩගේ
ගමලත්ගේ
ගම්පලගේ
ගාර්දියවසම් ලිදමුලගේ
ගාර්දියගේ
ගාලුගමගේ
ගාල්ලගේ
ගාලුගේ
ගිනිගේ
ගීගනබදනගේ
ගුරුගේ
ගෝනියා මාලිමිගේ
චන්ද්‍රම් පටබැඳිගේ
ජයතුරුගේ
ජයරජ ජයවර්ණ ගම් පාලනගේ
ජයවර්ණ වීරසූරියගේ
ජයසිරි ආදිත්‍ය තාන්තුලගේ
ජයසිරි අර්ශකුලසූරියගේ
ජයසූරියගේ
ජයසින්දු පලිහවඩනගේ
ජයසිංහ මහවිච්චිගේ
ජයසිරි විජය මහබෝධිගේ
ජුවන් ගෝමිස්ලාගේ
ජුවන් ජේම්ස්ලාගේ
ජුවන් පුල්ලගේ
තන්ඩල්ගේ
තන්ත්‍රිගේ
තාන්තුලගේ
තුඩුගල මුදලිගේ
තුප්පහිගේ
තුප්පහිරාළගේ
තෙල්ගේ
තෙවරුතන්ත්‍රිගේ
තෙවරුසිගේ
තුසෙව්නම්බිගේ
එකුරාජ දෙවාදිත්‍ය ගාර්දියවසන් ලිදමුලගේ
දඩයක්කාරගේ
දළුවත්තගේ



දළුවත්ත අල්ත්ව දෑඹිගමුවගේ
දළුවතුමුල්ල ගමගේ
දියලගොඩ අන්තෝනිලාගේ
දියලගොඩගේ
දිවලදගේ
දෙඹගහපතිරගේ
දෙඩම්පහලගේ
දෙළමූනගේ
ධීරසූරියගේ
නයිකළුගේ
නියකුලගේ
නිකෝල පේමදලගේ
නිලවීරගේ
නිලවීරසූරියගේ
නෙත්තිකුමාරගේ
පටබැඳි මද්දුමාගේ
පට්ටියගේ
පත්තිනිගේ
පතිරගේ
පතිරුන්නාහෙලාගේ
පතම්බෙරගේ
පන්සිල්ගේ
පනාගොඩගේ
පයාගලගේ
පරණමඩිගේ
පල්ලියරාළලාගේ
පෙස්තෝරුවේ ලියන රාළලාගේ
පියදිගමගේ
පින්නදූවගේ
පොරෝගමගේ
ප්‍රන්හිගේ
ප්‍රන්සිස්කු ප්‍රනාන්දුලාගේ
ප්‍රන්සිස්කු හෙට්ටිගේ
පෙටිඅරඹගේ
පේදුරු පීරිස්ලාගේ
බටදූවගේ
බටපොලගේ
බරතකුලසූරිගේ
බලපිටියගේ
බාලගේ
බාලසූරියගේ
බිංගිරි ගොඩගේ
බෙන්තර සරික්කාලිගේ
බොලොන්දගේ
බොලොඤ්ඤගේ
හරණසූරියගේ
මදන කන්දගේ
මදන කොණ්ඩගේ
මදනගේ
මදවනගේ
මඩකලපුවගේ
මද්දුමාගේ
මද්දුම එන්දරගේ
මන්ඩඩිගේ
මනුකුලසූරියගේ
මනුවෙල් පීරිස්ලාගේ
මලවිගේ
මහතොම්මෙගේ
මහබන්ඩිගේ
මහමඩකලපුවගේ
මහමඩච්චිගේ
මහමැන්දිගේ
මහසරුක්කාලිගේ
මානමරක්කලගේ

මාතුවෙල් පීරිස්ලාගේ
මාලිම්ගේ
මාලිම් පටබැඳිගේ
මිගෙල් පෙරේරුගේ
මිහිඳුකුලසූරියගේ
මිහිඳුකුලසූරිය වරපේලිගේ
මිහිඳුකුලසූරිය වීරසිංහගේ
මිහිඳුකුලසේකර
විජයශ්‍රේරුගේ
මුංගේනගේ
මුතුකුඹගේ
මුතුතන්ත්‍රිගේ
මුතුමාලගේ
මුතුවීරගේ
මුදන්ගොඩ කංකානම්ගේ
මුදලිගේ
මුදලිදේවගේ
මුදුන්ගොඩ මහ හබරකඩ
පතිරත්නැහෙලාගේ
මුනවීර තන්ත්‍රිගේ
මෙරෙයැඳගේ
මෙසසූරියගේ
මෙස්ත්‍රිගේ
මොරවක් කෝරලගේ
මෝදරගේ
යක්ගේ
යාලගලගේ
යෙඩ්ඩිගේ
රත්ගේ
රත් පටබැඳිගේ
රාජපක්ෂ මානික්කු නම්බිගේ
රාජකරුණාගේ
රාජපක්ෂ ජුසෙත් නම්බිගේ

රාජපක්ෂ මනීමෙල් නම්බිගේ
රාජපක්ෂ වර්ණසූරිය
මුදියන්සෙලාගේ
රාජපක්ෂ වික්‍රමසූරිය
පටබැඳි මහ විදානගේ
රාමනාථ මුදියන්සෙලාගේ
රාසමනුකුල කුරුකුල
ආදිත්‍ය කොළඹ
මහපටබැඳි මහවිදානගේ
රණසූරියගේ
රණසිංහ මුදියන්සෙගේ
ලද්දුව කෝවිස්ගේ
ලිඳමුලගේ
ලියනගේ
ලේකම්ගේ
ලොකුහීයනගේ
ලොකු යෙඩ්ඩිගේ
වටුදුරගේ
වර්ණසූරියගේ
වර්ණකුල ආරච්චිනලාගේ
වර්ණකුලසූරිය නායක්-
කාර ඉලේකුම්බිගේ
වර්ණකුලසූරිය මහ
මැන්දිගේ
වර්ණදීප්ති පත්තිනිගේ
වැදිගේ
වැලිගත්ත සේතුගේ
වැල් අරුමගේ
විමලසූරියගේ
වික්‍රම කළුතොටගේ
විජයතුංගගේ
වික්‍රමසූරියගේ
වික්‍රමසූරිය මහමාලිම්ගේ



විජය ශ්‍රේරුගේ
විජයකුලසූරියගේ
විජයනායකගේ
වීරමන්තිරිගේ
වීරරත්නගේ
වීරවර්ණ ජයසූරියගේ
වීරවික්‍රම විජේසූරියගේ
වීරසක්කාර වීරබල කුරු
ලතුම්පාල මහබල
ජයසූරියගේ
වෙල්ලගේ
සරුක්කාලිගේ
සල්පගේ
සේනාදිගේ

සල්ප ශ්‍රේරුගේ
සිප්කඩුවේ අන්තෝනිගේ
සුද්දික්කු ජයවික්‍රමගේ
සෙම්බු කුට්ටිගේ
සෙම්බු කුට්ටි විදානගේ
සෙල්ලකපුගේ
සෙල්ලප්පෙරුමගේ
සේලර්ලාගේ
හංවැදිගේ
හම්බකුලගේ
හිනිදුමගේ
හෙට්ටියාකන්දගේ
හේවාපොන්සේකාගේ
හේවාවිතාරණගේ

---

**කෞරව වංශිකයන්ගෙ ඇතැම් පෙළපත් අන්වර්ථය මෙහි මතු දක්වෙනුයේ එයින් අපට විස්තර සොයාගත හැකි වූ පෙළපත් කීපයක්.**

(අලගියවත්ත මුකවෙට්ටි තුමා තෝම්බුව ලිවීමේ දී කෞරව වංශිකයන්ගේ සමහර පෙළපත් නාමයන් අත්තනෝමතික ලෙස සම්බන්ධ කර ගැනීමෙන් ද, සමහර උද්විය තමන්ට අයිති පෙළපත් නාම හරිහැටි නොලීමෙන් ද යම් යම් අඩු-පාඩු සිදුවී තිබෙන බැව් පෙනේ.)

**පටබැඳිගේ.**

කාණ්ඩ වශයෙන් බලන කල පටබැඳිගේ පෙළපතට අයත් උද්විය වැඩි ය. පටබැඳිගේ යනු "පට්ටම් කට්ටි" යන දෙමළ වචනයෙන් සෑදී තිබෙන වචනයකි. පටබැඳිගේ යන්නෙන් අදහස් කරනුයේ නම්බු නාම දීමයි. දැනුදු නම්බු නාම දීමට පට්ටම් දීම යයි ව්‍යවහාර කරති. කරන ලද සේවය අගය කොට සම්මාන දීමෙහි දී පටබැඳි

ආයිත්තමට කඩු-කස්තාන ද හිමි වූ තැන් තිබේ. පටබැඳි නම් දීමෙහි දී එහි වගතුග තල් පතක ලියා නළලේ බැඳීම ඉන්දියාවේ හා ලංකාවේත් සිරිතක් ව පැවතිණි. කල් යත් යත් තල් පත වෙනුවට රන් තහඩුවක් භාවිතයට පටන් ගත්හ. නිශ්ශංක රජ තුමාගේ කාලයේ දී වීරවණි නිලවීර පෙළපතේ අයකුට රන් පටක් බඳින ලදුව අද දක්වා දෙවුන්දර පෙරහැරේ පෙරමුණ ගෙන ගමන් කරන්නේ වීරවණි නිලවීර රන් පටබැඳිගේ සහ විජේවීර ගුණරත්න මහවිදාන මුහන්දිරම්ගේ පරපුරවලට අයත් අය බැව් පෙනේ.

(දෙවුන්දර ඉතිහාසය)

**හැන්නැදිගේ (සන්නද්ධ පේරුව) සහ හේවාගේ.**

"ලතේව සන්නද්ධ මනෝඥ පල්ලවඃ"

(සන්නාහ සන්නද්ධව යුද්ධයට නික්මිණි.) අවි ආයුධයෙන් සැරසුණු හේවා භටයින්ට හැන්නැදි යනු භාවිත කළ බැවින් ඔවුන්ගෙන් පැවත එන්නෝ හැන්නැදිගේ හා හේවාගේ යයි භාවිත කළහ.

**අන්ද්‍රා හැන්නැදිගේ.**

දෙවුන්දර ඉතා පැරණි දේවාලය කතරගම් දේවාලය යි. එහි කපුරාළලා කීප දෙනෙකි. අන්ද්‍රා හැන්නැදිගේ වත්තුහාමි (අන්ද-සන්නද්ධ වත්හිමි) කපුරාළගේ පෙළපතේ උදවිය පරම්පරාගත ව කපුකම කරගෙන ආවෝ ය. "දෙන් අදිරියන් මහ බෙත්මේ" මුහන්දිරම් මහතා ද මේ පෙළපතේ අයෙකි. ඉන්දියාවේ අන්ද්‍රා දේශයෙන් මේ කෞරව හේවායන් පැමිණි නිසා එ නමින් ප්‍රසිද්ධ වූහ.

**වරුසහැන්නැදිගේ**

මානික්කුදේව නල්ලූර් වරුස විපුල සන්නද්ධ සෙනෙවියාගෙන් පැවත එන්නෝ වරුසහැන්නැදිගේ යයි භාවිත කරති.



**වීරහැන්නැදිගේ.**

වීර ලෙස සටන් කිරීම නිසා ලැබුණු සම්මාන නාමයකි.

**පත්තිනි හැන්නැදිගේ.**

පත්තිනි යනු දේවතාවියකි. එතුමියගෙන් අනුග්‍රහ ලබන දේවාලයන්ට පත්තිනි දෙවොල් යයි කියති. ඒ මේ දේවාලයන්හි දේව කාර්යයෙහි නියුක්ත වූ කෞරව වංශික හේවායෝ මෙ නමින් පතළ වූහ.

**පොන්නහැන්නැදිගේ.**

පූර්ණහැන්නැදිගේ යන්නෙන් හෝ පූර්ණහැන්නැදිගේ යන්නෙන් මේ පෙළපත් නාමය සෑදී තිබේ. සම්පූර්ණ යුද්ධ ඇඳුමෙන් සැරසීගත් යනු එහි තේරුමයි.

**පතිරජහැන්නැදිගේ.**

ප්‍රතිරජ යයි කියනු ලබන්නේ යුව රජුටයි. සන්නාහ සන්නද්ධ වූ යුව රජකුගෙන් පැවතෙන්නෝ මෙ නමින් හඳුන්වති.

**බෝදියාහැන්නැදිගේ.**

ජය ශ්‍රී මහා බෝධිය ලංකාවට වැඩමවද්දී ඒ හා පැමිණි සන්නාහ සන්නද්ධ වූ කෞරව වංශිකයන්ගෙන් පැවතෙන්නෝ මේ පෙළපතට ඇතුළත් ය.

**බැමිණහැන්නැදිගේ.**

අලගියවන්න මුකවැටි තුමා තෝම්බුව ලියනු පිණිස හැන්නැදිගේ නිවෙසකට ලඟා වූයේ ය. එහි උන් හැන්නැදිගේ උදවියගේ නම් ලිවූ පසු ගෘහ මූලිකයා පැමිණ සිය දියණියක් ඉන්දියාවෙන් පැමිණි චන්ද්‍රභාරති නමැති බ්‍රාහ්මණයකු සමඟ විවාහ වී පුතුන් දෙ දෙනකු ලැබූ බව ද, කලකට පසු බ්‍රාහ්මණයා මළ බව ද, දරු දෙ දෙනා හා දියණිය ගෙයි ඉන්නා බැව් ද හෙළි කෙළේ ය. එකෙණෙහි

මුකවැටි තුමා 'එහෙනම්, බැමිණිත් හැන්නැදි ගෙයි' යයි පැවසුවේ ය. එවක් පටන් ඒ හැන්නැදිගේ කාන්තාව හා ඈගේ දරු දෙදෙන 'බැමිණහැන්නැදිගේ' යන පෙළපත් නාමයෙන් ප්‍රසිද්ධ වූහ. ඔවුන්ගේ පරපුරයෙහි වූවෝය 'බැමිණහැන්නැදිගේ' නමින් දැක්වෙත්තේ. (සමහරු 'බැබිණහැන්නැදිගේ' යයි ද ඇතැමෙක් 'බැමිණිහැන්නැදිගේ' යයි ද කියති. ඒ අවියත් වහරකි.)

**හේවාගේ.**

හේවා යනුවෙන් අදහස් කරනුයේ පාබල හමුදාවට අයත් උදවිය ගැනය. මොවුහු විවිධ සේනාංකයන්හි නියුක්ත වූහ. ඇතැමෙක් රාජකාර්ය්‍යය සඳහා ගංතොට ආදි තැන් රැකවලෙහි යෙදුනාහ. ඔවුන්ගෙන් පැවතෙන්නෝ නර තොටහේවාගේ, බෙන්තොටහේවාගේ, කළුතොටහේවාගේ ආදි පෙළපත් නම් ව්‍යවහාර කරති.

**තන්ත්‍රිගේ.**

තන්ත්‍ර යනුවෙන් අදහස් කරනුයේ විද්‍යා-ශාස්ත්‍ර ආදි යයි. හේවාතන්ත්‍රිගේ යනුවෙන් අදහස් කරනුයේ යුද්ධ ශිල්පයෙහි නිපුණ වූ තැනැත්තා හෝ යුද්ධ ශිල්පය උගත් වන තැනැත්තා යි. තෙවරුතන්ත්‍රිගේ යනුවෙන් දැක්වෙනුයේ දේව ධර්මය හැදෑරූ තැනැත්තායි. වඩුතන්ත්‍රිගේ යනුවෙන් අදහස් කරනුයේ වඩු ගුරුවරයායි. මුතුතන්ත්‍රිගේ යනුවෙන් දැක්වෙනුයේ මුතු (පර) පිළිබඳ විද්‍යාව දැන ඒ පිළිබඳ ආරක්ෂාව, සැපයීම ආදි කාර්ය්‍යයන්හි නියුක්ත වූවෝයි. (තන්ත්‍රි යන නාමය උද්‍යාන පාලකයන්ට හා මුතුපර පාලකයන්ටත් යෙදුණු බැව් පොත්වල සඳහන් වේ.) තෙවරුතන්ත්‍රිගේ, දේවගේ, තෙවරුසිගේ, යෙදිගේ, කපුගේ, කපුරාළලාගේ, කට්ටඩිගේ, තාන්තුලගේ යන පෙළපත් ඇත්තෝ දේව කාර්ය්‍යයන්හි නියුක්ත වූවන්ගෙන් පැවැතෙන්නෝය.

ගේ බලනතන්ත්‍රිගේ යන වාසගම ඇති උදවිය කතලුව පළාතේ දැනුදු වෙසෙති. එහි ආරම්භය පිළිබඳ ව ඇර්ජ්. ඊ. ගුණරත්න ගාල්ලේ තෝම්බුවේ මුදලි තුමාගේ 'ඩව් ටයිම්ස්'



නමැති පොතේ මෙසේ සඳහන් වේ. අලගියවන්න මුකවැටි තුමා කතලුව පළාතේ තෝම්බුව ලියමින් යන අතර එහි බණ්ඩාර වත්ත පාලකයාගේ නොහොත් තංත්‍රිගේ පෙළපත් නාමය මුකවැටි තුමා විසින් ප්‍රශ්න කරන ලදුව පිළිතුරු දීම පමා විය. එකෙණෙහි මුකවැටි තුමා බණ්ඩාර වත්ත පාලකයාගේ, තන්ත්‍රිගේ නොහොත් තන්තුලගේ පෙළපත් වලිය **"ගේ බලනතන්ත්‍රිගේ"** යයි තෝම්බුවේ ලියා ගත්තේ ය.

**මුතු පිළිබඳ කාර්ය්‍යය.**

ඈත අතීතයෙහි පටන්ම රාජකීය මුතු පරවල ආරක්ෂක යෝත්, මුතු පර පිළිබඳ සර්වාධිකාරිභාවය දැරූවෝත් කෞරව වංශිකයෝ ය. මුතුමාලගේ, මුතුවාදිගේ, මුතුවාඩිගේ, මුතුතන්ත්‍රිගේ, මුතුමන්ත්‍රිගේ, මුතුමේස්ත්‍රිගේ, මුතුකුමරගේ, මුතුඅරශගේ, මුතුකුඩගේ ආදි පෙළපත් නම් කෞරව වංශිකයන්ට ඇති වූයේ එහෙයිනි.

**නම්බිගේ.**

නම්බිගේ යන්න 'නම්බුක' යන වචනයෙන් භින්න වූවකි. රාජකීය විශ්වාසය දිනා ගත් තැනැත්තා, රජ තුමාගේ හොඳ හිත දිනා ගත් තැනැත්තා යනු එහි අදහසයි.

**මේස්ත්‍රිගේ.**

මේස්ත්‍රිගේ යනුවෙන් දැක්වෙනුයේ ගුරුවරයා යි. වඩු මේස්ත්‍රි යයි කියන්නේ වඩු ගුරුවරයාට යි.

**බදුගේ-වඩුගේ.**

මේ නම් දෙකින් ම අදහස් කරනුයේ ප්‍රධානියා යන්නයි. වඩුගත් යන වචනයෙන් මෙය සිද්ධ වී ඇත. (බදුගේ) ක්‍රි. ව. 1542 ඔක්තෝබර් 28 වැනි දින දී තුත්තුකුඩිය සම්බන්ධව බොහෝ වැදගත් කරුණු ඇතුළත් වී තිබෙන සාන්ත සෙවියර් මුනිඳුගේ ලිපියකින් මෙසේ ප්‍රකාශ කර ඇත.

"ග්‍රාමය කෙරෙහි පහර දීමක් 'බදුගෙ' (වඩුගෙ) වරු විසින් කරන ලදී. ඔවුන් වනාකී විජය නගර රජුන් යටතේ මදුරෙහි සිටින නායක්කන් උප පාලකයින් සහ කාරිය කරවන නිලමේවරු වෙති."

**බෝදියාබදුගේ.**

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සිරිලක්දිවට වැඩමවද්දී ඒ හා පැමිණි කෞරව වංශික (වඩුගත්) ප්‍රධානීන්ගෙන් පැවතෙන්නෝ වෙති.

**යාත්‍රාවඩුගේ.**

යාත්‍රා පිළිබඳ ප්‍රධානියා යන අදහසයි.

**ගාර්දිය.**

ගාර්දිය යනු රජ මාලිගය ආදි ප්‍රධාන ස්ථානයන් මුර කරන ආරක්ෂක භටයාට පෘතුගීසි භාෂාවෙන් ව්‍යවහාර කරන නාමයයි: පෘතුගීසීහු සිංහල රජුන්ට රැකවල් කරන අවදියෙහි දී රජුන්ගේ ආරක්ෂාව පිණිස කෞරව වංශික සේවායන් යෙදවූහ. ඔවුන් හඳුන්වනු ලැබුවේ 'ගාර්දිය සේවය' යනුවෙනි.

**තෙල්ගේ.**

VI වැනි ශ්‍රී පරාක්‍රමබාහු රජ තුමාගේ කාලයෙහි දී ලංකාවට පැමිණි සේනාපතියෙක්වූ කුරුකුල නාච්චු දේවාර් නම් තැනැත්තාය තෙල්ගේ උදවියගේ මුල් පියා. පසු කලෙක කතරගම් දේවාලයෙහි ශුද්ධ පහන භාරකාරත්වය මේ පරපුර සතු විය. මේ පෙළපත් ඇත්තෝ තෙල් ගබඩා නිලමේ ධුර දැරූ බවත් එයින් 'තෙල්ගේ' යයි ප්‍රසිද්ධ වූ බවත් ඉතිහාසයෙහි දැක්වේ.

**සර් ජේම්ස් පීරිස් මැතිඳුගේ පුත් හර්බර්ට් පීරිස් මැති තුමා 'දේවාර්' යන නාමය භාවිතයට පමුණුවන්නේ එය තමන්ගේ මුල් පියාගේ නාමය නිසා ය.**

**පතිරගේ–පත්තිරිගේ.**

මෙයින් අදහස් කරනුයේ 'ගණකාධිකාරි' යනුයි.



**රංගේ.**

දේවාලයෙහි රන් ආභරණ භාරකාර නිලමේගේ පරපුරයි.

**දෙඹගහ පතිරගේ..**

අරසමුනි ජයසූරිය පතිරාජ පතිරැන්නැහේලාගේ යන මේ පෙළපත් නාමය තෝම්බුව ලිවීමට පැමිණි අලගියවන්න මුකවැටි තුමා විසින් මෙසේ ලියා තිබේ. එසේ ලිවීමට හේතු වූයේ මුකවැටි තුමා තෝම්බුව ලිවීමට සිය නිවෙසට ලඟාවූ මොහොතේදී ගෘහ මූලික කෞරව වංශිකයා ඔහුට හරසර නොදක්වා (ඔහු පැමිණි වගක් ගණනකට නොගෙන) දෙඹ ගසක් අසල තමන්ගේ වැඩක යෙදී සිටීමයි. තමාට හරසර නොදැක්වීම මුකවැටි තුමාගේ කෝපයට හේතුවූ බැව් පෙනේ. එහෙත් නියම පෙළපත් නාමය අරසමුනි ජයසූරිය පතිරාජ පතිරැන්නැහේලාගේ යයි විය යුතුයි.

**වන්නකුවත්තේවඩුගේ.**

කෝට්ටේ රාජධානිය කොට විසූ නව වෙනි පරාක්‍රමබාහු රජු දවස දෙවුන්දර, කෝට්ටෙගොඩ, බඹරැන්ද යන දේවාලවල වන්නකු නිලමේ මොරටුවට අවුත් කෝරලේ වැල්ල හෙවත් කොරළවැල්ල ප්‍රදේශය ආරක්ෂකයා හැටියට පත් විය. මේ ප්‍රදේශය ගල්කිස්ස තොටමුණේ සිට පානදුරු තොටමුණ දක්වා ප්‍රදේශය යි. මෙම ප්‍රදේශයට සාමාන්‍යයෙන් "මොරටු දික්වැල්ල" යයි කියා තිබේ.

"වන්නකු" යනු "බස්නායක"–බස්නැක–බන්නැක–ආදි වශයෙන් බිඳී ආ වචනයකි. කෝට්ටේ රජ විසින් මෙම "වර්ණකුලසූරිය කරෙයියුර් අවර්ගල්" නම් යුත් වන්නකු නිලමේට දෙවාවදළ ප්‍රදේශයට "වන්නකුවත්ත", යයි කියන ලදී. මොරටුවට එන්ට ප්‍රථම මොහු දේවාල අරමුදලේ බස්නායක තනතුර දරණ ලදී. 1402 දී ගම්පල (ගංගාසිරිපුර)

දෙ වෙනි වීරපරාක්‍රමබාහු රජුන් දවස මහා අධිකාරම් ධුරය දැරූ කුරගම අධිවාස කුරුවර අතිජාත අමරදිවාකර වික්‍රම-සිංහ මහනම්බුකාර අග්‍රකෝන් මහ නිලමේගේ පුත්‍රයා වන විලේගොඩ වික්‍රමසිංහ රාජපක්ෂ මුදියන්සේගේ මිණිබිරියක් වූ පුංචිමැතිකේ කුමාරිහාමිව ආවාහ කරගන්නා ලදී. මොහුගේ බාලම පුත්‍ර වත්නකුරාළ සිය පියාගේ උරුමය ලබා ක්‍රි. ව. 1528 සිටි දෙ වෙනි විජයබාහු රජුගේ රාජකීය යුධ හමුදාවේ පඩිකාර ලේකම් වශයෙන් රාජකාරිය කර තිබේ. කතරගම දේවාලයේ මහබෙත්මේගේ තුන් වෙනි පරම්පරාවට අයත් කුරුකුල නාට්ටු බණ්ඩාර සාමිගේ දියණියක වන ලීලාවතී කුමරිය සමග විවාහ වී තිබේ. මෙම වත්නකුරාළ වඩු කර්මාන්තයෙහි දක්ෂයෙකුව සිටියෙන් දෙ වෙනි බුවනෙකබාහු රජුට අනගි සිංහාසනයක් තනා ඔප්පුකර දුන්නේය. ක්‍රි. ව. 1534 දී රජ සම්මාන වශයෙන් තුන්රියවල ඉරවැල්ලේ කුඹුරුයාය මොහුට දෙවාවදාරණ ලදී.

මෙම වඩු මඩුව පිහිටි ස්ථානය අද ශුඩවූ එම්මානුවෙල් දෙවස්ථානය පිටුපස තිබෙන සොහොන් භූමිය යි. මෙම භූමිය වත්නකුවත්තේවඩුගේ පැරණි නායකයින් ඉදිරිපත්ව 1915 දී ඔප්පුවකින් රජයට පවරණ ලදී. අදත් මේ අවට ප්‍රදේශය ලංකාවේ දක්ෂ වඩු කර්මාන්ත කාරයින්ගේ වාසභූමියයි. වත්නකු රාළට පුත්‍රයෝ සිවු දෙනෙක් වූහ. ක්‍රිස්තියානිය වැළඳ ගැණීමේදී තුන් දෙනෙක් 'ප්‍රනාන්දු' නම සහ එක් අයෙක් "දොන්........පෙරේරා" යයි නම් ලබා ගත් බැවින් මෙම පෙළපතේ "ප්‍රනාන්දුලා" වැඩි දෙනෙක්ද "දොන් පෙරේරාලා" ස්වල්ප දෙනෙක්ද සිටිති.

"රාළ" යනු "රජකුල" නොහොත් රදල යන්නෙන් බිඳී ආ වචනයකි.

**අන්ද්‍රවාස්පටබැඳිගේ.**

"වාස්" යනුවෙන් දක්වෙන්නේ පෘතුගීසි නමක් නොවේ. "අන්ද්‍රාවාස්" යනු "අන්ද්‍රවාසි" ය. දකුණු ඉන්දියාවේ



ආන්ද්‍රා දේශයෙන් ආ මිනිසුන්ට "ආන්ද්‍රාවාසී"හු යයි කියනු ලැබේ. පසු කලක දී "ආන්ද්‍ර" 'අන්ද්‍ර'යයි ද වාසී "වාස්" යයි ද යොදා ගෙන තිබේ.

**ලක්ෂපතිමහවිදානෙලාගේ.**

"ලක්ෂපතිය" නම් පොල් උයන ක්‍රි. ව. 1187 දී නිශ්ශංක මල්ල රජතුමා විසින් ශ්‍රී ලක් විජය සිංකිත් සෙනෙවි තුමාට ප්‍රදානය කරන ලද ගම්වරයකි. දැනට ලක්ෂපතිය, රාවතාවත්ත, ඉඩම, උයන, රත්මලාන, කල්දෙමුල්ල නම්වලින් හැඳින්වෙන්නේ මෙම ගම්වරයයි. ඔහු පුත් වර්ණමාන සපරමාදු නානායක්කාර දිශානායක "ලක්ෂපති මහවිදානෙ මුහන්දිරම්" ධුරය දරන ලදී. ප්‍රතිකාල් කැප්ටන් ජනරාල් සහ ආණ්ඩුකාර ධුරන්ධර දියාගු ද මැල්ලො තුමාගේ ඥාති දරුවෙක් වූ ද ප්‍රතිකාල් ජාතික ගෞ. බර්නාදු පියතුමා අතින් ක්‍රි. ව. 1637 මැයි 25 දින ප්‍රසාද ස්නානය ලබාගෙන මෙම පරම්පරාවෙන් පළමුව රෝමානු කතෝලික ආගම වැළඳ ගත්තේ බර්නාදු ද මැල් නමැත්තායි. ඉන් පසු ලක්ෂපති මහ විදානෙලාගේ පරපුර "මැල්" නාමය භාවිතයට ගෙන ඇත.

**පොන්සේකා පරපුරවල්.**

†1. ගම්පලගේ පොන්සේකා
2. ගම්පලවඩුගේ පොන්සේකා
3 ගම මාලගේ පොන්සේකා
4. ගාර්දියවසන් හේවා පොන්සේකාගේ පොන්සේකා
5. ගාල්ලගේ පොන්සේකා,
6. හේවා පොන්සේකාගේ පොන්සේකා
7. හේවා පතිරණගේ පොන්සේකා
8. සේනාධීරගේ පොන්සේකා
9. සෙල්ලප්පෙරලගේ පොන්සේකා
10. පස්කුල් පොන්සේකලාගේ පොන්සේකා
11. පොඩිමරක්කලගේ පොන්සේකා

12. කළුතර වෙදගෙ පොන්සේකා
13. වණීගේ පොන්සේකා
14. මෙරෙඤ්ඤගේ පොන්සේකා
†15. ජයරාජ ජයවණී ගම්පාලනගේ (ගම්පලගෙ)

† මේ ලකුණෙන් හඳුන්වනු ලබන කෞරව වංශිකයන් වන ගම්පලගේ පොන්සේකා වරුන්ගේ ඉතිහාසය මීට අවුරුදු 400 කට වඩා පැරණි බව පාණදුරේ විසූ කීර්ති ශෙෂ භාවොපගත පණ්ඩිත ඩී. ඇම්. සිල්වා ශ්‍රී විජය කවිරාජ පඬි තුමා විසින් ඒ සම්බන්ධ ඓතිහාසික ප්‍රවෘත්ති ඇතුළත් ඉතා වටිනා වැදගත් ලියවිලි බ්‍රිතාන්‍ය කෞතුකාගාරයෙන් කීර්තිමත් ද සොයිසා පවුලට අයත් ශ්‍රීමත් විල්ප්‍රඩ් ද සොයිසා නයිට් තුමාණන්ගේ විශෙෂ ඉල්ලීම පරිදි පිටපත් කරගෙන ආ බවත් එම ලියවිලි සියල්ලක් ම බස්නාහිර පළාතේ මහ දිසාපති ධූරය දැරූ වී. ඇස්. ඇම්. ද මැල් මහතා ළඟ ඉතා සුරක්ෂිත ව තිබෙන බවත් අපට **දැනගන්ට** ලැබී තිබේ. මේ හැර **ජයශ්‍රී මහා බෝධිය ලංකාවට වැඩමවාගෙන ආ දඹදිව මීප චක්‍රවර්ති ධර්මාශෝක මහරජාණන්ගේ දියණිය වූ සංඝමිත්තා මහ රහත් මෙහෙණින් වහන්සේ සමඟ ලංකාවට පැමිණි දස අට කුලයෙහි ජනයා අතුරෙන් "ගම්පාලනගෙ" නමින් හැඳින්වෙන එක් කුලයක් ද විය. මේ ගම්පාලනගේ** පරපුරෙහි අය සිංහල රාජ්‍ය කාලයෙහි **"රටේ රාල" "ගමේ රාල" "කෝරාල"** ආදී එවකට තිබුන උසස් තනතුරු රාජ සම්මාන වශයෙන් ලබාගෙන තිබේ.

පසුව සිංහල රාජ්‍යය පරසතුරු උවදුරුවලින් පීඩා විඳින අවදියෙහි (පෘතුගීසි, ඕලන්ද ආණ්ඩු කාලයෙහි) එම ආණ්ඩුවලට විරුඬ ව සිංහල ආණ්ඩුවට පක්ෂපාතී අයවලුන් හැටියට මොවුන් පෘතුගීසි, ඕලන්ද ආණ්ඩුවල උසස් නිලධාරීන් විසින් අඳුනාගෙන තිබුන බැවින් ඒ ගැන පරසතුරු කරදරවලින් මිදෙන්ට කල්පනා කළ ඔවුහු



**ගම්පාලනගේ** වෙනුවට **ගම්පලගේ ද පොන්සේකා** කියා ද සමහරුන් **ගම්පලගේ පොන්සේකා** කියා ද භාවිතා කළ බව පෙනේ.

තවද පසු කාලයෙහි ගම්පලගේ ද පොන්සේකා වරුන් ගෙන් සමහරු ද පොන්සේකා යන නමේ අගට "ද පොන්සේකා ජයසූරිය" "ද පොන්සේකා වණීදිප්ත්‍ය ජයසූරිය" "ද පොන්සේකා අභයකරුණාරත්න" "ද පොන්සේකා සමරසේකර" "ද පොන්සේකා දිසානායක" යනුවෙන් ද ලියන්ට පටන්ගත්හ. එයින් බොහොමයක් ඉංග්‍රීසි ආණ්ඩුවෙන් ඔවුන්ගේ මුතුන්මිත්තන්ට මුදලි, මුහන්දිරම් ආදී නම්බු නාමයන් සමඟ ලැබුන රාජකීය ගෞරව උපාධි නාමයන් බැව් පිළිගැනීමට සාක්ෂි එමට තිබේ.

---

(පොන්සේකා අභිනන්දන පිටු 1, 2)

(කුරුකුල චරිතයේ පළමු වෙනි කාණ්ඩයේ "263" පිටේ "කළුතර වණීකුලසූරිය" "ආදිත්‍ය රාජ" පොන්සේකා සේනාපති කරාවේ යුව රජු ගැන විස්තර ලියා තිබේ.)

**මරක්කලගෙ.**

මරක්කාව යනු නෞකා විශේෂයකට නමකි.
"මලලබණ්ඩාරවලියෙහි"

"මරක්කාව කොයි අතටද පදින් තේ
සිංහල රටට යන්නට අපි පදින් තේ"

යයි කියා තිබේ. මරක්කල යනු නැවේ කැප්ටන්ට නමකි.

**මහ මරක්කලේ** = මහ නැවේ කැප්ටන් හෝ නැවේ ප්‍රධාන නියමුවායි.

**මාලිමිගේ** = නැවේ නියමුවා යන අර්ථයි.

**කොඩිකාරගේ** = කොඩි භාරකරු යන අර්ථයි.

**එකුරාඅ දේවදිත්‍ය ගාර්දියේවසම් ලිඳමුලගේ**

දෙ වන පරාක්‍රමබාහු රජ කාලයේ එකුරක නොහොත් එකුර සෙනෙවි ප්‍රධානව 700 ක් ආයර්‍ය හටයෝ ලංකාවට පැමිණියාහු ය. එ කල දඹදෙනි පුර ආණ්ඩු කළ රාජද්‍රෝහි මිත්‍ත සෙනෙවියා එකුරගේ එක් කඩුපහරින් කපා හෙළීය. ඉන් පසු ආයර්‍යය සිංහලය යන සියලු සේනාවෝ සමගිව යාපව්වට ගොස් බුවනෙකබාහු කුමරු දඹදෙනියට ගෙනවුත් අභිසේක කළෝ ය. එකුරගෙන් පැවත එන පරපුර **"එකුර අඹ දෙව ආදිත්‍ය"** යයි ව්‍යවහාර කළහ. මින් පැවත එන "ආදිත්‍ය බණ්ඩාර" නම් තරුණයා (7 වැනි බුවනෙකබාහු) දොන් ජුවන් ධර්මපාල කුමාරයාගේ ආරක්ෂාවට රජ වාසල නතර කරවූයෙන් "ගාර්දිය" යන නාමය ව්‍යවහාර විය. ("ගාර්දිය" යන පෘතුගීසි වචනයේ අර්ථය ආරක්ෂක මුර සේවය යනුයි) යුඩය සංසිඳී කලක් ගතවූ පසු හෙතෙම දූවරුන්ගේ ස්නානය සඳහා ලිඳක් කැපීමෙහි යෙදී සිටියේ ය. රජ අණ අතපසු වීම නිසා මරණය නියමවී තිබුනි. නමුත් හේ රාජපාක්ෂික සේවකයෙක් වූ බැවින් **"ලිඳමුලයා"** කියා නිදහස් කරන ලදී. එතැන් සිට මෙම පරපුරේ අය ලිඳමුලගේ යයි ව්‍යවහාර කළෝය.

ආදිත්‍ය බණ්ඩාර සෙනෙවියාට මුහුදු නදී උයන්තොට හතර මායිම් තුළ මුරටුව (දැන් මොරටුව) ගව පාලන බිමද මාකුඹුරුද බෝදුවේ කුඹුරද ඊට ගොඩබිම මහවත්තද බුවනෙකබාහු රජු විසින් සන්නස් පිට දී තිබේ. මෙ තුමා ගෙන් පැවත එන්නන් විසින් සතර කෝරලය පුරාණයේ සිට පාලනය කරන ලද්දේ ය.

ලිඳමුලගේ ජුසේ ද සිල්වා චැවලියර් තුමා ශුඩවූ මහා ග්‍රිගෝරි පඩකතියේ පළමු වන සිටුවරයා ශුඩවූ රෝම සභාවේ වටිනා ධර්මාභිසමයෙකි. කොටහේනේ සාන්ත ලූසියා ආසන දෙව්මැඳුරේ සහ මොරටුවේ සාන්ත සෙබස් තියන් මුනිඳුන්ගේ දේවස්ථානයේත් ප්‍රසෙන්ති මුහුප්පු ධූරය



දැරීය: මොහු දෙවස්ථාන ස්ථාපිත කිරීම සඳහා රුපියල් හතලිස් දහසක් පමණ ත්‍යාගි කෙළේය. මොරටුවේ කතෝලික පාඨශාලාවලට ද මුදලින් ආධාර කර තිබේ. මොහු කැතරින් ද සොයිසා ආයර්‍යාවගේ පියා ය.

(සම්පූර්ණ විස්තර බලා ගැනීමට සතුටු අය කුරුකුල චරිතයේ 1–2 කාණ්ඩ බලත්වා)

**මිරිස්සෙ කොඩිප්පිලි වරු** වනාහි සිංහල රජුන්ගේ යුධ හමුදාවල කොඩිකාරයෝ ය.

**විජේශ්‍රෙරු**:– ශ්‍රී මහාබෝධින් වහන්සේ සමග මෙහි පැමිණි අර්ධදක්ෂ මුදලි පරම්පරාවෙන් පැවත ආ තැනැත්තා පටන් එම අර්ධදක්ෂ මුදලිගේ මුණුබුරු වූ "විජේශ්‍රෙරුට" මුගවෙට්ටි පෙරුමාලුම් යන තනතුර ලැබී තිබේ.

**වච්චනාච්චු දේවගෙ** නමැත්තෝ සියනෑකෝරළේ කලගෙඩි හේන නමැති ගම්මානයේ සහ ජාපනේ පළානේ අච්චන් කුලමේද සිටිති. මොවුහු වනාහි මුක්තර සටනට පැමිණි වච්චනාච්චූ දේවරීර් යුව රජගෙන් පැවත එන්නෝ වෙති.

**තුප්පහිගේ**-තුප්පහි මුදියන්සේ හෙවත් තෝල්ක මුදියන්සේ යනු භාෂා පරිවර්තක මුදලි තැනට නමකි.

සල්පශ්‍රෙරු තුප්පහි යන්නෙහි තේරුම සල්පශ්‍රෙරු නමැති තෝල්ක මුදියන්සේගෙන් පැවත එන පරපුරයි.

**රුද්‍රිගු**:– දොන් ජුවන් ධර්මපාල රජුට උරුමක්කාරයින් නොසිටියෙන් එතුමන්ගේ අන්තිම කැමැත්ත ප්‍රකාර ලංකා රාජ්‍යය පෘතුගාලයේ රජතුමාට ක්‍රි: ව: 1597 දී මල්වානේ ගිවිසුමෙන් පවරාදෙන ලදී. මේ ගිවිසුමට අත්සන් කළ වංශාධිපතින් අතර කරාව ගෝත්‍රය වෙනුවෙන් අත්සන් තැබුවේ පට්ටන්කට්ටි තොමේ රුද්‍රිගු තුමාය. (ජෙරමියස් දියස් මැතිණිය මේ පරපුරෙන් පැවත ආ කෙනෙකි.)

**දියස් අන්දරාදි**

ක්‍රි: ව: 1590 වරුණකුල ආදිත්‍ය අරශ නිල ඉට්ටන් මනුවෙල් දියස් අන්දරාදි මුදලි තුමා දොන් ජෝන් විමලධර්මසූර්‍ය රජ තුමා විසින් උඩරට රාජධානියෙහි මහ අදිකාරම් ධුරයට පත් කරගන්නා ලදී. **ස්වදේශික හමුදාවේ සේනාපතියා** වනාහි කරාවේ ගොත්‍ර මනුවෙල් දියස් මුදලි තුමා ය. (ගාල්ලේ තෝම්බුවේ "Dutch Times")

දෙ වන රාජසිංහ රජුට සහ එතුමාගේ මිත්‍ර පාක්ෂික ඕලන්ද ආණ්ඩුවට ද පක්ෂව පරංගින්ට විරුඬව මීගමුව, කළුතර, ගාල්ල, ජාපනය යනාදි ස්ථානවල ඇරඹූ සටන්වලදී ප්‍රමුඛ ව ක්‍රියා කළවුන් අතර ලුවිස් දියෙස් අන්දරාදි සහ මනුවෙල් දියෙස් අන්දරාදි යන සහෝදර මුදලිවරු දෙ දෙනා නියම වීරයන් බවත්, සිංහලයින් අතරෙත් විශ්වාස කටයුතු මුදලිවරුන් බවත් බෙතාවියේ ඩැග් රෙජිස්ටරයේ ඕලන්දයන් විසින් සටහන් කර තිබේ. සිංහල රජුගේ ද අනුමැතිය ඇතිව ඕලන්ද ආණ්ඩුව විසින් කොළඹ **නාගලගම්තොට** පිහිටි අමුණු 65 ක් පමණ විශාලත්වය ඇති මහවත්ත **නමැති** ගම්වරය ලුවිස් දියස් අන්දරාදි මුදලිතුමාට නින්දගමක් වශයෙන් දෙවා වදාරණ ලදී.

**මොරටුව** යනු මුර–අටුව යන්නෙන් බිඳී ආ වචනයකි. (මුරටුව යනු Guard Pilar (දුටුගැමුණු රජුන් දවස ජයසිරි ආදිත්‍ය කුමරු එතුමාගේ හේවා පිරිසවූ 360 දෙනෙක් සමඟ "මුරටු" ප්‍රදේශයෙහි පදිංචි විය. මේ පිරිස මොරටුවේ මුල් පදිංචිකාරයන් වශයෙන් ඒ ගම්මානය ඇතිකිරීමෙහි මූලිකයෝ වූහ. සිංහල රජුන්ගේ විශ්වාසවන්ත භාවය දිනාගෙන සිටි බැවින් මුහුදු මාර්ගයෙන් ගොඩවදින සතුරන් මැඩලීම පිණිස මෙම යුඬකාරයන් මුහුදුබඩ ප්‍රදේශවල පිහිටි කඳවුරුවල නතර කරන ලදී.

දඹදිව ගන්ධාර දේශයෙන් කෞරවයෝ විත් පදිංචිවූ ප්‍රදේශය **ගන්දර** නම් විය.



පර සතුරු උවදුරු **මැඩලීම සඳහා මුහුදුබඩ ආරක්ෂා කිරීම** ඔවුන්ට පවරන ලදී. **ක්‍රි. ව. 497–515 මුගලන් රජුගේ කාලය ඒ අතින් අතිශය වැදගත් කාල පරිච්ඡේදයකි.**

**දෙඩම්පහල.**

උඹවේ යුව රජ නොහොත් කුරුවිටරාළ මහ පලාත කෝරළේ දිගලතැන්නේ කිරිඹරුවේ මහත්මී නමැති කාන්තාවක් සරණ පාවාගෙන සිටියේය. එතුමන්ට දාව ඇට ලැබුනාවූ ජයසූරිය නමැති කුමරුට පසු කලකදී මායා දුන්නේ රජු විසින් මාතොට ජයගෙන **දෙඩම්පහල නම්** ගම්වරය නින්දගම්කර දුන්නේය.

**මාතර–"මහ කරාව"**

අන්තෝනියෝ බැරුත්තු හෙවත් කුරුවිට රාළ මාතර පදිංචිව සිටි ප්‍රදේශයට "මහකරාව" යයි ව්‍යවහාර කරන ලදී. නූපේ විහාරස්ථානයේ ගල්කණුවෙන් මෙය පැහැදිලිවේ. නගර සභාව විසින් පසු කාලයක ඒ නම "තොටමූණ" යයි වෙනස් කර තිබේ.

**එදිරිවීර විජේසූරිය.**

ක්‍රි. ව. 1238 දී මුක්කර සටන සඳහා පැමිණි ආරච්චිවරු 18 දෙනාගෙන් කෙනෙක්වූ කුරුකුල **නම්වූ** දෙවරීර් යුවරජ කමට පත් කරන ලදින් ඔහුගේ පරපුරෙන් පැවත ආ අය විසින් කෝට්ටේගොඩ (කොටුගොඩ) (දැනට කඩපල අසල) අත්තිවාරම තිබෙන කොටුව හෙවත් අන්ද්‍රයම් බැම්ම (බතරොයිය) බැඳ සිංහලේ රජතුමා සමඟ ඕලන්දක්කාරයින් යුඬ කරන කල්හි සූරවීර ලෙස යුඬ කිරීම ගැන "ඉලංගේ රදල" නමැත්තාට රත්රන් නලල් පටක් බැඳ **"එදිරිවීර පටබැඳි"** රදල නාමයෙන් ගෞරව කරන ලදී. එම පටබැඳි රාළගේ මුනුබුරෙක්වූ කෝට්ටේගොඩ විසූ දොන් පිලිප් යන

අය එවකට දැදුරුඔය පටන් කතරගම දක්වා මුහුදුබඩ ප්‍රදේශයට අපඛිතිකම් කළ තමෙල් මහ මුදලි තුමාගේ ආධාරයෙන් ගොයියපානේ සිට කුඹුක්කන් ඔය දක්වා අතර බදු ගෙනයන හමුදාව භාර ප්‍රධාන මුදලිකම වන රංචියේපති ධුරයට පත්කරන ලදින් දොන් පිලිප් **එදිරිවීර විජේසූරිය** යන නාමයෙන් කඩුකස්තාන පළඳවා ගෞරව කරන ලදී. එම පරපුරෙන් පැවත එන්නෝ අදත් කෝට්ටේගොඩ, දෙඩම්පහළ සිටිති.

**වීරවික්‍රමසූරිය.**

එම පරපුරෙන් පැවත එන කොටසක් කතරගම ශ්‍රී මහා විෂ්ණු දේවාලයේ මහබෙත්මේ නිලමේ ධුරය දරා ගෙන එන අතර කීර්ති ශ්‍රී රාජසිංහ රජ තෙම මාගම් ජන පදය ඕලන්දක්කාරයින්ට භාර දුන් පසු ක්‍රි. ව. 1766 දී මාගම් ජනපදයේ මුදලි තනතුර ඕලන්ද ආණ්ඩුව විසින් දොන් සයිමන් අබේසිංහ වික්‍රමරත්න වීරවික්‍රමසූරිය මුදලි තුමාට භාර කරන ලදී.

**මුතුමාල අග්නිකුලසූරිය.**

විමලධම් නමින් රජවූ කොනප්පු බණ්ඩාර තුමා. රාජසිංහ රජු සමග යුද්ධ කරන කල යටකී පරපුරෙන් ආ අග්නිකුලජයසූරිය නම් රණසූර කුමාරයා, රාජසිංහ රජු පරදවා විමල ධර්ම රජුට ජය අත්කර දීම නිසා තම ගෙල පැලඳි මුතුහර (මුතුමාලය) සියතින් ගෙන පළඳවා මුතුමාල අග්නිකුලජයසූරිය නමින් රන් තලල්පට බැන්දේය.

**පැලවා සේනාධිපති.**

භාතිය තිස්ස රජුන් සමයේ එනම් ක්‍රි. ව. යට 20–9 යන කාලය තුළ දඹදිව, අයෝධ්‍ය, ඌඩ් හෙවත් **අයෝත්තී පට්ටනමෙන්** සිරිලකට ගෙන්වා කාක මුක්කර **නල මුදලියා** හා සටන් කළ **නවගෝත්‍ර කරාවේ** යුධාකාර සේනාපතීන් අතරෙන් **පැලවා** සේනාධිපති තැනද



කෙනෙකි. ඔවුන් සම්බන්ධව මනා විස්තර කුරුකුල චරිතයේ පළමු වෙනි කාණ්ඩයේ බහා තිබේ.

**පැලවා** සෙනෙවියන්ගේ **කරාව** ගෝත්‍රයට අයත් යුධ භටයින්ගේ සංඛ්‍යාව අටසියයක් යයි වන්නි රාජවලිය, මලල බණ්ඩාරවලිය යනාදී වන්නි කථා පොත්වල විස්තර කර තිබේ.

කාක මුක්කරුන් පරදවා භාතිය තිස්ස රජුට ජය ගෙනදුන් හත්දස් අටසීයක් පමණ අයෝත්ති පට්ටනමෙන් පැමිණි මේ කරාවේ යුධ භටයින්ටද ඔවුන්ගේ සේනාපතීන් නවදෙනාටද **"සිංහලෙන් නෑකම් දෙමි"** කියා සිංහල කාන්තාවුන් තැලි බැඳ කරකාර බැඳ දී හත්කෝරළේ පළාතෙන් ගම් හතලිහක පමණ රජු විසින් ඔවුන් පදිංචි කරවා තිබේ. තවත් සමහරෙකුට මුදුතෙර රටවල්වලට සන්නස් ප්‍රදානය කර යවන ලදී. මුදුතෙර පළාත්වලට යවන ලද සෙනාවන් අතරෙන් පැලවා යුධ සේනාධිපතියාද ඔහුගේ අටසීයක් පැලවා කැටියද හරුමල්ගොඩ සහ ඒ අවට ගම්වල පදිංචි වුන බැව් මුඛ පරම්පරා කථා ආශ්‍රයෙන් දැනගන්ට තිබේ.

**මේ පැලවා යුධ සේනාධිපතියන්ගෙන් පැවතෙන පරම්පරාවට පැලකැටියේගෙ යන පෙළපත් නාමය දැනට ව්‍යවහාරව පවතින බව විශවාස කරනු ලැබේ.** ඔවුහු අයෝධ්‍යයෙන් පැමිණි චන්ද්‍රසූයයී හෙවත් සෝමසූයයී වංශික කුරුකුල යුධකාරයින්ගෙන් පැවත එන මුණුබුරු පිරිසක් වශයෙන් සිතා ගත හැක.

**කුරුකුලසූරිය**-මිහිඳුකුලසූරිය, වණිකුලසූරිය, අර්ෂකුල සූරිය, මනුකුලසූරිය යන පෙළපත් ඇති සමහරු මීගමුවේ සිට ක්‍රි. ව. 1593 පමණේදී දකුණු පළාත්වලට විසිරගිය බැව් ඉතිහාසයෙන් පෙනේ.

**ව්‍යවස්ථාදායක, ව්‍යවස්ථාපක, රජ්‍ය මන්ත්‍රණ සභා, උත්තර මන්ත්‍රී සභා හා පාර්ලිමේන්තු සභාවෙහිත්**

## කෞරව වංශික මන්ත්‍රීවරු

| | |
|---|---|
| සර් ජේම්ස් පීරිස් | මැතිතුමා |
| සර් විල්ෆ්‍රේඩ් ද සොයිසා | මැතිතුමා |
| සර් එච්. ඇම්. ප්‍රනාන්දු | මැතිතුමා |
| සර් එච් ඇල්. ද මැල් | මැතිතුමා |
| සර් සුසාන්ත ද පොන්සේකා | මැතිතුමා |
| සර් බැනට් සොයිසා | මැතිතුමා |
| සර් පිලිප් රුද්‍රිගු | මැතිතුමා |
| සර් ලියෝ ප්‍රනාන්දු | මැතිතුමා |
| ඩබ්ලිව්. ආතර් ද සිල්වා | මැතිතුමා |
| ඒ. ජේ. ආර්. ද සොයිසා | මැතිතුමා |
| එච්. ඩබ්ලිව්. අමරසූරිය | මැතිතුමා |
| ජී. කේ. ඩබ්ලිව්. පෙරේරා | මැතිතුමා |
| ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා | මැතිතුමා |
| ඇල්. ඇම්. ඩී. ද සිල්වා | මැතිතුමා |
| වැලන්ටයින් ඇස්. ජයවික්‍රම | මැතිතුමා |
| එඩ්මන්ඩ් ජේ. කුරේ | මැතිතුමා |
| සෑම් පී. සී. ප්‍රනාන්දු | මැතිතුමා |
| මොන්ටේගු ජයවික්‍රම | මැතිතුමා |
| පී. ද ඇස්. කුලරත්න | මැතිතුමා |
| පී. එච්. විලියම් ද සිල්වා | මැතිතුමා |
| විල්මට් ඒ. පෙරේරා | මැතිතුමා |
| ලෑස්ලි ගුණවර්ධන | මැතිතුමා |
| පී. ඒ. කුරේ | මැතිතුමා |
| ඒ. ජී කුරේ | මැතිතුමා |
| එච්. ජී. පී. ද මැල් | මැතිතුමා |
| ඇම්. ඩබ්ලිව්. ආර්. ද සිල්වා | මැතිතුමා |
| හියු ප්‍රනාන්දු | මැතිතුමා |
| ඇම්. ජී. පෙරේරා | මැතිතුමා |



| | |
|---|---|
| ෂැන්රි පීරිස් | මැතිතුමා |
| මැරිල් ප්‍රනාන්දු | මැතිතුමා |
| පී. එච්. සී. සිල්වා | මැතිතුමා |
| චම්ලි ගුණවර්ධන | මැතිතුමා |
| ටී. විලියම් ප්‍රනාන්දු | මැතිතුමා |
| ඩබ්ලිව්. පී. ජී. ආරියදාස | මැතිතුමා |
| ඇම්. පී. ජෝතිපාල | මැතිතුමා |
| ඇම්. රන්කිත් ප්‍රනාන්දු | මැතිතුමා |
| සී. එච්. ඉසැඩ්. ප්‍රනාන්දු | මැතිතුමා |
| ඩී. ඩබ්ලිව්. ජේ. පෙරේරා | මැතිතුමා |
| තෝමස් අමරසූරිය | මැතිතුමා |
| ඩබ්ලිව්. ජී. ඇම්. ඇල්බට් සිල්වා | මැතිතුමා |
| ඇස්. ඒ. සිල්වා | මැතිතුමා |
| ආර්. ඒ. ද මැල් | මැතිතුමා |
| හැක්ටර් ප්‍රනාන්දු | මැතිතුමා |
| ටී. ක්වෙන්ටින් ප්‍රනාන්දු | මැතිතුමා |
| චන්ද්‍රසේන මුනවීර | මැතිතුමා |
| පී. පී. වික්‍රමසූරිය | මැතිතුමා |

---

## මන්ත්‍රී ධුරවලට පත්වූ කෞරව වංශික කාන්තාවෝ

එවුලින් ද සොයිසා ආයසිංව
සිසී කුරේ මැතිණිය
ෆ්ලෝරන්ස් සේනානායක මැතිණිය

**ඇමති පදවි ආදී උසස් තනතුරු ලත් කෞරව වංශිකයෝ**

සර් ජේම්ස් පීරිස් මැති තුමා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ නිල නොලත් මන්ත්‍රීන්ගේ නායක ධුරය හා මන්ත්‍රණ සභාවේ උප සභාපති ධුරය (මේ මන්ත්‍රණ සභාවේ සභාපති ආණ්ඩුකාර තුමා ය.)

සර් සුසාන්ත ද පොන්සේකා මැති තුමා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ උප කථානායක
ආර්. ඒ. ද මැල් මැති තුමා පාර්ලිමේන්තුවේ උප කථානායක
හියු ප්‍රනාන්දු මැති තුමා පාර්ලිමේන්තුවේ උප කථානායක
ඇම්. ඩබ්ලිව්. ආර්. ද සිල්වා මැතිතුමා පාර්ලිමේන්තුවේ කාරක සභාවේ උප සභාපති.

| | |
|---|---|
| ඩබ්ලිව්. ආතර් ද සිල්වා | සෞඛ්‍ය ඇමතිතුමා |
| එච්. ඩබ්ලිව්. අමරසූරිය | වෙළෙඳ ඇමතිතුමා |
| මොන්ටේගු ජයවික්‍රම | රථවාහන හා වැඩ පිළිබඳ ඇමතිතුමා |
| පී. එච්. විලියම් ද සිල්වා | කර්මාන්ත හා ධීවර ඇමතිතුමා |
| ඇම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා | අධිකරණ ඇමතිතුමා |
| වැලන්ටයින් ඇස්. ජයවික්‍රම | අධිකරණ ඇමතිතුමා |
| එඩ්මන්ඩ් ජේ. කුරේ | අධිකරණ ඇමතිතුමා |
| සෑම් පී. සී. ප්‍රනාන්දු | අධිකරණ ඇමතිතුමා |
| ඩබ්ලිව්. පී. ජී. ආරියදාස | උප ඇමතිතුමා |

## කෞරව වංශික ලේඛකයෝ

(පූජ්‍ය පක්ෂය)

දෙඹන්දූවේ ශ්‍රී පියරතන මහා නායක ස්වාමීන්ද්‍රයෝ
වැලිගම ශ්‍රී සුමංගල මහා නායක ස්වාමීන්ද්‍රයෝ
අම්බලන්ගොඩ දේවානන්ද උප සංඝරාජ මහා නායක ස්වාමීන්ද්‍රයෝ
පණ්ඩිතාචාර්ය පාණදුරේ ශ්‍රී ඥානවිමලතිස්ස නායක ස්වාමීන්ද්‍රයෝ
මොරටුවේ ආභිධම්මික ශ්‍රී මේධානන්ද නායක ස්වාමීන්ද්‍රයෝ
පණ්ඩිතාචාර්ය වැලිපටන්විල දීපංකර මහා ස්ථවිරයන් වහන්සේ
සී. ඒ. ශ්‍රී ශීලස්කන්ධාභිධාන ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ
ජම්බුවත්තේ ශ්‍රී පියරතන මහා ස්ථවිරයන් වහන්සේ
පණ්ඩිතාචාර්ය කෙසෙල්වත්තේ ප්‍රඥානන්ද මහා ස්ථවිරයන් වහන්සේ



දෙවුන්දර ධම්මානන්ද මහා ස්ථවිරයන් වහන්සේ
වලානේ ධම්මානන්ද අධිකරණ නායක ස්වාමීන්ද්‍රයෝ
තෙල්වත්තේ අරියවංස මහා නායක ස්වාමීන්ද්‍රයෝ
තෙල්වත්තේ අමරවංශ මහා ස්ථවිරයන් වහන්සේ
අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත මහා නායක ස්වාමීන්ද්‍රයෝ
පොල්වත්තේ සුදස්සි මහා ස්ථවිරයන් වහන්සේ
පණ්ඩිතාචාර්ය වලානේ විජයනන්ද නායක ස්වාමීන්ද්‍රයෝ
මොරටුවේ පේමරතන නායක ස්වාමීන්ද්‍රයෝ
වලානේ ආනන්ද මහා ස්ථවිරයන් වහන්සේ
එගොඩඋයනේ සුනන්ද මහා ස්ථවිරයන් වහන්සේ
එගොඩඋයනේ උපනන්ද නායක ස්වාමීන්ද්‍රයෝ
පණ්ඩිත කහඳමෝදර ශ්‍රී පියරතන මහා ස්ථවිරයන් වහන්සේ
පණ්ඩිත අම්බලන්ගොඩ ධම්මකුසල මහා ස්ථවිරයන් වහන්සේ
පණ්ඩිත මොරටුවේ සාසනරතන මහා ස්ථවිරයන් වහන්සේ
කෙසෙල්වත්තේ සීලානන්ද මහා ස්ථවිරයන් වහන්සේ
වෑකඩ ශ්‍රී ධීරානන්ද මහා ස්ථවිරයන් වහන්සේ
කෙසෙල්වත්තේ විනයධජ මහා ස්ථවිරයන් වහන්සේ
පණ්ඩිත මාදුපිටියේ මේධානන්ද මහා ස්ථවිරයන් වහන්සේ
පණ්ඩිත රූකව පාලිත මහා ස්ථවිරයන් වහන්සේ
පණ්ඩිත මිරිස්සේ ගුණසිරි මහා ස්ථවිරයන් වහන්සේ
ගල්කිස්සේ ශ්‍රී විසුද්ධානන්ද නායක ස්වාමීන්ද්‍රයෝ
විලේගොඩ ධම්මානන්ද මහා ස්ථවිරපාදයන් වහන්සේ
දෙඹන්දූවේ ධම්මරතන නායක ස්ථවිරයන් වහන්සේ
ගන්දර ශීලානන්ද මහා ස්ථවිරයන් වහන්සේ
ගන්දර සරණතිස්ස නාහිමියන් වහන්සේ
වැලිගම මේධානන්ද මාහිමියන් වහන්සේ
තංගල්ලේ පියරතන මාහිමියන් වහන්සේ
තංගල්ලේ සිරි සුනන්දසභ මහා ස්ථවිරයන් වහන්සේ
කහඳමෝදර ධම්මරතන මාහිමියන් වහන්සේ

මොරටුවේ සුමන සවාමීන්වහන්සේ
කළුතර සිරි සුනීත සවාමීන් වහන්සේ
වල්ගම්පළියේ සෝමාරාම මහා ස්ථවිරයන් වහන්සේ
හරුමල්ගොඩ ශ්‍රී සුමංගල මහා ස්ථවිරයන් වහන්සේ
පණ්ඩිත තංගල්ලේ සිරිසුනන්ද මාහිමියන් වහන්සේ
කේ. ඇස්. විමලසාර මාහිමියන් වහන්සේ
රුකව සිරි පියරතන නාහිමියන් වහන්සේ
කංගල්ලේ ශ්‍රී විමලානන්ද මහා ස්ථවිරයන් වහන්සේ
මාතර අග්ගසාර මහා ස්ථවිරයන් වහන්සේ
හිංතොට ශ්‍රී මේධංකර නාහිමියන් වහන්සේ
කවීශ්වර ශ්‍රී පෙතියාගොඩ ඥානාලෝක
මහා ස්ථවිරයන් වහන්සේ
උණකුරුවේ සෝණුත්තර මහා ස්ථවිරයන් වහන්සේ
මොරටුවේ විජිතනන්ද ධම්මාලෝක මාහිමියන් වහන්සේ
දික්වෙල පියනන්ද මහා ස්ථවිරයන් වහන්සේ
අතිගරු ඇඩ්මන්ඩ් පීරිස් රාජගුරු ප්‍රසාදීන් වහන්සේ
අතිගරු ලක්දාස් ද මැල් නායක බිෂොප් තුමාණෝ
ගෞරවාර්හ ජී. ඒ. එෆ්. සේනාරත්න දෙව්ගැති තුමා
ගෞරවාර්හ එස්. ජෝර්ජ් මැන්දිස් දෙව්ගැති තුමා
ගරු. එස්. ජී. පෙරේරා පියතුමා



# කෞරව වංශික ලේඛකයෝ

## (ගෘහස්ථ පක්ෂය)

බ්‍රහ්මචාරී ඩී. ජ්. වික්‍රමසූරිය මැති තුමා
ඇම්. ධර්මරත්න අභිනීතිඥ තුමා
ඩබ්ලිව්. ආතර් ද සිල්වා ඇමති තුමා
එච් දතිගෙල් ප්‍රනාන්දු ගුරු තුමා
දෙඩම්දූවේ ධර්මසේන පඬි තුමා
දාවිත් අපෝන්සු ගුරු තුමා
ටී. ජේ. ප්‍රනාන්දු ගුරු තුමා
පණ්ඩිත ඩබ්ලිව්. ඇෆ්. ගුණවර්ධන වාසල මුදලි තුමා
පී. ඒ. පීරිස් මැති තුමා
ඩී. ඇම්. ඇස්. ඇස්. කවිරාජ පඬි තුමා
ඩබ්ලිව්. ඇම්. ප්‍රනාන්දු මැති තුමා
උදේනි ද සිල්වා මැති තුමා
පී. ද ඇස්. කුලරත්න මැති තුමා
මාටින් වික්‍රමසිංහ මැති තුමා
ජේ. ඇම්. වීරසූරිය මුදලි තුමා
කේ. ඇස්. පෙරේරා මුදලි තුමා
ඒ. ද ඇස් පුංචිහේවා මුදලි තුමා
ඒ. ඇස්. ඇෆ්. කුරුකුලසූරිය මැති තුමා
පී. ඩී. ඇස්. වීරසූරිය මැති තුමා
ඇල්. එච්. මෙත්තානන්ද මැති තුමා
ජී. පී. ජිනදාස මැති තුමා
ටී. ඒ. ධර්මබන්ධු මැති තුමා
ඇම්. ජ්. ප්‍රනාන්දු ගුරු තුමා
ටී. ආර්ලිස් පීරිස් මැති තුමා
ඇල්. ඇල්. පෙරේරා මැති තුමා
ඇඩ්මන්ඩ් ගුණරත්න වාසල මුදලි තුමා
ටී. අගොස්තීනු පීරිස් ගුරු තුමා
සලමොන් දල්පතාදු මැති තුමා
බලදේව දේශබන්ධු මැති තුමා

ටී. සුගතපාල මැති තුමා
ඒ. පී. ගෝමස් මැති තුමා
ඩී. බී. ධනපාල මැති තුමා
ආචාර්ය ලක්ෂ්මන් පෙරේරා මැති තුමා
ඩබ්ලිව්. ලයනල් ප්‍රනාන්දු මැති තුමා
ජේ. ප්‍රැන්සිස් ප්‍රනාන්දු ගුරු තුමා
සී. ඇම්. ප්‍රනාන්දු ගුරු තුමා
ජේ. ඊ. ජයසූරිය මහාචාර්ය තුමා
ඩබ්ලිව්. ඇස්. ප්‍රනාන්දු මැති තුමා
රිචඩ් ද වාස් ගුණවර්ධන මැති තුමා
ඩේවිඩ් ද වාස් ගුණවර්ධන මැති තුමා
ඇම්. සී. ඇෆ්. පෙරේරා මැති තුමා
වෛද්‍යාචාර්ය නන්දියස් සිල්වා විජයසිරි මැති තුමා
හික්කඩුවේ බී. එච්. අමරසේන මැති තුමා
ටී. ඇස්. ධර්මබන්ධු මැති තුමා
සංගීත විශාරද ඩබ්ලිව්. ඩී. අමරදේව මැති තුමා
විඩිමන් මැන්දිස් මැති තුමා
බී. ජේ. ඩී. ප්‍රනාන්දු මැති තුමා
ජේ. වී. පීරිස් මැති තුමා
'තංගල්ලේ සුගතදාස ධර්මබන්ධු මැති තුමා
හික්කඩුවෙ ලියනගේ මැති තුමා
ඇස්. ඒ. පීරිස් ගුරු තුමා
ඒ. පී. ද සිල්වා ගුරු තුමා
ඇන්. එච්. ජිනදාස මැති තුමා
සුසාන්ත ද පොන්සේකා මැති තුමා
ආතර් වී. දියෙස් මැති තුමා
ජේ. ඩී. පී. රුද්‍රිගු ගුරු තුමා
විල්මට් ඒ. පෙරේරා මැති තුමා
එඩී ප්‍රනාන්දු ගුරු තුමා
ඔස්ටින් කැන්ටර් වර්ණකුල මැති තුමා
ලයනල් ප්‍රනාන්දු මැති තුමා
ඇම්. සී. ප්‍රනාන්දු ගුරු තුමා



ටී. ජේ. පීරිස් ගුරු තුමා
මයිකල් සී. ප්‍රනාන්දු මැති තුමා
ගුණපාල වීරසේකර මැති තුමා
හැන්රි පීරිස් මැති තුමා
ඇල්. ඇම්. ලීලසේන ගුරු තුමා
ලාල් ප්‍රේමනාත් ද මැල් මැති තුමා
ඩබ්ලිව්. අයිසෙක් ද මැල් මුදලි තුමා
ඩබ්ලිව්. ඇන්. විජයසේකර මැති තුමා
රෙජිනෝල්ඩ් ඒ. ප්‍රනාන්දු මැති තුමා
මහාචාර්ය ඇල්. ඇල්. කේ. ගුණතුංග මැති තුමා
ඩබ්ලිව්. ටී. ප්‍රනාන්දු ගුරු තුමා
එගොඩඋයනේ ශ්‍රී රාජ මැති තුමා
සුනිල්සාන්ත මැති තුමා
ඇල්. ඇම්. සිල්වා ගුරු තුමා
ඇස්. පියසේන මැති තුමා
පී. ජේ. ප්‍රනාන්දු ගුරු තුමා
ජේ. ඇස්. ජයසූරිය මැති තුමා
ඩබ්ලිව්. ඇම්. සොයිසා ගුරු තුමා
කේ. ඇස්. සුමනසූරිය මැති තුමා
ජෝන් සයිමන් පීරිස් මැති තුමා
ඩබ්ලිව්. තෝමස් ප්‍රනාන්දු ගුරු තුමා
ජයසුමන ධර්මබන්ධු මැති තුමා
ආචාර්ය කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය මැති තුමා
කේ. සී. ප්‍රනාන්දු මැති තුමා
ඇල්. ඇස්. ප්‍රනාන්දු මැති තුමා
ඇඩ්වින් ප්‍රනාන්දු ගුරු තුමා
ඇම්. ජූලියට් ජී. ප්‍රනාන්දු මැතිණිය
ඇඩ්ලින් ප්‍රනාන්දු මැතිණිය
ලිලී ඊ. ගෝමස් මැතිණිය
කුසුමා ද මැල් මැතිණිය
ඇම්. ආර්. පීරිස් මැති තුමා
ඇම්. ආර්. ප්‍රනාන්දු මැති තුමා

ඒ. ඩී. ආර්. වර්ණකුලසූරිය මැති තුමා
ඩී. ජ්. ඩී. ඇස්. ජයසූරිය මැති තුමා
ඒ. ඇස්. ඇෆ්. වීරසූරිය කුරුකුලවේන්දර මැති තුමා
කෞරව ආදිත්‍ය පියදාස ජයරත්න මැති තුමා
ඇස්. එච්. ඇස්. සිල්වා මැති තුමා
එච්. වී. පීරිස් ගුරු තුමා
ඇම්. ඒ. ඇස්. ප්‍රනාන්දු මැති තුමා
තිස්ස කුරුකුලනාථ මැති තුමා
ඇල්. ආර්. ප්‍රනාන්දු මැති තුමා
ටී. ජේ. කරුණාදාස මැති තුමා
මැල්සන් හියුබට් ද මැල් මැති තුමා
ඩඩ්ලි අමරදාස මැති තුමා
ඔබ්සන් කුමරගේ ගුරු තුමා
කේ. ටී. සී. පීරිස් ගුරු තුමා
ඇස්. සිමියොන් ප්‍රනාන්දු මැති තුමා
ඩී. සී. විජයවීර මැති තුමා
එච්. සෙල්ලගේවා මැති තුමා
බී. හේවාපොන්සේකා මැති තුමා
සුනන්ද ද මැල් මැති තුමා
ජේ. ඇෆ්. ප්‍රනාන්දු මැති තුමා
විලියම් ප්‍රනාන්දු වෛද්‍යවාචස්පති තුමා
ඒ. ඇම්. ඩී. අපෝන්සු මැති තුමා
ජී. සී. මැන්දිස් මැති තුමා
නිමල් රෝහණ මැති තුමා
ධම්ම ශ්‍රී ගුණදාස මැති තුමා
ඇස්. එච්. ජී. සුගුණසිරි මැති තුමා
රුබට් සෝමගේ මැති තුමා
ජේ. ඇල්. ජයවීර නොතාරිස් රාළහාමි
ඇම්. කේ. විජේවීර පටබැඳි ආරච්චි රාළහාමි
පියදාස තේනාබදු මැති තුමා
ඇම්. ඩී. වික්‍රමසිංහ මැති තුමා
ඒ එච්. ටී. අර්නෝලිස් සිල්වා මැති තුමා



ගන්දර ප්‍රේමතිලක මැති තුමා
චාර්ල්ස් ජයසූරිය මුහන්දිරම් මැති තුමා
ඩබ්ලිව්. ඇස්. සිල්වා මැති තුමා
ඒ එච්. ටී. චාර්ල්ස් සිල්වා පාඨශාලා පරීක්ෂක තුමා
ඩී. ඇම්. විජේසූරිය නොතාරිස් රාළහාමි
බී. ඒ. කේ. විජේනායක නොතාරිස් රාළහාමි
මොරකැටිආරේ ඩී. ඇස්. ජ්. විජේසූරිය
පටබැඳි ආරච්චි රාළහාමි
පියදාස ගන්දර මැති තුමා
තුංග හෙට්ටිහේවා මැති තුමා
කේ. බී. ජයසූරිය මැති තුමා
මහාචාර්ය ඇන්. ඒ. ජයවික්‍රම මැති තුමා
බී. ඒ. ගුණසේකර මැති තුමා
ඇස්. එච්. ඇන්. සිල්වා ගුරු තුමා
ගිල්මට් ජයසූරිය මැති තුමා

---

## සිල්වා ටවුන් හැටන් හා මැල් සිරි පුරය.

ඒ ඒ ආණ්ඩුවලින් බලය තහවුරු කරගත් සමහර පුද්ගලයෝ පොදු මහාජන මුදලින් සවකීය නාමයන් අනුස්මරණය කරන ග්‍රාම-නගර ආදිය ඇති කොට ගත්හ. එහෙත් සී. පී. ද සිල්වා, සී. ජේ. ඒ. දියෙස්, සර් එච්. ඇල්. ද මැල් යන මැතිවරු සිය මුදල් වියදම් කොට නාමානුස්මරණ මහා නගර ඇති කොට ගත්හ.

මාදම්පේ සිල්වා (ටවුම) නගරය කෞරව වංශික මොරටු පුත්‍රයෙක් වූ සී. පී. ද සිල්වා මැති තුමන් විසින් ඉදිකරවන ලද්දකි.

කලින් යුරෝපීය වතු සමාගමක් සතුව පැවැති හැටන් නගරය සහිත වත්ත සී. ජේ. ඒ. දියෙස් මැති තුමා විසින් මිලයට ගන්නා ලද්දේ එකී වත්තේ සුපිරින්ටැන්ඩන්ට් මහතාගේ ආඩම්බර මට්ටු කිරීම සඳහා ය. දියෙස් මැති තුමන්ගේ හිතවතෙක් වත්ත පාරෙන් කුඩයක් ඉහලාගෙන යාම ගැන සුද්දා කලබල වී වතු පාරෙන් යන විට කුඩය අකුලාගෙන යායුතු යයි කී බවත් මේ බැව් සැලවූ කෙණෙහි ම දියෙස් මැති තුමා එංගලන්තයට ගොස් හැටන් නගරය සහිත මුළු වත්තම මිලයට ගෙන පෙරලා ලංකාවට පැමිණ පැය විසි හතරක් කල්දී සුද්දා වත්තෙන් පලවා හැරි බවත් තතු දන්නෝ පවසති. එවකට පැවැති තැපැල් කන්තෝරු රජයේ වෙළෙඳ පොළ (මාර්කට්) ආදි සියලු ගොඩනැගිලි ම මේ වත්තට අයිති ව තුබුණු බැව් පරන්නෝ කියති.

මැල් සිරි පුරය ද අංග සම්පූර්ණ පුරප්‍රවරයකි, සර් එච්. ඇල්. ද මැල් මැති තුමා විසිනි මෙය ඇති කරන ලද්දේ. මේ හැර කෞරව වංශිකයන් සතු මහ වීදි ද ඇත. පටු මං ද එමට ඇත. ඒවා මහාජන සල්ලියෙන් නොව සිය මුදල් වියදම් කොට සැදවූ සිහිවටන ය.

නිමි.

# කුරුකුල චරිතය

**( කරාව ගෝත්‍රයේ ඉතිහාස පොත )** 1 හා 2 කාණ්ඩ



මහා භාරතයේ පෙනෙන අයුරු කුරුකුල උපතේ සිට කෞරව රජවරු, යුව රජ, බිසෝවරු, මහ මුදලි, මහ අදිකාරම් යනාදීන්ගේ තොරතුරු ද පඬි රජ පරම්පරා නාමාවලිය ද යාපනයේ සහ මන්නාරම් ප්‍රදේශවල වැසි කෞරව ප්‍රධානීන්ගේ නම් ගම් ආදිය ද හිටි බණ්ඩාර, නිකපිටියේ බණ්ඩාර, නව රත්න බණ්ඩාර, කුරුවීර පුරන් අප්පු, කුරුවිට බණ්ඩාර, ජුවන් ප්‍රනාන්දු නොහොත් ඉද්දගොඩ නයිදෙ, නයිදෙ අප්පු මුදියන්සේ හා පත්තිනිගේ වීරසූරිය නයිදෙ, මාතලේ අඹන ඇලගමුව, පඬිවිට ආදි ගම්වල කරාවේ කුලයේ තොරතුරු ද උඩ රට සහ වන්නිබද කරාව ගෝත්‍රිකයන් ගැන කරුණු ද, වර්ණසූරිය, කුරුකුලසූරිය, පරණකුලසූරිය මුදලිවරු ආදීන්ගේ තොරතුරු සහ මේතාක් යටපත්ව තිබෙන කරාව ගෝත්‍රයේ තොරතුරු රාශියක් ද දැනගැනීමට කරාව කුලයේ සැම නිවසක ම තැබීමට සුදුසු වූ වටිනා පොතකි.

ඡායාරූප සහිත වූ පොත පිටු 350 කි. පළමු වෙනි කාණ්ඩය සහ දෙවෙනි කාණ්ඩයත් විකිණීමට තිබේ. තිබෙන්නේ පොත් ස්වල්පයකි. ප්‍රමාද වී පසුතැවිලි නොවිය යුතුයි. වුවමනා භවතුන් පහත සඳහන් ලිපිනයෙන් ඉල්ලුම් කළ යුතුයි.

**එක කාණ්ඩයක මිල රු: 5-00 යි.**

පොතකට තැපැල් ගාස්තුව ශත 35

මෙසේ ඉල්ලනු:-

**කෞරව ආදිත්‍ය, පියදාස ජයරත්න**

නො: 108 "කාරවත්ති", මීගමු පාර, කුරුණෑගල.

රටින්-රට පතල වී ගිය කීර්තිය ඇති

කවුරුත් ගුණ කියන අරුම-පුදුම තෙල

**ලෝක ප්‍රසිද්ධ දිව්‍යමය ගුණ ඇති**

## නේත්‍රානන්ද තෛලය යි.

### අවුරුදු හැට ගණනක් මුළුල්ලේ

**මහාජන විශ්වාසය දිනා ගත් නේත්‍රානන්ද තෛලය අද ජයේ කලඑළි බැසගත් තෙලක් නොවේ.** අවුරුදු හැට ගණනක් මුළුල්ලේ මහාජන විශ්වාසය දිනා ගත් මේ තෙල අද තෙල ලෝකයේ නායකයා ය. මේ තෙලෙහි කීර්තිය අප රටට පමණක් සීමා වූ එකක් නොවේ. එංගලන්ත, අමෙරිකා, ප්‍රංස, ඉන්දියා, බුරුම, සියම් ආදි විදේශිකයන් අතර ද මේ තෙලෙහි කීර්තිය පැතිර පවතී.

**දිනපතා නේත්‍රානන්ද තෛලය හිස ගල්වන්න**

හිස රුදය මිනිත්තු පහෙන් දුරු කරන මේ තෙල පාවිච්චියෙන් හිස කැක්කුම, ඔලුවේ නොන්තු ගතිය, ඔලුව ඇද-බැඳගත් ගතිය, ඉරුවා රදය, මොළේ දැවිල්ල, මොළේ බර ගතිය, මොළේ කැක්කුම, සිහි-කල්පනා අඩුකම, අකලට හිස සුදු වීම, තට්ටය පෑදීම, පටලය, රැකන, ඇස් රිදිල්ල, ඇස් කැසිල්ල, ඇස්ගෙඩියේ කැක්කුම, නාසය වණ වීම, නාසය ඇහිරීම ආදි

**ඇසේ-හිසේ සියලු ලෙඩ වලක්වා**
**හිසකේ දිගු කොට වඩවයි.**

### තෙල් කාලක් රු: 2-50 යි.

තැපැල් ගාස්තුව සත 55

### ඩබ්ලිව්. දනියෙල් ප්‍රනාන්දු වෛද්‍යශේඛර වෙද මුදලිඳු හා පුත්‍රයෝ.

**සිරිවෙද වලව්ව, පානදුර.**

203 1/3 ඕල්කොට් ගොඩනැගිල්ල-නොරිස් පාර කොළඹ.

නො: 88, පුත්තලම් පාර-කුරුණෑගල

කාසල් හෝටලය-මහනුවර.

නො: 16, ඩික්මන් ලේන් හැව්ලොක් ටවුන්-කොළඹ.



## පානදුරේ ශ්‍රී ලංකා ස්වර්ණාභරණ

● නිර්මාණයෙන් විචිත්‍රයි!
● අලංකාරයෙන් අද්විතීයයි !!.
● වටිනාකමෙන් අනඝයි!!!
● දිවයින පුරා පතලයි !!!!



තනි පවුම් රත්රන් ● නවීන-තම මෝස්-තර අනුව

### උසස් ම වර්ගයේ බෙරලියන්තු හා දියමන්ති

**යොදා**

දක්ෂතම කාර්මිකයන් අතින් නිමවුණු අපේ ස්වර්ණාභරණයෙන් සැරසෙන ජනතාවන්ගේ දේහයන් සඳ පහනින් ඔද වැඩෙන කිරි මුහුද මෙන් දුටුවන්ගේ සිත්සතන් වශීකර ලීමෙහි සමත්වනු නිසැකයි

**අද ම පැමිණ ඔබේ ඕඩරය**

### ශ්‍රී ලංකා ජුවලරි පැලස් එකට දෙන්න.

ඇම්. ඩී. පී. ධම්සේන සහ පුත්‍රයෝ

**නො: 289, මහ වීදිය-පානදුර.** ෆෝන් 257

# කස්තූරි කල්ප යෝගය

**මේ බෙහෙත පාවිච්චියෙන් අකල් ජරාවට ගිය තරුණ තරුණියන්ට පමණක් නොව මහලු-මැහැලියන්ට ද තරුණ වියෂ්ය ගෙන දේ.** කෑම බැරිකම, බඩගිනි නැතිකම, බඩ පුරවා දැමීම, හති හානිය, සුළු වැඩකින් ඇඟට දුබ වෙහෙසක් දැනීම, නරක හීන පෙනීම, ශරීර යන්ත්‍රය අබලන් වීම, හුස්ම ඇල්ලීමේ අපහසුව, පපුවේ වේදනාව, කැස්ස, ලේ අපිරිසිදු කම, ලේ ගමන් වේගයෙහි වැඩි—අඩු බව ආදී රෝගාබාධ රාශියක් වළක්වා ශරීර ශක්තිය ගෙනදී ඇඟ පුෂ්ටිමත් කරවන බෙහෙතකි.

**මාසයක බෙහෙත් රු: 7–00 තැ: ගා: සත 50**

---

## නෙත්‍රාලෝක තෛලය

### නිදිවරණ ගොවිකරු—කම්කරු—ලිපිකරු ආදීන්ට මෙතරම් සැනසිල්ලක් වෙන කොයින්ද?

ඇසේ—හිසේ—කණේ—කටේ හා නාසයේ සියලු ආබාධ වළක්වා ගැනීමට කැමැත්තෝ මේ මාහැඟි බෙහෙත් තෙල පාවිච්චි කරත්වා.

**තෙල් බෝතල කාලක් රු: 3–00**

තැ: ගා: සත 50

**වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. කේ. ජිනදාස**

නො: 161, නෝරිස් වීදිය

**පිටකොටුව-කොළඹ, 11.**

# වීරගිරි ස්ටෝර්ස්

**නො: 306, කෙළින් වීදිය, පානදුර.**

**නවීන ක්‍රමයට නිමවන ලද අළුත් මෝස්තරවල**

- ★ පැටුල් ලාම්පු, භූමිතෙල් ලාම්පු ආදිය ද,
- ★ ඇක්සයිස් පොත්, ලියුම් පොත්, කවර, තීන්තකූඩු, පවුන්ටන් පෑන්, පෑන්, පැන්සල් ආදි ලිපි ද්‍රව්‍යයන් ද,
- ★ රමනීය කලාත්මක ව නිමවන ලද නානා මෝස්තරවල පිඟන් බඩු, වීදුරු බඩු හා ඇලුමිනියම් බඩු ද,
- ★ සුවඳ සබන්, පියර, සැන්ට් ආදි රූප ලස්සණය හැඩ-වැඩ කරන විසිතුරු දේ ද,
- ★ ලැක්ටෝජන්, සැනටෝජන්, නෙස්ප්‍රේ, නැස්ටමෝල්ට් ආදි කිරි ආහාර වර්ග ද,
- ★ කතුරු, පනා, දැලිපිහි, දැලිපිහි තල, ඉණ බඳින පටි, ඔර්ලෝසු පටි අදිය ද,
- ★ මුදු, වළලු, අරුංගල්, දම්වැල් ආදි විසිතුරු බඩු වර්ග ද,

ඉතා පහසු මිලට අපෙන් ලබාගත හැක.

---


**නවද කෑමවල ධන්වන්තරී බෙහෙත් තෙල් හා වෙනත් බෙහෙත් තෙල් වර්ග ද නියම මිලට අපෙන් ලබාගත හැක.**

ඔබ වරක් අප වෙළඳ ශාලාවට පැමිණිය හොත් සදහට අප අමතක නොකරනු නිසැකයි.

**වීරගිරි ස්ටෝර්ස්**

නො: 306 – කෙළින් වීදිය – පානදුර.

# අර්ශස් රෝගය සඳහා ශල්‍යකර්ම කුමටද?



ඕනෑම දරුණු අලුත් හෝ කල් ගත රෝගයක් අප සුවකරන්නේ බෙහෙත් දෙකකිනි. අර්ශස් රෝගීන් දහස් ගණනකට ප්‍රත්‍යක්ෂ ගුණ ලබා දී තිබෙන අපේ අත්දුටු අර්ශස් විද්වංශතිය හා අර්ශස් සුවය පාවිච්චි කිරීමෙන් ෂට් ප්‍රකාර අර්ශස් රෝග සුව කරයි. මලබද්ධය, බඩගිනි නැති කම, බඩ රිදීම, වාතයෙන් බඩ පුරවා දැමීම, බ[illegible] ගතිය, ශෙඩ් පිටවීම, බඩවැල පාත් වීම, ලේ යාම, ගුද මාර්ගයේ නලියන ගතිය වහා සුව කරයි. ශෙඩ් හීන් කරයි. කිරි පණුවන් නැති කරයි. හීන්න වඩා ආහාර රුචිය ඇති කරයි. ශරීර දුර්වලත්වය නැති කර ශක්තිය ඇති කරයි.

අලුත් හෝ කල්ගත ඕනෑම ඇදුම රෝගයක් බෙහෙත් විදීමක් නොමැතිව මිනිට්ටු දහයකදී සහනය කොට සති තුනකදී නිට්ටාවට සුව කර දෙමු.

**රෝග පරීක්ෂණය:** සතියේ සෑම දිනවලම උදේ 8 සිට රාත්‍රී 9 දක්වා පැමිණ හමුවන්න.

උදේ සවස කන බෙහෙත අර්ශස් විද්වංශතිය දින 15 රු. 10·00

දවල් රාත්‍රී කෑමෙන් පසු බොන බෙහෙත අර්ශස් සුවය රු. 5·50

බෙහෙත් දෙකටම තැපැල් ගාස්තුව රු. 2·00

මුදල් ඔඩරයක් සමඟ ඉල්ලුම් කරනු.

**වෛද්‍යාචාර්ය පී. ඇස්. පී. ගුණරත්න**

**ශ්‍රී විජය ඖෂධ ශාලාව.**

(විජිත සිනමා හල සමීපය) ගාලු පාර, රත්මලාන.